# අවසන් වාර්තාව

(සිංහල පරිවර්තනය)

2019 අප්‍රේල් මස 21 වෙනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර විමර්ශනය කර වාර්තා කිරීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් පත් කළ කොමිෂන් සභාව

වෙළුම 01

## කොමිෂන් සභා වාර්තාව

**2021 ජනවාරි 31**

විමර්ශන කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කර බාරදෙනු ලැබූ විමර්ශන කොමිෂන් සභාවේ සිංහල පරිවර්තනයකි. මෙම පරිවර්තනයේ නිවැරදිභාවය කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් පරීක්ෂා කර නොමැත.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

උතුමාණෙනි,

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 393 වන පරිච්ඡේදය වන සංශෝධිත ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව එතුමන්ට පැවරී ඇති අභිමතය පරිදි පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අනාගත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සහ කරුණු වාර්තා කිරීම සඳහා කොමසාරිස්වරුන් වශයෙන් අපව පත් කරමින් 2019 සැප්තැම්බර් 21ක් වන දින ජනාධිපති නියෝගයක් (උපලේඛනය I) නිකුත් කරන ලදි. ඒ අනුව,

01. 2019 අප්‍රේල් මස 21 වන දින ජීවිතවලට හා දේපලවලට හානි ඇති කරමින් සිදුවූ බෝම්බ ප්‍රහාරය හේතුකොට ගෙන ඇතිවූ සිද්ධිය / සිද්ධි දාමයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධතා ඇතැයි සැළකෙන හෝ එකී සිද්ධිය / සිද්ධි දාමය සම්බන්ධයෙන් වූ විවිධ වැරදි සහ බලය හෝ අධිකාරිය අනිසි ලෙස හෝ අයුතු ලෙස යොදාගැනීම්, මගහැරීම්, අතපසුවීම්, නොසැළකිලිමත්කම් හා ආකාරයක්ෂමතා, වගකීම් පැහැරහැරීම් ආදී සිදුවී යැයි සැළකෙනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවකයින් / නිලධාරීන් වශයෙන් සිටි හෝ දැනට සිටින තැනැත්තන්ට හා වෙනත් තැනැත්තන්ට එරෙහිව ඔවුන්ගේ ක්‍රියා හෝ නොතකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි තොරතුරු සහ වෙනත් සාක්ෂි කැඳවීම් සහ ඒවා ලබාගැනීම.

02. ඉහත 1 වන ඡේදයේ සඳහන් පැමිණිලි, තොරතුරු හා චෝදනා පිළිබඳව කඩිනමින් අපක්ෂපාතී, සම්පූර්ණ විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම.

03. ඉහත 1 වන ඡේදයේ සඳහන් මෙම ත්‍රස්තවාදී ක්‍රියාවට ඍජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් ඇති පුද්ගලයින් හා සංවිධාන හා ඒවායේ ක්‍රියා කළාපයන් හඳුනාගැනීම.

04. රටතුළ මෙවැනි ත්‍රස්තවාදී හා අන්තවාදී ක්‍රියාදාමයක් සිදුවන බවට පූර්ව හඳුනාගැනීම, ඊට අනුශාංගික කරුණු සොයාබැලීම සහ නීතියට අනුව ක්‍රියාකිරීම සම්බන්ධ පැහැරහැරීම්, නොසළකාහැරීම් සහ නිසි ක්‍රියාමාර්ග නොගැනීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන්, බලධාරීන් හඳුනාගැනීම.

05. 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ ප්‍රහාරය වළවක්ගැනීමට සිය අතපසුවීම්, නොසළකාහැරීම්, රාජකාරිය පැහැරහැරීම්, අකර්මන්‍යතාවයන් හේතුවෙන් නිසි ක්‍රියාමාර්ගය නොගැනීම සම්බන්ධව එයට වගකිවයුතු සියළු නිලධාරීන් හඳුනා ගැනීම.

06. 2019 අප්‍රේල් 21 වන දින ප්‍රහාරය සිදුවීමෙන් පසු රටතුළ ඇතිවූ මහජන උද්ඝෝෂණ, කඩාකප්පල්කාරී ක්‍රියාවන්, දේපල හා පුද්ගලයන්ට හානි සිදුකිරීම තුළින් මහජන කැළඹිලි ඇති කිරීමට සම්බන්ධ පුද්ගලයින් සහ සංවිධාන හඳුනා ගැනීම.

07. රටතුළ ජාතිවාදී හා ආගම්වාදී ආරවුල් ඇතිවීමට හේතුවන්නා වූ, මහජනයා කුපිතකරවන්නා වූ, සමාජ යහපැවැත්මට බාධා වන්නා වූ, සමාජ ඒකාබද්ධතාවයට හානිවන්නා වූ ජාතිවාදී හා ආගම්වාදී ප්‍රවණතා ඇතිකරවන්නා වූ ක්‍රියාදාමයන් සඳහා අනුබල දෙන, අනුග්‍රහය දක්වන පුද්ගලයින්, සංවිධාන හා ක්‍රියාවලින් හඳුනා ගැනීම.

08. (ආ) පුද්ගලයින්ට මරණය, පූර්ණ ආබාධිත තත්ත්වය හෝ තුවාල සිදුකරමින්.

(ආ) යම් රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට, ආගමික ස්ථානයකට පුද්ගලික ආයතනයට අයත් හෝ සංතකයේ ඇති දේපළ විනාශය හෝ අලාභය සිදුකරමින්.

**2019** අප්‍රේල් මස **21** වන දින දිවයින පුරා සිදුවූ සිදුවීම්වලට හේතු වූ අවස්ථානුගත කරුණු සහ ස්වභාවය දැන ගැනීම,

09.යම් තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක්, නැතහොත් එම සංවිධානය හා සම්බන්ධ යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් (I) වන ඡේදයේ සඳහන් ක්‍රියා,

(අ) සිදුකළේද හෝ සිදුකිරීමට කුමන්ත්‍රණය කළේද?

(ආ) එම ක්‍රියා සිදුකිරීමට මූල්‍යමය / භෞතික හා මානසික වශයෙන් ආධාර හෝ අනුබලදීම කළේද, නැතහොත් එම ක්‍රියා කිරීමට ආධාර හෝ අනුබලදීමට කුමන්ත්‍රණය කළේද?

(ඇ) එම ක්‍රියා සිදුකිරීමට යම් ආකාරයකින් සහාය දුන්නේද, දිරි දුන්නේද හෝ එම ක්‍රියා සිදුකිරීමට සම්බන්ධ වී සිටියේද හා ඊට කුමන්ත්‍රණය කළේද සහ දිරි දුන්නේද? හා

(i) එම ක්‍රියාවලියෙන් හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමට හෝ වෙනත් යම් ආකාරයකින් සහායවීමට අවශ්‍ය නම් යම් පියවර නිර්දේශ කිරීම.

(ii) මහජනතාවගේ ආරක්ෂාව පිළිබඳව සහතික වීමට අවශ්‍ය පියවර නිර්දේශ කිරීම.

(iii) එවැනි සිදුවීම් නැවත සිදුවීම වැළැක්වීමට අවශ්‍ය පියවර නිර්දේශ කිරීම.

10.ඉහත කී වැරදි සිදුකළ බවට සැකකරුනු ලබන තැනැත්තන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමේ අදහස ඇතිව අවශ්‍ය විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම සඳහා අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිසියට හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියකට ඉදිරිපත්ත කළයුත්තේ ඉහත සඳහන් කරුණුවල විෂය පථය තුළට වැටෙන ක්‍රියාවලින් කවර ක්‍රියාද යන්න හඳුනා ගැනීම.

11. ඉහත කී වැරදි සිදුකළා යයි කියනු ලබන තැනැත්තන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම සළකා බැලීමට නීතිපතිවරයාට හැකිවන පරිදි විමර්ශනයට සහ පරීක්ෂණයට අදාළ සාක්ෂි නීතිපතිවරයාට ප්‍රේෂණය කිරීම.

12. ඉහත වැරදි හෝ වැරදි ක්‍රියා සිදුකිරීම සඳහා වගකිවයුතු තැනැත්තන්ට එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග ඇත්නම් ඊට අදාළව නීති ප්‍රකාරව කටයුතු කිරීම සඳහා එම ක්‍රියාමාර්ග සම්බන්ධව කොමිෂන් සභාවේ නිර්දේශ සහ අනාගතයේදී එවැනි වැරදි හා වැරදි ක්‍රියා සිදුවීම වැළැක්වීම සඳහා ගතයුතු නිර්දේශ මා වෙත ඉදිරිපත් කිරීම.

13. මෙවැනි ත්‍රස්තවාදී, අන්තවාදී ක්‍රියාවන් මගින් ජාතික ආරක්ෂාවට හා ජාතික සමගියට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම සඳහා ගතයුතු පියවරයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ගරු නීතිපතිතුමාගේ සහයෝගය මත නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් ද පරීක්ෂණ කොමිෂන් සභාවේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ අදාළ ලේඛන පරීක්ෂා කිරීම, සාක්ෂිකරුවන් අභිදැක්ම සිදුකිරීම සහ පරීක්ෂණ කොමිෂන් සභාවේ විමර්ශන සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම මඟින් පරීක්ෂණ කොමිෂන් සභාවට සහයෝගය ලබාදුන්හ.

ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් කණ්ඩායමක් පරීක්ෂණ කොමිෂන් සභාවේ මෙහෙයවීම සහ අධීක්ෂණය යටතේ විමර්ශන සිදුකරමින් සහ ප්‍රකාශ සටහන් කර ගැනීම මඟින් පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය ලබාදුන්හ.

විමර්ශනය කෙරෙන කාරණයට සම්බන්ධතාවයක් පවතින හෝ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන පුද්ගලයන්ට පරීක්ෂණ කොමිෂන් සභාව තුළ පෙනී සිටිය හැකි අතර එවැනි පුද්ගලයින් විමර්ශනයේදී නීතිඥවරයෙකු මඟින් පෙනී සිටීම සුදුසු යැයි සලකන විට නීතිඥයන් මාර්ගයෙන්ද පෙනී සිටිය හැකි බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 16වන වගන්තිය ප්‍රකාරව අවස්ථාවක් ලබා දෙන බැවින් එයට අනුකූලව ඇතැම් පුද්ගලයන් නීතිඥයන් සමග පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියහ.

පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු ආරම්භ වූයේ ඊට ලබාදී තිබූ කාර්යට අදාළව මහජන අදහස් විමසීම අරබයා භාෂා තුනෙන්ම පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත් කිරීමත් සමඟිනි. 2019 සැප්තැම්බර් 30ස් වන දින එම නිවේදන ප්‍රසිද්ධ කරන ලදි. (ඇමුණුම ii) ලබා දී තිබූ අවසන් දිනය වන විට මහජන නියෝජනයන් 71ක් ලැබී තිබිනි. කෙසේ වෙතත්, නියමිත දිනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවද ස්වකීය නිල කාලය අවසන් විමට පෙර ඉදිරිපත් වු මහජන නියෝජනයන් පිළිගැනීමට පරීක්ෂණ කොමිෂන් සභාව තීරණය කලේය.

කොමිෂන් සභාවේ කටයුතු ආරම්භ වූයේ එහි කාර්ය භාරයේ කොටසක් වූ පරීක්ෂණවලින්ය. විමර්ශන කණ්ඩායම විසින් ප්‍රකාශ 1588 ක් වාර්තා කරන ලදී. ප්‍රකාශවල ඇති සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව කොමිසම සාක්ෂිකරුවන් 457 දෙනෙකු ගෙන් සාක්ෂි විභාග කලේය. ඔවුන්ගේ සාක්ෂි පිටු 37,314 කට අධික සංඛ්‍යාවක සටහන්වී ඇත. පොත් 206 ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටිගත කිරීම් ඇතුළු ලේඛන 2377 ක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් වී තිබේ. මෙම වාර්තාව සකස් කිරීම සඳහා මෙම සාක්ෂි, ලේඛන සහ ශ්‍රව්‍ය පටිගත කිරීම් විස්තරාත්මකව පරිශීලනය කර ඇත. අප විසින් සකස් කරන ලද වාර්තාව 1 වන වෙළුමේ අඩංගු වන අතර එය පරිච්ඡේද 32 කින් සමන්විත වේ. විෂය පථය තුළ දක්වා ඇති නිශ්චිත ගැටළු පිළිබඳ අපගේ නිගමනය වාර්තාවේ 30 වන පරිච්ඡේදයේ අඩංගු වේ. අපගේ නිර්දේශ 31 වන පරිච්ඡේදයේ දක්වා ඇත. කෙටි විධායක සාරාංශයක් 32 වන පරිච්ඡේදයේ අඩංගු වේ. වාර්තාවේ 2 වන වෙළුමේ පළමු කොටසෙහි විවෘතව ලබා ගත් සාක්ෂි අඩංගු වේ. සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වන පරිච්ඡේදය) තුළ දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව දෙවන වෙළුමේ දෙවන කොටසෙහි ලබාගත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අඩංගු වේ. දෙවන වෙළුමේ III වන කොටසෙහි අඩංගු සාක්ෂිවලින් කොටසක් සාක්ෂිකරුවන් විසින් විවෘතව ලබාදී ඇති අතර එම සාක්ෂිකරුවන් විසින්ම තවත් සාක්ෂිවලින් කොටසක් රහසිගතව ලබාදී තිබේ. වාර්තාවේ 3 වන වෙළුමේ "සී" ලෙස සලකුණු කරන ලද ලේඛන අඩංගු වේ. 4 වන වෙළුමේ "X" ලෙස සලකුණු කර ඇති ලේඛන අඩංගු වේ. 5 වන වෙළුමේ සාක්ෂිකරුවන් වෙනුවෙන් ඔවුන්ගේ නීතිඥයින් විසින් හෝ සාක්ෂිකරු විසින් පෞද්ගලිකව ඉදිරිපත් කරන ලද ලේඛන අඩංගු වේ. 6 වන

වෙළුමේ සලකුණු කළ ලේඛන දර්ශකය අඩංගු වේ. "X" ලෙස සලකුණු කර ඇති ලියකියවිලි රජයේ බුද්ධි අංශ හරහා ලබාගත් තොරතුරු වර්ගීකරණය කොට දක්වා ඇති බව අපි ඔබතුමාන්ගේ අවධානය යොමු කරමු. තවද බුද්ධි අංශ හා බුද්ධි තොරතුරු ඇතුළු ජාතික ආරක්ෂාවට අදාළ සාක්ෂි, සාක්ෂිකරුවන් විසින් ලබාදෙනවිට ඒවා රහසිගතව ලබා ගන්නා ලදි. වාර්තාව ප්‍රසිද්ධ කිරීමට තීරණය කිරීමට පෙර මේ කරුණු සලකා බැලිය යුතු යැයි අපි ඉතාමත් ගෞරවයෙන් යුක්තව නිර්දේශ කිරිමට කැමැත්තෙමු.

සංශෝධිත **1948** අංක **17** දරන (සංශෝධිත) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ **2 (6)** උප වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා අනුව මෙහි පහතින් සහ වාර්තාවේ අවසානයට අත්සන් කරනු ලබන අප විසින් පහත වාර්තාව උතුමාණන් වෙත බාර දීමට කැමැත්තෙමු.

වර්ෂ **2021** ක් වූ ජනවාරි මස **31** වෙනි දින.

අත්සන් කළේ/
විනිසුරු ජනක් ද සිල්වා
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර,
පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති

අත්සන් කළේ/
විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න
අභියාචනාධිකරණ විනිශ්චයකාර

අත්සන් කළේ/
විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ
විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර

අත්සන් කළේ/
විශ්‍රාමික මහාධිකරණ විනිශ්චයකාර
අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු

අත්සන් කළේ/
විශ්‍රාමික අමාත්‍යංශ ලේකම්
ඩබ්ලිව්. එම්. එම්. ආර්. අධිකාරි

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පිළිගැන්වීම | |
| කාර්ය මණ්ඩලය | |
| කෙටි යෙදුම් | |
| පළමු වන පරිච්ඡේදය - හැඳින්වීම | 01 |
| 02 වන පරිච්චේදය - අන්තවාදයේ සිට ත්‍රස්තවාදයට දක්වා | 09 |
| 03 වන පරිච්ඡේදය - ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව | 21 |
| 04 වන පරිච්ඡේදය - වහබ්වාදය | 36 |
| 05 වන පරිච්ඡේදය - ශ්‍රී ලංකාවේ වහබ්වාදය | 42 |
| 06 වන පරිච්ඡේදය - දකුණු ආසියාවේ සහ ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍ය | 65 |
| 07 වන පරිච්ඡේදය - සහරාන් හෂීම්ගේ මුල් වකවානුව | 79 |
| 08 වන පරිච්ඡේදය - සැබවී සිටි සහරාන් | 90 |
| 09 වන පරිච්ඡේදය - මාවනැල්ල සිට වනාතවිල්ලුව දක්වා | 112 |
| 10 වන පරිච්ඡේදය - පුහුණු කඳවුරු සහ ආරක්ෂක නිවස්න | 128 |
| 11 වන පරිච්ඡේදය - ප්‍රහාර සඳහා සූදානම | 140 |
| 12 වන පරිච්ඡේදය - මගහැරුණු අවස්ථා | 155 |
| 13 වන පරිච්ඡේදය - පූර්ව අනතුරු ඇඟවීම් | 167 |
| 14 වන පරිච්ඡේදය - ප්‍රහාර | 194 |
| 15 වන පරිච්ඡේදය - ට්‍රොපිකල් ඉන් පිපිරීම | 211 |
| 16 වන පරිච්ඡේදය - ප්‍රධාන පාර්ශ්වකාර පුද්ගලයින්ගේ විස්තර | 224 |
| 17 වන පරිච්ඡේදය - විදේශීය මැදිහත්වීම | 243 |

18 වන පරිච්ඡේදය - ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය (SLJI) 253

19 වන පරිච්ඡේදය - වගවීම 272

20 වන පරිච්ඡේදය - නීතිය බලාත්මක කරන බලධාරීන්ගේ අතින් සිදුවූ අතපසුවීම් 321

21 වන පරිච්ඡේදය - නීතිපති දෙපාර්තමේන්තුව 363

22 වන පරිච්ඡේදය - සහදායක සාදකයන් 370

23 වන පරිච්ඡේදය - ප්‍රතිත්‍රස්ත නීතිය 384

24 පරිච්ඡේදය - අකර්මන්‍ය වූ රජය 391

25 වන පරිච්ඡේදය - අන්තවාදී ආගමික කණ්ඩායම් 398

26 වන පරිච්ඡේදය - වින්දිතයින් සඳහා වන්දි, සුභසාධන පියවර සහ සහන වැඩසටහන් 417

27 වන පරිච්ඡේදය - පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම 431

28 වන පරිච්ඡේදය - ආගමික සිද්ධස්ථාන ස්ථාපිත කිරීම 458

29 වන පරිච්ඡේදය - ෆෙටෝ 464

30 වන පරිච්ඡේදය - නිගමන 474

31 වන පරිච්ඡේදය - නිර්දේශ 477

32 වන පරිච්ඡේදය - විධායක සාරාංශය 518

ඇමුණුම 01 - නියෝගය සහ සංශෝධන

ඇමුණුම 02 - මහජන අදහස් කැඳවීමේ පුවත්පත් නිවේදනය

ඇමුණුම 03 - 2020 ඔක්තෝබර් මස 22 වන දින සාක්ෂි සටහන්

ඇමුණුම 04 - 2019 අප්‍රේල් 09 දිනැති ලිපිය

ඇමුණුම 05 - සළකුණු කරන ලද ලේඛන C4(A) – C4(C)

ඇමුණුම 06 - සළකුණු කරන ලද ලේඛන C4

ඇමුණුම 07 - ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත

ඇමුණුම 08 - ව්‍යවස්ථාපිත අධිකරණ නීර්ණ

ඇමුණුම 09 - මද්‍රසා අධ්‍යාපන ආඥාපනත - බංග්ලාදේශය

ඇමුණු 10 - ආගමික සහජීවනය පවත්වාගෙන යාමේ පනත - සිංගප්පූරුව

# කොමිෂන් සභා කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 01 | එච්.එම්.බී.පී.හේරත් මහතා | ලේකම් |
| 02 | ඩී.ඒ.දූමේන්ද්‍රවංශ මහතා | පරිපාලන නිලධාරි |
| 03 | හසිනි රුවහාරි මූකන්දගේ මෙනෙවිය | නීති නිලධාරි |
| 04 | එම්.විමල් ශාන්ත ද සිල්වා මහතා | භාෂණ පරිවර්තක (මුඩලියර්) |
| 05 | ජෝන් කන්දසාමි මහතා | භාෂා පරිවර්තක (දෙමළ -සිංහල) |
| 06 | ඩී.වයි.සුසන්ත රත්නවීර මහතා | සංවර්ධන නිලධාරි |
| 07 | එච්.ඒ.ගීතිකා ලක්මාලි මහත්මිය | සංවර්ධන නිලධාරි |
| 08 | ඩබ්.එම්.ඩී.ප්‍රභාත් මහතා | සංවර්ධන නිලධාරි |
| 09 | එච්.සී.රුවිනි නිසංසලා ප්‍රනාන්දු මහත්මිය | සංවර්ධන නිලධාරි |
| 10 | ටී. චේතනා සඳමාලි මහත්මිය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර |
| 11 | ඊ. සූරවංශ මහතා | පර්යේෂණ නිලධාරි |
| 12 | බී. චන්ද්‍රිකා මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| 13 | ඒ.ඩබ්.එම්.අයි. නිරූපා ද සිල්වා මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි (ලඝුලේඛිකා - ඉංග්‍රීසි) |
| 14 | එච්.එම්.ඉන්ද්‍රානි හේරත් මැණිකේ මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි (ලඝුලේඛිකා - සිංහල) |
| 15 | සී.ඩී. දසනායක මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| 16 | ජේ.එන්.පී.කළුතොටගේ මහතා | කළමනාකරණ සේවා නිලධාරි |
| 17 | ඩී.එම්.එන්.එන්. කුමාරි දිසානායක මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| 18 | ඩී.ඒ.එම්.සුභාෂිණී දසනායක මෙනෙවිය | කළමනාකරණ සේවා නිලධාරි |
| 19 | ආර්.පී.එම්.සී.රාජපක්ෂ මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි |

| | | |
|---|---|---|
| 20 | කේ.එම්.ධම්මිකා උපශාන්ති පෙරේරා මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි (ලසුලේඛිකා - සිංහල) |
| 21 | එස්.ඩී.බෙරුගොඩ මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි (ලසුලේඛිකා - ඉංග්‍රීසි) |
| 22 | එම්.ඩී.එම්.යමුනා සඳසැලි දසනායක මහත්මිය | කළමනාකරණ සේවා නිලධාරි (ලසුලේඛිකා - සිංහල) |
| 23 | කේ.එම්.චන්දිමා දිල්හානි මෙනෙවිය | කළමනාකරණ සේවා නිලධාරි (ලසුලේඛිකා - සිංහල) |
| 24 | ඩී.ජී.නිල්මිණි කුමාරි මෙනෙවිය | කළමනාකරණ සේවා නිලධාරි (ලසුලේඛිකා - සිංහල) |
| 25 | පී.ජී.සචිනි මධුෂිකා සෙව්වන්දි මෙනෙවිය | කළමනාකරණ සේවා නිලධාරි (ලසුලේඛිකා - සිංහල) |
| 26 | ඩබ්.යූ.නන්දන රොද්‍රිගෝ මහතා | ශබ්ද පරිපාලක |
| 27 | එන්.පී.ආර්.ප්‍රසන්න හේමදාස මහතා | රියදුරු |
| 28 | එච්.කේ.ඩී.ආර්. සම්පත් මහතා | කාර්යාල කාර්ය සහායක -I |
| 29 | ජී.ජී.ඩී.කේ.බණ්ඩාර මහතා | කාර්යාල කාර්ය සහායක -III |
| 30 | ටී.එම්.තිලාන් ධනුෂ්ක ජයතිලක මහතා | කාර්යාල කාර්ය සහායක -III |
| 31 | ආර්.කුයින්ටස් ප්‍රනාන්දු මහතා | කාර්යාල කාර්ය සහායක |
| 32 | ආර්.එම්. සෝමරත්න මහතා | කාර්යාල කාර්ය සහායක |

## නීතිපති දෙපාර්තමේන්තුවේ කණ්ඩායම

| අ.අංක | නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.බී.ඒ.ජිනසේන මෙනෙවිය | අතිරේක සොලිසිටර් ජනරාල් |
| 02 | එස්. දිසානායක මහතා | ජ්‍යෝෂ්ඨ රජයේ අධිනීතිඥ |
| 03 | එස්.පී.එච්.ජයවීර මහත්මිය | ජ්‍යෝෂ්ඨ රජයේ අධිනීතිඥ |
| 04 | නයනා සෙනවිරත්න මහත්මිය | ජ්‍යෝෂ්ඨ රජයේ අධිනීතිඥ |
| 05 | ඒ.එන්.කේ ද අල්විස් මෙනෙවිය | රජයේ අධිනීතිඥ |
| 06 | සී.ඩී.එස්.බණ්ඩාර මහතා | රජයේ අධිනීතිඥ |
| 07 | කේ.ඩී. සම්පත් මහතා | රජයේ අධිනීතිඥ |
| 08 | කේ.එස්.අරීන්ද්‍ර ජයසිංහ මහතා | රජයේ අධිනීතිඥ |

## විමර්ශන අංශය

| | | |
|---|---|---|
| 01 | ඩබ්.එම්.ආර්.මහේෂ් වැලිකන්න මහතා | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති |
| 02 | ප්‍රියන්ත ලියනගේ මහතා | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි |
| 03 | පී.කේ.සේරසිංහ මහතා | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි |
| 04 | ජී.ඩී.ස්ටැනිස්ලෝස් මහතා | විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි |
| 05 | කේ.ඒ.ආර්.ඩබ්.කුමාරපේලි මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 06 | පී.එම්.ඒ.මාහින්කන්ද මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 07 | ආර්.කේ.තිරුනාවුකරසු මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 08 | ඒ.ජී.අලුත්ගෙදර මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 09 | ඩබ්.පී.එස්.ඩී.විජේසිංහ මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 10 | ඩබ්.එම්.ඩී.වීරසිංහ මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 11 | ටී.බී.එස්.කල්‍යානතුංග මහතා | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| 12 | ජේ.එම්.එස්.ජයමහමුදලි මහතා | පොලිස් පරීක්ෂක |
| 13 | ඒ.එම්.එන්.පී.අදිකාරම් මහතා | පොලිස් පරීක්ෂක |
| 14 | එම්.ඩී.සී.එන්.ගුණතිලක මහතා | පොලිස් පරීක්ෂක |
| 15 | ආර්.ඒ.ජේ. ජනිත කුමාර මහතා | පොලිස් පරීක්ෂක |
| 16 | ටී.එන්.සිල්වා මහතා | පොලිස් පරීක්ෂක |
| 17 | ජී.නිලූකා දිල්රුක්ෂි මහත්මිය | කාන්තා පොලිස් පරීක්ෂක |
| 18 | ටී.එම්.පී.බී.තෙන්නකෝන් මහතා | උප පොලිස් පරීක්ෂක |
| 19 | එච්.ඩී.එස්.එස්. සම්පත් මහතා | උප පොලිස් පරීක්ෂක |
| 20 | එන්.ටී.එස්.එන්.ප්‍රසාද් මහතා | උප පොලිස් පරීක්ෂක |
| 21 | එල්.ඩී.ජේ.ආර්. නානායක්කාර මහතා | පොලිස් සැරයන් -26513 |
| 22 | පී.ඒ.ජී.එන්.විජේවීර මහතා | පොලිස් සැරයන් -47232 |
| 23 | එල්.ඒ.මහින්දසෝම මහතා | පොලිස් සැරයන් -12926 |
| 24 | ජී.ඩබ්.ගුණසේකර මහතා | පොලිස් සැරයන් -25322 |
| 25 | කේ.එම්.ජී.කුමාර මහතා | පොලිස් සැරයන් - 30328 |

| | | |
|---|---|---|
| 26 | ආර්.ඩබ්.සී.එන්. ද සිල්වා මහතා | පොලිස් සැරයන් - 34908 |
| 27 | බී. නිහාල් මහතා | පොලිස් සැරයන් -34772 |
| 28 | කේ.ඒ.පී.අයි.අබේරත්න මහතා | පොලිස් සැරයන් -62355 |
| 29 | එච්.එස්.ප්‍රියන්ත මහතා | පොලිස් සැරයන් -3819 |
| 30 | එන්.එම්.එස්.එස්.නිශ්ශංක මහතා | පොලිස් සැරයන් -44871 |
| 31 | එම්.ඒ.ආර්.ජයතිලක මහතා | පොලිස් කොස්තාපල් -68979 |
| 32 | ආර්.එම්.ඩී.එල්.රත්නායක මහතා | පොලිස් කොස්තාපල් -69666 |
| 33 | එච්.රෝෂාන් ජයතිලක මහතා | පොලිස් කොස්තාපල් -70215 |
| 34 | ඩබ්.ජේ.එස්.විජේසේන මහතා | පොලිස් කොස්තාපල් -71831 |
| 35 | එස්.එම්.එස්.කුමාර මහතා | පොලිස් කොස්තාපල් -78185 |
| 36 | ටී.එම්.එන්.පී.තෙන්නකෝන් මහතා | පොලිස් කොස්තාපල් -87154 |
| 37 | ටී.එස්.වික්‍රමතිලක මහතා | පොලිස් කොස්තාපල් -91689 |
| 38 | ජේ.දූරිතා මහත්මිය | කාන්තා පොලිස් කොස්තාපල් - 6723 |
| 39 | එම්.ටී.එම්.යූ.එල්.ඒකනායක මහත්මිය | කාන්තා පොලිස් කොස්තාපල් -8588 |
| 40 | එස්.කේ.ඩී.එම්.ඒ.බණ්ඩාර මහත්මිය | කාන්තා පොලිස් කොස්තාපල් -9930 |
| 41 | කේ.පී.අයි.ගුණවර්ධන මහතා | පොලිස් කොස්තාපල් රියදුරු -15656 |
| 42 | ජී.ඒ.එම්.කොළඹගේ මහතා | පොලිස් කොස්තාපල් රියදුරු - 16115 |
| 43 | එම්.ඩබ්.එස්.අයි.සමරනායක මහතා | පොලිස් කොස්තාපල් රියදුරු - 80655 |
| 44 | කේ.එම්.එම්.විජේරත්න මහතා | පොලිස් කොස්තාපල් රියදුරු - 80676 |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ACJU | All Ceylon Jamayyathul Ulma |
| ACTJ | All Ceylon Thowheed Jamath |
| ASP | Assistant Superintendent of Police |
| BBS | Bodu Bala Sena |
| CI | Chief Inspector of Police |
| CDS | Chief of Defence Staff |
| CNI | Chief of National Intelligence |
| COI | Commission of Inquiry |
| CTU | Counter Terrorism Unit |
| CID | Criminal Investigation Department |
| DIG | Deputy Inspector General |
| DMI | Directorate of Military Intelligence |
| FETO | Fethullah Gulen Organization |
| FCID | Financial Crimes Investigation Department |
| GOSL | Government of Sri Lanka |
| IGP | Inspector General of Police |
| IP | Inspector of Police |
| ICM | Intelligence Coordinating Meeting |
| IS | Islamic State |
| ISIS | Islamic State of Iraq and Sham |
| IASWJ | Isthihad Ahlul Sunnath Wal Jamath |
| JASM | Jamaath Ansari Sunnathul Mohammadiya |
| JMI | Jamaathe Millathi Ibrahim |
| MOD | Ministry of Defense |
| MOFA | Ministry of Foreign Affairs |
| NIB | National Intelligence Bureau |
| NSC | National Security Council |
| NTJ | National Thowheed Jamath |

| | |
|---|---|
| PC | Police Constable |
| PTA | Prevention of Terrorism Act No.7 of 1979 |
| Sgt | Sargent of Police |
| PSC | Select Committee of Parliament of the Easter Attack |
| SDIG | Senior Deputy Inspector General |
| SSP | Senior Superintendent of Police |
| STF | Special Task Force |
| SLJI | Sri Lanka Jamaat – E- Islami Organisation |
| SLJISM | Sri Lanka Jamaat- E-Islami Student Movement |
| SLTJ | Sri Lanka Thowheed Jamath |
| SIS | State Intelligence Service |
| SI | Sub-Inspector of Police |
| SP | Superintendent of Police |
| TID | Terrorist Investigation Department |
| WAMY | World Assembly of Muslim Youth |

එකම පුද්ගලයා පිළිබඳ මෙම වාර්තාවේ ස්ථාන කිහිපයක සඳහන්වී ඇත. ඉඩකඩ භාවිතය සීමාකිරීම සඳහා එවැනි පුද්ගලයන්ගේ නම්වල කෙටි යෙදුම් ලැයිස්තුවක් සහරාන්ගේ කණ්ඩායම තුළ භාවිතා වූ ඔවුන්ගේ නම්ද සමඟ මෙහි දක්වා ඇත. මෙහි කෙටි යෙදුම මුලින් දක්වා ඇති අතර ඉන් පසුව සම්පූර්ණ නමද අවසානයේ සංවිධානය තුළ භාවිතා කළ නමද සඳහන් කොට ඇත.

1. සහරාන් - මොහොමඩ් කාසිම් මොහොමොඩ් ජහරාන් - අබු උබයිදා
2. නවුෆර් - මොහොමඩ් ඉබ්‍රාහිම් මොහොමොඩ් නවුෆර් - අබු ෂායිඩ්
3. රිල්වාන් - මොහොමඩ් කාසිම් මොහොමොඩ් රිල්වාන් - අබු ජල් අල් කිතාල්
4. ෂයිනි - මොහොමඩ් කාසිම් මොහොමොඩ් ෂයිනි
5. මිල්හාන් - හයතු මොහොමඩ් අහමඩ් මිල්හාන් - අබු සිලා/අබු හලිත්
6. ඉල්හාම් - මහමද් ඉබ්‍රාහිම් ඉල්හාම් අහමඩ් - අබු බරා
7. ඉන්ෂාෆ් - මොහොමඩ් ඉබ්‍රාහිම් ඉන්ෂාෆ් අහමඩ්
8. සාදික් - මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා - අබු උමර්
9. හස්තුන් - අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තුන් - අබු මොහොමඩ්

10. ජමීල් - අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් - අබු හම්සා
11. මුවාත් - අලව්ඩීන් අහමඩ් මුවාත්
12. ෂාහිඩ් - මොහොමඩ් ඉබ්‍රාහිම් අබ්දුල් හක් - අබු ෆලා
13. මුබාරක් - මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් - අබු අබ්දුල්ලා
14. ගෆූර් මාමා - මොහොමඩ් සරීබු ආදම් ලෙබ්බේ
15. අසාඩ් - මොහොමඩ් නසාර් මොහොමඩ් අසාඩ් - අබු මුක්තාර්
16. ආමි මොහොදීන් - බදූර්දීන් මොහොමඩ් මොහිදීන්
17. නියාස් - අහමඩ් ලෙබ්බේ මොහොමඩ් නියාස්
18. හාදියා - අබ්දුල් කාදර් ෆාතිමා හාදියා
19. සාරා - මහේන්ද්‍රන් පුලස්තිනී ආකා සාරා ජස්මින්
20. ඔමර් කතා - ෆාතිමා ෂිෆානා ඔමර්කතා

පළමු වන පරිච්ඡේදය

## හැඳින්වීම

අප්‍රේල් මාසය යනු ශ්‍රී ලංකිකයන් බහුතරයක් විසින් උත්සව සැමරුම් කරනු ලබන මාසයකි. සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද අප්‍රේල් මාසයේ මැද භාගය දක්වා සමරනු ලබයි. මෙම කාලය පවුල් එකට එක්වී අලුත් අවුරුදු උදාව සමරමින් සිටින කාල වකවානුවකි. එමෙන්ම මෙම කාල වකවානුවේදී පාස්කු ඉරු දිනය සැමරීම කිතුණු භක්තිකයන්ගේ ආගමික අංගයක් වේ.

2019 අප්‍රේල් 21 වන දිනය තවත් එක් දිනයක උදාවක් වූ අතර ශ්‍රී ලාංකිකයන් බහුතරයක් ඔවුන්ගේ පවුල් සමඟ සතුටින් කාලය ගත කරමින් සිටියහ. කිතුණු භක්තිකයන් පාස්කු ඉරු දින සමරමින් සිටින අවස්ථාවකදී ඔවුන් හට ඉමහත් වූ ඛේදනීය තත්ත්වයකට මුහුණදීමට සිදුවිය. බෝම්බ පිපිරීම් හේතුකොටගෙන ප්‍රමුඛ පෙළේ හෝටල් තුනකට, ප්‍රසිද්ධ කිතුණු දේවස්ථාන තුනකට සහ වෙනත් ස්ථාන දෙකකට හානි සිදුවිය. මෙම බෝම්බ පිපිරීම්වලින් ළමුන් ඇතුළුව මිනිසුන් සිය ගණනක් මරණයට පත්වූ අතර සිය ගණනකට අධික ප්‍රමාණයක් තුවාල ලැබූහ.

යුද්ධය අවසාන වී වසර 10කට පසු, ත්‍රස්තවාදයේ කුරිරු මුහුණත ජාතියට දැක ගැනීමට හැකි විය.

ප්‍රහාරයෙන් ඉක්බිතිව ඒ සම්බන්ධයෙන් සොයාබැලීමට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කළ අතර ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ විජිත් මලල්ගොඩ මහතා එහි සභාපති ධූරය දැරුවේය. මෙම කමිටුවේ අනාවරණයන්ට අමතරව විමර්ශන කොමිෂන් සභාවක් පත්කිරීමද නිර්දේශ කර ඇත. ඉන් අනතුරුව මෙම සිදුවීම් සොයාබැලීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ද පත් කරන ලදි.

වරින් වර සංශෝධිත විමර්ශන කොමිෂන් සභා පනතේ දෙවන වගන්තියේ (393 වන පරිච්ඡේදයේ) විධානයන්ට අනුව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 සැප්තැම්බර් 21 වන දින ජනාධිපති අධිකාර පත්‍රයක් නිකුත් කර ඇත. මෙමගින් අප

කොමසාරිස්වරුන් ලෙස පත් කරමින් විමර්ශනය සහ පරීක්ෂා කිරීම, අනාගත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සහ අධිකාර පත්‍රයේ දක්වා ඇති කාරණාවලට අනුව වාර්තා කිරීම සඳහා බලය පවරා ඇත.

2019 සැප්තැම්බර් 23 වන දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අප වෙත පත්වීම් ලිපි ලබා දෙන ලදි. කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීම සහ විනිසුරු විජිත් මලල්ගොඩ කමිටුවේ නිර්දේශ මත විමර්ශන කොමිෂන් සභාව පත් කළ බව ඔහු විසින් දැනුම් දෙන ලදි.

කොමිසමේ ලේකම්වරයා ලෙස බුවනෙක හේරත් මහතා පත් කරන ලදි.

විමර්ශන කොමිෂන් සභාවේ කාර්යාලය ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව යොදාගත් අතර කොමිෂන් සභාවට පවරා ඇති භාරදූර කාර්යය ඉටු කිරීම සඳහා විශාල කාර්ය මණ්ඩලයක් අවශ්‍ය විය.

අපගේ පළමු රැස්වීම 2019 ඔක්තෝම්බර් මස පළමු වන දින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, ස්ථාපිත බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පස්වන කොටසේ පළමු මහලේ පවත්වන ලදි. සංශෝධනය කරන ලද විමර්ශන කොමිෂන් සභා පනතේ (393 පරිච්ඡේදය) 23 වන වගන්තිය යටතේ මෙම කොමිසමේ විමර්ශන සහ පරීක්ෂණ සඳහා රජයේ නිලධාරින්ගේ සහාය ලබා ගැනීමට කොමිෂන් සභාවට බලය පැවරී තිබුණි. මෙහි කඩිනමින්ම කළ යුතු කාර්යභාරය වූයේ විමර්ශන කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා සහායවීමට නිලධාරීන් කණ්ඩායමක් පත් කර ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබාදීමය.

මෙම ක්‍රියාවලිය මඳක් ප්‍රමාදවීමට, ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කර තිබීම සහ කලින් පැවැති විමර්ශන කොමිෂන් සභාව මෙම කාර්යාල පරිශ්‍රය තුළ තව දුරටත් කෙටි කාලයක් ක්‍රියාත්මක වීමට බලාපොරොත්තු වීම හේතු විය.

ඉන් අනතුරුව විමර්ශන කොමිෂන් සභාව නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, ජනාධිපති ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය සහ ප්‍රවෘත්ති

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ සහාය ලබා ගන්නා ලදි. අදාළ වක්‍ර ලේඛන අනුව අතිරේක කාර්ය මණ්ඩලය බඳවා ගන්නා ලදි.

ඊට අමතරව විමර්ශන කොමිෂන් සභාව විසින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මූල්‍ය බුද්ධි අංශය, ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව සහ විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධාරීන්ගේ සහයෝගය ලබා ගන්නා ලදි.

විමර්ශන කොමිෂන් සභාව පත් කරන විට එයට ලබාදී තිබුණේ සාමාන්‍යයෙන් වෙනත් විමර්ශන කොමිෂන් සභාවලට ලබාදී ඇති බලතල පමණි. කෙසේ නමුත් එයට පැවරී ඇති බලතල පරීක්ෂා කිරීමෙන් අනතුරුව බලතල ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා කොමිෂන් සභා පනතේ 08 වන වගන්තිය (393 පරිච්ඡේදය) යටතේ අමතර බලය ඉල්ලා සිටිය යුතු බව අපගේ අදහස විය. එම ඉල්ලීම පරිදි කටයුතු සිදු විය.

මෙම කොමිෂමට පැවරී ඇති කාර්යයභාරයට අනුකූලව රාජ්‍ය නිලධාරින්/රාජ්‍ය සේවකයින් හෝ වෙනත් පුද්ගලයින්ට විරුද්ධව මහජන පැමිණිලි, තොරතුරු සහ අනෙකුත් කරුණු කැඳවීම, ලබා ගැනීම මෙම කොමිෂන් සභාවට බලතල හිමිවිය. ඒ අනුව 2019 සැප්තැම්බර් 30 වන දින භාෂා තුනෙන්ම දිනමිණ, දිවයින, ලංකාදීප, අරුණ, මව්බිම, තිනකරන්, වීරකේසරි, ද අයිලන්ඩ් පුවත්පත, ඩේලි මිරර් පුවත්පත සහ සිලෝන් ටුඩේ පුවත්පත්වල දැන්වීම් පළ කරන ලදි (උප ග්‍රන්ථය II ). 2019 ඔක්තෝම්බර් 06 වන ඉරු දින ලංකාදීප, තිනකරන් සහ සන්ඩේ ඔබ්සර්වර් යන පුවත්පත්වල එම දැන්වීම නැවත පළ කරන ලදි.

නියමිත දිනයට සමස්තයක් ලෙස මහජනතාවගේ ප්‍රතිචාර 71 ක් ලැබී තිබුණි. කෙසේ වුවද නියමිත දිනට යෝජනා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමද සැලකිල්ලට ගෙන විමර්ශන කොමිසම් සභාව තීරණය කරන ලද්දේ එහි මුළු කාල සීමාව තුලම පැමිණිලි භාර ගැනීමයි. විමර්ශන කොමිෂන් සභාවට කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙතින් ද කරුණු දැක්වීමක් ලැබුණි.

මෙලෙස විමර්ශන කොමිෂන් සභාව පත් කිරීමට එක් හේතුවක් ලෙස කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් කරන ලද ඉල්ලීම බව ජනාධිපතිවරයා විසින් දැනුම් දී තිබූ බැවින් එම දැනුම්දීම සැලකිල්ලට ගනිමින් විමර්ශනයේ පළමු වන දිනයේ සිටම එතුමා වෙනුවෙන් නීතිඥ නියෝජනයක් ලබා දීමට තීරණය කරන ලදි. ඒ අනුව, ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා සහ නීතිඥ කණ්ඩායමක් කැමරා සාක්ෂි ඇතුළු සාක්ෂි ලබාගැනීමේ මුළු කාල සීමාව තුළම කොමිෂම ඉදිරියේ පෙනී සිටින ලදි.

කොමිසමට ලැබුණු සියලුම කරුණු දැක්වීම් පළමුව සමාලෝචනය කිරීමට තීරණය කරන ලදි. ඉන් අනතුරුව විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් කිරීමට ප්‍රතිචාර දැක්වූ අයට අවස්ථාව ලබාදීමට තීරණය කරන ලදි. පසුව විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙය විය යුතුද යන්න පිළිබඳව තීරණයක් ගන්නා ලදි. මෙම ක්‍රියාපටිපාටිය මඟින් අදාළ නොවන කරුණු බැහැර කිරීමට විමර්ශන කොමිෂන් සභාවට හැකි විය.

විමර්ශන කොමිෂන් සභා පනතේ 26 වන වගන්තිය (393 වන පරිච්ඡේදය) සංශෝධනය කර ඇති පරිදි නීතිපතිවරයා සිය බලතල ක්‍රියාත්මක කළ අවස්ථාවේදී වැදගත් තීරණයක් ගැනීමට විමර්ශන කොමිෂන් සභාවට සිදුවිය. නීතිපතිවරයා වෙනුවෙන් කොමිසම ඉදිරියේ පෙනී සිටි ජනාධිපති නීතිඥ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා විසින් පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවේ හෝ රැඳවුම් භාරයේ සිටින ඕනෑම පුද්ගලයෙකු සාක්ෂිකරුවෙකු ලෙස විමර්ශන කොමිසමට කැඳවීම පිළිබඳව විරෝධතාවය ප්‍රකාශ කරන ලදි.

උගත් ජනාධිපති නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද සම්පූර්ණ කරුණු ඉදිරිපත් කිරීම උප ග්‍රන්ථයේ (III)හි දැක්වේ. එහි කොටසක් පහත පරිදි දැක්විය හැකිය.

*"ගරු සභාපතිතුමනි, ගරු කොමසාරිස්තුමනි, කොමසාරිස්තුමියනි බොහෝම ස්තුතියි මට නීතිපතිතුමා වෙනුවෙන් එතුමා වෙනුවෙන් මෙම පනතේ 26 වන*

*වගන්තිය ප්‍රකාරව සැලකිරීමක් කිරිමට අද අවස්ථාව ලබාදීම ගැන. මම මේ අවස්ථාව නිතිපතිතුමාගේ උපදෙස් පිට යොදාගනු ලබන්නේ වැදගත් නිතිමය සහ සිද්ධිමය කාරණයක් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අද දින සහ මින් ඉදිරියට මට දැනගන්න ලැබෙනවා මේ වන තෙක් සැකකරුවන් ලෙස හෝ සැකකාරියන් ලෙස විමර්ශකයන් විසින් අත්අඩංගුවේ තබාගෙන සිටි යම් සැකකරුවන් ඔබතුමන්ලාගේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන් ලෙස කැඳවීමට යම් සූදානමක් තිබෙන විත්තිය ගරු නිතිපතිතුමාට දැනගන්නට ලැබී තිබෙනවා. ඉතිං ගරු නීතිපතිතුමා වෙනුවෙන් ඔබතුමාලා ඉදිරියේ මා කරන දේශනයේ මුඛ්‍ය පරමාර්ථය හේතුවෙන් කෙටියෙන් සඳහන් කරනවා නම් සියලුම නීතිමය සහ අනෙකුත් කාරණා සලකා බලන විට සාක්ෂිකරුවන් ලෙස හෝ වෙනත් ආකාරයකින් මෙම සැකකරුවන් කැඳවීම අනාගතයේ දවසක නීතිපතිතුමා මා වෙතට විතරක්ම පැවරෙන නඩු පැවරීමේ බලයක් පැමිණිල්ල මෙහෙයවීමේ බලයටත් ප්‍රබල අගතියක් සිද්ධ වෙනවා. ඒ නිසා මගේ අවසාන ඉල්ලීම වන්නේ ඒ ඉල්ලීම ප්‍රකාරව මේ ආකාරයෙන් විමර්ශකයන් භාරයේ පොලීසිය භාරයේ රඳවා නියෝග ගැනීම මත රඳවා සිටින යම් යම් සැකකරුවන් මේ කොමිෂන් සභාව ඉදිරියේ දී සාක්ෂිය සඳහා කවර ආකාරයෙන් හෝ කැඳ නොවන ලෙස."*

ඉදිරිපත් කරන ලද දේශනය අනුව සුපරික්ෂාකාරීව සලකා බැලීමෙන් පසුව කොමිෂන් සභාව බහුතර මතයෙන් (යෝජනාවට විපක්ෂව එක් මතයක්) ඉදිරිපත් කරන ලද විරෝධතාවය නිෂ්ප්‍රභා කරමින් අත්අඩංගුවේ පසුවන හෝ රඳවාගෙන සිටින පුද්ගලයෙකු සාක්ෂිකරුවෙකු ලෙස කැඳවනු ලබන්නේ ද යන්න එක් එක් සිද්ධිය අනුව සලකා බැලීමටත් සහරාන්ගේ බිරිඳ වන හාදියා සාක්ෂිකරුවෙකු ලෙස කැඳවීමටත් තීරණය කරන ලදි. කැඳවන ලද සාක්ෂිකරුවන් අතර ජමීල්ගේ බිරිඳ ඔමර්කතා ද විය.

සංශෝධිත කොමිෂන් සභා පනතේ **(393** පරිච්ඡේදය) **16** වන වගන්තිය යටතේ පුද්ගලයින් කිහිප දෙනෙකු සඳහා නීතිඥ පෙනී සිටීමක් සිදුවිය. එසේ කරන ලද්දේ

පරීක්ෂණයට භාජනය කරන ලද කරුණු සම්බන්ධයෙන් ඔවුන්ට විරුද්ධව යම් කරුණු ඉදිරිපත් කර තිබීම හෝ එම පුද්ගලයාගේ ඉල්ලීම මතයි.

විමර්ශන කොමිෂන් සභාව තීරණය කරන ලද්දේ ඇතැම් ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සාක්ෂි වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට උපකාරි වනු ඇති බවය. නින්දවූර් (Ninthavur), සමන්තුරේ, සයින්දමර්දු සහ කාත්තන්කුඩි යන ස්ථානවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලද අතර එහිදී ආරක්ෂිත නිවාස කිහිපයක් නිරීක්ෂණය කරන ලදි. 2019 අප්‍රේල් 26 වන දින මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ පවුල්වල සාමාජිකයන් කිහිපදෙනෙකු නිවෙස් තුළම සියදිවිනසා ගත් ආකාරය අධ්‍යයනය කර ගැනීමට සයින්දමරුදු සංචාරය විශේෂයෙන්ම උපකාරී විය.

2020 අගෝස්තු 15 වන දින විමර්ශන කොමිෂන් සභාව කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය සහ කටුවාපිටියේ ශාන්ත සෙබස්තියන් දේවස්ථානය වෙත ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදි.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විමර්ශන කොමිෂන් සභාවේ කටයුතුවලට දෙවරක් බාධා ඇති විය. රටේ පළමු කොවිඩ් 19 රැල්ල ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් ලෙස 2020 මාර්තු 12 සිට 2020 මැයි 13 දක්වා කොමිසමේ කටයුතු නතර විය. 2020 ඔක්තෝම්බර් මස මුලදී විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට අනුයුක්තව සිටි නිලධාරියෙකුට කොවිඩ් 19 ආසාදනය වීම හේතුවෙන් මුළු කාර්ය මණ්ඩලයම දින 17 ක කාලයක් නිරෝධායනයට ලක්වීමට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 ඔක්තෝම්බර් 27 සිට නොවැම්බර් 12 දක්වා කොමිසමේ කටයුතු නතර විය.

විමර්ශන කොමිෂන් සභාවේ කාල සීමාව තුළ 2019 නොවැම්බර් මස ජනාධිපතිවරණය සහ 2020 මහාමැතිවරණය පැවැත්විණි. මෙහි කාර්යභාරයට ඇතුලත් වන්නා වූ කරුණු දේශපාලන වශයෙන් වැදගත්කමක් ඇති හෙයින් විමර්ශන කොමිෂන් සභාවට සතියක් පමණ රැස්වීම් පැවැත්වීමට අවස්ථා දෙකකදීම නොහැකි විය.

අපගේ කටයුතු විමර්ශන කොමිෂන් සභාව විසින් විශ්වාසදායක සාක්ෂි පදනම් කරගෙන විමර්ශනය කිරීම, පරීක්ෂණ කිරීම හා වාර්තා කිරීමට මෙන්ම නීතියෙන් අවසරදී ඇති එවන් නිගමන සහ නිරීක්ෂණ උකහා ගැනීමට අපගෙන් ඉල්ලා ඇති කරුණු සම්බන්ධව කරුණු සොයා බැලීමට දරණ උත්සාහයකි. මෙම කටයුතු සිදුකළ යුතු වූයේ විශ්වාසදායක සාක්ෂි මඟින් තහවුරු කර ඇති එවැනි කරුණු ඇසුරිනි. සැක සහිත කරුණු, අනුමාන සහ උපකල්පන මත පදනම්ව කිසිදු සොයා ගැනීම් සිදු නොකරන බව මෙහිදී අපි විසින් අවධාරණය කරමු.

පාරදෘශ්‍ය භාවයෙන් යුතුව ස්වාධීන, අපක්ෂපාතී, සම්පූර්ණ සහ පක්ෂග්‍රාහී නොවීමට අප විසින් උත්සාහ කර ඇත්තෙමු. එබැවින් විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ මහජනතාව සහ මාධ්‍යයට සාක්ෂි විවෘත වන පරිදි කටයුතු හැකිතාක් විවෘතව කිරීමට අපි සෑම උත්සහායක්ම ගත්තෙමු. කෙසේ වුවද ජාතික ආරක්ෂාව කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන ශ්‍රී ලංකා බුද්ධි අංශ කිහිපයකින් ලබාගත් සංවේදී බුද්ධි තොරතුරු යොදාගැනීම විමර්ශන කොමිෂන් සභාවේ බලතල යටතේ අවශ්‍යතාවක් විය. එම නිසා සාක්ෂිකරුවන් කිහිපදෙනෙකුගේ සාක්ෂි නීති ප්‍රකාරව මාධ්‍යයට විවෘත නොවන ආකාරයෙන් ලබා ගන්නා ලදි.

2019 අප්‍රේල් 21 වන දින සිදුවීම් සහ එහි පූර්වගාමී පසුබිම පිළිබඳ වඩාත් සම්පූර්ණ විස්තරයක් ලබාදීමට විමර්ශන කොමිෂන් සභාව සෑම උත්සහායක්ම ගෙන තිබේ. මෙම අවසාන වාර්තාව අප විසින් කර ඇති කාර්යයන් පිළිබඳ සාරාංශයක් පමණි. අප විසින් විමසා ඇති ප්‍රභවයන්ගෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් මෙහි ඇතුළත් වේ. එයට ප්‍රධාන හේතුව වන්නේ පුද්ගලයන් කිහිපදෙනෙකුට එරෙහිව අපරාධ නඩු විභාග වෙමින් පවතින බව විමර්ශන කොමිෂන් සභාව විසින් අවධානය යොමු කර තිබීමය. පවතින සාක්ෂි අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම සාර්ථක නඩු විභාගයකට බාධාවක් විය හැකිය. එබැවින් විමර්ශන කොමිෂන් සභාව සාක්ෂිවල මූලාශ්‍රවල ඇතුලාන්තය (හරස් සමුදේශනයන්) සිතාමතාම හෙළිදරව් කිරීමෙන් වැළකී ඇත. කෙසේ වෙතත් විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ඇති සියලුම සාක්ෂි ගරු නීතිපති වෙත ලබා දී ඇති පරිදි ඕනෑම

අපරාධ නඩු විභාගයකදී භාවිතා කිරීම සඳහා නීතියෙන් ප්‍රතිපාදන සලසා තිබීම අස්වැසිල්ලක් වේ.

මෙම වාර්තාව කතාවක ශෛලියෙන් ඉදිරිපත් කර ඇත්තේ පහසු කියවීම සහ කරුණු අවබෝධය සඳහා වේ.

විමර්ශන කණ්ඩායම විසින් ප්‍රකාශයන් **1588** ක් සටහන් කර ගන්නා ලදි. ප්‍රකාශවල ඇති සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව කොමිසම සාක්ෂිකරුවන් **457** දෙනෙකුගේ සාක්ෂි විභාග කරන ලදි. ඔවුන්ගේ සාක්ෂි පිටු තිස්දාස් එකසිය දෙකක් **(30,102)** කට අධික සංඛ්‍යාවක සටහන් වී ඇත. පොත්, **206** ක් ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය පටිගත කිරීම් ඇතුළුව සමස්ත ලේඛන **2377** ක් සමස්ත සාක්ෂි වශයෙන් ඉදිරිපත් වී ඇත. අප විසින් සකස් කරන ලද වාර්තාවේ පළමු වන වෙළුමෙහි පරිච්ඡේද 32ක් අඩංගු වේ. අපගේ බල සීමාව තුළ දක්වා ඇති නිශ්චිත ගැටළුව පිළිබඳ සහ වාර්තා කළයුතු සුවිශේෂී කරුණු **30** වන පරිච්ඡේදයේ දක්වා ඇත. අපගේ නිර්දේශ **31** වන පරිච්ඡේදයේ දක්වා ඇත. කෙටි විධායක සාරාංශයක් **32** පරිච්ඡේදයේ සඳහන් කර ඇත.

විමර්ශන කොමිෂන් සභාව ආසන්න වශයෙන් මාස **15**ක කාලයක් තිස්සේ ක්‍රියාත්මක වී ඇති අතර අප වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යම් අංශ සම්බන්ධයෙන් කරුණු සෙවීමේදී ඇතැම් පුද්ගලයින්ට යම් ප්‍රමාණයක අපහසුතාවයක් හෝ කනස්සල්ලක් ඇති විය හැකිය. මෙම විමර්ශන කොමිෂන් සභාව හා සම්බන්ධ අපගේ කාර්යයන් සම්බන්ධයෙන් මෙම කාල පරිච්ඡේදය තුළ කිසිදු ස්ථානයක කිසිදු පුද්ගලයෙකු අපට බලපෑම් කිරීමට හෝ සන්නිවේදනය කිරීමට උත්සාහ කොට නොමැති වීම විමර්ශන කොමිෂන් සභාව විසින් අගය කරනු ලබයි. අපට ක්‍රියාත්මක වීමට හැකි දැඩි හා පූර්ණ ස්වාධීනත්වය කොමසාරිස්වරුන්ගේ ඇගයීමට ලක් වේ.

## 02 වන පරිච්ඡේදය

## අන්තවාදයේ සිට ත්‍රස්තවාදය දක්වා

ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක 2019.04.21 වන දින සිදුවූ ඛේදනීය සිදුවීම් යම් කාල පරිච්ඡේදයන් තුළ සිදුවූ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල වේ. ප්‍රචණ්ඩ අන්තවාදය සහ ත්‍රස්තවාදය පිළිබඳ ගැටළු විමසීම සඳහා එකී ආඛ්‍යානය මෙන්ම දායක සාධක සහ වාර්තාව අවසානයේ පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්පූර්ණයෙන් වටහාගැනීම සඳහා සමහරක් සාමාන්‍යය යෙදුම් පිළිබඳ සාමාන්‍යය දැනීමක් තිබීම වැදගත්ය. අවම වශයෙන් කරුණු 04 ක් තේරුම් ගතයුතුව ඇතත් ඒවා අතර ඒවායේ සීමාවන් සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධතා පවතී. ඒවා නම් රැඩිකල්කරණය, අන්තවාදය, ප්‍රචණ්ඩ අන්තවාදය සහ ත්‍රස්තවාදයයි. **Oxford General** ශබ්ද කෝෂයේ අන්තවාදය ලෙස නිර්වචනය කර ඇත්තේ දේශපාලන, ආගමික යන ආදිය අදහස් කිරීම සඳහා අර්ථ දක්වා ඇති අතර ආන්තික හා අසාධාරණ හෝ බොහෝ මිනිසුන්ට පිළිගත නොහැකි අදහස් හෝ ක්‍රියාවේ. අන්තවාදය යනු පුද්ගලයෙකු මධ්‍යස්ථ මට්ටමේ සිට අන්තවාදය දක්වා ගමන් කරන රැඩිකලීකරණයවූ ක්‍රියාවලියේ මුල් අවධියක් ලෙස දැක්විය හැකිය. ප්‍රචණ්ඩ අන්තවාදය අර්ථ දක්වන්නේ සාමාන්‍යය සමාජ, වාර්ගික, ආගමික සහ / හෝ දේශපාලන ස්වභාවයේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම පිළිගන්නා දෘෂ්ඨිවාදයක් ලෙස වන අතර නාසර් එඩින් **(Nasser-Edeen)** [1] විසින් දක්වන පරිදි ප්‍රචණ්ඩ අන්තවාදය යනු " දේශපාලන, සමාජීය හෝ දෘෂ්ඨි විද්‍යාත්මක ස්වභාවයක් ඇතුළුව තවත් නිශ්චිත විශ්වාසයක් සඳහා ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීමට හෝ සහායදීමට ඇති කැමැත්තයි. මෙයට ත්‍රස්තවාදී ක්‍රියාද ඇතුළත් විය හැකිය"

රැඩිකල්කරණය සාමාන්‍යයෙන් අර්ථ දැක්වෙන්නේ සමාජ වෙනසක් ඇති කිරීමේ මාධ්‍යයක් ලෙස ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීමට සහායදීම හෝ පහසුකම් සැලසීම ඇතුළුව

---

[1] Nasser – Eddine, Garnham, Agostion,& Caluya, 2011.p.9 quoting national Counter- terroism Committee

අන්තවාදී විශ්වාස පද්ධතියක් අනුගමනය කිරීමේ ක්‍රියාවලියක් ලෙසය. ඇලෙක්ස් එස්. විල්නර් සහ ක්ලෙයා ජෙහාන් ඩුබුලෝස්ට අනුව (ජෝන් බුබුලෝස්) රැඩිකල්කරණය යනු "පුද්ගලයන් අතිශය දේශපාලන, සමාජීය හෝ ආගමික පරමාදර්ශයන් සහ අභිලාෂයන් අනුගමනය කරන පුද්ගලික ක්‍රියාවලියක් වන අතර විශේෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවිචාරවත් ප්‍රචණ්ඩත්වය භාවිත කිරීම යුක්ති සහගත ලෙස සැලකීමයි. ඒ මානසික සහ චිත්තවේගාත්මක ක්‍රියාවලියක් වන අතර එමඟින් ප්‍රචණ්ඩකාරී හැසිරීම සඳහා පුද්ගලයෙකු සූදානම් කරනු ලබයි." [2] **Joson – Leigh Striegher** [3] ( ජේසන් ලී ස්ටයිගර්) ට අනුව දෘෂ්ඨි විද්‍යාත්මක කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම යුක්ති සහගත කරන පුද්ගලයෙක් සාමාන්‍යයෙන් මෙය කරනු ලබන්නේ රැඩිකල්කරණ ක්‍රියාවලියක් හරහා ගමන් කිරීමෙන් අනතුරුව එය ප්‍රචණ්ඩ අන්තවාදී දෘෂ්ඨි කෝණයක් ලෙස පිළිගැනීමට හේතුවේ. ත්‍රස්තවාදය යනු සමස්තයක් ලෙස තරාතිරම නොබලා තම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියාවලියකි. ප්‍රචණ්ඩ අන්තවාදය දෘෂ්ඨි කෝණයක් ලෙස පිළිගැනීම මෙමඟින් අනුමත නොවන බවත් මෙහිදී ත්‍රස්ත ක්‍රියාවක් සිදුනොකරන බවත් ඔහු පෙන්වාදේ.

ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී යන යෙදුමට ව්‍යස්ථාපිත අර්ථ නිරූපනයක් නොමැත. **1979** අංක **48** දරණ ත්‍රිස්තවාදය වැළැක්වීමේ (තාවකාලික) විධිවිධාන පනත මඟින් ත්‍රස්තවාදය යන්න අර්ථ දක්වා නැත. **2006** අංක **06** දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ත්‍රස්තවාදී ක්‍රියාව හොඳින් නිර්වචනය කරමින් දක්වා සිටින්නේ ශ්‍රී ලංකා නීතියට අනුව දැනට ක්‍රියාත්මක වන ඕනෑම නීතියක් යටතේ නියම කරන ලංකාව තුළ ත්‍රස්තවාදයට මහ විවර කරන්නක් ලෙසය. ජාත්‍යන්තරව පොදුවේ පිළිගැනීමට ලක් වන ආකාරයට ත්‍රස්තවාදය යනු දේශපාලන හෝ දෘෂ්ඨිවාදාත්මක අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී සිවිල් වැසියන් ඉලක්ක කරගත් ප්‍රචණ්ඩ ක්‍රියාවේ. සමහර අවස්ථාවලදී වඩාත් සවිස්තරාත්මක අර්ථ

---

[2] Alex S. Wilner and Claire Jehanne Dubouloz, " Three precursors of homegrow Radicalisation" In Homegrown Terrorism and Tranformative: An Interdisciplinary Approach to Understanding RadicaliZation, 38.1 st Ed. Vol. 22 Taylor & Francis, 2010 ට

[3] Violent- extremism: An examination of a definitional dilemma, 2015. [ Online] Available at < https:// ro. Ecu.edu.au/cgi/viewContent. Cgi? Article= 1046&Contex = asi >. Accessed on 2 nd January 2021.

දැක්වීමක් අනුගමනය කර ඇත. නිදසුනක් ලෙස ත්‍රස්තවාදය මැඩපැවත්වීම පිළිබඳ 2002 යුරෝපා සංගමයේ සාකච්ඡා රාමුව මඟින් ත්‍රස්තවාදය යනුවෙන් අර්ථ දක්වා ඇත්තේ "ජනගහනයක් බරපතල ලෙස බිය ගැන්වීමේ අරමුණින් කෙරෙන ලද රජයකට අනවශ්‍ය ලෙස බලකිරීම සඳහා කරන රටක හෝ ජාත්‍යන්තර සංවිධානයකට බරපතල ලෙස හානි කරන ලද චේතනාන්විත ක්‍රියාවකි. පුද්ගලයාගේ ජීවිතයට පහරදීම පුද්ගලයෙකුගේ භෞතික අඛණ්ඩතාවයකට පහරදීම පැහැර ගෙනයාම ප්‍රාණ ඇපකරුවන් රැගෙන යාම, මූලික දේශපාලනයට දැඩි ලෙස බාධා කරමින් හෝ විනාශ කරමින්, ව්‍යවස්ථාමය, ආර්ථික හෝ සාමාජ ව්‍යුහයන් බරපතල ලෙස අස්ථාවර කිරීමේ උපක්‍රම මඟින් පුද්ගල ජීවිතවලට තර්ජන ඇති කිරීම පුද්ගල ශාරීරික ඒකග්‍රතාවයට බාධා පැමිණිවීම පැහැරගෙන යාම්, ප්‍රාණ ඇපකරුවන් ලෙස තබාගැනීම ගුවන් යානා මංකොල්ල කෑම හෝ නෞකා හෝ නිෂ්පාදනය, අවි ආයුධ හෝ පුපුරන ද්‍රව්‍ය ළඟ තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම" මීට අයත්වේ.

2000 එක්සත් රාජධානියේ ත්‍රස්තවාදී පනතේ පළවන වගන්තිය මඟින් ත්‍රස්තවාදය යන්න අර්ථ දක්වනු ලබන්නේ "පුද්ගලයෙකුට/ජනතාවට අනතුරක් හෝ බරපතල ප්‍රචණ්ඩත්වයක් ඇති කරන ක්‍රියාවක්, දේපළවලට බරපතල හානි සිදුකරන හෝ විද්‍යුත් පද්ධතියට බරපතල ලෙස බාධා කිරීම හෝ කඩාකප්පල් කිරීම ආදියවේ. තවද මෙහිදී රජයට බලපෑම් කිරීමට හෝ මහජනයා බිය ගැන්වීමට වන අතර එය දේශපාලන, ආගමික හෝ දෘෂ්ටිවාදි අරමුණු ඉදිරියට ගෙනයාම සඳහා බල කිරීම හෝ තර්ජන සැලසුම් කිරීම ආදිය වේ. (2000 එක්සත් රාජධානියේ ත්‍රස්තවාද පනතේ පළවන වගන්තිය)

ත්‍රස්තවාදය කරා එළැඹෙන ක්‍රියාදාමය පියගැට පෙළක් බඳුය. ත්‍රස්තවාදයේ පළමු පියවර වන්නේ විශේෂීකරණවාදය. පුද්ගලයෙක් විශේෂිකරණවාදියකු බවට පත්වූ පසු ඔහු තවදුරටත් ඔහු අන්තවාදයට වඩා පහසුවෙන් ග්‍රහණය වන තත්ත්වයට පත්වේ. විශේෂීකරණවාදීන් ඔහුගේ ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමේ සාමාජිකයින් පමණක් ඇසුරු කරයි. ඔවුනට වෙනත් ජන කොටස්, වෙනත් ඇදහිලි කණ්ඩායම් හෝ වෙනත් ජනවාර්ගික කණ්ඩාම්වල මිතුරන් අවශ්‍ය නොවේ. පුද්ගලයෙකු මේ ආකාරයෙන්

හුදකලාවූ විට ඔහු අන්තවාදයෙකු බවට පත්කරන එම මතවාදයන්ට ඔහු තව තවත් ග්‍රහණය වේ . එවිට ඔවුන් අන් අයව අගතියට පත් කිරීමට ක්‍රියා කරයි. සහරාන් සිය කතාවල ආරම්භය සනිටුහන් කළේ " මුස්ලිම් මිතුරන් අල්ලාහ් පිළිගෙන අනුගමනය කරන අය පමණක් බවයි.

මෙම අනන්‍යතාවය නිර්මාණය කළහැකි එක් ක්‍රමයක් වන්නේ ජනවාර්ගික හෝ ආගමික සමූහ බවට පත්වීමෙනි. සිංගප්පූරුව වැනි රටවල් ඉතිහාසයේ බොහෝ කලකට පෙර මෙලෙස වෙන්වී සිටීමේ (Exclusivism) තර්ජන ස්වභාවය හඳුනාගන්නා ලදී. සිංගප්පූරුවේ රජය විසින් ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම් සඳහා පමණක් ඉඩකඩම් හෝ නිවාස යෝජනා ක්‍රම ලබා නොදෙන බවට රජය සහතික කරන ලදී. වීන, මුස්ලිම්/මැලේ, ඉන්දියානු/දෙමළ සහ යුරේසියානුවන් වැනි විවිධ ප්‍රජාවන්ට අයත් ජනතාව එක නිවාස යෝජනා ක්‍රමයක ජීවත්වෙති. එක් ප්‍රජාවක් පමණක් වාසය කරන නිවාස යෝජනා ක්‍රම එහි නොමැත.

අවාසනාවකට ශ්‍රී ලංකා බලධාරීන් විසින් මෙලෙස එක් කණ්ඩායමක් පමණක් වෙන්ව සිටීමේ තර්ජනය වටහාගෙන නොමැත. කාත්තන්කුඩි ප්‍රදේශයේ සුවිශේෂීත්වය වනුයේ දිර්ඝ කාලයක සිට බහුවිධ විස්වාසවන්තයින් සමාජයට නිරාවරණය නොවීමයි. සහරාන් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් මඩකලපුවේ සිට කිලෝමීටර් 04 ක් දකුණෙන් පිහිටි කාත්තන්කුඩියෙහි ඉස්ලාමීය අන්තවාදයේ ප්‍රවර්ගය සමඟ දිගුකලක් ජීවත්ව එහි මැනවින් සමෘද්ධිමත් වී ඇත. සිංගප්පූරුව ඉතිහාසයේ මුල් අවධියේම මෙලෙස සුවිශේෂි ලෙස වෙන්ව සිටීමේ (හුදෙකලාවීම) අන්තරායන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදුවද 2007 මුල් භාගයේ සිට මෙම ප්‍රශ්නය දේශීය සහ විදේශීය මාධ්‍යයන් ඉස්මතු කර පෙන්නුවද බලයේ සිටි ආණ්ඩු ඒ සඳහා කලින් ක්‍රියා කිරීමට අසමත්වීම කණගාටුවට කරුණකි. නැගෙනහිර ශ්‍රී ලංකාවේ මඩකලපුව නගරයට කිලෝමීටර් 04 ක් දකුණෙන් පිහිටි කාත්තන්කුඩිය සුවිශේෂි වේ. මෙය දිවයිනේ ඇති එකම මුස්ලිම් නගරය වේ. මුස්ලිම් නොවන අයට එහි වාසය කිරීමට දේපළ මිලදී ගැනීමට හෝ ව්‍යාපාර පවත්වා ගැනීමට නොහැකිය. මුස්ලිම් පල්ලි 65 ක් පමණ වර්ග කිලෝමීටර් 1 ක පමණ භූමි භාගයක පැතිරී ඇති අතර මෙහි

පනස්දාහක මුස්ලිම් ප්‍රජාවක් සිටී. මුස්ලිම් ලෝකයෙන් (මුස්ලිම් රටවල්) පිටත වර්ග කිලෝමීටරයක වැඩිම මුස්ලිම් පල්ලි ප්‍රමාණයක් ඇති ප්‍රදේශය කාත්තන්කුඩිය බවට මොවුන් පුරසාරම් දොඩති. කාත්තන්කුඩි නගරයට ඇතුළු වන සැනින් යමෙකුගේ නෙත ගැටෙනුයේ නැගෙනහිර ශ්‍රී ලංකාවේ අනෙකුත් නගරවලට වෙනස් ආකාරයක් හඳුනාගත හැක. එනම් වීදිවල කාන්තාවන් නොමැති තරම්ය. මෙය ඊට මිනිත්තු 10 ක් වැනි ඉතා කෙටි කාලයකින් ලඟා විය හැකි මඩකලපුවට වඩා හාත්පසින්ම වෙනස් තත්ත්වයකි. එහි (මඩකලපුව) තරුණ ගැහුණු ළමයි විශාල සංඛ්‍යාවක් පිටත ඔබමුබ පමණක් නොව බයිසිකල්වල හෝ කුඩා ස්කූටිවල ඔවුන් සැරිසරති. 2009 අගෝස්තු 16 වන දින මෙම කරුණු යළිත් ප්‍රමුඛ පෙළේ මාධ්‍යවල ආවරණය විය. සන්ඩේ ටයිම්ස්හි පළ වූ " Unholy tension in Sri Lanka's Muslim East" ලිපිය ලියා ඇත්තේ " Chris Kamalendran and Asif Fuard" වේ. කතුවරුන්ට මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වී ඇත්තේ, කාත්තන්කුඩියේ සාම්ප්‍රදායික සූෆි සහ තවුහිද් කණ්ඩායම් සමඟ ඇති ගැටුම තවදුරටත් හුදු දෘෂ්ටිවාදී නොවන බවත් ප්‍රචණ්ඩත්වය, තර්ජනය හෝ බිය ගැන්වීම වැනි සිද්ධීන් කිහිපයක් සිදුවී ඇති බවත් එය එක හා සමානව ආරක්ෂක බලධාරීන් සහ මුස්ලිම් ප්‍රජා නායකයින් අවදි කරන්නක් වූ බවත් මෙම බිය ගැන්වීම්වලට ප්‍රතිහිංසාව හෝ අපහසුතාවයට ලක්කිරීමට ඔවුන්ට අවශ්‍ය වුයේ නැත.

1990 අගෝස්තු 03 වන දින කාත්තන්කුඩි මුස්ලිම් පල්ලියට LTTE ප්‍රහාර එල්ල කිරීමෙන් පසු මුස්ලිම්වරුන් 103 දෙනෙකු ඝාතනය කිරීමත් සමඟ බලයේ සිටි ආණ්ඩුව විසින් මුස්ලිම් ගම්වැසියන් සන්නද්ධ කිරීම් සහ පුහුණු කිරීම පිළිබඳවද මෙම ලිපියෙන් අනාවරණය කර ඇත. එසේම 2006 දෙසැම්බර් මාසයේ තවුහිද් අනුගාමිකයන් විසින් සූෆි නිවාස හා ආයතන 117 කට වැඩි ප්‍රමාණයක් පහරදී විනාශ කරමින් කාත්තන්කුඩියේ සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී සිදුවීම් ද මෙහි විස්තර කර ඇත. සූෆිවරුන්ගේ ආධ්‍යාත්මික නායකයා වූ තාරිකාතුල් මුෆ්ලිහීන්ගේ දේහය තවුහිද් සාමාජිකයන් ඔහුගේ සොහොන් වළ හාරා එළියට ඇද දැමූහ.

2007 දී පමණ සිදු වූ තවත් ප්‍රචණ්ඩකාරී සිදුවීමක්, ලෙස කාත්තන්කුඩියේ ඩීන් පාරේ පිහිටි පුස්තකාලයක් සහ භාවනා මධ්‍යස්ථානයක් තවුහිද් කණ්ඩායම් විසින් විනාශ කිරීම ගැන ද මෙහි සඳහන් වේ. මෙහිදීද සූෆි අනුගාමිකයින්ගේ නිවාස විස්සක් පමණ විනාශ විය.

තවුහිද් කණ්ඩායම විවේචනය කළ සූෆි පූජකවරුන්ට එරෙහිව තර්ජන එල්ලවී තිබුණි. 2009 ජුලි 31 වන දින මව්ලවි මොහොමඩ් රිස්වි පැහැරගෙන ගොස් ඇති බවට චෝදනා එල්ලවූ තවුහිද් ආධාරකරුවන් ඔහුව පැහැරගෙන පහරදුන් අතර ඔහු තවුහිද් කණ්ඩායම විවේචනය කිරීම ගැන ප්‍රශ්න කළහ.

සහරාන් විසින් භාවිතා කරන ලද රැඩිකලීකරණ ක්‍රියාවලියේ ප්‍රධාන බලවේගය මනාව ගොඩනඟන ලද ආඛ්‍යානයක් විය. එකී ආඛ්‍යානය යනු මූලික වශයෙන් ලෝකය අර්ථ නිරූපණය කිරීම සඳහා නිශ්චිත අර්ථයන් ගෙන ඒම සඳහා මූලද්‍රව්‍ය හා අනුක්‍රමයන් එකට සම්බන්ධ කරන කතාවකි. එය තේමාවන් ආකෘති සහ පැරණි වස්තූන් බෙදා ගන්නා කථා පද්ධතියකි. ප්‍රචණ්ඩ අන්තවාදීන්ගේ ආඛ්‍යාන විශාල වශයෙන් අධ්‍යයන්ට පාත්‍රව තිබේ.

සහරාන්ගේ කතාවට වැදගත් අංග පහක් තිබුණි. පළමුව කැලිෆේටයක් ගැන කතා කරයි. කැලිෆේට් (අරාබි බසින් කිලාෆා) යනු ඉස්ලාමීය රාජ්‍යයක් වන අතර එය කාලිෆ් (අරාබි බසින් කලීෆා) විසින් මෙහෙයවනු ලබයි. මෙම පුද්ගලයා මුහම්මද් නබිතුමාගේ දේශපාලන-ආගමික අනුප්‍රාප්තිකයෙකු ලෙස සැලකෙන අතර සමස්ත මුස්ලිම් ලෝකයේ (උම්මා) නායකයා වේ.

ලෝක ඉතිහාසයේ කැලිෆේට කිහිපයක් පැවත ඇති අතර පළමුවැන්න අබු බකර්ගේ නායකත්වයෙන් යුත් රෂිදූන් කැලිෆේට් (ක්‍රි.ව. 632–661) ය. එය ක්‍රි.ව. 661 දී අවසන් වූයේ දෙවන කැලිෆේට්, උමායියාඩ් කැලිෆේට්, බනු උමයියා විසින් ක්‍රි.ව. 750 දක්වා පැවතුණි. තුන්වන කැලිෆේට්, අබ්බාසිඩ් කැලිෆේට් අබ්බාසිඩ්වරුන් විසින් පාලනය කරන ලද අතර එය 1258 වන තෙක් පැවතුනි. 1924 වන තෙක් තවත් කැලිෆේට කිහිපයක් පැවතුනි. අවසන් වරට 1517 සිට 1924 දක්වා ඔටෝමාන් කැලිෆේටය පැවතිනි. 1924 මාර්තු 03 වන දින තුර්කි ජනරජයේ පළමු ජනාධිපති මුස්තාපා කෙමාල් අටාර්ටුක්

මැදපෙරදිග පුරා වෙස්ට්ෆේලියානු මාදිලියේ භෞමික රාජ්‍යයන් ස්ථාපිත කිරීමට ඉඩ සලසමින් කැලිෆේට් සංස්ථානිකය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව අහෝසි කළේය.

සිත්ගන්නා සුළු කරුණ නම්, කැලිෆේට්හි මතකයන් යළි පණගැන්වූයේ සහරාන් පමණක් නොවීම නිසාවෙනි. 2017 අගෝස්තු 10 වන දින "කාලිෆා උමර්" නමින් දෙමළ චිත්‍රපටයක් දෙමටගොඩ පිහිටි ස්ථානයක ප්‍රදර්ශනය කරන ලද අතර එය WAMY හි සාමාජිකයින් දෙදෙනෙකු විසින් සංවිධානය කරන ලදි. එය ක්‍රි.ව. 634 ත් ක්‍රි.ව. 644 ත් අතර දෙවන ඉස්ලාමීය කැලිෆේට්හි පාලකයා වූ උමාර් ඉබ්න් අල් ඛාටාබ්ගේ ජීවිත කතාව පදනම් කරගත් චිත්‍රපටයකි.

දෙවනුව, සහරාන් ඉස්ලාමීය ආගමික ග්‍රන්ථවල දක්වා ඇති ජිහාඩ් සහ පිළිබඳව සඳහන් කර ඇති අතර එය ප්‍රචණ්ඩ ජිහාඩ් යන්නෙන් අදහස් කළයුතු බව අවධාරණය කළේය. ඔහු අවධාරණය කළේ යමෙකුට ජිහාඩ් කිරීමෙන් පමණක් කෙනෙකුට පාරාදීසයට යාහැකි බවත් "දිවි පිදූවන්" (Martyrs) ලෙස මියයන ලෙසට මුස්ලිම්වරුන්ට ආරාධනා කරන බවත්ය.

තෙවනුව, සහරාන් ලොවපුරා මුස්ලිම්වරුන් අරඹයා සිදුකරන ලද හිංසාවන් ගැන සඳහන් කළ අතර ඔවුන්ගෙන් පළිගැනිය යුතුබව ප්‍රකාශ කළේය. විශේෂයෙන් ඔහු බුරුමයේ සිදුවීම් සහ සිරියාවේ සහ ඉරාකයේ අයිඑස් හමුදාවන්ට පහරදීම ගැන සඳහන් කළේය.

සිව්වනුව, සහරාන් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ඉලක්ක කරගත් සිදුවීම් සහ විශේෂයෙන් පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමිගේ ක්‍රියාකාරකම් ගැන සඳහන් කළේය. උදාහරණයක් ලෙස 2016 නොවැම්බර් 20 වන දින සහරාන් බොදුබල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩ අත්තේ ඥානසාර හිමිගේ ක්‍රියාකාරකම් පිළිබඳව දේශනයක් පැවැත්වූ අතර ඉස්ලාමීය රාජ්‍යයක ඔහුගේ ක්‍රියාවන් සිදුවූයේ නම් දඬුවම හිස ගසා දැමීම, එල්ලා මැරීම, ගල් ගැසීම හෝ පිටුවහල් කිරීම සිදුවිය හැකි බව ප්‍රකාශ කළේය.

මෙම සන්දර්භය තුළ බහුතර ප්‍රජාව තුළ අන්තවාදී කණ්ඩායම් මතුවීම අනෙක් ප්‍රජාවන් අතර තවදුරටත් උණුසුම් තත්ත්වයන් ඇතිවීමට හේතුවන බව පැහැදිලිය. එමඟින් ශ්‍රී ලාංකික අනන්‍යතාව විශාල ලෙස ඛණ්ඩනය වීමේ විෂම චක්‍රයකට මඟපාදයි. වැදගත්ම කරුණ නම් බහුතර අන්තවාදී කණ්ඩායම්වල එවැනි ක්‍රියා මගින් අයිඑස් හිතවාදී සහ වෙනත් ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායම්වල ආඛ්‍යානය පෝෂණය කිරීමයි. ප්‍රහාරයට පෙර සහරාන් විසින් පටිගත කරන ලද අවසාන පණිවුඩයේ පූජ්‍ය ගලගොඩ අත්තේ ඥානසාර හිමියන්ගේ මෙන්ම අනෙකුත් අන්තවාදී කණ්ඩායම්ද පාස්කු ප්‍රහාරයට හේතු ලෙස දක්වා ඇත.

පස්වනුව, සහරාන් උත්සාහ කළේ මුස්ලිම් ප්‍රජාව තුළ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය කෙරෙහි ඇති විශ්වාසය බිඳ හෙළීමටය. මේ සඳහා ඔහු පාර්ලිමේන්තු ක්‍රමයට පහර දුන්නේ එය ඉස්ලාමයට විරුද්ධ යැයි පවසමින් ය. ඔහු ප්‍රකාශ කළේ නීති සම්පාදනය කළහැක්කේ අල්ලාහ්ට පමණක් බවය. ඔහු අධිකරණ පද්ධතියට පහර දුන්නේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රමයේ සාමාජිකයන් වීමෙන් මුස්ලිම් විනිසුරුවන් සහ නීතිඥයින් ඉස්ලාමයට පටහැනිව කටයුතු කරන බව පවසමින්ය.

නිව්යෝර්ක් පොලිස් දෙපාර්තමේන්තු පර්යේෂණයන්ට අනුව ඉස්ලාමීය අන්තවාදියෙකු බවට පරිවර්තනය වීමේ කොටසක් ලෙස බටහිර රටවල පුද්ගලයකු රැඩිකලීකරණ ක්‍රියාවලියකට භාජනය වන අතර පසුව ත්‍රස්තවාදියා බවට පත්වන්නේ පූර්ව රැඩිකලීකරණය ස්වයං අනන්‍යතාවය සෙවීම, අධික්ෂණය සහ ජිහාඩ් (ප්‍රචණ්ඩකාරී ක්‍රියාව). යන අදියරයක්) **4** හරහාය.

රැඩිකලීකරණ ක්‍රියාවලියේ විවිධ ආකෘතීන් තිබුණද මෙම ආකෘතිය සහ සහරාන් තම අනුගාමිකයන් රැඩිකලීකරණය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදයේ පොදු කරුණු කිහිපයක් ඇත.

පූර්ව රැඩිකලීකරණ අවධිය පුද්ගලයාගේ ලෝකය පිළිබිඹු කරන්නේ ආගම සහ ඉස්ලාමීය ඇදහිල්ල පිළිබඳ ඔහුගේ ආකල්පයයි. බඳවා ගැනීම් කළ හැකි පුද්ගලයන් හඳුනා

ගැනීමෙදී සහරාන් විසින් පරීක්ෂා කරන ලද පළමු දෙය නම් පුද්ගලයා දිනකට පස් වතාවක් යාඥා කරන්නේද යන්න බැලීමයි. මේ සඳහා ඔහු තම අනුගාමිකයන් උදේ පාන්දර පල්ලියට යවා යාඥා කිරීමට පැමිණි අයව හඳුනාගත්තේය.

ඊළඟ අදියර පෞද්ගලික අනන්‍යතාවය සෙවීම මඟින් සමන්විත වේ. මෙයට පෞද්ගලික සිදුවීම් මෙන්ම ලෞකික සිදුවීම්ද ඇතුළත් විය හැකිය. සහරාන්ගේ ක්‍රමවේදය තුළ උදාහරණ දෙකක් තිබේ. ඔහු බේරුවල සිද්ධිය හේතුවෙන් ආබාධිත වූ මුස්ලිම් තරුණයෙකුව හඳුනාගෙන ඔහුට ත්‍රිරෝද රථයක් මිලට ගෙන දුන්නේය. තරුණයා සහරාන්ගේ කණ්ඩායමේ දැඩි ආධාරකරුවෙකු බවට පත්විය.

අන්තර් ග්‍රහණය කිරීමේ පියවර තුළ ආගමික විශ්වාසයන්හි තියුණු වර්ධනයක් සහ වහබ් දෘෂ්ටිවාදය මුළුමනින්ම පිළිගැනීමක් සිදුවේ. ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම සඳහා කෆීර් (මුස්ලිම් නොවන) යන සංකල්පය සහ ආගමික ග්‍රන්ථවල ඔවුන් ඝාතනය කිරීමට යැයි කියනු ලබන නියෝගය ගැන සහරාන් දිගින් දිගටම සඳහන් කළේය. මෙම අදියරේදී පුද්ගලයා සැරිසැරිමට පටන්ගන්නේ කණ්ඩායම් කවය තුළ පමණි. සහරාන් නිරන්තරයෙන් කියා සිටියේ ආගමික ග්‍රන්ථවලට අනුව මුස්ලිම්වරුන් මුස්ලිම් නොවන අය සමඟ මිතුරන් ලෙස නොසිටිය යුතු බවයි.

සිව්වන සහ අවසාන අදියර වන්නේ කණ්ඩායමේ කොටසක් ලෙස පුද්ගලයා "ජිහාඩ්" වලට සහභාගී වීමෙන් තම "ඉස්ලාමීය" යුතුකම ඉටුකිරීමට තීරණයක් ගැනීමයි. අධ්‍යයනයේ සඳහන් වන්නේ ප්‍රහාරය සිදුවූ ස්ථානය හා උපායමාර්ගය සම්බන්ධයෙන් තීරණ ගත් පසු කණ්ඩායම එහි මෙහෙයුම් සැලසුම් කිරීම සහ සකස් කිරීම ආරම්භ කරන බවයි. මෙම අදියර සාපේක්ෂව කෙටි යැයි කියනු ලබන අතර ඉලක්ක තෝරා ගැනීම, තෝරාගත් ඉලක්කයේ මෙහෙයුම් අධීක්ෂණය, ආරක්ෂිත නිවාස කුලියට ගැනීම, මෙහෙයුම් පුහුණුව, පුපුරණ ද්‍රව්‍ය සකස් කිරීම සහ ප්‍රහාරය ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

පාස්කු ප්‍රහාරයේදී සමහර ක්‍රියාමාර්ග විස්තර කර ඇති පියවරට සාපේක්ෂව ඊට බොහෝ කලකට පෙර ගනු ලැබ ඇති බව පෙනේ. උදාහරණයක් ලෙස 2018 අගෝස්තු 27 වන

දින රිල්වාන් පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීමේදී තුවාල ලැබූ විට ප්‍රහාර සඳහා භාවිතා කළ බෝම්බ 2019 අප්‍රේල් 20 වන දින එකලස් කර ඇති බව පෙනේ. නිවාස පසුව කුලියට ගෙන ඇති අතර ඉලක්කගත හෝටල්වල ඔත්තු බැලීම 2019 අප්‍රේල් 17 වන දින සිදුකර ඇති බව පෙනේ.

හුදෙකලාවීම අන්තවාදය සහ ත්‍රස්තවාදය ජාතීන්ගේ ස්ථාවරත්වයට හා ආරක්ෂාවට බලපාන අතර ත්‍රස්තවාදය බොහෝ රජයන් හා සමාජයන්ට ඉහළම ජාතික ආරක්ෂක තර්ජනයක් එල්ල කරයි. ඒ නිසා නීතිය හා සාමය පවත්වාගෙන යාමේ වගකීම පවරා ඇති නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන්ට එවැනි ක්‍රියාවන් වැළැක්විය හැකිවිය යුතු වන අතර ඒ සඳහා පිළියම් යෙදීමට හැකිවිය යුතුය .

2016 සිට 2019 දක්වා තීරණාත්මක වර්ධිත අවධියේදී ඉස්ලාමීය අන්තවාදයේ තර්ජනයට මුහුණදීම සඳහා ප්‍රමාණවත් හා ඵලදායී පියවර ගැනීමට ශ්‍රී ලංකා බලධාරීන් අපොහොසත් වූ බව පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂිවලින් පිළිබිඹු වේ. මෙය වඩාත් විස්තරාත්මකව 12, 13 සහ 24 පරිච්ඡේදවල වඩාත් සවිස්තරාත්මකව පරීක්ෂා කෙරේ.

පාස්කු ප්‍රහාරයට තුඩුදුන් සිදුවීම් විමසා බැලීමෙන් පසු පරීක්ෂණ කොමිෂන් සභාවෙහි එක් නිර්දේශයක් වන්නේ ආගමික අන්තවාදීන් ප්‍රතිරැඩිකල් කිරීම සඳහා සඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමයි. මන්දයත් ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ රැඩිකලීකරණය වැළැක්වීම අරමුණු කරගත් වෙනත් ක්‍රියාමාර්ග ඉස්ලාමය සහ අනෙකුත් ආගමික රැඩිකල්වාදීන් විසින් එල්ල කරන තර්ජනය වැළැක්වීමට ප්‍රමාණවත් නොවන බැවිනි.

එසේ කිරීමේදී ක්‍රියාවලින් හා සංකල්පවල වෙනස්කම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. පුනරුත්ථාපනය යනු ප්‍රතිරැඩිකලීකරණය අරමුණු කරගත් ක්‍රියාවලියකි. මුදාගැනීම ප්‍රතිරැඩිකලීකරණ ක්‍රියාවලියේ කොටසක් විය හැකිය.

ප්‍රතිරැඩිකලීකරණ යනු අන්තවාදී දෘෂ්ටිවාදය ප්‍රතික්ෂේප කිරීම සහ ප්‍රධාන ධාරාවේ සාරධර්ම වැළඳ ගැනීම හේතුවෙන් පුද්ගලයාගේ ඇදහිලි පද්ධතිය වෙනස් වන ක්‍රියාවලියයි.

මුදවාගැනීම යනු පුද්ගලයෙකුගේ විශ්වාසයන් වෙනස් නොකර ඔහුගේ හැසිරීම වෙනස් කිරීමට උත්සාහ කිරීමයි. නිදසුනක් වශයෙන් රැඩිකල් සංවිධානයක් සමඟ සම්බන්ධ වූ පුද්ගලයෙකුට එම සංවිධානය සමඟ ඇති සියළුම සම්බන්ධතා බිඳදැමිය හැකි නමුත් ඔහු සමඟ සම්බන්ධ වූ ඔහුගේ විශ්වාසයන් දිගටම පවත්වා ගත හැකිය.

ආගමික විශ්වාසයන් සම්බන්ධව ප්‍රතිරැඩිකලීකරණ කළ නොහැකි බවට යම් යම් මතවාදයන් තිබේ. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ සියලු ආකාරයේ ආගමික අන්තවාදය රැඩිකලීකරණය කිරීමේ අරමුණින් පුනරුත්ථාපන වැඩසටහනක් වහාම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. වැඩසටහන හරහා සංවිධාන වීමෙන් ඔබ්බට ගොස් මුදවාගැනීම ළඟාකර ගැනීමට උත්සාහ කිරීම වැදගත්ය.

ආගමික අන්තවාදීන් රැඩිකලීකරණය කිරීම හා මුදවාගැනීම අරමුණු කරගත් පුනරුත්ථාපන වැඩසටහනක් සැකසීමේදී ඉස්ලාමීය අන්තවාදය සමඟ කටයුතු කිරීමේදී වෙනත් රටවල අත්දැකීම් සලකා බැලීම ප්‍රයෝජනවත් වේ.

යේමනය, සෞදි අරාබිය, ඉරාකය සහ ලිබියාව වැනි රටවල ගිනිකොනදිග ආසියාවේ සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දුනීසියාව සහ තායිලන්තය වැනි රටවල සහ යුරෝපයේ එක්සත් රාජධානිය, නෙදර්ලන්තය සහ ඩෙන්මාර්කය වැනි රටවල වැඩසටහන් කිහිපයක් අධ්‍යයනය ප්‍රයෝජනවත් විය හැකිය.

කෙසේ වෙතත් එක් ක්‍රියාවලියක් සෑම තැනටම බවත්, ආගමික අන්තවාදයට තුඩුදෙන දේශීය තත්වයන් පුනරුත්ථාපන වැඩසටහන ව්‍යුහගත කිරීමේදී වැදගත් අංගයක් ලෙස සැලකිය යුතු බවත් අප මතක තබා ගත යුතුය. දේශීය තත්වයන්ට සරිලන පරිදි යම් යම් වෙනස් කිරීම් සහිතව සිංගප්පූරුවේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ශ්‍රී ලංකාවේ ආගමික අන්තවාදයට විසඳුම් සෙවීම සඳහා වඩාත් සුදුසු බව අපගේ අදහසයි.

සිංගප්පූරුවේ වැඩසටහනට මනෝවිද්‍යාත්මක පුනරුත්ථාපන, ආගමික පුනරුත්ථාපන, සමාජ පුනරුත්ථාපන සහ ප්‍රජා සහභාගීත්වය සහ පවුල් සහයෝගය ඇතුළත් විවිධ නමුත් සම්බන්ධිත සංරචක කිහිපයක් තිබී ඇති අතර එය අපගේ දැක්ම අනුව වැදගත් අංගයක් වන අතර එය දිගු කල් පවතින හා තිරසාර වේ. අධ්‍යාපන පුනරුත්ථාපනය, වෘත්තීය පුනරුත්ථාපනය සහ විනෝදාත්මක පුනරුත්ථාපනය ද සංරචක ලෙස එකතු කරන ලෙස අපි නිර්දේශ කරමු.

කෙසේ වෙතත් පුනරුත්ථාපන ක්‍රියාවලියකට සමගාමීව, ආගමික අන්තවාදය සහ ත්‍රස්තවාදය බරපතල වැරදි සහ නීතියෙන් ද දඬුවම් ලැබිය හැකි බවට සමාජයට පැහැදිලි පණිවිඩයක් ලබාදිය යුතු බව අපි අවධාරණය කිරීමට කැමැත්තෙමු. එබැවින් වඩාත් සාපරාධී වැරදිකරුවන් වූ පුද්ගලයින් උසාවියට ගෙනැවිත් නඩු පැවරිය යුතුය. මෙම වැරදිකරුවන් ද වැරදිකරුවන් පුනරුත්ථාපන වැඩසටහනේ කොටසක් වියයුතුය.

ආගමික අන්තවාදීන් පුනරුත්ථාපනය කිරීමට රජය අපේක්ෂා කරන බව ප්‍රජාව සැබවින්ම විශ්වාස නොකරන්නේ නම් පුනරුත්ථාපන ක්‍රියාවලියට පූර්ණ කැපවීමක් ඇති බව රජය පෙන්විය යුතුය.

එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ මැතිවරණයෙන් ඉක්බිතිව එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් කිරීමට නියමිතව තිබුණි. පත්වීම සිදු වී ටික කලකට පසු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාගේ ආධාරකරුවන් එය සැමරීමට සිදු කරන ලද උත්සවය අතරතුර ඔවුන් රිල්වාන්ට සහ ජාතික තවුහිද් ජමාත් පල්ලියට පහර දුන් අතර එහිදී රිල්වන්ගේ හිසට තුවාල සිදු විය.

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායකයා තවත් පුද්ගලයින් කිහිප දෙනෙකු සමඟ සහභාගිවූ රැස්වීමක වීඩියෝ පටිගත කිරීමක් පරීක්ෂණ කොමිෂන් සභාව දුටුවේය. සහරාන් සාකච්ඡාවට සහභාගි වන බව පෙනේ. මුස්ලිම් පල්ලියට එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාගේ ආධාරකරුවන් විසින් පහරදීමෙන් පසුව සිදුවූ හානිය දැක බලා ගැනීම පැමිණි සංචාරයක් බව රවුෆ් හකීම් පැහැදිලි කළේය.

රවුෆ් හකීම් සමඟ ෂිබ්ලි ෆාරුක් රිල්වාන් මඩකලපුව රෝහලට ගිය බවට පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි ඉදිරිපත්වී ඇත. පීඩාවට පත් සියලු දෙනා දැක බලා ගැනීම සඳහා රවුෆ් හකීම් මෙම සංචාරය පැහැදිලි කිරීමට උත්සාහ කළද, සාක්ෂිවලින් පෙනී ගියේ ඔවුන් මුලින්ම රිල්වාන් ප්‍රතිකාර ලබන ස්ථානයට ගිය බවයි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සමඟ සම්බන්ධකම් පැවැත්වූ බවට කිසිදු සාක්ෂියක් පරීක්ෂණ කොමිෂන් සභාවට අසන්නට නොලැබුණි.

2016දී පමණ සහරාන් තම ෆේස්බුක් පිටුවේ අයිඑස් මතවාදයට සමාන ලිපි පළ කිරීම ආරම්භ කළ අතර මුස්ලිම් නොවන අය ඝාතනය කිරීම වැනි අයිඑස්හි කුරිරු ක්‍රියා සාධාරණීකරණය කළේය. සහරාන් අයිඑස් නායක අබූ බකර් අල්-බක්දාදි හැඳින්වූයේ කුරෙෂ් ගෝත්‍රය ගැන සඳහන් කරමින් මුහම්මද් නබිතුමාගෙන් පැවත එන්නෙකු ලෙසය. පාස්කු ප්‍රහාරය එල්ල කිරීමට පෙර 2019 අප්‍රේල් 20 වන දින මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසින් දෙන ලද බයියා (නායකයෙකුට පක්ෂපාතී වීම/පක්ෂපාතීත්වය

සම්බන්ධයෙන් දිවුරුම්දීම පිළිබඳ පොරොන්දුව) නිරූපණය කරන වීඩියෝවේ සහරාන් අබු බකර් අල්-බක්දාදි ගැන සඳහන් කිරීමේදී කුරේෂ් ගෝත්‍රය පිලිබඳව ද සඳහන් කළේය. 2016 දී පමණ නුෆර් නැවත ශ්‍රී ලංකාවට පැමිණ සහරාන් සමඟ එකතු විය. පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් වූ සාක්ෂි වූයේ 2016 අගෝස්තු හෝ ඔක්තෝබර් මාසවල කිසියම් දිනයක නවුෆර් විසින් සහරාන් සතුරන්ගේ හිස ගසා දැමීම පෙන්වන අයිඑස් වීඩියෝ අඩංගු පෙන් ඩ්‍රයිව් එකක් ලබාදුන් බවයි.

ෂියා නිකායෙන් මුස්ලිම්වරුන්ට සිදුවන හානිය යන තේමාව යටතේ සහරාන් 2016 මාර්තු 4 වන දින වාලච්චේනේහි මීරාඩ් හන්දියේදී වැඩසටහනක් පැවැත්වූ අතර ඔවුන්ගේ ක්‍රියාවන් කිහිපයක් විවේචනය කළේය.

සාමය රූපවාහිනී නාලිකාවේ සිය වැඩසටහන් තුළින් ආචාර්ය සකීර් නායික් ඉන්දියානු මුස්ලිම්වරුන්ට අන්තවාදය සහ ත්‍රස්තවාදය කෙරෙහි ආස්වාදයක් ලබාදෙන බවට ඉන්දියානු මාධ්‍ය විසින් කරන ලද ප්‍රකාශයන් සහරාන් 2016 ජූලි 9 වන දින විවේචනය කළේය. මීට පෙර ඔහු අවස්ථා දෙකකදී ශ්‍රී ලංකාවට පැමිණ 2010 මැයි 25 වන දින සුගතදාස ක්‍රීඩාංගණයේදී සහභාගී 20,000 ක් පමණ පිරිසක් ඇමතූ අතර 2011 ජනවාරි 26 වන දින මඩකලපුවේ 150 දෙනෙකු පමණ සහභාගී විය.

2016 සැප්තැම්බර් මස 4 වන දින සිට සහරාන් සෑම ඉරිදාවකම ඉස්ලාමීය රාජ්‍යය සහ කාලිෆා යන තේමාව යටතේ කාත්තන්කුඩි 3 හි පිහිටි සිය කාර්යාලයේදී සම්මන්ත්‍රණ පවත්වන ලදි. මුස්ලිම් නොවන රටක සිට ඉස්ලාමීය රාජ්‍යයකට ගමන් කිරීම යන්නෙන් අදහස් කරන්නේ හිජ්රාත් සංකල්පයයි.

2016 ඔක්තෝබර් 16 වන දින සහරාන් සහ ජාතික තවුහිද් ජමාත්හි සාමාජිකයින් කිහිප දෙනෙකු ජේඑම්අයිහි සාමාජිකයින් කිහිප දෙනෙකු මරදමුන කබීර් පල්ලියේදී හොස්නි මුබාරක් නම් පුද්ගලයෙකුගේ විවාහ මංගල්‍යයේදී හමුවිය. මෙය පළමු වරට ජමීල් සහ ඉල්හාම් සහරාන් මුණගැසුනු පළමු අවස්ථාව ලෙස පෙනේ. මෙම රැස්වීම ජාතික තවුහිද් ජමාත් සහ ජමාතේ මිල්ලතු ඊබ්‍රහිම් අතර සමීප සම්බන්ධතාවයක් ඇති කිරීමට හේතු විය.

සහරාන් විසින් පවත්වන ලද පුහුණු කඳවුරුවලට ජමාතේ මිල්ලතු ඊබ්‍රහිම්හි සාමාජිකයින් කිහිප දෙනෙකු සහභාගිවිය.

ඒ අතරම සහරාන්, කාත්තන්කුඩියේ ජාතික තවුහිද් ජමාත් පල්ලිය ඉදිකිරීම ආරම්භ කළේය. සිංගප්පූරු ජාතික හජා නලීම් නම් පුද්ගලයා පල්ලිය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන පහක් ලබාදුන්නේය.

2016 නොවැම්බර් 18 වන දින සහරාන් සිය ෆේස්බුක් ගිණුමේ අයිඑස් ක්‍රියාකාරකම් සහ සිරියාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව ප්‍රකාශයට පත් කළේය.

සහරාන් විසින් 2016 නොවැම්බර් 20 වන දින බොදුබල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ගේ ක්‍රියාකාරකම් සහ අබ්දුල් රාසික් අත්අඩංගුවට ගැනීම පිළිබඳව දේශනයක් පවත්වන ලදි. පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ගේ ක්‍රියාවන් ඉස්ලාමීය රාජ්‍යයක සිදුවූයේ නම් ඊට දඬුවම හිස ගසා දැමීම, එල්ලා මැරීම, ගල් ගැසීම හෝ පිටුවහල් කිරීම විය හැකි බව ඔහු තවදුරටත් කියා සිටියේය. ඔහු කියා සිටියේ මුස්ලිම්වරුන් වෙනුවෙන් කතා කරමින් සිටියදී අබ්දුල් රාසික් අත්අඩංගුවට ගත් බවයි.

2016 දෙසැම්බර් 9 වන දින සහරාන් විසින් ඉස්ලාමය සහ කැලිෆේට් පිළිබඳ කාත්තන්කුඩියේ ජාතික තවුහිද් ජමාත් පල්ලියේදී දේශනයක් පැවැත්විය. මුහම්මද් නබිතුමා ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපිත කළේ කඩුව ගෙන යුද්ධ කර සතුරන් මරා දමන බව ඔහු පැහැදිලි කළේය. මුස්ලිම්වරුන් යුද්ධ කළ යුතු බවත්, ඔහු (සහරාන්) මිය යාමට බිය නොවන බවත්, යුද්ධයෙන් පසු ඔහුත් මිය යා යුතු බවත් ඔහු තවදුරටත් කියා සිටියේය. මෙම කතාවේ වීඩියෝව යූ ටියුබ්හි පල කර ඇත.

මෙම ප්‍රසිද්ධ ප්‍රකාශවලින් පෙනී යන්නේ සහරාන් 2016 අවසානය වන විට ප්‍රචණ්ඩ අන්තවාදයට නැඹුරුවක්දී ලබා ඇති බවයි. 2017 මාර්තු මාසයේ අලියාර් හන්දියේදී සුෆිවරුන්ට එරෙහිව කඩු භාවිතා කිරීම මඟින් මෙය තවදුරටත් තහවුරු වේ.

2017 ජනවාරි 22 වන දින සහරාන් ජිහාඩ් සහ ජිහාඩ් සම්බන්ධයෙන් මුස්ලිම් නොවන අයගේ කැමැත්ත පිළිබඳව ප්‍රකාශයට පත්කළේය.

2017 පෙබරවාරි 13 වන දින ජාතික තවුහිද් ජමාත් විසින් කාත්තන්කුඩිහි පිහිටි සිය කාර්යාලයේදී "ඉස්ලාම් කාලිෆා අවශ්‍ය වන්නේ ඇයි? කුමක් සඳහාද? එය සාක්ෂාත් කරගන්නේ කෙසේද? " සහරාන් කථිකයා වූ අතර ඉස්ලාමීය රාජ්‍ය සංකල්පය ඉස්මතු කළේය. "බයියාත්" දිවුරුම ගැන සඳහන් කළ ඔහු, කලීෆා පත් කිරීමෙන් පසු අතට කඩුවක් හෝ ආයුධයක් ලබාදිය යුතු බවත්, ඉන්පසු සියලු මුස්ලිම්වරුන් ඔහු අණ කළ පරිදි ක්‍රියා කළ යුතු බවත් පැවසුවේ ය. කලිෆාගේ මරණයෙන් පසු බුද්ධිමත් මුස්ලිම් සමාජයට තවත් කාලිෆා කෙනෙකු පත් කිරීමට හැකි විය යුතු බව ඔහු පැවසීය.

ඉස්ලාමීය රාජ්‍ය සහ කලීෆා යන සංකල්ප පැහැදිලි කරමින් සහරාන් 2017 මාර්තු 2 සහ 4 යන දිනවල සිය ෆේස් බුක්හි ලිපි පළ කළ අතර ජිහාඩ් සංවිධානය විසින් මුස්ලිම්වරුන්ට යුද්ධ කිරීම අනිවාර්ය බව ප්‍රකාශ කළේය.

සහරාන් ඔහුගේ දෘෂ්ටිවාදය ප්‍රචාරය කිරීමට සහ අනුගාමිකයින් බඳවා ගැනීමට සහ ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනඟා ගැනීමට සමාජ මාධ්‍ය සහ සන්නිවේදන යෙදුම් දැඩිව පරිශීලනය කර ඇත.

සහරාන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ඉහත දක්වා ඇති ස්ථාවරය බුද්ධි අංශ ඇතුළු වාචික හා වාර්තාමය සාක්ෂි මඟින් ලබාගත් පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත්වූ සාක්ෂි ඇසුරින් වන අතර සහරාන් ක්‍රියාකාරීවූ දින සිට කාත්තන්කුඩිහි ජීවත් වූ පුද්ගලයින්ද ඇතුළත්ය.

## 8 වන පරිච්ඡේදය

## සැඟවී සිටි සහරාන්

2017 මාර්තු මස මුලදී ජාතික තවුහිද් ජමාත් විසින් කාත්තන්කුඩිහි පත්‍රිකා බෙදාහරිනු ලැබුවේ 2017 මාර්තු 10 වන දින කාත්තන්කුඩියේ පැවැත්වීමට නියමිත රැස්වීමකට සහභාගි වන ලෙස ජනතාවට ආරාධනා කරමිනි. ජාතික තවුහිද් ජමාත් [illegible]නය විසින් සූෆි මුස්ලිම්වරුන් ඉස්ලාමයෙන් ඉවත්ව ගිය අය ලෙස හඳුන්වන්නෙ[illegible]යේ ජනතාව දැනුවත් කිරීම මෙම රැස්වීමේ අරමුණ වන බව එහි සඳහන් විය.

2017 මාර්තු 10 වන දින ජාතික තවුහිද් ජමාත් සාමාජිකයින් සහරාන්ගේ දේශනය පැවැත්වීම සඳහා කර්බාලා පාරේ කාත්තන්කුඩි 6 ප්‍රදේශයේ අලියාර් හන්දිය අසළ වේදිකාවක් සූදානම් කරමින් සිටියහ. එවිට ඉෂ්තිහාද් සුන්නතුල් වල් ජමාත් සාමාජිකයන් ජාතික තවුහිද් ජමාත් සාමාජිකයින් මුහුණට මුහුණ හමුවූ අතර එම ස්ථානයේ දේශනයක් නොපවත්වන ලෙස ජාතික තවුහිද් ජමාත් සාමාජිකයන්ට ප්‍රකාශ කළහ. කෙසේ වෙතත් කණ්ඩායම් දෙක අතර බහින්බස් වීමක් ඇති වූ අතර එක් සූෆි මුස්ලිම් ජාතිකයෙකුට කඩුවකින් පහරදීම නිසා කැපුම් තුවාල සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික තවුහිද් ජමාත්හි සාමාජිකයින් 8දෙනෙකු සහ ඉෂ්තිහාද් සුන්නතුල් වල් ජමාත්හි සාමාජිකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගනු ලැබීය.

මෙම සිද්ධියේ ප්‍රතිඵලයක් ලෙස සහරාන් අත්අඩංගුවට ගත යුතු බව දැනුම් දෙමින් සූෆි මුස්ලිම්වරු ජනාධිපති ලේකම් කාර්යාලයට පුද්ගලිකව පෙත්සමක් භාරදුන්හ. මෙය තැපැල් හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයට යොමු කර තිබුණි.

2019 අප්‍රේල් 26 වන දින සායින්දමරුදුහිදී ඝාතනයවූ ජාතික තවුහිද් ජමාත්හි සාමාජිකයෙකු වන නියාස් සිය ෆේස්බුක් පිටුවේ 2017 මාර්තු 11 වන දින සටහනක් තැබුවේ සූෆිවරුන් ඉස්ලාමයෙන් ඉවත්ව ගිය අය ලෙස සලකන බවත් මේ බව තහවුරු කරන 1979දී සමස්ත ලංකා ජමියතුල් උලමා සභාව විසින් නිකුත් කරන ලද ෆත්වා පිළිබඳවය.

සහරාන් අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලා සිටිමින් 2017 මාර්තු 13 වන දින සූෆිවරුන් විසින් කාත්තන්කුඩිහිදී උද්ඝෝෂණයක් සිදු කළහ. නියාස්ගේ ෆේස්බුක් සටහනට එරෙහිව ඔවුන් 2017 මාර්තු 15 වන දින කාත්තන්කුඩි පොලිසියට පැමිණිල්ලක්ද කළහ.

2017 මාර්තු 27 වන දින වලියුල්ලා භාරය සහරාන්ට එරෙහිව ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය, අධිකරණ අමාත්‍යාංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, නීතිපති, පොලිස්පති සහ ත්‍රස්ත විමර්ශන අංශයට පැමිණිලි කළේය.

අලියාර් හන්දියේ සිදුවීමෙන් පසු සහරාන් ප්‍රදේශයෙන් පලා ගියේය. ඔහුගේ බිරිඳ භාදියා සහ දරුවන් දෙදෙනා කැකුණගොල්ල බලා පිටත්ව ගියහ.

සහරාන්ට ප්‍රායෝගික අත්දැකීම් තුළින් ලබාගත් අන්තර්ජාලය පිළිබඳ දැනුමක් තිබුණි. මුලදී නූෆර් සහ පසුව හස්තුන් අන්තර්ජාලය භාවිතා කිරීමට ඔහුට උදව් කළහ. 2016 අප්‍රේල් මාසයේදී කාත්තන්කුඩියේ ජාතික තවුහිද් ජමාත් පල්ලියට පැමිණ හස්තුන් සහරන් හමුවිය. සහරාන් භාදියාට පැවසුවේ තමා අයිඑස් සාමාජිකයෙකු වන බවයි.

මෙම කාලය තුළ සහරාන් විසින් සාමාජිකයින් දෙසියයකට වැඩි සංඛ්‍යාවක් සිටින ටෙලිග්‍රෑම් යෙදුම මත අන්සාර් කිලාෆත් නමින් සමූහයක් නිර්මාණය කරන ලදි. සහරාන් භාදියාට පැවසුවේ විදුලි ටෙලිග්‍රෑම් යෙදුම වට්ස්ඇප් යෙදුමට වඩා ආරක්ෂිත බවයි. හස්තුන් භාදියා සඳහා ටෙලිග්‍රෑම් යෙදුම ස්ථාපනය කළේය. හස්තුන් විද්‍යුත් උපකරණ වෙළඳසැලක් පවත්වාගෙන ගියේය.

ඔහු සැඟවී සිට ටික කලක් යන විට සහරාන් ඔහුගේ ෆේස්බුක් ගිණුමේ ක්‍රියාකාරී නොවීය. 2017 අගෝස්තු 18 වන දින සහරන් සිය ෆේස්බුක් ගිණුම සක්‍රීය කළේය.

ඉන් අනතුරුව සහරාන් සිය ෆේස්බුක්හි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් දිරිගැන්වීම සඳහා තොරතුරු පළ කිරීමට පටන් ගත්තේය. ඔහු ආරම්භ කළේ මියන්මාරයේදී ඝාතනය කරන ලද මුස්ලිම්වරුන්ගේ සිද්ධිය සැළකිල්ලට ගනිමිනි. 2017 සැප්තැම්බර් 2 වන දින සහරාන් කියා සිටියේ මෙම ඝාතනවලට එරෙහිව ඔවුන් සටන් කළ යුතු බවයි. ඔහු 2017

සැප්තැම්බර් 17 වන දින ජිහාඩ් ඉටු කරන මුජාහිදීන් කෙනෙකු ලෙස තේජාන්විතව මියයාම පිළිබඳව ප්‍රකාශ කළේය.

මෙම සටහනට සමහර මුස්ලිම්වරුන්ගෙන් විවේචනයක් එල්ල වූ බව පෙනේ. 2017 නොවැම්බර් 10 වන දින ජිහාඩ් යන වචනයේ සැබෑ අරුත නොදැන විවේචනය කළ මුස්ලිම්වරුන් විවේචනය කරමින් සහරාන් ඊට ප්‍රතිචාර දැක්වීය.

2017 නොවැම්බර් මැද භාගයේදී සමහර සිංහල සහ මුස්ලිම් කණ්ඩායම් අතර ගිංතොටදී ප්‍රචණ්ඩත්වය පුපුරා ගියේය.

ගැටුමට සම්බන්ධවූ ගමේ පාර්ශ්වයන්ගේ කතා අනුව දෘෂ්ඨියන් වෙනස් වන නමුදු, අවම වශයෙන් බොහෝදෙනා එකඟ වන්නේ එය නොවැම්බර් මස 12 දින සිදුවූ සුළු රිය අනතුරකින් ආරම්භ වූ බවත්, ගමේ පිරිමි ළමයින් අතර නැවත නැවතත් ගැටුම් ඇතිවී අවසානයේදී එය බිහිසුණු වාර්ගික ප්‍රචණ්ඩත්වයක් දක්වා වර්ධනයවූ බවයි. පෙර දින බ්‍රහස්පතින්දා (16) එළැඹෙන පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වීමට බලාපොරොත්තුවෙන් සිටින ප්‍රාදේශීය මුස්ලිම් දේශපාලනඥයෙක් ගිංතොටදී සිංහල නිවාසවලට පහරදීමට අවට ප්‍රදේශවලින් මැර පිරිසක් මෙහෙයවූ බව වාර්තා වේ. මෙම ප්‍රහාරයෙන් නිවාස තුනකට හානි සිදුවීමෙන් පසු ප්‍රාදේශීය දේශපාලනඥයා ඇතුළු තිදෙනෙකු පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. සිකුරාදා රාත්‍රියේ පළිගැනීම් ආරම්භ විය. 2014දී අලුත්ගම වාර්ගික කෝලාහල පිළිබඳ අමිහිරි මතකයන් සිහියට ගෙන එමින් මුස්ලිම් නිවාස හා ව්‍යාපාර දූසිම් ගණනක් ගිනිබත් කොට විනාශ කරන ලදි. ප්‍රධාන වශයෙන් මුස්ලිම් ප්‍රදේශවල දේපල විනාශය ක්ෂණිකව සිදුවූ බව දක්නට ලැබේ. ත්‍රිරෝද රථ, යතුරුපැදි, ගඩොල් ව්‍යාපාරයක් සහ වෙළඳසැල්වලට ප්‍රහාරකයින් විසින් ගිනි තබා ඇති අතර, ආදායම් හා ජීවනෝපායන් විනාශ කිරීම සඳහා ප්‍රවේශමෙන් ඉලක්ක තෝරාගෙන ඇති බව පෙනේ.[1]

[1] Dharisha Bastians, Financial Times, 23rd November 2017. *Gintota and the Shadows of Extremism*. [Online] Availablke at < http://www.ft.lk/opinion/gintota-and-the-shadows-of-extremism/14-643843> Accessed on 7th January 2021.

ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට තුඩුදුන් ප්‍රදේශයේ සිදුවීම් පෙළ හෙළි කරමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුනසේකර මහතා පැවසුවේ "පළමු සිදුවීම නොවැම්බර් 13 වනදා සිදුවී ඇති නමුත් ඉන් පසුව ඇතිවූ සිදුවීම් සමඟ කිසිදු සම්බන්ධයක් නොමැති බවයි." නොවැම්බර් 13 දා මුස්ලිම් කාන්තාවක් සහ ඇගේ දියණිය සිංහල ජාතිකයෙකු විසින් පදවන ලද යතුරුපැදියක ගැටී ඇත. තිදෙනාම තුවාල ලබා රෝහල් ගත කර ඇත. ප්‍රතිකාර ලැබීමෙන් පසුව ඔවුහු රෝහලෙන් පිටව ගොස් ඇති අතර, කාන්තාව සහ ඇගේ දියණියට වන්දි වශයෙන් බයිසිකලය පැද වූ තැනැත්තා රු. 25000ක වන්දියක් ගෙවීම නිසා සිද්ධිය පොලිසියෙන් පරිබාහිරව සමතයකට පත්වී ඇති බව ඔහු පැවසුවේ ය.  ඉන් අනතුරුව බයිසිකල් පැදිකරුවෙකු පොලිස් ඇප මත නිදහස් කරන ලදි. බ්‍රහස්පතින්දා අනතුරට පළිගැනීමක් ලෙස ප්‍රහාරයක් එල්ල වී තිබේ. "කෙසේ වෙතත්, බ්‍රහස්පතින්දා එක් මුස්ලිම් ජාතිකයෙකු තුවාල ලැබූ එම සිද්ධිය සිදුවූ ස්ථානය අනතුරට සම්බන්ධ කිසිදු පාර්ශ්වයක සම්බන්ධයක් නොමැත. අනතුරට සම්බන්ධ කිසිවෙකු නොසිටියේය." සිංහල පුද්ගලයින්ට අයත් නිවාස දෙකකට පහරදී ඇති අතර එක් සිංහල පුද්ගලයකු තුවාල ලබා තිබේ. සිකුරාදා වන විට එම සිදුවීම් දාමය උත්සන්න වී ඇති අතර දේශපාලනඥයින්ගේ සහ ආගමික නායකයන්ගේ සහාය ඇතිව සිද්ධිය පාලනය කරන ලදි.[2]

2017 නොවැම්බර් 19 වන දින සිංහල හා මුස්ලිම් කණ්ඩායම් අතර ගිංතොටදී සිදුවූ සිදුවීම්වලින් දින කිහිපයකට පසු සහරාන් තම ෆේස්බුක් පිටුවට වීඩියෝවක් උඩුගත කළේය. එහිදී ඔහු හිජ්රාත්හි කැලිෆේටයට (මුස්ලිම්වරුන් වෙනත් රටවලින් ඉස්ලාමීය රාජ්‍යයකට ගමන් කරන), ෂරියා නීතිය සහ ජිහාඩ් (ඉස්ලාමය වෙනුවෙන් කෙනෙකුගේ ජීවිතය පූජා කිරීම) පිලිබඳව කතා කළේය.

---

[2] Daily Mirror, 18th November 2017. *Gintota situation under control, 19 arrested.* [Online] Available at <http://www.dailymirror.lk/140639/Gintota-situation-under-control-arrested>. Accessed on 7th January 2021.

සහරාන් පොලීසිය මඟ හරිමින් සිටියද 2017 අග භාගයේ සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පුහුණු කඳවුරු සහ සම්මන්ත්‍රණ පවත්වා ඇත.

සහරාන් සිය පළමු පුහුණු කඳවුර 2017 නොවැම්බර් මාසයේ දී මැදවච්චිය රඹෑවෙල පැවැත්වූවේය. මෙම කඳවුරට පුද්ගලයින් 13 දෙනෙකු පමණ සහභාගිවී ඇති අතර ටී-56 ආයුධයක් භාවිතා කරමින් ප්‍රතිඥාවක් ලබාදී තිබේ.

දෘෂ්ටිවාදාත්මක වෙනස්කම් හේතුවෙන් ජමාතේ මිල්ලතු ඊබ්‍රහිම් තුළ පැන නැගී ඇති ආරවුලක් සමතයකට පත් කිරීම සඳහා 2017 දෙසැම්බර් 16 වන දින මල්වානේ පිහිටි පැන්ඩා බහු ක්‍රීඩාපිටියේ වේදිකාවේදී සම්මන්ත්‍රණයක් පැවැත්වීමටද ඔහු මූලිකත්වය ගත්තේය. සිරියාවට ගොස් අයිඑස් සංවිධානය වෙනුවෙන් සටන් කිරීමෙන් ජිහාඩ් සිදුකළ යුතු යැයි උමායාර් මොහොමඩ්ගේ අදහස විය. අනෙක් අතට ජිහාඩ් ශ්‍රී ලංකාවේ සිදුකළ යුතුය යන්න ජමීල්ගේ මතය වී තිබුණි.

2017 අග භාගයේ සහ 2018 මුල් භාගයේදී සහරාන් රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය විවේචනය කිරීමට පටන් ගත්තේය. ඒවායින් සමහරක් අධිකරණයට එරහිවද ප්‍රචණ්ඩකාරී හඬක් නඟා තිබේ. මෙයට පදනම් වූයේ ඉස්ලාමීය රාජ්‍යයක ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩක් නොමැති බවට වන ඔහුගේ අවබෝධය මතය.

2017 දෙසැම්බර් 25 සහ 27 දිනවල ඔහු ව්‍යවස්ථාදායකය සහ අධිකරණය විවේචනය කරමින් වීඩියෝවක් නිකුත් කළ අතර කුර්ආනය හා සුන්නාව අනුව ජීවත් වන පුද්ගලයෙකු ව්‍යවස්ථාදායකයට හා අධිකරණයට ගරු නොකළ යුතු බව ප්‍රකාශ කළේය. අල්ලාහ්ට අනුව පාර්ලිමේන්තුව යනු කාෆිර්වරුන්ට (මුස්ලිම් නොවන අයට) අයත් ස්ථානයක් බව ඔහු තවදුරටත් විස්තර කළේය.

අධිකරණය සම්බන්ධයෙන් ඔහු කියා සිටියේ මුස්ලිම් නොවන අධිකරණවල සහාය පතන මුස්ලිම්වරු අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන බවත්, විනිසුරුවන් හා නීතිඥයින් වැනි අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන මුස්ලිම්වරුන් ඝාතනය කළයුතු බවත් එය මහානාර්ඝ ජිහාඩ් ක්‍රියාවක් වන බවත්ය.

"ඉස්ලාමීය රාජ්‍ය සංකල්පය සහ ශ්‍රී ලංකා දේශපාලන පක්ෂ" යන මාතෘකාව යටතේ 2018 ජනවාරි 6 වන දින නිකුත් කරන ලද වීඩියෝවකින් ඔහු දේශපාලන පක්ෂ කෙරෙහි අවධානය යොමු කළේය. ඉස්ලාමීය රාජ්‍යයක ප්‍රජාතන්ත්‍රවාදයක් නොමැති බවත් ඉස්ලාමීය රාජ්‍යයක පවතින්නේ ජිහාඩ් (මුස්ලිම් නොවන අයගෙන් බදු අය කිරීම) සහ ෂරියා නීතිය පමණක් බවත් ඔහු පැවසීය. සහරාන්ගේ මෙම ප්‍රකාශයන් ඉස්ලාමීය රාජ්‍යයක වෙනත් ආගමක් හෝ ප්‍රජාතන්ත්‍රවාදයක් තිබිය නොහැකි බවට පැහැදිලි සාක්ෂියකි. ඇත්ත වශයෙන්ම ඔහු මහනුවර තැන්නකුඹුර ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියක් තුළ පිරිත් ගායනා කිරීම පිළිබඳව දැඩි විවේචනයක් කළේය.

බඳවා ගන්නන් ආකර්ෂණය කරගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහයට පහරදීමේ උපායමාර්ගය අයිඑස් සංවිධානය ලෝකය පුරා භාවිතා කරන උපාය මාර්ගයකි. සිරියාවේ රූගත කරන ලද අයිඑස් ප්‍රචාරක වීඩියෝවක බංග්ලාදේශයේ ජිහාඩ්වාදීන් තිදෙනෙක් බංග්ලාදේශයේ හෝලි ආටිසන් බේකරි ප්‍රහාරයට ප්‍රශංසා කළ අතර ජිහාඩ් ඉල්ලා සිටියහ. ඔහුගේ ප්‍රකාශයේදී එක් ජිහාඩ්වාදියෙකු පළමුවෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට හෝ 'මිනිසා විසින් සාදන ලද නීති' ගැටලුව ලෙස දොස් පැවරූ අතර විසඳුම ලෙස සන්නද්ධ අරගලය ඉදිරිපත් කළේය. ඔහුගේ වචන වලින්: "අද බංග්ලාදේශයේ තත්ත්වය දෙස බැලුවහොත්, ආණ්ඩු විසින් අල්ලාහ්ගේ (දිව්‍ය) නියෝග වෙනුවට මිනිසා විසින් සාදන ලද නීති ආදේශ කර ඇති අයුරු අපට පෙනේ. ඔවුන් තාගුට් බවට පත්ව ඇත්තේ එබැවිනි. ඔවුන් කෆීර් බවට පත්ව ඇත. ජිහාඩ් ඔවුන්ට එරෙහි සන්නද්ධ සටනේදී මෙන් ෆාර්ඩ්-ඊ-අයින් (තනි පුද්ගල වගකීමක්) බවට පත්ව තිබේ. අල්ලාහ් වෙනුවට රටේ නීති තීරණය කරන මිනිසුන් 'ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් හැඳින්වෙන මෙම ශර්ක් දෘෂ්ටිවාදයට සහයෝගය දක්වන්නේ කෙසේදැයි' ප්‍රශ්න කරමින් බංග්ලාදේශ රජය එහි සේවකයින්, සාමාන්‍ය ජනතාව සහ ප්‍රජාතන්ත්‍රවාදයේ ආධාරකරුවන් ඔහු මිනිසුන් වර්ග තුනක් විවේචනය කළේය. ඒ හා සමාන මතයක් ඔවුන්ගේ අන්තර්ජාල සඟරාවක් වන ඩබීක්හි ද දක්නට ලැබේ. එහි සඳහන් වනුයේ "ප්‍රජාතන්ත්‍රවාදය යනු නීති සම්පාදනය කිරීමට හා දේවල් හලාල් හා හරාම් කිරීමට බලය ලබාදීමට විශ්වාස කරන ආගමක් වන අතර එය අල්ලාහ්ගේ අයිතිය පමණි."

මුස්ලිම් ප්‍රජාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය විවේචනය කළ එකම පුද්ගලයා සහරාන් නොවේ. 2018 ජනවාරි 12 වන දින ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය විසින් සංවිධානය කරන ලද මස්ජිඩ් තවුහිද් ජුම්මා මුස්ලිම් පල්ලියේ පැවති දේශනයකදී ප්‍රජාතන්ත්‍රවාදය ඉස්ලාමයේ ඉගැන්වීම්වලට හා තවුහිද් මතවාදයට පටහැනි බව පැවසේ.

2017 අග භාගයේ සිට සහරාන් ඉන්දියාවේ සිටි අබු හින්ද් සමඟ සම්බන්ධ විය. නුෆර්ද් අබු හින්ද් සමඟ දැන හඳුනාගෙන සන්නිවේදනය කළේය. සහරාන් හාදියා පැවසුවේ අබු හින්ද්ට සිරියාව සමඟ සම්බන්ධතා ඇති බවයි. ඔවුන් ත්‍රීමා සහ ටෙලිග්‍රෑම් යෙදුම් භාවිතා කරමින් දෙමළෙන් කතා කළහ.

ඔවුන් එකිනෙකාගේ හඬ පණිවිඩ කිරීම් හුවමාරු කර ගැනීමට පුරුදුව සිටියහ. අබු හින්ද් සහරාන්ගේ ආරක්ෂාව ගැන විමසුවේය. අබු හින්ද් ඔහුගේ සමහර දේශනවල හඬ පටිගත කිරීම් යැවීමට පුරුදුව සිටියේය. වරක් ඔහු සිරියාවේ 15 හැවිරිදි දරුවෙකු විසින් සිදු කරන ලද මරාගෙන මැරෙන ප්‍රහාරයක් පිළිබඳ විස්තර සහරාන් වෙත යවා ඇත. සහරාන් කටාර් සහ සවුදි අරාබියේ මිනිසුන් සමඟ මෙසෙන්ජර් හරහා කතාබස් කිරීමටද පුරුදුව සිටියේය.

අහම්බෙන් 2017 අගෝස්තු 23 වන දින දේශීය මාධ්‍ය විසින් ඉන්දියානු ජාතික මොහොමඩ් ෂාෆි අර්මාර්@චොට් මවුලා@අනන් බායි@යූසුෆ් අල්-හින්දි (Mohommed Shafi Armar@Chhote Maula@Anan Bhai@Yousuf Al-Hindi) ලෝක ත්‍රස්තවාදීන්ගේ ලැයිස්තුවට ඇතුළත් කර ඇති අතර ඔහු "විශේෂයෙන් නම් කරන ලද ගෝලීය ත්‍රස්තවාදියෙකු" ලෙස වාර්තා කර ඇත. ඔහු අයිඑස් සඳහා ඉන්දියානු උප මහාද්වීපයේ නියෝජිතයා ලෙස කටයුතු කර ඇති අතර අයිඑස් සංවිධානයට සම්බන්ධවූ පළමු ඉන්දියානුවා ලෙස සැළකේ. ඔහු මේ වන විට ඉන්දියාව, බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව යන රටවලින් මුස්ලිම් තරුණයින් 50ක් පමණ අයි.එස්. ඉස්ලාමීය රාජ්‍යයක් වන විලයාත් සීලානි, ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම සඳහා මාවතක් නිර්මාණය කිරීමේ අරමුණින් 2018

මුල් භාගය වන විට සහරන් ශ්‍රී ලංකාවේ ප්‍රහාර දියත් කිරීමට තීරණයක් ගෙන ඇති බවට සෘජු හා අවස්ථානුකූල ප්‍රබල සාක්ෂි තිබේ. මෙයට සාධක කිහිපයක් හේතු විය.

මූලික රියදුරු වූයේ අයිඑස් දෘෂ්ටිවාදය සහ ලොව පුරා එහි ක්‍රියාකාරකම් ය. අයිඑස් දෘෂ්ටිවාදයේ කොටසක් වන වහබ්වාදී දෘෂ්ටිවාදය විසින් ද එය මෙහෙයවනු ලැබූ අතර, ඒ වන විට ඔහු වෙන් කිරීමකින් තොරව වැළඳ ගැනීමට පැමිණ සිටියේය. අනුගාමිකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ඔහු සැලසුම් කර තිබුණේ මහනුවර ඇසළ සංදර්ශනයට පහරදී සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර කලබල ඇති කිරීමටත්, පසුව අගතියට පත් මුස්ලිම්වරුන් බඳවා ගැනීමටත්, පොලීසියට හා හමුදාවට පහර දීමටත් පොලීසිය සහ ආරක්ෂක හමුදා මුස්ලිම්වරුන්ට ඇති කරන පීඩනය ගසාකෑමටය. නැගෙනහිර කඳවුරු බැඳ ආයුධ එකතු කිරීම. බඳවා ගැනීමේ උපාය මාර්ගයේ කොටසක් ලෙස ඔහු ලොව පුරා සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ඉලක්ක කරගත් සිදුවීම් භාවිතා කළේය.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔහු පුහුණු කඳවුරු කිහිපයක් පැවැත්වූ අතර එහිදී සහභාගී වූවන්ට ටී-56 පිස්තෝලය සහ පිහිය වැනි ආයුධ භාවිතය පිළිබඳ න්‍යායාත්මක පැහැදිලි කිරීමක් ලබා දෙන ලදි. බුද්ධි අංශ සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් හඳුනාගැනීම වළක්වා ගැනීම සඳහා ඔවුන්ට යම් පුහුණුවක් ලබාදෙන ලදි. අනුගාමිකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සමාජ මාධ්‍යවල නොමිලයේ අන්ත ආගමික, දේශපාලන හා ප්‍රචණ්ඩකාරී කථා කිහිපයක් ද මෙම ප්‍රයත්නය සමඟ ඒකාබද්ධ විය.

දේශන හා පන්ති පැවැත්වීම, ආයුධ පුහුණුව වැනි යුද්ධයේ ක්‍රමානුකූල ප්‍රවේශය වැනි මුල් අවධියේදී ක්‍රියාත්මක වන ඕනෑම ත්‍රස්ත සංවිධානයක් භාවිතා කරන උපක්‍රම සහරාන්ගේ සැඟවුණු ක්‍රියාකාරකම්වලට හේතු විය හැකිය.

2018 පෙබරවාරි 20 වන දින සහරාන් තම ෆේස්බුක් ගිණුමේ ජිහාඩ් ගැන සඳහන් කරමින් වීඩියෝවක් උඩුගත කර ඇති අතර ඉස්ලාමයේ සැබෑ අනුගාමිකයන් වෙනත් ආගම්වලට යටත් නොවී ඉස්ලාමය (ජිහාඩ්) ආරක්ෂා කිරීමට සටන් කළ යුතු බව ප්‍රකාශ කරයි. අයිඑස්හි හිටපු මාධ්‍ය ප්‍රකාශක අෂෛයික් අබු මුහම්මද් අල් අද්නානි විසින් අරාබි බසින් ගායනා කරන ලද ගීතයක් ගැන ඔහු සඳහන් කළ අතර එහිදී දෙවියන් වෙනුවෙන් මියයෑම වරප්‍රසාදයක් බවත් එමගින් සියලු පාපවලට සමාව දෙන බවත් ප්‍රකාශ කර ඇත.

තම අනුගාමිකයන් ත්‍රස්තවාදය දෙසට පොළඹවා ගැනීමේ ඔහුගේ උපාය මාර්ගයේ කොටසක් ලෙස සහරාන්ද උත්සාහ කළේ මුස්ලිම්වරුන්ව ඡන්ද බලය පාවිච්චි කිරීමෙන් වළක්වාලමින් මැතිවරණ ක්‍රියාවලිය අඩපණ කිරීමටය. ඔහු එසේ කිරීමට උත්සාහ කළේ ජනතාවගේ නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද බලය පාවිච්චි කිරීම ඉස්ලාමීය ඉගැන්වීම්වලට සහ හදීස් මූලධර්මවලට පටහැනි බව පවසමින් ඔහුගේ ෆේස්බුක් ගිණුමේ වීඩියෝ නිකුත් කිරීමෙනි.

ප්‍රජාතන්ත්‍රවාදය පවතින විට මුස්ලිම්වරුන්ට 100% ක් ඉස්ලාම් දහම පිළිපැදිය නොහැකි බැවින් ඡන්දය ප්‍රකාශ නොකරන ලෙස ඔහු 2018 ජනවාරි 25 සහ 28 යන දිනවල අනුගාමිකයින්ගෙන් ඉල්ලා සිටියේය. නැවතත් 2018 පෙබරවාරි 4 වන දින සහරාන් විසින් මැතිවරණවලදි ඡන්දය ප්‍රකාශ කිරීම විවේචනය කරමින් වීඩියෝවක් නිකුත් කළ අතර එය ඉස්ලාමයට අනුකූල යැයි සමස්ත ලංකා ජමියතුල් උලමා සභාව හට ප්‍රකාශ කළ හැක්කේ කෙසේදැයි ප්‍රශ්න කරයි. ඔහුට අනුව මැතිවරණවලදී ඡන්දය ප්‍රකාශ කිරීම ඉස්ලාමයට විරුද්ධය. ඉන්පසුව ඔහු 2018 පෙබරවාරි 6 සහ 7 යන දිනවල ඉස්ලාමයේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරන බව කියා සිටින වීඩියෝ නිකුත් කළේය. තවුහිද්වාදය ප්‍රජාතන්ත්‍රවාදය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන හෙයින් මුස්ලිම්වරු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කළ යුතු බව ඔහු තවදුරටත් පැහැදිලි කළේය. 2018 පෙබරවාරි 10 වන දින පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය වර්ජනය කරන ලෙස ඔහු මුස්ලිම්වරුන්ගෙන් ඉල්ලා සිටියේය.

2018 පෙබරවාරි මාසයේ දී රටේ සමහර ප්‍රදේශවල අම්පාර, දිගන සහ තෙල්දෙණිය වැනි නගරවල සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර යළිත් ආතතියක් ඇති විය.

2018 පෙබරවාරි මස අග වන විට අම්පාරහි සිදුවීමක් යළිත් වරක් රටේ සමහර ප්‍රදේශවල සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර උණුසුම් තත්ත්වයක් ඇතිකිරීමට හේතු විය. මෙම සිදුවීම ආරම්භ වූයේ සඳුදා රාත්‍රියේ ගැටුමකට තුඩුදුන් මුස්ලිම් ජාතිකයෙකුට අයත් ආපන ශාලාවක දරුඵල ලැබීමට ඇති හැකියාව කෙරෙහි බලපාන රසායනික ද්‍රව්‍ය අඩංගු ආහාර සිංහල ජනතාව වෙත ලබාදෙන බවට පැතිරගිය කටකතාවක් හේතුවෙනි. මුස්ලිම් පල්ලියක් සහ ප්‍රජාවේ මුස්ලිම් සාමාජිකයින්ට අයත් දේපළ කිහිපයක්, මුස්ලිම් පල්ලියට ආසන්න කුඩා වෙළඳසැල් කිහිපයක්, අම්පාර නගරයේ මාර්ගයක් අසළ වූ හෝටලයක් සහ වාහන කිහිපයක් යම් පුද්ගලයින් පිරිසක් සහ හෝටලයේ හිමිකරුවන් අතර ඇති වූ බහින්බස් වීමක් දුරදිග යාමෙන් එක්තරා පිරිසක් විසින් ගිනිබත්කොට ඇත.

දිගනහි වීදිවල ප්‍රචණ්ඩත්වයට තුඩු දුන් සිද්ධිය සිදුවී ඇත්තේ පෙබරවාරි 22 වනදා ය. 42 හැවිරිදි සිංහල ජාතිකයෙකුට ත්‍රිරෝද රථයක් පසුකර යාමට තැත් කිරීම හේතුවෙන් අමානුෂික ලෙස පහරදී තිබේ. මහනුවර මහ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ දින 10 කට ආසන්න කාලයක් ගතවීමෙන් පසු මාර්තු 3 වන දින (සෙනසුරාදා) මෙම පුද්ගලයා මියගොස් ඇති බව ප්‍රදේශයේ වාර්තාකරුවන් පැවසුහ. විත්තිකරුවන් සිව්දෙනාම වහාම අත්අඩංගුවට ගෙන මාර්තු 7 වන තෙක් රිමාන්ඩ් කරනු ලැබීය. වින්දිතයාගේ අවමංගල්‍ය උත්සවය ඊයේ පැවති අතර එය ප්‍රචණ්ඩත්වයට හේතු වන්නට ඇතැයි ප්‍රදේශයෙන් එළියට එන පොලිස් වාර්තා පවසයි. තෙල්දෙණියෙදී අනතුරට ලක්වූ පුද්ගලයා ඔහුගේ පවුලේ එකම ආහාර සැපයුම්කරු සහ වෙහෙස මහන්සිවී වැඩ කළ අයෙකු බව ප්‍රදේශයේ සමාජ සේවකයෙකු වන හම්සා රහ්මාත් පැවසීය. මාර්ගයේ සිදුවූ සිදුවීම ත්‍රිරෝද රථයක පැති කණ්ණාඩියක් නිසා සිදුවී ඇති බව රහ්මාත් පැවසීය. ඝාතනය සම්බන්ධයෙන් විත්තිකරු මත්පැන් පානය කර ඇති බව සමාජ සේවකයා වැඩිදුරටත් පැවසීය. "ඔවුන්ගේ වැරැද්ද නිසා දැන් මුළු ප්‍රජාවම කරදරයට පත්ව ඇත" රහ්මාත් පැවසීය.

සහරාන්ට අවශ්‍ය වූයේ අපකීර්තිමත් මුස්ලිම් තරුණයින් තම සංවිධානය වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා තත්ත්වය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට ය. මේ සඳහා ඔහු 2018 මාර්තු 5 වන දින දිගන සහ තෙල්දෙණියෙහි සිදුවීම් පිළිබඳ වීඩියෝවක්

සිය ෆේස්බුක් පිටුවට උඩුගත කළේය. මුස්ලිම්වරුන්ට ආයුධ අතට ගන්න, පහරදී මරා දමන ලෙස ඔහු මුස්ලිම්වරුන්ගෙන් ඉල්ලා සිටි අතර ඉස්ලාමය මුස්ලිම් නොවන අය සමඟ සාමකාමීව පැවතිය නොහැකි බව කියා සිටියේය. සහරාන් ඔවුන්ගෙන් සාමය ගැන කතා කරන අයට අවනත නොවන ලෙස ඉල්ලා සිටි අතර පළිගැනීමේ ප්‍රහාර දියත් කිරීමෙන් පසුව ඇතිවිය හැකි ප්‍රතිවිපාක ගැන සිතීමට එරෙහිව දේශනා කර තිබේ. මුස්ලිම්වරුන්ට හානි කළ අයගෙන් පළිගැනීමට කටයුතු කරන බව ඔහු වැඩිදුරටත් කියා සිටියේය. සහරාන් සිය කතාවේදී ජිහාඩ් ගැන නිශ්චිත සඳහනක් කළේය.

ඔහුගේ උත්සාහයන් යම් දුරකට සාර්ථක වූ බව පෙනේ. දිගන සිද්ධියෙන් පසු තමා සහරාන් සමඟ සම්බන්ධ වූ බව සාදික් සාක්කි දෙමින් කියා සිටියේ තමා අයිඑස්හි මතවාදයන්ට අනුව කටයුතු කරන බවයි. කෙසේ වෙතත්, සහීක් සහරාන් සමඟ සම්බන්ධ වීමට බොහෝ කලකට පෙර සාදික් තම සගයන් සඳහා පුහුණු කඳවුරු පවත්වා ඇති බව පෙනේ. පුහුණු කඳවුරක් 2017 නොවැම්බරයේ හෝ දෙසැම්බර් මාසයේදී මුත්තූර්හි තොප්පූර්හිදී පවත්වන ලද අතර එය සාදික් විසින් පවත්වන ලද අතර පුද්ගලයින් 6 දෙනෙකු පමණ සහභාගිවිය. සහරාන් මෙම පුහුණු කඳවුරට සහභාගිවූ බවට මෙතෙක් කිසිදු සාක්ෂියක් නොමැත. සාදික් ටී-56 ආයුධය ඉවත් කිරීම හා පැටවීම පිළිබඳ ප්‍රායෝගික නිරූපණයක් ලබාදී තිබුණි. පුහුණුව සඳහා භාවිතා කරන නිවස අයිති වන්නේ සාදික්ගේ මිතුරෙකු වන හජා මොහදීන් ය. එය එක් දින කඳවුරක් විය.

දිගන සිද්ධියෙන් පසුව පැවැත්වූ පළමු පුහුණු කඳවුර සහරාන් ඊට පෙර සිටි පිරිසට වඩා විශාල පිරිසක් සහභාගිවිය. එය එන්රිච් බංගලාවේ අංක 147/7 / ඒ, ධර්මසෝකා මාවත, ලේවැල්ල, මහනුවර. 2018 මාර්තු 23 සිට 25 දක්වා පැවැත්වූ අතර එහිදී 25 ක් පමණ සහභාගී විය. ඉස්ලාමීය අන්තවාදය, අයිඑස් සහ එහි ක්‍රියාකාරකම් පිළිවෙලින් සහරාන් සහ නූෆර් විසින් දේශන පවත්වන ලද අතර මිල්හාන් ටී-56 ආයුධ දෙකක් ආධාරයෙන් ටී-56 පටවා ගැනීම පිළිබඳ පුහුණුව ලබා දුන්නේය. ආරක්ෂක අංශ සහ බුද්ධි අංශ මගහැරීම සඳහා ජංගම දුරකථනය සඳහා වීපීඑන් එකක් භාවිතා කරන්නේ කෙසේදැයි හස්තුන්

පැහැදිලි කළ අතර කෙනෙකුගේ අනන්‍යතාවය හෙළි නොකරන සිම් කාඩ්පත් ලබා ගන්නා ලෙස සහභාගිවන්නන්ට උපදෙස් දුන්නේය.

ඊළඟ පුහුණු කඳවුරේදී සංඛ්‍යාව තවත් වැඩිවිය. තවත් පුහුණු කඳවුරු තුනක් අංක 56/1, පන්සල් පාර, ශාන්තිපුර, නුවරඑළියෙහි 2018 මාර්තු 30 සිට 2018 අප්‍රේල් 1 දක්වා පුද්ගලයින් 15 සිට 20 දක්වා පමණ සහභාගිවූ අතර 2018 මැයි 4 සිට 2018 මැයි 6 දක්වා පුද්ගලයන් 30 ත් 35 ත් අතර සංඛ්‍යාවක් සහභාගිවූ අතර 2018 මැයි 7 සිට 2018 මැයි 8 දක්වා පුද්ගලයින් 25 ත් 30 ත් අතර සංඛ්‍යාවක් සහභාගිවූහ. හයාතු මොහොමඩ් අහමඩ් මිල්හාන් ටී-56 සහ පිස්තෝලය භාවිතා කිරීම පිළිබඳ දේශන පැවැත්වූයේ ආයුධ ඉවත් කර නැවත සවි කිරීම පිළිබඳ ප්‍රායෝගික නිරූපණයක් ලබා දෙමිනි. මොහොමඩ් හස්තුන් බෝම්බ සෑදීම පිළිබඳ දේශන පැවැත්විය. අන්තවාදී දේශන පැවැත්වූයේ සහරාන් සහ නූෆර් විසිනි.

එවැනි සිදුවීම්වලින් කුපිත වූ මුස්ලිම් තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීම සඳහා සිය දේශනයේ ප්‍රායෝගික උදාහරණ අඩංගු බව සහරාන් සහතික කළේය. ඔහුගේ සමහර දේශන මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ මියන්මාරයේ සිදුවීම් සහ ජපානයේ බෞද්ධ අන්තවාදී ව්‍යාපාරය වන ඕම් ෂින්රිකියෝ යන නමින් වන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අතර ඒ පිළිබඳව සහරාන් ෆේස්බුක්හි ලිපියක් ලියා තිබේ. සාක්ෂිවලට අනුව සහරාන් ප්‍රකාශ කර ඇත්තේ එම ලිපිය පලකිරිම සම්බන්ධයෙන් බුද්ධි අංශ නිලධාරීන් විසින් විමර්ශනයක් සිදුකරන බවය.

සහරාන් ප්‍රකාශ කර ඇත්තේ පූජ්‍ය ගලබොඩඅත්තේ ඥානසාර හිමියන් මියන්මාරයේ පූජකයෙකු මුණගැසී ජපානයට ගොස් ඇති අතර එහිදී ඔහු ඕම් ෂින්රිකියෝ ව්‍යාපාරයේ නියෝජිතයන් හමුවී ඇති බවයි. එය වඩාත් ඒත්තු ගැන්වීම සඳහා සහරාන් ප්‍රකාශ කර ඇත්තේ මුස්ලිම්වරුන්ගේ තත්ත්වය වඩාත් නරක අතට හැරෙමින් පවතින බවත් ඉතිරිව ඇති එකම දෙය නම් මුස්ලිම්වරුන්ගේ මරණය පමණක් බවත්ය.

රාමසාන් කාලයට සමගාමීව 2018 මැයි මාසය තුළ සහරාන් විසින් ජිහාඩ් රාමසාන් පුවත සමඟ සමීපව සම්බන්ධවී ඇති බව මුස්ලිම්වරුන්ට ඒත්තු ගැන්වීම සඳහා ප්‍රචාරක වැයමක් දියත් කරන ලදි. 2018 මැයි මස 17 සහ 18 යන දෙදින තුළ ඔහු මුජාහිදීන් සහ ජිහාඩ් ගැන සාකච්ඡා කරමින් වීඩියෝව සිය ෆේස්බුක් වෙබ් අඩවියේ නිකුත් කළේය. මුජාහිදීන් යනු අවි අතට ගෙන මුස්ලිම් නොවන අයට එරෙහිව සටන් කරන පුද්ගලයින් වන අතර ජිහාඩ් යනු අල්ලාහ් වෙනුවෙන් පුද්ගලයන් තම ජීවිතය පූජා කර කැප කරන ස්ථානයකි. මොහොමඩ් නබිගේ ක්‍රියා කලාපය ගැන සඳහන් කරමින් හදීස් පිළිබඳ නිවැරදිව පොත් ලියා ඇත්තේ ඉමාම් අල් බුහාරි සහ ඉමාම් අල් මුස්ලිම් පමණක් බව ඔහු වැඩිදුරටත් පැවසීය. අල්ලාහ්ගේ පරමාධිපත්‍යය තහවුරු කිරීම සඳහා ස්වර්ගයට ඇති කෙටිම මාර්ගය ජිහාඩ් කිරීම බව ඔහු තවදුරටත් කියා සිටියේය. මොහොමඩ්ගේ නබිතුමාගේ ජීවිතය පිළිබඳව "අල්ලාහ්ගේ දූතයා, යුද නායකයා" යන මාතෘකාව යටතේ අල් බග්දාඩි විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත සහරාන් මීට පෙර සඳහන් කර ඇති අතර එය ජිහාඩ් සහ ඉස්ලාමීය රාජ්‍ය සංකල්ප සංකල්ප ඉස්ලාමීය රාජ්‍යය මුස්ලිම් දරුවන්ගේ මනස්වලට ඒත්තු ගැන්වීමට ඒවා ඉගැන්වීම සඳහා ශ්‍රී ලංකාවේ මුස්ලිම් පාසල් සහ අරාබි පාසල් භාවිතා කළ යුතු බව පවසා තිබේ. හාදියාට අනුව මෙම උපවාස කාලය තුළ සහරාන් ශ්‍රී ලංකාවේ නායකයා ලෙස සහරාන් වෙනුවෙන් ප්‍රතිඥාවක් දුන් කණ්ඩායමක් සහ සිරියාවේ නායකයා ලෙස අබුබකර් අල් බක්දාදි පිළිබඳවද ගැන සඳහන් කළේය.

2018 මැයි 22 වන දින සහරාන් විසින් "ජිහාඩ් යුද්ධය කිරීමට පසුබට නොවන්න" නමින් වීඩියෝවක් පලකරන ලද අතර ජීවිත කාලය තුළ සිදුකරන ලද සියලු පව්වලට සමාව ලැබීමෙන් පසු ස්වර්ගයට යන මාර්ගය ජිහාඩ් කිරීම බව ප්‍රකාශ කරයි. ඉන්පසුව 2018 මැයි මස 27 වන දින සහරාන් රාමසාන් මාසයේ වැදගත්කම පිළිබඳ වීඩියෝවක් නිකුත් කළේය. නබිතුමාගේ ජීවිත කාලය තුළ ඔහු යුද්ධ 73 ක් සිදු කළ අතර ඉන් 11 ක් රාමසාන් මාසය තුළ සිදුකරන ලදි. රාමසාන් මාසය තුළ මුස්ලිම් නොවන අයට එරෙහිව ජිහාඩ් කිරීම ස්වර්ගයට ඇති කෙටිම මාර්ගය බවත් මුස්ලිම් තරුණයින් මෙය මතකයේ තබා ගත යුතු බවත් ඔහු ප්‍රකාශ කර තිබේ.

2018 ජුනි මාසය තුළ සහරාන්ගේ අවධානය යොමුවී ඇත්තේ අයිඑස්හි ක්‍රියාමාර්ග සාධාරණීකරණය කිරීම සහ ඒවාට සාපේක්ෂව තුර්කි ජනාධිපති මාරසෙෆ් තායිෆ් එර්ගෝඩන් ගේ ක්‍රියාමාර්ග අවතක්සේරු කිරීම බව පෙනේ.

නමුත් ඔහු මාසය ආරම්භ කළේ සූෆි ප්‍රජාව ඉලක්ක කර ගනිමිනි. සොහොන් වන්දනාමාන කරන මුස්ලිම්වරුන් පිරිසක් ගැන සඳහන් කරමින් සහරාන් 2018 ජුනි මස 1 වන දින සිය ෆේස්බුක් පිටුවේ ලිපියක් පළ කළ අතර ඔවුන් දේශපාලනඥයින්ගේ ආරක්ෂාව පතා ඉස්ලාමය විනාශ කරන බව කියා සිටියේය. ඔහු මෙම කණ්ඩායම සූෆිස්හි ඉස්තිහාඩ් අහ්ලුල් සුන්නතුල් වල් ජමාත් ලෙස හැඳින්වූ අතර වහබ්වාදීන් සහ තවුහිද්හි ක්‍රියාවන්වළට සාර්ථකව මුහුණ දිය නොහැකි බැවින් ඔවුන් මෙය කරන බව කියා සිටියේය.

2018 ජුනි 17 වන දින ඔහු සිය ෆේස්බුක් වෙබ් අඩවියේ "ඉස්ලාමීය රාජ්‍යයට අපහාස කරන අය අල්ලාහ්ට බිය විය යුතුය" යන මාතෘකාව යටතේ වීඩියෝවක් උඩුගත කළේය. ඔහු අයිඑස් සංවිධානයේ ක්‍රියා යුක්ති සහගත කරන අතර අයිඑස්ට එරෙහිව කතා කළ මවුලවිවරුන් හෙළා දුටුවේය. අල් කුර්ආනය විවිධ ආකාර 10 කින් අර්ථ නිරූපණය කිරීමට අබුබකර් අල් බග්දාඩි සමත් වූ බැවින් මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් ඔහුව ඉස්ලාමයේ කාලිෆා ලෙස පිළිගැනීමට එකඟ වන බව ඔහු ප්‍රකාශ කළේය. වැඩිකල් යන්නට මත්තෙන් 2018 ජුනි 21 සහ 24 යන දිනවල නිකුත් කරන ලද ලිපිවලින් අයිඑස්හි ක්‍රියාකලාපය ප්‍රශංසා කරමින් ජිහාඩ් අයිඑස් මෙහෙයවීම නිවැරදි යැයි කියා සිටියේය.

එදිනම සහරාන් සිය ෆේස්බුක් ගිණුමේ ලිපියක් පළ කරමින් කියා සිටියේ තුර්කි මැතිවරණයේ ජයග්‍රහණය සමස්ත මුස්ලිම් ලෝකයේම එකක් නොවන බවත් එය බටහිර න්‍යාය පත්‍රයේ කොටසක් වන බවත් ඉස්ලාමීය රාජ්‍යයක් නිවැරදිව පෝෂණය කරන්නේ අබුබකර් අල්-බක්දාදි පමණක් බවත්ය.

2018 ජුනි මස 28 වන දින සහරාන් සිය ෆේස්බුක් ගිණුමේ වීඩියෝවක් නිකුත් කරමින් තුර්කි ජනාධිපති මාරසෙෆ් තායිෆ් එර්ගෝඩන් පිළිබඳව සඳහන් කරමින් කියා සිටියේ එය

අවසාන ඉස්ලාමීය රාජ්‍යය අවසන් වූ ස්ථානය වුවද සහ ලෝකයේ සියලුම මුස්ලිම්වරු මහු ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවනු ඇතැයි අපේක්ෂා කළද තුර්කිය බටහිර බලපෑම් ඇති මහු වාර්ගික රටක් බැවින් එය සිදු නොවේ. මෙම සන්දර්භය තුළ 1924 දී ජනාධිපති මුස්තාෆා කෙමාල් අටටුර්ක් තුර්කියේ බලයට පැමිණ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළ විට එය ඔටෝමාන් අධිරාජ්‍යයේ කොටසක් ලෙස 1517 සිට 1924 දක්වා පැවති ඉස්ලාමීය රාජ්‍ය කැලිෆේටය අවසන් කළේය.

මෙම සන්දර්භය තුළ තුර්කියේ ක්‍රියාත්මක වන හිස්බ්-උට්-තහීර් නම් සංවිධානයක් පසුගිය ඉස්ලාමීය රාජ්‍යය බිඳ වැටී වසර 100 කට පසු ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවන බව ප්‍රකාශ කර ඇති බව ශ්‍රී ලංකා ආරක්ෂක බලධාරීන් බැරෑරුම් ලෙස සැලකිල්ලට ගත යුතුය. මෙම සංවිධානය 1953 දී තකියුදීන් අල්-නබානි නම් පලස්තීන ජාතිකයෙකු විසින් පිහිටුවන ලද අතර ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීමට ප්‍රතිඥා දුන්නේය. මෙම සංවිධානයේ ඉන්දුනීසියානු ශාඛාව 2017 ජූලි 19 වන දින තහනම් කරන ලදි. මෙම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අතර එරාවූර්, වාලච්චේනෙයි, ඔට්ටමාවඩි, කාත්තන්කුඩි, අම්පාර සහ ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල ක්‍රියාත්මක වේ.

2018 ජූලි මාසය තුළ සහරාන් අයිඑස් දෘෂ්ටිවාදය සහ ක්‍රියාවන් දිගින් දිගටම ප්‍රචාරය කිරීම සහ සාධාරණීකරණය කිරීම සිදුකළේය. මුස්ලිම් නායකයින්ට ආදර්ශයක් ලෙස සටන් කිරීම සඳහා තම පුත් හුතයිෆා අල්-බද්රි යැවීම තුලින් අබු බකර් අල් බැග්දාඩි විසින් සිදු කරන ලද ක්‍රියාව පැසසුමට ලක් කරමින් ඔහු 2018 ජූලි මස 4 වන දින සිය ටෙලිග්‍රෑම් ගිණුමේ ලිපියක් බෙදා ගත්තේය. හුතයිෆා අල්-බද්රි සටනේදී මිය ගියේය. පසුව ඔහු වීඩියෝ පටයක් උඩුගත කළ අතර මුස්ලිම්වරුන්ට ජිහාඩ් සිදුකිරීම අනිවාර්ය වන බව ප්‍රකාශ කළ අතර අයිඑස් විවේචනය කරන මුස්ලිම් නායකයින් අල්ලාහ්ට බිය විය යුතු යැයි කියා සිටියේය. ආයුධ ලබා ගැනීම සහ ජිහාඩ් කිරීම පිළිබඳව අල්ලාහ් නබිතුමා උපදෙස් දී ඇති බවත්, වර්තමාන මුස්ලිම් නායකයින්ට එය අමතක වුවද එසේ කිරීම සියලු මුස්ලිම්වරුන්ගේ යුතුකම බවත්, 2018 ජූලි 30 වන දින සහරාන් විසින් වීඩියෝවක් උඩුගත කරන ලදි.

සහරාන්ගේ ප්‍රචාරක ව්‍යාපාරය ඔහු අපේක්ෂා කළ පරිදිම සාර්ථකත්වය කරා ගමන් කරමින් සිටින බව 2018 ජූලි 7 සිට 8 දක්වා සහ 2018 ජූලි 20 සිට 22 දක්වා අංක 67/4/1, ශ්‍රිමිලා බේකරිය අසළ, සිප්පිකුලම, හම්බන්තොට යන ස්ථානයේ පැවැත්වූ සාර්ථක පුහුණු කඳවුරේට සහභාගිවූ ප්‍රමාණයෙන් පිළිබිඹු වේ.

සහරාන් විසින් මෙහෙයවන ලද ජූලි 7 සිට 8 දක්වා පැවති පුහුණු කඳවුරට පුද්ගලයින් 20ත් 25 ත් අතර සංඛ්‍යාවක් සහභාගී වූහ. ටී-56 ආයුධයක් භාවිතා කරමින් ආයුධ පුහුණුව මිල්හාන් විසින් ලබාදෙන ලදි. එය න්‍යායාත්මක පුහුණුවක් වූ අතර එය එම ආයුධය එකලස් කිරීම හා කොටස්වලට වෙන් කිරීම සම්බන්ධයෙන් විය. බෝම්බ සැකසීමේ පුහුණුව ලබාදුන්නේ රිල්වාන් විසිනි. සහරාන් ඉස්ලාමය පිළිබඳව අන්තවාදී දේශන පැවැත්වූ අතර නූෆර් අයිඑස් පිළිබඳ දේශන පැවැත්වූයේ ය.

2018 ජූලි 20 සිට 22 දක්වා මෙම පරිශ්‍රයේ මීළඟ පුහුණු කඳවුරට 25 ත් 30 ත් අතර පිරිසක් සහභාගී වූහ. සහරාන් ඉස්ලාමය පිළිබඳ අන්තවාදී දේශන පැවැත්වූ අතර නූෆර් අයිඑස් පිළිබඳ දේශන පැවැත්විය. හයතු මොහම්මදු අහමඩ් මිල්හාන් ටී-56 භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී ඇති අතර, එය ටී-56 ආයුධය, පිස්තෝලය සහ පිහිය විසුරුවා හැරීම හා එකලස් කිරීම පිළිබඳ න්‍යායාත්මක පුහුණුවක් වූ අතර රිල්වාන් බෝම්බ සැකසීමේ දේශන පැවැත්විය. මියගිය අය අතරින් සහරන්, හස්තුන් සහ ඉල්හාම් අහමඩ් සහභාගිවූහ.

2018 අගෝස්තු මාසයේදී සහරාන් වැඩි ආධාරකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා අයිඑස් සහ ජිහාඩ් ප්‍රවර්ධනය කිරීම දිගටම කරගෙන ගියේය. ඔහු මෙය කළේ ආයුධ භාවිතයෙන් ජිහාඩ් යුද්ධ සිදුකිරිම ආගමික ඉගැන්වීම්වල කොටසක් බව ප්‍රක්ෂේපණය කරමිනි.

2018 අගෝස්තු 10 වන දින ඔහු වීඩියෝවක් නිකුත් කළ අතර එහිදී ඔහු කියා සිටියේ පාරාදීසයට ඇති කෙටිම මාර්ගය ආයුධ අතට ගැනීම සහ අල්ලාහ් වෙනුවෙන් ජිහාඩ්හි නිරතවීම බවයි.

2018 අගෝස්තු 15 වන දින සහරාන් තම ආධාරකරුවන් කණ්ඩායමක් මාවනැල්ලේදී හමුවී රහස් විමර්ශන කණ්ඩායම ලෙස ක්‍රියා කිරීම සඳහා කුඩා කණ්ඩායමක් පිහිටුවයි. එහි ප්‍රධානියා ලෙස මිල්හාන්, සාදීක්, ගෆූර් මාමා සහ සමීර් ඇතුළත් විය. නූෆර් සහ හස්තුන් ද මෙම රැස්වීමට සහභාගිවූහ. මෙම කණ්ඩායමට පැවරී ඇති මුල්ම කාර්යයන්ගෙන් එකක් වූයේ කොළඹ, නාවික හමුදා මූලස්ථානය සහ පොලිස් මූලස්ථානය පිළිබඳ තොරතුරු ලබා ගැනීමයි. ඉස්ලාමයෙන් ඉවත්ව ගිය දෙදෙනෙකු ඝාතනය කිරීමට ද මෙම කණ්ඩායම යොදවා තිබුණි.

සහරාන් අයිඑස් සංවිධානයට පක්ෂපාතිවීම මෙම මාසය තුළ දිනක් ඇතුළත සිදුවීම් දෙකක් මඟින් පිළිබිඹු වේ. 2018 අගෝස්තු 22 වන දින අයිඑස් නායක අබු බකර් අල්-බග්දාදි විසින් හජ් උත්සවය වෙනුවෙන් "රෝගියාට සුබ ආරංචියක් ලබා දෙන්න" යන මාතෘකාව යටතේ නිල අයිඑස් මාධ්‍ය "අල්-ෆුර්කාන් මාධ්‍ය" සමූහය වෙත හඬපටයක් නිකුත් කරන ලදී. වාහන, බෝම්බ සහ තියුණු ආයුධ භාවිතා කරමින් මුස්ලිම් නොවන අයට එල්ල කරන ප්‍රහාර වැඩි කරන ලෙස ඔහු සිය ආධාරකරුවන්ගෙන් සහ හිතවතුන්ගෙන් ඉල්ලා සිටියේය. ඔහු තවදුරටත් කියා සිටියේ "එම්බා කැලිෆේට් සොල්දාදුවනි... දෙවියන්ගේ පොරොන්දුව සහ දෙවියන්ගේ ජයග්‍රහණය කෙරෙහි විශ්වාසය තබන්න" 'මක්නිසාද දුෂ්කරතාවයන් සහනයක් හා නව මානයක් විවර කරන බැවිනි'.

2018 අගෝස්තු 23 වන දිනම සහරාන් විසින් කලීෆා අබුබකර් අල්-බග්දාඩිගේ ආරක්ෂාව ඉල්ලා සමාජ මාධ්‍ය වෙත ලිපියක් නිකුත් කළ අතර බොහෝ රටවල් යටත් කර ගනිමින් ඉස්ලාමය ව්‍යාප්ත කිරීම සඳහා අල්ලාහ්ගේ සහාය ඔහුට ලැබෙනු ඇතැයි අපේක්ෂා කළේය. මුස්ලිම් නොවන අයගේ බෙල්ල කපා දැමීමට ඉස්ලාමීය රාජ්‍යයේ වීරයන් හට අල්ලාහ්ගේ සහාය ලැබෙනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය.

තවත් පුහුණු කඳවුරක් 2018 අගෝස්තු 26 සිට 28 දක්වා අංක 67/4/1, සිප්පිකුලම, හම්බන්තොට, ෂිමිලා බේකරිය අසළදී පැවැත්වූ අතර ඊට 30 සිට 40 දක්වා පිරිසක් සහභාගිවිය. සහරාන් ඉස්ලාමය පිළිබඳව අන්තවාදී දේශන පැවැත්වූ අතර නූෆර් අයිඑස් පිළිබඳ දේශන පැවැත්විය. හයාතු මොහමමදු අහමඩුමිල්හාන් ටී 56, පිස්තෝලය සහ පිහිය

භාවිතා කිරීම පිළිබඳව පුහුණුව ලබාදී ඇති අතර හජ්ජි මොහොමඩ් මොහොමඩු හස්තුන් පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී තිබේ. 2019 අප්‍රියෙල් 21 සහ 26 යන දිනවල මියගිය පුද්ගලයින් අතරින් සහරාන්, ෂයිනි, හස්තුන්, මුවාත් සහභාගිවූහ. ඊට අමතරව සාදික් සහ ෂාහිඩ් සහභාගිවූහ.

2018 අගෝස්තු 27 වන දින අලුයම කාත්තන්කුඩි පලමුනායිහි පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීමේදී රිල්වාන්ට මාරාන්තික තුවාල සිදුවිය. 2018 මැයි මාසයේදී මිල්හාන් සහ රිල්වාන් පිටකොටුවේ සිට බෝම්බ නිෂ්පාදනය සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීමට සම්බන්ධ වූ කිහිප දෙනෙකුද, සහරාන් සහ ඔහුගේ කණ්ඩායමේ සාමාජිකයින් කිහිප දෙනෙකුද කොළඹට පැමිණ රිල්වාන්ව ජාතික රෝහලට ඇතුළු කළහ. මෙම සිදුවීම සහරාන් සහ ඔහුගේ කණ්ඩායම මේ වන විට අන්තවාදීන්ට වඩා ත්‍රස්තවාදීන් බවට පත්ව ඇති බවට සහ ඔවුන් එකට එක්වී ත්‍රස්තවාදී ක්‍රියාවන් සැලසුම් කරමින් ඒවා ක්‍රියාත්මක කිරිමට උත්සුක වූ බව තවදුරටත් පිළිබිඹු කරන්නකි. මෙම සිද්ධිය පිළිබඳ වැඩි විස්තර 12 වන පරිච්ඡේදයේ සාකච්ඡා කෙරේ.

සාදික්ගේ සාක්ෂියට අනුව, නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා සහ නාමල් කුමාරා අතර සංවාදයක් මාධ්‍ය විසින් ප්‍රචාරය කරන තෙක් සහරාන් විසින් මෙම සිදුවීමෙන් පසු පුපුරණ ද්‍රව්‍ය සැකසීමේ ක්‍රියාවලිය අතහැර දමා ඇත. උක්ත සංවාදයේ අන්තර්ගතය තුළ නයිට්‍රික් අම්ලය සහ යූරියා භාවිතයෙන් බෝම්බ සෑදිය හැකි බවට සඳහන් කර ඇතැයි චෝදනා එල්ල විය. සාදික් පවසන පරිදි සහරාන් මෙම සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස පුපුරණ ද්‍රව්‍ය නිර්මාණය කිරීමට ගත් උත්සාහයන් යලි පණ ගැන්විය.

පරීක්ෂණ කොමිෂන් සභාවට ඉහත අන්තර්ගතය සහිත වීඩියෝවක් හමු නොවීය. කෙසේ වෙතත් ප්‍රංශයේ වෙසෙන ශ්‍රී ලාංකිකයෙකු වන නාමල් කුමාර සහ තුෂාර පීරිස් අතර සංවාදයකදී තුෂාර පිරිස් විසින් යූරියා ගැන සඳහන් කළ බවට සාක්ෂි තිබේ.

සහරාන් සහ ෂයිනි තම සංවිධානයේ සාමාජිකත්වයෙන් ඉවත් කරන බව සඳහන් කරමින් 2018 අගෝස්තු 31 වන දින ජාතික තවුහිද් ජමාත් විසින් නිළ වශයෙන්ම ලිපියක් නිකුත්

කළේය. එහෙත් දෙදෙනාම ජාතික තවුහිද් ජමාත් සාමාජිකයන් සමඟ දිගටම සම්බන්ධතා පැවැත්වූහ. ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම අරමුණු කරගත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් හේතුකොට ගෙන සංවිධානයට කලු පැල්ලමක් ඇතිවීමේ අවදානම වළක්වා ගැනීම සඳහා ජාතික තවුහිද් ජමාත් සංවිධානය මෙය සිදුකළ බව පෙනේ. රිල්වාන් විසින් පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීමේ සිද්ධියේ තවත් එක් ප්‍රතිඵලයක්ද මෙය සැළකිය හැකිය.

බොහෝ විට රිල්වාන් සිද්ධිය නිසා 2018 සැප්තැම්බර් මාසයේදී කිසිදු පුහුණු කඳවුරක් පැවැත්වූ බවට වාර්තාවක් නොතිබුණද, සහරාන් මෙම කාලය තුළ සිය ෆේස්බුක්හි අශෝභන වීඩියෝ කිහිපයක් ප්‍රකාශයට පත් කළේය.

මුස්ලිම් පල්ලි, ව්‍යාපාරික ස්ථාන සහ මුස්ලිම්වරුන්ගේ නිවාසවලට එල්ල කරන ලද ප්‍රහාරයන්ට පළිගැනීමක් ලෙස නුදුරු අනාගතයේ දී මුස්ලිම් නොවන අයට එරෙහිව ජිහාඩ් දියත් කරන බව පවසමින් සහරාන් විසින් වීඩියෝවක් නිකුත් කරන ලදි. මුස්ලිම්වරුන් ඉලක්ක කර ගත් ප්‍රහාරවලට පළිගැනීමක් ලෙස හෙලන ලද සෑම ලේ බිංදුවකටම පළිගැනීමක් සිදුවන බවත් නුදුරු අනාගතයේදී භයානක යුද්ධයක් ඇතිවනු ඇති බවත් මුස්ලිම් තරුණයින් අල්ලාහු අක්බාර් (අල්ලාහ් ශ්‍රේෂ්ඨයි) යනුවෙන් සජ්ජායනය කරමින් මුස්ලිම් නොවන අයට එරෙහිව කඩුව අතට ගන්නා දිනය උදාවන බවත් ඔහු පැවසීය. ඔහු කියා සිටියේ පාරවල් ලේවලින් තෙමී යන බවත්, මුස්ලිම්වරුන් කෆිර්වරුන්ගේ ප්‍රහාරයන්ට නොබියව ජිහාඩ් ඉටු කරන බවත්ය.

සහරාන් මුස්ලිම් නොවන අයට එරෙහිව ප්‍රහාර දියත් කිරීමට සූදානම් වූ බවට මෙය වඩාත් වැදගත් ඇඟවීමකි. මෙම තොරතුරු රාජ්‍ය බුද්ධි සේවයේ අවධානයට ලක්විය.

අල්-කුර්ආනයේ සූරා 9: 14 ගැන අයිඑස්හි මාධ්‍ය ප්‍රකාශක අෂ්ෂෙයික් අබුල් හසන් අල් මුජහිරි විසින් කරන ලද විශ්ලේෂණයන් ගැන සඳහන් කරමින් සහරාන් 2018 සැප්තැම්බර් 26 වන දින සිය ෆේස්බුක්හි නිකුත් කළ ලිපියක් සමඟින් එය තහවුරු වන අතර කළ අතර ඔහු පවසන්නේ අල්ලාහ් තම දෑත් ශක්තිමත් කර ඇති බවයි. එහි තවදුරටත් සඳහන් වූයේ

මුස්ලිම් නොවන අයට පහර දෙන්න. අල්ලාහ් තම අරමුණු වෙනුවෙන් නිර්භයව ක්‍රියා කරන පුද්ගලයින්ට ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබා දෙනු ඇති බවයි.

මෙම කාලය තුළ සහරාන් තම අනුගාමිකයන් සමඟ "අන්සරුල් කිලාෆා" නම් ටෙලිග්‍රෑම් ගිණුමක දෙමළෙන් ප්‍රකාශයට පත් කරන ලද අයිඑස් ප්‍රචාරය පදනම් කරගෙන සමාජ මාධ්‍යවල ලිපි හුවමාරු කර ගන්නා බව නිරීක්ෂණය විය.

පුහුණු කඳවුරු ඔක්තෝම්බර් මාසයේදී ආරම්භවූ අතර ඉන් එකක් 181/01 බ්ලැක්පූල්, නුවරඑළියෙහි බ්ලූ අයි හෝටලයේදී පැවැත්විණි. එය 2018 ඔක්තෝබර් 6 සිට 7 දක්වා පැවති අතර පුහුණුව සඳහා පුද්ගලයින් 20 සිට 25 දක්වා ප්‍රමාණයක් සහභාගිවිය. සහරාන් ඉස්ලාම් අන්තවාදය, අයිඑස් පිළිබඳ නූෆර්, ඉල්හාම් අහමඩ්, ටී - 56 ආයුධ සහ පිස්තෝලය පිළිබඳව දේශන පැවැත්විය. 2019 අප්‍රේල් 21 සහ 26 යන දිනවල මියගිය පුද්ගලයින් අතරින් සහරාන්, ඉල්හාම් සහ හස්තුන් මේ සඳහා සහභාගිවූහ.

සහරාන් අයිඑස් ආධාරකරුවන් ලෙස පෙනී සිටිමින් බුද්ධි අංශවල ක්‍රියාකාරීන් ලෙස කටයුතු කරන අය ගැන සුපරීක්ෂාකාරී වූ බව පෙනේ. 2018 ඔක්තෝම්බර් 10 වන දින සහරාන් සිය ෆේස්බුක් ගිණුමට ලිපියක් නිකුත් කරමින් කියා සිටියේ පක්කම් බින් අබු යන නමින් ෆේස්බුක් ගිණුමක් පවත්වාගෙන යන පුද්ගලයා සත්‍ය වශයෙන්ම ඉන්දියානු බුද්ධි අංශයේ තොරතුරුකරුවෙකු බවයි. පක්කම් බින් අබු ශ්‍රී ලංකාවට පැමිණ ඇති බවත්, පුත්තලම, කල්පිටිය වැනි ස්ථානවල නැවතී සිටින අතරතුර, ශ්‍රී ලංකාවේ අයිඑස් ආධාරකරුවන් සමඟ සමීප සබඳතා ගොඩනඟා ගැනීමට උත්සාහ කරන බවත්, පසුව ඔවුන් පිළිබඳ තොරතුරු ඉන්දීය බුද්ධි අංශ වෙත ලබාදෙන බවත් ඔහු පැවසීය. ඊට ප්‍රතිචාර වශයෙන් පක්කම් බින් අබු විසින් 2018 ඔක්තෝබර් 11 වන දින සහරාන් ඊශ්‍රායල බුද්ධි අංශයේ නියෝජිතයෙකු බවත් අයිඑස් දෘෂ්ටිවාදය වෙත තරුණයින් ආකර්ෂණය කර ගනිමින් වීරයෙකු ලෙස පෙනී සිටීමට උත්සාහ කළද ඔහු ඇත්ත වශයෙන්ම කාන්තාවකට සමාන බවත් ප්‍රකාශ කර තිබේ.

2018 ඔක්තෝබර් 19 වන දින සහරාන් විසින් තම කුරුස යුද්ධයේ සිංහාසනය විනාශ කිරීම යන මාතෘකාව යටතේ වීඩියෝවක් ඔහුගේ ෆේස්බුක් වෙබ් අඩවියට උඩුගත කරන විට මුස්ලිම් නොවන අයගේ සිංහාසනය ගිනි තැබීම සහ අල්-කුර්ආනය සහ හදිස්සි අන්තර්ගතය මත පදනම්ව හිස ගසා දැමීම පිළිබඳව සාකච්ඡා කරන ලදි. "කුරුස යුද්ධ කරන්නන්" යන යෙදුම රෝමානු කතෝලිකයන් සම්බන්ධයෙන් කරන ලද්දකි.

2018 ඔක්තෝබර් අග වන විට සහරාන් යළිත් කියා සිටින්නේ මුස්ලිම්වරුන් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කළයුතු බවත් අල්ලාහ්ගේ නියෝග අනුව ජීවත්වන මුස්ලිම්වරුන්ට ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කළ නොහැකි බවත්ය. ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන අය මුස්ලිම්වරුන්ගේ විරුද්ධවාදීන් බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය.

නොවැම්බර් මාසයේ දී අයිඑස් සටන්කරුවෙකුගේ පින්තූරයක් පළ කරමින් සහරාන් සිය ෆේස්බුක්හි තවත් වැදගත් සටහනක් තබමින් සඳහන් කළේ ඉස්ලාමය වෙනුවෙන් ජිහාද් සිදුකිරීමට අල්ලාහ් අයිඑස් සටන්කරුවන්ට අවස්ථාව ලබාදී තිබුණද එසේ කිරිමේ බලයක් ඇති තමන්ට ඊට අවස්ථාවක් ලබාදී නොමැති බවයි. ඔහු සතුව තිබූ බලය පිළිබඳව වන ප්‍රකාශය මෙහිදි වැදගත්ය.

2018 නොවැම්බර් මාසයේදී සහරාන් සහ ඔහුගේ කණ්ඩායම තවත් පුහුණු කඳවුරු දෙකක් පැවැත්වූහ. පළමුවැන්න අංක 67/4/1, ශිමිලා බේකරිය අසළ, සිප්පිකුලම, හම්බන්තොට යන ස්ථානයේදී පවත්වා ඇති අතර එය 2018 නොවැම්බර් 3 සිට 4 දක්වා පැවැත්විණි. පුහුණු කඳවුරට 25 ත් 30 ත් අතර පිරිසක් සහභාගිවී සිටියහ. සහරාන් ඉස්ලාමය පිළිබඳව අන්තවාදී දේශන පැවැත්වූ අතර නූෆර් අයිඑස් පිළිබඳ දේශන පැවැත්වූයේ ය. මිල්හාන් ටී-56 පිස්තෝලය සහ පිහිය භාවිතා කිරීම පිළිබඳව පුහුණුව ලබාදී ඇති අතර හජ්ජි මොහොමඩ් මොහොමඩු හස්තුන් පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී තිබේ. 2019 අප්‍රේල් 21 සහ 26 යන දිනවල මියගිය පුද්ගලයින් අතරින් මෙ කඳවුර සඳහා සහරාන් සහ හස්තුන් මෙන්ම ෂාහිඩ් ද සහභාගිවූහ. දෙවන කඳවුර 181/01 බ්ලැක්පූල්, නුවරඑළියේදි 2018 නොවැම්බර් 16 සිට 18 දක්වා පැවති අතර 15 සිට 25 දක්වා පිරිසක් මෙ සඳහා සහභාගිවූහ. සහරාන් ඉස්ලාම් අන්තවාදය පිලිබඳවද, නූෆර් අයිඑස් පිළිබඳව,

මිල්හාන් ටී - 56 සහ පිස්තෝලය භාවිතය පිළිබඳව හස්තුන් පිහි භාවිතය පිළිබඳව දේශන පවත්වා ඇත. 2019 අප්‍රේල් 21 සහ 26 යන දිනවල මියගිය පුද්ගලයින් අතරින් සහරාන් සහ හස්තුන් මීට සහභාගිවූහ.

සහරාන් සහ ඔහුගේ අනුගාමිකයන් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් විශේෂ බුද්ධි අංශ යොදවා ඇති බවත් ඔවුන් තොරතුරු රැස් කරමින් සිටින බවත් සඳහන් කරමින් 2018 දෙසැම්බර් 12 වන දින රාසික් මොහොමඩ් ෆයිස් නොහොත් පොලිස් ෆයිස් සිය ෆේස්බුක් පිටුවට පණිවිඩයක් නිකුත් කළේය. පොලිස් ෆයිස් යනු යුද සමයේදී නැගෙනහිර ක්‍රියාකාරීව සිටි මුජාහිදීන් කණ්ඩායමේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. මේ කාලය වන විට පොලිස් ෆායිස් සහරාන් සමඟ සබඳතා ගොඩනඟා ගෙන තිබුණි. 2007 අගෝස්තු 28 වන දින ඒෂියන් ට්‍රිබියුන් හි “Militant Wahabism beats other Islamic fundamentalists in Sri Lanka” යන හිසින් පළවූ ලිපියක සඳහන් වනුයේ “වහබ්වාදයේ නවතම ගොදුර වන්නේ ඔට්ටමාවඩිහි කර්නල් ලතීෆ් ”ය. අගෝස්තු මස මුල් භාගයේදී කර්නල් ලතීෆ්ට වෙඩි තබා ඇත. (sic) ප්‍රකට වහබ්වාදී සටන්කාමියෙකු වූ ‘ඔඩමාවාඩිහි පොලිස් ෆයිස්’.

සහරාන් ක්‍රමානුකූලව ඔහුගේ කණ්ඩායම ජිහාඩ් (ශුද්ධ යුද්ධය) ආරම්භ කිරීම සඳහා විකාශනය කරමින් සිටි අතර ඔහු විස්තර කළ පරිදි මාවනැල්ල සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කරන රහස් පොලිසියේ විමර්ශකයින් විසින් වනාතවිල්ලුව කඳවුර සොයා ගැනීමත් සමඟ එම ප්‍රයත්නය අනපේක්ෂිත ලෙස කඩාකප්පල් විය. සාදික්ගේ සාක්ෂිය වූයේ සහරාන් ආරක්ෂක හමුදා සහ බුද්ධි අංශ නිලධාරීන් තමාව සමීපව නිරීක්ෂණය කරමින් සිටින බව සිතමින් ප්‍රහාරය වේගවත් කළ බවය.

සහරාන් සැඟවී සිටි කාල පරිච්ඡේදය පිළිබඳ ඉහත දක්වා ඇති ස්ථාවරයට එළැඹීම කෙරෙහි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබාගත් වාචික හා ලේඛනමය සාක්ෂි ද බුද්ධි අංශවලින් ලබා ගත් බුද්ධි තොරතුරු ද සැලකිල්ලට ගෙන තිබේ.

## 9 වන පරිච්ඡේදය

# මාවනැල්ල සිට වනාතවිල්ලුව දක්වා

මාවනැල්ල සහ වෙනත් ප්‍රදේශවල බුද්ධ ප්‍රතිමාවලට හානිවූ සිදුවීම් මාලාවක් සිදුවිය. මෙම ප්‍රදේශයේ ආගමික ආතතීන් වැඩිවීමට හේතුවිය.

බුද්ධ ප්‍රතිමා බිඳදැමීමේ නියෝගය සහරාන් විසින් සාදික් සහ සාහිඩ් වෙත ලබාදුන් අතර ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට සිංහලයන් විසින් එල්ල කරන ලද හිංසනයන්ට පළිගැනීම මෙහි අරමුණ විය.

එය ආරම්භ වූයේ 2018 දෙසැම්බර් 23 වන දින අංක 24 ග්‍රාම නිලධාරි ප්‍රදේශයේ රන්දිවෙල හන්දියේ ඇති බුද්ධ ප්‍රතිමාවට හානිවීමෙනි. බුදු පිළිමයේ මුහුණ විකෘති විය. ඇසින් දුටු සාක්ෂිකරුවන් සිටියේ නැත. සිංහලයන් හා විවාහ වූ දෙමළ කාන්තාවන් දෙදෙනෙකු හැර ප්‍රදේශයේ පදිංචිකරුවන් මුළුමනින්ම සිංහලයන්ය. කෙසේ වෙතත් මුස්ලිම්වරුන් සහ සිංහල ජනතාව යන දෙකොටසම ජීවත්වන ගමක් ප්‍රදේශයට මායිමේ පිහිටා ඇත. එදිනම රන්දිවෙල භූමියේ සිට කිලෝමීටර 7ක් පමණ ඈතින් පිහිටි මිරිස්කුඩු හන්දියේදී තවත් බුද්ධ ප්‍රතිමාවකට හානි සිදුවිය.

2018 දෙසැම්බර් 26 වන දින නාඳුනන පුද්ගලයින් විසින් අලාභහානි කරන ලද හිඟුලේ තවත් බුද්ධ ප්‍රතිමාවක් ඇත. එය පිහිටා තිබෙන්නේ මහනුවර බස් පර්යන්තය ඉදිරිපිට කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයට මුහුණලාය. එම බුද්ධ ප්‍රතිමාවේ හිසට සහ අතකට හානි සිදුවී ඇත. 2018 සංඛ්‍යා ලේඛනවලට අනුව සිංහල පවුල් 486ක්, මුස්ලිම් පවුල් 242ක් සහ දෙමළ පවුල් මෙම ප්‍රදේශයේ පදිංචිව සිටියහ.

එදිනම අලුයම 4.30 සිට අලුයම 4.45 දක්වා කාලය තුළ මාවනැල්ල, ගල විදපු තැන, දිදුලවත්තේ පිහිටි බුද්ධ ප්‍රතිමාවට හානි සිදුවිය. එය පිහිටා තිබුණේ වරකාපානේ අංක 26/ඒ, ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළය. මෙම ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයන් සිටියේ

නැත. කෙසේ වෙතත් පෙර අවස්ථා මෙන් නොව, එක් අපරාධකරුවෙකු සුපරීක්ෂාකාරී ගම්වැසියන් දෙදෙනෙකු විසින් අල්ලා ගන්නා ලදී.

ත්‍රිරෝද රථ රියදුරෙකුවූ සෙනරත් බණ්ඩාර ජීවත්වූයේ හානියට පත් බුදු පිළිමයට ආසන්නයේය. බුදු පිළිමය තැන්පත් කර ඇති කාමරයේ අගුලේ යතුර ඔහුගේ ත්‍රිරෝද රථයේ යතුරේම එල්ලා තිබුණි. රාත්‍රියේදී ඔහු ආපසු නිවසට පැමිණ පෙර දිනවල පිළිමයට සිදුකර ඇති පූජා ඉවත් කිරීම වැදගත් කරුණක් විය. ඔහුට උදේ කුලී ගමනක් යාමට ඇත්නම්, පෙර දින රාත්‍රියේ බුදු පිළිමය පිහිටි කාමරය අගුළු දමා තබාගැනීමට ඔහු සැළකිලිමත් වූ අතර, එලෙස අගුලු දමා තිබූ එක් දිනයක පූජාවන් සිදු කිරීමට නොහැකි වීමෙන් ගම් වැසියන් අපහසුතාවයට පත්විය.

2018 දෙසැම්බර් 25 වන දින ඔහුට අළුයම කුලී ගමනක් යෙදී තිබූ බැවින්, එදින ඔහු බුදු පිළිමය පිහිටි කාමරය විවෘත කර තැබූ දිනයක් විය. 2018 දෙසැම්බර් 25 වන දින, බුද්ධ ප්‍රතිමාව වැඳපුදා ඔහු පැමිණෙන විට එය නොවෙනස්ව පැවතුණි. පසුදා උදේ කුලී ගමන යාම සඳහා ඔහුට සිදු වූ හෙයින් ඔහු අළුයම 3.30ට සහ අළුයම 3.40ට සිහිකැඳවීමේ නාද (alarms) දෙකක් සකසා ඇත. අළුයම 3.40ට නාද වීමට නියමිතව තිබූ සිහිකැඳවීම නාදවීම නිසාවෙන් සයනයෙන් නැගීසිටි ඔහුට ඔහුගේ නිවසේ සිට මීටර් 30 සිට මීටර් 40 ක් පමණ ඈතින් බුදු පිළිමය පිහිටි දිශාවෙන් ශබ්දයක් ඇසිනි.

2018 දෙසැම්බර් 22 වන දින පුර පසළොස්වක පෝය දිනය යෙදී තිබූ බැවින් බුදු පිළිමය පිහිටි කුඩා කාමරයේ විදුලි පහන් නිවා දමා ඇතත්, සෙනරත් බණ්ඩාරට බුද්ධ ප්‍රතිමාවට හානියක් සිදු කරන මිනිසෙකු දැකීමට තරම් ප්‍රමාණවත් සඳ එළියක් ඒ මොහොතේ පැවතිනි.

ඔහු බුදු පිළිමය පිහිටි කාමරය දෙසට දිවගිය අතර එහිදී යතුරුපැදියක නැගී සිටින තවත් මිනිසෙකු ඒ මත හිඳ බලා සිටින අයුරු ඔහු දුටුවේය. අපරාධකරු එම බයිසිකලයේ පසුපසට නැගුනු පසු ඔවුන් ගමේ පාර දිගේ පලා යන අයුරු දුටු සෙනරත් බන්ඩාර වාහනක

ජයරත්නට කතා කළේ අපරාධකරුවන් ලුහුබැඳීමට ඔහුගේ යතුරුපැදිය භාවිතා කිරීමේ අදහසිනි.

ඔවුන්ගේ ආධාරයට පැමිණි ගම් වැසියන් කිහිප දෙනෙකුගේ සහාය ඇතිව, බුද්ධ ප්‍රතිමාව කඩා දැමීමට සම්බන්ධවූ එක් අයෙකු වන අෂ්ෆක් අල්ලා ගැනීමට ඔවුන්ට හැකිවිය. උද්යෝගිමත් අත්අඩංගුවට ගත් සැකකරු කෑගල්ල පොලිස් ස්ථානයට ගෙන යන ලදී. සිද්ධි දාමයේ පුරවැසියන් දෙදෙනෙකු විසින් සිදුකරන ලද මෙම ක්‍රියාව නිසා දිග හැරුනු ප්‍රතිඵලය ලෙස සිදුවූ අත්අඩංගුවට ගැනීම මෙම කණ්ඩායමේ සැලසුම්වලට බාධා පමුණුවා අවසානයේදී වනාතවිල්ලුවේදී පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ සොයා ගැනීමට හේතුවිය. මෙම සොයාගැනීම නොතිබුණේ නම් හානිය හා විනාශය මීට වඩා වැඩිවනු ඇතැයි පරීක්ෂණ කොමිෂන් සභාවෙහි අදහසයි. එම පුරවැසියන් දෙදෙනා වන සෙනරත් බණ්ඩාර සහ වානක ජයරත්න යන දෙදෙනාගේ නිර්භීතකම වෙනුවෙන් ඔවුන් ජාතික වීරයන් ලෙස පිළිගැනීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

මාවනැල්ල සිද්ධියේ ප්‍රධාන භූමිකාව රඟපෑවේ මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා නොහොත් අබු උමර් විසිනි. අහම්බෙන්, බුද්ධි අංශ ක්‍රියාකාරිකයෙකු 2018 නොවැම්බර් මාසයේදී පමණ ග්‍රාම නිලධාරී වෙත ගොස් සාදික් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටි අතර ඔහු කිසියම් නීති විරෝධී සංවිධානයකට සම්බන්ධ දැයි සොයා බලන මෙන් ඉල්ලා සිටියේය. ඔවුන් පසුව අවස්ථා කිහිපයකදීම සාදික් සහ ඔහුගේ පවුලේ අය පිළිබඳව තොරතුරු රැස්කරගෙන ඇති අතර ඒවා 2018 දෙසැම්බරයේ මාවනැල්ලේ බුද්ධ ප්‍රතිමා කඩා දැමීමට පෙර සිදුවිය. බුද්ධි අංශ නිලධාරියා විසින් සාදික් පිළිබඳව අවධානයෙන් සිටින මෙන් ග්‍රාම නිලධාරීවරියගෙන් කරන ලද ඉල්ලීම නිසාවෙන් ඇය පසුව සාදික්ගේ නිවස සහ එම පරිශ්‍රයට ගොස් ඇත. සාදික්ගේ නිවස ඔහුගේ පියාගේ නිවස පිහිටි ඉඩමේ අර්ධ වශයෙන් ගොඩනඟා ඇති බව මෙහිදී නිරීක්ෂණය විය. එම පරිශ්‍රය තුළම කිකිළියන්ගේ කුඩා ගොවිපලක් පවත්වාගෙන යන ලදී. තවද, නිවසේ කුකුළු මස් ගොවිපල පවුලක වියදමට ප්‍රමාණවත් නොවන බැවින් සාදික් ජීවිකාව උපයා ගත්තේ කෙසේද යන්න පිළිබඳව ග්‍රාම

නිලධාරීවරියට සැක පහළ විය. කෙසේ වෙතත්, සාදික් පිළිතුරුදී ඇත්තේ තමා තවත් අයෙකු සමඟ හවුල් වී මාවනැල්ලෙහි ගොවිපලක් පවත්වා ගෙන ගිය බවය.

සාදික් පවසන පරිදි බුද්ධ ප්‍රතිමා විනාශ කරන ලෙසට සහරාන් ඔහුට නියෝග කර ඇත. කුලියාපිටියේ බොදු බල සේනා සංවිධානය විසින් පවත්වන ලද උද්ඝෝෂණයක ඡායාරූප පෙන්වමින් ඔහු එවැනි විනාශකාරී ක්‍රියාවන් සඳහා පෙළඹවීමක් ලබාදී ඇති අතර එම පින්තූර අතර "අල්ලා" නම් ඌරකුගේ පින්තූරයක් සහිත පුවරු විරෝධතාකරුවන් විසින් ප්‍රදර්ශනය කරන ලද ආකාරයද දැක්වුණි. මෙම සිද්ධියේ විශ්වාසනීයත්වය පිළිබිඹු වනුයේ සහරාන් විසින් මාවනැල්ලේ සිද්ධියට අදාළව අත්අඩංගුවට ගත් සැකකරුවන්ට ඇප ලබා ගැනීමට මුහිස්ගේ බිරිඳට රු. 500,000 / = ක මුදලක් ලබාදී ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී තිබීම නිසාවෙනි. එම මුදල් සහරාන්ට ලබාදුන්නේ ඉල්හාම් විසිනි.

සහරාන්ගේ උපදෙස් අනුව, සාදික් සහ ඔහුගේ සහෝදර සාහිඩ් 2018 දෙසැම්බර් 23 වන දින SG BO - 1117 යන අංකය දරන ඔවුන්ගේ යතුරුපැදියේ පිටත්ව ගොස් හිඟුලාවේ බුද්ධ ප්‍රතිමාවේ හිසට හානිකර ඇත. රඹුක්කන පාරේ පිහිටි තවත් බුද්ධ ප්‍රතිමාවකටද 2018 දෙසැම්බර් 24 වන දින සාදික් විසින් අලාභ හානි සිදු කරන ලදි. 2018 නත්තල් දිනයේ ඔහු කිසිදු ප්‍රතිමාවක් කැඩී නොතිබීම කෙරෙහි සිය අප්‍රසාදය පළකළ ඇති අතර මහා පරිමාණයෙන් විනාශය දිගටම කරගෙන යන ලෙස සාක්ෂිකරුට අවධාරණය කර ඇත. ඒ අනුව, 2018 දෙසැම්බර් 26 වන දින, සාදික් බුද්ධ ප්‍රතිමා විනාශ කිරීම සඳහා පිටත්ව යැමට SL GISM හි සිටම තමා දන්නා ඔහුගේ මිතුරන් සිව් දෙනෙකු සංවිධානය කර තිබුණි.

සිද්ධිය පිළිබඳව සාදික් විසින් සහරාන් වෙත දැනුම්දුන්විට, ඔහු වහාම තම වාසස්ථානයෙන් ඉවත්වී කුරුණෑගල වෙත යන ලෙස ඔහුට උපදෙස්දී තිබේ. කුරුණෑගල සිටියදී වරක් සහරාන් විසින් සාදික්ව බම්මාන්න ප්‍රදේශයට සහ පසුව වෙනත් නිවසකට යොමු කර ඇත. නිවසේ හිමිකරු සාදික්ට, ඔහුගේ බිරිඳට සහ පුතාට පළමු රාත්‍රියේ නැවතී සිටීමට අවසරදී තිබේ. කෙසේ වෙතත්, මාවනැල්ල සිද්ධිය පිළිබඳ මාධ්‍ය වාර්තා සංසරණය වන විට නිවසේ හිමිකරු ඔවුන් පිළිබඳව සැක සහිත විය. පසුව සාදික්ට

සහරාන් උපදෙස්දී ඇත්තේ තම පවුලේ අය සමඟ සහරාන් රැඳී සිටි කුලියාපිටියට පැමිණෙන ලෙසය. එහිදී සාදික්ගේ ත්‍රිරෝද රථයේ යතුර සහ ලියකියවිලි සමඟ සාදික්ගේ ජංගම දුරකථන ("ත්‍රිමා" යෙදුම ස්ථාපනය කර ඇති ජංගම දුරකථනය ඇතුළුව) සහරාන් සන්තකයේ තබාගෙන තිබුණි. පසුව සාදික් සහ ඔහුගේ පවුලේ අය මීගමුවේ පිහිටි නිවසට (රිල්වාන්ට ප්‍රතිකාර කිරීම සඳහා සහරාන් කුලියට ගෙන තිබුණු) වෙත යොමු කරන ලදී. අසාත් (මඩකලපුවේ සියොන් පල්ලියේ බෝම්බකරු) සහ රිල්වාන් මෙම නිවසේ ජීවත්ව සිට ඇත. 2019 ජනවාරි 16 වෙනිදා වනාතවිල්ලුවෙහි පුපුරණ ද්‍රව්‍ය සොයා ගන්නා තෙක් සාදික් මීගමුවේ නිවසේ රැඳී සිට ඇත.

සහරාන්හට සාදික් ලවා පුහුණුවීම් කිරීමට ඉඩමක් සොයාගැනීමට අවශ්‍ය විය. මේ අතර, සාදික් සහ මිල්හාන්ද එළු ගොවිපලක් ආරම්භ කිරීමට සැළසුම් කරමින් සිටියහ. අවශ්‍යතා දෙකම සපුරාලීම සඳහා, සාදික් වනාතවිල්ලුවේ ඉඩමක් අයත් බව දැන සිටි මුෆිස් (SLIISMහි සිටි කාලයේ සිටම ඔහු දන්නා) සමඟ කතා කර තිබේ. තම ඉඩමෙන් (අක්කර 10 ක් පමණ) වෙනම ප්‍රදේශයක් ලබාදීමට මුෆිස් එකඟවී තිබේ. වෙනම ඉඩමක වැටක් අර්ධ වශයෙන් ඉදිකරන ලදි. සිරියාවේදී මියගිය නිලම් සිහිකිරීම සඳහා සහරාන් එම ස්ථානයට අබූ සුරේ ලෙස නම් කළේය.

ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කර තිබූ මෙන්ම පුහුණු කඳවුරක් ලෙසද භාවිතා කිරීමට අදහස් කරන ලද වනාතවිල්ලුවේ පිහිටි ඉඩම සොයාගැනීම, මාවනැල්ල සිද්ධිය පිළිබඳ විමර්ශනයේ කොටසක් ලෙස රහස් පොලිසිය විසින් සිදුකරන ලද විශාල ඉදිරි පියවරක්වූ අතර එම ප්‍රයත්නයේ නිරතවූ විමර්ශකයින් පැසසුමට ලක්විය යුතුය. මෙම සොයාගැනීම සිදුකර ඇත්තේ ඔවුන් සාදික් සහ සාහිඩ් සොයායන අතර වන අතර පරීක්ෂණවලින් හෙළිවූයේ ඔවුන් පුත්තලමේ සිටින බවයි.

2019 ජනවාරි 23 වන දින වන විට වනාතවිල්ලුව පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ අත්අඩංගුවට ගැනීම සම්බන්ධව සහරාන්ගේ නම අනාවරණය විය. සාදික්ගේ සාක්ෂිවලට අනුව, වනාතවිල්ලුවේ පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීමෙන් පසු සහරාන් විසින් මරාගෙන මැරෙන ප්‍රහාරයක් සඳහාවූ සිය සැලසුම් කඩිනම් කර තිබේ.

කෙසේ වෙතත්, මාවනැල්ල සිද්ධිය භාරව සිටි විමර්ශන නිලධාරියා වූ කෑගල්ල පොලිස් අධිකාරී අංශයේ පුද්ගලික සහකාර ලෙස සේවය කළ සහකාර පොලිස් අධිකාරී කමල් පෙරේරා මහතා **2018** දෙසැම්බර් **28** දිනැති ලිපියක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා වෙත යවා ඇති අතර එමගින් ඉල්ලා සිටින ලද්දේ සිද්ධිය පිටුපස සිටින කණ්ඩායමට ජාත්‍යන්තර සම්බන්ධතා තිබේද නැද්ද යන්න ජාත්‍යන්තර පොලීසියෙන් විමසා බැලිය හැකිද යන්නයි. **2019** ජනවාරි **29** දිනැති ලිපියක් මගින් ඊට පිළිතුරක් ලබාදෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර විසින් කුමන්ත්‍රණය පිළිබඳ කිසිදු තොරතුරක් නොමැති විට, එය සැලසුම් කර ඇති රට සහ එය සිදුකර ඇති ආකාරය පිළිබඳ තොරතුරු නොමැති විට ජාත්‍යන්තර පොලීසිය වෙතින් ආධාර ලබාගත නොහැකි බව සඳහන්කර තිබේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ ස්ථාවරය පිළිගත නොහැක්කේ සහරාන් යනු අයිඑස් දෘෂ්ටිවාදය ප්‍රචාරය කරන සහ ශ්‍රී ලංකාව තුළ අයිඑස් පන්නයේ ප්‍රහාරයක් දියත්කිරීමට තරුණයින් පොළඹවන අන්තවාදී දේශකයෙකු බව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන විසින් 2018.01.25 තරම් ඈත කාලයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න හට දන්වා තිබීම නිසාවෙනි. සහරාන් විදේශීය අන්තවාදීන් සමඟ සම්බන්ධකම් පවත්වන බවට විදේශ බුද්ධි අංශ විසින් දැනුම්දී ඇති බව තවදුරටත් දැනගන්නට ලැබුණි.

2019 පෙබරවාරි එම ක්‍රියාමාර්ගය නිර්දේශ කරමින් විමර්ශන නිලධාරියා විසින් සකස් කරන ලද විමර්ශන සැලැස්ම 8 වන දින ඔහු වෙත යවා තිබියදීත්, අදාළ නිලධාරියා විසින් එම ගවේෂණය සිදුකරන ලද කෝණය පිළිබඳව සලකාබැලීමට කිසිදු උත්සාහයක් නොගත් හෙයින්, මාවනැල්ලේදී සිදුවූ ක්‍රියාවන්ට සම්බන්ධ කණ්ඩායමට යම් ජාත්‍යන්තර ආධාරයක් තිබිය හැකි බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා නොසිතූ බව පෙනේ.

මෙම පරීක්ෂණය සඳහා රහස් පොලිසිය ප්‍රමුඛත්වය ලබාදී නොමැති බවද සාක්ෂිවලින් පෙනීයයි. මෙම කාලය තුළ තම අංශය විසින් විමර්ශන 400ක් පමණ සිදුකර ඇති බව විමර්ශන නිලධාරියා සාක්ෂි දුන්නේය. රහස් පොලිසියේ මුළු ශක්තිය නිලධාරීන් 700 කට වඩා වැඩිවූ තත්ත්වයක් පැවතියද, මෙම පරීක්ෂණය සඳහා ප්‍රධාන විමර්ශකයා ඇතුළු නිලධාරීන් පස් දෙනෙකු පමණක් අනියුක්ත කර ඇති බව පෙනේ.

අමාත්‍ය කබීර් හෂීම්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කරමින් සිටි මොහොමඩ් රාසික් මොහමඩ් තස්ලීන් ආයුධ ගබඩාව සොයාගැනීම සිදුකරනවිට රහස් පොලිසිය සමඟ පරිවර්තකයෙකු ලෙස කටයුතු කළ බවට සාක්ෂි තිබේ. 2019 මාර්තු 9 වන දින ඔහුගේ නිවසේ නිදා සිටියදී හිසට වෙඩි වැදී ඇත. ඝාතනය කිරීමේ නියෝගයට අනුව සිදුවූ වෙඩි තැබීම හේතුවෙන් තුවාල සිදුවීම නිසා ඔහු මේ වනවිට එක්තැන්ව සිටින අතර එක්සත් රාජධානියේ වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය වේ. ඔහුගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් රජය විසින් දැරිය යුතු යැයි පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

ශ්‍රී ලංකාව ඉස්ලාමීය රාජ්‍යයක් බවට පත් කිරීමේ දැවැන්ත සැලැස්මේ කොටසක් වනාතවිල්ලුවේ ස්ථානයෙන් හෙලිවන රහස් පොලිසිය විසින් සොයා ගන්නා ලදි. එක් සැකකරුවෙකු පවසන පරිදි, "ඒක ලේ විලක් කරනවා" යන්නෙන් මෙහි තීව්‍රභාවය පැහැදිලිය. මෙම සැලසුම 2020 දී විශාල ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කර ඇති බව පෙනේ. කෙසේ වෙතත් පසුව පරිච්ඡේදයේ විස්තරාත්මකව විස්තර කර ඇති පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනාතවිල්ලුව ඉඩම සොයාගැනීම සහ පසුව වූ සිදුවීම්වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස ප්‍රහාරය වේගවත් කිරීමට සහරාන් සමත් විය.

මෙම ස්ථානයෙන් සොයාගත් භාණ්ඩ අතර නයිට්‍රික් අම්ල ටින් හයක් (කිලෝග්‍රෑම් 35 බැගින්), යූරියා, පොටෑසියම් නයිට්රේට් කිලෝග්‍රෑම් 110 ක්, ඩෙටනේටර් 99 ක්, LED බල්බ කිහිපයක්, කූඩාරම්, දේශීය තුවක්කු සහ ගරිල්ලා යුද්ධයකට අවශ්‍ය උපකරණ ඇතුළත් වේ. ගවේෂණය කරන ලද ද්‍රව්‍ය මෑතකදී වළලා තිබූ බව හෙළිවිය. 2019 ජනවාරි 17 වන දින රාජ්‍ය බුද්ධි සේවය සහ යුධ හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් එම ස්ථානයට පැමිණියහ. පරීක්ෂණවලට අනුව ඩෙටනේටර් ඉන්දියාවේ විදුලිය භාවිතා නොකොට

නිපදවන ලද ඒවා වන අතර ඒවා මෙරට තුලදී මිලදීගෙන ඇත. මෙම වර්ගයේ ඩෙටනේටර් ලෝහ ගල්වල භාවිතා වේ.

එක් සැකකරුවෙකු වූ මුෆීෂාඩ් තම මුදල් පසුම්බියේ ඉංග්‍රීසියෙන් ලියා ඇති බෝම්බ සාදන ආකාරය විස්තර කරමින් සටහනක් තබාගෙන ඇත. හාදියාට අනුව සහරාන්ගේ කණ්ඩායම අයිඑස්හි ඩබික් සඟරාව හරහා බෝම්බ සෑදීමේ තොරතුරු ලබාගත්හ.

සාදික් සහ සාහිඩ්ගේ පියා වන රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම්ව 2019 ජනවාරි 22 වන දින අත්අඩංගුවටගෙන රැඳවුම් නියෝග යටතේ තබාගෙන 2019 ජනවාරි 25 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලදි. ඔහුගේ නිවස පරීක්ෂා කිරීමේදී සීඩී තැටි 390ක්, ගුවන් රයිෆලයක් සහ ඇතැම් ලියකියවිලි සොයා ගැනීමට හැකිවිය. කොළ පැහැති පසුබිමක්, වීඩියෝ කැමරාවක්, ආලෝකකරණයක් සහ පටිගත කිරීම හා විකාශනය සඳහා අවශ්‍ය අනෙකුත් උපකරණ සොයාගත් අතර නිවසේ දෙවන තට්ටුව මත ඉදිකර ඇති හුදකලා කාමරයක් එහි අඩංගු විය. එම කාමරය පටිගත කරන කාමරයක් ලෙස භාවිතා කරන ලද බව පෙනී යන අතර එය සහරාන් විසින් ඔහුගේ සමහර වීඩියෝ නිර්මාණය කිරීමට භාවිතා කර ඇති බව පෙනී යයි.

වනාතවිල්ලුවේ ඉඩමෙන් හමුවූ පුද්ගලයින් සිව්දෙනාම අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටි බවට සාක්ෂි මගින් පෙන්නුම් කළද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 11 (1) වගන්තිය යටතේ කරන ලද සීමාකිරීමේ නියෝගයක් මත රැඳවියන් දෙදෙනෙකු ඉක්මනින් නිදහස් කර ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයින් රහස් පොලිසියට ගොස් රැඳවියන් දෙදෙනෙකු පාසල් ළමුන් බව දන්වා ඇති බව ප්‍රධාන විමර්ශන නිලධාරි ප්‍රධාන පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා සාක්ෂි දෙමින් කියා සිටියේය. කෙසේ වෙතත්, පරීක්ෂණ කොමිෂන් සභාවට මානව හිමිකම් කොමිසමේ නිලධාරින්ගේ සංචාරයේ දිනය හෝ සංචාරය පිළිබඳ කිසිදු සටහනක් ලබාදී නොමැත. පාසැල් ළමුන් දෙදෙනාට එරෙහිව ඉක්මනින් පරීක්ෂණ අවසන් කර වාර්තා කරන ලෙස විමර්ශකයින්ට ජොෂ්ඨ නියෝජ්‍ය

පොලිස්පති සහ රහස් පොලිසියේ අධ්‍යක්ෂවරයා විසින් දැනුම්දුන් බව තවදුරටත් හෙළිදරව් විය. ඒ අනුව වනාතවිල්ලුවේදී අත්අඩංගුවට ගත් රැඳවියන් දෙදෙනෙකුට (එනම් මුහීස්ගේ මස්සිනාවරුන්) එරෙහිව කිසිදු තොරතුරක් සොයාගත නොහැකි බව පවසමින් විමර්ශකයා සිය ඉහළ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ වාර්තාවක් සකස් කර තිබුණි. ඔවුන්ගේ නම මොහමඩ් නෆීස් මොහමඩ් නාෆ්රිත් සහ මොහමඩ් නෆීස් මොහමඩ් නවිත් ය.

මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකරගෙන් මේ කොමිසම ප්‍රශ්න කළවිට මානව හිමිකම් කොමිසමේ කිසිදු මැදිහත්වීමක් මේ සම්බන්ධයෙන් සිදුනොවූ බව ඔහු ප්‍රකාශ කළේය. කෙසේ වෙතත්, උසාවියේ ගොනු කරන ලද බී වාර්තාවලින් අනාවරණය වූයේ නවීත් පමණක් පාසල් යන වයසේ පසුවන බවයි. ඔවුන් දෙදෙනාම නිදහස් කරනු ලැබුවේ එවකට ආරක්ෂක අමාත්‍ය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 අප්‍රේල් 09 දින අත්සන් කරන ලද නියෝගයකට අනුකූලවය. තම අත්සන සඳහා එම ලේඛනය ඉදිරිපත් කළ නිලධාරීන් ඒ සඳහා වගකීම භාරගතයුතු බවට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අවධානය කළේය.

රැඳවුම් නියෝගයක් මත මුදාහරින ලද එක් සැකකරුවෙකු විසින් වාසය කරන ලද කුඩා පැල්පතක ගුවන් රයිෆලයක් තිබී ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ සාක්ෂිවලින් පෙනීයයි. සෝදිසි කිරීමේදී රහස් පොලිසියට සහායවූ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් එය සොයා ගන්නා ලදි. මධ්‍යම රාත්‍රියේදී සෝදිසි මෙහෙයුමක් සිදුකර ඇති බැවින් මේ කාරණය විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් ඔහුගේ අවධානයට යොමු නොකළ බව රහස් පොලිසිය විසින් විමර්ශන නිලධාරියාට දැනුම්දී ඇත.

මෙම තත්ත්වයන් යටතේ, සහරාන් සහ ඔහුගේ කණ්ඩායම හා SLIIM ඇතුළු අනෙකුත් තවුහිද් කණ්ඩායම් සමඟ ඔවුන් සම්බන්ධවී ඇති බවට පරීක්ෂණ පැවැත්විය යුතුය. මොහොමඩ් නෆීස් මොහමඩ් නෆ්රිත් සහ මොහොමඩ් නෆීස් මොහමඩ් නවිත් පැවැත්වූ සම්බන්ධතා පිළිබඳව සවිස්තරාත්මක පරීක්ෂණයක් වහාම ආරම්භ කරන ලෙස පරීක්ෂණ සභා කොමිසම නිර්දේශ කරයි.

මාවනැල්ල සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ සඳහා බස්නාහිර පළාතේ හිටපු ආණ්ඩුකාර අසාත්සාලිගේ මැදිහත්වීම මෙන්ම වනාතවිල්ලුවේදී අත්අඩංගුවටගත් සැකකරුවන් දෙදෙනෙකු නිදහස් කිරීම සම්බන්ධයෙන් ද මෙම නිර්දේශය ඉදිරිපත් කෙරේ.

මොහමඩ් නෆීස් මොහමඩ් නෆ්රිත් සහ මොහොමඩ් නෆීස් මොහමඩ් නවිත් යන සැකකරුවන් දෙදෙනා නිදහස් කිරීම සඳහා පෙනී සිටීමට තමා සම්බන්ධ වූ බව අසාත්සාලි පිළිගත්තේය. ඔහුට අනුව මුස්ලිම් කවුන්සිලයේ හිටපු සභාපති එන්.එම්. අමීන් මේ සම්බන්ධයෙන් ඔහු සමඟ කතා කර තිබේ. 2019 ජනවාරි 23 වන දින ආරක්ෂක ලේකම් සමඟ රැස්වීමක් පවත්වා ඇති අතර, එම ප්‍රශ්නය අධ්‍යක්ෂ සී.අයි.ඩී. ශානි අබේසේකර මහතා වෙත යොමු කළවිට ඔහු පවසා සිටියේ "ඒ ගැන දැන් කථා කරන්න එපා, විමර්ශනය කරලා අවසන් වෙන්න ඕන" යනුවෙනි. කෙසේ වෙතත්, ඉහත දක්වා ඇති පරිදි, අතිගරු ජනාධිපතිතුමාගේ 2019 අප්‍රේල් 9 වන දිනැති නියෝගය පරිදි එම සැකකරුවන් දෙදෙනාගේ මැදිහත්වීම පිළිබඳ පරීක්ෂණ කඩිනම් කර ඇත.

මාවනැල්ල සිද්ධිය පිළිබඳ විමර්ශනවලට ඔහුගේ මැදිහත්වීම පිළිබඳව අසාද් සාලිගේ ස්ථාවරය වූයේ උක්ත සිදුවීම පිළිබඳව ඔහුට දුරකථන ඇමතුම් කිහිපයක් ලැබුණු බවත් ඔහුට ඒ දුරකතන ඇමතුම් ලැබුණු දින නිශ්චිත වශයෙන් සඳහන් කිරීමට නොහැකි බවත්ය. සමස්ත ලංකා ජමියතුල් උලමා සභාවේ සභාපති රිස්වි හා මුස්ලිම් කවුන්සිලයේ ප්‍රධානී එන්. එම්. අමීන් මහතා අමතා මෙවැනි සිදුවීම් නැවත නැවතත් සිදුවීම වැළැක්වීම සඳහා ඒ පිළිබඳව සාකච්ඡා කළයුතු බව තමා කඩිනමින් දැනුම්දුන් බව ඔහු තවදුරටත් සඳහන් කළේය. සමස්ත ලංකා ජමියතුල් උලමා සභාවේ සහකාර ලේකම් සහ ලංකා මුස්ලිම් තරුණ සංවිධානයේ අධ්‍යක්ෂ මොහොමඩ් සාලි මොහොමඩ් තාසිම් (තාසිම් මවුලවි) යන අයවලුන් මෙම තත්ත්වය හැසිරවීමට සහ ඔහුගෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා යොදවා ඇති බව සමස්ත ලංකා ජමියතුල් උලමා සබාවේ ප්‍රධානියා අසාත්සාලි වෙත දැනුම් දී තිබේ. තාසිම් මවුලවි යනු 2019 අප්‍රේල් 21 වන දින ට්‍රොපිකල් ඉන් තානායමේදී මියගිය අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ්ගේ පියා වන අබ්දුල් ලතීෆ්ගේ ඥාති සොහොයුරෙකි.

පසුව අසාත් සාලි විසින් කාසිම් මවුලවි අමතා තත්ත්වය විමසූ විට, මාවනැල්ලේ කිසියම් සිදුවීමක් සිදුවී ඇති බවට දෙවැන්නා පිළිතුරුදී ඇත. (සිද්ධියේ ස්වභාවය කාසිම් මවුලවි ද වන විටත් නොදැන සිටි බවත් කාසිම් මවුලවි ඒ වන විට සිද්ධිය පිළිබඳව සෙවීමට මාවනැල්ල බලා ගමන් කරමින් සිටි බවත් අසාද් සාලි ප්‍රකාශ කළේ ය.

අසාත්සාලි ඔහු පළමුවෙන්ම කාසිම් මවුලවි ඇමතූ දිනය මතක් කිරීමට අපොහොසත් වූවේය. කෙසේ වෙතත්, කාසිම් මවුලවි විසින් ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියෙන් තොරතුරු රැස්කර එය අසාත්සාලි වෙත ලබාදී ඇති අතර, ඔහු විසින් වහාම පොලිස්පති පූජිත් ජයසුන්දර සහ ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන අය අමතා රැස්වීමක් ඉල්ලා සිටි අතර එය ලබාදෙන ලදි. මෙම අවස්ථාවට ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂකවරයා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර සහ ජාතික බුද්ධි අධ්‍යක්ෂ සිසිර මෙන්ඩිස් යන අය සහභාගිවූහ.

මෙම රැස්වීම ආරක්ෂක ලේකම් කාර්යාලයේ දී 2019 ජනවාරි 3 වන දින පමණ පැවැත්විණි. මෙතෙක් සිදු කරන ලද විමර්ශනවලින් අනාවරණයවූ කරුණු පිළිබඳව පොලිස්පතිවරයා රැස්ව සිටි පිරිස දැනුවත් කර ඇති අතර සැඟවුණු සැකකරුවන් දෙදෙනාගේ පියා විසින් සිය පුතුන්ට පොලිසියට බාර වන මෙන් ආයාචනා කරමින් වට්ස්ඇප් වෙත හඬපටයක් නිකුත් කර ඇති බවද තසිම් මවුලවි ප්‍රකාශ කර තිබේ. අවශ්‍ය නම් තමාට අදාළ ප්‍රදේශයේ පල්ලිය සමඟ සම්බන්ධීකරණය කර සැකකරුවන්ගේ පියා සම්බන්දීකරණය කළ හැකි බව තාසිම් මවුලවි ප්‍රකාශ කර ඇති අතර, එය අනවශ්‍ය බව ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් අදාළ අවස්ථාවට සහභාගි වූ නියෝජිතයින් ප්‍රකාශ කර තිබේ. මේ අතර පොලිස්පතිවරයා විසින් සහකාර පොලිස් අදිකාරි ගාමිණී තෙන්නකෝන් අමතා අසාත් සාලිගේ ජංගම දුරකථන අංකය ලබාදී ඇති අතර, අවශ්‍යතාවයක් ඇත්නම් ඇමතීමට සහකාර පොලිස් අධිකාරී ගාමිණී තෙන්නකෝන් දුරකථන අංකය සාක්ෂිකරු සමඟ බෙදා ගත්තේය.

තාසිම් මවුලවිගේ දුරකථන අංකයට වඩා පොලිස්පතිවරයා තම දුරකථන අංකය සහකාර පොලිස් අධිකාරී ගාමිණී තෙන්නකෝන් වෙත ලබාදීමට හේතුව ලෙස අසාද් සාලි පෙන්වා

දෙන ලද්දේ අවශ්‍ය නම් ඔහුට සමස්ත ලංකා තවුහිද් ජමාත් හා මුස්ලිම් කවුන්සිලය සම්බන්දීකරණය කළ හැකි පුද්ගලයෙකු වන නිසාත් මෙවැනි බොහෝ අවස්ථාවන්හි මූලපිරීම තමන් විසින් සිදුකර ඇති නිසාවෙන් වන බවත්ය. තාසිම් මවුලවි මාර්ගයෙන් මාවනැල්ලේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් බාරදීමේ අපේක්ෂාව තමන් විසින් පොලිස්පතිවරයා හරහා ප්‍රකාශ කළ බවට සහකාර පොලිස් අධිකාරී ගාමිණී තෙන්නකෝන්ගේ ස්ථාවරය අසාද් සාලි ප්‍රතික්ෂේප කළේය.

කෙසේ වෙතත්, පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව, 2019 ජනවාරි 3 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ රැස්වීමට පෙර 2018 දෙසැම්බර් 29 වන දින අසාත්සාලි පොලිස්පතිවරයාට දුරකතනයෙන් අමතා තිබේ. පොලිස්පතිවරයා ලබාදුන් සාක්ෂිවලට අනුව මාවනැල්ල සිද්දියට අදාළ සැකකරුවන් (සහෝදරයන්) දෙදෙනාව වෙනත් පුද්ගලයෙකුගේ, බොහෝදුරට තාසීම් මවුලවිගේ මැදිහත්වීම මත බාරදීම සම්බන්ධීකරණය කිරීමට තමන්ට හැකි බව පොලිස්පතිවරයාට දන්වා ඇත. අසාද් සාලි වෙත පොලිස්පතිවරයාගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාවක් ලබාදුන්නද පොලිස්පතිවරයාගේ මෙම ස්ථාවරය අභියෝගයට ලක් නොකළේ ය. පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි ඔහු අසාත්සාලිට කතා කළ බව සාක්ෂි දුන් සහකාර පොලිස් අධිකාරී ගාමිණී තෙන්නකෝන්ගේ සාක්ෂි මඟින් තහවුරුවීම මත මෙම ස්ථාවරය සනාථ වේ. මාවනැල්ල සිද්ධියේ ප්‍රධාන සැකකරුවන් වන සහෝදරයන් දෙදෙනා තාසිම් මවුලවි විසින් ගෙන එනු ලබන බවත් දිවා කාලයේදී ඔවුන් භාරදෙන බවත් අසාද් සාලි ඔහු වෙත දැනුම් දුන්නේය.

අසාත්සාලි පොරොන්දුවූ පරිදි සැකකරුවන් එවැනි යටත් වීමක් සිදුනොවූ බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත්වූ සාක්ෂි අනුව තහවුරු වේ. 2018 දෙසැම්බර් 31 වන දින නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ පැවති රැස්වීමකදී සහකාර පොලිස් අධිකාරී ගාමිණී තෙන්නකෝන් විසින් නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධනගේ උපදෙස් මත අසාත්සාලි මහතා අමතා සැකකරුවන් යටත්වීම සිදුනොවීමට හේතුව විමසීය. එම සංවාදය පහත පරිදි ය.

සහකාර පොලිස් අදිකාරී තෙන්නකෝන් : අසාද් සාලි මහතා අද ඉදිරිපත් කරනවා කිව්ව Accused ලා ඉදිරිපත් කළේ නෑනේ

අසාද් සාලි : ආ... තාම ඉදිරිපත් කළේ නැද්ද? පොඩ්ඩක් ඉන්නකෝ

සාලි ඒ පිළිබඳව මවිතය පල කර බවක් මින් හැඟවේ.

යටත් වීම සිදු නොවීම ගැන සාලි පුදුමයට පත් වූ අතර පසුව මෙම දුරකතන ඇමතුම සම්මන්ත්‍රක ඇමතුම් මාදිලියේ (conference call) තබා ගනිමින් වෙනත් අයෙකු සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළේය. සහකාර පොලිස් අධිකාරී ගාමිණී තෙන්නකෝන් පසුව ඇමතුම විසන්ධි කර ඇත. මාවනැල්ල සිද්ධියේ සැකකරුවන් දෙදෙනා යටත් වීමට කැන් කිරීමේදී අසාද්සාලිගේ මැදිහත්වීම පිළිබඳව සොයා බැලීමේදී, ඔහු 2018 දෙසැම්බර් 26 වන දින දූම්මලසූරියට පොලිස් ස්ථානය භාර ස්ථානාධිපතිවරයාට දුරකථන ඇමතුමක් ලබාදී ඇති බව සඳහන් කිරීම සුදුසුය. මාවනැල්ල සිද්ධිය සම්බන්ධයෙන් දූම්මලසූරිය පොලිසිය විසින් මොහමඩ් අන්සාර්දීන් මොහමඩ් ඉල්මි, මොහොමඩ් මන්සූර් මොහොමඩ් සොනාස්ඩීන් සහ මොහොමඩ් අමීර් මොහමදු ආයාතුල්ලා යන අය උක්ත සිද්ධියට සැක පිට අත්අඩංගුවට ගනු ලැබීය. තමන් දූම්මලසූරිය පොලිස් ස්ථානාධිපතිවරයාට දුරකතන ඇමතුමක් ලබා දුන් බව අසාත් සාලිට මතක නැති බව ප්‍රකාශ විනි.

දූම්මලසූරිය පොලිසියේ එවකට පොලිස් ස්ථානාධිපතිවරයාගේ සාක්ෂි වූයේ 2018 දෙසැම්බර් 26 වන දින පෙරවරු 11.06 ට අසාත්සාලිගෙන් ඔහුට ඇමතුමක් ලැබුණු බවය. දුරකථන ඇමතුම තත්පර 13 ක් පැවතුන අතර අසාත්සාලි විසින් මෙම ඇමතුමේදී සිදුවීම පිළිබඳව විමසා ඇති අතර, සාක්ෂිකරු පිළිතුරුදී ඇත්තේ සිද්ධිය කෙටියෙන් විස්තර කිරිමෙනි. 2018 දෙසැම්බර් 26 වන දින පෙ.ව. 11.07 ට ඔහුගේ නිල ජංගම දුරකථන අංක 0718591272 මඟින් අසාත් සාලි මහතාගෙන් ඔහුට දෙවන දුරකථන ඇමතුමක් ලැබී තිබේ. තත්පර 83ක් පැවති එම දුරකතන ඇමතුමෙන් ද අසාත්සාලි සිද්ධිය සම්බන්ධයෙන් යළිත් අවධානාත්මකව විමසීම කර ඇති අතර පොලීසිය විසින් පවත්වනු ලබන

විමර්ශනවල ස්වභාවය පිළිබඳව ප්‍රශ්න කර තිබේ. සාක්ෂිකරු විමර්ශනවල ස්වභාවය විස්තර කර ඇති අතර සිද්ධිය පිටුපස සිටින සැකකරුවන් හඳුනාගැනීමට පියවර ගෙන ඇති බව ද ප්‍රකාශ කළේය. අසාත්සාලි විමර්ශන කෙරෙහි දක්වන උනන්දුව විමර්ශන කඩිනම් කිරීම සඳහා පොලීසියට පෙලඹවීමක් ලෙස තමා වටහාගත් බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය.

කෙසේ වෙතත්, ඇතැම් පොලිස් නිලධාරීන් අසාත්සාලිගේ මෙම මැදිහත්වීම පොලීසිය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග දැන ගැනීමට සහ ඔවුන්ගෙන් තොරතුරු ලබාගැනීමට උත්සාහ කිරීමක් ලෙස සැලකූ බවට බවට සාක්ෂි තිබේ.

2019 අප්‍රේල් 23 වන දින විකාශය වූ වාදපිටිය වැඩසටහනේ කොටසක් පිළිබඳ සාක්ෂි පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී තිබේ. පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් දේශපාලන ප්‍රතිචාර සාකච්ඡා කිරීම සඳහා එම වැඩසටහනට සහභාගි වූවෝ නම් පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ සහ අසාත්සාලි යන මහත්වරුන් සහභාගී විය.

වැඩසටහනෙන් උපුටා ගත් කොටස් කිහිපයක් පහත පරිදි ය:

අ. 49 වැනි මිනිත්තුවේ, 21 වන තත්පරයේදී - මවුලවි සහ තවත් පුද්ගලයෙකු සම්මන්ත්‍රණ ඇමතුමක් (conference call) ආරම්භ කර ඇති බවත්, මාවනැල්ල සිද්ධියට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු පොලීසියට භාරදිය හැකි ආකාරය ගැන සාකච්ඡා කළ බවත් අසාත්සාලි පවසයි.

බී. 49 වන මිනිත්තුව, 39 වන තත්පරය - මාවනැල්ල සිද්ධීන් සම්බන්ධයෙන් සැකකරුවන්ගේ පියා හමුවීමට සමස්ත ලංකා තවුහිද් ජමාත්හි තාසිම් මවුලවි ගම්පොල වෙත යවා ඇති බව අසාත්සාලි පවසයි.

ඇ. 50 වන මිනිත්තුවේ, 40 වන තත්පරයේ - අසාත්සාලි පවසන්නේ ඔහු පොලිස්පතිවරයා සහ ආරක්ෂක ලේකම්වරයා අමතා සැකකරුවන්ගේ පියාගෙන් ප්‍රකාශයක් ලබාගත හැකි බව ඔවුන්ට දන්වා ඇති බවත්, ඔහු පවසා ඇත්තේ තමා

මාවනැල්ල පොලිසියට ප්‍රකාශයක් ලබාදීමට සූදානම් බවත් ඔහුගේ පුතුන් පොලිසියට භාර දෙන ලෙස ඉල්ලීමක් කිරීමට බවත්ය.

ඇ. 51 වන මිනිත්තුව, 11 වන තත්පරයේ - අසාද් සාලි පවසන්නේ පුත්තලම ඇතිවූ සිද්ධියේදී අත්ඩංගුවට පත් එක් තරුණයෙකු අසල්වැසි භූමියේ සිට සිද්ධිය නැරඹීමට පැමිණි තරුණයෙකු වන බවත් තවත් අයෙකු ඔහුගේ ආහාර රැගෙන ආ තරුණයෙකු වන බවත්ය.

ඉ. 51 වන මිනිත්තුව, 24 වන තත්පරය - තරුණයින් දෙදෙනා සම්බන්ධ කාරණය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර සහ ආරක්ෂක ලේකම්වරයා සමඟ සාකච්ඡා කළ බව ඔහු තවදුරටත් සඳහන් කළේය.

ඊ. 51 වැනි මිනිත්තුවේ, 30 වන තත්පරය - විමර්ශන අවසන් වනතුරු කිසිදු පරීක්ෂණයක් නොකළ යුතු බවට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර පිළිතුරු දී තිබේ.

උ. 51 වන මිනිත්තුව, 37 වන තත්පරය - අසාත්සාලි, ඉඩමේ හිමිකරු සහ ඔහුට ආහාර ගෙනා පුද්ගලයා "අහිංසක" යැයි සඳහන් කළේය.

ඌ. 51 වන මිනිත්තුව, 47 වන තත්පරය - අසාත්සාලි පවසන්නේ සැකකරුවන් දෙදෙනෙකු අධිකරණය විසින් නිදහස් කළ බවයි.

එ. 53 වන මිනිත්තුව, 37 වන තත්පරය - සැකකරුවන් දෙදෙනෙකු නිදහස් කරගැනීමට ඔහු මැදිහත් වූයේ දැයි වැඩසටහනේ පූරකවරයා විමසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් අසාත්සාලි පවසා ඇත්තේ මාවනැල් සිද්ධියේදී පලාගිය සැකකරුවන් දෙදෙනෙකු සහ වනාතවිල්ලුව ඉඩමට අදාළව නිදහස් කරන ලද සැකකරුවන් දෙදෙනෙකු මරාගෙන මැරෙන බෝම්බකරුවන් නොවන බවයි.

ඒ. 01 වන පැය, 02 වන මිනිත්තුව, 14 වන තත්පර - අසාත්සාලි ප්‍රකාශ කළේ පියා ත්‍රස්තවාදියෙකු නොවන බවත්, ඔහුගේ පුතුන් කළ වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බවත්ය.

ඔ. 01 වන පැය, 15 වන මිනිත්තුව, 35 වන තත්පරය - අසාත්සාලි සඳහන් කළේ තමා පොලිස්පතිවරයා අමතා ප්‍රකාශයක් සටහන් කර ගැනිම සැකකරුවන්ගේ පියා සහකාර පොලිස් අධිකාරී තෙන්නකෝන් වෙත ගෙන ඒමට ඇති හැකියාව දැනුම් දුන් බවයි.

දේශපාලනඥයෙකු වන අසාද් සාලි ඉහත සඳහන් කළ අවස්ථාවන්ට මැදිහත් නොවිය යුතුව තිබූ බව පරීක්ෂණ කොමිසමේ මතයයි. මෙවැනි ක්‍රියා පොලිසියේ ස්වාධීන විමර්ශනවලට බාධා වන බැවින් එවැනි ක්‍රියා සාපරාධි ක්‍රියාවන් බවට පත් කිරිම මඟින් දේශපාලනඥයින්ගේ මැදිහත්වීම් අධෛර්යමත් කළ යුතුය.

ඉෂ්ෂාන් මියුනිදීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය රිෂාඩ් බදියුදීන් යුද හමුදාපති ජනරාල් මහේෂ් සේනානායක මහතාට සිදුකළ මැදිහත්වීම හේතුවෙන් ඉහත තර්කය තවදුරටත් ශක්තිමත් වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් නියෝජිතයෙක් විසින් පොලිස් පරීක්ෂණ සහ අත්අඩංගුවේ හෝ රඳවාගෙන සිටින ත්‍රස්තවාදී සැකකරුවන් සම්බන්ධයෙන් කෙරෙන ඕනෑම මැදිහත්වීමක් සාපරාධී ක්‍රියාවන් බවට ප්‍රකාශයට පත් කරමින් එවැනි ක්‍රියාවන් දඬුවම් ලැබිය හැකි වැරදි ලෙස හඳුන්වාදීමට පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

මාවනැල්ල සහ වනාතවිල්ලුව සිදුවීම් සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති නිගමනයට එළඹීම කෙරෙහි පරීක්ෂණ කොමිසම වෙත ඉදිරිපත් වූ වාචික හා ලේඛනමය සාක්ෂි මඟින් ලබාගත් සාක්ෂි මෙන්ම විමර්ශකයන්ගේ සාක්ෂි ද දායක කරගෙන ඇත.

## 10 වන පරිච්ඡේදය

# පුහුණු කඳවුරු සහ ආරක්ෂක නිවස්නය

සහරාන් සහ ඔහුගේ කණ්ඩායම රට පුරා ස්ථාන කිහිපයකම පුහුණු කඳවුරු සහ සමුළු පවත්වා තිබේ. සහරාන් විසින් තරුණයන් ඔහුගේ දේශන සහ පුහුණු සැසි සඳහා ආකර්ශනය කර ගත් ආකාරය එක්තරා සාක්ෂිකරුවකු විසින් විස්තර කරන ලදී. නොමිලේ පවත්වන ඔහුගේ දේශනවලට සහභාගි වීමට තරුණයන්ව දිරිමත් කෙරුණු අතර ආහාර වේල්ද නොමිලේ ලබාදී තිබේ. මෙම දේශන අතරතුරදී ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳ වීඩියෝ දර්ශන අදාළ ආයුධද සමඟ සහභාගිකයන් හට ප්‍රදර්ශනය කර තිබේ. ඉන් අනතුරුව එහිදී සාකච්ඡා කරන ලද කිසිවක් වෙනත් පාර්ශ්වයකට හෙළිදරව් කලහොත් කළින් පෙන්වන ලද වීඩියෝ දර්ශනවල දක්නට ලැබුණු ඉරණමට එවන් ද්‍රෝහියන් ගොදුරුවනු ඇති බවට පසුව එම සහභාගිකයන් හට සහරාන් විසින් තර්ජනය කර තිබේ.

සෑම පුහුණු කඳවුරකදීම සහරාන් විසින් සහභාගිකයන් කණ්ඩායම් දෙකට බෙදා තිබේ. ඉන් එක කණ්ඩායමක් සිය දිවි නසා ගන්නා බෝම්බකරුවන් ලෙස පෙනී සිටීමට එකඟ වූවන්ගෙන් සමන්තවිත වූ අතර, අනෙක් කණ්ඩායම සමන්විත වූයේ ආයුධ භාවිතා කරමින් සටහන් කිරීමට කැමති වූ සහභාගිකයින් ගෙනි. මෙම සෑම සාමාජිකයෙකු හටම ඉස්ලාම් භාවිතයන්ට අනුකූලව “අබු” යන නම මුලට යෙදෙන සේ නම් ලබා දෙන ලදී. විශේෂ වශයෙන් මෙම සහභාගිකයින් බහුතරයක් ශ්‍රී ලංකා ජමෙයිතුල් ඉස්ලාම් (SLII) සංවිධානයේ සාමාජිකයන් වූහ.

පළමු පුහුණු කඳවුරු වසර **2017** නොවැම්බර් තෝප්පූර්හිදී පැවැත්වුණ අතර, අවසන් පුහුණු කඳවුර පැවැත්වූයේ වර්ෂ **2018** දෙසැම්බර් **14** සහ **18** කාලය තුළ හිඟුල ප්‍රදේශයේදීය. මෙම පුහුණු කඳවුරුවල අන්තර්ගතය වූයේ ප්‍රධාන වශයෙන් ඉස්ලාම් අන්තවාදී දේශන IS සංවිධානයේ ක්‍රියාකාරකම් පිළිබඳ දේශන T **56** ගිණිඅවි, පිස්තෝල සහ පිහි භාවිතය පිළිබඳ න්‍යායාත්මක පුහුණුව, පුපුරණ ද්‍රව්‍ය භාවිතය සහ බෝම්බ සාදන ආකාරය වේ. සහරාන් ඉස්ලාම් අන්තවාදය පිළිබඳ දේශන පැවැත්වූ අතර නවුෆර් විසින් IS සංවිධානය

පිළිබඳ දේශන පැවැත්වීමද මිල්හාන් විසින් T 56 ගිණිඅවි සහ පිස්තෝල වෙඩි තැබීම සඳහා සූදානම් කරන හා යළි නිෂ්ක්‍රිය කරන ආකාරයද, පිහි භාවිත කරන ආකාරයද ප්‍රායෝගිකව ඉදිරිපත් කළ අතර, හස්තුන් සහ රිල්වාන් විසින් පුපුරණ ද්‍රව්‍ය භාවිතා කරන ආකාරය සහ බෝම්බ සාදන ආකාරය ප්‍රායෝගිකව ඉදිරිපත් කළෝය. මේවා ඉදිරිපත් කිරීමේදී සම්පත් ධාරීන් වරින්වර වෙනත් ඉදිරිපත් කිරීම් සිදු කළෝය. සමහර අවස්ථාවලදී T 56 ගිණිඅවියේ ක්‍රියාකාරිත්වය ප්‍රදර්ශනය කිරීම සඳහා යූටියුබ් වීඩියෝ දර්ශනද යොදා ගෙන තිබේ. දළ වශයෙන් මෙම පුහුණු කඳවුරු සඳහා 20 දෙනෙක් හෝ 30 ක් අතර පිරිසක් සහභාගීවූහ. ඇතැම් අවස්ථාවලදී එකම ස්ථානයක එක්වරකට වඩා පුහුණු කඳවුරු පවත්වා තිබේ.

<u>පහත දැක්වෙන්නේ පුහුණු කඳවුරු හා පවත්වන ලද සමුළු පිළිබඳ තොරතුරු වේ</u>

1. වර්ෂ 2017 නොවැම්බර් මාසයේදී මැදවච්චිය රබෑව ප්‍රදේශයේදී පවත්වන ලද පුහුණු කඳවුරයි.

වර්ෂ 2017 නොවැම්බර් මාසයේදී මැදවච්චිය රබෑව ප්‍රදේශයේදී පවත්වන ලද පුහුණු කඳවුර සඳහා සහරාන්, නවුෆර්, අන්සාර්, රිස්වි,රිස්වාන්, ආබ්දීන්, රමීස්, මිල්හාන්, හස්තුන් සහ රිල්වාන් ඇතුළු 14 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් සහභාගී වූහ. එම පුහුණු කඳවුර පැවැත්වුණේ අබ්දුල් ලතිෆ් මොහොමඩ් ෂෆිර් නැමැත්තාගේ නිවසේදීය. මෙම කණ්ඩායමේ නායකත්වය දරන ලද්දේ සහරාන් විසින් වන අතර ඔහු කාත්තන්කුඩියේදී ෂෆිර්ව හඳුනාගෙන ඇති බව අනාවරණය විය. මෙම කණ්ඩායම අදාළ ස්ථානයට පැමිණ ඇත්තේ වෑන් රථයකිනි. එදින අළුයම 3 ට පමණ සහරාන් එම ස්ථානයට පැමිණ ඇති අතර, එතැන් සිට කණ්ඩායමේ සියලු දෙනා සාකච්ඡාවක නිරතවී තිබේ. ඉන් අනතුරුව කණ්ඩායමේ සියලු දෙනා එම නිවස අසල හුදකලා ප්‍රදේශයකට ගොස් IS සංවිධානයේ දජය සහ T 56 අවි අතදරා ප්‍රතිඥාවක් දී තිබේ. ඔවුන් සියලු දෙනා අදාළ දිනයේ මධ්‍යාහ්න 12 ට පමණ එම ස්ථානයෙන් පිටත්ව ගොස් තිබේ.

2. වර්ෂ 2017 නොවැම්බර් හෝ දෙසැම්බර් මාසයේ මුතූර්හි, තෝප්පූර්හි හා නල්ලූර්හි පවත්වන ලද පුහුණු කඳවුර.

මෙම පුහුණු කඳවුර සාදික් විසින් මෙහෙයවන ලද අතර හය දෙනෙකු පමණ එයට සහභාගී වූහ. මේ දක්වා අනාවරණය වූ සාක්ෂිවලින් සහරාන් මෙම කඳවුර සඳහා සහභාගී වූ බවට හෙළිදරව් වී නැත. මෙහිදී සාදික් විසින් T 56 ගිණිඅවිය වෙඩි තැබීම සඳහා සූදානම් කරන අයුරු සහ නැවත ගලවා අසුරණ අයුරු ප්‍රායෝගිකව ඉදිරිපත් කොට ඇත. මෙම පුහුණු කඳවුර සඳහා යොදා ගත් නිවස සදික්ගේ මිතුරෙකු වන හජා මොහිදීන් හට අයත් එකකි. එහි පැවැත්වූයේ එක් දින කඳවුරකි.

3. වර්ෂ 2017 දෙසැම්බර් මස 16 වෙනි දින මල්වාන පැන්ඩා බහුවිධ ක්‍රීඩා පරිශ්‍රයෙද පැවැති සමුළුව.

මෙම ස්ථානය වෙන් කර ගැනීම සිදුකොට ඇත්තේ ජමියතුල් ඉස්ලාම් (JMI) සංවිධානයේ සාමාජික අබ්දුල් කාදර් මොහොමඩ් ෂස්නි නැමැත්තෙකුගේ හැඳුනුම්කමක් පිට අදාළ ස්ථානයේ හිමිකරු වන රංගනාත් තිලකරත්න යන අයගෙනි. පැය 1 ½ ක කාලයක් සඳහා මෙම ස්ථානය වෙන් කොට ගෙන තිබූ අතර, මෙම සමුළුව සඳහා 15 දෙනෙකුගෙන් පමණ පිරිසක් සහභාගී වූහ. පස්වරු 7ට පමණ ඔවුන් එහි පැමිණි අතර, අඩකවයක ආකාරයෙන් අසුන් ගෙන ඔවුන් විසින් එහි රැස්වීමක් පවත්වා තිබේ. කණ්ඩායමේ නායකයා ලෙස ක්‍රියාකොට ඇත්තේ සහරාන්ය. එය සූදානම් කොට තිබුණේ JMI සංවිධානයේ අභ්‍යන්තර අර්බුදයක් විසඳලාලීම සඳහායි. එහිදී අර්බුදය උද්ගතවී ඇත්තේ ජමීල් නැමැත්තෙකු සහ JMI සංවිධානයේ නායක උමයර් මොහොමඩ් නැමැත්තෙකු අතරයි. උමයර් මොහොමඩ් JMI සංවිධානයේ නායකයා ලෙස පත් කිරීම පිළිබඳ ජමීල් තම නොසතුට පළ කල අතර, එබැවින් ඔවුන් දෙදෙනා අතර යම් අරගලයක් සිදුවී තිබේ. නවුෆර් සහ මිල්හාන් ද මෙම රැස්වීමට සහභාගී වූහ. JMI සංවිධානයේ සාමාජිකයින් ඔවුන් අතර පවතින ගැටුම් නිරාකරණය කර ගන්නා බවට සහ

ඉදිරියේදී එවැනි ගැටුම් නිර්මාණය නොකරන බවට එහිදී දිවුරා පොරොන්දු වූහ. ඊට සහභාගී වූ අය IS සංවිධානය පිළිගැනීමටද එකඟ වූහ.

මෙම රැස්වීම සඳහා සහභාගී වූ අය අතර වර්ෂ **2019** අප්‍රේල් මස **21** සහ **26** වන දිනවල මියගිය අය අතුරින් සහරාන්, ඉල්හාම්, අහමඩ්, මොහොමඩ් හස්තුන්, අහමඩ් මුවාර්ඩ් සහ ජමීල් මොහොමඩ් යන අයද වූහ.

4. වර්ෂ **2018** මාර්තු මස **23** සහ **25** අතර කාලය තුළ ලේවැල්ල, ධර්මාශෝක මාවතේ අංක **177/7/A** නැමැති ලිපිනයේ පිහිටි එන්රිච් බංගලෝ නැමැති ස්ථානයේ පැවැත්වුණු පුහුණු කඳවුර.

මෙම ස්ථානයේ හිමිකාරිත්වය දරණ ලද්දේ ලේවැල්ල ධර්මාශෝක මාවතේ අංක **147/9** දරණ ස්ථානයෙ පදිංචි නාලිනි මැණිකේ ගුණරත්න නැමැති කාන්තාව වන අතර, එහි තානායමක් පවත්වාගෙන ගිය දිනුක නුවන් පෙරේරා යන අයට එම ස්ථානය කුළී පදනම යටතේ ලබාදී තිබුණි. මෙම ස්ථානය වෙන් කර ගැනීම සිදුකොට ඇත්තේ කොමිස් මුදලකට හෝටල් සහ තානායම් වෙන් කිරීමේ කටයුතු සිදුකළ තුෂාන් වීලික්ස් ද සිල්වා යන අයෙකු හරහාය. මුලින්ම තුෂාන් වීලික්ස් ද සිල්වාගෙන් මෙම ස්ථානය කුළියට ගැනීම පිළිබඳ මුලින්ම විමසා ඇත්තේ මීරා සයිබ් මොහොමඩ් නෆ්ලි නැමැත්තෙකු විසිනි. මෙම පුහුණු කඳවුර සඳහා **25** දෙනෙකුගෙන් පමණ සැදුම්ලත් පිරිසක් සහභාගී වූ අතර, ඊට නායකත්වය ලබාදී තිබුණේ සහරාන් විසිනි. මෙම පිරිස වෑන් රථ **3** කින් අදාළ ස්ථානයට පැමිණ තිබේ. මෙම පුහුණු කඳවුරේ අන්තර්ගතය වී ඇත්තේ සහරාන් විසින් පවත්වන ලද ඉස්ලාම් අන්තවාදී දේශන සහ මිල්හාන් විසින් පවත්වන ලද අවි පුහුණුය. පළමු දිනයේදී ඉස්ලාම් අන්තවාදය, IS සංවිධානය සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳ සහරාන් සහ නවුෆර් විසින් පිළිවෙලින් දේශන පැවැත් වූ අතර, දෙවන දිනයේදී මිල්හාන් නොහොත් අබු සීලා විසින් T 56 ගිණිඅවියක් වෙඩි තැබීමට සූදානම් කිරීම සහ අක්‍රීය කිරීම පිළිබඳව T 56 අවි දෙකක් යොදා ගනිමින් පුහුණුව ලබාදී තිබේ. ඊට අමතරව ඔහු විසින් T 56 ගිණිඅවියක් මානන ආකාරය සහ එයට යොදන මැගසීන්

සඳහා අවි බහාලන ආකාරයද පුහුණු කරන ලදි. මීට සහභාගී වූවන් අතර පාෂාන්, අර්කම්, ඉන්ෂාම්, ඉන්ෂාෆ්, ජමිල්, උමයර්, අබු හිතාම්, මුවාඩ්, නවුෆර්, මිල්හාන්, හස්තුන්, ගෆුර් සහ රිස්කාන් යන අය වූහ. මෙහිදී හස්තුන් විසින් ආරක්ෂක අංශවලට හසු නොවීම සඳහා සහභාගිකයන්ගේ ජංගම දූරකථනවලින් VPN තාක්ෂණය හරහා අන්තර් ජාලය භාවිතා කරන ආකාරය සහ තම අනන්‍යතාවය හෙළි නොවන ආකාරයේ ජංගම දූරකථන සිම්පත් මිළදී ගෙන භාවිතා කරන ආකාරය පහදා දෙන ලදි. තවද පරිගණක හා ජංගම දූරකථන භාවිතයේදී තම අනන්‍යතාවය හෙළි නොවන ආකාරයෙන් එවා භාවිතා කරන ආකාරයද ඔහු විසින් විස්තර කරන ලදි. මෙම පුහුණුවට සහභාගී වූ අය අතර වර්ෂ **2019** අප්‍රේල් මස 21 සහ **26** වන දිනවල මියගිය අය අතුරින් සහරාන්, හස්තුන්, ජමිල්, රිල්වාන්, මුවාඩ් සහ ෂයිනි වූහ.

5. ශාන්තිපුර පන්සල පාරේ අංක **56/1** දරණ ස්ථානයේ පිහිටි තක්ෂිලා නිවාඩු නිකේතනයේදී පවත්වන ලද පුහුණු කඳවුරු **3.** මෙම නිවාඩු නිකේතනයේ භාරකරු ලෙස කටයුතු කර ඇත්තේ ශාන්තිපුර පන්සල පාරේ අංක **57** දරණ ස්ථානයේ පදිංචිව සිටි රංග ඉන්දික වීරසිංහ නැමැත්තෙකි. ඔහු පදිංචිව සිට ඇත්තේ අදාළ නිවාඩු නිකේතනයට යාබද ස්ථානයකය. මෙම නිවාඩු නිකේතනයේ හිමිකරු වී ඇත්තේ කැලණියේ පදිංචි තක්ෂිලා ඉන්දික කුමාර නැමැත්තෙකු විසිනි. අවස්ථා 3කදී මෙහි පුහුණු කඳවුරු පැවැත්වුණු අතර, සහරාන් විසින් ඒවා මෙහෙයවන ලදි. හයාතු මොහොමඩ් අහමඩ් මිල්හාන් විසින් T 56 ගිණිඅවි සහ පිස්තෝල භාවිත කරන ආකාරය පිළිබඳ දේශන පැවැතු වූ අතර, එහිදී ප්‍රායෝගික ඉදිරිපත් කිරීම් ලෙස එම ආයුධ කොටස්වලට ගලවන ආකාරය සහ නැවත සවිකරන ආකාරයද ඉදිරිපත් කරන ලදි. බෝම්බ සාදන ආකාරය පිළිබඳව මොහොමඩ් හස්තුන් විසින් දේශන පවත්වන ලදි. අන්තවාදය පිළිබඳ දේශන පවත්වන ලද්දේ සහරාන් සහ නවුෆර් විසිනි. මෙහි පැමිණීම සඳහා කණ්ඩායමේ අය විසින් වෑන් රථ **2** ක් භාවිතා කර තිබේ. ඒ අතුරින් ඇතැමෙක් පොදු ප්‍රවාහන මාධ්‍යයන් භාවිතා කොට

නුවරඑළියට පැමිණ ඇති අතර, එතැන් සිට වෑන් රථ 2 කින් අදාළ ස්ථානයට පැමිණ තිබේ. පුහුණු කඳවුරු පැවැත් වූ කාල පරාසයන් මෙසේය.

අ. වර්ෂ 2018 මාර්තු 30 වෙනි දින සිට අප්‍රේල් 1 වෙනි දින දක්වා 15, 20 ක් අතර පිරිසක් පුහුණුවට සහභාගී වී ඇත.

ආ. වර්ෂ 2018 මැයි 4 දින සිට 6 වන දින දක්වා 30, 35 ත් අතර පිරිසක් පුහුණුවට සහභාගී වී ඇත.

ඇ. වර්ෂ 2018 මැයි මස 7 වන දින සිට 10 වෙනි දින දක්වා පැවැත්වීමට නියමිත වුවද 8 වන දින දක්වා පමණක් පවත්වන ලද පුහුණුවට 25, 30 ත් අතර පිරිසක් සහභාගී වූහ.

මෙම පුහුණු සැසි 3 සඳහාම වර්ෂ 2019 අප්‍රේල් මස 21 සහ 26 යන දිනවල මියගිය අය අතුරින් සහරාන්, ෂයිනි, හස්තුන් සහ රිල්වාන් යන අය සහභාගී වූහ.

6. හම්බන්තොට සිප්පිකුළම මිමිලා බේකරිය අසල අංක 67/4/1 යන ස්ථානයේ පවත්වන ලද පුහුණු කඳවුරු.

මෙම ස්ථානයේ හිමිකරු වන්නේ සෙයියදු මොහම්මදු ෆවුෆාස් මවුලානා නැමැති කටාර්හි සේවය කරන තැනැත්තෙකු වන අතර, එහි කළමනාකරු ලෙස කටයුතු කොට ඇත්තේ සෙයියදු මසූර් මවුලානා නැමැත්තෙකු විසිනි.

මෙහිදි පුහුණු කඳවුරු පැවැත් වූ කාල පරාසයන් වන්නේ වර්ෂ 2018 ජූලි මස 7 වන සහ 8 වන දිනවල, එම මස 20 සහ 22 අතර කාලය තුළ, අගෝස්තු මස 26 සහ 28 කාලය අතරතුර, නොවැම්බර් මස 3 වන සහ 4 වන දිනවල සහ දෙසැම්බර් මස 1 වන හා 2 වන දිනවල වේ.

වර්ෂ 2018 ජූලි මස 7 සහ 8 වන දිනවල පැවැත්වුණු පුහුණු කඳවුර සඳහා 20, 25 ක් අතර පිරිසක් සහභාගි වූ අතර, සහරාන් විසින් එය මෙහෙයවන ලදි. මෙම කණ්ඩායමෙන් ඇතැමෙක් වෑන් රියකින් පැමිණ ඇති අතර, සෙසු අය හම්බන්තොට නගරයට පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතා කොට පැමිණ එතැන් සිට වෑන් රථයෙන් ගෙනවිත් ඇරලවා තිබේ. මියගිය අය අතුරින් මෙම පුහුණුවට

සහභාගි වී ඇත්තේ සහරාන් සහ රිල්වාන්ය. T 56 අවියක් භාවිත කරමින් මෙහිදී මිල්හාන් විසින් අවි පුහුණුව ලබාදී ඇති අතර, බෝම්බ සකසන ආකාරය පිළිබද පුහුණුවක් රිල්වාන් විසින් ලබාදී ඇත. සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳවද, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳවද දේශන පවත්වා තිබේ.

මීළඟ පුහුණු සැසිය පැවති ජූලි 20 සහ 22 වෙනි දින අතර කාලය තුළ 25, 30 ත් අතර පිරිසක් ඒ සඳහා සහභාගිවී ඇති අතර, සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳවද, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳවද දේශන පවත්වා තිබේ. හයතු මොහොමදූ මිල්හාන් T 56 ගිණිඅවි, පිස්තෝල සහ පිහි භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී ඇති අතර, රිල්වාන් විසින් බෝම්බ සැකසීම පිළිබඳව දේශන පවත්වා ඇත. මියගිය අය අතුරින් සහරාන්, හස්තුන් සහ ඉල්හාම් අහමඩ් යන අය මෙ සඳහා සහභාගිවී තිබේ.

අගෝස්තු මස 26 සහ 28 යන දින අතරතුර කාලයේ පැවති මීළඟ පුහුණු සඳහා 30, 40 ත් අතර පිරිසක් සහභාගිවී තිබේ. වෑන් රථ දෙකකින් සහභාගි වූ කණ්ඩායම් මේ සඳහා පැමිණ ඇති අතර, සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳවද, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳවද ඔවුනට දේශන පවත්වා තිබේ. හයතු මොහොමදූ අහමදූ මිල්හාන් විසින් T 56 ගිණිඅවි, පිස්තෝල සහ පිහි භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී ඇති අතර, හජි මොහොමඩ් මොහොමදූ හස්තුන් විසින් පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී තිබේ. වර්ෂ 2019 අප්‍රේල් මස 21 සහ 26 දිනවල මියගිය අය අතුරින් සහරාන්, ෂයිනි, හස්තුන් සහ මුවාඩ් යන අය මීට සහභාගිවී ඇත. ඊට අමතරව සාදික් සහ ෂහීඩ් ද මේ සඳහා සහභාගිවී ඇත.

නොවැම්බර් මස 3 සහ 4 යන දින අතරතුර කාලයේ පැවති මීළඟ පුහුණු සඳහා 25, 30 ත් අතර පිරිසක් සහභාගිවී තිබේ. සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳවද, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳවද ඔවුනට දේශණ පවත්වා තිබේ. හයතු මොහොමදූ අහමදූ මිල්හාන් විසින් T 56 ගිණිඅවි, පිස්තෝල සහ පිහි භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී ඇති අතර, හජි මොහොමඩ් මොහොමදූ හස්තුන් විසින් පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී තිබේ. වර්ෂ 2019

අප්‍රේල් මස 21 සහ 26 දිනවල මියගිය අය අතුරින් සහරාන් සහ හස්තුන් මෙන්ම ෂහීඩ් යන අය මීට සහභාගිවී ඇත.

25 ත් සහ 30 අතර පිරිසකගේ සහභාගිත්වයෙන් වර්ෂ 2018 දෙසැම්බර් 1 වෙනි දින සිට 2 වෙනි දින දක්වා මීලඟ පුහුණුව පැවැත්විනි. මෙම පුහුණු වැඩ සටහනේදී ද සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳව දේශන පැවැත් වූ අතර, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳවත්, නුවර, දිගන සහ බේරුවල ප්‍රදේශ ආශ්‍රිත සිද්ධීන් පිළිබඳවත්, ෂයිනි විසින් ජිහාඩ් පිළිබඳවත් දේශන පැවැත්වූහ. හයතු මොහොමදූ අහමදූ මිල්හාන් විසින් T 56 ගිණිඅවි, පිස්තෝල සහ පිහි භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී ඇති අතර, හජී මොහොමඩ් මොහොමදූ හස්තුන් විසින් පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුහුණුව ලබාදී තිබේ. මියගිය අය අතුරින් සහරාන්, රිල්වාන්, ෂයිනි සහ හස්තුන් මීට සහභාගිවී තිබේ. මෙම පුහුණුවීම් අවස්ථා හතරේදීම වර්ෂ 2019 අප්‍රේල් මස 21 සහ 26 වෙනි දිනවල මියගිය අය අතුරින් සහරාන්, රිල්වාන්, ෂයිනි සහ හස්තුන් සහභාගිවී ඇත.

7. නුවරඑළිය අංක 181/01 බ්ලැක්පුල් නැමැති ස්ථානයෙ පිහිටි බ්ලූඅයිඉන් නැමැති ස්ථානයේ පවත්වන ලද පුහුණුව.මෙම ස්ථානය ikman. lk වෙබ් අඩවියේ දැන්වීමක සඳහන් වූ පරිදි තානායමක් ලෙස නීතා කමලිනින් මාටින්ස්ටයින් යන අයගේ හිමිකාරත්වය යටතේ පවත්වාගෙන ගොස් ඇති අතර, ගම්පොළ පදිංචි සුනිල් කුලරත්න නැමැති අය විසින් එම ස්ථානය පවත්වාගෙන ගොස් ඇත. මෙහිදී පුහුණු කඳවුරු පවත්වා ඇත්තේ වර්ෂ 2018 ඔක්තෝබර් 6 සහ 7 දෙදින සහ නොවැම්බර් 16 හා 18 යන කාලය තුළය. මින් පළමු පුහුණු වැඩසටහන සඳහා 20 ත්, 25 ත් අතර පිරිසක් සහභාගිවී ඇති අතර, ඔවුන් වෑන් රථ 2 කින් මෙහි පැමිණ තිබේ. එහිදී සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳවද, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳවද දේශන පවත්වා ඇති අතර, ඉල්හාම් අහමඩ් විසින් T 56 ගිණිඅවි සහ පිස්තෝල භාවිතය පිළිබඳව පුහුණුව ලබාදී ඇත. වර්ෂ 2019 අප්‍රේල් මස 21 සහ

26 වෙනි දිනවල මියගිය අය අතුරින් සහරාන්, ඉල්හාම් සහ හස්තුන් සහභාගිවී ඇත.

නොවැම්බර් මස 16 සහ 18 වකවානුව තුළ පැවති පුහුණුව සඳහා 15, 25 ත් අතර පිරිසක් සහභාගිවූහ. එහිදී ද සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳව දේශන පැවැත්වූ අතර, නවුෆර් විසින් IS සංවිධානය පිළිබඳ දේශන පැවැත්විය. ඉන් අනතුරුව මිල්හාන් විසින් T 56 ගිණිඅවි සහ පිස්තෝල භාවිතය පිළිබඳ පුහුණුව ලබා දුන් අතර, හස්තුන් විසින් පිහි භාවිතය පිළිබඳ පුහුණුව ලබා දුන්නේය. වර්ෂ 2019 අප්‍රේල් මස 21 සහ 26 වෙනි දිනවල මියගිය අය අතුරින් සහරාන් සහ හස්තුන් සහභාගිවී ඇත.

8. වර්ෂ 2018 දෙසැම්බර් මස 14 සහ 18 අතර කාලය තුළ හිඳුල, දෙල්ගහගොඩ අංක 130/B දරණ ස්ථානයේ හරියා මස්ජිද් තවුහිද් නැමැති ඉස්ලාම් දේවස්ථානයේ ෂහිඩ් සහ සාදික් විසින් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීමට නියමිතව සිටි දරුවන් සඳහා පවත්වන ලද පුහුණුව.

මෙම නේවාසික කඳවුර සඳහා මාවනැල්ල, කඩුගන්නාව සහ දෙල්ගොඩ යන ප්‍රදේශවල සිට පැමිණි ළමයින් 30 ක් පමණ සහභාගිවූහ. ඔවුනට IS සංවිධානය පිළිබඳ දේශන පවත්වා ඇති අතර, IS සංවිධානය විසින් කුඩා දරුවෙකු මරා දමන දර්ශනද ඔවුනට පෙන්වා තිබේ. එමෙන්ම දිගන ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් පිළිබඳව ඔවුනට විස්තර කොට ඔවුනටද එවැනි ප්‍රහාර එල්ල වුවහොත් ඔවුන්ද ප්‍රතිප්‍රහාර එල්ල කළයුතු බව කියාදී තිබේ.

9. ඉහත සඳහන් පුහුණු කඳවුරුවලට අමතරව වනාතවිල්ලුව, කාර්තිවිහි සූරියා අරබි පාසැලේ ද වර්ෂ 2015 මුල් භාගයේ සිට වර්ෂ 2019 දක්වා කාලය තුළ පුහුණු කඳවුරු පවත්වා ඇත. මෙම ස්ථානය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ MRCA/QM/PT/43 දරණ ලියාපදිංචි අංකය යටතේ ලියාපදිංචි කොට ඇති මද්‍රාසා පාසැලකි. මෙම පාසැල 1989 දී දහම් පාසැලක් ලෙස ආරම්භ වර්ෂ 2011 දී මද්‍රාසා පාසැලක් බවට පරිවර්ථනය කොට තිබේ. මෙහිදී පුහුණුව ලබා දී ඇත්තේ Save the Pearl (මුතු ඇටය සුරකිමු) නැමැති සංවිධානය විසින් වන

අතර, අදාළ මද්‍රාසා පාසැලට ඇතුළත් කර ගන්නා ළමයින්ට පමණක් එම පුහුණුව ලබාදී තිබේ.

වර්ෂ 2015 මුල් භාගයේ සිට වර්ෂ 2017 අග භාගය දක්වා කාලය තුළ මෙම මද්‍රාසා පාසැල සඳහා Save the Pearl (මුතු ඇටය සුරකිමු) නැමැති සංවිධානය විසින් දරුවන් 26 දෙනෙකු පමණ ඇතුළත් කොට ගෙන ඇත. මෙම දරුවන් තෝරා ගෙන ඇත්තේ මට්ටක්කුලිය, මාදම්පේ හා පුත්තලම වැනි ප්‍රදේශවල අනාථ තත්ත්වයට පත් වූ, මව හෝ පියා අතුරින් එක් අයෙකු පමණක් සිටින පවුල්වල හෝ සමාජය විසින් කොන් කරන ලද ජන කොටස් අතුරිනි. මෙම දරුවන් හට T 56 අවි පුහුණුව, කරාටේ පුහුණුව සහ අත් බෝම්බ සෑදීම පිළිබඳව පුහුණුව ලබාදී ඇති අතර, අන්තවාදී වීඩියෝ දර්ශන පෙන්වීම සහ අන්තවාදී ඉස්ලාම් දේශන පැවැත්වීමත් සිදුකොට තිබේ. මේ සඳහා සහභාගිවූවන් අතර සහරාන්, ඉල්හාම් අහමඩ්, පුලස්තිනි මහේන්ද්‍රන් නොහොත් සාරා ෂස්මින්, ඉල්හාම් අහමඩ්ගේ බිරිඳ වන දෙමටගොඩ පිපිරුමේදී මියගිය ෆාතිමා ජිෆ්රි, නවුෆර්, රිල්වාන් සහ අවශේෂ පිරිස වූහ.

මේ අතුරින් කාන්තා සාමාජිකාවන් සඳහා කාතන්කුඩි, පාලමුනෙ ප්‍රදේශයේදී දින 3 ක පුහුණුවක් ලබාදී ඇති බවටද සාක්ෂි තිබේ. ඉල්හාම්ගේ බිරිඳ වන ෆාතිමා මොහොමඩ් ජිෆ්රි විසින් ඔවුනට කරාටේ පුහුණුවද ලබා දී ඇත.

පුහුණු කඳවුරු පැවැත්වීමට අමතරව සහරාන් විසින් ඔහුට හා සිය කණ්ඩායම් සභයින් හට ආරක්ෂක අංශවලින් වසන්ව සිටීම සඳහා ආරක්ෂිත නිවස්න කිහිපයක්ම සූදානම් කොට ගෙන සිටි බවද අනාවරණය වී ඇත.

මේ අතරින් ප්‍රධාන නිවස්නයක් පිහිටා තිබුණේ පානදුර, පරත්ත පාරේ, ෂෙරීෆ් මාවතේ අංක 61/02 දරණ ස්ථානයේ නස්මියා විලා නැමැති ලිපිනයේය. බෝම්බ සාදන්නට ඇත්තේ මෙම ස්ථානයේ විය හැකි බව පෙනී යයි. කොළඹ නගරයේ හෝටල් ඉලක්ක කොටගෙන ප්‍රහාර එල්ල කිරීම සඳහා මරාගෙන මැරෙන බෝම්බකරුවන් පුපුරණ ද්‍රව්‍ය ඇතුළත් ගමන් මලුද රැගෙන අදාළ හෝටල් වෙත

පිටත්ව ගොස් ඇත්තේ ද මෙම ස්ථානයේ සිට බව හෙළිදරව් වී තිබේ. මෙම නිවසින් සොයා ගත් ද්‍රව්‍ය අතර විදුලි පරිපථ සටහනක්ද වේ.

තවත් ආරක්ෂක නිවස්නයක් දළුවාකොටුව, ජනපද මාවතේ අංක 546/7/1 යන ලිපිනයේද පිහිටා තිබුණි. එය කුළියට ගෙන තිබුණේ අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි නැමැත්තා විසින් සහරාන්ගේ උපදෙස් මතය. සාෆි සහ සහරාන් අතර සම්බන්ධය කාත්තන්කුඩියේ ක්‍රියාත්මක වූ දාරුල් අධා අද්දයියා පැවැති කාලය තරම් ඈත කාලයකට දිවේ. ඔහු සහරාන්ගේ රියදුරා ලෙසද එකල කටයුතු කර ඇත. වර්ෂ 2017 නොවැම්බර් මස මැදවච්චිය, රබෑව ප්‍රදේශයේ පවත්වන ලද පළමු පුහුණු කඳවුර සංවිධානය කොට ඇත්තේ ද මොහුගේ නිවසේය. මාවනැල්ල සිදුවීමෙන් අනතුරුව සැඟවී සිටි සාදික් සහ ඔහුගේ පවුලේ අයටත්, ඔහුගේ සොහොයුරු ෂහීඩ්ටත් රැකවරණය සැලසීම සඳහා මෙම නිවස්නය යොදා ගන්නා ලදි. මෙම නිවැසියන් වනාතවිල්ලුව ප්‍රදේශයෙන් ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය තොගයක් හමුවීමත් සමඟම ඉක්මණින් එම ස්ථානයෙන් ඉවත් වූහ.

කටුවාපිටිය, උලුඅම්බලමේ අංක 394/A/21, දොන් ඩේවිඩ් මාවත යන ලිපිනයේ පිහිටි ආරක්ෂක නිවස්නයේ සිට කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය ඉලක්ක කර ගත් ප්‍රහාරය සඳහා හස්තුන් පිටව ගොස් ඇති බව අනාවරණය විය. වර්ෂ 2019 ජනවාරි මස 26 වෙනි දින මෙම නිවස කුළී පදනම මත ලබා දීම සඳහා ikman. Lk වෙබ් අඩවියේ දැන්වීමක් පළ කොට තිබූ අතර, එම නිවස කුළියට ගැනීම සඳහා එම වසරේ පෙබරවාරි මස 4 වෙනි දින බදු ගිවිසුමක් මුබාරක් නැමැත්තෙකු විසින් අත්සන් කොට තිබේ. වර්ෂ 2019 පෙබරවාරි මස 16 වෙනි දින සිට මෙම ආරක්ෂක නිවස්නයෙහි පුද්ගලයින් පදිංචිව සිට තිබේ.

තවත් ආරක්ෂක නිවස්නයන් කිහිපයක් නින්දවූර්, සම්මන්තුරෙයි, සහින්දමර්දු, ගල්කිස්ස ස්පෑන් ටවර්ස්, වැල්ලවත්ත ස්පෑන් ටවර්ස්, මල්වාන, එඬේරමුල්ල, කොල්ලුපිටිය, තිරියාය, වාලච්චේනෙයි, කටුපොත, කුළියාපිටිය සහ

හෙට්ටිපොළ යන ප්‍රදේශවලද පවත්වාගෙන ගොස් තිබේ. මෙම ආරක්ෂක නිවස්න පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

1. අංක **5/5,41** ස්පැන් ටවර්ස්, ගල්කිස්ස.
2. අංක **9/3, 41** ස්පැන් ටවර්ස්, ගල්කිස්ස.
3. අංක **68/5/2, 70** ලකී ප්ලාසා, ශාන්ත අන්තෝනි පාර, කොළඹ 3.
4. අංක **546/7/1,** ජනපද මාවත, දළුවාකොටුව, කොච්චිකඩේ.
5. අංක **394,** රිදීවැලි පාර, කොච්චිකඩේ.
6. අංක **53,** නස්මියා විලා, පරත්ත පාර, පානදුර.
7. අංක **48, 2** වන හරස් පාර, නින්දවූර් 7 වන අදියර.
8. අංක **185,** ජලල්දීන් පාර, අඩ්ඩාලච්චේනෙයි.
9. අංක **183, 3** වන හරස් වීදිය, සහින්දමර්දූ.

මෙම පුහුණු කඳවුරු පිළිබඳ සාක්ෂි විමර්ශන කොමිසම ඉදිරිපිට විභාග කරන ලද සාක්ෂිවලට අන්තර්ගත වන අතර, ඒවා ලබා ගෙන ඇත්තේ වාචික සහ ලිඛිත සාක්ෂි මත පදනම්ව විමර්ශන නිලධාරීන්ගේ හා බුද්ධි අංශ සාක්ෂි ප්‍රකාශයන්ද ඇතුළත් වන පරිදිය.

## 11 වන පරිච්ඡේදය

## ප්‍රහාර සඳහා සූදානම

වර්ෂ 2019 මාර්තු මස 25 වන දින දැනට අත්අඩංගුවේ පසුවන සමීර්ව හමුවූ මුවාත් සහරාන් සහ නවුෆර් අතර උද්ගතවී ඇති ගැටුම් සහගත තත්ත්වයක් පිළිබඳ දැනුම්දී ඒ පිළිබඳ සාකච්ඡා කිරීම අවශ්‍ය බව පැවැසීය. ඉන් දින දෙකකට පසු වර්ෂ 2019 මාර්තු මස 27 වන දින දැනට අත්අඩංගුවේ පසුවන සමීර් සහ තවත් දෙදෙනෙකු, මුවාත් සහ ජමීල් හමුවී පානදූර පරත්ත පාරේ, ෂෙරිප් මාවතේ, අංක 61 /02 දරණ ලිපිනයේ පිහිටි නෂ්මියාවිලා වෙත ගියහ. ඔවුන් එහි පැමිණෙන විට සහරාන් සහ හස්තූන් යන අය එහි සිටියහ.

කලින් සිදුවූ සිදුවීම් කීපයක් පිළිබඳ විස්තර කරමින් සහරාන් විසින් සාකච්ඡාව ආරම්භ කරන ලදී. සූරා සභාව නම් වූ තීරණ ගැනීමේ පරිපාලන ව්‍යුහයක් මෙම කණ්ඩායම තුළ පැවතිණි. මෙම සභාවේ සමාජිකයින් 13 දෙනෙක් පමණ සිටියහ. ඒ අතර සහරාන් සහ නවුෆර්ද වූහ. මෙම සභාවේ රැස්වීමකදී සහරාන්ගේ වැරදි 19 ක් පමණ මිල්හාන් විසින් ඉස්මතු කොට ඇති අතර එම වැරදි හේතුවෙන් සහරාන් වෙනුවට නවුෆර් කණ්ඩායම් නායකත්වයට වඩාත් සුදුසු බව පවසා ඇත. මෙම රැස්වීම අතරතුර ඔවුන් සතුවූ ආයුධ සමසේ බෙදා ගනිමින් කණ්ඩායම් දෙකකට බෙදීම සඳහා යෝජනා වූ අතර එම කණ්ඩායම් දෙක පිළිබඳව ආරක්ෂක අංශවලට හෙළිදරව් කිරීමෙන් වැළැක්වීමටද යෝජනා ඉදිරිපත් විය. කෙසේ වුවද මෙම යෝජනාවට එරෙහිවූ ඉල්හාම් පවසා ඇත්තේ තමා කණ්ඩායමට අරමුදල් සපයන ලද්දේ සහරාන් කෙරෙහි වන ගෞරවය නිසා බවත් අවශ්‍ය නම් එක් නිවසක්, එක් වාහනයක්, සහ එක් ආයුධයක් නවුෆර් වෙත ලබාදිය හැකි බවයි.

මීට කලින් සිදුවූවා යැයි පැවසෙන සිදුවීම් පිළිබඳ විස්තර කළ සහරාන්, නවසීලන්තයේ ක්‍රයිස්ට් චර්චහි ඉස්ලාම් දේවස්ථානයකදී මුස්ලිම්වරුන් ඝාතනය කිරීමේ ක්‍රියාවට සහ සිරියාවේ අයි.එස් සංවිධානයට එරෙහිව එල්ලවන ප්‍රහාරවලට

පළිගැනීමක් ලෙස මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කළ යුතු බව එහි සිටි අයට දැනුම් දී තිබේ.

තවදුරටත් විස්තර කරමින් සහරාන් පවසා ඇත්තේ රිල්වාන් විසින් බෝම්බ සාදනු ඇති බවත් ඒවාට යොදා ගන්නා පුපුරන ද්‍රව්‍ය දින 15 කින් කල් ඉකුත් වන බැවින් එම කාලසීමාවෙන් පසුව ඒවා නිවැරදි ලෙස ක්‍රියාත්මකවේද යන්න අවිශ්වාස නිසා බෝම්බ සාදා දින 15 ක් ඉකුත්වීමට පෙර ප්‍රහාරයක් දියත් කළ යුතු බවයි. හස්තුන් රිල්වාන් සහ ඉල්හාම් යන අය බෝම්බ සෑදීම සඳහා අවශ්‍ය දැනුම අන්තර් ජාලය ඔස්සේ ලබාගෙන ඇත.

එබැවින් ඔහු යෝජනා කොට ඇත්තේ විදේශිකයන් නිතර ගැවසෙන හෝටල් කැසිනෝ සමාජශාලා සහ කතෝලික දේවස්ථාන ඉලක්ක කොට ගෙන මෙම ප්‍රහාරය එල්ල කළ යුතු බවයි. එහිදී ඔහු මීගමුව ප්‍රදේශය පිළිබඳව විශේෂයෙන් සඳහන් කොට ඇති අතර එහිදී මුවාත් පවසා ඇත්තේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තම නිවසට ආසන්නව පිහිටා ඇති බැවින් තමන් විසින් එල්ල කරන මරාගෙන මැරෙන බෝම්බ පුපුරවා හැරීමේ ප්‍රහාරය සඳහා එම ස්ථානය ඉලක්ක කොටගත හැකි බවයි. එහිදී යෝජනා වී ඇත්තේ ප්‍රහාරය සඳහා විසිදෙනෙකු පමණ යොදා ගත යුතු බවයි.

ෂැංග්‍රිලා හෝටලය වෙත බෝම්බකරුවන් දෙදෙනෙකු යෙදවීම සහ ප්‍රහාර එල්ල වූ සෙසු ස්ථාන වෙත එක් බෝම්බකරුවෙකු බැගින් පමණක් යොමු කිරීම පසු පස ඇති හේතු පිළිබඳ යම් අනුමානයන් ඇති වී තිබේ. මේ සඳහා හේතු දෙකකි.

ඉන් එක් හේතුවක් වන්නේ, බොහෝ දෙනා කණ්ඩායමට එක්වූවද, සමහරවිට සැලසුම් කළ පරිදි අවශ්‍ය වූ ප්‍රමාණයට බෝම්බකරුවන් සම්බන්ධකර ගැනීම සඳහා සහරාන්ට හැකියාව නොලැබීම වේ.

දෙවනුව සහරාන් විසින් යෝජනා කොට ඇත්තේ ප්‍රහාර මාලාව අදියර තුනකින් දියත් කළ යුතු බවයි. පළමු පිපුරුමෙන් පසු එහි සිට පලා යන පුද්ගලයින්ව

තවත් දෙවන පෙළ ප්‍රහාරයකින් ඉලක්ක විය යුතු බව සඳහන් වී ඇත. ෂැංග්‍රිලා හෝටලයේ සහරාන් විසින් පළමු පුපුරවා ගැනීම සිදුකිරීමෙන් පසු බේරීම සඳහා පලායමින් සිටි පිරිස ඉලක්ක කරගනිමින් ඉල්හාම් විසින් දෙවන මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එල්ල කිරීම මෙම අනාවරණයට සාක්ෂි සපයයි. මෙම දෙවන ප්‍රහාරය ඉවවැටීම නිසා කුඩා දරුවන් ඇතුළු පලායමින් සිටි පිරිසගේ ජීවිත බියමුසු කැගැසීම් එම ස්ථානයේ සවිකර තිබූ සී.සී.ටී.වී කැමරා දර්ශන තුළින් නරඹන විට එය වඩාත් පැහැදිලිවේ.

මෙම උපක්‍රමය භාවිතය පිළිබඳ සැලැස්ම සම්බන්ධයෙන් තවත් නිදසුනක් වන්නේ කොච්චිකඩේ දේවස්ථානය අසළ පිපිරීමක් සිදු කිරීමේ අරමුණින් විරාමසයිකාවක් සමඟ පුපුරණ උපකරණ අටවන ලද ගෑස් සිලින්ඩර් සහිත වෑන් රථයක්ද නවතා තිබීමයි. එම ඇටවුම නියමිත පරිදි පිපිරීම විරාමසයිකාව දෝෂ සහිත වීම හේතුවෙන් සිදුවීම වැළකුණද එම පිපිරීමේද ඉලක්කය විය හැක්කේ එසේ බේරීමට පළා යන ජනතාවයි. මෙම ප්‍රහාරයේ තුන්වන අදියර තවත් පිපුරුම් මාලාවක් ලෙස ක්‍රියාත්මක වීමට නියමිතව තිබෙන්නට ඇත්තේ මුල් ප්‍රහාරවලින් තුවාල ලැබූවන් රෝහල් වෙත ප්‍රවාහනය කරන අවස්ථාවේදීය.

අදාළ රැස්වීමේදී ප්‍රහාර එල්ල කිරීමට නියමිත දිනය පිළිබඳ සහරාන් සාකච්ඡා නොකළ අතර ප්‍රහාරය සිදු වීමට දින තුනකට පෙර ඒ පිළිබඳ අදාළ රැස්වීමට සහභාගිවූ අයව දැනුවත් කරන බව ඔහු පවසා සිටියේය. පසු කාලීනව ප්‍රහාරයක් එල්ල කිරීමේ අරමුණින් නුවරඑළිය ප්‍රදේශයේ විදේශිකයන් නිතර ගැවසෙන ස්ථාන පිළිබඳව නිරීක්ෂණයක් සිදුවී ඇති බවද සාක්ෂිවලින් අනාවරණයවේ.

සහරාන් ප්‍රහාරවලින් මියගිය බැවින්, සැබවින්ම කණ්ඩායමේ නායකයා ඔහුද යන්න පිළිබඳ බොහෝ මත පළවී ඇත. මෙම රැස්වීම සඳහා සහභාගීවූ අයට සහරාන් පවසා ඇත්තේ බංගලාදේශයේ අයි.එස් සංවිධානයේ කණ්ඩායමේ නායකයා සිදු කළ පරිදිම තමන්ද මරාගෙන මැරෙන ප්‍රහාර සඳහා සහභාගිවී මිය යන බවයි.

සහරාන් මෙහිදි බොහෝ විට සඳහන් කොට ඇත්තේ අබු ඊබ්‍රහිම් අල්-හනීෆ් ලෙස ඔහුගේ කූනාෆාව හෙවත් කණ්ඩායම විසින් හඳුන්වාගත් තමින් අහමඩ් වචූද්‍රි නමැති බංගලාදේශ ඉස්ලාම් රාජ්‍යයේ එමීර්වරයා පිළිබඳවයි.

වර්ෂ 2016 ජූලි මසයේ ගුල්ෂන් කැෆේ අවන්හල ඉලක්ක කොට එල්ල කරන ලද ඩකා ප්‍රහාරයේ මහමොළකරු ඔහු වන අතර එම ප්‍රහාරයේ විසිනමදෙනෙකු හට ජීවිත අහිමිවිය. මෙම ප්‍රහාරයේදී තමීන් සැබවින්ම මරණයට පත් නොවූවත් සහරාන් එහිදී ඔහු මිය ගිය බවට සාවද්‍ය මතයක එල්ඹව සිටියේය. නමුත් වර්ෂ 2019 මාර්තු මස 27 වන දින පානදූර පරත්ත පාරේ,ෂෙරිප් මාවතේ, අංක 61 /02 දරණ නෂ්මියාවිලාහි සාකච්ඡාවට ලක් වූ කරුණු පිළිබඳ සාක්ෂි විමසීමේදී ඉහත කරුණ පිළිබඳව සැකයක් ඇතිකර ගැනීමට හේතුවක් විමර්ශන කොමිෂන් සභාවට නැත.

මෙම රැස්වීම අවසන් වූයේ එහිදි සාකච්ඡා වූ කිසිවක් කිසිවෙකු හට අනාවරණය කළහොත් වවුනතිව්හිදි ඝාතනයට ලක් වූ පොලිස් නිලධාරින් දෙදෙනා හටද, අමාත්‍ය කබීර් හෂීම්ගේ සම්බන්ධිකරණ ලේකම් ලෙස කටයුතු කරමින් වනාතවිල්ලුවෙන් හමුවූ ආයුධ තොගය සොයා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහය දැක්වූ බවට සැක කිරීම හේතුවෙන් හිසට වෙඩි ප්‍රහාරයක් එල්ල වූ තස්ලිම් නැමැත්තාට ද අත්වූ ඉරණමටම එවැන්නන් ගොදුරුවන බවට සහරාන් විසින් අනතුරු ඇඟවීමෙන් පසුවය.

සහරාන් සහ නවුෆර් අතර ගැටුමක් ඇතිවීම නිසා කණ්ඩායම් තුළ ඇතිවූ බෙදීම පිළිබඳ අනාවරණය සැබැවින්ම සත්‍ය කාරණයක් ද, එසේත් නැතිනම් මෙම සිද්ධිය පිළිබඳ විමර්ශනය කරන නිලධාරීන් නොමඟ යැවීම සඳහා ගොතන ලද කථාවක්ද යන්න විමර්ශන නිලධාරීන් විසින් සම්පූර්ණයෙන් විමසා බැලිය යුතු කරුණකි. මේ පිළිබඳ කිසිදු ස්ථාවරයක් විමර්ශන කොමිසම විසින් සිදු නොකරේ.

කෙසේ නමුත් වර්ෂ 2019 මාර්තු මස 27 වන දින සහරාන් විසින් කියන ලද බවට සැලකෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ කාරණය ඒ හා සම්බන්ධ සිදුවීම්වල සැබෑ පිළිබිඹුවක් ලෙස විමර්ශන කොමිසම විසින් අධීක්ෂණය කරනු ලබන්නේ ඊට පෙර සිදුවූ සිදුවීම් කීපයක්ද සැලකිල්ලට ගනිමිනි.

අලියාර් මංසන්ධියේ සිදුවීමෙන් අනතුරුව කාත්තන්කුඩියෙන් පලාගිය පසු සහරාන් විසින් තම බිරිඳ සහ දරුවන් ප්‍රධාන වශයෙන් රඳවා තැබුවේ කැකුණගොල්ල ප්‍රදේශයේ සහ කාත්තන්කුඩියේ විසූ සිය දෙමාපියන් භාරයේ වන අතර ඒ මුළු කාලය තුළම ඔහු නිරතුරුවම ආරක්ෂක අංශ වෙතින් වසන් වෙමින් පළවි, ඔලුවිල්, පුත්තලම, මාවනැල්ල, අම්පාර සහ මල්වාන වැනි ප්‍රදේශවල සැබවී මිතුරන් සහ ආධාරකරුවන් සමඟ ගත කළේය. කලින් කලට ඔහු විසින් සිය දරුවන් සහ බිරිඳ බැලීමට රාත්‍රී කාලයේදී කැකුණගොල්ල හා කාත්තන්කුඩි ප්‍රදේවල ගොස් ඇති අතර එසේ ගිය එක් ගමනකදී දළ වශයෙන් දින දෙකක පමණ කාලයක් එහි රැඳී සිට ඇත. සාරාද ඔවුන් සමඟ එම ස්ථානවල නැවතී සිට තිබේ.

වර්ෂ 2018 මුල් භාගයේදී ත්‍රස්ත විමර්ශන නිලධාරියෙකු කැකුණගොල්ල ප්‍රදේශය වෙත පැමිණ සහරාන් පිළිබඳ විමසා තිබේ. ඉන් අනතුරුව ඒ සම්බන්ධයෙන් කිසිවක් සිදුවී නොමැති බව පෙනී යයි. කෙසේ වුවත් වර්ෂ 2019 පෙබරවාරි මස 19 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හයදෙනෙකු පමණ කැකුණගොල්ල වෙත පැමිණන තිබේ. හදියාගේ සහෝදරයා වන අන්සාර් ඔවුන් සමඟ විය. වනාතවිල්ලුවෙන් සොයාගත් පුපුරන ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඔහුව විමර්ශන කටයුතු සඳහා අත්අඩංගුවට ගෙන තිබිණි. එහිදී විමර්ශන නිලධාරීන් විසින් අදාළ පුපුරන ද්‍රව්‍ය එම ස්ථානය වෙත ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගත් වෑන් රථය සමඟ ඔහුගේ තිබූ සම්බන්ධතාවය අනාවරණය කොටගෙන තිබිණි. ඔවුන් හාදියාගෙන් ප්‍රශ්න කොට ප්‍රකාශයක් ලබාගෙන තිබුණි.

මෙම තත්ත්වය පිළිබඳ දැනගත් පසුව සහරාන් විසින් ඔහුගේ පවුලේ අය සහ සාරාව කැකුණගොල්ල ප්‍රදේශයෙන් ඉවත් කිරීමට පියවර ගත් අතර එම කාර්ය සඳහා හස්තුන්, ඉල්හාම්, රිශ්ඛාන් සහ තවත් කීපදෙනෙක් සම්බන්ධ වූහ. එම ගමන අතර මගදී හාදියා විසින් පාවිච්චි කල දුරකථනය විනාශ කල අතර එහි එම් අංකය ඉවත් කිරීමෙන් පසුව එය බැහැර වන ලදි ඉල්හාම් විසින් අතර මගදී මෙම කණ්ඩායම සිය මෝටර් රථයේ නන්වාගෙන ගමන් කොට ඇත.

යළිත් වරක් වර්ෂ **2019** පෙබරවාරි **28** වන දින ත්‍රස්ත විමර්ශන අංශයේ නිලධාරීන් හත්දෙනෙක් සහරාන්ව සොයා කැකුණගොල්ල වෙත ගොස් තිබේ. වර්ෂ **2018** ජූලි **09** වන දින වනවිට නඩු අංක B **92358/8/18** දරණ නඩුවට අදාළව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ත්‍රස්ත විමර්ශන අංශය විසින් සහරාන්ට එරෙහිව විවෘත වරෙන්තුවක් ලබාගෙන තිබිණි. එහිදි සහරාන්ගේ විවාහයෙන් ඥාති සහෝදරයෙකු වන පුද්ගලයෙක් ඔවුන්ට හමුවූ අතර ඔහුගෙන් තොරතුරු විමසීමක් ආරම්භ කරන අවස්ථාවේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ සාජන් ඩයස්ගෙන් ලැබුණු ඇමතුමකින් ඔවුනට දන්වනු ලැබුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද ඒ වනවිටත් ඔහු පිළිබඳව විමර්ශනයන් අරඹා තිබුණු බැවින් එම පරීක්ෂණ කටයුතුවලින් ඉවත් වන ලෙසයි. ත්‍රස්ත විමර්ශන අංශයේ සහකාර පොලිස් අධිකාරිවරයෙකුට සහ එවකට වැඩ බලන අධ්‍යක්ෂවරයාට මේ පිළිබඳ දැනුම් දීමෙන් අනතුරුව අදාළ නිලධාරීන් එම විමර්ශනයෙන් ඉවත් වූහ.

**2019** වර්ෂයේ මාර්තු මස මුල් භාගයේදී රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණු තොරතුරු අනුව අයි.එස් සංවිධානයේ ප්‍රහාර මාදිලියට සමාන ආකාරයේ ප්‍රහාරයක් ශ්‍රී ලංකාවේදී දියත් කිරීම සඳහා මඩකලපුව, අම්පාර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තරුණයින්ව රිල්වාන් විසින් පොළඹවමින් සිටින බවට සැලවිය. වර්ෂ **2019** මාර්තු මාසය තුළ රිල්වාන් විසින් කිලෝ **35** ක් බරැති නයිට්‍රික් අම්ලය අඩංගු බැරල් **08** ක් කාත්තන්කුඩියෙන් මිලදී ගෙන තිබුණි.

වර්ෂ 2019 මාර්තු 06 වන දින 'කාෆිර්වරුන්ගේ රුධිරය සහ ආර්ථිකය' නමැති සිරස්තලය සහිතව සහරාන් විසින් ඔහුගේ මුහුණු පොත් පිටුවෙහි වීඩියෝවක් ඉදිරිපත් කරමින් ඔහුගේ අධාරකරුවන්හට දන්වා සිටියේ ඉස්ලාමයේ ශුද්ධ වූ මාස අවසන්වූ පසු හැකි තරම් මුස්ලිම් නොවන අය ඝාතනය කරන ලෙසයි. ඔහු තවදුරටත් විස්තර කර සිටියේ කුරානයේ සූරා අංක 9:5 අනුව යහපත් කටයුතුවල යෙදිය යුත්තේ ඉස්ලාමයේ මාස ක්‍රමයට අනුව 01,07, 11 වන හා 12 වන මාසවල පමණක් වන බවත් සෙසු මාසවලදී මුස්ලිම් නොවන ජනතාව දුටුතැන මරාදැමිය යුතු බවත් ඉස්ලාම් දහම වැළඳ ගන්නා අන්‍ය ලබ්දිකයන්ට පමණක් ඔවුන්ගේ ගමන ඉදිරියට යාමට ඉඩසැලසිය යුතු බවයි. තවදුරටත් ඔහු පවසා සිටියේ කුරානයේ ඉගැන්වීම් අකුරටම අනුගමනය කරන මුස්ලිම්වරුන් ශුද්ධවූ මාස ලෙස නොසැලකෙන කාලයන්හි මුස්ලිම් නොවන අය ඝාතනය ඔවුන්ගේ දේපල අත්පත් කර ගැනීම සිදු කරන බවයි. අවසානයේදී ඔහු සඳහන් කොට සිටියේ හොඳම විකල්පය වන්නේ කලීෆ්වරයෙකුගේ නායකත්වය යටතේ ඉස්ලාම් රාජ්‍යයක් බිහිකිරීම බවයි.

වර්ෂ 2019 මාර්තු මස 07 වන දින රාජ්‍ය බුද්ධි අංශ මෙහෙයුම් ක්‍රියාකාරිකයන් විසින් අපරාධ පරීක්ෂණ දෙපාරත්මේන්තුවේ නිලධාරින් හට ආමි මොහිදීන් සහ රිල්වාන් යන අය සැඟව සිටින ස්ථාන පෙන්වූ අතර ෂයිනි ජීවත් වූ ස්ථානයද ඔහුන් හට අනාවරණය කළෝය. අපරාධ පරීක්ෂණ නිලධාරින් ආමි මොහිදීන් සමඟ සම්බන්ධතා පැවැත්වීම ආරම්භ කළ අතර ඔහුට එරෙහිව වරෙන්තුවක් ඇති බව ඔවුන් දැන සිටියද ඔහුව අත් අඩංගුවට නොගෙන ඒ වෙනුවට සහරාන් පිළිබඳ තොරතුරු සපයන්නෙකු ලෙස ඔහු භාවිතා කිරීමට ක්‍රියා කළෝය.

මෙහිදී ආමි මොහිදීන්හට එක් විමර්ශන නිලධාරියෙකුගේ දුරකථන අංකයක් පවා ලබාදී තිබේ. ආමි මොහිදීන් විසින් මෙම තොරතුරු සහරාන් වෙත දැනුම්දී තිබීමට ඉඩ ඇත. මේ සියලු සිද්ධීන් විසින් ඇති කළ සමස්ථ බලපෑම හේතුවෙන් තමා වෙත විමර්ශන නිලධාරීන් වඩාත් ඉක්මනින් සමීපවන බව සහරාන් හට හැඟුණා විය හැක. සාදික් විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂිවලට අනුව මරාගෙන මැරෙන ප්‍රහාරයක් සඳහා වන තම සැලසුම දියත්

කිරීම සහරාන් විසින් කඩිනම්කොට ඇත්තේ වනාතවිල්ලුවෙන් පුපුරන ද්‍රව්‍ය සොයාගැනීමේ සිද්ධියෙන් අනතුරුවයි.

පාස්කු ඉරිදා දින එල්ල වූ ප්‍රහාරය සඳහා හේතු පාදක වූ ජාත්‍යන්තර මට්ටමේ සිදුවීම්ද පැවති බව විමර්ශන කොමිසමේ අවධානයට ලක් වී ඇත.

මාස 06 ට අධික නිහඬතාවයකින් පසුව වර්ෂ 2019 මාර්තු මස 16 වෙනිදා පමණ අබු හසාන් අල් - මුහජිර් නමැති අයි.එස් සංවිධානයේ ප්‍රකාශකයා ශ්‍රව්‍ය පටිගත කිරීමක් මුදාහැර තිබූ අතර එහි සඳහන් වූවේ නවසීලන්තයේ ඉස්ලාම් දේවස්ථානයකට එල්ල වූ ප්‍රහාර සඳහා ප්‍රතිප්‍රහාර එල්ල කිරීම අවශ්‍ය බවත් නවසීලන්තයේ ක්‍රයිස්ට් චර්ච් හි ඉස්ලාම් දේවස්ථාන දෙකක යාඥාවේ යෙදී සිටි මුස්ලිම් බැතිමතුන් හතලිස් නවදෙනෙකුට මරු කැඳවීමට වර්ෂ 2019 මාර්තු මස 15 වෙනි දින සුදුජාතික ජාතිවාදී අන්තවාදියෙකු විසින් එල්ල කරන ලද ප්‍රහාරය සමත් විය. ඉහත සඳහන් ශ්‍රව්‍ය පටිගත කිරීමේදී පැවසුනේ මුස්ලිම් දේවස්ථාන දෙකක සිදුවූ සමූල ඝාතනයේ දර්ශන දැකීමෙන් එතෙක් මුලාවට පත්වී සිටි අය ඒ මුලාවෙන් අවදි විය යුතු බවත් කලීෆතයේ (ඉස්ලාම් රාජ්‍යයේ) අධාරකරුවන් හට ඔවුන්ගේ ආගමේ නාමයෙන් පළිගැනීමට අනුබල දිය යුතු බවත්ය. අල්කයිඩා සංවිධානය හා සම්බන්ධ කණ්ඩායම්ද මෙම ප්‍රහාරයේ පටිගත කරන ලද දර්ශන සමාජ මාධ්‍ය වෙත මුදා හරිමින් ඉස්ලාම් දහම නොඅදහන්නන් මරා දැමීම සඳහා මුස්ලිම්වරුන්ට අනුබල දීම දිගින් දිගටම සිදුකළහ. ඉන් එක් පණිවිඩයකින් ඕස්ට්‍රේලියානු සංචාරකයින් ඉලක්ක කොට ගන්නා ලෙස මුස්ලිම්වරුන් දිරිමත් කෙරුණු අතර, ඔවුන් ගලා යන්නට සැලැස් වූ මුස්ලිම් ජනතාවගේ රුධිරයේ පළිය ගැනීම සඳහා කුරුස යුද්ධයේ සෙබලුන් කපා කොටා කැබලි කිරීමට උසිගැන්වූහ. වර්ෂ 2019 අප්‍රේල් මස 20 වන දින සහරාන් විසින් නිකුත් කරන ලද වීඩියෝවේ අන්තර්ගත වන ආකාරයට, ඔහු මෙම සිදුවීම පිළිබඳ විශේෂ සඳහනක් සිදු කරමින් ප්‍රහාරය එල්ල කිරීමට එය ප්‍රධානතම හේතුවක් ලෙස හුවා දැක්විය.

මීළඟ සතිය තුළ නැගෙනහිර සිරියාවේ බගූ ගම්මානය නැමැති IS සංවිධානයේ කලීෆයට පාලනය යටතේ පැවති ප්‍රදේශය තුළද ඔවුන්ගේ බලය හීන වෙමින් පැවති බව පැහැදිලිය. කෙසේ වුවද නිරීක්ෂකයින්ට අනුව IS සංවිධානයේ අනුගාමිකයින් ඒ වන විටත් ලොව පුරා

ජීවත්වන ඉස්ලාමය නොඅදහන්නන් ඝාතනය කිරීමට ප්‍රතිඥා දෙමින් සිටියහ. ඔවුන්ගේ විශ්වාසය වූයේ තරුණ තරුණියන්ගේ හදවත්වල හා මනසෙහි තවදුරටත් ඉස්ලාම් රාජ්‍ය සංකල්පය මුල් බැසගෙන තිබෙන නිසා කුමක් සිදුවුත් එම රාජ්‍ය තවදුරටත් පවතීය යන්නයි. අන්තර් ජාලයට එක්කොට තිබූ IS සංවිධානයේ තවත් හඬ පටයක සඳහන් වූයේ ලොව පුරා තම ආධාරකරුවන් හට පවසා සිටියේ නැගෙනහිර සිරියාවේ සිය අවසන් සටනෙහි සිය ජීවිත පරිත්‍යාගයෙන් නිරතව සිටි සටන්කරුවන් වෙනුවෙන් හැකි සෑම ස්ථානයකම ප්‍රහාර එල්ල කරන ලෙසයි. තවදුරටත් IS සංවිධානය විසින් යුරෝපයේ සහ සෙසු විදෙස් රටවල ඔවුන්ගේ සහෝදරත්වය වෙත අවධාරණය කොට සිටියේ කුරුස යුද්ධයේ සෙබලුන් හට එරෙහිව නැඟී සිටිමින් ආගමේ නාමයෙන් පළිගන්නා ලෙසයි.

වර්ෂ 2019 අප්‍රේල් මස 20 වෙනි දින සහරාන් විසින් නිකුත් කරන ලද වීඩියෝ දර්ශනයේ ඔහු මෙම ප්‍රහාරය දියත් කිරීමට තවත් හේතුවක් ලෙස බගූස් ගම්මානයේ සිදුවන ඝාතන විශාල ප්‍රමාණයද අදාළ වන බව පවසා තිබේ.

වර්ෂ 2019 මාර්තු 23 වන දින ඇමරිකාවේ ආධාර සහිතව සටහන් වැදුනු සිරියානු ප්‍රජාතන්ත්‍රවාදී හමුදාව විසින් IS සංවිධානය යුදමය වශයෙන් පරාජය කළ බව නිවේදනය කළේ නැගෙනහිර සිරියාවේ ඉරාක දේශසීමාව ආසන්නයේ පිහිටි බගූස් ගම්මානය අසළ IS සංවිධානයේ අවසන් මරමස්ථානයද IS සංවිධානයේ ග්‍රහණයෙන් මුදා ගැනීමෙන් අනතුරුවයි. කෙසේ වුවද සිරියානු ප්‍රජාතන්ත්‍රවාදී හමුදාව විසින් අත්කර ගත් යුධමය ජයග්‍රහණය ඒ අයුරින් සිදුවුවත් මේ පිළිබඳ අවධානයෙන් සිටි නිරීක්ෂකයින් වකිතයට පත් වූයේ IS සංවිධානයේ සහ ඒ හා සම්බන්ධ සෙසු සංවිධාන මඟින් එල්ලවන තර්ජනවල නිමාවක් දැකිය නොහැකි වනු ඇති බැවිනි. මක්නිසාදයත් ඊජිප්තුව, ඇෆ්ගනිස්ථානය පිලිපීනය හා ලෝකය පුරා තවත් රටවල් කිහිපයක එම සංවිධාන සක්‍රීයව පවතින බැවිනි.

වර්ෂ 2019 මාර්තු මස 25 හෝ 26 ආසන්න දිනවල හස්තුන් මුබාරක් සහ රිස්බාන් විසින් වාලච්චේනෙහි ඔඩමාවඩි ප්‍රදේශයෙන් යූරියා මිළදී ගෙන ඇත. ඔවුන් පොළොන්නරුවෙන් එම මිළදී ගැනීම සඳහා උත්සාහ කර ඇති නමුත් එම උත්සාහය සාර්ථක වී නොමැත. යූරියා කිලෝ ග්‍රෑම 25 ට අධික ප්‍රමාණයක් මිළදී ගෙන එදිනම

පානදුර පිහිටි ආරක්ෂක නිවස්නය කරා ඒවා ප්‍රවාහනය කොට තිබේ. වර්ෂ 2019 මාර්තු මාසයේදී රිල්වාන් විසින් කිලෝ 35 ක් බරැති නයිට්‍රේට් අම්ලය අඩංගු බැරල් 8 ක් කාත්තන්කුඩියෙන් මිළදී ගත් අතර, සුදු වෑන් රියකින් එය ප්‍රවාහනය කොට තිබේ.

වර්ෂ 2019 අප්‍රේල් මස 11 වෙනි දින ලීටර් 50 ක ධාරිතාවයකින් යුත් ගමන් මලු 10 ක් බත්තරමුල්ල ඩිකැට්ලන් ආයතනයෙන් මිළදී ගෙන තිබේ. ඒවා මිළදී ගෙන තිබුණේ මුබාරක් විසින් වන අතර, ඒවා මිළදී ගැනීම සඳහා ඔහුගේ පාරිභෝගික වරප්‍රසාද අංකය භාවිත කොට තිබුණි. මරාගෙන මැරෙන ප්‍රහාරයේදී භාවිත කර තිබුණේ මෙම ගමන් මලුය.

වර්ෂ 2019 අප්‍රේල් මස 17 වන දින ඉන්ෂාෆ් විසින් සිනමන් ග්‍රෑන්ඩ්, ටාජ් සමුද්‍රා, ෂැංග්‍රිලා සහ කිංස්බරි යන හෝටල් අවට පූර්ව නිරීක්ෂණ චාරිකාවක නිරත වී තිබේ. මෙම පූර්ව නිරීක්ෂණ චාරිකාවේ දෘශ්‍ය නිරූපණයන් පහත දැක්වේ.

DATE : 17TH APRIL 2019




DATE : 17TH APRIL 2019



වර්ෂ 2019 අප්‍රේල් 18 වන දින රුමාන් අම්ජාඩ් නැමැති මුස්ලිම් පුරුෂයින් විසින් පළඳින සාටක වර්ගයකින් සාටක අටක් කොළඹ 14 ග්‍රෑන්ඩ්පාස් පාරේ අංක 176 දරණ ලිපිනයේ පිහිටි නිව් ලුක් අල් හමයින් නැමැති ස්ථානයෙන් හස්තූන් සහ මුබාරක් විසින් මිළදී ගෙන තිබේ. වර්ෂ 2019 අප්‍රේල් මස 19 වන දින බත්තරමුල්ල ඩිකැට්ලන් ආයතනයෙන් රුපියල් 76,650 ක් පමණ වටිනා ආයිත්තම් තොගයක් මිළට ගෙන තිබූ අතර, එම ආයිත්තම් අතර කැප් තොප්පි, කලිසම්, කොට කලිසම්, අව් කණ්නාඩි, පා ආවරණ (මේස්), දිවීමට භාවිතා කරන පාවහන්, ටී ෂර්ට්, ඔරලෝසු ආදිය අඩංගු විය.

වර්ෂ 2019 අප්‍රේල් මස 20 වන දින මරාගෙන මැරෙන බෝම්බකරුවන් අට දෙනා විසින් පැය 13.17 සහ 15.32 අතර කාලය තුළ වීඩියෝ දර්ශන 17 ක් පමණ පටිගත කොට ඇති අතර, එය සිදු කොට ඇත්තේ ගල්කිස්ස පන්සල පාරේ පිහිටි ස්පැන් ටවර් ගොඩනැගිල්ලේදීය. මෙම වීඩියෝ දර්ශන අතර සහරාන්ගේ කතාවක්ද අන්තර්ගත විය. එම කතාවේදී මෙම ප්‍රහාරය එල්ල කිරීමට හේතු 4 ක් සහ එය ශ්‍රී ලංකාවේදී එල්ල කිරීමට හේතු 10 ක් සහරාන් විසින් සඳහන් කර තිබුණි. ඔවුන් සියලු දෙනා ඇඳ සිටියේ කලු පැහැති ඇඳුම් වන අතර, ඉන් දින 2ට පෙර මිළදී ගත් රුමාන් අම්ජාඩ් නැමැති සාටකද පැළඳ සිටියෝය.




මෙම ප්‍රහාරය සඳහා ඔවුන් ඉදිරිපත් කොට තිබූ හේතු **4** වන්නේ

1. අහ්ලාහ් වෙනුවෙන් අහ්ලාහ්ගේ නාමයෙන් ප්‍රේම කිරීම හා අහ්ලාහ්ගේ නාමයෙන් වෛර කිරීම (අභ්-වලා ' ව-ඉල්-බරා')
2. බගූ නැමැති මුස්ලිම්වරුන් වෙත දෙවියන් විසින් ප්‍රදානය කරන ලද ඉස්ලාම් රාජ්‍යයේ මුස්ලිම්වරුන් ඝාතනය සඳහා රටවල් **80** ක සන්ධාන ගතවීමෙන් යුතුව සුදු පොස්පරස් යොදාගෙන තනන ලද බෝම්බ භාවිත කිරීම උදෙසා පළිගැනීමක් ලෙස.
3. නවසීලන්තයේ ක්‍රයිස්ට් චර්ච්හි මුස්ලිම් දේවස්ථාවල යාඥා කරමින් සිටි අහිංසක මුස්ලිම්වරුන් ක්‍රිස්තියානි ලබ්ධිකයෙක් විසින් ඝාතනය කිරීමට පළිගැනීමක් ලෙස. ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව, ඉතාලිය, නෙදර්ලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඊශ්‍රායලය සහ යුරෝපා කළාපයේ රටවල් වැනි කතෝලික රටවල්වල විනෝදය සඳහා මුස්ලිම්වරුන් ඝාතනය, එවැනි ප්‍රහාර දියත් කිරීම සඳහා කණ්ඩායම් පුහුණු කිරීම සහ එවැනි කටයුතුවලට මූල්‍ය ආධාර ලබාදීම. එමෙන්ම ඔවුන් ඉරාකයේ මොසූල් ප්‍රදේශයද, සිරියාවේ රක්බා ප්‍රදේශයද, ලිබියාවේ

සිරිප්ටි ප්‍රදේශයද වනසමින් සිටිති. ක්‍රිස්තියානි දේවස්ථාන වෙත ප්‍රහාර එල්ල කරන්නේ මෙම හේතුව නිසා බව ඔහු පවසයි.

4. හෝටල් ඉලක්ක කිරීමට හේතුව ලෙස ඔහු පවසා තිබුණේ ඉරාකයේ සහ සිරියාවේ මුස්ලිම්වරුන් ඝාතනය කරන, කාන්තාවන් දූෂණය කරන, දේවස්ථාන විනාශ කරන, සහ කුර්ආනය ඉරා විසි කරන රටවල මිනිසුන් සංචාරකයින් ලෙස ශ්‍රී ලංකාවට පැමිණ විනෝදය සඳහා සංචාරය කරන බැවිනි.

මෙම ප්‍රහාරය ශ්‍රී ලංකාවේ දියත් කිරීමට හේතු ලෙස කාරණා 10 ක් සහරාන් ඉදිරිපත් කරයි.

1. අල්ලාහ් දෙවියන්ට නිග්‍රහා කිරීම සහ බැණ වැදීම.
2. කුළියාපිටිය ප්‍රදේශයේ පැවති උද්ඝෝෂණයකදී "අල්ලාහ්" ලෙස සටහන් කරන ලද සූකරයෙකුගේ රූපයක් ප්‍රදර්ශනය කිරීම. ඉස්ලාමයේ හරාම් එනම් තහනම් කරන ලද සත්ව විශේෂයක් ලෙස සූකරයින් සැලකේ.
3. පූජ්‍ය ඥාණසාර හිමියන් විසින් අල්ලාහ් දෙවියන් නැවත ඉපදී ඇති බවට සාවද්‍ය ප්‍රකාශ සිදු කිරීම.
4. තමාට හෝ තමාගේ පවුලටත් වඩා අතිශය භක්ති ආදරයෙන් ගරු කරනු ලබන මොහොමඩ් නබීතුමා හට අපහස කිරීම සහ බැණ වැදීම.
5. තම ජීවිතයටත් වඩා වටිනා ලෙස සලකන කුර්ආනය ඉරා දැමීම හා පිලිස්සීම.
6. මුස්ලිම් දේවස්ථාන විනාශ කිරීම.
7. මුස්ලිම් ජනතාවගේ ආර්ථිකය සහ නිවෙස් විනාශ කිරීම සහ අසත්‍ය චෝදනා ඉදිරිපත් කරමින් ඔවුන්ට අයත් ඉඩම් ආදිය බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම.
8. විමර්ශනයක මුවාවෙන් මුස්ලිම් කාන්තාවක් බුද්ධි අංශ නිලධාරීන් විසින් දූෂණය කිරීම සහ එය සැඟවීමට කටයුතු කිරීම.

9. බටහිර අප්‍රිකාවේ කුරුස යුද්ධයේ හවුල්කාර පාර්ශවයක් බවට ශ්‍රී ලංකාව පත්වීම.
10. ඉස්ලාමය නොඅදහන්නන් දුටු තැන මරා දැමීමට අල්ලාහ් දෙවියන් විසින් දී ඇති නියෝගය.

සහරාන් බේරුවල හා දිගන නගරවල මුස්ලිම් ජනතාව ඉලක්ක කොටගත් සිදුවීම් පිළිබඳවද සඳහන් කරයි.

ඔහු තවදුරටත් සඳහන් කරන්නේ ඔවුන් අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සිය ජීවිත කැප කිරීම නොහොත් ඉස්තිෂාඩ් වතාවතෙහි නිරතවන බවයි. එම අරාබි වචනයේ තේරුම ජීවිත පූජා කිරීම යන්නයි. තම ජීවිතය එසේ පූජා කරන අයෙකුගේ මරණය වීරයෙකු ලෙස මිය යාමක් වන අතර, එවැනි මරාගෙන මැරෙන ප්‍රහාරවලින් ශ්‍රී ලංකාව තුළ IS සංවිධානය වර්ධනය වනු ඇතැයි ඔහු අපේක්ෂා කරයි.

ඔහු තවදුරටත් පැවසුවේ ඉස්ලාම් රාජ්‍යයක මූල බීජය මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ලේ, මස්, ඇට, නහර මඟින් රෝපණ වනු ඇති බවත්, මෙම ප්‍රහාරය ඉන්දියාව ද ජයග්‍රහණය කිරීමට භාවිතා කළ යුතු මෙන්ම ඉන්දියාවේ වෙසෙන මුස්ලිම්වරුද ඔවුන්ගේ එදිරිවාදීන්ට එරෙහිව මෙවැනි ප්‍රහාර දියත් කළ යුතුය.

මෙම වීඩියෝ දර්ශනවලින් එකක කණ්ඩායම විසින් බයියාත් නැමැති දිවුරුමක් ප්‍රකාශයට පත් කරන අතර, එහිදී ඔවුන් IS සංවිධානය කෙරෙහි සහ එහි නායක අබු බකාර් අල් බග්ඩාඩි කෙරෙහි තමා තුළ ඇති ලැදියාව ප්‍රකාශ කරති. සහරාන් විසින් අල් බග්ඩාඩි පිළිබඳ සඳහන් කිරීමේදී ඔහුට අල්-ක්වරේෂි යන නම භාවිතා කරන අතර, ඉන් අදහස් වන්නේ මොහොමඩ් නබිනායකතුමා අයත් වන ගෝත්‍රයටම ඔහුද අයත් වන බැවින්, ඉස්ලාම් රාජ්‍යයේ නායකත්වය හෙබවීමට ඔහු සුදුස්සෙකු බවයි.

ප්‍රහාරයට පෙර සූදානම පිළිබඳ සාක්ෂි විමර්ශන කොමිසම ඉදිරිපිට විභාග කරන ලද සාක්ෂිවලට අන්තර්ගත වන අතර, ඒවා ලබා ගෙන ඇත්තේ වාචික සහ ලිඛිත

සාක්ෂි මත පදනම්ව විමර්ශන නිලධාරීන්ගේ හා බුද්ධි අංශ සාක්ෂි ප්‍රකාශයන්ද ඇතුළත් වන පරිදිය.

12 පරිච්ඡේදය

## මඟහැරුණු අවස්ථා

වර්ෂ 2019 අප්‍රේල් මස 21 වන පාස්කු ඉරිදා දින ප්‍රහාරයට ප්‍රථමයෙන් වඩාත් පරීක්ෂාකාරිව සහ අනතුරක් වළක්වා ගැනීම පිළිබඳ වැඩි අවධානයකින් යුතුව පසුවූවේ නම්, සහරාන් ඇතුළු කණ්ඩායම අත්අඩංගුවට ගැනීමට නීතිය බලාත්මක කරන අංශවලට හැකියාවක් ලැබීමට ඉඩ තිබිණි. කෙසේ වුවත් නීතිය ක්‍රියාත්මක කරන අංශවල සහ සිවිල් වැසියන් දෙදෙනෙකුගේ බරපතල ගණයේ අතපසුවීම් සහ නොසැලකිලිමත් භාවය හේතුවෙන් මෙම කණ්ඩායම නීතියෙන් ගැලවී සිටීමට සමත්විය. පහත දැක්වෙන්නේ ඛේදනීය ජීවිත විනාශයක් සහ දේපල හානියක් වළක්වා ගැනීමට තිබූ අවස්ථා ගිලිහී යාම පිළිබඳ විස්තරාත්මක ඉදිරිපත් කිරීමකි.

### *01. ගරු අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතාගේ කථාව*

වර්ෂ 2016 නොවැම්බර් 18 වන දින පාර්ලිමේන්තුවේදී අයවැය විවාදය අතරතුර සභාව අමතමින් අධිකරණ අමාත්‍ය ගරු විජේදාස රාජපක්ෂ මහතා අයි.එස්. සංවිධානය හා සම්බන්ධ ශ්‍රී ලාංකිකයින් පිළිබඳ අවධාරණය කොට සිටියේය. ශ්‍රී ලාංකික පවුල් හතරකට අයත් තිස් දෙදෙනෙකුගෙන් යුත් පිරිසක් සිරියාව වෙත ගොස් අයි.එස්.සංවිධානය හා සම්බන්ධ වී ඇති අතර ඔවුන් ඉතා හොඳ අධ්‍යාපනයක් ලබා ඇති අය බවද ඔහු සඳහන් කළේය. ඔහු තවදුරටත් සඳහන් කළේ සංචාරක අවසර පත්‍ර ලබාගනිමින් ශ්‍රී ලංකාවට පැමිණෙන විදෙස් රටවල දේශකයන් විසින් බේරුවල කල්එලිය, කල්මුණේ සහ කුරුණෑගල ප්‍රදේශවල දේශනා පවත්වමින්

අන්තවාදය පතුරවන අතර මුස්ලිම් තරුණයන්ගේ මනස ඒ මගින් විකෘති කරන බවයි.

ඔහු විමර්ශන කොමිසම වෙත දන්නවා සිටියේ ඔහු මෙම පියවර ගන්නා ලද්දේ මෙම කරුණ පිළිබඳව විවෘතව සාකච්ඡා කිරීමේ අරමුණින් වන අතර පැවති රජයේ අමාත්‍ය ධූරයක් ඔහු විසින් හෙබවූවද එවකට පැවති රජය විසින් මෙම ගැටළුවට හිමිවිය යුතු ප්‍රමුඛත්වය ඊට ලබා නොදුන් බව ඔහුට හැඟීගොස් ඇත. නිදසුනක් ලෙස ඔහු එසේ සභාව ඇමතීමට මාස තුනකට පමණ පෙර ජනාධිපතිතුමාගේ ඇරයුමින් ඔහු සහභාගිවූ ආරක්ෂක මණ්ඩල රැස්වීමක් පිළිබඳ සඳහන් කළේය. එහිදී රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන විසින් රටේ ආරක්ෂක තත්ත්වය පිළිබඳ ඉතාමත් සතුටුදායක ලෙස නිරූපණය වන ඉදිරිපත් කිරීමක් සිදුකොට ඇත. නමුත් එහිදී ඉස්ලාම් අන්තවාදයේ තර්ජනාත්මක වර්ධනයක් පිළිබඳ කිසිදු සඳහනක් නොවීය. මේ පිළිබඳ අමාත්‍යවරයා විමතියට පත්වූ අතර ඊට හේතුවූවේ වඩා වර්ධනය වන ඉස්ලාම් අන්තවාදය පිළිබඳව ඔහු එවකට හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කල සුරේෂ් සලේ වෙතින් දැනගෙන තිබූ බැවින් මෙහිදි අදාළ වන තවත් කරුණක් වන්නේ එවකට හමුදාපති ලෙස කටයුතු කල ක්‍රිෂාන්ත ද සිල්වා මහතා සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ එවකට හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කල සුරේෂ් සලේ විසින් ශ්‍රී ලංකාවේ ඉස්ලාම් අන්තවාදය පිළිබඳ ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී කථා කල අවස්ථාවන්හිදි එවකට අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කළ රනිල් වික්‍රමසිංහ ඒ පිළිබඳ සතුටු නොවූ අතර ඔහු දැරූ මතය වන්නේ එවැනි තත්ත්වයක් එවකට නොපැවති බවත්

සමහර අවස්ථාවලදී සලේ මහතා විසින් සිදුකළ ඉදිරිපත් කිරීම්වලදී හමුදාපතිවරයාටද මැදිහත් වීමට සිදුවිය.

මෙම කථාව පැවැත්වීම පිළිබඳව රාජපක්ෂ අමාත්‍යවරයාට මුස්ලිම් අමාත්‍යවරුන් කීපදෙනෙකුගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කීපදෙනෙකුගේ මෙන්ම මුස්ලිම් නායකයින්ගේද විවේචනය එල්ලවූ අතර ඊට වසර දෙකකුත් මාස 05 ක් ඉකුත් වූ තැන පාස්කු ප්‍රහාරය දියත් විය. එබැවින් එය පණිවිකරු මරාදැමීම වැනිවූ සිද්ධියක් ලෙස හැඳින්විය හැක.

*02 මහචාර්ය රෝහාන් ගුණරත්න මහතාගේ සම්මුඛ සාකච්ඡාව*

වර්ෂ 2017 නොවැම්බර් මස 27 වන දින සිලෝන් ටුඩේ පුවත්පතේ මහාචාර්ය රෝහාන් ගුණරත්න මහතා සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් පලකොට තිබු අතර එහිදී ඔහු සඳහන් කොට තිබුණේ දකුණු ආසියානු කාලපය තුළ සහ ශ්‍රී ලංකාව තුළ අයි.එස්. ත්‍රස්තවාදී සංවිධානය සක්‍රීයවීම ආරම්භවීම මුල් යුගය දැන් උදාවී ඇති බවයි. එමෙන්ම එම කලාපයේ රාජ්‍යයන් මෙම තර්ජනය සඳහා මන්දගාමී ප්‍රතිචාරයක් දක්වන බවද ඔහු එහි සඳහන් කොට තිබේ. ඔහු තවදුරටත් අනාවරණය කොට ඇති කරුණක් නම් ඇතැම් ශ්‍රී ලාංකික අයි.එස් අධාරකරුවන් නැවතත් අයි.එස් සංවිධානයේ මතවාදයන් සමඟ යළිත් දිවයිනට පැමිණ ඇති බවත් රජය විසින් ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු බවත්ය. ඔහු මෙහිදි අනතුරු ඇඟවීමක් ද සිදුකරන අතර ඉන් අනාවරණය වන්නේ බංගලාදේශය ඉන්දියාව හා මාලදිවයින යන රටවල අයි.එස් සංවිධානයේ ජාල සිය ගණනක් නිර්මාණය වී ඇති අතර රජයේ යහපාලන ප්‍රතිපත්ති

මෙම ප්‍රවණතාවයන් සැළකිල්ලට නොගැනීම හේතුවෙන් ජාතික ආරක්ෂාව සඳහා අවහිරතා එල්ලවී ඇති බවයි.

මෙවැනි විශේෂඥයින් අනතුරු අඟවා තිබියදී ජාතික ආරක්ෂාවට අදාළව අයි.එස් සංවිධානය සහ එහි ආධාරකරුවන් වෙතින් එල්ල වන තර්ජන මැඩලීම සම්බන්ධයෙන් රජය කිසිදු ප්‍රායෝගික පියවරක් නොගැනීම.

*03. ලේවැල්ල, ධර්මාශෝක මාවතේ අංක 177/7/A නැමැති ලිපිනයේ පිහිටි එන්ට්ව බංගලෝ නැමැති ස්ථානයේ පැවැත්වුණු පුහුණු කඳවුර.*

මෙම ස්ථානයේ හිමිකාරිත්වය දරණ ලද්දේ ලේවැල්ල ධර්මාශෝක මාවතේ අංක 147/9 දරණ ස්ථානයෙ පදිංචි නාලිනි මැණිකේ ගුණරත්න නැමැති කාන්තාව වන අතර එහි තානායමක් පවත්වාගෙන ගිය දිනුක නුවන් පෙරේරා යන අයට එම ස්ථානය කුළී පදනම යටතේ ලබාදී තිබුණි. මෙම ස්ථානය වෙන්කර ගැනීම සිදුකොට ඇත්තේ කොමිස් මුදලකට හෝටල් සහ තානායම් වෙන් කිරීමේ කටයුතු සිදුකළ තුෂාන් වීලික්ස් ද සිල්වා යන අයෙකු හරහාය. මුලින්ම තුෂාන් පිලික්ස් ද සිල්වාගෙන් මෙම ස්ථානය කුළියට ගැනීම පිළිබඳ මුලින්ම විමසා ඇත්තේ මීරා සයිබ් මොහොමඩ් නල්ලි නැමැත්තෙකු විසිනි. 25 දෙනෙකුගෙන් පිරිසක් මේ සඳහා සහභාගිවූහ.

එම තනායමේ කළමණකරු වූ දිනුක නුවන් පෙරේරා යන අයට කණ්ඩායම ගැන යම් සැකයක් ඇතිවීමට හේතුවූ කාරණය වන්නේ නිවස තුළ සිදු වන කිසිවක් බාහිර පාර්ශ්වලට දැකිය නොහැකි වනසේ මුළු නිවසේම කවුළු ඇඳරෙදිවලින් ආවරණය කොට තිබීම හේතුවෙනි. එහිදි ඔහු තුෂාන් පිලික්ස් ද

සිල්වා යන අය අමතා පොලිසියට දැනුම්දීමට යෝජනා කළ අවස්ථාවේදී තුෂාන් පිලික්ස් ද සිල්වා විසින් එසේ සිදුකළහොත් ගැනුම්කරුවන් අඩුවීමට ඉඩ ඇතැයි පවසා එය වළක්වා තිබේ. එය වෙනුවට ඔවුන් දෙදෙනාම අදාළ ස්ථානයට ගොස් ඇති නමුත් එහි සිටි කණ්ඩාම විසින් ඔවුන් නිවසට ඇතුළුවීම වළක්වා ඇත. ඒ වෙනුවට ඔවුන් නිවසින් පිටත සිට කථා බහකොට තිබේ. පසුව තමන් හට නිවස තුළ ඇති පාවහන් යුවළක් රැගෙන ඒමට අවශ්‍ය බව පවසමින් ඒ මුවාවෙන් දීනුක නිවසේ පහළ මහලයට යාමට සමත්වී ඇත. ඔහු සමඟ කණ්ඩායමේ එක් සාමාජිකයකුද එහි පැමිණ තිබේ. ඒ මොහොතේ කිසිදු සැක සහිත යමක් දීනුක නිරීක්ෂණය කොට නොතිබිණි. සහරාන් විසින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳ දේශන පැවැත්වූ අතර නවුෆර් විසින් අයි.එස් සංවිධානය පිළිබඳ දේශන පැවැත්විය. මේ සඳහා 25 දෙනෙකුගෙන් පමණ යුතු පිරිසක් සහභාගිවී තිබේ. මෙම පුහුණුවට සහභාගිවූ අය අතර වර්ෂ 2019 අප්‍රේල් මස 21 දිනවල මියගිය අය අතුරින් සහරාන්, හස්තුන්, ජමිල්, රිල්වාන්, මුවාඩ් සහ ෂයිනි වූහ.

### *04 නුවරඑළිය ශාන්තිපුර පැවති පුහුණු කඳවුර*

තක්ෂිලා නිවාඩු නිකේතනය දෙමහල් නිවාඩු නිකේතනයක් වන අතර එය නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ පිහිටා තිබේ. එහි හිමිකරුවන්නේ තක්ෂිලා ඉන්දික කුමාර නැමැත්තෙක් වන අතර එම ස්ථානය පවත්වාගෙන යන්නේ රංග නැමැත්තෙකු විසිනි.

වර්ෂ 2018 අප්‍රේල් 03 වන දින තක්ෂිලා නිවාඩු නිකේතනය වෙත ඩොල්ෆින් වර්ගයේ සුදු වෑන් රථ 04 ක් පැමිණි අතර ඒවායේ විසිදෙනෙකු පමණ පිරිසක් පැමිණියහ. ඔවුන් එහි දින දෙකක් ගතකොට අප්‍රේල් මස 05 වන දින පිටපත්ව ගොස් තිබේ.

වර්ෂ 2018 මැයි මස 05 වන දින යළිත් එම වාහන 04ම තක්ෂිලා නිවාඩු නිකේතනය වෙත පැමිණි අතර මැයි 07 වන දින පමණ වන විට ලා නිල් පැහැති වෑන් රථයක් ද එහි දක්නට ලැබිණි. ඒවා ඩොල්ෆින් සහ ලියිට් ඒස් නමැති මාදිලිවලට අයත් වූ අතර

බඩුබාහිර ගෙනයාම සඳහා පිටත සිටනු දක්නට ලැබුණේ එක් පුද්ගයෙක් පමණි. එහි සිටි සියලු දෙනාම පුරුෂයින් අතර ජිල්බාබ් නැමැති අරාබි ඇඳුමින් ඔවුන් සැරසී සිට ඇත.

අසල්වැසියෙක් වූ තිලකරත්න ඉලේසිංහ නමැති සිවිල් ආරක්ෂක කමිටු සමාජිකත්වයද හිමි පුද්ගලයකුට මෙම කණ්ඩායම පිළිබඳ සැක සිතී ඇති අතර මැයි 08 වන දින මල් නෙලාගැනීම මුවාවෙන් අදාළ නිවසට ඔහු ගොස් ඇත. එහිදී දෙමළ භාෂාවෙන් සිදුකරන ලද සංවාදයක් ඔහුට ශ්‍රවණය වී ඇත. එහි අන්තර්ගතය වී ඇත්තේ ආයුධ සහ කණ්ඩායම විසින් රැගෙන එන ලද මුදල කාත්තන්කුඩිය වෙත ප්‍රවාහන කිරීම පිළිබඳ කාරණයයි.

ඔහු එහිදී **119** අංකයට ඇමතුවද ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර නුවරඑළිය පොලිස් ස්ථානය ද ඇමතීමට උත්සාහ කළ නමුත් කිසිවෙකු සම්බන්ධ කර ගැනීමට නොහැකිවී ඇත. ඊළඟට ඔහු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා විසින් පෙර දිනයක රූපවාහිනී වැඩසටහනකදී තමා අමතන ලෙස ජනතාවට ලබාදී තිබූ දූරකථන අංකයක් ඔස්සේ සම්බන්ධ කොටගෙන ඇති අතර පෙරවරු **8.14** ට පමණ අදාළ ඇමතුම ගෙන තත්පර **85** ක පමණ කාලයක් සංවාදයෙහි යෙදෙන අතර තම ප්‍රදේශයේ සැකකටයුතු පුද්ගලයින් කීපදෙනෙක් ගැවසෙන බව පවසා ඇත. එහිදි පොලිස්පතිවරයා විසින් ඔහුට උපදෙස් ලබාදී ඇත්තේ නුවරඑළිය ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මහින්ද දිසානායක මහතා අමතා මේ පිළිබඳ දන්වන ලෙසයි. එසේ පැවසීමෙන් අනතුරුව අදාළ නිලධාරියාගේ අංකයද ඔහු විසින් ලබාදී ඇත. පෙරවරු **8.16** පමණ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මහින්ද දිසානායක මහතා ඇමතූ තිලකරත්න ඉලේසිංහ තත්පර **57**ක කාලක් තුළ අදාළ සැකකටයුතු පුද්ගලයන් පිළිබඳ දැනුම්දී තිබේ. අවාසනාවන්ත ලෙස ඔහු විසින් ශ්‍රවණය කරන්නට යෙදුණු දෙමළ බසින් ආයුධ සහ මුදල් පිළිබඳ සිදු වූ සංවාද පිළිබඳ පොලිස්පතිතුමාට හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමාට හෝ වෙනත් කිසිදු පොලිස් නිලධාරියෙකු හට සඳහන් කිරීමට ඔහුට අවකාස නොලැබී තිබේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි දිසානායක මහතා ඉලේසිංහ වෙත දැනුම්දී ඇත්තේ සුළු වේලාවකින් නුවරඑළිය පොලීසියෙන් ඔහුට දූරකථන ඇමතුමක් ලැබෙනු ඇති බවත්

එතෙක් නිවසේ රැඳී සිටින ලෙසත්ය. ඉන් විනාඩි 30 ට පමණ පමණ පසු ඔහුට නුවරඑළිය පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරියෙකුගෙන් උදෑසන 8.43 ට පමණ ඇමතුමක් ලැබුණු අතර තත්පර 141 ක කාලයක් පැවති මෙම දූරකථන සංවාදයේදී ඔහු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මහින්ද දිසානායක හට යම් තොරතුරක් ලබා දුන්නේ ද යන්න විමසා ඇති අතර එය තවුරු කර ගැනීමෙන් පසු අදාළ ස්ථානයට පැමිණීම සඳහා මාර්ග විස්තර අදාළ පොලිස් නිලධාරියා විසින් ඔහුගෙන් අසා දැනගෙන තිබේ. කෙසේ වුවත් දිවා කාලයතෙක්ම පොලිස් ස්ථානයෙන් කිසිවෙකු පැමිණ නැත.

ඉන් පසුව නැවතත් පෙරවරු 11.50 ට පමණ ඉලේසිංහ විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඇමතූ අතර පොලිස් ස්ථානයෙන් තවමත් කිසිවෙකු නොපැමිණි බව දන්වා සිටියේය. පස්වරු 4.30 පමණ සුදුපැහැති පොලිස් මෝටර් රථයක් තක්ෂිලා නිවාඩු නිකේතනය වෙත පැමිණ තිබේ. එම පොලිස් නිලධාරීන් කණ්ඩායම සමන් විත වූයේ ප්‍රධාන පොලිස් පරික්ෂක ඉන්ද්‍රජිත් පොලිස් කොස්තාපල් 76735 අංක දරණ බණ්ඩාර පොලිස් කොස්තාපල් 1336 දරණ රත්නායක සහ තවත් හඳුනා නොගත් පොලිස් නිලධාරියෙක් මෙන්ම පොලිස් රියදුරෙකුගෙනි. ඔවුන් එහි පැමිණියේ K.B 3680 අංක තහඩුව දරණ ජංගම පොලිස් රථයෙනි එහිදි මුදලින් ලක්ෂ 10 ක් සහ රත්‍රරන්දමා තිබූ ගමන් මල්ලක් පොලිසියට හමුවිය. එහි සිටි පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කලවිට දැන ගන්නට ලැබුණේ ව්‍යාපාරික කටයුත්තක් සඳහා රත්‍රරන් රැගෙනවිත් තිබූ බවයි.

පොලිස් කොස්තාපල් 76735 අංක දරණ බණ්ඩාරගේ සාක්ෂිය අනුව පොලිස් කණ්ඩායම එහි යන විට පහළ මහලේ 4 දෙනෙකුද උඩු මහලේල 20 දෙනෙකු පමණ සිට ඇත. ඔවුනට එහිදි පවසා ඇත්තේ ඉස්ලාම් ආගම් ප්‍රචාර කටයුතු සඳහා එම කණ්ඩායම එහි පැමිණ සිටි බවයි. ඔවුන් එහි සිටි සියලු දෙනාගේම ජාතික හැඳුනම් පත් පරීක්ෂා කොට නිවසද සෝදිසි කළ නමුත් සැකසහිත කිසිවක් හමු නොවීය.

පොලිස් කණ්ඩායම් මගින් මෙහිදි ඉදිරිපත් කළ සිද්ධි විස්තරය තහවුරු කර ගැනීමට සාක්ෂි නොපැවතිය අතර ඊට හේතුව අදාළ ස්ථානය වෙත ඔවුන් ගමන් කළ බවට කිසිදු සටහනක් යොදා නොතිබිමයි.

ඉලේසිංහ පවසන ආකාරයට පොලිස් නිළ රථය එහි පැමිණීමට මිනිත්තු කීපයකට පෙර එම ස්ථානයෙන් වාහන තුනක් පිටපත්ව ගොස් තිබිණි. ඉන් පසුව එම නිවසේ සිටි පිරිස පස්වරු 7.30 ට පමණ බැහැර වී ඇති අතර ලාකොල පැහැති වෑන් රියක් පමණක් අදාළ ස්ථානයේ නවතා තිබී ඇත. පොලිස් රථය එහි රැඳී සිට ඇත්තේ විනාඩි 15 ක පමණ කාලයක් පමණි. වර්ෂ 2018 මැයි මස දී තක්ෂිලා නිවාඩු නිකේතනය පැමිණි අය අතුරින් සහරාන් සහ නාවුෆර් මවුලවිවරයාව ඉලේසිංහ විසින් හඳුනාගෙන ඇත.

ඉලේසිංහ පවසන පරිදි වර්ෂ 2019 අප්‍රේල් මස 21 වන දින සිදුවූ පාස්කු ප්‍රහාරයෙන් පසු නුවරඑළිය පොලිස් ස්ථානාධිපති ඉන්ද්‍රජිත් ඉලේසිංහ හමුවීමට පැමිණ ඇති අතර මෙම සිද්ධිය පිළිබඳ ප්‍රසිද්ධ නොකරන ලෙසට ඔවුන්ගෙන් ඉල්ලා සිට තිබේ. ඔහු විසින් සහරාන්ගේ ඡායාරූපයක් ඉලේසිංහහට පෙන්වා අදාළ දිනයේ පැමිණි පිරිස අතර ඔහුද සිටියේ දැයි විමසා ඇත. එහිදි ඉලේසිංහ විසින් සහරාන්ව හඳුනාගෙන තිබේ. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්ද්‍රජිත්ගෙන් හමුවී ප්‍රශ්න කිරීමට විමර්ශන කොමිසමට අවස්ථාවක් නොලැබුණු අතර ඊට හේතුව වූවේ විමර්ශන කොමිසමට අනුබද්ධිත පොලිස් ඒකකය විසින් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කොටගෙන සති දෙකක කාලයක් ඇතුළත හෘදයාබාධයක් නිසා ඔහු මියගිය බැවින්.

හාදියාට අනුව පොලීසිය අදාළ ස්ථානයට පැමිණ පිස්තෝලයක් සඟවා තිබූ ගමන් මල්ලක් පවා පරීක්ෂා කල අතර එහිදි ඔවුනට එය හමු නොවීය. T 56 ගිණි අවිය මිල්හාන් විසින් එම ස්ථානයේ පිහිටි ළිඳක සඟවා තිබූ අතර පිස්තෝලය සඟවා තිබී ඇත්තේ රත්රන් බහා තිබූ සහරාන්ගේ ලැප්ටොප් පරිසනක ගමන් මල්ල තුළය. එම ගමන් මල්ල පොලීසිය විසින් පරීක්ෂා කොට ඇති අතර එහිදි රත්රන් භාණ්ඩ පමණක් පිටතට ගෙන පරීක්ෂා කළත් එහිදි පිස්තෝලය සොයා ගැනීමට ඔවුන්ට නොහැකි විය. අදාළ ස්ථානයේ යතුර එම කණ්ඩායම විසින් එදිනම භාරදී නොමැති අතර එය ආපසු ලබාදී ඇත්තේ ටික කලකට පසුවය.

පාස්කු ප්‍රහාරය එල්ලවී ටික කාලකින් පසුව මෙම කාරණා අනාවරණය වීමත් සමඟ අදාළ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ගද ගෙන තිබේ.

මේ සම්බන්ධයෙන් විමර්ශන කොමිසමෙහි නිර්දේශය වන්නේ හෝටල් හිමිකරුවන් සහ නවාතැන් හා තානායම් හිමිකරුවන් වසර තුනක කාලයක් තුළ අදාළ ස්ථානවල ලැගුම් ගන්නා අයගේ සම්පූර්ණ විස්තර තමා සතුව තබා ගැනීම අනිවාර්ය කරන ලද ක්‍රමවේදයක් ඇති කළ යුතු බවයි.

*05 කොළඹ ජාතික රෝහලේදී රිල්වාන් හට ප්‍රතිකාර කිරීම.*

2018 වසරේ අගෝස්තු 27 වන දින අළුයම් කාලයේ රිල්වාන් ජීවිත අවදානමක් සහිත ශාරීරික හානිවලට ලක්විය. මෙය සිදුවූවේ කාත්තන්කුඩියේ පාලමුණේ ප්‍රදේශයේදී පුපුරන ද්‍රව්‍ය සමඟ පරීක්ෂණ සිදුකරන අතරතුරයි. ඒ වන විට සහරාන් සිට ඇත්තේ හම්බන්තොට ප්‍රදේශයේ පවත්වන ලද පුහුණු කඳවුරකයි. එහිදී සහරාන් විසින් සෞදි ආරාබියේ සිටි මොහොමඩ් අලියාර් මසූක් රිලාන් යන අය සම්බන්ධ කොට ගෙන සහය පතා ඇත. එසැනින් වෛද්‍ය මොහමඩ් සූෆියන් මොහොමඩ් සප්‍රාස් හා සම්බන්ධ වී මේ පිළිබඳ වෛද්‍ය උපදෙස් ලබාගෙන තුවාල ලැබූ රිල්වාන්ට ප්‍රතිකාරය කරන ආකාරය පිළිබඳ විමසා ඇති අතර එහිදි සහාරන් විසින් මිල්හාන් ෂයිනි සහ ගපූර් මාමාට උපදෙස් ලබාදී ඇත්තේ මඩකලපුව වෙත යන ලෙසයි. ඔවුන් එහි යන විට රිල්වාන් සිටියේ බරපතළ තත්ත්වයකයි. අසාඩ්ද එහි සිටියේය. මුලින් ඔවුන් උත්සාහ කලේ රිල්වාන්ව මඩකලපුව රෝහල වෙත රැගෙන යාමට වුවත් එසේ නොකරන ලෙස රිල්වාන් ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය.

ලබාදුන් උපදෙස්වලට අනුව රිල්වාන්හට ප්‍රථමාධාර ලබාදී පසුව ප්‍රතිකාර සඳහා කොළඹට ප්‍රවාහනය කළ බව පෙනේ. සහරන් සහ සාදික් වෙනත් වාහනයකින් කොළඹට පැමිණියහ. අසාද් සහ සහරන්ගේ මස්සිනා ඇතුළු තවත් අය විසින් රිල්වාන්ව වෙනත් වාහනයකින් කාත්තන්කුඩි සිට කොළඹට ගෙන එන ලදි.

රිල්වාන් රෝහලට ඇතුළත් කළ අතර රෝගියාගේ නම ලෙස එම්.අයි. ෂහීඩ් යන නම ලබාදී ඇත. ගෑස් සිලින්ඩරයක් පුපුරා යාමෙන් තුවාල සිදුව ඇති බව රෝහල් බලධාරීන්ට දන්වා තිබේ. කෙසේ වෙතත් හදිසි ප්‍රතිකාර ඒකකයේදී රෝගියා පරීක්ෂා කළ

වෛද්‍ය චන්දන රෝගියාගේ තත්ත්වයට හේතුවූ සංසිද්ධිය ලෙස දක්වා තිබූ කරුණු ඉදිරියේ ප්‍රශ්නාර්ථ ලකුණක් සටහන් කල අතර, එම තුවාල ලබා ඇති හේතුව හා විස්තරකොට ඇති සංසිද්ධිය මුළුමනින්ම ගැලපෙන බවක් ඒත්තු නොගත් හෙයින්, පොලිසියට දැන්විය යුතු බව තවදුරටත් නිර්දේශ කළේය. ඇත්ත වශයෙන්ම එක් හෙදියක් වන ශිරෝමි විද්‍යාසේකර සාක්ෂි දෙමින් කියා සිටියේ ඇය ද රෝගියාගේ තත්ත්වයට හේතුව ලෙස දක්වා ඇති සංසිද්ධිය ලබා ඇති තුවාල හා රෝගියාගේ තත්ත්වය සමග ගැලපීමක් නැති බව වෛද්‍යවරයාට දන්වා ඇති බවයි.

කෙසේ වෙතත් රිල්වාන්ගේ ඇඳ ඉහපත රිල්වාන්ගේ භාරකරු ලෙස කටයුතු කරමින් සිටි පුද්ගලයෙකු විසින් ජාතික රෝහලේ පොලිස් මුරපොළ වෙත ගෙන ගිය බව පෙනේ. පොලිස් පරීක්ෂණයක් අවශ්‍ය නොවන බව රාජකාරියේ යෙදී සිටි පී.එස් අරුණ ශාන්ත තෙන්නකෝන්හට ඔහු විසින් දන්වා සිටියේය. ඒ සඳහා දෙමළ භාෂාවෙන් අනුමැතියක් ලබාදී ඇති අතර, දෙමළ භාෂාව කියවිය නොහැකි බව තෙන්නකෝන් නමැති නිලධාරියා පිළිගත්තද වැඩිදුර ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. එවකට රෝහල් පොලිස් මුරපලේ ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කල ප්‍රධාන පොලිස් පරීක්ෂක බන්දුල චන්ද්‍රසිරි නානායක්කාරගේ සාක්ෂි වූයේ මේ පිළිබඳව ඔහුව දැනුම්වත් කර නොතිබූ බවයි.

රිල්වාන්ගේ ඇඳ ඉහපතේ නිශ්චිතව දක්වා ඇති පරිදි පියවර ගනු ලැබුවේ නම් සිද්ධිය පිළිබඳ වැඩි විස්තර සහ මෙම කණ්ඩායම විසින් ප්‍රචණ්ඩකාරී ක්‍රියාකාරකම් සඳහා සූදානම් වෙමින් සිටින බව දැනගැනීමට ද හැකියාව තිබුණි. රිල්වාන්ට ඔහුගේ සැබෑ අනන්‍යතාවය හෙළි නොකර ප්‍රතිකාර ලබාගැනීමට හැකිවීම පිළිබඳව විමර්ශන කොමිසමේ අවධානය යොමු විය.

ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීම තුළින් රජයේ රෝහල්වලට ඇතුළත් කර ගන්නා රෝගියාගේ අනන්‍යතාවය හැකි ඉක්මනින් ලබා ගත යුතු බව විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි. තවද සියලුම රජයේ රෝහල්වල පොලිස් මුරපල සඳහා වන ක්‍රියා පටිපාටිය සමාලෝචනය කළ යුතුය. වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශය පරිදි සියලුම රෝගීන්ට වෛද්‍ය-නෛතික පරීක්ෂණ

පෝරමයක් නිකුත් කිරීම සහතික කිරීම සඳහා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කළ යුතු අතර රෝගියා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතුය. අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ පරීක්ෂණයෙන් පසු වෛද්‍ය-නෛතික වාර්තාවක් නිකුත් කළ යුතු අතර අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ අනාවරණයන් මත පදනම්ව වැඩිදුර පරීක්ෂණ පවත්වන ලෙස පොලිසියට උපදෙස් දිය යුතුය.

*6. පාකිස්තාන බලධාරීන්ගෙන් ලැබුණු තොරතුරු*

**2018** අගෝස්තු **10** වන දින පාකිස්තාන බලධාරීන් ශ්‍රී ලාංකික ජාතිකයෙකු පිළිබඳ වැදගත් තොරතුරු පාකිස්තානයේ ඉස්ලාමාබාද්හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත යොමුකර තිබිණි. සාමාන්‍ය අධීක්ෂණයේදී ඔහු දයේෂ් නොහොත් **(**අයි.එස් වෙත යොමුව**)** සබැඳි ජාලවල ක්‍රියාකාරී සාමාජිකයෙකු බව සොයාගත් අතර පහසුවෙන් ලබාගත හැකි රසායනික ද්‍රව්‍යවලින් පුපුරණ ද්‍රව්‍ය සැකසීමට සැලසුම් කරමින් සිටියේය. සැකකරුගෙන් ලබාගත් ජිහාඩි තොරතුරු අතර ක්ෂණික පිපුරුම් උපකරණ (IEDs), වාහනවල සවිකරන ක්ෂණික පිපුරුම් උපකරණ/ **(Vb IEDs)** වෙනත් ක්ෂණික පිපුරුම් උපකරණ **( IEDs)** සහ **ac** බෝම්බ **/ IEDs,** සංකේතාංකන පද පිළිබඳ උපදෙස් (encryption key instructions) / භාවිත මාර්ගෝපදේශය, ආයුධ පුහුණු අත්පොත් ඇතුළත් වේ. එසේ භාරදුන් දේ අතර සැකකරුගේ පින්තූර කිහිපයක් ද ඇතුළත් විය.

මෙම ප්‍රකාශය ශ්‍රී ලංකා ආරක්ෂක බලධාරීන් වෙත යොමු නොවීම ගැන විමර්ශන කොමිසම සැලකිලිමත් වන අතර, මෙම අතපසු කිරීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙස කොමිසම නිර්දේශ කරයි.

මෙතෙක්, මෙම තොරතුරු පාස්කු ප්‍රහාරය සමඟ කෙලින්ම සම්බන්ධ වී ඇති බවක් නොපෙනේ. එහෙත්, මෙම ක්‍රියාකාරකම් බලධාරීන් විසින් මතුව එන ප්‍රවණතා ලෙස දැඩි අවධානයෙන් සැලකිල්ලට ගැනීමට පෙළඹෙන සුළු කරුණු ලෙස සැලකිය හැක.

*7. ආම් මොහිදීන් සහ රිල්වාන් අත්අඩංගුවට ගැනීමට අපොහොසත් වීම*

වර්ෂ 2019 මාර්තු මාසයේදී රාජ්‍ය බුද්ධි අංශයේ මෙහෙයුම් ක්‍රියාකාරීන් සීඅයිඩී නිලධාරීන්ට ආමි මොහිදීන් සැඟවී සිටි ස්ථානය සහ රිල්වාන් නිතර යන එන ස්ථානය පෙන්වාදී තිබුණි. අලියාර් හන්දියේ සිද්ධිය සම්බන්ධයෙන් ආමි මොහිදීන් වෙත නිකුත් කර ඇති වරෙන්තුව පිළිබඳව රහස් පොලිසිය දැන සිටියේය. කෙසේ වෙතත්, ඔවුන් ඔහුව අත්අඩංගුවට ගැනීම වෙනුවට සහරාන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උත්සාහ කළ අතර රහස් පොලිසියේ එක් නිලධාරියෙකුගේ දුරකථන අංකය පවා ඔහුට ලබාදුන්හ.

රිල්වාන් සිටින ස්ථානය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් රහස් පොලිසියේ නිලධාරීන් විසින් කිසිදු සාක්ෂියක් ලබාදී නොමැත.

## *8. ඉන්දියානු බුද්ධි අංශ ලබාදුන් බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වීම*

සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විසින් එල්ල කිරීමට නියමිත ප්‍රහාරය පිළිබඳව ඉන්දීය බලධාරීන් විසින් **2019** අප්‍රේල් **4** වන දින රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධනට සවිස්තරාත්මක හා වටිනා තොරතුරු ලබාදෙන ලදි. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයාට අනුව මේවා තොරතුරු පමණක් මිස බුද්ධි තොරතුරු නොවේ. මේ දෙක අතර වෙනස ඊළඟ පරිච්ඡේදයෙන් විමසා බලනු ඇත. කෙසේ වෙතත්, ප්‍රහාරය වැළැක්වීම සඳහා මෙහෙයුමක් දියත් කිරීම සඳහා මෙම තොරතුරු වුවමනාවටත් වඩා ප්‍රමාණවත් වුවත් එසේ සිදුවී නොමැති බව විමර්ශන කොමිසමෙහි අදහසයි.

## 13 වන පරිච්ඡේදය

## පූර්ව අනතුරු ඇඟවීම්

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ඉක්බිතිව බුද්ධි අංශ සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට ඉදිරියේදී එල්ල වන ප්‍රහාරය පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් තිබුණද ඒ පිළිබඳ ක්‍රියාත්මක වීමට ඔවුන් අපොහොසත් වූ බව ප්‍රචාරය විය. මෙම පරිච්ඡේදයේ විමර්ශන කොමිසම විසින් මෙම කාරණය පිළිබඳ විමසා බලනු ඇත.

සහරාන්ගේ කණ්ඩායමෙන් ප්‍රහාරයක් එල්ල විය හැකි බවට රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාට වෙනත් රටක බුද්ධි අංශයක ඔහු හා සම තනතුරු දරන නිලධාරියෙකුගෙන් පූර්ව අනතුරු ඇඟවීම් ලැබුණි. වාර්තාවෙන් මෙම මූලාශ්‍රය හෙළි කළ යුතුද යන්න පිළිබඳව විමර්ශන කොමිසම බරපතල ලෙස සලකා බලා ඇත. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා සහ එම රටේ කාර්යභාරය පිළිබඳව ප්‍රශ්න කරන තවත් සමහර සාක්ෂිකරුවන් විසින් එම රටේ බුද්ධි අංශවලට එරෙහිව කරන ලද ඇතැම් වක්‍ර චෝදනා සැළකිල්ලට ගනිමින් පුද්ගලයන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කරන අතරම මෙය කළ යුතු යැයි තීරණය විය. මීට අදාළ සිදුවීම්වලදී එම රටේ බුද්ධි අංශ සහ වෙනත් සංවිධාන හෝ පුද්ගලයින් ප්‍රහාර පිටුපස සිටීද යන්න විමර්ශන කොමිසමට පැවරී ඇති කාර්යභාරය අනුව තීරණය කිරීම අවශ්‍ය විය.

වර්ෂ 2019 අප්‍රේල් මස 4 වන දින රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා හට ඉන්දියානු බුද්ධි අංශ සගයකුගෙන් වට්ස්ඇප් පණිවිඩයක් ලැබුණි.

ඉන් කියවුනේ "ලැබුණු තොරතුරකට අනුව ශ්‍රී ලංකාවේ ජාතික තව්හීඩ් ජමාත් සංවිධානයේ සහරාන් හෂීම් සහ ඔහුගේ සහචරයින් ළඟදීම ශ්‍රී ලංකාවේ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කර තිබේ. ඔවුන් වැදගත් දේවස්ථාන කිහිපයක් ඉලක්ක කිරීමට සැලසුම් කරති. ඔවුන් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ඔත්තු බැලීම් සිදුකර ඇති අතර එය සැලසුම් සහගත ප්‍රහාරයේ එක් ඉලක්කයක් බව තවදුරටත් දැනගන්නට ඇත.

2. අදාළ තොරතුර මගින් ත්‍රස්තවාදියා පහත සඳහන් ඕනෑම ප්‍රහාර ක්‍රමයක් අනුගමනය කළ හැකි බව පෙන්නුම් කරයි.

අ. මරාගෙන මැරෙන ප්‍රහාර

ආ. ආයුධ යොදාගෙන එල්ලකරන ප්‍රහාර

ඇ. පිහි ප්‍රහාර

ඈ. ට්‍රක් රථ ප්‍රහාර

3. සැලසුම් සහගත මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාරයේ කණ්ඩායම් සාමාජිකයන් පහත දැක්වෙන අය බව ද දැනගන්නට ඇත.

I. සහරන් හෂීම්

ii. ජල් අල් කිතල්

iii. රිල්වාන්

iv. සජිඩ් මවුලවි

v. ෂාහිඩ්

vi. මිල්හාන් සහ තවත් අය

මෙම තොරතුරු දැක්වීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරනු ඇතැයිද අපට ඒ පිළිබඳ ප්‍රතිචාරයක් ලබාදීමට කාරුණික වනු ඇතැයි ද බලාපොරොත්තු වෙමු"

බුද්ධි කවයන් තුළ තොරතුරු සහ බුද්ධි තොරතුරු අතර පැහැදිලි වෙනසක් ඇත. තොරතුරු හුදෙක් ප්‍රාථමික මට්ටමේ දත්ත වේ. එය ඕනෑම ආකාරයක තොරතුරක් විය හැකිය. මෙය යම් බුද්ධිමය වටිනාකමක් ඇති ආකෘතියක් බවට පරිවර්තනය කළ යුතුය. පරිවර්තනය සිදු වූ පසු තොරතුරු බුද්ධි තොරතුරු බවට පත්වේ.

තොරතුරු රැස්කිරීම හා එය බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය බුද්ධි තොරතුරු චක්‍රය ලෙස හැඳින්වේ. ඊට සැලසුම් කිරීම සහ මෙහෙයවීම, එකතු කිරීම, සැකසීම සහ බෙදාහැරීම ඇතුළත් වේ. පළමු පියවර වන්නේ සැලසුම් කිරීම සහ උපදේශනාත්මක විධාන ලබාදීමයි. මෙය සාමාන්‍යයෙන් ඉහළ අධිකාරියක් විසින් ලබාදෙනු ලැබේ. එම උපදේශනාත්මක යොමුව මත පදනම්ව, විවිධ ප්‍රභවයන්ගෙන් තොරතුරු රැස් කරනු ලැබේ. ඉන්පසු රැස්කරගත් තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් නිසි ලෙස සකස් කෙරේ. තොරතුරු විශ්ලේෂණය කළ පසු එය බුද්ධි තොරතුරු බවට පරිවර්තනය වේ.

බුද්ධි තොරතුරු කවයන්හී විශ්වසනීයත්වය පරීක්ෂා කිරීම සඳහා **5W1H** ප්‍රවේශය (කවුද, කුමක්, කොහේද, කවදාද, ඇයි, කෙසේද) භාවිතා කරයි. මේ පිළිබඳව ප්‍රශ්න කිරීමේදී රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා මේ පිලිබඳ ප්‍රශ්න කිරීමේදී එය ව්‍යාපාර විශ්ලේෂණය සඳහා පමණක් භාවිතා කරන බවට වන ස්ථාවරයෙහි සිටියේය. කෙසේ වෙතත්, රාජ්‍ය බුද්ධි අංශයේ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සනාථ කළේ මෙය රාජ්‍ය බුද්ධි අංශය විසින් භාවිතා කරන විශ්ලේෂණ මෙවලමක් බවයි. අප්‍රේල් **4** වන දින ලැබුණු බුද්ධි තොරතුරු සඳහා මෙම ක්‍රමය භාවිතා කිරීමෙන් පෙන්නුම් කරන්නේ එය ඉහළ විශ්වසනීයත්වයක් ඇති බුද්ධි තොරතුරක් බවයි.

මෙම සන්දර්භය තුළ, ඉන්දියානු බුද්ධි සගයෙකුගෙන් ලැබෙන තොරතුර හුදෙක් මූලික තොරතුරක්ද නැතිනම් රාජ්‍ය බුද්ධි අංශය විසින් බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කිරීමට තිබූ තොරතුරු ද යන්න සොයා බැලීම ඉතා වැදගත් ය. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන එය හුදෙක් තොරතුරක්ම පමණක් බව දැඩිව අවධාරණය කොට සිටියේය. කෙසේ වෙතත්, විමර්ශන කොමිසම විසින් තවත් බුද්ධි විශේෂඥයින් කිහිප දෙනෙකුගෙන් අසා දැනගෙන ඇත්තේ එය නියත වශයෙන්ම බුද්ධි තොරතුරක් බව වන අතර විමර්ශන කොමිසම ද මෙම මතයට එකඟ වේ.

සාමාන්‍යයෙන්, බුද්ධි අංශයකට වෙනත් රටක බුද්ධි අංශ නිලධාරියෙකුගෙන් බුද්ධි තොරතුරක් ලැබුණු විට, කළ යුතු පළමු දෙය නම් එම බුද්ධි තොරතුරේ විශ්වසනීයත්වය

පිළිබඳ අදාළ විදෙස් බුද්ධි සගයා සමඟ යළිත් පරීක්ෂා කිරීමයි. රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂකවරයාගේ ස්ථාවරය වූයේ මෙය ඔහු විසින් සිදු කරන ලද්දක් බවයි. බුද්ධි අංශවල විශ්වසනීයත්වය පිළිබඳව ඉන්දීය බුද්ධි අංශ සගයාට පවා විශ්වාසයක් නොමැති බව ඔහු ප්‍රකාශ කළේය.

මෙහිදී විමර්ශන කොමිසමට ද විස්මිත්තියට කරුණක් වූයේ රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා සිය විදෙස් සගයා සමඟ කළ සංවාදය පිළිබඳ රාජ්‍ය බුද්ධි අංශ සතුව කිසිදු වාර්තාවක් නොමැති වීමයි. මෙය සාමාන්‍යයෙන් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා විසින් එවැනි වාර්තා පවත්වාගෙන යන බවත්, ඇත්ත වශයෙන්ම මෙම සංවාදය පිළිබඳ වාර්තාවක් ඔහු විසින් සාදන ලද බවත් සාක්ෂි දරයි. දෙපාර්ශ්වයම එකිනෙකා වෙත ගෙන ආවේ කුමක්ද සහ විශේෂයෙන් ඒ පිළිබඳ රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයාගේ ස්ථාවරය දැනගැනීමට එය විශාල සහයක් වනු ඇත.

ලබාදී ඇති බුද්ධි තොරතුරු "ප්‍රමුඛතාවය සහ අපට ලබා දෙන ප්‍රතිපෝෂණය පිළිබඳව විමසා බැලිය යුතු" යැයි **2019** අප්‍රේල් **4** වන දින සංවාදයේදී ඉන්දීය බුද්ධි අංශ නිලධාරියා විශේෂයෙන් ඉල්ලා සිටි බව සැළකිල්ලට ගැනීම වැදගත්ය. ඉන්දියානු බුද්ධි අංශ සගයාට ලබාදෙන එවැනි ප්‍රතිපෝෂණ සඳහා ඉදිරිපත් කරන ලෙස විමර්ශන කොමිසම විසින් රාජ්‍ය බුද්ධි අංශය වෙත උපදෙස් දෙන ලදී. රාජ්‍ය බුද්ධි අංශය පෙන්වා දුන්නේ එවැනි වාර්තාවක් නොමැති බවයි. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකගේ හැසිරීම සැළකිල්ලට ගනිමින් රාජ්‍ය බුද්ධි අංශය වෙතින් මෙම දැනුම්දීමේ සත්‍යතාව සැක කිරීමට විමර්ශන කොමිසම හට කිසිදු හේතුවක් නැත.

ඔහු තවදුරටත් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා නොවුණද, සිද්ධියට අදාළව වැදගත් කරුණුවල පිටපත් ලබාගෙන ඇති බව විමර්ශන කොමිසම වෙත පැහැදිලි විය.

එහෙත් ඔහු සහ ඉන්දියානු බුද්ධි අංශ සගයා අතර සන්නිවේදනය පිළිබඳ කිසිදු සාක්ෂියක් හෝ **2019** අප්‍රේල් **4** වන දින ලබාදුන් බුද්ධි තොරතුරුවලට ඔහු දැක්වූ ප්‍රතිචාරය පිළිබඳව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කළේ නැත.

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන ඇත්ත වශයෙන්ම ඔහුගේ ඉන්දීය බුද්ධි අංශ සගයන්ගෙන් කිසිවෙකුට කිසිදු ප්‍රතිපෝෂණයක් ලබා නොදුන් බව විමර්ශන කොමිසම නිගමනය කරයි. 21 වන දිනට හෝ ඊට පෙර සිදුවීමට නියමිත ප්‍රහාරයක් පිළිබඳව ඔහුගේ පළමු ඉන්දීය බුද්ධි අංශ සගයා දෙවන වරටත් තොරතුරු ලබාදීමෙන් පසු 2019 අප්‍රේල් 20 වන දින ඔහුගේ දෙවන ඉන්දීය බුද්ධි සගයාගෙන් පණිවුඩයක් ලැබුනේ දැයි ඇසූ ප්‍රශ්නයකට ඔහු දක්වන ප්‍රතිචාරය සලකා බලන විට මෙය පැහැදිලි වේ.

පහත දැක්වෙන පණිවිඩය ලැබුණු බව ඔහු සාක්ෂි දුන්නේය.

"හායි! ශ්‍රී ලංකාව කෙරෙහි ඉන්දියානු උනන්දුව පිළිබඳ සහරාන් හෂීම්ගෙන් 2019 අප්‍රේල් 21 දිනට පෙර තර්ජනයක් සම්බන්ධයෙන් මූලස්ථානයෙන් ලැබුණු තොරතුරක් මම ඉදිරිපත් කරමි. මීට සති කිහිපයකට පෙර මේ හා සමාන වාර්තාවක් අප වෙත ඉදිරිපත් කර තිබුණි. වෙනස වන්නේ මෙහිදී තොරතුරු ලබා දුන් පාර්ශ්වය විසින් කාල රාමුවක් පෙන්නුම් කරන අතර කාත්තන්කුඩියේදී මෙහි පෙර පුහුණුවක් සිදුකොට ඇති බවයි. අවශ්‍ය ක්‍රියාමාර්ග සහ ප්‍රතිපෝෂණ සඳහා කරුණාකර බලන්න. කිසියම් කරුණක් තිබේ නම් කලින් ලබාදුන් තොරතුර පිළිබඳ ප්‍රතිපෝෂණය දැන ගැනීමට මූලස්ථානයට අවශ්‍ය විය. "

(2020 අගෝස්තු 20 දින ක්‍රියා පටිපාටීන් අවධාරණය කරන ලදි)

මෙම ප්‍රශ්නය මතු වූයේ වර්ෂ 2019 අප්‍රේල් මස 4 වෙනි දින පළමු ඉන්දීය බුද්ධි සගයා විසින් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා හට ලබාදුන් තොරතුරු වර්ෂ 2019 අප්‍රේල් මස 5 වන දින 2 වන ඉන්දීය බුද්ධි සගයා විසින් තහවුරු කොට තිබූ බැවිනි.

රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාගේ පසුකාලීන හැසිරීමෙන් පෙනී යන්නේ ඔහු 2019 අප්‍රේල් 4 වන දින ලබා දුන් බුද්ධි තොරතුරුවලට නිසි වැදගත්කමක් ලබාදී නොමැති බවයි.

නිදසුනක් වශයෙන්, ජනාධිපති සිරිසේන මහතා 2019 අප්‍රේල් 12 වන දින මඩකලපුවේ සංචාරය කිරීමට නියමිතව තිබුණේ උත්සව මාලාවක් සඳහාය. භාවිතයේදී මෙන්, යෝජිත

සංචාරයේදී රාජ්‍ය බුද්ධි අංශය වෙතින් තර්ජන තක්සේරු වාර්තාවක් කැඳවන ලදී. 2019 අප්‍රේල් 10 දිනැති ලිපියක් මගින් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ විසින් අත්සන් කරන ලද තර්ජන තක්සේරු වාර්තාවක් නියෝජ්‍ය පොලිස්පතිවරයාට (ජනාධිපති ආරක්ෂක අංශය) යවා ඇත. එහි සඳහන්වූයේ ත්‍රස්තවාදී, අන්තවාදී හෝ වෙනත් කණ්ඩායම්වලින් ජනාධිපතිවරයාට හෝ සංචාරයට තර්ජනයක් නොමැති බවයි.

කෙසේ වෙතත් එම වාර්තාවේම ඔහු සහරාන් ගැන සඳහන් කරන අතර ඔහුගේ ෆේස්බුක් උඩුගත කිරීමවලින් කියැවෙන්නේ ඉස්ලාම් දහම අනුගමනය නොකරන පුද්ගලයින් කෆීර්වරුන් බවත් ඔවුන් විනාශ කර ඉස්ලාමය ආරක්ෂා කළ යුතු බවත්ය

❖ Islamic State සංවිධානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරීත්වය

- ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් තරුණයින් 130කට ආසන්න පිරිසක් IS සංවිධානයේ මතවාදය වෙත නැඹුරුව සිටින බවත් ඔවුන් අතරින් පුද්ගලයින් 30කට ආසන්න පිරිසක් මඩකළපුව ප්‍රදේශයේ පදිංචි බවටත් බුද්ධි තොරතුරු තරහා හඳුනාගෙන ඇති බවට වාර්තා වේ

  මඩකළපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක ජාතික තව්හිද් ජමාත් National Thowheed Jama'ath (NTJ) සංවිධානයේ නිර්මාතෘ නායක එම්.සී.එම්. සහ්රාන් යන අය විසින් මෙරට දේශපාලන ක්‍රමය, ප්‍රජාතන්ත්‍රවාදය, නීති පද්ධතිය සහ අන්‍යාගමිකයින් පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වමින් වීඩියෝ පට සිය සමාජ ජාල ගිණුම් හරහා ප්‍රචාරය කර ඇති බවත් සංවිධානයේ මතවාදයට නැඹුරුවූ පිරිස් අදාළ වීඩියෝ පට පරිශීලනය කර ඇති බවටත් අනාවරණය වී ඇත.

  එසේම ඔහු විසින් සිය සමාජ ජාල ගිණුම් හරහා වීඩියෝ පට යොමුකරමින් අල්ලාහ් දෙවියන් විසින් යොමුකරන ලද දර්ශනය ප්‍රතික්ෂේප කරන අයවළුන් තුනර, නැවත කාෆිර්වරුන් ලෙස සඳහන් කරමින් ඔවුන් විනාශ කර ඉස්ලාමය ආරක්ෂා කළයුතු බවට ප්‍රචාරය කර ඇත.

- එමෙන්ම IS සංවිධානයේ මතවාදය වෙත නැඹුරුව සිටින පුද්ගලයින් IS වෙබ්අඩවි සහ සමාජ ජාල ගිණුම් නිරන්තරයෙන් පරිශීලනය කරමින් IS ප්‍රචාරණ මාධ්‍ය ඔස්සේ ලබාදෙන උපදෙස්/නියෝග සහ සිරියාවේ සහ ඉරාකයේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරීක්ෂණය කරමින් සිටින බවට වාර්තා වී ඇත

**2019 අප්‍රේල් 4 වන දින සහරාන්ගේ නම සහිතව බුද්ධි සගයෙකුගෙන් ලැබුණු තොරතුරු ගැන කිසිවක් සඳහන් නොවේ.**

මඩකලපුව සියොන් දේවස්ථානය වෙත මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කළ අසාද්, 2019 අප්‍රේල් 12 වන දින ජනාධිපතිවරයාගේ රැස්වීම පැවැත්වූ වෙබර් ක්‍රීඩාංගනය ඉදිරිපිට පිහිටි මුස්ලිම් පල්ලියේ නැවතී සිටියේය.

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා තම ඉන්දීය සගයා විසින් ලබාදුන් බුද්ධි තොරතුරට නිසි වැදගත්කමක් ලබාදී ඇත්නම් ඔහු ගත යුතුව තිබූ සාමාන්‍ය ක්‍රියාමාර්ගය වූයේ එය නියෝජ්‍ය පොලිස්පතිවරයාට (ජනාධිපති ආරක්ෂක අංශය) ඉදිරිපත් කළ තර්ජන තක්සේරු වාර්තාවේ සඳහන් කිරීමයි. එවැනි සඳහනක් කර නැත.

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා 2019 අප්‍රේල් 7 වන දින ජාතික බුද්ධි ප්‍රධානියා වෙත ලිපියක් යවමින් ඉන්දීය බුද්ධි සගයාගෙන් ලබාගත් බුද්ධි තොරතුරෙහි පිටපතක් අමුණා ඇත. ආවරණ ලිපියේ මාතෘකාව "සැලසුම් කර ඇතැයි සැලකෙන ප්‍රහාරයක් පිළිබඳ තොරතුරු" ලෙස හඳුනාගෙන ඇති අතර,

"මෙහි අමුණා ඇත්තේ විදේශීය සගයකුගෙන් ලැබෙන තොරතුරුය. කරු. දැන ගැනීම සහ උපදෙස් සඳහා"

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා ඒ වන විටත් දැරූ ස්ථාවරය වන්නේ ඔහුට ඉන්දියානු බුද්ධි සගයෙකුගෙන් ලැබී තිබුණේ හුදෙක් තොරතුරු මිස බුද්ධි තොරතුරු නොවන බවයි. "අප නොදන්නා බව ඔවුන් පවසනවා" යන්නෙහි අර්ථය "Alleged" යන වචනය භාවිතා කිරීමද ඔහු පැහැදිලි කළේය.

මෙම ලිපිය 2019 අප්‍රේල් 8 වන දින පෙ.ව. 10.00 ට පමණ ලැබුණු බව ජාතික බුද්ධි අංශ ප්‍රධානී සිසිර මෙන්ඩිස් පිළිගත්තේය. ප.ව. 3.00 ට පසු එදිනම ඔහු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සමඟ සාකච්ඡා කළේය. ඊළඟ දිනයේ පැවැත්වීමට නියමිත බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කළ හැකි බව දැනුම් දෙන ලදි. 2019 අප්‍රේල් 9.

ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු, රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන සහ ජාතික බුද්ධි අංශ ප්‍රධානී සිසිර මෙන්ඩිස් ගේ සාක්ෂි 2019 අප්‍රේල් 9 වන දින පැවති

බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ සිදුවූ දෑ සම්බන්ධයෙන් පරස්පරතාවයක් දක්වයි. කෙසේ වුවත් ඔවුන් තිදෙනාම එකඟවන කාරණයක් නම් ඉන්දියානු බුද්ධි අංශ වෙතින් ලද තොරතුරු පිළිබඳව අදාළ රැස්වීමේදී සාකච්ඡාවට බඳුන් නොවූ බවයි. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා සඳහන් කරන්නේ, මේ පිළිබඳව සලකා බලන ලෙස ඔහු ජාතික බුද්ධි අංශ ප්‍රධානියා වෙතින් ඉල්ලා සිටි බවයි. ජාතික බුද්ධි අංශ ප්‍රධානී ප්‍රකාශ කරන්නේ ඔහු ආරක්ෂක ලේකම්වරයා හට "සර්, නිලන්තගේ කාරණය" යනුවෙන් එය දැනුම් දුන් බවයි. ආරක්ෂක ලේකම්වරයා පවසන්නේ ඔහු රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයාගෙන් "නිලන්ත ඔබේ ලිපිය?" යනුවෙන් විමසූ බවයි. ජාතික බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා පිළිතුරුදී ඇත්තේ තමා පොලිස්පතිවරයා වෙත ඒ පිළිබඳව ලිපියක් යැවීමට සූදානම් වන බවත් රැස්වීමෙන් මඳ වේලාවකට පසුව එය සිදුකරන බවත්ය.

විමර්ශන කොමිසම මෙය බරපතල පසුබෑමක් ලෙස සලකයි. බුද්ධි අංශ සම්බන්ධීකරණ රැස්වීම එල්ටීටීඊ සංවිධානය ක්‍රියාත්මක වූ වකවානුවේ ආරම්භ කරන ලද්දේ බුද්ධි අංශ සහ බුද්ධි තොරතුරු අතර සම්බන්ධීකරණයක් ඇති බව සහතික කිරීම සඳහා මෙන්ම තොරතුරු හුවමාරු කර ගැනීම සඳහාය.

බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ වැදගත් පුද්ගලයෙක් ලෙස යුධ හමුදා බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා සැළකේ. ඇත්ත වශයෙන්ම සම්ප්‍රදායක් ලෙස, රැස්වීමේ ආරම්භක කථාව ආරක්ෂක ලේකම් විසින් සිදුකරනු ලබන අතර ඉන් අනතුරුව රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයාගේ ඉදිරිපත් කිරීම සහ පසුව යුද හමුදා බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාගේ ඉදිරිපත් කිරීම සිදුකෙරේ. සහභාගි වන සෙසු අය අතර ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානීන්, සෙසු බුද්ධි අංශ ප්‍රධානීන් සහ පොලිස්පතිවරයා ද වූහ. රැස්වීමේදී ඉන්දීයානු බුද්ධි අංශ මඟින් ලබාදුන් තොරතුරු පිළිබඳ සාකච්ඡා කිරීමට අපොහොසත්වීම විශේෂයෙන් ප්‍රහාරය මැඩපැවැත්වීම සඳහා මනාව සම්බන්ධීකරණයක් සහිත උත්සාහයක් වළක්වනු ලැබීය. මක්නිසාදයත් සහරාන් සහ ඔහුගේ කණ්ඩායම පිළිබඳව සැළකිය යුතු බුද්ධි තොරතුරු හමුදා බුද්ධි අංශය සතුවද තිබුණු බැවිනි.

මෙම රැස්වීමේදී ඉන්දීය බුද්ධි තොරතුරු පිළිබඳව සාකච්ඡා කිරීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු, රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන සහ රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී සිසිර මෙන්ඩිස් යන නිලධාරීන් තිදෙනාම වගකිව යුතු බව විමර්ශන කොමිසම සොයාගෙන තිබේ.

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා මෙම රැස්වීම්වලදී තම අංශය සතුව ඇති බුද්ධි තොරතුරු ඉදිරිපත් කරයි. කිසියම් විශේෂිත විෂයයක් සාකච්ඡා කිරීම සඳහා ඔහුට විශේෂ ආරාධනයක් කරනු නොලැබේ. ඉන්දියානු බුද්ධි තොරතුරු පිළිබඳ ඔහු විසින් රටේ ප්‍රමුඛ බුද්ධි අංශයෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කළ යුතුව තිබුණි.

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා එසේ කිරීමට අපොහොසත් වූ විට, ජාතික බුද්ධි ප්‍රධානියා විසින් එම රැස්වීමේදී අනෙක් සියලුම බුද්ධි අංශ නියෝජිතයන් සමඟ විවෘතව කරුණු ඉදිරිපත් කළ යුතුව තිබුණි. ජාතික බුද්ධි අංශ ප්‍රධානියාගේ පරම යුතුකම වන්නේ මෙම ආයතන අතර බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධීකරණය කිරීමයි.

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා සහ ජාතික බුද්ධි අංශ ප්‍රධානියා ඔවුන්ගේ රාජකාරිවල අසමත් වූ විට පවා ආරක්ෂක ලේකම්වරයා විවෘත සාකච්ඡාවක් සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතුව තිබුණි. ජාතික බුද්ධි ප්‍රධානී විසින් දැනුම් දුන් පරිදි අප්‍රේල් 8 වනදා වන විට ඔහු බුද්ධි තොරතුරු පිළිබඳව දැන සිටියේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (2) ව්‍යවස්ථාව මඟින් සෑම අමාත්‍යාංශයකම ලේකම්වරයා විසින් අමාත්‍යවරයාගේ මඟපෙන්වීම සහ පාලනයට යටත්ව, අමාත්‍යවරයා භාරව සිටින දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන අධීක්ෂණය කළ යුතුය. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක සහ ජාතික බුද්ධි ප්‍රධානී යන දෙදෙනාම ඒ වනවිට වාර්තා කරමින් සිටියේ ඔහු යටතේය. අදාළ ගැසට් නිවේදනය අනුව මෙම ආයතන දෙකම ඔහුගේ අධීක්ෂණය යටතේ පැවතුනි.

රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා විසින් 2019 අප්‍රේල් මස 4 වන දින ඉන්දියානු බුද්ධි සගයින්ගෙන් ලැබුණු පණිවිඩය අදාළ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති අතර එය ඔහු විසින් සහකාර අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. පසුව ඔහු එය අංශයේ භාර

නිලධාරියා වෙත යවා ඇත. මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා කණ්ඩායමක් නැගෙනහිර පළාතට යවා තිබේ. රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාගේ මතය පරිදි එය තොරතුරු පමණක් යැයි උපකල්පනය කරමින් බුද්ධි චක්‍රයේ ඊළඟ පියවර වූයේ එය විශ්ලේෂණය කර බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කිරීමයි.

2019 අප්‍රේල් 5 වන දින අදාළ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සිය වාර්තාව රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදි . ඔහු සඳහන් කරන්නේ බුද්ධි අංශ මඟින් අදාළ තොරතුරේ සඳහන් වන ඇතැමුන් හඳුනාගෙන ඇති බවයි. මොවුන්ගෙන් 2018 දෙසැම්බර් 26 දින සිට මාවනැල්ල සිද්ධියෙන් පසු සහරාන් හෂීම් සහ ශාහිද් අක්කරයිපත්තුවේ ඔලුවිල්හි සැඟවී සිටින බව හඳුනාගෙන තිබේ. රිල්වාන් සහරාන්ගේ සහෝදරයා බවත්, ඔහු ද 2017 මාර්තු 10 වන දින අලියාර් හන්දියේ සිද්ධියෙන් පසු සැඟවී සිටින බවත්, බුද්ධි අංශ වාර්තාවලට අනුව ඔහුද ඔලුවිල්හි සැඟවී සිටින බවත්, ඔහු රාත්‍රියේදී අරියම්පතිහි යම් ස්ථානයකට තම බිරිඳ හා දරුවන් ජීවත් වන ස්ථානයට පැමිණෙන බවත් තවදුරටත් සඳහන් විය.

මිල්හාන් ලෙස හඳුනාගෙන ඇති පුද්ගලයා සහරාන් සමඟ සම්බන්ධතා ඇති මොහොමඩ් මිල්හාන් ලෙස ෆේස්බුක් ගිණුමක් පවත්වාගෙන යන බව වාර්තාවේ සඳහන් වේ. නවසීලන්තයේ කතෝලිකයෙකු විසින් ක්‍රයිස්ට් චර්ච් ප්‍රහාරයෙන් පසුව ඔහු 2019 මාර්තු 15 වන දින මුස්ලිම් නොවන අය පිළිබඳ විවක්ෂණශීලී අදහස් බෙදා ගනිමින් සිටියේය.

සහරාන් මේ දක්වා කතෝලික පල්ලිවලට හෝ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට පහර දීමට තම අනුගාමිකයින් පෙළඹවූ බවට කිසිදු සාක්ෂියක් නොතිබුණද, මීට පෙර ඔහු මුස්ලිම් නොවන අය ඝාතනය කිරීම ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් බවත්, මුස්ලිම් නොවන අය ඝාතනය කරමින් ඉස්ලාමය ව්‍යාප්ත කළයුතු බවත් පවසමින් තම අනුගාමිකයින් පෙළඹවූ බව එහි තවදුරටත් සඳහන් විය.

නැගෙනහිර පළාතට යවන ලද කණ්ඩායම 2019 අප්‍රේල් 8 වන දින කොළඹට පැමිණ රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂ වෙත වාර්තා කළේය.

නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් එවන ලද වාර්තාව සහ නැගෙනහිර පළාතට ගිය කණ්ඩායම ලබාදුන් ප්‍රතිපෝෂණ මත පදනම්ව රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා විසින් 2019 අප්‍රේල් 9 දිනැති පොලිස්පතිවරයා වෙත ලිපියක් යවා ඇත. (උපග්‍රන්ථය IV) එහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව පවත්වන ලද මූලික පරීක්ෂණයකට අනුව, රාජ්‍ය බුද්ධි අංශය විසින් අදාළ තොරතුරුවල අඩංගු වූ නම් සහිත පුද්ගලයින් කිහිප දෙනෙකු හඳුනාගෙන ඇති බව ඔහු පැවසීය. ඔහු සහරාන් පිළිබඳ විස්තර ලබාදුන් නමුත් පුදුමයට කරුණක් නම් එම තොරතුරු මාවනැල්ලෙහි බුද්ධ ප්‍රතිමාවන්ට පහරදීමෙන් පසු ඔහු ප්‍රදේශයෙන් පලා ගොස් ඇති බවත්, අක්කරයිපත්තුවේ ඔලුවිල්හි සැඟවී සිටින බවත් යන කරුණුවලට සීමාවීමයි. මෙම තොරතුරු අනුව සහරාන් විසින් ඒ වන තෙක් සිදු කරන ලද ක්‍රියාවන් කිසිවක් සඳහන් නොවේ.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හෝ කතෝලික පල්ලි ඉලක්ක කර ගන්නා ලෙස සහරාන් තම අනුගාමිකයින්ගෙන් ඉල්ලා ඇති බවට නිශ්චිත තොරතුරක් නොතිබුණද, සහරාන් 2016 සිට සිය ෆේස්බුක් පෝස්ට්වල සඳහන් කර ඇත්තේ මුස්ලිම් නොවන අය ඝාතනය කිරීම මහා ආගමික සත් ක්‍රියාවක් බවත් ඉස්ලාම් දහම ප්‍රචාරය කළ යුත්තේ මුස්ලිම් නොවන අය ඝාතනය කිරීමෙන් බව වන අතර විදේශීය පාර්ශ්වකරු විසින් සපයනු ලබන තොරතුරු පිළිබඳව රහස් විමසීම් කරගෙන යන බවයි.

විමර්ශන කොමිසමද පිළිගන්නා පරිදි බුද්ධි තොරතුරු විශේෂඥයින් බහුතරයකගේ මතය නම් මෙම ලිපියේ මෙම කොටස බුද්ධි තොරතුරුවල නිශ්චිතතාව අවම කිරීමට හේතුවී ඇති බවයි. අවසාන කොටසෙහි සඳහන් මෙසේය.

සහරාන් සහ ඔහු සමාජ ජාල ගිණුම ඔස්සේ සිය අනුගාමිකයින් අභිප්‍රේරණය කිරීමට මෙරට කතෝලික පල්ලි සහ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාල ඉලක්ක කරගන්නා ලෙස [illegible] සඳහන් කළ බවත් මේ වන විට [illegible] අනුගාමිකයින් [illegible] 2016 වර්ෂයේ සිට [illegible] සමාජ ජාල සහ ආගමික [illegible] අනුගාමිකයන් අභිප්‍රේරණය කරන බවට [illegible] ඇත.

ඉහත සඳහන් තොරතුරු පිළිබඳව රහසිගත පරීක්ෂණ සිදුකරමින් පවතී.

මෙම පසුබෑමට හේතුවී ඇත්තේ එකල රාජ්‍ය බුද්ධි අංශ සතුව පැවති බුද්ධි තොරතුරු මත පදනම් වූ තීරණාත්මක අතපසුවීම් බව විමර්ශන කොමිසමේ අදහසයි. ලැබුණු තොරතුරු විශ්ලේෂණය කර එය බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කිරීමේදී එක් වැදගත් අංගයක් වනුයේ විෂය තොරතුරු පිළිබඳ රාජ්‍ය බුද්ධි අංශය සතුව පෙර සිටම පැවති තොරතුරු හෝ බුද්ධි තොරතුරු සලකා බැලීමයි. ඉන්දියානු බුද්ධි සගයා විසින් ලබාදී ඇති තොරතුරු රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද ආකාරයට හුදෙක් තොරතුරුම පමණක් යැයි උපකල්පනය කලහොත් **2019** අප්‍රේල් **4** වන විට ජාතික බුද්ධි අංශය සතුව ඒ වන විටත් අදාළ තොරතුරු පැවතියද පහත සඳහන් තොරතුරු සහ බුද්ධි තොරතුරු නොසලකා හැර තිබේ.

අ. **2016** සැප්තැම්බර් මාසයේ සිට සහරාන් අයිඑස් දෘෂ්ටිවාදය විවෘතව ඉදිරිපත් කළ අතර එයට සහාය පළ කරමින් ප්‍රකාශ නිකුත් කළේය.

ආ. සහරාන් විසින් **2018** මැයි මස **5** සිට **7** දක්වා නුවරඑළියෙහි පුහුණු කඳවුරක් පවත්වනු ලැබූ අතර එහිදී තෝරාගත් පුද්ගලයින් **25** දෙනෙකු පමණ පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි භාවිතය පිළිබඳ වැඩමුළුවකට සහභාගිවූහ.

ඇ. ඉරාකය සිරියාව සහ ඇෆ්ගනිස්ථානය යන රටවල අයිඑස් අහිමි වෙමින් පැවතුණද, ශ්‍රී ලංකාවේ අයිඑස් හිතවාදීන්/ආධාරකරුවන් ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම සඳහා කටයුතු කරමින් සිටින බව 2018 නොවැම්බර් මස මුලදී රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා විසින් ආරක්ෂක ලේකම්වරයාට දැනුම් දුන්නේය.

ඈ. අයිඑස් ප්‍රචාරයේ අනුගාමිකයන් ලෙස හඳුනාගෙන ඇති ශ්‍රී ලාංකිකයන් විදේශිකයන් හා මුස්ලිම් නොවන අය කෙරෙහි වෛරයෙන් ජීවත් වන බවත් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරන බවත් 2018 නොවැම්බර් මැද භාගයේදී අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා ආරක්ෂක ලේකම්වරයාට දන්වා සිටියේය. මෙම පසුබිම තුළ මෙම මුස්ලිම් තරුණයින් හදිසියේම මුස්ලිම් නොවන අයට එරෙහිව ප්‍රහාර දියත් කළ හැකි බව තවදුරටත් සඳහන් විය.

ඉ. 2018 නොවැම්බර් මස 1 වන දින සහරාන් සිය ෆේස්බුක් වෙබ් අඩවියේ අයිඑස් සටන්කරුවෙකුගේ පින්තූරයක් පළකර ඇති අතර, ඉස්ලාමය වෙනුවෙන් ජිහාඩ් ඉටු කිරීමට අල්ලාහ් අයිඑස් සටන්කරුවන්ට අවස්ථාව ලබාදී තිබුණද, ඔහුට (සහරාන්) බලය තිබුණද අවස්ථාවක් නොමැති බව සඳහන් කළේය.

ඊ. බෞද්ධ, ක්‍රිස්තියානි සහ හින්දු ප්‍රතිමා ඇතුළු 2018 දෙසැම්බර්යේ අග භාගයේ මාවනැල්ල සහ වෙනත් ප්‍රදේශවල ආගමික ප්‍රතිමා බිඳ දැමීම පිළිබඳ පරීක්ෂණවලින් සහරන් සහ ඔහුගේ කණ්ඩායමේ මැදිහත්වීම අනාවරණය විය.

උ. සහරාන් වනාතහිල්ලුවේ තිබී සොයාගත් පුපුරණ ද්‍රව්‍ය හා ආයුධ සමඟ සම්බන්ධතාවක් ඇති බවට අනාවරණය විය. පොටෑසියම් නයිට්‍රේට්, නයිට්‍රික් අම්ලය, ඩෙටනේටර් වැනි බෝම්බ සෑදීමට යොදාගන්නා කළමනා සැළකිය යුතු ප්‍රමාණයක්. එම ස්ථානයෙන් සොයා ගන්නා ලදි.

"ජිහාඩ්" සඳහා මාවත පෙන්වන සමහර පොත් සහ ලෝක ප්‍රකට යේමනයේ ඇමරිකානු රැඩිකල් දේශකයෙකු වන අන්වර් අල් අව්ලාකිගේ සිත් ඇදගන්නාසුලු වචනද හමුවිය. අත්අඩංගුවට ගත් එක් සැකකරුවෙකුගේ මුදල් පසුම්බියේ පරිපථයක රූප සටහනක් සහ බෝම්බ සෑදීමේ විස්තර ඇතුළත් ලිපියක් තිබී ඇත.

එ. ඉරාක දේශසීමාව ආසන්නයේ නැගෙනහිර සිරියාවේ කැලිපේට්හි අවසන් ග්‍රහණයද අහිමි වීමේ පසුබිම තුළ **2019** ජනවාරි **23** වන දින අයිඑස් විසින් සිය ආධාරකරුවන්ට "ජිහාඩ් මාවතට පිවිසෙන්න" යනුවෙන් ඉල්ලා සිටින වීඩියෝවක් නිකුත් කළේය.

ඒ. **2019** ජනවාරි **31** වන දින සහරාන් සිය ෆේස්බුක් පිටුවේ වීඩියෝවක් නිකුත් කරමින් කියා සිටියේ ස්ථිර ජීවිතය මරණයෙන් පසු ජීවිතය බවත් මරණයෙන් පසු ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා මුස්ලිම් නොවන අය මරා ජිහාඩ් කළයුතු බවත්ය. අල්-කුර්ආනයෙහි හා හදීස්හි මෙලොව හා මරණයෙන් පසු ජීවිතය විශ්ලේෂණය කර ඇති බවත්, ඒ අනුව අල්ලාහ් සතුටු වන්නේ මුස්ලිම් නොවන අය ඝාතනය කිරීමෙන් ඉස්ලාමය ලොව පුරා ප්‍රචාරය කළහොත් පමණක් බවත් ඔහු තවදුරටත් පැවසීය.

ඔ. **2019** පෙබරවාරි **1** වන දින සහරාන් සිය ෆේස්බුක් ගිණුමේ වීඩියෝවක් නිකුත් කළ අතර අල්ලාහ් නිවැරදි මාර්ගය පෙන්වා ඇති බවත් එම මාර්ගයේ යාහැකි එකම මාර්ගය ජිහාඩ් කිරීම සහ මුස්ලිම් නොවන අය ඝාතනය කර ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම බවත් පැවසීය.

ඕ. **2019** පෙබරවාරි **5** වන දින සහරාන් විසින් ජිහාඩ් උත්කර්ෂයට නංවන වීඩියෝවක් උඩුගත කර ඇති අතර මුස්ලිම්වරයෙකු දෙවියන්ගේ ඒකීයභාවය පිළිබඳව ප්‍රචාරය කිරීම ප්‍රමාණවත් නොවන අතර ජිහාඩ් අනිවාර්ය බවත්, ජිහාඩ් ඉටු කිරීමට එම උත්සාහය ගත යුතු බවත් ප්‍රකාශ

කරයි. පුද්ගලයෙකුට පාරාදීසයට යාහැක්කේ ජිහාඩ් කළහොත් පමණක් බව ඔහු තවදුරටත් පවසයි. ඔහු මුස්ලිම්වරුන්ගෙන් ඉල්ලා සිටින්නේ සටන්කරුවන් ලෙස මිය යන ලෙසයි.

ඛ. 2019 මාර්තු මස 1 වන දින වන විට ශ්‍රී ලංකාවේ අයිඑස් රටාවේ ප්‍රහාරයක් දියත් කිරීමට රිල්වාන් මඩකලපුව, අම්පාරා සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තරුණ තරුණියන් පොළඹවමින් සිටියේය.

ග. 2019 මාර්තු 6 වන දින සහරාන් සිය ෆේස්බුක් පිටුවේ "කෆීර්වරුන්ගේ රුධිරය සහ ආර්ථිකය" නමින් වීඩියෝවක් නිකුත් කළ අතර ඉස්ලාම් ශුද්ධ මාස අවසන් වූ වහාම මුස්ලිම් නොවන අය ඝාතනය කරන ලෙස තම ආධාරකරුවන්ට දැනුම් දුන්නේය. අල්-කුර්ආනයේ සූරා 9: 5 ට අනුව ඉස්ලාමයේ 1, 7, 11 සහ 12 මාසවලදී යමෙකු පුණ්‍ය ක්‍රියා කළයුතු බවත්, අනෙක් මාසවලදී මුස්ලිම් නොවන අයව දුටු තැන මරා දැමියයුතු බවත්, ඉස්ලාමය වැළඳ ගන්නා මුස්ලිම් නොවන අයට පමණක් තම ගමන ඉදිරියට යාමට ඉඩහැරියයුතු බවත්, ඔහු තවදුරටත් පැහැදිලි කරයි. අල් කුර්ආනයේ ඉගැන්වීම් අකුරටම අනුගමනය කරන මුස්ලිම්වරු ශුද්ධ නොවන මාසවලදී මුස්ලිම් නොවන ඝාතනය කර ඔවුන්ගේ දේපල අත්පත් කර ගන්නා බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය. ඔහු එම කතාව අවසාන කරන්නේ හොඳම විකල්පය ලෙස කලීෆරයෙකුගේ නායකත්වය යටතේ ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපනය කිරීම තෝරා ගතයුතු බවයි.

ච. 2019 මාර්තු 31 වන විට නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච්හි මුස්ලිම් දේවස්ථාන දෙකකදී යාච්ඤාවලට සහභාගීවූ මුස්ලිම් වන්දනාකරුවන් 49 දෙනෙකු 2019 මාර්තු 15 වන දින සුදු ජාතිකවාදී අන්තවාදියෙකු විසින් වෙඩි තබා ඝාතනය කිරීම පිළිබඳ තොරතුරු රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා දැන සිටියේය. නැගෙනහිර සිරියාවේ බාගුස් ගම්මානයේ අයිඑස්ගේ කැලිපේට්වල අවසාන ග්‍රහණයද බිඳ වැටෙමින් පවතින බව ඔහු තවදුරටත් කියා සිටියේය.

කෙසේ වෙතත්, විශ්ලේෂකයින්ට අනුව එහි අනුගාමිකයන් තවමත් ලොව පුරා ඇදහිලිවන්තයන් නොවන පුද්ගලයින් ඝාතනය කිරීමට ප්‍රතිඥා දෙමින් සිටින අතර ඉස්ලාමීය රාජ්‍ය සංකල්පය යෞවන යෞවනියන්ගේ හදවත් හා මනස තුළ ගැබ්ව ඇති හෙයින් එය දිගටම පවතිනු ඇතැයි විශ්වාස කරයි. ඇත්තවශයෙන්ම අන්තර් ජාලයට එක්කොට තිබූ IS සංවිධානයේ තවත් හඬ පටයක සඳහන්වූයේ ලොව පුරා තම ආධාරකරුවන්හට පවසා සිටියේ නැගෙනහිර සිරියාවේ සිය අවසන් සටනෙහි සිය ජීවිත පරිත්‍යාගයෙන් නිරතව සිටි සටන්කරුවන් වෙනුවෙන් හැකි සෑම ස්ථානයකම ප්‍රහාර එල්ල කරන ලෙසයි. තවදුරටත් IS සංවිධානය විසින් යුරෝපයේ සහ සෙසු විදෙස් රටවල ඔවුන්ගේ සහෝදරත්වය වෙත අවධාරනයකොට සිටියේ කුරුස යුද්ධයේ සෙබලුන්හට එරෙහිව නැඟී සිටිමින් ආගමේ නාමයෙන් පළිගන්නා ලෙසයි. කුරුස යුද්ධකරුවන් පිළිබඳ සටහන රෝමානු කතෝලිකයන් පිළිබඳ සඳහනකි.

ජ. මාස 06 ට අධික නිහඩතාවයකින් පසුව වර්ෂ 2019 මාර්තු මස 16 වෙනිදා පමණ අබු හසාන් අල් - මුහජිර් නමැති අයි.එස් සංවිධානයේ ප්‍රකාශකයා ශ්‍රව්‍ය පටිගත කිරීමක් මුදාහැර තිබූ අතර එහි සඳහන් වූවේ නවසීලන්තයේ ඉස්ලාම් දේවස්ථානයකට එල්ලවූ ප්රහාර සඳහා ප්‍රතිප්‍රහාර එල්ලකිරීම අවශ්‍ය බවත් නවසීලන්තයේ ක්‍රයිස්ට් චර්ච්හි ඉස්ලාම් දේවස්ථාන දෙකක යාඥාවේ නිරතවී සිටී මුස්ලිම් බැතිමතුන් හතලිස් නමදෙනෙකුට මරු කැඳවීමට වර්ෂ 2019 මාර්තු මස 15 වෙනි දින සුදුජාතික ජාතිවාදී අන්තවාදීයෙකු විසින් එල්ල කරන ලද ප්‍රහාරය සමත්විය. ඉහත සඳහන් ශ්‍රව්‍ය පටිගත කිරීමේදී පැවසුනේ මුස්ලිම් දේවස්ථාන දෙකක සිදුවූ සමූල ඝාතනයේ දර්ශන දැකීමෙන් එතෙක් මුලාවට පත්වී සිටි අය ඒ මුලාවෙන් අවදි වියයුතු බවත් කලීෆටයේ (ඉස්ලාම් රාජ්‍යයේ) අධාරකරුවන්හට ඔවුන්ගේ ආගමේ නාමයෙන් පළිගැනීමට අනුබල දිය යුතු බවත්ය. මෙම

බුද්ධි තොරතුරු සියල්ලම පිළිබඳ රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂකවරයා දැනුවත්ව සිටියේය.

ට. මෙහි රූප සටහන අංක 2 යටතේ දැක්වෙන 2019 මාර්තු 26 දිනැති අභ්‍යන්තර රාජකාරී සංදේශය ඉස්ලාම් අන්තවාදය පිළිබඳ වන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් රාජ්‍ය බුද්ධි අංශයේ සියලු ජ්‍යෙෂ්ඨ හා අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් හට යොමුකොට ඇති අතර මෙහිදී තීරණාත්මක ලෙස මඟහැරී තිබේ. අදාළ සංදේශයේ සඳහන්ව ඇත්තේ සාදික්, ෂහීඩ් සහ සහරාන් විසින් මාවනැල්ලේ සිදුවූ ප්‍රහාර සඳහාත් නායකත්වය ලබාදී ඇති බවත් ඔවුන් අතරින් පළමු දෙදෙනා වර්ෂ 2018 දෙසැම්බර් 28 දින සිට වර්ෂ 2019 ජනවාරි මස 11 වෙනි දක්වා වනාතවිල්ලුවේ සැඟවී සිටින අතරතුර පුපුරන ද්‍රව්‍ය සහිත උපකරණ නිෂ්පාදනයේ නිරතවී ඇත. තවදුරටත් එහි සඳහන්ව ඇත්තේ මෙසේ සැඟවී සිටින තිදෙනාහට අයි.එස්. සංවිධානය අනුගමනය කරන ආකාරයේ

ප්‍රහාරයක් ශ්‍රී ලංකාව තුළ දියත් කිරීමේ හැකියාවක් ඇති බැවින් ඔවුන්ව හැකි ඉක්මණින් අත්අඩංගුවට ගත යුතු බවයි.

බුද්ධි තොරතුරු ලබා ගැනීම

පහත සඳහන් පුද්ගලයින් තිදෙනා අන්තවාදී මතවාද කෙරෙහි නැඹුරුව මෙරට මුස්ලිම් තරුණ පිරිස් යම් කලහකාරී ක්‍රියාවන් සඳහා මෙහෙයවීමට උත්සාහ දරණ බවට බුද්ධි තොරතුරු වාර්තාවී ඇත. එසේම මාවනැල්ල සිදුවීමට සම්බන්ධිතයින් කණ්ඩායම මෙහෙයවමින් අදාළ ප්‍රහාරයන් සඳහා නායකත්වය ලබාදී ඇති බැවින් විමර්ශණ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන පුද්ගලයින් වේ (පුද්ගලික විස්තර මේ සමග යා කර ඇත.)

| අනු අංකය | නම | ලිපිනය | ජා.හැ. අංකය/ උපන් දිනය | වි.ග.බ අංකය |
|---|---|---|---|---|
| 01 | මොහොමඩ් කාසිම් මොහොමඩ් සහ්රාන් | කුඩෙයිනරත් වීදිය, ටම්ෂේරම් පාර, නව කාත්තන්කුඩි 03 | 862014685 V 1986.07.19 | N 2017422 |
| 02 | මොහොමඩ් ඉබ්‍රාහිම් සහිද් අබ්දුල් හක් | අංක D/10/08, දෙල්ගහගොඩ, මාවනැල්ල | 921030800 V 1992.04.12 | N 3334020 |
| 03 | මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල් හක් | අංක D/10/08, දෙල්ගහගොඩ, මාවනැල්ල | 891492995 V 1989.05.28 | N 3295883 |

මොවුන් තිදෙනා අතරින් 01 සහ 02 පුද්ගලයින් දෙදෙනා අවසන් වරට 20181228 සිට 2019.01.11 දින දක්වා පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ රැදී සිටිමින් මාවනැල්ල සිදුවීමට පසු ද පුපුරණ ද්‍රව්‍ය යොදාගනිමින් පුපුරණ අභ්‍යාසයන් සකස් කිරීමට කටයුතු කරමින් සිට ඇති බවට බුද්ධි තොරතුරු ඇත.

මෙම පුද්ගලයින් රහසිගතව සැඟව සිටීම IS මාදිලියේ ප්‍රහාර මෙරට දියත් වීමට හේතුවක් විය හැකි බැවින් මොවුන් අත්අඩංගුවට ගැනීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මේ පිළිබඳව ඔබ අධීක්ෂණය යටතේ සිටින නිලධාරීන් දැනුවත් කරමින් මොවුන්ගේ සමීපතමයින් මගින් තොරතුරුකරුවන් ඇති කරගනිමින් මොවුන් පිළිබඳ වන තොරතුරු නොපමාව මා පහතාර අධ්‍යක්ෂ එච්කිව් සහ ස්ථානාධිපති එච්කිව් 02 දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

මේ පිළිබඳව ඔබ විසින් ලබාදෙන සහයෝගය ඉතා අගයකොට සලකමි

2019 අප්‍රේල් 9 වන දින ජාතික බුද්ධි ප්‍රධානී විසින් පොලිස්පතිවරයා වෙත රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයාගෙන් අප්‍රේල් 8 වන දින ලැබුණු ප්‍රකාශයට අදාළ ලිපියක් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලදි. එම දිනය තුළදීම පොලිස්පතිවරයා වෙත මෙම ලිපිය ලැබුණු අතර, අදාළ දිනය වන විට මෙම ලිපිය සහ රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා විසින් අප්‍රේල් මස 9 වෙනි දිනැතිව යොමු කරන ලද ලිපිය යන ලිපි දෙකම පොලිස්පතිවරයා සතු විය. පොලිස්පතිවරයා විසින් මෙම ලිපි දෙකම ජ්‍යෙෂ්ඨ උප පොලිස්පතිවරුන්හට (බස්නාහිර පළාත සහ රථවාහන), ජ්‍යෙෂ්ඨ උප පොලිස්පතිවරුන්හට(අපරාධ හා විශේෂ කාර්ය බලකා), පොලිස්පති (විශේෂ ආරක්ෂණ

පරාසය) සහ ත්‍රස්ත අපරාධ විමර්ශන කොට්ඨාශ අධ්‍යක්ෂවරයා වෙත "අවශ්‍ය පරිදි පසු විපරම් සඳහා" යන සටහන සහිතව යොමු කළේය. (උප ග්‍රන්ථ V)

මෙම තොරතුරු පිළිබඳ ක්‍රියාමාර්ග හෝ අතපසුවීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා ඇතුළු පොලිස් නිලධාරීන්ගේ වගවීම 20 වන පරිච්ඡේදයේ වෙන වෙනම සාකච්ඡා කෙරේ.

2019 අප්‍රේල් 18 වන දින දක්වා රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා විසින් ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු, ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස්, හෝ පොලිස්පති පූජිත් ජයසුන්දර සමඟ මීට අමතරව කිසිවක් සඳහන් කොට නැත.

2019 අප්‍රේල් 10 වන දින ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති එම්. ආර්. ලතීෆ් විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරීවරයා 2019 අප්‍රේල් 9 දිනැති පොලිස්පතිවරයාගේ ලිපියට ප්‍රතිචාර වශයෙන් ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය පොලිස්පති සන්තෝෂ් වර්මා සහ ආරක්ෂාව භාර නිලධාරී කර්නල් රවීන්ද්‍ර හමුවිය. රවීන්ද්‍රන් හමුවී ආරක්ෂක විධිවිධාන පිළිබඳව උපදෙස් දුන්නේය.

2019 අප්‍රේල් 12 වන දින තොරතුරු ලබාදුන් ඉන්දීය සහවරයා සති අන්තයේ පිටත සංචාරය කිරීමට නියමිතව තිබූ හෙයින් ඉන්දීය මහ කොමසාරිස්වරයාට නියමු මෝටර් රථයක් ලබා ගැනීම සඳහා පොලිස්පතිවරයා සමඟ කතා කරන ලෙස රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා සිටියේය. ට්‍රක් රථ ප්‍රහාර සම්බන්ධයෙන් ඔවුන්ට ලැබී ඇති තොරතුරු සැළකිල්ලට ගනිමින් මෙම ඉල්ලීම කරන බව පැවසීය. මෙයින් පෙනී යන්නේ ඉන්දියානු තානාපති කාර්යාලය විසින් සපයන ලද බුද්ධි අංශ තොරතුරු බැරෑරුම් ලෙස සැළකූ නමුත් රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂකගේ ස්ථාවරය වූයේ එහි විශ්වසනීයත්වය පිළිබඳව පවා ඔවුන්ට විශ්වාසයක් නොමැති බවයි.

2019 අප්‍රේල් 9 දිනැති ලිපිය පොලිස්පතිවරයා වෙත යැවීමට වැඩියමක් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා විසින් සිදු නොකළේ යන්න පිළිබඳව විමර්ශන කොමිසම විමතියට පත්වී ඇත. විශේෂයෙන් ඔහු එම ලිපිය අවසානයේ දක්වා ඇති පරිදි විදේශීය

සගයා විසින් සපයන ලද තොරතුරු පිළිබඳව රහසිගත පරීක්ෂණ පවත්වන බව සඳහන් කරමින්. 2019 අප්‍රේල් 17 වන දින තාලන්කුඩාහි යතුරුපැදි පිපිරීමක් සිදුවන තුරු වැඩිදුර තොරතුරු යැවීමට රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාට කිසිදු හේතුවක් නොතිබුණි.

රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා ඉන්දියානු සහවරයා විසින් ලබාදුන් බුද්ධි තොරතුරුවලට නිසි වැදගත්කමක් ලබාදී නොමැති බවට මෙය පැහැදිලි ඇඟවුමකි.

ඇත්තවශයෙන්ම අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා විසින් 2019 අප්‍රේල් 20 වන දින දක්වා සිය ඉන්දීය බුද්ධි සගයින්ගෙන් ලබාගත් බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි අංශහි වෙනත් කිසිදු අංශයක් සමඟ හුවමාරු කර නොගත්තේය. මෙය පුදුමයට කරුණකි. 2019 මාර්තු 26 දිනැති අභ්‍යන්තර සංදේශය සෙසු සියලු අංශ වෙත යොමු කිරීම සුදුසු යැයි ඔහු සිතීම පුදුමයකි. සහරාන්, සාදික් සහ ෂාහිඩ් සැඟවී සිටීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අයි.එස් සංවිධානය විසින් එල්ල කරන ආකාරයේ ප්‍රහාරයක් ඇතිවීමේ හැකියාව පිළිබඳව මෙහි සඳහන් වී තිබුණි.

2019 අප්‍රේල් 4 වන දින ලැබුණු බුද්ධි තොරතුරු සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය බුද්ධි අංශය තුළ සම්බන්ධීකරණ ක්‍රමවේදයක් නොමැතිකම, 2019 අප්‍රේල් 18 වන දින ජනාධිපතිවරයාට ඇති ආරක්ෂක තර්ජන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජනාධිපති ආරක්ෂක අංශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා කැඳවන ලද රැස්වීමකදී පිළිබිඹු විය. රාජ්‍ය බුද්ධි අංශයෙහි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් මෙම මාසික රැස්වීම සඳහා සහභාගී වූ අතර එහිදි වෙනත් කරුණු සඳහන් කරන අතරතුර ඔහු පවසා සිටියේ ජාතික තව්හිද් ජමාත් සංවිධානය සහ එහි නායක සහරාන් විසින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් නොවන පුද්ගලයින් මරාදැමිය යුතු බව සිය අනුගාමිකයින්ට පවසා ඇති බවයි. එහෙත් 2019 අප්‍රේල් 4 වන දින විදෙස් බුද්ධිඅංශ සගයකු වෙතින් ලැබුණු අනතුරු ඇඟවීම ගැන කිසිදු සඳහනක් කර නැත.

එම රැස්වීමේදීම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රන්දෙනිය විසින් (කොළඹ දකුණ සහකාර පොලිස් අධිකාරි) සඳහන් කල පරිදි අයි.එස්.සංවිධානයේ ශ්‍රී ලංකාවේ අධාරකරුවන්

ඔවුන්ගේ අතට හසුවන ඕනෑම දෙයක් යොදාගෙන ඝාතන සිදුකිරීමේ අදහසින් පසුවන බව හේතුවෙන් මේ පිළිබඳ වඩාත් ප්‍රශ්නකාරි තත්ත්වයක් උද්ගතවේ.

රාජ්‍ය බුද්ධි අංශයහි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට **2019** අප්‍රේල් **4** වන දින ලැබුණු බුද්ධි තොරතුරු ලබා දී නොමැති බව එයින් පැහැදිලි විය.

**2019** අප්‍රේල් **17** වන දින රාත්‍රී **8** ට පමණ. නැගෙනහිර පළාතේ පිපිරීමක් පිළිබඳ තොරතුරු රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාට ලැබුණි. පසුදා අළුයම ඔහුට පිපිරුම සිදුවූ ස්ථානයේ ඡායාරූප ලැබුණි. එය යතුරුපැදි පිපිරීමක් බව ඔහුට වැටහුණි. **2019** අප්‍රේල් 17 වන දින රාත්‍රී **7** ට පමණ ඉඩමේ හිමිකරු පොලිසියට පැමිණිලි කර තිබේ. අප්‍රේල් 16 වන දින රාත්‍රී **9.20** ට පමණ මෙම පිපිරීම සිදුව ඇති බව පරීක්ෂණවලින් හෙළි විය.

**2019** අප්‍රේල් **18** සහ **19** යන දෙදින තුළ රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක කාත්තන්කුඩි ප්‍රදේශයේ තාලන්කුඩා ප්‍රදේශයේ සිදුවූ යතුරුපැදි පිපිරීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ලිපි දෙකක් පොලිස්පතිවරයා වෙත යවා ඇති අතර මෙය නුවරඑළියෙහි පැවති පුපුරණ ද්‍රව්‍ය සැකසීම පිළිබඳ පුහුණු පන්තියේදී සඳහන් වූ ලෙස යතුරුපැදියක් භාවිතා කරමින් පිපිරීමක් සිදුකිරීමේ අත්හදා බැලීමක් බව දන්වා සිටියේය. ඔහුට අවශ්‍ය වූයේ යතුරුපැදි අංක **WP BCY 2183** නමැති යතුරු පැදිය පිළිබඳ සියලුම පොලිස් ස්ථාන වෙත දැනුම් දීමටයි. එය සහරන්ගේ කණ්ඩායම විසින් මිලදී ගෙන ඇත. ඔහු මීට පෙර අප්‍රේල් මස **18** වන දින පැය **14.57** ට ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා අමතා විමර්ශන කටයුතු පිළිබඳ තොරතුරු දන්වා තිබේ. ඇමතුම මිනිත්තු හතරකට ආසන්න කාලයක් පැවතුනි. ඔහු පිපිරුම සිදු වූ ස්ථානයේ පින්තූර ඇතුළත් වට්ස්ඇප් පණිවිඩයක් ද යවා තිබේ. එදිනම ප.ව. **3.08** ට පමණ පිපිරීම පිළිබඳ තොරතුරු රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා විසින් යුධ හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා වෙත මෙම පිපිරුම පිළිබඳ තොරුතුරු දැනුම් දී ඇත.

මීට පෙර **2019** අප්‍රේල් **18** වන දින රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක ඔහුගේ ඉන්දීය බුද්ධි සගයකු අමතා තාලන්කුඩා පිපිරීම පිළිබඳ තොරතුරු ලබාදී ඇති අතර ඒ පිළිබඳව වැඩි

විස්තර ඔහුගේ මූලාශ්‍රයෙන් ලබාගැනීමට ඔහුට අවශ්‍යවිය. අප්‍රේල් 20 වන දින උදෑසන මුලින් බුද්ධි තොරතුරු ලබාදුන් ඉන්දීය සගයා සංසරණය වෙමින් පවතින ලිපියක පිටපත් ඔහු වෙත යොමු කළේය. මෙම ලිපියේ අඩංගුවූවේ ඔහු විසින් පෙරදී සපයන ලද තොරතුරුය. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂගේ සාක්ෂියට අනුව සහරාන් සහ ඔහුගේ කණ්ඩායම පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගැනීමට ඔවුන්ට බාධාවක් විය හැකි බැවින්, මහජනතාවට මෙම තොරතුරු යොමු කිරීම පිළිබඳව අදාළ විදෙස් බුද්ධි අංශ සගයා කළබලයට පත්ව සිටියේය.

> ඒ එක්කම මම ඔහුට කතා කලා. මම කතා කරලා කිව්වා. ඔයගොල්ලන්ගේ නම මේ සම්බන්ධ නැහැ. ඔයගොල්ල ඒ ගැන කණගාටු වෙන්න එපා. මේක වෘත්තීමය භාවයෙන් අඩුයි. ස්වාමීනි ඒ තොරතුර අති රහසිගතයි කියලා ඉදිරිපත් කලේ. එතකොට ඒගොල්ලෝ ඒක ගැන පොඩි ගැටලුවක් තිබ්බා. තොරතුරු ලබාගැනීමට බාධාවෙයි කියලා මම කිව්වා ඒක ගැන එච්චර මේවා කරන්න එපා. මම ඔයගොල්ලන්ගේ නම කොහෙවත් කියලා යවලා නැහැ. ඒ ගොල්ලොන් worry වුනා තොරතුර එලියට ආව ගමන්. මම permission අරන් යැව්වට. එතකොට මේක හැමතැනම යනවනේ සර් කියලා මට කිවා. එතකොට ඒගොල්ලෝ පොඩි concern එකක් පෙන්වුවා මට. ඒ කියන්නේ තොරතුරු පත්‍රයත් ඒ විදියටම circular වෙලා තියෙන හින්දා. එතකොට ඒගොල්ලන්ට මට එයා කිව්වේ නෑ ඒක එදාමද ලැබුනේ කියලා. ඒ ගොල්ලන්වත් ඒක ලැබිලා තිබ්බා. ඒ කියන්නේ වචේටම ප්‍රහාරයට පෙර ගිහිල්ලා තියෙනවා.11වෙනිදා ඕක පල්ලලෙහාට යවලා තියෙන්නේ. ඒ අනුව 11 වෙනකොට ඒගොල්ලන්ට ලැබිලා තිබ්බා.

**(2020 අගෝස්තු 20 වන දින සාක්ෂි විමසීම)**

රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂකවරයා තම ඉන්දීය සගයාගේ ගැටළුව කෙරෙහි තම අවධානය යොමු කළ අතර යතුරුපැදි පිපිරීම පදනම් කරගෙන වැඩිදුර තොරතුරු ඉල්ලා සිටියේය.

2019 අප්‍රේල් 20 වන දින 16.12 ට අදාළ බුද්ධි සහයා විසින් පහත දැක්වෙන වට්ස්ඇප් පණිවිඩය යොමු කරන ලදි.

"විශ්වාසදායක තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ ජාතික තවුහීඩ් ජමාත්හි සහරාන් හසීම් සහ ඔහුගේ සගයන් ශ්‍රී ලංකාවේ ඉස්තිෂාඩ් ප්‍රහාරයක් එල්ල කිරීමේ සැලසුමක් දියත් කර

තිබේ. ඔවුන්ගේ සැලැස්මේ කොටසක් ලෙස ඔවුන් විසින් පෙර පුහුණුවක් පවත්වා පුපුරණ ද්‍රව්‍ය ඇටවූ ඇති යතුරුපැදියක් සමඟ ශ්‍රී ලංකාවේ කාත්තන්කුඩි ප්‍රදේශයට ආසන්න පාලමුනෙයිහිදී පිපිරීමක් සිදු කර ඇති බව තවදුරටත් දැනගන්නට ඇත. ඔවුන් 2014.4.21 දින හෝ ඊට පෙර ඕනෑම වේලාවක ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ ඉස්තිෂාද් ප්‍රහාරය එල්ල කිරීමට ඉඩ ඇති බව දැනගන්නට ඇත. ඔවුන් ඉන්දියානුවන් විශාල වශයෙන් ගැවසෙන දේවස්ථානයක් සහ හෝටලයක් ඇතුළු ස්ථාන 8 ක් තෝරාගෙන ඇති බව වාර්තා වේ. වැඩි විස්තර බලාපොරොත්තු වේ”

රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂ විසින් මෙම පණිවිඩය ආරක්ෂක ලේකම්, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති වෙත යොමු කරන ලද අතර ඊට පෙර ඔහු සිය බුද්ධි සගයා සමඟ කතා කළේ සංවාදයක් ලබාගැනීමේ සාමාන්‍ය ක්‍රියා පටිපාටිය ලෙසය.

“මම ඇහුවා එය ලබාගත්තේ දුරකථන පණිවිඩ පරීක්ෂාව ඇසුරෙන් ලබාගත් තොරතුරක්ද යනුවෙන් එවිට ඔහු පැවසුවේ නැත. මෙය ජීනමූලාශ්‍රයකින් ලබාගත් බවයි. මම කිව්වේ දැන් තහවුරු කිරීමක් තියෙනවා, මොකද ඔබ මේක දීලා තියෙනවා, ඔබ කතන්කුඩියේ සිදුවීම ගැන අපේ තක්සේරුව සනාථ කළා. මොකද අපි හොයා ගත්තා ඔවුන් මේ බයිසිකල් බෝල නමින් හඳුන්වන ලෝහ කොටස් වර්ගය ප්‍රහාරය සඳහා පාවිච්චි කරලා තියෙන බව එයින් හැඟවෙන්නේ ඔවුන් සූදානම් කියන එකයි. මොකද අපි මේ අයව හඳුනාගෙන තියෙනවා. එයාලා අඳුනගත්ත අයවත් ඒ අය දැකලා තියෙනවා. මොකද එයා මට උදේ කථා කරලා කිව්වා මම පොලිස්පතිතුමාට මේ අයගේ නම් සහ විස්තර එක්ක යවපු වාර්තාව ඔහුට ලැබිලා තියෙනවා. සහරාන්, රිල්වාන්, වගේ ඔය හැමෝ ගැනම එයා මට කිව්වා.

(අගෝස්තු මස 20 වන දින විභාග කරුණු අසුරිනි)

වට්ස්ඇප් පණිවිඩ යැවීමට අමතරව, රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂකවරයා පොලිස්පතිවරයා සමඟ කතා කළ අතර ඔහුගේ සගයාගෙන් ලැබුණු පණිවිඩය වාචිකව ඉදිරිපත් කළේය.

ඇමතුම 17.03.36 ට සිදුවූ අතර ඇමතුම් කාලය තත්පර 133කි. එවිට ඔහු විසින් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයාගෙන් ඉල්ලීමක් කොට ඇත්තේ මෙම පණිවිඩය ජ්‍යෙෂ්ඨ උපපොලිස්පති නන්දන මුණසිංහ මහතාටද බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ උපපොලිස්පතිවරයාටද යොමු කරන ලෙසයි. මෙවැනිම ඇමතුම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ උපපොලිස්පති රවිසෙනවිරත්න මහතාටද ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති ලතීෆ්ටද (අපරාධ හා විශේෂකාර්ය බලකාය බාර උපපොලිස්පති) ලබාදී තිබේ.

රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂකවරයා ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති නන්දන මුණසිංහ සහ උපපොලිස්පති (කොළඹ) ලලිත් පතිනායක යන අයව ඇමතීමට උත්සාහ කළ නමුත් එය සිදු කිරීමට ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් ඔවුන් දෙදෙනාම පසුව නැවත ඇමතුම් ලබාදුන් අතර රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂකවරයා එහිදි ඔවුනට පණිවිඩය ලබාදුන්නේය. ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති නන්දන මුණසිංහ සමඟ සංවාදය පැය 17.55 ට පමණ සිදු වූ අතර තත්පර 384 ක කාලයක් පැවතුනි.

පසුව රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා පැය 18.02 ට ආරක්ෂක ලේකම් අමතා ඔහුව යාවත්කාලීන කර පොලිස්පතිවරයා අමතන්නැයි ඉල්ලා සිටියේ අධ්‍යක්ෂ පොලිස් අධිකාරීවරයා සිතුවේ පොලිස්පතිවරයා තොරතුරු බැරෑරුම් ලෙස නොසළකන බවයි. මෙම සංවාදය තත්පර 202 ක් පැවතුනි.

තොරතුරු දැනගැනීම සඳහා සිංගප්පූරුවේහි සිට ජනාධිපති සිරිසේන මහතා සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ නමුත් එය කිරීමට අපොහොසත්වූ බව රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා සාක්ෂි දුන්නේය.

2019 අප්‍රේල් 20 වන දින රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂවරයා 2019 අප්‍රේල් 14 සිට 20 දක්වා කාල සීමාව සඳහාවූ සතිපතා බුද්ධි වාර්තාවේ සඳහන් කර ඇත්තේ 2019 අප්‍රේල් 16 වන දින කත්තන්කුඩිහි තාලන්කුඩා ප්‍රදේශයේ පිපිරීමක් සිදුවූ බව පමණක් වන අතර ඒ සඳහා සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සම්බන්ධවූ ආකාරය පිළිබඳ කිසිදු සඳහනක්

සිදුකොට නැති බව විමර්ශන කොමිසමට නිරීක්ෂණ විය. එනමුත් ඔහු සැකකටයුතු ජාලයන් දක්වමින් විශේෂ වාර්තාවක් පොලිස්පතිවරයා වෙත යවා තිබුණි. සතිපතා බුද්ධි වාර්තාව යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂකවරයා වෙතද යොමු කෙරේ හමුදා බුද්ධි අංශ සහ මෙහෙයුම් වපසරිය සහ සම්පත් රාජ්‍ය බුද්ධි අංශට වඩා වැඩි බැවින් මෙම තොරතුරු අනාවරණය නොවීම පුදුමයට කරුණකි.

ඒ වනවිට ලැබී තිබූ බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා රාජ්‍ය බුද්ධි අංශයේ සියලු සම්පත් යොදාගෙන තිබුණේ වර්ෂ **2019** අප්‍රේල් මස **20** වන දින බව පෙනී යයි. රාජ්‍ය බුද්ධි අංශයේ ඉස්ලාම් අන්තවාද පිළිබඳ සිද්ධි අධීක්ෂණය කරන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා විසින් සෙසු සියලු අංශ ප්‍රධානීන්හට දැනුම්දී සිටියේ සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විනාශකාරී ක්‍රියාවකට අර අඳින බව සහ ඒ සඳහා **WP DCY – 2183** අංක තහඩුව දරණ යතුරු පැදිය යොදාගත හැකි බවයි. තවදුරටත් එහි සඳහන්වූයේ සහරාන් සිය පාඨමාලාවලදී මුස්ලිම් නොවන අය සහ තම අදහස ප්‍රතික්ෂේප කරන අය මරාදැමීම ඉතා ශ්‍රේෂ්ඨ අයුරින් ජියාඩ් ඉටුකිරීමක් බව සඳහන් කොට ඇති බවයි.

**2019** අප්‍රේල් මස **21** වෙනි දින පෙරවරු **8.27** ට රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා වෙත තවත් පණිවිඩයක් ලැබුණේ ඔහුට මුලින්ම තොරතුරු ලබාදුන් ඉන්දීය බුද්ධි අංශ සගයාගෙනි. එහි සඳහන් වූවේ:

"මහත්මයාණෙනි ඔවුන්ගේ එක් ඉලක්කයක් වන්නේ කොළඹ මෙතෝදිස්ත දේවස්ථානයයි" එම මූලාශ්‍රයෙන්ම පහත දැක්වෙන පණිවිඩයද ඒ මොහොතේම ඔහු වෙත ලැබිණ 'සුභ උදෑසනක් ගරු මහත්මයාණෙනි. ඔවුන් ක්‍රියාත්මක වීමට ඉඩ ඇත්තේ අද දින පැය **06.00** සහ පැය **10.00** අතර කාලය තුළයි තවත් තොරතුරු බලාපොරොත්තුවෙන් සිටිමි. ඔබගේ කාරුණික දැන ගැනීම සඳහායි.'

රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා සැණකින් බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරයා වන නන්දන මුණසිංහ මහතා ඇමතූ අතර එහිදී මේ පිළිබඳ දැනුම්

දෙන ලදි. මෙම ඇමතුම සඳහා ගතවූ කාලය තත්පර **89** කි. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා සාක්ෂි දෙමින් පවසා සිටියේ මාර්ගයේ පොලිසිය යොදවා ඇත්ද යන්න ඔහු විමසූ බවයි. ඊළගට ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා සහ පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා අමතා තොරතුරු ලබාදී තිබේ.

ඉහත දක්වා ඇති කරුණු කාරණා වාචික හා ලේඛනමය සාක්ෂි මගින් සහ විමර්ශකයන්ගෙන් ප්‍රකාශ ඇතුළුව විමර්ශන කොමිසම ඉදිරියේදී ඉදිරිපත් කරන ලද සාක්ෂිවල කොටසකි.

# 14 පරිච්ඡේදය

## ප්‍රහාර

මෙම පරිච්ඡේදයේ අඩංගු වන්නේ වර්ෂ **2019** අප්‍රේල් මස **21** වන දින එල්ල වූ ප්‍රහාර පිළිබඳ විස්තරාත්මක ඉදිරිපත් කිරීමකි.

**01** කිංස්බරි හෝටලය

මුබාරක් විසින් මෙම මරාගෙන මැරෙන ප්‍රහාරය එල්ල කරන ලදි. **2019** අප්‍රේල් මස **17** වන දින පැය **14.00** ට, **201-4592** අංක තහඩු දරණ ත්‍රී රෝද රථයකින් ඉන්සාෆ් කිංස්බරි හෝටලය වෙත ගොස් ඇත. ඔහු පැය **14.12**ට පමණ එම හෝටයේ පිළිගැනීමේ කවුන්ටරය වෙත ගොස් අප්‍රේල් **20** වන දින සඳහා කාමර අංක **819** වෙන්කරවාගෙන ඇත. එය වෙන්කරවාගෙන ඇත්තේ අබ්දුල්ලා අබ්දුල්ලා යන නමිනි. CCTV කැමරා දර්ශන ඇසුරින් විමර්ශන කොමිසම නිරික්ෂණය කර ඇති ආකාරයට ඉන්ෂාෆ් අදාල හෝටල් කාමරය වෙන්කරවා ගැනීමට පිළිගැනීමේ කවුලුව වෙත පැමිණීමේදී එහි සවි කර ඇති කැමරාවේ වීඩියෝ දර්ශනවලට හසුවන සීමාවට ඉතාමත් වැඩිදුරක් පවතින ආකාරයෙන් ඒ වෙත ලඟාවී ඇති අතර ඒ මඟින් ඔහුගේ අනන්‍යතාවය පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි වන ලෙස කටයුතු කර ඇත. මෙයින් හැඟවෙන්නේ ඊට පෙර එම කණ්ඩායම විසින් හෝටලය අවට පූර්ව නිරීක්ෂණයක් සිදුකොට ඇති බවයි. කාමර වෙන්කරවා ගැනීමේ ලේඛනවල සඳහන්කොට ඇත්තේ මුහාරක්ට අයත් බව පසුව

හඳුනාගත් 0779207730 නමැති දූරකථන අංකයි. ඉන්පසුව ඉන්ෂාෆ් හෝටලයෙන් පිටව ගොස් ඇත්තේද ඉහත සඳහන් 201-4592 අංක තහඩුව දරණ ත්‍රීරෝද රථයෙන්ම වන අතර එය ගමන් කර තිබෙන්නේ ඩෑම් වීදිය දෙසටයි.

2019 අප්‍රේල් මස 20 වන දින පානදුර පරත්ත පාරේ ෂෙරිප් මාවතේ අංක 61/02, දරණ ලිපිනයෙහි පිහිටි නෂ්මියා විලා නමැති ආරක්ෂක නිවස්නයෙන් මුබාරග් පිටත්වී ඇති අතර ඒ සඳහා යොදාගෙන ඇත්තේ උබර් (Uber) කුලිරථ සේවය මඟින් ගෙන්වාගත් WPCBD-8510 දරණ අංක තහඩුව සහිත වාහනයෙනි. පැය 19.29ට පමණ ඔහු කිංස්බරි හෝටලයට ඇතුළුවී තිබේ. ඔහු සතුව පිටේ එල්ලාගෙන යන ගමන් මල්ලක් සහ කුඩා ගමන් මල්ලක් තිබී ඇත. ඔහු පිළිගැනීමේ කවුළුව වෙත ගොස් ඇත්තේ පැය 19.31ට වන අතර ඔහු තම ජාතික හැඳුනුම් පත ඉදිරිපත්කොට කාමර අංක 819 සඳහා යතුර භාරගැනීමට ඉතිරි ගෙවීමක්ද සිදුකොට ඇත. ඔහු කාමර අංක 819 වෙත පැය.19.42ට පමණ ඇතුළු වී ඇති අතර ඔහු පිටේ එල්ලාගෙන යන ඉතා බරැති ගමන් මල්ලක් සහ තවත් කුඩා ගමන් මල්ලක්ද අතේ එල්ලාගෙන එසේ ඇතුළු වී තිබේ. පැය 20.59 ට පමණ කුඩා ගමන් මල්ල අතැතිව මුබාරග් 819 පිටවී විදුලි සෝපානයෙන් බිම් මහලට ගොස් පිහිණුම් තටාක අන්තයෙන් හෝටලයේ ආලින්දයට පැමිණ ප්‍රධාන දොරටුවෙන් හෝටලයෙන් පිටවී ගොස් තිබේ. ඔහු ජනාධිපති මාවත ඔස්සේ ගාලු මුවදොර දෙසට ඇවිද ගොස් තිබේ. ඔහු උබර් කුලී රථ සේවයෙන් කුලී රථයක් ගෙන්වාගෙන ඇති අතර එම වාහනය පිළිබඳ තොරතුරු අනාවරණය වී නොමැත.

මුබාරක් කොලොන්නාවේ ලාෆ් සුපිරි වෙළඳ සැල වෙත 2019 අප්‍රේල් මස 20 වෙනි දින පැය 21.30 පමණ ඇතුළු වී ඇති බවට සාක්ෂි ඇති අතර එයින් ඔහු ටිපිටිප් ඇසුරුම් කීපයක් සහ රෙඩ්බුල් කෑන් එකක් මිලදී ගෙන තිබේ. මුබාරක් ජයන්ති මාවතේ පැය 23.26ට පමණ ඔහුගේ නිවස දෙසට ඇවිද යන අයුරු CCTV කැමරාවක සටහන් වී ඇති අතර එහි ලිපිනය වන්නේ අංක 22/1/1 ජයන්ති මාවත, කොලොන්නාව. මුබාරක් පැය 23.47ට පමණ නිශ්චිත තොරතුරක් නොදන්නා ත්‍රී රෝද රථයකින් නැවත හෝටලය පැමිණ තිබේ. CCTV ඔහු එම හෝටලය ඉදිරිපිට මාර්ගයේ අනිත් පස සිට පැමිණෙන අයුරු සහ හෝටලය ඇතුල් වන අයුරු පැය 23.46ට පමණ CCTV කැමරාවල සටහන්ව තිබේ. ඔහු කාමර අංක 819 වෙත ඇතුළුවී ඇත්තේ 2019.04.20 වන දින පැය 23.51ට පමණය.

2019 අප්‍රේල් 21 වන දින පැය 08.44 පමණ මුබාරක් විදුලි සෝපානයෙන් ඉවතට පැමිණ ඇති අතර පිටෙහි එල්ලන ගමන් මල්ලක් සහ අතේ රැගෙන යන ගමන් මල්ලක් සහිතවද හාබර් කෝට් අවනහල වෙත ගමන්කොට ඇත. විමර්ශන කොමිසම විසින් නිරීක්ෂණය කළ පරිදි මුබාරක් තම ජංගම දුරකථනයට නිතරම ශ්‍රව්‍ය පලඳනා උපකරණ ( Earphones) සවිකරගෙන ඒවා කනහි රුවාගෙන සිට ඇත. විමර්ශන ආයතන මඟින් ලබාගත් දූකරථන ඇමතුම් වාර්තාවලට අනුව මුබරක්හට ලැබුණු හෝ ඔහු විසින් ලබාදුන් අවසාන ඇමතුම් පිළිබඳ වාර්තාවී ඇත්තේ 2019 අප්‍රේල් 20 වන දින පැය 23.19.52 යන වේලාවේය. එම දූරකථන

ඇමතුම ලැබී තිබුණේ උබර් කුලී රථ රියදුරෙකුගෙනි. ඔහු සිය බෝම්බය පුපුරවා ගත්තේ 2019 අප්රේල් 21 වෙනි දින පැය 08.47. 06ට එම හෝටලයට අයත් හාබර්කෝට් අවන්හලේදීය. ඔහුගේ බිරිඳ හා දියණිය යොදාගෙන සිදුකළ ඩීන්.එන්.ඒ. පරීක්ෂණයේදී තහවුරු වූවේ මරාගෙන මැරෙන බෝම්බකරු මුබාරක් බවයි. මෙම මරාගෙන මැරෙන ප්‍රහාරයේ ප්‍රතිඵල ලෙස දස දෙනෙකුගේ ජිවිත අහිමිවූ අතර එසේ වාර්තාවුණු මරණ අතරින් 8 දෙනෙක් විදේශිකයන් වූ අතර ඉතිරි දෙදෙනා මෙරට වැසියන් වූහ. එහි තුවාල ලැබූ සමස්ථ සංඛ්‍යාව 23 දෙනෙකු වූ අතර ඒ අතුරින් 07ක් විදේශියන්ද ඉතිරි 16දෙනා ශ්‍රී ලාංකියන්ද වූහ.

02 ෂැංග්‍රිලා හෝටලය

2019 අප්‍රේල 17 වෙනි දින සිදුකළ පූර්ව නිරීක්ෂණයේදී ඉන්ෂාෆ් විසින් ABC 1090 අංක තහඩුව දරණ ත්‍රීරෝද රථයක් ෂැංග්‍රිලා හෝටලයට අනික් පස පිහිටි ටාජ් සමුද්‍රා හෝටලයට ගෙන්වාගෙන ඇත. ඉන්පසු ඔහු පැය 13.52 ෂැංග්‍රිලා හෝටලයට ඇතුළුවී මොහමඩ් හාම්සාඩ් යන නමින් පෙනී සිටිමින් අප්‍රේල් මස 20 වෙනි දින සඳහා කාමර අංක 616 වෙන්කරවාගෙන ඇත. කෙසේ වුවත් ඔහු කිසිදු ආකාරයක හැඳුනුම්පතක් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා මෙහිදි ලබාදී නොමැත. මේ කාමර වෙනකරවා ගැනීම සම්බන්ධ දත්ත ඇතුළත් කිරීමේ පෝරමයේ අදාළ කාමරයේ ලැගුම් ගන්නා පුද්ගලයාගේ නම ලෙස සඳහන් වෙන්නේ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් ලෙස වන අතර ඔහුගේ ලිපිනය ලෙස සඳහන් වෙන්නේ අංක 658 /90, මහවිල උයන කොළඹ 09. ඔහුගේ හැඳුනුම්පත්

අංකය ලෙස 862442067V සඳහන්කොට ඇත. මෙම කාමර වෙන්කිරීමෙන් පසු ඉන්භාග් ෂැංග්‍රිලා හෝටලයෙන් පිටව ගොස් ඇත්තේ 201-4592 අංක තහඩුව දරණ ත්‍රීරෝද රථයෙන් වන අතර කිංස්බරිහෝටලය වෙත එය ගමන් කර තිබේ. ඉන් පසුව හෝටලය සහ ඒ අවට පරිසරය සහරාන් සහ ඉල්හාම් විසින් පූර්ව නිරීක්ෂණයට ලක්කොට ඇත්තේ 2019 අප්‍රේල් මස 19 වන දින බව CCTV කැමරා දර්ශන මඟින් අනාවරණය වේ.

ඔවුන් උදෑසන 7.27ට පමණ CBB 3681 උබර් කුලී රථයෙන් ආර්.ඒ.ද මෙල් මාවත දෙසින් ෂැංග්‍රිලා හෝටලය වෙත පැමිණ ඇත. ඔවුන් දෙදෙනාම ටේබල් වන් අවහන්හලට උදෑසන 7.29ට ඇතුළුවී තිබේ. එහිදී රුපියල් 5599 සත 90ක් වටිනා ආහාර වේලක් ඔවුන් ලබාගෙන ඇත. ඔවුන් තෝරාගත් මේසය ස්ථානගතකොට තිබී ඇත්තේ 2019 අප්‍රේල් 21 වෙනි දින බෝම්බ පිපිරීම සිදුවූ එක් ස්ථානයක් දර්ශනය වන අකාරයටයි. ඔවුන් උදෑසන 9.22 ට CBC 7819 අංක තහඩු දරන උබර් කුලී රථයෙන් හෝටලයෙන් පිටවීමට පෙර උදෑසන 09.14 සිට ඔවුන් දෙපල තෙවන මහලේ පිහිටි ආලින්දයේ කාලය ගතකොට ඇත. ඔවුන් ඉන් පිටව ගොස් ඇත්තේ කොල්ලුපිටිය ලකි ප්ලාසා දෙසටයි.

2019 අප්‍රේල් 20 වන දින පැය 19.56ට WPPI 9289 අංක තහඩුව දරණ පික්මී කුලී රථයෙන් සහරාන් සහ ඉල්හාම් ෂැංග්‍රිලා හෝටලය වෙත පැමිණ තිබේ. ඔවුන් එහි පැමිණ තිබුණේ පානදුර, පරත්ත පාරේ, ෂෙරිෆ් මාවතේ, අංක 61/02 දරන ලිපිනයෙහි පිහිටි නෂ්මියා විලාහි සිට වන අතර ෂැංග්‍රිලා හෝටලයේ කාමර අංක

616 හි ඔවුන් නවාතැන් ගෙන ඇත. ඊට පෙර ඔවුන් පිළිගැනීමේ කවුළුව වෙත පැමිණ ඉල්හාම්ගේ හැඳුනුම්පත් අංකය ලබාදී කලින් වෙන් කර තිබූ කාමරය ලබාගෙන ඇති අතර සහරාන්ගේ තොරතුරු ලෙස ලබාදී ඇත්තේ අසාම් මොහමඩ් මුබාරක් යන නම වන අතර හැඳුනුම්පත් අංකය ලෙස 873340312V මෙම අංකය ලබා දී ඇත්තේ A 01921411 දරන රියදුරු බලපත්‍රය ඇසුරෙනි.

ඉල්හාම් පිටේ එල්ලාගෙන යන ගමන් මල්ලක් සහ තවත් ගමන් බෑගයක් රැගෙන කාමරයට ඇතුළු වූ අතර, සහරාන් ද එවැනිම කරේ එල්ලාගෙන යන ගමන් මල්ලක් සහ ගමන් බෑගයක් සහිතව සිටියේය. ඔවුන් දෙදෙනාම අප්‍රේල් මස 20 වෙනි දින පැය 20.11ට ෂැංග්‍රිලා හෝටලයේ 6 වන මහලේ පිහිටි කාමර අංක 617 වෙත පිවිසියෝය. රුපියල් 40,611 ක මුදලක් සෘජු මුදල් ගෙවීමක් ලෙස සිදුකළ බව දැක්වෙන බිල් පතක් ඊබ්‍රාහිම් ඉල්හාම්ගේ නමට කාමර නවාතැන් සමඟ උදෑසන ආහාරයද ඇතුළත් වනසේ නිකුත්කොට තිබුණි. ඉල්හාම් කාමරයෙන් සහ හෝටලයෙන් WPCAG 2763 දරණ අංක තහඩුව සහිත පික්මී කුළී රථයකින් නික්ම ගොස් ඇති අතර, එය ගමන්කොට ඇත්තේ ගල්කිස්ස ස්පෑන් ටවර්ස් වෙතයි. එහිදී ඔහු සැහැල්ලු පිටේ එල්ලන ගමන් මල්ලක්ද රැගෙන ගොස් ඇත. ඉල්හාම්ව නැවත දක්නට ලැබුණේ අප්‍රේල් මස 21 වන දින පැය 01.46ට CKY 1549 දරණ අංක තහඩු සහිත ඌබර් කුළී රථයෙන් නැවත හෝටලය වෙත පැමිණි මොහොතේදීය. 2019 අප්‍රේල් මස 21 වන දින ලබා ගත් සී.සී.ටී.වී දර්ශන මඟින් පෙනීයන්නේ ඉල්හාම් පැය 08.08ට කාමර අංක 616න් පිටවී තෙවන තට්ටුවේ

ඇති ආලින්දය වෙත විදුලි සෝපානය ආධාරයෙන් පැමිණෙන ආකාරයයි. ඒ මොහොතේ ඔහු කිසිදු ගමන් මල්ලක් රැගෙන ආවේ නැත. වෙනත් කැමරාවකින් ලබාගත් සී.සී.ටී.වී දර්ශනවලින් දක්නට ලැබෙන්නේ ඉල්හාම් විදුලි පියගැට පෙළක් ආධාරයෙන් පැය 08.13ට පමණ ගමන් කරන ආකාරයයි. දූරකථන ඇමතුමක් ගන්නා අතරතුර එම විදුලි පියගැට පෙළින්ම ඔහු තෙවන මහල වෙත පෙරවරු 8.19ට පමණ ගමන් කරන ආකාරය එම කැමරාවේම සටහන්වී ඇත. පෙරවරු 8.21ට පමණ ඉල්හාම් කාමර අංක 616 වෙත නැවත පැමිණ ඇත. ඉන්පසුව පෙරවරු 8.50ට සහරාන් සහ ඉල්හාම් යන දෙදෙනාම කාමර අංක 616න් පිටතට පැමිණි අතර, ඔවුන් ඉතා බරැති ගමන් මලුත් පිටේ එල්ලාගෙන සිටියෝය. ඉන්පසු තෙවන මහළ වෙත යාම සඳහා ඔවුන් විදුලි සෝපානය භාවිතා කරනු දක්නට ලැබිණි. විදුලි සෝපානය ඇතුළත ඇති සී.සී.ටී.වී කැමරා තුළ සටහන්වන්නේ ඉල්හාම් සහ සහරාන් එකිනෙකාට අතට අත දෙමින් සුභ පතන ආකාරයයි. ඔවුන් දෙදෙනා තෙවන මහළේ පිහිටි ටේබල්වන් අවන්හළ වෙත පෙරවරු 8.51ට පමණ ඇතුල් වූ අතර, එහිදී පාස්කු ඉරිදා දිනය වෙනුවෙන් විශේෂ උදෑසන ආහාරයක් පිළියෙලකොට තිබුණි. ඔවුන් දෙදෙනාම අවන්හළ ඇතුළට ඇවිද ගිය අතර, එහිදී සහරාන් ඉතා උනන්දුවෙන් වට පිටාව නිරීක්ෂණය කරනු දක්නට ලැබුණි. ඉල්හාම් අනික් පසට ඇවිද යන අතර දෙවන මහළ හා 3 වන මහළ සම්බන්ධ කෙරෙන පිටගැටපෙළ දෙසට ඔහු ගමන් කළේය. සී.සී.ටී.වී දර්ශනවලින් දර්ශනය වන පරිදි සහරාන් විසින් සිදුකරනු ලැබූ පළවන පිපිරීම 2019 අප්‍රේල් මස 21 වන දින පැය 08.54.17ට සිදුවී ඇති අතර, විදුලි

පියගැටපෙළ අසළ සවිකර තිබූ කැමරාවෙන් දර්ශනය වෙන ඉල්හාම්ගේ ගමන් මාර්ගය ලෙස දැක්වෙන්නේ ඔහු පියගැටපෙළ ඔස්සේ දෙවන මහළ වෙත ගමන් කරන ආකාරයයි. පළමු පිපිරීමත් සමඟ ඇණහිටි විදුලි පියගැටපෙළ ඔස්සේ ඔහු ඉහළට ගමන් කරන ආකාරය දර්ශනය වන අතර, එහිදී ඔහු පළමු පිපිරීමෙන් පසුව බේරී පළා යන කුඩා දරුවන්ද ඇතුළු පිරිස සමඟ සමීපවී ඔහු සතුව තිබූ බෝම්බය පුපුරුවා ගත්තේය.

පිපිරීම් දෙකෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයින් 35 දෙනෙකු (මෙරට වැසියන් 13 දෙනෙක් එනම් පුරුෂයින් 8 දෙනෙක් සහ කාන්තාවන් 5 දෙනෙක් සමඟ විදේශිකයන් 22 දෙනෙක් එනම් පුරුෂයින් 11 දෙනෙක්, කාන්තාවන් තිදෙනෙක් සහ කුඩා දරුවන් 8 දෙනෙක්) මිය ගියෝය. 34 දෙනෙකු තුවාල ලැබූහ. (මෙරට වැසියන් 22 ක් සහ විදේශිකයන් 12 ක්)

සහරාන්ගේ අනන්‍යතාවය සිය ඥාතීන් විසින් ඔහුගේ හිස හඳුනාගැනීමත් සමඟම හෙළි වූ අතර, එය තවදුරටත් තහවුරු වූයේ ඔහුගේ දියණිය රුදයිනාගේ හා සහින්දමර්දූ පිපිරීමෙදී මියගිය පුතුගේ ඩී.එන්.ඒ. සමඟ සන්සන්දනාත්මකව විශ්ලේෂණය කිරීමෙනි.

ඉල්හාම්ගේ අනන්‍යාතාවය තහවුරු කර ගන්නා ලද්දේ ඔහුගේ ඩී.එන්.ඒ. සාම්පල යූසුප් ඊබ්‍රාහිම් (ඔහුගේ පියා), ඉස්මයිල් ඊබ්‍රාහිම් (සහෝදරයා), ඉස්ලාල් ඊබ්‍රාහිම් (සහෝදරයා), ජුනයිඩීන් කාර්දිජා උම්මා (ඔහුගේ මව) සහ කොළඹ 9, මහවිල

ගාඩින්ස්හි පිපුරුම සිදුවූ ස්ථානයෙන් සොයාගත් පටක සාම්පල 10ක ඩී.එන්.ඒ. සමඟ සන්සන්දනාත්මකව විශ්ලේෂණය කිරීමෙනි.

3. සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය

මරාගෙන මැරෙන බෝම්බකරුවා ලෙස කටයුතු කළේ ඉන්ෂාෆ්ය. මරාගෙන මැරෙන බෝම්බකරු කාමර අංක 425 හි නවාතැන් ගෙන තිබිණි.

ඔහුගේ පියා වන මොහොමඩ් යූසුප් මොහොමඩ් ඊබ්‍රාහිම් සහ සහෝදරවරු වන මොහොමඩ් ඊබ්‍රාහිම් ඉස්මයිල් සහ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාල් අහමඩ් යන අයගේ ඩී.එන්.ඒ සාම්පල් ඇසුරෙන් විශ්ලේෂණ සිදුකෙරෙනු අතර ඒ අයුරින් ඔහුගේ අනන්‍යතාවය හෙළි කරන ලදි.

සී.සී.ටී.වී. කැමරාවල සටහන්වූ දත්ත අනුව අප්‍රේල් මස 20 වන දින පැය 19.07.38ට කුඩා ගමන් මල්ලක්ද රැගෙන ඉන්ෂාෆ් හෝටලය වෙත පැමිණ ඇත. පැය 19.08.25ට පමණ හෝටලයේ ඉදිරිපස කාර්යාලයට ඔහු ඇතුල් වූ අතර, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැති ව්‍යාජ නමක් ලබාදී ඔහු එහි ලියාපදිංචි වී ඇත. දුම්පානය සඳහාද ඔහු විශේෂයෙන් කාමරයක් ඉල්ලුම්කොට ඇත. පැය 19.17.02 ට පමණ ඔහු ඉදිරිපස කාර්යාලයෙන් පිටවූ අතර, කාමර අංක 425 වෙත ඇතුළුවීමට උත්සාහ කළේය. කාමරයේ යතුර ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඔහු නැවතත් ඉදිරිපස කාර්යාලයට පැමිණ ඔහුගේ බඩු බාහිරාදිය එහි තබා යයි. ප්‍රධාන දොරටුවෙන් පිටවන ඔහු, තමන් එහි පැමිණීමට භාවිත කළ රථ

පැහැති මෝටර් රථයේ සිටින අයෙකු සමඟ කතා බහක යෙදුණේය. ඔහු පිළිගැනීමේ කවුළුව වෙත නැවත පැමිණ පැය 19.31.23ට කාමර අංක 425 වෙත ගමන් කළේය. පැය 20.08.59ට පමණ ඉන්ෂාෆ් කාමරයෙන් පිටතට පැමිණි අතර, සුදු පැහැති මෝටර් රථයකින් හෝටලයෙන් පිටව ගියේය.

අප්‍රේල් මස 21 වන දින පැය 07.05.00ට පමණ ඉන්ෂාෆ් සිනමන් ග්‍රෑඩ් හෝටලය වෙත නැවත පැමිණි අතර, ඒ සඳහා භාවිතාකොට තිබුණේ WPCBD 8175 අංක තඹ්‍රූ දරණ නිල් පැහැති මෝටර් රථයකි. ඔහු එවර පැමිණෙන්නේ තමන් විසින්ම රැගෙන එන බරැති ගමන් මල්ලක්ද සමඟයි. පැය 07.09.04ට පමණ කාමර අංක 425 දරණ කාමරයට ඇතුල්වෙන ඉන්ෂාෆ් පැය 07.50ට පමණ ඔහු මැහුම් සඳහා භාවිත කරන උපකරණ කට්ටයක් ඉල්ලා සිටි බැවින් අදාළ හෝටලයේ පවිත්‍රා කාර්ය මණ්ඩලය මඟින් අදාළ උපකරණ ඔහුට ලබාදී ඇත. පැය 08.46.00ට පමණ කාමරයෙන් පිටවූ ඔහු තැප්ප්‍රබේන් අවන්හළට ඇතුල්වී එහි බුෆේ ක්‍රමයට පිළියෙළකොට තිබූ ආහාර ගැනීම පැය 08.49 පමණ සිදුකළේය. නැවතත් පැය 08.08ට පමණ නැවතත් සිය කාමරයට පැමිණෙන ඔහු පැය 09.07.43ට පමණ කාමරයෙන් පිටවී තැප්ප්‍රබේන් අවන්හළ වෙතට නැවතත් ගමන්කොට අසුනක හිඳගෙන තිබේ. විනාඩි කිහිපයකින් අනතුරුව පැය 09.11.28 ට එයින් නැගී සිටින ඔහු අවන්හළ මධ්‍යයට ගොස් පැය 09.12.33 ට බෝම්බය ක්‍රියාත්මක කරයි.

මෙහිදී අභාවයන් 22 ක් සහ තුවාල ලැබූ පුද්ගලයින් 17 දෙනෙක් වාර්තා වූහ.

4. කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය

කොළඹ රදගුරු දියෝසිසයට අයත් රෝමානු කතෝලික දේවස්ථානයක් වන කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය පිහිටා ඇත්තේ මීගමුව කටුවාපිටිය ප්‍රදේශයේය. ශාන්ත සෙබස්තියන් සාන්තුවරයාව ප්‍රකටවී ඇත්තේ රෝගීන්හට සුවය ලබාදීමෙන් හාස්කම් සහිත සාන්තුවරයෙක් ලෙසයි. වර්ෂ 2018දී මෙම දේවස්ථානය ඉදිකොට වසර 150ක් සපිරිනි. මරාගෙන මැරෙන බෝම්බකරුවා වූයේ හස්තුන්ය. ඔහු එහි පැමිණියේ කටුවාපිටිය උළුඅම්බලමේ දොන් ඩේවිඩ් මාවතෙහි අංක 394/A /21 දරණ ලිපිනයේ පිහිටි නිවසක සිටය. මෙම නිවස 2019 පෙබරවාරි 05 වන දින සිට කුළී පදනම මත ලබාගෙන තිබූ අතර, ඒ වෙත පදිංචිය සඳහා පිරිස ගොස් තිබුණේ 2019 පෙබරවාරි 16 වෙනි දින පමණ කාලයේ සිටයි. මෙහිදී වාර්තාවූ ආකාරයට මෙම නිවසේ තිබූ බඩු බාහිරාදිය අප්‍රේල් මස 9 වෙනි දින පමණ ඉවත්කොට තිබුණි. හස්තුන් 2019 අප්‍රේල් මස 20 වන දින රාත්‍රී 9ට පමණ මෙම නිවසට පැමිණ තිබුණේ මීගමුවේ තෙල්වත්ත හන්දියේ සිට ත්‍රිරෝද රථයකිනි. ඔහු මාර්ගය ඔස්සේ පැමිණෙන ආකාරය සහ දේවස්ථානයට ඇතුල්වන ආකාරය සී.සී.ටී.වී දර්ශනවලින් දැකගත හැකිය. ඔහු දේවස්ථානය වෙත මාර්ගය හරහා පැමිණෙනවිට කුඩා ගැහැණු දරුවෙක් ඔහු පැමිණෙන මඟ හරහා ගමන් කරන අතර, එහිදී හස්තුන් එම දරුවාගේ උරහිස සන්සුන්ව ස්පර්ශ කරනු දැකගත හැක. ඔහු දේවස්ථානයේ කොරිඩෝව දිගේ ගමන් කරන අතර, ඉදිරිපසින් දේවස්ථාන ශාලාවට ඇතුළුවී එහි රැස්ව සිටි භක්තිවන්තයින් අතරට ගොස් ඔහුගේ මරාගෙන මැරෙන බෝම්බ පුපුරවා හැරීම සිදුකරයි. මෙම ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස 115 දෙනෙකුට ජීවිත අහිමි වූ අතර, 302 දෙනෙකු තුවාල ලැබූහ.

කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බය පුපුරුවා ගත්තේ හස්තුන් යනවග හඳුනාගනු ලැබුවේ ඔහුගේ දෙමාපියන්ගෙන් සහ සොහොයුරාගෙන් ලබාගත් ඩී.එන්.ඒ. සාම්පල සමඟ විශ්ලේෂණය කිරීමෙනි.

5. කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය

මෙම මරාගෙන මැරෙන ප්‍රහාරය දියත් කරන ලද්දේ මුවාඩ් විසිනි. 2019 අප්‍රේල් 21 වෙනි දින එම දේවස්ථානය අසළට මුවාඩ් පැමිණියේ WPPJ 4080 දරණ අංක තහඩුව සහිත වෑන් රියෙනි. එම රථය ලියාපදිංචිකොට ඇත්තේ ක්‍රිංස්බරි හෝටලයේ බෝම්බය පුපුරුවා ගත් මුබාරක්ගේ නමිනි. ඔහු වෑන් රථයේ ඇති පුපුරණ ද්‍රව්‍ය සහිත ඇටවුම සක්‍රියකොට වෑන් රථයෙන් පිටතට බැස, ගමන් මල්ලක්ද පිටේ එල්ලාගෙන දේවස්ථානය තුළට ගමන් කළේය. 2019 අප්‍රේල් 21 වෙනි දින පාස්කු දින ශුද්ධවූ යාඥාව පූජ්‍ය ජෝෂප් ජෝයි මරියරත්නම් පියතුමා විසින් දෙමළ බසින් සිදු කරන ලදි. එය ආරම්භ වූයේ උදෑසන 8ට පමණය. මෙම මරාගෙන මැරෙන ප්‍රහාරය දියත් කරන ලද්දේ පෙරවරු 8.45ට පමණය. දේවස්ථානය තුළ භක්තිවන්තයින් සමහරු හිඳසිටි අතර, සෙසු භක්තිවන්තයින් සිටගෙන සිටියෝය. විශාල පිපිරුමක ශබ්දයක් සමඟ මරියරත්නම් පියතුමාට දක්නට ලැබුණේ දේවස්ථානයේ ගායක කණ්ඩායම වෙත හිසක් විසිවී යන ආකාරයයි. මුවාඩ්ගේ අනන්‍යතාවය තහවුරු කර ගන්නා ලද්දේ ඔහුගේ පියා වන අහමදු ලෙබ්බෙ අලව්දීන් සහ ඔහුගේ මව වන පකීර් මුගෙවුදින් වෝකීගෙන් ලබාගත් ඩී.එන්.ඒ. සාම්පල විශ්ලේෂණය කිරීමෙනි.

ජීවිත 56 ක් මෙහිදී අහිමිවූ අතර, තුවාල ලැබූවන්ගේ ගණන වාර්තා වන්නේ 148 දෙනෙක් ලෙසයි. පුපුරුවා හැරීම සඳහා ඇටවුමක් වෑන්රිය තුළ සක්‍රීය කර තිබූ බව හඳුනාගන්නා ලද්දේ මෙම පිපිරීම සිදුවූ ස්ථානය වෙත සම්භාවනීය පුද්ගලයින් කිහිප දෙනෙකුම පැමිණීමෙන්ද සුළු කාලයකට පසුවයි. විශේෂ කාර්ය බලකාය මඟින් අප්‍රේල් මස 22 වෙනි දින පස්වරු 3.26 ට පමණ එය පුපුරුවා හරින ලදි.

## 6. මඩකලපුව සියෝන් දේවස්ථානය

මරාගෙන මැරෙන ප්‍රහාරය එල්ල කරන ලද්දේ අසාද් විසිනි. 2019 අප්‍රේල් 20 වෙනි දින උදෑසන 11.21ට පමණ මුවාඩ් (කොච්චිකඩේ දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සිදු කළ තැනැත්තා මෙන්ම අසාද්ගේ මිතුරෙක්) විසින් ඔහුගේ දුරකථන අංකය වන 077-9814308 අංකයෙන් කල්මුණේ වෙත ගමන් කරන බස් රථවල ආසන වෙන්කරන ඒජන්තවරයෙක් වන උදුමා ලෙබ්බේ අබ්දුල් අලීම් නැමැත්තාගේ දුරකථන අංකය වන 077-2589057 අංකයට දුරකථන ඇමතුමක් ලබාදී ඇත. එම ඇමතුමෙන් මුවාත් දැනුම්දී සිටියේ කොළඹ සිට මඩකලපුව දක්වා ගමන් කිරීමට තමාහට ආසනයක් වෙන්කරවා ගැනීමට අවශ්‍ය බවයි.

එවිට අලිම් විසින් ඔහුගේ මිතුරෙකු වන මොහොමඩ් සකීල් බතුර්දීන් නැමැති දෙහිවල ප්‍රදේශයේ බස් සඳහා ආසන වෙන්කිරීමේ සේවා ආයතනයක් පවත්වාගෙන යන පුද්ගලයකු හට උදෑසන 11.23ට පමණ ඇමතුමක් ලබාගෙන ආසනයක් වෙන්කොට ගෙන ඇත. ඉන් පසු ආසන වෙන්කිරීම පිළිබඳ අලීම් විසින් මුවාත්ව දැනුවත්කොට ඇති අතර දෙහිවල ප්‍රදේශයේ බස් සඳහා ආසන වෙන්කිරීමේ සේවාව පවත්වාගෙන යන සකීල් බතුර්දීන් නමැත්තාව සම්බන්ධ කරගැනීම සඳහා තොරතුරු ලබාදී ඇත. ඉන් අනතුරුව මුවාත් සකීර්ව අමතා ආසන වෙන්කිරීම පිළිබඳ තහවුරුකොටගෙන ආසාත්ගේ දුරකථන අංකය ලබාදී ඇත. 2019 අප්‍රේල් මස 20 වන දින පස්වරු 8.07, 8.22ට සහ 8.34 අසාද් විසින් සකීල්හට තෙවරක් දුරකථනයෙන් අමතා ඇති අතර ඒ සඳහා යොදා ගෙන ඇත්තේ ප්‍රහාරයෙන් පසුව ඒ සිදුවූ ස්ථානයේ තිබී සොයා ගත් සිම් පතයි. කොළඹ සිට කල්මුණේ බලා පිටපත් වූ EPMD 2664 දරණ අංක තහඩු සහිත සුබෝපබෝගී බස් රථයට මරදාන, සහිරා විද්‍යාලය ඉදිරිපිට බස්නැවතුම්පොළෙන් අසාද් ගොඩවී තිබේ. ඔහු ගමන් මළු දෙකක් රැගෙන යමින් සිට ඇත. පැය 20. 51ට එම බස් රථය මරදාන සහිරා විදුහල අසළින් පිටපත් වන අතර ඒ මඩකලපුව නගරයට ලඟා වන්නේ 2019 අප්‍රේල් මස 21 වන දින අලුළුයම 2.12ට පමණය. මඩකලපුව නගරයෙන් බැසගත් පසුව අසාද් අලුයම 2.14ට පමණ ත්‍රිරෝද රථයකට නැගී මඩකලපුවේ ජම්මූස් සම්මාන් ජුම්මා දේවස්ථානය වෙත ගමන්කොට අළුයම 2.16ට පමණ ඉන් බැස තිබේ. මෙම දේවස්ථානය පිහිටා තිබෙන්නේ මඩකලපුව අධිකරණ සංකීර්ණයට යාබදවයි. මස්ජිදයේ දොටුවට

අගුලුලා තිබූ අතර පෙරවරු **4.38** පමණ දොරටුව විවෘත කරනතුරු ගමන්මළු දෙකක් සමඟ අසාද් එහි රැඳී සිට ඇත. ඊට පෙර මස්ජිදයේ ඉදිරිපිටින් මුර සංචාරයේ යෙදෙන පොලිස් ජීප්රථයක්ද දැකිය හැක. පෙරවරු 4.39ට පමණ ගමන් මළු දෙකකද රැගෙන අසාද් මස්ජිදය ඇතුළට ගමන් කළේය. මෙම මස්ජිදය තුළ බාහිර පුද්ගලයන්හට කුලී පදනම මත ලබාදී ඇති කාමර 06ක් පිහිටා ඇති අතර ඕනෑම අයෙකුට විවේක ගැනීම සඳහා විවේකාගාරයක්ද මෙහි තිබේ. මෙම මස්ජිදය තුළ ඇති පොදු විවේකාගාරය තුළ තම ගමන් මලු තැන්පත් කරන අසාද් ස්වභාවික ලෙස හැසිරී තිබේ. ඔහු මස්ජිදයේ නාන කාමරයද භාවිතාකොට ඇති අතර පෙරවරු **5.30** පමණ මස්ජිදයේ ප්‍රධාන කොටසට ගොස් උදෑසන යාඥාවේද යෙදී ඇත. උදෑසන **8.31**ට පමණ අසාද් එක් ගමන් මල්ලක් පිටේ එල්ලාගෙන අනික් ගමන් මල්ල අතෙහි රැගෙන දේවස්ථානයෙන් පිටවී තිබේ. **2019** අප්‍රේල් මස **21** වෙනි දින උදෑසන **8.40** ට පමණ ඔහු සියෝන් දේවස්ථානයට පැමිණ තිබේ.

උදෑසන **9.03** පමණ ඔහු බෝම්බය පුපුරවා හැර තිබේ. මෙහිදී **31** දෙනෙකු පමණ මිය ගිය අතර ඒ අතර වූ බහුතරය කුඩා දරුවන් වූහ. තුවාල ලැබූවන් **72** ක් පිළිබඳ වාර්තාවී ඇත.

රමේෂ් රාජු මාතාගේ නිර්භීත මැදිහත්වීම නොවන්නට මෙහිදී අහිමි වන ජීවිත ගණන මීට වඩා වැඩිවන්නට ඉඩ තිබිණි. දේවස්ථානයෙන් පාස්ටර්වරයෙකු ලෙස කටයුතු කළ නාගයියා ස්ටැන්ලි යන අයහට දේවස්ථානයේ දොරකඩ අසළ

සිටගෙන සිටි අසාද් පිළිබඳව සැක පහළවී ඇති අතර ඔහු විසින් රමේෂ් රාජ මහතාගෙන් ඉල්ලා සිට ඇත්තේ ආචාරශීලි අයුරින් ඔහුව එම ස්ථානයෙන් රැගෙන යන ලෙසටයි. එමනිසා දේවස්ථානය තුළට පැමිණ බෝම්බ පුපුරවා හැරීමෙන් අසාද්ට වැළැක්වීමට ඔහුට හැකිවිය. විමර්ශන කොමිසම විසින් රජයට නිර්දේශකොට ඇත්තේ සියෝන් දේවස්ථානයේදී ජීවතක්ෂයට පත්වූ රමේෂ් රාජු මහතාගේ ළඟම ඥාතියෙකුහට අහිමිවූ ජීවිත ගණන සැළකිය යුතු ප්‍රමාණයකින් අවම කිරීමට සමත්වූ ඔහුගේ නිර්භීත ක්‍රියාවට උපහාරයක් වශයෙන් යම් මූල්‍යයම ප්‍රධානයක් සිදු කරන ලෙසයි.

අසාද්ගේ මවගෙන් ලබාගත් ඩී.එන්.සාම්පල ඇසුරෙන් සිදුකරන ලද විශ්ලේෂණයේදී මරාගෙන බෝම්බකරුවා අසාද් බවට තහවුරු කරගෙන තිබේ.

07 කොළඹ 09 මහවිල උයනෙහි අංක 658/90 දරන ස්ථානයෙන් සිදුවූ පිපිරීම

2019 අප්‍රේල් මස 21 වන දින උදෑසන කොළඹ ප්‍රදේශයේ හෝටල් තුනක සිදුවූ පිපිරීම් පිළිබඳ විමර්ශනය මත පදනම්ව කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් කොළඹ 09, මහවිල උයනෙහි අංක 658/90 දරන නිවස වෙත ගියහ. මෙම නිවස ඉන්සාෆ් හා ඉල්හාම්ගේ දෙමව්පියන්ට අයත්, ඉල්හාම් ඇතුළු පවුලේ සැම විසූ නිවසයි. කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරින් නිවසේ දොරට තට්ටු කර ඇතුළුවී එහි සිටි අයගෙන් ප්‍රශ්න කිරීම ආරම්භ කළහ.

ඒ අතරතුර කණ්ඩායමේ නිලධාරීන් තිදෙනෙක් සෝදිසිකිරීම සඳහා පළමු මහල වෙත ගිය අවස්ථාවේ පැය 14.36ට පමණ එහි පිපිරීමක් සිදුවිය. පැය 14.53ට පමණ දෙවන වරටද එහි පිපිරීමක් සිදුවිය. මෙම නිලධාරීන් තිදෙනාම එම සිදුවීමෙදී ජීවිතක්ෂයට පත්වූ අතර ඉල්හාම්ගේ බිරිඳ වන ෆාතිමා මොහමඩ් ජෙෆ්රි සහ ඔවුන්ගේ දරු තිදෙනාද ඒ සමඟම මියගියහ. (මෙම පිපිරීම සිදු වන අවස්ථාවේ ෆාතිමා ගැබිණියක්ව සිටියාය)

ඉහත දක්වා ඇති කරුණු කාරණා, වාචික හා ලේඛනමය සාක්ෂි මගින් සහ විමර්ශකයන්ගෙන් ප්‍රකාශ ඇතුළුව විමර්ශන කොමිසම ඉදිරියේදී ඉදිරිපත් කරන ලද සාක්ෂිවල කොටසකි.

15 පරිච්ඡේදය

## ට්‍රොපිකල් ඉන් තනායමේ සිදුවූ පිපිරීම

ටාජ් සමුද්‍රා හෝටලය ඉලක්ක කොට ගත් මරාගෙන මැරෙන ප්‍රහාරය අසාර්ථක වීම පිළිබඳව විවිධමත පලවේ. බෝම්බය පුපුරා නොයාම යන කාරණයේ සිට ප්රහාරය අත්හිටුවීමේ තීරණයක් ගැනීම දක්වා වන පරාසයට විහිදෙන විස්තරාත්මක පැහැදිලි කිරීම් කීපයක්ම මේ සම්බන්ධයෙන් ගෙනහැර පානු තිබේ. විමර්ශන කොමිසම විසින් මෙම සිදුවීම හා සම්බන්ධ සිද්ධීන් අධ්‍යයන කොට කොමිසමේ නිගමන ඉදිරිපත්කොට තිබේ. ටාජ් සමුද්‍රාහෝටලයේදී සහ දෙහිවල ට්‍රොපිකල් ඉන් ළැඟුම්හලේ පසුව ඇතිවූ සිදුවීම් පිළිබඳ වඩා හොද අවබෝධයක් ලබාගැනීම සඳහා විමර්ශන කොමිසම විසින් 2019 අප්‍රේල් මස 20 වන දින සිට 2019 අප්‍රේල් මස 21 වෙනි දින දෙහිවල ට්‍රොපිකල් ඉන් ළැගුම්හලේ පිපිරුම සිදුවූ වේලාව දක්වා ජමීල් නැමැත්තා සිදුකළ ගමන් පිළිබඳව සම්පව අධ්‍යයනය කරන ලදි.

වැල්ලම්පිටියේ සිට පිහිටි සිය නිවසින් අප්‍රේල් මස 19 වන දින රාත්‍රී 09.50ට පමණ පිටත් වූ ජමීල්, තමන් ජමාත් වන්දනාවක යන බව පවසා සිටියේ යැයි සාක්ෂි ලබාදීමේදී ඔහුගේ බිරිඳ වන ඔමාර්කතා පැවසීය. කොළඹ 03 ධර්මපාල මාවතේ, අංක 60 ඒ, දරන ස්ථානයේ පිහිටි ඩයිනමෝන් අවන්හල වෙත රාත්‍රී 10.12ට පමණ පැමිණි ඔහු එහෙම ආහාර පාර්සල කීපයක් ඇණවුම්කර ඒවා ලැබෙන තෙක් රාත්‍රී 10.37 දක්වා එහි රැඳී සිට ඇත. ඊළඟට ඔහු පානදුර, පරත්ත පාරේ පිහිටි ආරක්ෂක නිවෙස්නය වෙත ගොස් තිබේ. අප්රේල් 20 වන උදෑසන පෙරවරු 10.50ට පමණ පානදුර පිහිටි ආරක්ෂක නිවෙස්නයෙන් පිටවූ ජමීල් උබර් කුලි රියක් ගෙන්වාගෙන ගල්කිස්සේ

පන්සල පාරේ අංක 41 දරණ ලිපිනයෙහි පිහිටි ස්පෑන් ටවර්ස් වෙත පෙරවරු 11.53ට පමණ පැමිණ තිබේ. මෙම ස්ථානයද ආරක්ෂිත නිවෙස්නයක් ලෙස භාවිත කර ඇති බව සඳහන් වේ. ඔහු එම ස්ථානයෙන් පස්වරු 4.32 පමණ පිටවී ඇති අතර පස්වරු 4.52ට පමණ ටාජ් සමුද්‍රා හෝටලයට ඔහු පැමිණ තිබේ. පස්වරු 4.54ට ජමීල් විසින් මොහොමඩ් ජමීල් නමැති නම භාවිතා කොට කාමරයක් වෙන් කරවා ගත් අතර ඔහුගේ ලිපිනය ලෙස ලබාදී තිබුණේ අංක 49 වැල්ලම්බොඩ, මහනුවර ලෙසයි. ඔහු එකවරම පැමිණ කාමරයක් ඇණවුම් කල අමුත්තෙකු බැවින් පිළිගැනීමේ නිලධාරිනිය විසින් කාමරය වෙන් කිරීමට පෙර රාජකාරියෙන් යුතු කලමණාකාරවරයාගෙන් ඒ පිළිබඳ අවසර පතා ඇති අතර ඔහු විසින් කාමර වෙන්කිරීම අනුමත කර තිබේ. ජමීල් විසින් එක් දිනක් සඳහා උදේ ආහාරයද සහිත කාමරය ඇනවුම් කර තිබේ. කාමර අංක 365 දරණ කාමරය එහිදී ජමීල් වෙත ලබාදී තිබේ. පස්වරු 5.44ට පමණ ඔහු හිස් අතින් හෝටලයෙන් පිටතට පැමිණි අතර සුදු පැහැති මෝටර් රථයකට ගොඩවී හෝටලයෙන් (CAP-2828 අංක තහඩුව දරණ හොන්ඩා වෙසල් වර්ගයේ රථයකි) පිටව ගොස් ඇත. පස්වරු 6.30ට පමණ පානදුර පරත්ත පාරේ පිහිටි ආරක්ෂක නිවස්නය වෙත ඔහු පැමිණ තිබේ. ඉන් මද වේලාවකට පසු රාත්‍රී 7.00 පමණ ජමීල් එම ස්ථානයෙන් පිටපත්ව PJ 4080 දරන අංක තහඩු සහිත වෑන් රථයකින් ස්පෑන් ටවර්ස් වෙත ළඟාවී තිබේ. ඒ වන විට වේලාව රාත්‍රී 7.33ට පමණ වී ඇති අතර ඔහු එහි රාත්‍රිය ගතකොට තිබේ. අප්‍රේල් මස 21 වෙනි දින උදෑසන 6.38ට පමණ CBD 8175 දරන අංක තහඩු සහිත වාහනයකින් ස්පෑන් ටවර්ස් වෙතින් පිටවන ජමීල් උදෑසන 7.07 වන විට ටාජ් සමුද්‍රා හෝටලය වෙත පැමිණ තිබේ. උදෑසන 8.48ට පමණ ගමන් මල්ලක් සහ පිටේ එල්ලාගෙන යන මල්ලක්ද රැගෙන සිය

කාමරයෙන් පිටතට පැමිණෙන ඔහු පහළ මහලේ ඇති අවන්හල වෙත ගොස් එහි පිටතින් ගමන් මල්ල තබා පිටේ එල්ලාගෙන යන ගමන් මලුද සමඟ අවන්හලට ඇතුළුවී තිබේ. මුලින්ම ඔහු ආහාර තබා ඇති මේසය වෙත ගමන් කරන අතර ඒ වන විට වේලාව පෙරවරු **8.49**ට පමණ වී ඇත.

මෙම කාලය තුළ ඔහු විසින් නිශ්චිත සිදු කරන ලද සෑම දෙයක්ම විමර්ශන කොමිසම වෙත සාක්ෂි ලෙස ලැබුණු CCTV දර්ශන තුළ අන්තර් ගතවී නොමැත.

පෙරවරු **8.51**ට පමණ අවන්හලෙහි අසුනක හිඳ ගන්නා ජමීල් ඔහු පිටෙහි පැළඳ සිටි ගමන් මල්ල සිය උකුලමතට ගෙන එහි මතුපිට පරීක්ෂා කිරීම ආරම්භ කළේය. ඉන් මද වේලාවකට පසු ඔහුගේ දුරකථනයට ඇමතුමක් ලැබෙන බව පෙනී යයි. එම ඇමතුම කවරෙකුගෙන් ලැබුණු කුමන ආකාරයේ ඇමතුමක්ද යන්න පැහැදිලි නැත. නමුත් විමර්ශන කොමිසම නිරීක්ෂණය කරන ලද කාරණයක් වන්නේ එම ඇමතුම ඔහු වෙත ලැබුණේ ජමීල් විසින් ඔහුගේ ගමන් මල්ල පිරික්සීම ආරම්භ කිරීමෙන් පසුව බවයි.

ඉන් සුළු වේලාවකට පසු ඔහු අවන්හලින් පිටවූ අතර හෝටලයෙන්ද නික්ම ගොස් ඇත. ඔහු පිටතට යන අතරතුර අත්වැරදීමකින් ඔහු අවන්හලේ පිටත තබා තිබූ ගමන් මල්ල දමා ගොස් ඇත. එබැවින් හෝටල් කාර්ය මණ්ඩල සමාජිකයෙක් පැමිණ එය ඔහුහට ලබාදී ඇත. ඔහු හෝටල් පරිශ්‍රයෙන් පිටව ගාලු පාරට පැමිණ ඇත.

උදෑසන **8.55**ට පමණ **QW-1890** දරණ ත්‍රීරෝද රථය කැඳවූ ජමීල් එහි නැඟී දෙහිවල දෙසට ගමන් කරයි. විමර්ශන කොමිසම විසින් අදාළ ත්‍රීරෝද රථය පැදවූ රියදුරු

විමලසේන පෙරේරාගේ සාක්ෂි විමසා තිබේ. ඔහු සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කර සිටියේ ජමිල් විසින් දෙහිවල දෙසට ගමන් කරන ලෙස ඔහුට පැවසූ බවයි.

අතර මඟදී වැල්ලවත්තට නුදුරු ස්ථානයක නවත්වන ලෙස ජමීල් විසින් ඔහුට පවසා ඇත. ඔහු වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව අසලින් බැස බස්නැවතුම්පොල වෙත ගමන් කළේය. ABH **1241** දරණ අංක තහඩුව සහිත ත්‍රී රෝද රථයෙන් ජමිල් ට්‍රොපිකල් ඉන් ලැගුම්හල වෙත ගමන් කළේය. එම ත්‍රීරෝද රථයේ පැදවූ රියදුරු වන දේවාගෙදර රණවීර විමර්ශන කොමිසම ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කරමින් පවසා සිටියේ 21 වෙනිදා උදෑසන දෙහිවල සිට වැල්වත්ත ඩෙල්මන් රෝහලවෙත රෝගීයෙක් රැගෙන යාම සඳහා ඔහුට පැවරුණු අතර එම ගමන නිමාකොට ඔහුට දෙහිවල දෙසට යායුතු වූ බැවින් වැල්වත්ත හන්දියේදී ඔහු යූටර්න් එකක් දැමූ බවයි. එතැන බස්නැවතුමක් තිබූ අතර එහි සිට ජමීල් සිය රථයට නැඟ සත්ව උද්‍යානය අසළ හෝටලයකට ඔහුව රැගෙන යන ලෙස පැවසූ බව රියදුරු සඳහන් කළේය.

ඔහු කලින්ද ට්‍රොපිකල් ඉන් ලැගුම්හල වෙත මගීන්ව රැගෙන ගොස් තිබූ බැවින් රණවීර, ට්‍රොපිකල් ඉන් ලැගුම්හල පිළිබඳ දැන සිට ඇත. උදෑසන **9.25** පමණ ජමිල්ව ඔහු විසින් එම ස්ථානයට රැගෙන ගොස් ඇති අතර ලැඟුම්හල පවත්වාගෙන යන සුමිත් විජේලාල්හට ජමීල්ව හඳුන්වදී ඇත. කොමිසම ඉදිරියේ සාක්ෂි ලබාදුන් විජේලාල් පවසා ඇත්තේ ඔහු උදෑසන **9.25**ට පමණ ලැඟුම්හල සේවා සඳහා විවෘත කල අතර එදින උදෑසන රණවීර විසින් ජමීල් කැටිව පැමිණ විට ඔහු වායු සමනය කරන ලද කාරමයක් තෝරාගෙන ඒ සඳහා මුදල් ගෙවූ බවයි. ජමීල් විසින් ගමන් මළු දෙකක් රැගෙන විත් තිබූ

අතර ඒවායින් එකක් පිටේ එල්ලාගෙන යන වර්ගයේ ගමන් මල්ලක් විය. ජමීල්ගේ ජාතික හැඳුනුම්පත ලබාගත් විජේලාල් එය සිය ලාච්චුවෙහි දමා ඇත. ඊළඟ දිනයේ උදෑසන තෙක් එම කාමරයේ ලැගුම් ගන්නා බව ජමීල් ඔහුට දැනුම්දී තිබේ. ඉන් පසු ජමීල් පිළිගැනීමේ කවුළුව වෙතින් නික්ම ඔහුගේ ගමන් මලුද රැගෙන කාමරය ඇතුළුවී ඇත. මදවේලාවකින් පසු කාමරයෙන් පිටවූ ජමිල් පිටතට ගියේ හිස් අතිනි.

පෙරවරු 9.35ට පමණ ජමීල් ට්‍රොපිකල් ඉන් ලැගුම්හලින් පිටපතට පැමිණෙන ආකාරය CCTV කැමරාවල සටහන්වී ඇත. හිල් ස්ට්‍රීට්හි අංක 46 A දරණ ස්ථානයෙහි ඇති 'කූල්බේබි' නමැති වෙළඳසැල පෙරවරු 9.38 පමණ පසුකර ගොස් ඇති අතර උදෑසන 9.40 ට පමණ කොළ පැහැති ත්‍රීරෝද රථයකට ගොඩවනු දක්නට ලැබී තිබේ.

එබනිසා ප්‍රදේශයේ පිහිටි මුස්ලිම් දේවස්ථානය වෙත ජමීල් උදෑසන 9.51ට පමණ වන විට පැමිණ ඇති අතර ඒ තුළට ගොස් තිබේ. ඉන් පසු උදෑසන 10.03ට පමණ දේවස්ථානයෙන් පිටතට පැමිණෙන ඔහු ගාලුපාර වෙත ගොස් AAT-2112 දරණ අංක තහඩුව සහිත ත්‍රීරෝද රථයට ගොඩවී තිබේ. ඔහු මද වේලාවක් කොළඹ දෙසට ගමන් කරන අතර රාමක්‍රිස්න මාවතට හරවා මුහුදු බඩ මාර්ගය ඔස්සේ නැවතත් දේවස්ථානය දෙසට පැමිණ ඇත. පෙරවරු 10.20ට පමණ ඔහු නැවතත් දෙවස්ථානය වෙතට ගොස් පොළව මත හිඳ සිට ඇත. ඉන්පසු පෙරවරු 10.23ට පමණ එතැනින් නැගිට දේවස්ථානයෙන් පිටතට ඔහු ගමන්කොට ඇත. පෙරවරු 10.29ට ඔහු නැවත පැමිණෙන අතර පෙරවරු 10.34ට පමණ තවත් පිරිසක්ද සමඟ වෙනත් අයකුගේ දුරකථනයකින් ඔහු යමක් නරඹන ආකාරයේ දක්නට ලැබී ඇත. නැවතත් පෙරවරු 10.50ට පමණ

නොදන්නා වෙනත් පුද්ගලයකුගේ දුරකථනයක් ආධාරයෙන් ඔහු යම් කිසිවක් නරඹමින් සිටි ආකාරය නිරීක්ෂණයවී තිබේ.

උදෑසන 11.24ට පමණ ඔහු දේවස්ථානයේ පිය ගැටපෙළ මත හිඳගෙන සිටිනු දක්නට ලැබී තිබේ. පෙරවරු 11.30ට පමණ යම් පුද්ගලයෙක් ඔහුගෙන් කිසිවක් අසන ආකාරය දර්ශනය වී තිබේ. නැවතත් ජමීල් පස්වරු 12.05ට පමණ දේවස්ථානයෙන් පිටව ගොස් පස්වරු 12.15ට පමණ නැවත පැමිණ යාඥා කරනු දක්නට ලැබී ඇත. පස්වරු 12.24ට පමණ යම් කිසිවෙක් ඔහු හා කථා කර ඇති අතර ඉන් විනාඩියකට පසු දෙවස්ථානයෙන් පිටව යන ජමීල් නැවතත් පස්වරු 12.26ට පමණ නැවත පැමිණ යාඥා කිරීම ආරම්භකොට ඇත. නැවතත් පස්වරු 12.41ට පමණ දේවස්ථානයෙන් පිටවන ජමීල් පස්වරු 12.42ට පමණ නැවත එහි පැමිණ තිබේ. විනාඩි 15ට පමණ පසු ඔහු දේවස්ථානයෙන් පිටතට පැමිණ ඉන් පිටත රැඳී සිටින අතර පස්වරු 1.23ට පමණ අමීර් නැමැත්තෙකු ඔහු වෙත එළඹ තිබේ.

මෙහිදි විමර්ශන කොමිසම විසින් ප්‍රවීන මනෝවෛද්‍යවරයෙකු වන නීල් ප්‍රනාන්දු මහතාගෙන් සහයද ලබාගෙන ඉහත සඳහන් අයුරින් ජමීල් සැරිසැරූ එබනිසා ප්‍රදේශයේ පිහිටි මුස්ලිම් දේවස්ථානය අවට CCTV දර්ශන ලබාගෙන නිරීක්ෂණයකොට ඇත. එහිදී එම මනෝවෛද්‍යවරයාගේ විශේෂඥ මතය වී ඇත්තේ ජමීල් තුළින් ප්‍රකට වූවේ තමන්ගේ ඉලක්කය වෙත ලඟාවීමට අපෝසත් වූ කනස්සල්ලට පත් පුද්ගලයෙකුගෙන් දක්නට ලැබෙන ක්‍රියාකාරකම් බවයි.

නුගේගොඩ, දෙල්කඳ, සෝමා තලගල මාවතේ පළමු පටුමගේ අංක 19/43 දරණ ස්ථානයේ පිහිටි අංකා කන්සල්ටන්ට් සර්විස් නමැති පුද්ගලික ආරක්ෂක ආයතනයට මෙහෙයුම් කළමණාකරු ලෙස අමීර් කටයුතු කළේය. ඊට පෙර පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස කටයුතු කල ඔහු වර්ෂ 2004දී සේවයෙන් ඉල්ලා අස්වී ඇත. විශ්‍රාම ගැනීමෙන් පසු ඔහු බම්බලපිටිය පොලිසියට අනුබද්ධිත පුරවැසි කමිටුවේ සාමජිකයෙකු ලෙසට කටයුතු කර තිබේ.

කොළඹ සිදුවූ පිපිරීම්වලින් අනතුරුව ඔහුගේ ආයතයේ ප්‍රධානියා විසින් ලබාදුන් උපදෙස් අනුව ආයතනය යටතේ පවතින ස්ථාන වෙත ගොස් එහි පැමිණෙන පුද්ගලයින්ගේ විස්තර සොයා බලා අදාළ ස්ථාන වෙත ඇතුළුවීමට අවකාශ සැලස්වීම සඳහා උපදෙස් ලබාදීම ඔහු සිදුකළේය. ඔහු එබනිසා ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථානය වෙත පස්වරු 12.45ට පමණ වන විට ගමන් කළේ සිය ආයතන ප්‍රධානියා විසින් එම දේවස්ථානයට ආරක්ෂාව සපයන ලෙස ඔහුට පැවසූ බැවිනි. අදාළ දේවස්ථාන පරිශ්‍රය පරීක්ෂා කිරීමෙන් අනතුරුව එහි පරිපාලන නිලධාරියෙකු පිළිබඳව පිටතට පැමිණි ඔහු දුටුවේ පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එකිනෙකා සමඟ වාදකරමින් සිටින ආකාරය සහ මාර්ගයෙන් අනෙක් පස තිබූ ගසක් අසළ සිට ගෙන සිටි ජමීල්වය.

අමීර් අදාළ ස්ථානයට ගොස් වාදය ඇතිවීමට හේතුව විමසා සිටියේය එතන සිටි කණ්ඩායමේ අය පවසා සිටියේ ජමීල් බොහෝ වේලාවක් එම දේවස්ථානය තුළ රැඳී සිටි අතර ඔවුන් ඔහුව දැන නොසිටි නිසා ජමීල්ට ඔවුන් එතැනින් පිටවී යන ලෙසට පැවසූ අතර එම අවස්ථාවේදී මෙම වාදය සිදුවූ බවයි. එහිදී තවදුරටත් සඳහන්වී ඇත්තේ ජමීල්

සියය ජාතික හැඳුනුම්පත හෝ ඔවුනට නොපෙන්වූ බවයි. එවිට අමීර් සියලුදෙනාට දැනුම්දී සිටියේය රටේ උද්ගතව පැවති තත්ත්වය අනුව ඔවුන් දේවස්ථානය වසා දැමීමට සූදානම් වන බවයි. ඉන් පසු අමීර් ජමීල්හට කථා කල අතර ඔහු පිළිබඳ විමසීම සිදුකලේය. ඒ අවස්ථාවේදී අමීර් පොලිස් නිලධාරියෙකු දැයි ජමීල් විසින් විමසා ඇත. අමීර් විසින් දේවස්ථානයන් පිටතදී ජමීල්ගෙන් ප්‍රශ්න අසන විට වේලාව පැය 13.23 ලෙස සටහන් වී තිබිණි. අමීර් තමා පොලිස් සේවාවේ අනුයුක්තව සිටි කාලයේදී අන්තර්ජාතික පොලිසිය විසින් ඔහුට ලබාදුන් හැඳුනුම්පතක් ජමීල්හට පෙන්වා තිබේ. එවිට ජමීල් සිය රියදුරු බලපත්‍රය ලබාදී ඇත. එවිට ජමීල් නුවර ප්‍රදේශයේ සිට පැමිණි අයෙකු බව අමීර්ට දැන ගන්නට ලැබී ඇති අතර එබැවින් ඔහු පහළ ප්‍රදේශයේ කුමක් කරන්නේ දැයි අසා ඇත. ඉන් පසු ජමීල්ගේ නිවසට දුරකථන ඇමතුමක් ලබාදී ඔහු විසින් පවසන ලද තොරතුරුවල සත්‍ය අසත්‍යතාවය තහවුරු කර ගැනීමට අමීර්ට අවශ්‍ය වී ඇත.

අමීර් ඉන් පසු සිය දුරකථනයෙන්ම ජමීල්ගේ බිරිඳ වන ඔමාර්කතා අමතා ජමීල් පිළිබඳ විස්තර ලබාගෙන තිබේ. බිරිඳ විසින් ඔහුට දන්වා ඇත්තේ මතගැටුමක් හේතුවෙන් ජමීල් නිවසින් පිටව ගොස් ඇති බවයි. අමීර් විසින් ඔමාර්කතා පිළිබඳ විස්තරද ඔහු සතුව තිබූ පොතෙහි සටහන් කොටගෙන ඇත. ජමීල්ගේ හා සිය බිරිඳ ඔමාර්කතාගේ අනන්‍යතාවය පිළිබඳව ඔහු සෑහීමට පත්වීමෙන් පසු අමීර් ජමීල්හට පිටවීමට ඉඩ හැර තිබේ.

ඉන් පසු WPABR -5353 දරණ අංක තහඩුව සහිත ත්‍රීරෝද රථයෙහි නැගුණු ජමීල් ගාලු පාර දෙසට ගමන් කරන ලෙසට රියදුරු හට සංඥා කොට ඇත. ඔවුන් ගාලු පාරට පැමිණි පසු ඔහු රියදුරාට සං කොට ඇත්තේ කළුබෝවිල රෝහල දෙසට ගමන් කරන ලෙස වන

අතර එතැන් සිට හස්ත මුද්‍රා මඟින් රියදුරාට මාර්ගය දක්වා තිබේ. මදවේලාවට පසු රථය නවත්වන ලෙස රියදුරාට සං කොට ඔහු එයින් බැස ගොස් ඇත. මෙම සිද්ධි දාමය රියදුරු මොහමඩ් නිල්වාන් නැමැත්තාගේ සාක්ෂියෙන්ද තහවුරුවේ.

ජමීල් නික්ම ගොස් විනාඩි තුනකට පමණ පසු ඔමාර්කථාගේ දුරකථන අංකයෙන් අමීර් වෙත යළිත් ඇමතුමක් ලැබුණු අතර දෙමළ බසින් කථා කල පිරිමි පුද්ගලයෙකු ඔහුට පවසා සිටියේ ජමීල්ව තවදුරටත් එතනම රඳවා ගන්නා ලෙසත් පවුල් ආරවුල් සම්බන්ධ කරුණක් සඳහා එහි පැමිණ ඔහුව රැගෙන යාමට ඔවුන්ට අවශ්‍ය බවත්ය.

ඔහුට වෙනත් රාජකාරි ඇති බැවින් එය කළ නොහැකි බවත්, කෙසේ වුවද ජමීල් ඒ වන විටත් එම ස්ථානයෙන් පිටව ගොස් ඇති බවත් අමීර් ඔහුට දැනුම් දී තිබේ. අමීර් ඔහුගේ අනෙකුත් රාජකාරි සඳහා යොමු වී සිටි අතර පස්වරු 5.00 පමණ නොදන්නා අංකයනින් ලැබුණු දුරකථන ඇමතුමකින් ඔහු වෙත පවසා සිටියේ එසේ අමතන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි අංශයෙන් එම දුරකථන ඇමතුම ලබාදුන් බවයි. එසේ ඔහුට ඇමතූ පුද්ගලයාගේ කටහඬ, එබනිසා ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථානය අසලින් ජමීල් පිටපව ගිය පසු ඔහුව ඇමතූ පුද්ගලයාගේ කටහඬට සමාන විය. ඉන් පසු වැල්ලවත්ත පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස අමීර් වෙත දන්වන ලදි එහිදී ඔහුට අදාළ පුද්ගලයා හමුවූ අතර ඔවුන් යුද හමුදා බුද්ධි අංශයේ නිලධාරින් බව අමීර්ට අවබෝධ විය.

අමීර් විසින් විස්තර කරන ලද සිද්ධි දාමය සමඟ අමීර් සහ ඔමර්කතා අතර ඇතිවූ දුරකථන සංවාද පිළිබඳ වාර්තා මනාව සැසඳේ. විමර්ශන කොමිසම විසින් හමුදා බුද්ධි අංශයේ නිලධාන් කීපදෙනෙක්වම කැඳවන ලදි. ඔවුන් විසින් සාක්ෂි ලබාදෙමින් පවසා

සිටියේ වර්ෂ 2016 පමණ කාලය සිට ජමීල්ගේ අන්වාදී අදහස් නිසාම ඔහු පිළිබඳ හමුදා බුද්ධි අංශ පරීක්ෂාවෙන් සිටි බවයි.

සැබවින්ම යුද හමුදා බුද්ධි අශය විසින් ලබා දෙන ලද තොරතුරු හේතුවෙන් වර්ෂ 2018 අප්‍රේල් මාසයේ ත්‍රස්ත විමර්ශන අංශය විසින් ජමීල්ගෙන් ප්‍රශ්න කොට තිබේ. කොළඹ හා තද ආසන්න ප්‍රදේශවල පිපුරුම් සිදු වූ වහාම, ලද උපදෙස් මත ක්‍රියාත්මක වූ හමුදා බුද්ධි අංශ මෙහෙයුම් ක්‍රියාකාරිකයින් දෙමටගොඩ ලන්සියා වත්තෙහි පිහිටි ජමීල්ගේ නිවසට ගොස් ඔහු කොහි සිටින්නේද යන්න වග පරික්ෂා කොට ඇත. ජමීල් එබනිසා ප්‍රදේශයේ ඒ වනවිට සිටි ඇති බව එහිදි ඔමාර්කතා විසින් ඔවුනට පවසා ඇත. හමුදා බුද්ධි අංශ නිලධාරීන් විසින් අමීර්හට දූරකථනයෙන් අමතා ජමීල් සොයා ගැනීමට උත්සහ ගෙන ඇත්තේ එවිටයි. නමුත් ඒ වන විට ඔහු දේවස්ථානයෙන් පිටව ගොස් තිබිණි.

සියලු අදාළ පාර්ශ්වවල සාක්ෂි විමසීමෙන් අනතුරුව විමර්ශන කොමිසම විසින් එළඹී ඇති නිගමන වන්නේ අමීර් විසින් සහ හමුදා බුද්ධි අංශ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන සිදුවීම් විස්තරය මඟින් සැබෑ කරුණු පිළිඹුවන බවයි. දැනට ලැබී ඇති සාක්ෂි අතර ට්‍රොපිකල් ඉන් ලැඟුම්හලේ සිදුවූ පිපිරීම පෙර ජමීල් බුද්ධි අංශ නිලධාරීන් කිසිවෙකු හමුවූ බවට කිසිදු සාක්ෂියක් නොමැත.

ටාජ් සමුද්‍රා හෝටලයේදී සහ පසුව ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේදී ජමීල් ක්‍රියාකල ආකාරය පිළිබඳ විමර්ශන කොමිසම විසින් විශ්‍රාමික රස පරීක්ෂකවරයෙකුගෙන් විශේෂඥ සාක්ෂි විමසීමක් සිදුකල අතර එහිදි ඔහුගෙන් විමසනු ලැබුවේ පිපුරුම පළමු අවස්ථාවේදී සිදුකල උත්සහ අතරතුර සිදුනොවීමත් ඉන් පැය 4 පසු සිදුවීමට කිසියම් හැකියාවක් ඇත්ද

යන්නයි. එහිදී ඔහුගේ විශේෂඥ අදහස වූයේ බෝම්බ පුපුරවා ගැනීමට යොදා ගන්නා ඩෙටනේටරය තත්ත්වයෙන් බාල එකක් වූවේ නම් එසේ සිදුවිය හැකි බවත් එසේත් නැතිනම් අදාළ පරිපථයේ නිසි ලෙස සම්බන්ධ නොවීමට හේතුවන ආකාරයේ අඩුපාඩුවක් පැවතියේ නම් හෝ නිවැරදි ආකාරයෙන් බැටරිය සම්බන්ධ නොවී පැවතියේ නම් ද එසේ සිදුවිය හැකි බවයි.

එක්තරා පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට දූරස්ථ පාලක බෝම්බයක් මගින් ජමීල් මරාදැමීමට අවශ්‍ය වූවේ නම් අනිවාර්යෙන්ම දේවස්ථාන හා හෝටල්වල මුල් පිපිරීම සිදු කිරීමෙන් පසු ඔවුන් පැය 4 ක තරම් කාලයක් ඒ වෙනුවෙන් විඩංගු නොකරනු ඇති බවයි. මෙම කාලය තුළ ජමීල් අවම වශයෙන් ත්‍රී රෝද රථ දෙකකින් නිදහසේ එහා මෙහා ගමන් කර අතර පුපුරන ද්‍රව්‍ය රැගත් බෑගයද සමඟ ටොෆිකල් ඉන් ලැඟුම්හලේ නවාතැන් ගැනීමට ඔහුට හැකිය. එතරම් වෙලාවක් කිසිදු ආකාරයක පිපිරීමක් සිදු නොවීය.

ජමීල් යනු ප්‍රහාර හා සම්බන්ධ ප්‍රධානතම ක්‍රියාකරිකයෙක් වනවා සේම ප්‍රහාරය පිළිබඳ බොහෝ තොරතුරු ඔහු දැන සිටියේ ය. එසේ නම් ජමීල්ව මරණයට පත් කිරීමට උනන්දුවක් ඇති පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් දූරස්ථපාලක බෝම්බයක් යොදාගෙන එය සිදුකිරීම සඳහා එතරම් දීර්ඝ වේලාවක් මිඩංගු කොට අදාළ දූරස්ථ පාලකය ක්‍රියාත්මක කරන්නේ කුමකටද? ප්‍රහාරයෙන් පසු බැසීම සඳහා ජමීල්හට යම් සංඥාවක් ලබා දුන්නේ නම්, ඔහුට එතරම් නිදහසේ අදාළ සැලසුම් පිළිබඳව මනා දැනුමක් ඇතිව ඔබ මොබ සැරිසැරීමට අවස්ථාව ලබාදී තිබුණේ ඇයි? එතරම් නිශ්චිත ආකාරයට ප්‍රහාරයක් සැලසුම් කළ කණ්ඩායමක් සතුව අනිවාර්යයෙන් බාහිර පාර්ශ්වයක මැදිහත් වීමකින් තොරව

මරාගෙන මැරෙන බෝම්බකරුවන් අදාළ ස්ථානවලින් ඉවත් කිරිමට ඔවුන් ප්‍රහාරයට අත්හිටුවීමට සැලසුම් කළ අවස්ථාවකදී අනිවාර්යයෙන් හැකියාව තිබිය යුතුය.

කෙසේ වුවත් විමර්ශන කොමිසම මඟින් නිරීක්ෂණය කරන ලද CCTV කැමරා දර්ශනවලින් අනාවරණයවූ පරිදි ජමීල් ට්‍රාජ් සමුද්‍රා හෝටලයෙන් පිටතට පැමිණ, එම හෝටලයේ ඉදිරිපිට ගොඩබිම පැත්තේ සිට ත්‍රිරෝද රථ කැඳවීමට උත්සහා කරන අවස්ථාවේ ත්‍රී රෝද රථ කිහිපයක්ම නොනවත්වා ගමන් කළ නමුත් පාරේ අනිත් පසින් (මුහුදු බඩ පැත්තේ) ගාලු මෝදර වට රවුමේ සිට මහ බැංකුව දෙසට ගමන් කළ ත්‍රී රෝද රථයක් යූටර්න් ආකාරයෙන් හරවා පැමිණ ජමීල් අසල නැවැත්තූ අතර ඔහු ඊට ගොඩවිය. ඉන්පසුව ඔහු වැල්ලවත්ත හන්දිය වෙත ගොස් ඉන් බැස ගත්තේ ය.

ඉන් පසුව ඔහු තවත් ත්‍රී රෝද රථයක් ගෙන්වා ගෙන එය දෙහිවල ලෙසට පදවන ලෙස පවසා ඇත. එසේ යන අතර මහදී සත්ව උද්‍යානය ආසන්නයේ සුදුසු නාවාතැන් ඇත්දැයි ඔහු විමසා තිබේ. එම ත්‍රී රෝද රථ රියදුරා ඉන් පෙරද ට්‍රොපිකල් ඉන්  ලැඟුම්හලට රැගෙන ගොස් තිබූ බැවින් එම ස්ථානය පිළිබඳ දැන සිට ඇත. ජමීල් ට්‍රොපිකල් ඉන් ලැඟුම්හලට පැමිණියේ ඒ ආකාරයෙනි. පසුව ඔහු දෙහිවල සහ වැල්ලවත්ත ප්‍රදේශවල පා ගමනින් ගමන් කළ අතර වැල්ලවත්තේ පිහිටි මුස්ලිම් දේවස්ථානයකටද ගොස් නැවතත් ට්‍රොපිකල් ඉන්  ලැඟුම්හල වෙත තවත් ත්‍රී රෝද රථයකින් පැමිණියේ ය. උදෑසන පිපිරුමෙන් පසු වඩා වැඩි ආරක්ෂාවක් සහ සෝදිසියක් පැවති බවට වැල්ලවත්තේ මුස්ලිම් දේවස්ථානය අසලදී අමීර් සහ ජමීල් අතර සිදුවූ සිදුවීම සාක්ෂි දරයි. එවැන් ප්‍රහාර එල්ල කිරීම සඳහා මනාව සංවිධානය වූ කණ්ඩායමක් ඒ ආකාරයට ජමීල්හට ට්‍රොපිකල් ඉන්

රැඳුම්හලේදී සිදුවූ පිපිරුම දක්වාම නිදහසේ ඔබමොබ ගමන් කිරීමට අවස්ථාව ලබාදෙනු ඇතැයි සිතිය නොහැක.

ඉහත දක්වා ඇති කරුණු කාරණා, වාචික හා ලේඛනමය සාක්ෂි මඟින් සහ විමර්ශකයන්ගෙන් හා විශේෂඥයින්ගෙන් ප්‍රකාශ ඇතුළුව විමර්ශන කොමිසම ඉදිරියේදී ඉදිරිපත් කරන ලද සාක්ෂිවල කොටසකි.

## ප්‍රධාන පාර්ශ්වකාර පුද්ගලයින්ගේ විස්තර වාර්තා

සහරාන්ගේ කණ්ඩායමේ ක්‍රියාකාරකම්වල වැදගත් කාර්යභාරයක් ඉටු කළ පුද්ගලයන් කිහිප දෙනෙක් සිටියහ. මෙම පරිච්ඡේදය මගින් කණ්ඩායමේ ක්‍රියාකාරකම්වල නිරත වූ පුද්ගලයින් සහ ඔවුන්ගේ භූමිකාව හඳුනා ගැනීමට උත්සාහ කරයි. 7 සිට 11 දක්වා පරිච්ඡේදවල සවිස්තරාත්මකව සලකා බැලූ බැවින් සහරාන් පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදයේ දක්වා නොමැත.

**1.** මොහොමඩ් ඉබ්‍රාහිම් මොහොමඩ් නවුෆර්

ඔහු සහරාන්ගේ කණ්ඩායම තුළ අබු ෂයිඩ් ලෙස හැඳින්විණි.

ඔහු 1978 නොවැම්බර් 30 වන දින කාත්තන්කුඩියෙහි උපත ලැබීය. ඔහුගේ පියා මොහොමදු මුස්තාෆා මොහොමදු ඊබ්‍රාහිම් සහ මව ඊබ්‍රාහිම් නිච්මතු නාච්චි ය.

ඔහු අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා ඔහුගේ සිය මූලික අධ්‍යාපනය ලැබුවේ කාත්තන්කුඩි, මීරා බාලිකා විද්‍යාලයේ, කාත්තන්කුඩි මධ්‍ය මහා විද්‍යාලයේ සහ කාත්තන්කුඩි ජැමියල් ෆලාහි පාසලෙනි. ඉන්පසු ඔහු ශ්‍රී ලංකා ජමෙයිතුල් ඉස්ලාමි සංවිධානය විසින් මෙහෙයවනු ලබන මාදම්පේ ඉස්ලාහියා අරාබි විද්‍යාලයට ගොස් උසස් පෙළ විභාගය දක්වා අධ්‍යාපනය ලැබීය. ඒ අතරම ඔහු මවුලවිවරයෙක් වීම සඳහා එහි පාඨමාලාවක් හැදෑරීය.

නවුෆර් ඉස්ලාමීය අන්තවාදයට නිරාවරණය වූයේ මාදම්පේ ඉස්ලාහියා අරාබි විද්‍යාලයේදී ය. ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳව ඔහුට උගන්වන ලද අතර ඇෆ්ගනිස්ථානය, බොස්නියාව සහ චෙච්නියාවේ මුස්ලිම්වරුන් මුහුණ දෙන ගැටලු නිරූපණය කරන වීඩියෝ දර්ශන පෙන්වන ලදී. ආයුධ පුහුණුව අනිවාර්ය බව ඔහුට ඉගැන්වීය. සෑම වසරකම සිසුන් කැලෑවට ගෙන ගොස් පුහුණු කඳවුරුවල පුහුණුව ලබාදෙන ලදී. ඔහු

ජමෙයිතුල් ඉස්ලාම් සංවිධානයේ ප්‍රචාරක නිලධාරියෙකු ලෙස පත් කරන ලදී. මෙය සිදුවූ කාල සීමාව බොහෝ විට 1990 දශකයේ විය හැකිය.

2000 සිට 2004 දක්වා ඔහු අග්නිදිග විශ්ව විද්‍යාලයෙන් අරාබි සංස්කෘතිය ඉගෙන ගත්තේය.

එක් සාක්ෂිකරුවෙකුට අනුව නවුෆර් තවුහිද් දෙසට නැඹුරු වූයේ සලෆි අනුගාමිකයෙකු වූ එහියාස් ඉල්මිගේ ආභාෂය හේතුවෙනි. එම මූලාශ්‍රයට අනුව, අයිඑස්අයිඑස් මතවාදය පිළිබඳව මුහුණු පොතෙහි (Facebook) පළ කිරීම ආරම්භ කළ පළමු ශ්‍රී ලාංකිකයා නවුෆර් ය.

ඔහු 2003 දී මොහොමඩ් සිත්ති හජිරා සමඟ විවාහ විය. ඇය සහරාන්ගේ බිරිඳ වන හාදියාගේ මවගේ සහෝදරියකි.

2004 දී පමණ සහරාන් ඉස්ලාම් දහම ඉගෙන ගැනීම සඳහා කත්තන්කුඩිහි ජමෙයිතුල් ෆලා මද්‍රසා වෙත ඇතුළත් වී සිටියදී නවුෆර්ට සහරාන් හමු විය. නවුෆර් සහරාන්ව වහබිවාදය කෙරෙහි යොමු කිරීමට පටන් ගත්තේය.

සහරාන් 2005/2006 දී පමණ කත්තන්කුඩිහි ධාරුල් අද්හාර් අද් දයියා නමින් සංවිධානයක් ආරම්භ කළේය. සහරාන් සහ නවුෆර් සහ මවුලවි නෂ්මාල්, මවුලවි අෂ්ෆර් රවුෆ් සහ තව්ෆීක් දාරුල් අද්හාර් අද් දයියාහි සාමාජිකයන්ව සිටිහ. හාදියා අනුව, 2008 දී නවුෆර් කටාර් බලා යාමට පෙර සහරාන් හා නවුෆර් අතර හිත් නොහොඳවීමක් ඇති විය.

2006 දී නවුෆර් කටාර් බලා පිටත්ව ගොස් මාස හයකින් ආපසු පැමිණියේය. පසුව ඔහු අම්මානා ජාත්‍යන්තර පාසලේ ගුරුවරයෙකු ලෙස සේවය කිරීමට පටන් ගත් අතර, 2008 දී නැවත කටාර් බලා ගොස් ආපසු ශ්‍රී ලංකාවට පැමිණෙන තෙක් 2016 දක්වා එහි සේවය කළේය. ඔහු කටාර්හි නැවතී සිටි කාලය තුළ සාමාන්‍යයෙන් වසරකට වරක් ශ්‍රී ලංකාවට පැමිණියේය. ඔහු නීති කාර්යාලයක පරිවර්තකයෙකු ලෙස සේවය කළේය.

ඔහු ෆේස්බුක් හරහා මිල්හාන් සහ හයිම් අහමඩ් සමඟ සම්බන්ධ විය. ඔහු අවස්ථා කිහිපයකදී කටාර්හිදී මිල්හාන් හමුවූ අතර ඔහු සමඟ අයිඑස් ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කළේය.

නවුෆර් 2016 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණ නැවත සහරාන් සමඟ මිතුරු විය. පසුව 2016 ඔක්තෝම්බර් මාසයේදී පමණ නවුෆර් සහරාන් හට හිස ගසා දැමීමේ අයි.එස් වීඩියෝ අඩංගු දත්ත බහාලුමක් ලබා දුන්නේය. හාදියා විසින් ලබා දුන් මෙම සාක්ෂි සහරාන් අයිඑස් තොරතුරු ෆේස්බුක්හි පළ කිරීමට පටන් ගත් කාලසීමාව සමඟ ගැලපේ.

2017 නොවැම්බරයේ මැදවච්චියේ, රබාවැව ප්‍රදේශයේ පැවති පළමු පුහුණු කඳවුරට නවුෆර් සහභාගී වූ අතර එහිදී සහරාන්, නවුෆර්, අන්සාර්, රිස්වි, රිස්වාන්,ආබ්දීන්, රමීස්, මිල්හාන්, හස්තුන් සහ රිල්වාන් ඇතුළු පුද්ගලයින් 14 දෙනෙකු පමණ සහභාගී වූහ.

ජමාත් ඉල් ඉස්ලමික් (ජේ.එම්.අයි) ආයතනයේ සාමාජිකයින් පැමිණ ඔහුගේ නිවසේදී නවුෆර්ව මුණගැසී කණ්ඩායමේ සමහර සාමාජිකයින් නිලාම්ගේ දේශනවලට සහභාගී වී ඇති බවත්, උමයර් සිරියාවට ගොස් ආපසු පැමිණ ඇති බවත් දැනුම් දුන්හ. ඔවුන්ට අවශ්‍ය වූයේ වෙනම ක්‍රියා කරනවාට වඩා සියල්ලන්ම අත්වැල් බැඳ ගැනීමයි. ඔවුන් මීට පෙර සහරාන් මුණගැසී ඇති බව නවුෆර්ට දන්වන ලදී.

සහරාන් විසින් සංවිධානය කරන ලද සියලුම පුහුණු කඳවුරුවලට නවුෆර් සහභාගී වූ අතර අයි.එස් දෘෂ්ටිවාදය සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳව දේශන පැවැත්වීය.

මානැල්ලෙහි බුද්ධ ප්‍රතිමාවලට පහරදීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන්ගේ පවුල්වලට ලබාදීම සඳහා සහරාන් 2019 ජනවාරි මාසයේදී නවුෆර්ට මුදල් ලබා දුන්නේය. සහරාන්ට මෙම මුදල් ලබා දුන්නේ ඉල්හාම් විසිනි. නවුෆර් සිය බිරිඳ සමඟ පුත්තලමට ගොස් අත්අඩංගුවේ සිටි මුෆීස්ගේ පවුලට මුදල් ලබා දුන්නේය. ඔහු

සහරාන්ගේ ලැප්ටොප් පරිගණකය මුෆීස්ගේ බිරිඳගෙන් නැවත ලබාගෙන එය සහරාන්ට භාර දුන්නේය.

සහරාන් විසින් කණ්ඩායමේ දෙවන අණදෙන නිලධාරියා ලෙස නවුෆර් පත් කරන ලද බවට සාක්ෂි තිබේ. කෙසේ වෙතත්, නවුෆර් විසින් ඉටු කරන ලද භූමිකාව කණ්ඩායමේ න්‍යායාචාර්යවරයෙකුගේ කාර්යභාරයට වඩාත් සමීප වේ. සංවිධානයේ ආරක්ෂාව සඳහා සහරාන් සහ අනෙක් අය නැවතී සිටින ස්ථානයෙන් වෙන් වූ වෙනත් ස්ථානයක නැවතී සිටින ලෙස සහරාන් නවුෆර්ට උපදෙස් දී තිබේ. සහරාන් විසින් එඬෙරමුල්ලෙහි ආරක්ෂිත නිවසේදී මිලිමීටර් 9 පිස්තෝලයක් ඔහුට ලබා දෙන ලදී.

ඔහු දැනට අත්අඩංගුවේ පසුවෙයි.

2. මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන්

සහරාන්ගේ කණ්ඩායමේ ඔහු අබු ජල් අල් ක්විටල් ලෙස හැඳින්විණි. සැබැවින්ම අරාබි භාෂාවෙන් එම නාමේ අරුථ ලෙස දැක්වෙන්නේ ඝාතකයා යනුවෙනි.

රිල්වාන් සහරාන්ගේ සහෝදරයෙකු වන අතර ඔහු මුල සිටම ඔහු සමඟ සමීපව කටයුතු කළේය. හිස්බුල්ලා මහතා 2015 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් කිරීමෙන් පසු එම්.එල්.ඒ.එම් හිස්බුල්ලාගේ ආධාරකරුවන් විසින් ඔහුට පහර දෙන ලදී. රිල්වාන් ඩ්‍රෝන යානයක් භාවිතා කිරීම අත්හදා බැලීය. මෙම උත්සාහයේ වීඩියෝවක් 2019 අප්‍රේල් 26 දිනෙන් පසුව සොයා ගන්නා ලදී.

ඔහු අන්තර්ජාලය හරහා බෝම්බ සෑදීම පිළිබඳ දැනුම ලබාගෙන තිබුණි. 2017 ... මාසයේදී ඔහු පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීමේදී දරුණු තුවාල ලැබූ අතර අත් ... බොහෝ ඇඟිලි අහිමි වූ අතර ඔහුගේ වම් ඇසට බරපතල තුවාල සිදුවිය. පිපිරීම සිදුවන විට ඔහු විරාම සටිකාවක් සමඟ පුපුරණ ද්‍රව්‍ය කිහිපයක් පරීක්ෂා කරමින් සිටියේය.

සහරාන් විසින් සංවිධානය කරන ලද පුහුණු කඳවුරු බොහොමයකට ඔහු සහභාගී වූ අතර රැකවල් රාජකාරිය ඉටු කළේය.

දිගන සහ තෙල්දෙණිය සිදුවීම්වලින් පසුව, මිල්හාන් සහ රිල්වාන් මොහොමඩ් ෂිෆාස් සත්තාර්ගෙන් ඉල්ලා සිටියේ කඩු කිහිපයක් සොයා දෙන ලෙසයි. එසේ සොයාදුන් කඩු බේරුවල සහ කුරුණෑගල ප්‍රදේශවලට යවන ලදී.

2019 මාර්තු මාසයේදී රිල්වාන්, කත්තන්කුඩිහිදී කිලෝ 35 ක් බරැති නයිට්රේට් අමල අඩංගු බැරල් 8 ක් මිල දී ගෙන සුදු වෑන් රථයකින් ප්‍රවාහනය කරන ලදී. වර්ෂ 2018 සහ වර්ෂ 2019 අප්‍රේල් 26 වන දින අතර කාලය තුළ ඔහු ව්‍යාජ හැඳුනුම්පත් යොදාගෙන ජංගම දුරකථන සිම්පත් විශාල ප්‍රමාණයක් මිළදී ගෙන සක්‍රීය කොට තිබේ. මෙම සියලු මිළදී ගැනීම් සිදු කර ඇත්තේ කාත්තන්කුඩු ප්‍රදේශයේදී ය. 2019 අප්‍රේල් 26 වන දින සහින්දමර්දුහි සිදු වූ පිපිරීමෙන් රිල්වාන් මිය ගියේය.

3. මොහොමඩ් කාසිම් මොහොමඩ් ෂයිනි

සහරාන්ගේ කණ්ඩායමෙ ඔහු අබු මුකතිල් ලෙස හැඳින්විය. ඔහු සහරාන්ගේ සහෝදරයෙකි.

1988 නොවැම්බර් 4 වන දින උපත ලැබූ ඔහු 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා කාත්තන්කුඩිහි අල් අමීන් විද්‍යාලය සහ 6 ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා කාත්තන්කුඩි මධ්‍යම විද්‍යාලයේ ඉගැනුම ලැබුවේය. ඉන්පසු ඔහු පාසලෙන් සමුගෙන වර්ෂ 2000 දී කාත්තන්කුඩි ජමෙයිතුල් ෆලා අරාබි පාසලට බැඳී 2007 දක්වා අල් කුර්ආනය හැදෑරිය. 2008 ජනවාරි සිට 2011 අවසානය දක්වා ඔහු වත්තල ඉබුනු උමර් අරාබි පාසලේ ඉස්ලාම් දහම හැදෑරීය.

ඉන්පසු ඔහු 2012 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා ගුරුවරයෙකු ලෙස සේවය කළේය. 2014 මුලදී ඔහු ඉන් සමුගෙන කාත්තන්කුඩිහි එන්.ටී.ජේ (නැෂනල් තව්හිද් ජමාත්)මද්‍රසාහි ගුරුවරයෙකු ලෙස සේවය කළේය.

කණ්ඩායමේ ආරම්භයේ සිටම ෂයිනි සහරාන් සමඟ සිටියේය. ඔහු ෆේස්බුක්හි අයි.එස් හිතවාදී තොරතුරු ප්‍රකාශයට පළ කළේය.

2017 මාර්තු 10 වන දින අලියාර් මංසන්දියේදී සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට ගනු ලැබීය. අත්අඩංගුවේ සිටියදී ඔහු මඩකලපුව සිරගෙදර සිටි සෙසු රැඳවියන්ට ඉස්ලාමීය අන්තවාදය පිළිබඳව දිගටම දේශනා පැවැත්වීය.

2019 අප්‍රේල් 26 වන දින සහින්දමරුදුහි සිදුවූ පිපිරීමෙන් ෂයිනි මිය ගියේය.

4. මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් අහමඩ්

සහරාන්ගේ කණ්ඩායමේ ඉල්හාම් අබු බාරා ලෙස හැඳින්විය.

සහරාන්ගේ කණ්ඩායමේ ප්‍රධාන අරමුදල් සපයන්නෙකු වූ ඉල්හාම් සමඟ ඔහුගේ සහෝදර ඉන්ෂාෆ් ද විය. 2018 දී සහරාන් සහ ඔහු රුපියල් මිලියන 200 ක් ශ්‍රී ලංකාවේ සිට සිරියාවට බෝට්ටුවෙන් යැවීම සඳහා සාකච්ඡා කර ඇත.

ඉල්හාම්ගේ අන්තවාදයේ තරම තේරුම් ගත හැක්කේ ඔහු තම දරුවන් පාසලට නොයවා නිවසේදී ඉගැන්වීම, දරුවන්ට ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා නොදීම, බිරිඳගේ සහෝදරයාගේ විවාහ උත්සවයට පවා නොපැමිණීම සහ ඔහුගේ නිවසේ තිබී ප්‍රහාරයෙන් පසු අන්තවාදී ආගමික ග්‍රන්ථ හමුවීම යන කාරණා සලකා බැලීමේදීය.

ඔහු කිසිදු අපරාධයකට සම්බන්ධ වූ බවට වාර්තා නොතිබුණි.

ඉල්හාම් ධනවත් ව්‍යාපාරික පසුබිමකින් පැමිණි අයෙකි. ඔහුගේ පියා මොහොමඩ් යූසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් යනු "ඉෂාස්නා එක්ස්පෝට්ස්" නමින් කුළුබඩු අපනයන ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය කුළුබඩු වෙළෙන්දෙකි.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු බඩල්කුඹුර, බුත්තල පාරේ "ඩොල්ෆින්" නැමැති ස්ථානයේ පිහිටි ඔහුගේ ගබඩාවෙන් කඩුවක් සොයා ගන්නා ලදී.

සහරාන් සමඟ ෂැංග්‍රිලා හෝටලයට ප්‍රහාර එල්ල කළ අනෙක් මරාගෙන මැරෙන බෝම්බකරු ඔහු ය.

5. අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ්

සහරාන් කණ්ඩායම තුළ ජමීල් අබු හම්සා ලෙස හැඳින්විණි.

ඔහු 1982 දෙසැම්බර් 18 වන දින මහනුවරදී උපත ලැබීය. ඔහුගේ පියා 2010 දී මියගිය අබ්දුල් රසාක් අබ්දුල් ලතීෆ් වන අතර මව සම්සුදින් හිදායා ය. ඔහුගේ පවුලේ ගැහැණු ළමයින් 4 දෙනෙකු සහ පිරිමි ළමයින් තිදෙනෙකු සිටියහ. ජමීල් සිය පවුලේ හයවැන්නා විය.

පළමුවන ශ්‍රේණියේ සිට 6 ශ්‍රේණිය දක්වා වෙලම්බඩ දෙමළ පාසලට ඇතුළත් වූ ඔහු 6 වන ශ්‍රේණියේ සිට සාමාන්‍ය පෙළ විභාගය දක්වා මාරියාවත්ත ගම්පොළ ජාත්‍යන්තර පාසලට ඇතුළත් විය. ඉන්පසු ඔහු උසස් පෙළ විභාගය සඳහා රෝයල් ඉන්ස්ටිටියුඩ් වෙත ඇතුළත් විය.

පසුව ඔහු රත්මලාන ආසියානු ගුවන් සේවා මධ්‍යස්ථානයට ගොස් ගගනගාමී ඉංජිනේරු විද්‍යාව පිළිබඳ HND පාඨමාලාව හැදෑරීය. 2007 දී පාඨමාලාව හැදෑරීම සඳහා එක්සත් රාජධානියට ගිය ඔහු 2008 දී නැවත ශ්‍රී ලංකාවට පැමිණියේය.

ඔහු 2008 අප්‍රේල් 4 වන දින ෆාතිමා ෂිෆානා ඔමර්කත්තා සමඟ විවාහ විය. ඔවුන්ට දරුවන් හතර දෙනෙක් සිටී.

ජමීල් සහ ඔහුගේ බිරිඳ 2009 දී පුරවැසිභාවය ලබාගැනීම සඳහා ඕස්ට්‍රේලියාවට ගියේ ජමීල්ගේ සහෝදරයෙකු වන අබ්දුල් ලතීෆ් යස්ලිම් මොහොමඩ් එහි පදිංචිව සිටියදී ය. ශිෂ්‍ය වීසා බලපත්‍රයක් මත වසර දෙකක් එහි අධ්‍යාපනය ලැබූ ඔහු නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් හැදෑරූ අතර, ඉන් අනතුරුව වසරක පමණ කාලයක් ඉංජිනේරු නිර්මාණකරුවෙකු ලෙස සේවය කළ ඔහු 2013 දී නැවත ශ්‍රී ලංකාවට පැමිණියේය.

ඔහු ඕස්ට්‍රේලියාවේ සිටියදී ඇල්ෆර්කාන් දේවස්ථානයේ ආගමික වතාවත් සඳහා සහභාගි වූ අතර එහිදී හරූන් මවුලවි සහ අරූස්ව දැන හඳුනා ගත්තේය.

හරූන් මවුලවි සමඟ ඇති සම්බන්ධය ජමීල් තුළ විප්ලවීය වෙනසක් ඇති කළේය. ඔහු රැවුලක් වැඩීමට පටන් ගත් අතර සංගීතයට සවන්දීම සහ චිත්‍රපට නැරඹීම නැවැත්වූ අතර ඉස්ලාමයේ ඉගැන්වීම්වලට පටහැනි බැවින් එසේ කරන ලෙස තම බිරිඳටද උපදෙස් දුන්නේය. මෙම වෙනස ආරම්භ වූයේ **2011** දී ය.

මොහමඩ් මුහුසින් සර්ෆාස් නිලාම් සමඟ ඔහුට කිට්ටු සම්බන්ධතා පැවති අතර, **2014** දී පමණ දෙමටගොඩ, මල්ලිකාරාම පාරේ පිහිටි සමස්ථ ලංකා තවුහිද් ජමාත් (ACTJ) මුස්ලිම් පල්ලියේදී ඔහුට ප්‍රථම වරට මුණ ගැසුණි. නිලාම් සහ අරූස් ඥාතීන්ය. ඔවුන් දෙදෙනාම සිරියාවට ගියේ අයි.එස් සංවිධානයට බැඳීමට ය. අයි.එස් වෙනුවෙන් සටන් කරමින් සිටියදී සිරියාවේදී ඝාතනය වූ පළමු ශ්‍රී ලාංකිකයා නිලාම් ය. නිලාම් සිරියාවට යාමට පෙර ජමීල් සහ ඔමර්කත්තා නිලාම් වෙනුවෙන් සමුගැනීමේ දිවා භෝජන සංග්‍රහයකට සහභාගි වූහ. 2014 නොවැම්බර් **12** වන දින ජමීල් තම සහෝදරයා වන හකීම් සමඟ ව්‍යාපාරික කටයුත්තක් සඳහා ටී.කේ **31** ගුවන්යානයෙන් තුර්කියට පියාසර කොට, **2014** නොවැම්බර් **19** වන දින ටී.කේ **731** ගුවන්යානයෙන් ශ්‍රී ලංකාවට ආපසු පැමිණියේය. එසේ යළි පැමිණි පසු ඔහු සිය සහෝදර ලතීෆ්ගේ තේ අපනයන ව්‍යාපාරය හා සම්බන්ධ විය. ඉන්පසු ජමීල් දෙවරක් තුර්කියට යාමට ඉල්ලුම් කළ නමුත් වීසා බලපත්‍ර අයදුම්පත ප්‍රතික්ෂේප විය. ඔහුට අවශ්‍ය වූයේ තුර්කිය හරහා සිරියාවට ගොස් අයි.එස් සංවිධානයට බැඳීමට ය.

ජමීල් මුස්ලිම් රාජ්‍යයක ජීවත් විය යුතු බවට තදින් විශ්වාස කළ අයෙකි. අයිඑස් විසින් ප්‍රකාශයට පත් කරන ලද කැලිෆේට් ගැන ඔහු තරයේ විශ්වාස කළේය. ෂරියා නීතිය බලාත්මක කරන ලද ඉස්ලාමීය රාජ්‍යයකට (හිජ්රාත්) යාමට ඔහුට අවශ්‍ය විය. **2019** මුල් භාගය වන තුරුම සහරාන්ට අයිඑස් සංවිධානය සමඟ තිබූ සම්බන්ධතා පූරුක අරූස් හරහා සලසා දුන්නේ ජමීල් ය.

2015 අග භාගයේ සිට ඔහු ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් නිර්මාණය කිරීම ගැන දේශනා කරමින් සිටියේය. එක්සත් රාජධානියේ ඉස්ලාමීය අන්තවාදී දේශකයෙකු වන අංජම් චෞද්‍රිගේ දේශනවලට ජමීල් සවන් දුන්නේය.

කොළඹ මූලික කරගත් ජමාත් ඉල් ඉස්ලාමියා (ජේ.එම්.අයි) පිහිටුවීමේදී ජමීල් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළද ඔහුව එහි නායකයා ලෙස පත් නොකිරිනි. මේ නිසා ජේ.එම්.අයි හි නායක උමයර් මොහොමඩ් සමඟ මතභේදයක් ඇති විය. ජමීල් සහ උමයර් අතර සහයෝගීතාවයක් ඇතිකර ගැනීම සඳහා සහරාන් මල්වානේ පැන්ඩා ක්‍රීඩා මධ්‍යස්ථානයේ සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය.

ජමීල් 2017 දී ඉල්හාම් සමඟ දින දහයක් මක්කම බලා ගිය අතර සංචාරයට අනුග්‍රහය දැක්වූයේ ඉල්හාම් විසිනි.

අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යනු, අයි.එස් සංවිධානයට බැඳීම සඳහා සිරියාව සහ ඉරාකය වෙත සංචාරය කිරීමට ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සපයන පුද්ගලයෙකු බව 2016 ජූලි මාසයේදී පොලිස්පති වෙත රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දෙන ලදී.

ජමීල්ගේ ජෛව දත්ත, ඔහුගේ අන්තවාදී අදහස් හා ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර සහ ශ්‍රී ලංකාව ඉස්ලාමීය රාජ්‍යයක් බවට පරිවර්තනයවීම දැකීමට හෝ ඉස්ලාමීය රාජ්‍යයකට සංක්‍රමණයවීමට ඇති ආශාව පිළිබඳව දන්වමින් 2017 නොවැම්බර් මාසයේදී රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා පොලිස්පතිවරයාට ලිපියක් යවා තිබේ. මේ පිළිබඳව විමර්ශන කටයුතු මෙහෙයවූ ත්‍රස්ත විමර්ශන අංශයේ නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා වෙත යොමු කරන ලදී. ජමීල්ගෙන් ත්‍රස්ත විමර්ශන අංශය විසින් 2018.04.12 දින ප්‍රශ්න කරන ලද අතර ප්‍රකාශයක් වාර්තා කර ඇත. ඔහු අයි.එස් ආධාරකරුවෙකුවේද, අයිඑස් සංවිධානයෙහි දෘෂ්ටිවාදය ප්‍රචාරය කරන්නේද, අයිඑස් සංවිධානයට බැඳීමට ඔහුට ආශාවක් වේද, එමෙන්ම ඔහු ඉස්ලාමීය රාජ්‍යයක ජීවත් වීමට කැමතිද යන්න පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඔහුගෙන් විමසන ලදී. ජමීල් අනෙක් යෝජනා ප්‍රතික්ෂේප කරමින් ඉස්ලාමීය රාජ්‍යයක ජීවත් වීමට කැමති බවට පිළිතුරු දුන්නේය.

පාස්කු ඉරිදා ප්‍රහාරයට පෙර ජමීල් පිළිබඳ පොලිස්පතිවරයාට වරින් වර වාර්තා **8** ක් ත්‍රස්ත විමර්ශන අංශය විසින් යවා තිබුණි. එසේ වාර්තා වූ කරුණු අතර සිරියාවේ අයිඑස් වෙනුවෙන් සටන් කරමින් සිටියදී මියගිය නිලම්ව මල්ලිකාරාම පාරේ පිහිටි මුස්ලිම් දේවස්ථානයකදී ජමීල් දැන ඇති බව ද සඳහන් විය. මෙම සියලු වාර්තාවලින් පෙනී ගියේ ජමීල් අන්තවාදී අදහස් දරන පුද්ගලයෙකු බව පරීක්ෂණවලින් හෙළි නොවූ බවයි. ජමීල්ට නිලාම් සමඟ සමීප සම්බන්ධයක් ඇති බවට තහවුරු කිරීමට කිසිදු තොරතුරක් හමු නොවූ බව ද වාර්තා විය. අවසන් වාර්තාව **2019** අප්‍රේල් **10** දිනැතිව සිදු කර ඇති අතර එහි ජමීල්ගේ කිසිදු අන්තවාදී ක්‍රියාකාරකමක් පිළිබඳ තොරතුරු නොමැති බව කියැවේ.

කෙසේ වෙතත්, අවම වශයෙන් **2016** දෙසැම්බරයේ සිට හමුදා බුද්ධි අංශ විසින් ජමීල් ආගමික අන්තවාදියෙකු ලෙස හඳුනාගෙන ඔහු පිළිබඳව නිරතුරුවම සෝදිසියෙන් සිට ඇත. මෙය බුද්ධි අංශ විසින් හමුදාපතිට වාර්තා කරන ලදි. ජාතික ආරක්ෂක මණ්ඩලයේ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම්වලදී ජමීල්ගේ අන්තවාදී ක්‍රියාකාරකම් සඳහන් කළ බව හමුදා බුද්ධි අංශ අධ්‍යක්ෂක විසින් සාක්ෂි ලබා දෙන ලදී.

ජමීල් **2014** සහ **2015** අතර ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් ජාත්‍යන්තර වට්ස්ඇප් කණ්ඩායමේ සාමාජිකයෙකි. ඊබ්‍රාහිම් නබිගේ දෘෂ්ටිවාදය අනුගමනය කරන පුද්ගලයින් ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් ලෙස හැඳින්වේ.

2019 අප්‍රේල් **19** වන දින ජමීල් ඔමාර්කතාට දන්වා සිටියේ ඔහු මිතුරන් කිහිප දෙනෙකු සමඟ පිටතට යන බවත් ඔහු මිලදී ගත් ගමන් බෑගයක ඇඳුම් කිහිපයක් ඇසුරුම් කරන ලෙසත්ය. රාත්‍රී **10** ට පමණ ඔහු ත්‍රිරෝද රථයකින් නිවසින් පිටත්ව ගියේය. ළමයින් නිදා සිටියදී, ඔහු ඔවුන්ගේ මුහුණු මත සිඹ, ඔහුගේ බිරිඳගේ නළලත සිපගෙන සමුගත්තේය.

අප්‍රේල් **21** වන දින උදේ **8.30** ට පමණ ඔමාර්කාතාට නාඳුනන අංකයකින් වට්ස්ඇප් හඬපට පණිවිඩයක් ලැබුණි. හිජ්රාත් යාම ගැන තමා බොරු කියා ඇති බවත්, ඔහු අල්ලාහ්ව මුණ ගැසීමට යන බවත් ජමීල් විසින් එයින් දැනුම් දී තිබෙන අතර එම පණිවිඩය පොලිසියට පෙන්විය හැකි බවත් ඔහු ඒ සමඟ පවසා තිබුණි. ඇය එම අංකයට වට්ස්ඇප්

ඇමතුමක් ගැනීමට උත්සාහ කළ නමුත් දූරකථනය නාද වුවද පිළිතුරක් නොලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී.

2019 අප්‍රේල් 26 වන දින දෙහිවෙලහි ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේ සිදුවූ පිපිරීමෙන් ජමීල් මිය ගියේය.

5. හයාතු මොහමදු අහමදු මිල්හාන්

සහරාන්ගේ කණ්ඩායම තුළ ඔහු අබු සීලා / අබු හලිත් ලෙස හැඳින්විණි.

මිල්හාන් 1989 ජූලි 18 වන දින කාත්තන්කුඩිහි උපත ලැබීය. ඔහුගේ පියා ආදම් ලෙබ්බෙ හයාතු මොහමදු සහ මව මොහමදු කාසිම් සිත්ති නජිමා නම් විය .

ඔහු 1 ශ්‍රේණියේ මෙත්තයි මුස්ලිම් පල්ලියේ, කාත්තන්කුඩි බදූරියා පාසලෙන් 2 වන ශ්‍රේණියේ දක්වාද කාත්තන්කුඩි, අල් අහමින් මහා විද්‍යාලයයෙන් 3 සිට 5 ශ්‍රේණිය දක්වා, 6 වන ශ්‍රේණියේ සිට උසස් පෙළ විභාගය දක්වා කාත්තන්කුඩි මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබීය. ඔහු වාණිජ අංශයෙන් විභාගයට පෙනී සිටිමින් සාමාර්ථ තුනක් ලබා ගත්තේය.

2006 දී පමණ මිල්හාන් එල්ටීටීඊයට එරෙහි සටනේදී ශ්‍රී ලංකා හමුදාවේ බුද්ධි අංශ නියෝජිතයෙකු ලෙස සේවය කරමින් සිටි රාසික් මොහොමඩ් ෆයිස් නොහොත් පොලිස් ෆයිස් සමඟ සම්බන්ධතා පැවැත්වීය. එකල මුස්ලිම් තරුණ තරුණියන් බුද්ධි අංශ නියෝජිතයින් ලෙස බඳවා ගනු ලැබුවේ ඔවුන්ගේ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය හේතුවෙනි. ඉන්පසුව මිල්හාන් පෙ ායිස් සමඟ ශ්‍රී හමුදාවේ බුද්ධි අංශ නියෝජිතයෙකු ලෙස සේවය කළේය. 2007 දී පොලිස් ෆයිස වසින් මිල්හාන්ට ටී -56 ආයුධයක් භාවිතයෙන් පුහුණුව ලබා දී එය ගලවා කර සවි කළ යුතු ආකාරය පෙන්වා දී ඇත. ඔහු මිල්හාන් සහ තවත් තරුණයන් කිහිප දෙනෙකු කැලෑවට ගෙන ගොස් කාය වර්ධන පුහුණුව ලබා දුන්නේය. ඔවුන්ගෙන් එක් අයෙක් පාස්කු ඉරිදා ප්‍රහාර සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසුවෙයි. සහරාන් විසින් සංවිධානය කරන ලද පුහුණු කඳවුරුවල ආයුධ පුහුණුවීම් කිරීමට මිල්හාන්ට මෙම අත්දැකීම නිසැකවම ඉවහල් විය.

2009 දී මිල්හාන් මරදාන මහාචාර්ය ජයසූරිය අනුස්මරණ ජාත්‍යන්තර පාසලේ වෛද්‍ය රසායනාගාර කාර්මික පාඨමාලාවක් හැදෑරීය. 2010 සිට 2011 දක්වා ඔහු කාත්තන්කුඩි සිපා සායනයේ සේවය කළ අතර 2011 දී රසායනාගාර කාර්මිකයෙකු ලෙස නවලෝක රෝහලට සම්බන්ධ විය.

මිල්හාන් 2012 දී කටාර් රාජ්‍යයට ගොස් වෛද්‍ය නියෝජිතයෙකු ලෙස වසර එකහමාරක් පමණ සේවය කළේය. ඔහු 2013 ජුනි මාසයේදී නැවත ශ්‍රී ලංකාවට පැමිණියේය. ඔහු මාස 8 ක් පමණ ශ්‍රී ලංකාවේ සේවය කළ අතර 2014 දී නැවත කටාර් බලා ගියේය.

මිල්හාන් පෙර සිටම ෆේස්බුක් ඔස්සේ නවුෆර්ව හඳුනාගෙන තබුණ ද, 2016 දී කටාර්හිදී අවස්ථා කිහිපයකදී පුද්ගලිකව ඔහුව මුණගැසීමට හැකි වී ඇත. 2015 අග භාගයේදී පමණ නවුෆර් අයිඑස් විවේචනය කර තිබුණි. කෙසේ වෙතත් 2016 වන විට ඔහු අයිඑස් සංවිධානයට සහාය පළ කරමින් සමාජ මාධ්‍යවල ලිපි පළ කරමින් සිටියේය. මිල්හාන් අයිඑස් දෘෂ්ටිවාදයේ ආධාරකරුවෙකු බවට පත් කළේ නවුෆර් ය. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට අයුක්තියක් සිදුව ඇති බවත් ඔවුන් ඊට එරෙහිව නැගී සිටිය යුතු බවත් ඔහු නවුෆර්ට පැවසීය.

2017 දී මිල්හාන් නැවත ශ්‍රී ලංකාවට පැමිණියේය. ඔහු පාසල් කාලයේ සිටම රිල්වාන්ගේ මිතුරෙකි. දිනක් රිල්වාන් ඔහුට කතා කොට, සහරාන් සමඟ කතා කිරීමට රැගෙන ගොස් ඇත. එහිදී ඔහුට සහරාන් විසින් දිගන සහ අළුත්ගම සිදුවීම් සහ රැස්වීමක් පැවැත්වීමේ අවශ්‍යතාවය ගැන කතා කළේය. ඔවුන් මුණ ගැසුණු අතර සහරාන් ප්‍රකාශ කර ඇත්තේ නවුෆර් ඔහුට රැස්වීමේ විස්තර දැනුම්දෙනු ඇති බවය. ඉන්පසු නවුෆර් විසින් කරන ලද දැනුම්දීම මත මිල්හාන් 2017 නොවැම්බරයේ දී මැදවච්චියේ රාඹා වැව ප්‍රදේශයෙහි අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆිගේ නිවසේ පැවති පුහුණු කඳවුරට සහභාගී විය. පුහුණුවට සහභාගී වූවන් අයිඑස් ධජය ඉදිරියේ ප්‍රතිඥාවක් ලබා දුන්හ.

ඉන්පසුව ඔහු සහරාන් විසින් පවත්වන ලද පුහුණු කඳවුරු 16 ක් හෝ 17 ක් අතරින් 13 ක හෝ 14 ක, ආයුධ පුහුණුකරු ලෙස කටයුතු කළේය.

දිගන - තෙල්දෙණිය සිදුවීම්වලින් පසු ඉන්ෂාෆ් අහමඩ්, මුස්ලිම්වරුන්ට සැමවිටම තාඩනයට පීඩනයට ලක්වෙමින් සිටිය නොහැකි බව සිතා, කඩු එකතු කිරීමට පටන් ගත්තේය. ඔහු මොහොමඩ් ෂිෆාස් සත්තාර්ගේ සහාය පැතුවේය. ඔහු කුරුණෑගල සහ මීගමුවෙහි නිපදවන ලද කඩු කිහිපයක් ඉන්ෂාෆ්ට ලබා දුන්නේය. පසුව ඔහු වෙළඳපොලෙන් ද කඩු මිල දී ගෙන ඉන්ෂාෆ්ට ලබා දුන්නේය.

පසුව කඩු කිහිපයක් සොයා දෙන ලෙස මිල්හාන් සහ රිල්වාන් විසින් මොහොමඩ් ෂිෆාස් සත්තාර්ගෙන් ඉල්ලීමක් කළහ. එම කඩු බේරුවල සහ කුරුණෑගල ප්‍රදේශවලට යවන ලදි. කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන නාගරික කොමසාරිස් ලෙස කටයුතු කළ මොහොමඩ් අර්ෂාඩ් සහ මවුලවි මොහොමඩ් ගවුස් මොහොමඩ් ෆර්හිම්ගේ සහභාගීත්වයෙන් මස්ජිඩ් දුල් කාදර් ජුම්මා පල්ලියට කඩු 50 ක් ලබා දෙන ලදී.

2018 නොවැම්බර් 30 වන දින වවුනතිව්හි දී ආයුධ ලබා ගැනීම සඳහා පොලිස් නිලධාරීන් දෙදෙනා ඝාතනය කිරීමේ සිදුවීමට මිල්හාන් සම්බන්ධ වී තිබේ. අනතුරුව 2019 මාර්තු 9 වන දින මොහොමඩ් රාසික් මොහොමඩ් තස්ලිම් ඝාතන තැත සඳහා ද ඔහු සම්බන්ධ වී ඇත.

ඇත්ත වශයෙන්ම ඔහු වනාතාවිල්ලුවේ පුහුණු කඳවුරක් පිහිටුවීමේදී මොහු වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. හස්තුන් සහ රිල්වාන් සමඟ වනාතාවිල්ලුව සහ මීගමුව ආරක්ෂිත නිවස්වල පුපුරණ ද්‍රව්‍ය සැකසීමට ද ඔහු සම්බන්ධ විය.

මිල්හාන් සහ රිල්වාන් 2018 මැයි මාසයේදී පිටුකොටුවෙන් බෝම්බ නිෂ්පාදනය සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීමට සම්බන්ධ වූහ. ඔහු සිරියාවේ අයිඑස් ක්‍රියාකාරිකයෙකු සමඟ සම්බන්ධකම් පැවැත්වූයේ නීති විරෝධී මූල්‍ය ගනුදෙනු ජාලයේ හවුල් ක්‍රියාකරුවෙකු ලෙස කටයුතු කළ අබු දාවුඩ් හසාකි නොහොත් අබු සුලෙයිමාන් සමඟය.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු කටාර්හි දී අත්අඩංගුවට ගැනීමෙන් පසු මිල්හාන් මේ වන විට අත්අඩංගුවේ පසුවෙයි.

6. මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා

සහරාන්ගේ කණ්ඩායම තුළ ඔහු අබු උමර් ලෙස හැඳින්විණි.

සාදික් දෙල්ගහගොඩ පාසලෙන්ද පසුව මාවනැල්ල සහිරා විද්‍යාලයෙන් ගණිත අංශයෙන් (දෙමළ මාධ්‍යයෙන්) අධ්‍යාපනය ලැබීය. ඔහු මහනුවර අයිසීබීටී කැම්පස් හරහා අයර්ලන්තයේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ කළමනාකරණ විද්‍යාවේදී උපාධියක් ලබාගෙන ඇත. ඔහුගේ පාසල් කාලය තුළ ඔහු SLJISM හි ක්‍රියාකාරකම්වලට සම්බන්ධ විය. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු ඔහු මාවනැල්ලෙහි හිඟුල ඔය පල්ලියේ දින පහක පාඨමාලාවට සහභාගි විය. ඉන්පසු ඔහු උසස් පෙළ විභාගයෙන් පසු, දින හතක පාඨමාලාවට සහභාගි විය.

පසුව ඔහු SLJISM සංවිධානයෙහි ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ අතර ගංවතුර සහනාධාර සහ රුධිර පරිත්‍යාග කඳවුරු මෙන්ම වෙනත් ක්‍රියාකාරකම් වැනි සමාජ සේවා ව්‍යාපෘති කිහිපයකට සහභාගී වූ අතර ඒවායේ තනතුරු කිහිපයක් ද දැරීය. 2012 දී සබරගමුව පළාතේ සම්බන්ධීකාරක ලෙස පත් වූ ඔහු පසුව 2013 සිට 2015 දක්වා ජාතික සංවිධායක ලෙස කටයුතු කළේය. මෙය පූර්ණ කාලීන තනතුරක් වූ අතර ඔහුට රු. 18,500 ක මාසික ගෙවීමක් සිදු කරන ලදී. එය 2015 වන විට රු. 25,000 ක් දක්වා වැඩි විය.

සාදික්ට එස්එල්ජේඅයි හරහා 2014 දී තුර්කියට යාමට අවස්ථාවක් ලැබුණු අතර පසුව සිරියාවට ගොස් ආයුධ පුහුණුව ලැබීය. 2011 දී SLJISM හි ජාතික සංවිධායක ලෙස කටයුතු කළ අහමඩ් මුන්ෂිෆ් නැමැත්තෙක් මෙම අවස්ථාව සම්බන්ධව ඔහුට පවසා, සිරියාවේ අවි පුහුණුව සඳහා අවස්ථාවක් ඇති බව ඇඟවීය. එස්.එල්.ජේ.අයි හි ප්‍රධාන කාර්යාලයේදී අබු අබ්දුල්ලා නම් විදේශිකයෙකු හමුවීමට ඔහු සාදික්ට අවස්ථාව ලබා දුන්නේය. අබු අබ්දුල්ලා යනු ලූක්මන් තාලිබ් අහමඩ් ය. 2014 මැයි මාසයේදී තුර්කියට පැමිණි අවස්ථාවේදී සාදික්ව රැගෙන යාම සඳහා පැමිණියේ අබු අබ්දුල්ලා වන අතර සාදික්ව නවාතැනට ගෙන යන ලද්දේ ඔහු විසිනි. ගමන සඳහා ටිකට් පත එවකට එස්.එල්.ජේ.එස්.එම් හි නායකයා වූ සුහියන් විසින් සාදික්ට ලබා දෙන ලදී.

සදීක් මාස දෙකක් පමණ ඉස්තාන්බුල් හි නැවතී සිටි නමුත් ඔහුට භාෂාව නොවැටහෙන නිසා ඔහු ලියාපදිංචි වූ පාඨමාලාවට සහභාගී නොවීය. සියලුම වියදම් අබු අබ්දුල්ලා විසින් දරණ ලදී. මෙම නවාතැනේදී ඔහුට තවත් **SLJISM** ක්‍රියාකාරිකයෙකු වන ඉර්ෆාන් මුණ ගැසුණි.

ඉන්පසු සාදීක් තුර්කි-සිරියානු දේශ සීමාව හරහා  සිරියාවට ගොස් ඇලෙප්පෝ වෙත ගෙන යන ලදී. එහිදී ඔහු යුද්ධය හේතුවෙන් තරමක් හානි වූ විශාල නිවසක නැවතී සිටි අතර ඊට සහභාගී වූ තවත් දොළොස් දෙනෙකු සමඟ නැවතී සිටියේය. ඔවුන් දින හතළිහක පුහුණු වැඩසටහනකට සහභාගී වූ අතර කාය වර්ධන හා ආයුධ පුහුණුවකින් සමන්විත උපායමාර්ගික පුහුණුවක් ඊට ඇතුළත් විය. දින **56** ක් පමණ සිරියාවේ සිටි සාදීක් නැවත තුර්කියට ගිය අතර දින දෙකක් ඇතුළත **2014** ඔක්තෝබර් මාසයේදී පමණ ශ්‍රී ලංකාවට පැමිණියේය.

අයිඑස්අයිඑස් වෙනුවෙන් සටන් කරමින් සිටියදී සිරියාවේදී මොහොමඩ් මුහුෂින් සර්ෆාස් නිලාම් නොහොත් අබු සුරයි සෙලානි නම් ශ්‍රී ලාංකිකයෙකු ඝාතනය වූ බව **2015** මැද භාගයේදී ප්‍රසිද්ධ විය.නොබෝ කලකින්ම , ශ්‍රී ලංකා ජමතේ ඊබ්‍රාහිම්  සංවිධානයේ නිලධාරීන් කිහිපදෙනෙක් සාදීක් හමුවී ඔහු සිරියාවට ගොස් පුහුණුව ලැබූ බව දැනගත් අතර එය ප්‍රසිද්ධ විමත්  සමඟ  ශ්‍රී ලංකා ජමතේ ඊබ්‍රාහිම්  සංවිධානයට කැළලක් වන නිසා ඔහුව නෙරපා හරින බව දන්වා සිටියේය.

**2015** දී ඔහු විවාහ වී ගොවිපලක් ආරම්භ කළේය. සාදීක් පවසන පරිදි **2018** මාර්තු මාසයේදී ඔහු සහරාන්ගේ වීඩියෝවක් සමාජ මාධ්‍යවල දකින අතර එහිදී ඔහු කියා සිටින්නේ මුස්ලිම්වරුන් පසුනොබසිමින් සටන් කළ යුතු බවත්, මුස්ලිම් විරෝධී ක්‍රියාවන්ට බෞද්ධයින්ගෙන් පළිගත යුතු බවත්ය. දිගන සිද්ධියෙන් මාසයකට පමණ පසු ඔහුට සහරාන් හමුවිය. සහරාන් අයිඑස් සමඟ සම්බන්ධ වී සිටින බව සාදීක්ට දැනුම් දුන්නේය.

සහරාන් විසින් පවත්වන ලද පුහුණු කඳවුරු දෙකක් සඳහා ඔහු සහභාගී විය. මෙම කඳවුරු දින දෙකක කාල පරාසයක් සහිතව 2018 ජුනි මාසයේදී නුවරඑළියෙහි පැවැත්විණි. ඔවුන්ට ටී -56 ආයුධයක් පෙන්වන ලදී.

ඊට අමතරව ඔහු විසින්ම තනිවම පුහුණු කඳවුරු පැවැත්විය. ඉන් එකක් 2017 නොවැම්බර් හෝ දෙසැම්බර් මාසයේදී මුත්තූර් හි තොප්පූර් හිදී විය. මෙය සාදික් විසින් මෙහෙයවන ලද අතර පුද්ගලයින් 6 දෙනෙකු පමණ සහභාගී විය. සහරාන් මෙම පුහුණු කඳවුරට සහභාගී වූ බවට මෙතෙක් කිසිදු සාක්ෂියක් නොමැත. සාදික් ටී -56 ආයුධය ගැලවීම හා වෙඩි තැබීම සඳහා සූදානම් කිරීම පිළිබඳ ප්‍රායෝගික ඉදිරිපත් කිරීමක් සිදුකර තිබුණි. පුහුණුව සඳහා භාවිතා කරන ලද නිවස අයිති වන්නේ සාදික්ගේ මිතුරෙකු වන හජා මොහිදීන්ට වන අතර එය එක් දින කඳවුරක් ලෙස පැවැතවිණි.

2018 දෙසැම්බර් 14 සිට 18 දක්වා හිඟුල, දෙල්ගහගොඩ අංක 130 / බී දරණ ස්ථානයේ හයිරියා මස්ජිඩ් තවුහිද් පල්ලියේ සාදික් තවත් කඳවුරක් පැවැත්වීය. ඔහුට සහාය වූයේ ඔහුගේ සහෝදර ෂාහිඩ් විසිනි. මාවනැල්ල, කඩුගන්නාව සහ දෙල්ගොඩ යන ප්‍රදේශවලින් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට නියමිතව සිටි ළමුන් 30ක පමණ පිරිසක් උදෙසා මෙම නේවාසික කඳවුර පවත්වන ලදී. දේශන පැවැත්වූයේ අයි.එස්. පිළිබඳවය. සහභාගී වූවන්ට IS විසින් කුඩා දරුවෙකු ඝාතනය කරන ආකාරය වීඩියෝ දර්ශනයකින් පෙන්වන ලදී. දිගන සිද්ධිය පිළිබඳව ද මෙහි දී සඳහන් කර ඇති අතර සහභාගී අයහට එහිදී උපදෙස් දෙන ලද්දේ පහර දෙන්නේ නම් තමා ද යළි පහර දිය යුතු බවයි.

ඔහු දැනට අත්අඩංගුවේ පසුවෙයි.

7. අච්චි මොහම්මදු මොහමදු හස්තුන්

සහරාන්ගේ කණ්ඩායමේ ඔහු අබු මොහොමඩ් ලෙස හැඳින්විණි.

ඔහු 1994 දී උපත ලැබීය. ඔහුගේ පියා උසනාර් හජ් මොහමඩ් සහ මව අබ්දුල් ලතීෆ් රවූමත් උම්මා ය. ඔවුන් පදිංචිව සිටින්නේ වලච්චෙනෙයි හි ය. ඔහුට සහෝදරයන් දෙදෙනෙකු සහ එක් සහෝදරියක් සිටී.

ඔහු කාත්තන්කුඩි මධ්‍යම විද්‍යාලයෙන් දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා අංශයෙන් නියෝජනය කරමින් විභාගයට පෙනී සිටියේය.

කාත්තන්කුඩිහිදී සහරාන්ගේ දේශන වීඩියෝ ගත කිරීම ඔස්සේ ඔහු සහරාන් දැන හඳුනා ගත්තේය. ඔහු 2015 දී ජාතික තවුහිද් ජමාත් ආයතනයට සම්බන්ධ විය. සහරාන් විසින් සංවිධානය කරන ලද බොහෝ පුහුණු කඳවුරුවලට සහභාගී වූ ඔහු, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගේ අවධානයට ලක් නොවන ලෙස ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය භාවිතය මෙන්ම දුරකථන භාවිතා කිරීම පිළිබඳ දේශන පවත්වා ඇත.

මිල්හාන් බෝම්බ සෑදීම පිළිබඳ අන්තර්ජාලය හරහා හොඳ දැනුමක් ලබා ගත්තේය. මරාගෙන මැරෙන බෝම්බ සෑදීම සඳහා ඔහු සම්බන්ධ විය. උපදෙස් ආදිය ඉංග්‍රීසියෙන් වූ බැවින් වරින් වර ඒවායේ අදහස තේරුම් ගැනීමට ඔහු සාරාගේ සහාය පැතීය. ඔහු සාරා සමඟ විවාහ විය.

ඔහු අවසන් වරට තම පවුල දුරකථනයෙන් අමතා ඇත්තේ 2019 පෙබරවාරි මාසයේදීය. ඔහු කටුවපිටියේ ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සිදුකළ තැනැත්තා විය.

**8.** අහමඩ් ලෙබ්බේ මොහොමඩ් නියාස්

1982 දී උපත ලැබූ ඔහු 1 වසරේ සිට 10 වසර දක්වා කාත්තන්කුඩි මධ්‍යම විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අතර පසුව හමුදා බුද්ධි අංශයට බැඳුණි.

ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ ස්වාධීන මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කළ අතර වර උරෙයිගල් සහ ශ්‍රී ලංකා මුස්ලිම් වර්ල්ඩ් ප්‍රෙස් යන වෙබ් අඩවි දෙකක් පවත්වාගෙන

ගියේය. ඔහු ජංගම දුරකථන සහ ලැප්ටොප් පරිගණක අලුත්වැඩියා කරමින් සිටියේය. ඔහුහට අරාබි ඇතුළු භාෂා පහකින් චතුර ලෙස කතා කිරීමේ හැකියව ද තිබුණි. අලියාර් හන්දිය සිදුවීමෙන් පසු ප්‍රදේශයෙන් බහරේනයට පලා ගිය ගොස් ඔහු පසුව 2018 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණ ඇති බව වාර්තා වේ.

ඔහු අයිඑස් සංවිධානයට සාමාජිකයින් බඳවා ගැනීමේ දකුණු ආසියා නියෝජිතයා ලෙස කටයුතු කළ බව වාර්තා වේ.

ඔහු 1997 සිට කාත්තන්කුඩි ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ජිහාඩ් ව්‍යාපාරයේ කොටස්කරුවෙක් විය. 2004 සිට ඔහු හමුදා බුද්ධි අංශ සමඟ සම්බන්ධතා පවත්වා ගෙන ගියේය. 2007 දී ඔහු රැකියාව සඳහා කුවේටයට ගොස් 2016 ජුනි 31 වන දින ශ්‍රී ලංකාවට පැමිණියේය. පසුව ඔහු ජාතික තවුහිද් ජමාත් සමඟ සම්බන්ධ වෙමින් සහරාන් සමඟ සමීපව කටයුතු කළේය.

ඔහු 2019 අප්‍රේල් 26 වන දින සයින්දමර්දු හිදී මරණයට පත්විය .

9. මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්

සහරාන්ගේ කණ්ඩායමේ මුබාරක් අබු අබ්දුල්ලා ලෙස හැඳින්විණි.

ඔහු ඉපදී හැදී වැඩුණේ කොළඹ 12 හි බණ්ඩාරනායක මාවත ප්‍රදේශයේ පිහිටි මාලිගාවත්තේ ඇලෙක්සැන්ඩ්‍රියා ජාත්‍යන්තර පාසලින් සාමාන්‍ය පෙළ විභාගය තෙක් අධ්‍යාපනය ලබා ඇත. ඔහු සපත්තු ව්‍යාපාරයක නිරත වූ අතර ඒ හේතුවෙන් ඔහු කිහිප දෙනෙකුගෙන් ණය ලබාගෙන තිබුණි.

ඔහුගේ නොගැවුණු ණය නිසා ඔහු සැඟවුණු ජීවිතයක් ගත කළේය. මෙම මරාගෙන මැරෙන බෝම්බකරු භාවිතා කළ අංක ලෙස මේ වන විට ජංගම දුරකථන අංක 14 ක් හඳුනාගෙන ඇති අතර, ඉන් 11 ක් ඔහුගේම හැඳුනුම්පත් අංකයෙන් ද, සෙසු දුරකථන අංක තුන වෙනත් පුද්ගලයින්ගේ නමින් ද ලියාපදිංචි කර ඇත. මුබාරක් ආරක්ෂිත නිවාස

කුලියට ගෙන වැන් රථයක් මිල දී ගෙන ඇති අතර ඔහුගේ නමින් බැංකු ගිණුම් 32 ක් තිබී ඇත.

මුබාරක් සම්බන්ධයෙන් කිසිදු අපරාධයක් සිදු කිරීම පිළිබඳ වාර්තාවක් නොතිබුණි. මුබාරක්ට අයත් විදේශ ගමන් බලපත්‍ර දෙකක (අංක N 6725891 සහ එන් 1782827) ඔහු සෞදි අරාබිය (2006 සහ 2015), ඉන්දියාව 2012, පකිස්ථානය 2013, බංග්ලාදේශය 2016, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ චීනය 2018 යන රටවල් කිහිපයක සංචාරය කර ඇති බව පෙන්නුම් කරයි.

මුබාරක් විසින් 2016.04.16 දින කාත්තන්කුඩිහි පැවති ප්‍රහාරයකට කලින් යතුරු පැදියක අටවන ලද බෝම්බ පිපිරවීමේ පෙර සූදානම සඳහාද සහභාගී විය. ඔහු අවස්ථා කිහිපයකදී සහරාන්ගේ රියදුරු ලෙස කටයුතු කර ඇත.

කිංස්බරි හෝටලයට පහර දුන් මරාගෙන මැරෙන බෝම්බකරු ඔහු විය .

10. මූමඩ නසාර් මොහොමඩ් අසාද්

ඔහු සහරාන්ගේ කණ්ඩායම තුළ අකා අබු මුක්තාර් ලෙස හැඳින්විය.

අසාද් 1985 නොවැම්බර් 05 වන දින ආරියම්පතිහි උපත ලැබීය. ඔහුගේ පියා මසුන් ඇල්ලීමේදී එල්ටීටීඊය විසින් මරා දමන ලදී. ඔහුගේ බිරිඳ අබ්දුල් රහීම් ෆෙරෝසා ය.

ඔහු 2005 සිට 2010 දක්වා සහ 2010 සිට 2012 දක්වා කටාර්හි සිටියේය.

මඩකලපුවෙහි සියොන් පල්ලියට පහර දුන් මරාගෙන මැරෙන බෝම්බකරු අසාද් ය.

ඉහත දක්වා ඇති කරුණු කාරණා ජනාධිපති පර්යේෂණ කොමිෂන් සභාව ඉදිරියේ මෙහෙයවන ලද වාචික හා ලිඛිත සාක්ෂි වල කොටසක් වන අතර විමර්ශකයන්ගේ සහ බුද්ධි අංශවල සාක්ෂි ද ඇතුළත්ව වේ.

17 වන පරිච්ඡේදය

## විදේශ මැදිහත්වීම

සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විසින් පමණක් මෙම ප්‍රහාර සිදුකර නොමැති බවත්, ප්‍රහාර පිටුපස විදේශීය හස්තයක් ඇති බවත් සාක්ෂිකරුවන් කිහිපදෙනෙක් සාක්ෂි දුන්හ. කෙසේ වෙතත්, ඔවුන්ගෙන් කිසිවෙකු හුදෙක් තහවුරු නොකරන ලද අනුමාන *(ipse dixit)* හැරෙන්නට මෙම කරුණ විමසා බැලීමට පරීක්ෂණ කොමිසමට සහාය දැක්වීමට කිසිදු සාක්ෂියක් ලබාදී නැත. මෙම ප්‍රහාරය පිටුපස බාහිර හස්තයක් හෝ කුමන්ත්‍රණයක් ඇති බවට පහත දැක්වෙන සාක්ෂිකරුවන් ඇහවුම් හෝ පැහැදිලිව සාක්ෂි දුන්හ:

1. කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්
2. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන
3. හිටපු අමාත්‍ය රාවුෆ් හකීම්
4. හිටපු අමාත්‍ය රිෂාඩ් බතියුදීන්
5. හිටපු ආණ්ඩුකාර අසාත් සාලි
6. පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රාහුමන් මහතා .
7. නිලන්ත ජයවර්ධන මහතා, රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ
8. ලතීෆ් මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, විශේෂ කාර්ය බලකාය අණදෙන නිලධාරී (විශ්‍රාමික)
9. රවීන්ද්‍ර විජේගුණරත්න මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා (විශ්‍රාමික)

10. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති / අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු රවී සෙනෙවිරත්න මහතා (විශ්‍රාමික)

11. ශානි අබේසේකර මහතා, රහස් පොලිසි (සී .අයි. ඩී.) අධ්‍යක්ෂ (වැඩ තහනම යටතේ)

එහෙත් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් එහි ඇති සම්පත් හා බලය යොදාගෙන මෙම ගැටළුව විමර්ශනය කිරීමට උත්සාහ කළේය.

ප්‍රහාරය සිදුකළ කණ්ඩායමේ සැබෑ නායකයා සහරාන් නොවන බවට ප්‍රකාශ කිරීමට එක් හේතුවක් වන්නේ ඔහු අනෙක් ප්‍රහාරකයන් සමඟ සියදිවි නසා ගැනීමයි. ලෝකයේ කිසිම තැනක ත්‍රස්තවාදී සංවිධානයේ නායකයෙකු මුලදී මරාගෙන මැරෙන ප්‍රහාරයකට සහභාගීවී නොමැති බව පැවසේ. මෙම කරුණ සම්බන්ධයෙන්, 2019 මාර්තු 25 වන දින පැවති රැස්වීමක සාක්ෂි ඇසීමේ අවස්ථාව පරීක්ෂණ කොමිසම් සභාවට හිමි විය. එහිදී සහරාන් සහ නවුෆර් අතර ඇති වූ ආරවුලක් සහ සාකච්ඡාවක් පැවැත්වීමේ අවශ්‍යතාවය ගැන මුවාත් විසින් සමීර්ට දැනුම් දුන්නේය. ඉන් දින දෙකකට පසු, 2019 මාර්තු 27 වන දින දැනට අත්අඩංගුවේ පසුවන සමීර් සහ තවත් දෙදෙනෙකු මුවාත් සහ ජමීල් මුණගැසී අංක 61/02 නස්මියා විලා, ෂෙරිෆ් පාර, පාරාඩු පාර, පානදුර යන නිවස වෙත ගියහ. ඔවුන් එහි පැමිණෙන විට සහරාන් සහ හස්තුන් එහි සිටියහ.

සහරාන් මෙම ප්‍රහාර සඳහා සිය සැලසුම් ගෙනහැර දැක්වීමෙන් පසුව, බංගලාදේශයේ අයිඑස් කණ්ඩායමේ නායකයා විසින් සිදුකරන ලද මරාගෙන මැරෙන ප්‍රහාරයට සමාන මරාගෙන මැරෙන ප්‍රහාරයට ද සහභාගී වන බව ඔහු එහි සිටි අයට දැනුම් දුන්නේය.

සහරාන් මෙහි දී සඳහන් කොට ඇත්තේ, තම කුන්යා අබු ඊබ්‍රාහිම් අල්-හනීෆ් ලෙස හඳුන්වන තමීම් අහමඩ් චෞද්‍රි සහ බංගලාදේශයේ ඉස්ලාමීය රාජ්‍යයේ එමීර්වරයා පිළිබඳව බව පෙනේ. ඔහු 2016 ජූලි මාසයේ ගුල්ෂාන් ආපන ශාලාවට ඩකා ප්‍රහාරය එල්ල කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මරණ 29 ක් සිදුවිය. මෙම ප්‍රහාරයෙන් තමීම් මියගොස් ඇති බව සහරාන් වැරදි ලෙස විශ්වාස කළේය. කෙසේ වෙතත්, 2019 මාර්තු 27 වන දින අංක

61/02 නස්මියා විලා, ෂෙරිෆ් පාර, පානදූර යන ස්ථානයේදී සිදුවූ දේ පිළිබඳ සාක්ෂියේ මෙම කොටස සැක කිරීමට පරීක්ෂණ කොමිසමට කිසිදු හේතුවක් නැත.

වනාතවිල්ලුවේ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමෙන් පසුව සහරාන් සියදිවි නසාගැනීමේ ප්‍රහාරයක් සඳහා වූ සැලසුම් කඩිනම් කළ බවට සාදික් සාක්ෂි දුන් සාදික්ගේ සාක්ෂි මඟින් ඇත්ත වශයෙන්ම මෙම ස්ථාවරය සනාථ වේ. මෙම සොයා ගැනීම පුපුරණ ද්‍රව්‍ය කඳවුරට ප්‍රවාහනය කිරීමට සහභාගී වූ නිසා සහරාන්ගේ මස්සිනා වන අන්සාර් අත්අඩංගුවට ගැනීමට හේතුවිය. එදිනම රහස් පොලිසියේ නිලධාරීන් හාදියාගේ නිවසට පැමිණ ප්‍රකාශයක් සටහන් කර ගත්හ. දින දෙකක් ඇතුළත සහරාන් හාදියාව සහ පවුලේ අයව ආරක්ෂිත නිවසකට ගෙන ගියේ. එතැන් සිට ඔහු පවුල සැමවිටම විවිධ ආරක්ෂිත නිවාසවල තබා ගත්තේය. තමන්ව නුදුරේදීම සොයා ගෙන අත්අඩංගුවට ගනු ඇතැයි සහරාන් නිරතුරුවම සැකයෙන් පසු වූ බව පෙනී යයි.

විදේශීය මැදිහත්වීමක අනන්‍යතාවය පිළිබඳව ව්‍යංගයෙන් සාක්ෂි දුන් එකම සාක්ෂිකරු රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධනය. අබු හින්ද් නම් ඉන්දියානුවෙකු මෙම ප්‍රහාරය අවුලුවාලීමට ඉඩ ඇති විදේශී කොටස්කරුවෙකු බව ඔහු සාක්ෂි දුන්නේය. 2019 අප්‍රේල් 4, 20 සහ 21 යන දිනවල තමාට බුද්ධි අංශ ලබා දුන් බුද්ධි තොරතුරු මෙම පුද්ගලයා අත තිබෙන්නට ඇතැයි ඔහු ඇඟවීය.

මෙම චෝදනාවට පෙර ඇති සාක්ෂි මත පරීක්ෂණ කොමිසම විසින් දැඩි අවධානයක් යොමු කර ඇත.

2017 අග භාගයේ සිට සහරාන් ඉන්දියාවේ සිටි අබු හින්ද් සමඟ සම්බන්ධකම් පැවැත්වූ බව හාදියා සාක්ෂි දුන්නා ය. නවුෆර් ද අබු හින්ද් සමඟ දැන හඳුනාගෙන සන්නිවේදනය කළේය. සහරාන් හාදියාට පැවසුවේ අබු හින්ද්ට සිරියාව සමඟ සම්බන්ධතා ඇති බවයි. ඔවුන් ත්‍රීමා සහ ටෙලිග්‍රෑම් යෙදුම් භාවිතා කරමින් දෙමළෙන් කතා කළහ. ඔවුන් එකිනෙකාගේ හඬ පටිගත කිරීම් යැවීමට පුරුදුව සිටියහ. අබු හින්ද් සහරාන්ගේ ආරක්ෂාව ගැන විමසීය. අබු හින්ද් ඔහුගේ සමහර දේශනවල හඬපට පටිගත කිරීම් යැවීමට පුරුදුව

සිටියේය. වරක් ඔහු සිරියාවේ 15 හැවිරිදි දරුවෙකු විසින් සිදුකරන ලද මරාගෙන මැරෙන ප්‍රහාරයක් පිළිබඳ විස්තර සහරාන් වෙත යවා ඇත. ඒ සමඟම සහරාන් කටාර් සහ සවුදි අරාබියේ පුද්ගලයින් සමඟ මැසෙන්ජර් ඔස්සේ කතාබස් කිරීමටද පුරුදුව සිටියේය.

අබු හින්ද්ගේ අනන්‍යතාව පිළිබඳ ඉඟියක් සපයන සාක්ෂි පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ විමසන ලදී. මෙම සාක්ෂි ලැබුණේ සංවේදී සාක්ෂි හේතුවෙන් අප්‍රසිද්ධියේ සාක්ෂි ලබාදීමට එකඟ වුණි. ත්‍රස්තවාදය පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයෙකුගෙනි. අපරාධ පර්යේෂණ කොමිසම අයඳුම්පතට අවසර දුන්නේය.

ඔහුගේ සාක්ෂියට අනුව අබු හින්ද් යනු ඉන්දියානු පළාත් බුද්ධි අංශයක කොටසක් විසින් නිර්මාණය කරන ලද චරිතයකි. රාජ්‍ය බුද්ධි සේවය අධ්‍යක්ෂවරයාට 2019 අප්‍රේල් 4, 20 සහ 21 යන දිනවල ලැබුණු බුද්ධි තොරතුරු මෙම මෙහෙයුමෙන් ලැබුණු අතර, අබු හින්ද් නැමැත්තෙකු ලෙස එම මෙහෙයුමේ බුද්ධි අංශ ක්‍රියාකාරිකයකු පෙනී සිට ඇත. ඉස්ලාමීය රාජ්‍යයේ චරිත ලෙස මවා පාමින් මෙම සංවිධානයේ ක්‍රියාකාරීන් සමාජ මාධ්‍ය තුළ ක්‍රියාත්මක වේ. අනන්‍ය පෞරුෂත්වය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් පුහුණු කරනු ලැබේ.

මෙම මෙහෙයුමට හේතුව විශේෂඥයාට අනුව සිරියාවට ගිය ඉන්දියානු ජාතිකයන් ශ්‍රී ලංකාව සංක්‍රමණ සඳහා යොදාගැනීමයි. ඔවුන් මීගමුව, හලාවත සහ පුත්තලම යන ප්‍රදේශවල එක් මද්‍රසාවක පුහුණුව ලබා ඇත. අයිඑස් සංවිධානයට බැඳීම සඳහා සිරියාවට ගිය ඉන්දියානුවන් කිහිප දෙනෙකු සහභාගී වූ ආයතනයක් ලෙස ඉන්දීය බුද්ධි අංශ නිලධාරීන් මීට පෙර කොච්චිකඩේ අල්කම මද්‍රසාහි පිළිබඳ රාජ්‍ය බුද්ධි අංශය වෙත දැනුම්දී ඇති බවට සාක්ෂි විමර්ශනය කරන ලදි. ඇත්ත වශයෙන්ම ඇෆ්ගනිස්ථානයේ මරාගෙන මැරෙන ප්‍රහාරයකට සහභාගී වූ ඉන්දීය ජාතිකයෙක් මීට පෙර ශ්‍රී ලංකාවට ගොස් සිටියේය.

සාක්ෂිය වූයේ අබු හින්ද් ඉස්ලාමීය රාජ්‍ය කලාපීය නියෝජිතයා බව සහරාන් විශ්වාස කළ බවයි. අබු හින්ද් සහරාන් සහ ඔහුගේ සහෝදරයා වන රිල්වාන් සමඟ සම්බන්ධකම්

පැවැත්වූ අතර ඔහු නාවුෆර් සමඟ කතා කර ඇත. සාක්ෂිවල මෙම කොටස හාදියාගේ සාක්ෂියෙන් සනාථ වේ.

විශේෂඥයාගේ සාක්ෂියට අනුව සමස්ත සැලැස්ම අබු හින්ද් වෙත හෙළි නොකිරීමට සහරාන් ඉතා සැලකිලිමත්විය. අබු හින්ද් සමඟ සහරාන් කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට පහරදීමේ තම අදහස බෙදා ගත්තේය. පාස්කු ප්‍රහාරයට පෙර දින පුපුරුවූ ක්‍රමවේද හරහා මෙම ශාඛාවේ මෙහෙයුම්කරුවන් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වෙත දැනුම් දුන්නේ එක දේවස්ථානයක් සහ එක් හෝටලයක් පමණක් ඉලක්කය බවයි. මෙම මෙහෙයුමට ලැබෙමින් තිබූ තොරතුරු විස්තරාත්මක නොවූ අතර ඇතැම් අසම්පූර්ණ හෝ සාවද්‍ය විය. ඔවුන් වරක් කියා සිටියේ එක් නිවසක බෝම්බයක් අටවා ඇති බවයි. මෙය සාවද්‍යය පුවතකි. පුපුරවා හිරීම සඳහා සූදානම් කරන ලද වාහනය ගැන ඔවුන් දැන සිටියහ. එම තොරතුර නිවැරදි විය.

ඇත්ත වශයෙන්ම 2019 අප්‍රේල් 21 වන දින උදෑසන පිපිරීමෙන් පසු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ හට පුපුරණ ද්‍රව්‍ය රැගත් ඇති වාහනය පිළිබඳව බුද්ධි තොරතුරු ලැබුණේ මෙම ප්‍රභවයෙන්ය. කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය අසල පුපුරණ ද්‍රව්‍ය පටවන ලද වෑන් රථය සොයා ගැනීමත් සමඟ එය නිවැරදි බවට තහවුරු විය.

2019 අප්‍රේල් 4 වන දින ලබා දුන් බුද්ධි තොරතුරු විශ්වාසනීය නොවන බව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ සාක්ෂි දක්වමින් සඳහන් කළේය. 2019 අප්‍රේල් 8 වන දින පැවති ඉන්දු-ශ්‍රී ලංකා ආරක්ෂක සංවාදයට සහභාගීවීම සඳහා ඉන්දීය ආරක්ෂක ලේකම් සංජේ මිත්‍රා සහ නියෝජිත කණ්ඩායම 2019 අප්‍රේල් 7 වන දින ශ්‍රී ලංකාවට පැමිණි බව සලකන විට 2019 අප්‍රේල් 4 වන දින දැනුම් දුන් පරිදි ඇත්ත වශයෙන්ම ආරක්ෂක තර්ජනයක් තිබේ නම් ඉන්දීය ආරක්ෂක ලේකම්වරයා රටට පැමිණේවි දැයි ප්‍රශ්න කළේය.

මෙම ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින් විශේෂඥය සාක්ෂිකරුවෙක් සාක්කි දෙමින් කියා සිටියේ ඉන්දීය මධ්‍යම රජය පළාත් කණ්ඩායම විසින් ලබාගත් බුද්ධි තොරතුරු පිළිබඳව නොදැන සිටි බවයි.

ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය පවා 2019 අප්‍රේල් 4 වන දින ලබාදුන් බුද්ධි තොරතුරු බැරෑරුම් ලෙස නොසලකන බවට රාජ්‍ය බුද්ධි සේවාව අධ්‍යක්ෂවරයා පැවසූ නමුත්, සාක්ෂි ලෙස සටහන් වූයේ ඉන් පෙරදී 4 වන දින තොරතුරු සැපයූ ඉන්දීය බුද්ධි සභයා, 2019 අප්‍රේල් 12 වන දින ඉන්දීය මහ කොමසාරිස්වරයා සති අන්තයේ පිටත සංචාරය කිරීමට නියමිතව තිබූ බැවින් ඔහුට පෙර ගමන් රථයක් ලබාගැනීම සඳහා පොලිස්පතිවරයා සමඟ කතා කරන ලෙස රාජ්‍ය බුද්ධි සේවය අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා සිටි බවයි. ට්‍රක් රථ ප්‍රහාර සම්බන්ධයෙන් ඔවුන්ට ලැබී ඇති තොරතුරු සැලකිල්ලට ගනිමින් මෙම ඉල්ලීම කරන බව පැවසේ. මෙයින් පෙනී යන්නේ ඉන්දියානු තානාපති කාර්යාලය විසින් සපයන ලද බුද්ධි තොරතුරු බැරෑරුම් ලෙස සලකන නමුත් රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකගේ ස්ථාවරය වූයේ එහි විශ්වසනීයත්වය පිළිබඳව පවා ඔවුන්ට විශ්වාසයක් නොමැති බවයි.

එය කෙසේ වෙතත් ඉන්දියානු ආරක්ෂක ලේකම්ගේ සංචාරය 2019 අප්‍රේල් 4 වන දින ලබාදුන් බුද්ධි තොරතුරුවලින් ව්‍යුක්ත වූ කාරණයක් බව යෝජනා විය. අපරාධ පර්යේෂණ කොමිසමට පෙර ඇති සාක්ෂි අනුව ඉන්දු-ශ්‍රී ලංකා ආරක්ෂක සංවාදය වාර්ෂික ඉසව්වක් වන අතර 2019 දී එය සත්කාරකත්වය දක්වනලද්දේ ශ්‍රී ලංකාව විසිනි. මෙම උත්සවය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා විසින් සංවිධානය කිරීමට නියමිතව තිබුණි. 2018 නොවැම්බරයේදී ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යවරයා විසින් මාණ්ඩලික ප්‍රධානියා වෙත යෝජනා කරන ලද්දේ මෙම උත්සවය 2019 ජනවාරි මාසයේදී සංවිධානය කළහැකි බවයි. ප්‍රතිචාරය වූයේ මෙතරම් කෙටි කාලයක් තුළ උත්සවය සංවිධානය කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බවයි. ඉන්පසු 2019 පෙබරවාරි හෝ මාර්තු මාසවලදී එය පැවැත්වීමට ආරක්ෂක අමාත්‍යංශය යෝජනා කළේය. රාජ්‍ය බුද්ධි සේවය අනුමත කළ දිනයන් 2019 මාර්තු මාසයේදී, ආරක්ෂක අමාත්‍යංශය විසින් කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට දිනයන් යෝජනා කරමින් ලිපියක් යවන ලදි. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ප්‍රතිචාර දැක්වූයේ 2019 අප්‍රේල් 8 සහ 9 යන දින සුදුසු බවය. මෙම දිනයන් පාර්ශ්වයන් අතර එකඟ විය. පූර්ව සාකච්ඡා 2019 මාර්තු 12 සහ අප්‍රේල් 4

යන දිනවල පැවැත්විණි. ආරක්ෂක සංවාදයෙන් පසුව ඉන්දීය නියෝජිත කණ්ඩායම 2019 අප්‍රේල් 10 වන දින ශ්‍රී ලංකාවෙන් පිටත්ව බංගලාදේශයට නික්ම ගියහ.

ඊට පෙරදී ඇති සාක්ෂි මත පදනම්ව, ඉන්දීය ආරක්ෂක ලේකම්ගේ සංචාරය 2019 අප්‍රේල් 4 වන දින ලබාදුන් බුද්ධි තොරතුරු වලින් ව්‍යුක්ත කාරණයක් බවට වූ යෝජනාවේ කිසිදු විශ්වාසනීයත්වයක් පරීක්ෂණ කොමිසම වෙත නිරීක්ෂණය නොවෙයි. රාජ්‍ය බුද්ධි සේවය අධ්‍යක්ෂවරයාට සිය ඉන්දියානු බුද්ධි සහයා විසින් සපයන ලද බුද්ධි තොරතුර සජීවී ප්‍රභවයකින් ලැබුණු බව දන්වන ලදී. එම බුද්ධි තොරතුරු නිරවද්‍ය වූ අතර ඒ පිළිබඳ පියවරක් ගැනීමේ හැකියාව තියෙනවා.. බුද්ධි තොරතුරුවල විශ්වසනීයත්වය තක්සේරු කිරීමට සහ ඒවා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත යොමු කිරීමට ප්‍රමාණවත් බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි සේවය සතුව තිබුණි.

තවද රාජ්‍ය බුද්ධි සේවය අධ්‍යක්ෂකගේ විදෙස් බුද්ධි සහභයා ඔහුට එතරම් නිවැරදි තොරතුරක් ලබාදී ඉන්දීය ආරක්ෂක ලේකම්ගේ සංචාරයකට ඉඩ දීමෙන් අවධානය වෙනතකට හැරවීමට උත්සාහ කරන්නේ මක් නිසා ද? 2019 අප්‍රේල් 20 වන දින පවා විදේස් බුද්ධි සහයා වඩාත් නිරවද්‍ය බුද්ධි තොරතුරු ලබා දුන්නේය. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාට ඔවුන් ලබාදුන් බුද්ධිය තොරතුරු සමාජ මාධ්‍යවල සංසරණය වන බව දැනගත් විට ඒවා ලබා දුන් ප්‍රකාශය බෙහෙවින් කනස්සල්ලට පත්විය.

අප්‍රේල් 20 වන දින උදෑසන බුද්ධි තොරතුරු ලබා දුන් ඉන්දීය සගයා විසින් සංසරණය වන ලිපියක පිටපත් ඔහු වෙත යොමු කරන ලදි. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාගේ සාක්ෂියට අනුව සහරාන් සහ ඔහුගේ කණ්ඩායම පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ඔවුන්ට බාධාවක් විය හැකි බැවින් අදාළ තොරතුරු මහජනතාවට නිරාවරණය වීම ගැන විදෙස් බුද්ධි සහයා කනස්සල්ලට පත්විය.

ඒ එක්කම මම ඕහුට කතා කලා. මම කතා කරලා කිව්වා. ඔයගොල්ල ඒ ගැන ඔයගොල්ලන්ගේ නම මේ සම්බන්ධ නැහැ. ඔයගොල්ල ඒ ගැන කණගාටු වෙන්න එපා. මේක වෘත්තිමය භාවයෙන් අඩුයි. ස්වාමීනි ඒ තොරතුර අති රහසිගතයි කියලා ඉදිරිපත් කලේ. එතකොට ඒගොල්ලෝ ඒක ගැන පොඩි ගැටලුවක් තිබ්බා. තොරතුරු ලබාගැනීමට බාධාවෙයි කියලා මම කිව්වා ඒක ගැන එච්චර මේවා කරන්න එපා. මම ඔයගොල්ලන්ගේ නම කොහෙවත් කියලා යවලා නැහැ. ඒ ගොල්ලොත් worry වුනා තොරතුර එලියට ආව ගමන්. මම permission අරන් යැව්වට. එතකොට මේක හැමතැනම යනවනේ සර් කියලා මට කිවා. එතකොට ඒගොල්ලෝ පොඩි concern එකක් පෙන්වුවා මට. ඒ කියන්නේ තොරතුරු පත්‍රයත් ඒ විදියටම circular වෙලා තියෙන හින්දා. එතකොට ඒගොල්ලන්ට මට එයා කිව්වේ නෑ ඒක එදාමද ලැබුනේ කියලා. ඒ ගොල්ලන්ටත් ඒක ලැබිලා තිබ්බා. ඒ කියන්නේ වෙලාවටම ප්‍රහාරයට පෙර ගිහිල්ලා තියෙනවා.11වෙනිදා ඕක පල්ලලෙහාට යවලා තියෙන්නේ. ඒ අනුව 11 වෙනකොට ඒගොල්ලන්ට ලැබිලා තිබ්බා.

**(2020 අගෝස්තු 20 වන දින කාර්යය සටහන්)**

අබු හින්ද්ගේ අනන්‍යතාවය පිළිබඳව විමර්ශනය කරන බව පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ රහස් පොලිසිය විසින් සාක්ෂි ලබාදෙන ලදී. එම පරීක්ෂණ ඉදිරියට යා යුතුයි. අබු හින්ද්ගේ භූමිකාව පිළිබඳ පවත්නා සම්පත් සහ කාර්ය භාර්ය තුළ රැඳී සිටිමින් අධ්‍යනය කිරීමට පරීක්ෂණ කොමිසම බැඳී සිටියේය. අප විසින් අපගේ අනාවරණය ඉහත දක්වා ඇත.

කෙසේ වෙතත් අවධානය යොමු කළ යුතු තවත් අංශයක් පරීක්ෂණ කොමිසම විසින් නිරීක්ෂණය කර ඇත. ශ්‍රී ලංකාවේ අයිඑස් සහ අල්කයිඩා ක්‍රියාකාරකම්වලදී අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ් සහ ඔහුගේ පුත් ලූක්මන් තාලිබ් අහමඩ් හෝ අබු අබ්දුල්ලාගේ භූමිකාව එයයි. ඔවුන් ඕස්ට්‍රේලියාවේ වාසය කරන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අයයි.

අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ් සහ ඔහුගේ පුත් ලූක්මන් තාලිබ් අහමඩ් නොහොත් අබු අබ්දුල්ලා, SLJISM, සාදීක්, මොහොමඩ් නිස්තාර් අහමඩ් මුන්ෂිෆ් සහ සූෆියාන්

සාමාජිකයින් කිහිප දෙනෙකුට ආයුධ පුහුණුව සඳහා තුර්කිය හරහා සිරියාවට යාමට පහසුකම් සපයන ලදි.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු සාරා ජීවතුන් අතර සිටින බවට සාක්ෂි දුන් සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ සාක්ෂි පරීක්ෂණ කොමිසම වෙත ලැබුණි. හාදියා සිය සාක්ෂියේ සඳහන් කර ඇත්තේ 2019 අප්‍රේල් 26 වන දින සයින්දමරුදූහි සිදුවූ පිපිරීමෙන් පසු ඇය සිහිසුන් වූ බවයි. ඇය යථා තත්ත්වයට පත් වීමෙන් පසු සාරා මෙන් හඬ නඟන කාන්තාවකගේ කටහඬක් ද ඇසිණි. සාරාගේ මව සමඟ කළ ඩීඑන්ඒ විශ්ලේෂණයෙන් පිපිරීමෙන් සාරා මියගිය බව තහවුරු වී නැත. මෙම සාක්ෂිය සැලකිල්ලට ගනිමින් පරීක්ෂණ කොමිසම නිර්දේශ කරන්නේ සාරා පිළිබඳ පරීක්ෂණ දිගටම කරගෙන යන ලෙසයි.

අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ්ට කටාර්හි පදිංචිව සිටියදී ත්‍රස්තවාදී සම්බන්ධතා තිබූ බයිස් නම් ශ්‍රී ලාංකිකයෙකු සමඟ කිට්ටු සම්බන්ධතා පැවැත්වූ අතර ඔහු 2020 ජූලි මාසයේදී අත්අඩංගුවට ගනු ලැබීය. අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ් සහ ඉස්ලාමීය ත්‍රස්ත සම්බන්ධතා ඇති මාලදිවයින් සිව්දෙනෙකු අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකාවට පැමිණ සාදික් සමඟ අන්තවාදී සාකච්ඡා පවත්වා තිබුණි.

ත්‍රස්තවාදයට ආධාර කිරීම සහ අනුබලදීම සම්බන්ධයෙන් අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ් 2020 ඔක්තෝම්බර් මාසයේදී කටාර් රජය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. ඔහුගේ එක් පුතෙකු වන ලූක්මන් තාලිබ් ඉස්මයිල් ද අත්අඩංගුවට ගනු ලැබීය. අල් කයිඩා සංවිධානයට සහාය දැක්වීමේ චෝදනාව මත ලූක්මන් තාලිබ් අහමඩ් මේ වන විට ඕස්ට්‍රේලියානු බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිටී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකරට අනුව 2019 අප්‍රේල් 26 වන දින සයින්දමාරුදූහි පිපිරීම සිදු වූ ස්ථානයෙන් ඕස්ට්‍රේලියානු සිම් කාඩ්පත් කිහිපයක් සොයා ගන්නා ලදි.

අල්කයිඩා සංවිධානයට සම්බන්ධ සහ තුර්කි ක්‍රියාකාරිකයෙකු වන අබු අබ්දුල්ලා අල් යේමනය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරන රිම්සාන් නම් ශ්‍රී ලාංකිකයෙකු

පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවය වෙත බුද්ධි තොරතුරු ලැබී ඇත. අබු අබ්දුල්ලා අල් යෙමනි@අල් ඔස්ට්‍රේලියාව (Abu Abdulla Al Yemeni@Al Australi) දකුණු ආසියානු රටක ත්‍රස්ත ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරමින් සිටී. මෙය ලූක්මන් තාලිබ් අහමඩ් නොහොත් අබු අබ්දුල්ලා වෙත යොමු කිරීමකි.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, පාස්කු ඉරිදා ප්‍රහාරයේදී අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ්, ඔහුගේ පුත් ලූක්මන් තාලිබ් අහමඩ් නොහොත් අබු අබ්දුල්ලා සහ රිම්සන්ගේ භූමිකාව තිබේ දැයි විමර්ශනය කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

වාචික හා වාර්තාමය සාක්ෂි මඟින් ලබා ගත් පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරිපිට ඇති සාක්ෂිවල සත්‍ය කරුණු දක්වා ඇති කරුණු සහ විශේෂඥයෙකුගේ සහ විමර්ශකයන්ගේ සාක්ෂි ඇතුළත් වේ.

## 18 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය (SLJI)

සහරාන් විසින් සංවිධානය කරන ලද පුහුණු කඳවුරුවලට සහභාගිවූවන්ගෙන් බොහෝ දෙනෙක් SLJI සංවිධානයේ සාමාජිකයින් වන අතර ඒවා සංවිධානය කරන ලද බොහෝ පිරිස් ද SLJI හි සාමාජිකයන් වන බව පරීක්ෂණ කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. පාස්කු ඉරිදා ප්‍රහාර සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසුවන සැකකරුවන් කිහිප දෙනෙකු SLJIහි සාමාජිකයින්ය. එබැවින් SLJI සහ එහි ප්‍රධාන චරිතයක් වන රෂීඩ් හජ්ජුල් අක්බාර්ගේ ක්‍රියාකාරකම් මෙම පරිච්ඡේදයේ සමීපව විමසා බලයි.

ජමාතේ-ඉ-ඉස්ලාමි (මුස්ලිම්වරුන් එක්රැස් කිරීම) යනු 1941 අගෝස්තු 26 වන දින අබුල් අලා මවුලවි විසින් පිහිටුවන ලද ආගමික පුනර්ජීවන ව්‍යාපාරයකි. ඔහුගේ දේශපාලන මතවාදය ජමාත්හි දෘෂ්ටිවාදය නියෝජනය කරන අතර එය ඔහුගේ සංකල්ප දෙක මත පදනම් වේ. එකක් පරමාධිපත්‍යය දෙවියන් වහන්සේට අයත් වන අතර සෑම මුස්ලිම්වරයෙකුගේම අරමුණ වන්නේ මිහිපිට දෙවියන්ගේ පාලනය ස්ථාපිත කිරීමයි. දෙවනුව ඉස්ලාමය යනු සමාජ, ආර්ථික, දේශපාලනික යනාදී ජීවිතයේ සියලු අංශ පාලනය කරන සම්පූර්ණ හා පුළුල් ජීවන රටාවකි. මේ අනුව ජමාතෙහි ප්‍රධාන අරමුණ ඊඉස්ලාමි යනු මවුලවිට අනුව ඉස්ලාමීය රාජ්‍යය හෝ දරුල් ඉස්ලාම් වැනි විවිධ වචනවලින් හඳුන්වන පරිදි දෙවියන්ගේ පරමාධිපත්‍යය පොළොව මත ස්ථාපිත කිරීමයි. මවුලවි පවසන පරිදි, “ඉස්ලාමීය රාජ්‍යය ඒකාධිපති රාජ්‍යයක් වන අතර එය සෑම ක්ෂේත්‍රයකින්ම සමන්විත වේ. නමුත් මෙම ඒකාධිපතිවාදය සහ විශ්වාසභාවය පදනම් වී ඇත්තේ ඉස්ලාමීය පාලකයෙකු විසින් නිරීක්ෂණය කළ යුතු හා බලාත්මක කළ යුතු දිව්‍ය නීතියේ විශ්වීයත්වය මත ය. ”

සංවිධානයේ ඉන්දියානු ශාඛාව ජමාත්-ඊ-ඉස්ලාමි හින්ද් ලෙස හැඳින්වෙන අතර එය ඉන්දීය රජය විසින් දෙවරක් තහනම් කරන ලදි. පළමුවැන්න 1975-1977 හදිසි අවස්ථාව තුළ තාවකාලික තහනමක් වන අතර එය හදිසි අවස්ථාව ඉවත් කිරීමෙන් පසු අවලංගු

කරන ලදි. දෙවැන්න 1992 දී 1967 නීති විරෝධී ක්‍රියාකාරකම් (වැළැක්වීමේ) පනත යටතේ සිදු කරන ලද්දකි. එය ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉදිරියේ අභියෝගයට ලක් විය.

ජමාඅත්-ඊ-ඉස්ලාමි හින්දි එදිරිව ඉන්දියානු සමූහාණ්ඩුව [1995 එස්.සී.සී. (1) 428] මධ්‍යම නීති ප්‍රකාශය සනාථ කරමින් 1967 නීති විරෝධී ක්‍රියාකාරකම් (වැළැක්වීමේ) පනතේ 4 වන වගන්තිය යටතේ සම්මත කරන ලද 1994.04.11 දිනැති නියෝගය ඉන්දිය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවලංගු කරන ලදි. පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ජමාඅත්-ඉස්-ඉස්ලාමි හින්ද් පනතේ අර්ථ දක්වා ඇති පරිදි "නීති විරෝධී සංගමයක්" බව රජය විසින් නිකුත් කරන ලද නිවේදනයෙහි දැක්වේ. මෙම තීන්දුව පදනම් වී ඇත්තේ කාර්ය පටිපාටියක නුසුදුසුකම මත වන අතර ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්චිතවම කියා සිටියේ අවශ්‍ය තොරතුරු තිබේ නම් ජමාඅත්-ඊ-ඉස්ලාමි හින්ද්ට එරෙහිව එකී පනත යටතේ විවාදයට නොගන්නා බවයි.

කොළඹ 9 හි අංක 77 දෙමටගොඩ පාරේ අබ්දුල් කාදර් ජයිලානි ෂාහිබ් නම් ඉන්දියානු ව්‍යාපාරිකයෙකු විසින් 1954 දී SLJI ආරම්භ කරන ලදි. එහි ලෝක දර්ශන බොහෝ දුරට බලපාන්නේ 1928 දී ඊජිප්තුවේ මුස්ලිම් සහෝදරත්වය ආරම්භ කළ හසන් අල්-බන්නාගේ සිතුවිලි සහ ඉස්ලාමීය නොවන දේශපාලන ක්‍රමයට හා අදහස්වලට අභියෝග කරන ලෙසත් (සටන්කාමී) ජිහාඩ් මිලිටරි අංශ හරහා ඉස්ලාමීය රාජ්‍යයක් ගොඩනැගීමටත් මුස්ලිම් සමාජයන් කැඳවූ සයිඩ් කුතුබ්ගේ පණිවිඩ ප්‍රවර්ධනය කිරීම මෙම සංවිධානය විසින් සිදු කරන ලදි.

හසන් අල්-බන්නා ඉස්ලාමය සැළකුවේ පරිපූර්ණ ජීවන ක්‍රමයක් ලෙසත් පිළිගත හැකි එකම ව්‍යවස්ථාව ශුද්ධ වූ අල් කුර්ආනය පමණක් යනුවෙනි. ඔහු රජය එහි ආර්ථිකය හා සමාජය ඉස්ලාමීයකරණය කිරීම වෙනුවෙන් පෙනී සිටියේය. සයිඩ් කුතුබ් විසින්ම ඉබ්නු කයිම් අල්-ජව්සියා සහ හසන් අල්-බන්නා යන අයගේ බලපෑමට ලක් වූ අතර 1966 දී ඊජිප්තු ජනාධිපති ගමාල් අබ්දුල් නසාර් ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවට

වරදකරු වූ අතර එල්ලා මරා දමන ලදි. වහබ්වාදය, සලෆිවාදය සහ ජිහාඩ්වාදය වැනි අතිශය ගතානුගතික මතවාද කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළ ඉබ්නු අල්-කයිම් ඉබ්නු තයිමියාගේ ප්‍රමුඛතම ශිෂ්‍යයෙකු ලෙස හැඳින්වේ.

මුස්ලිම් සහෝදරත්වයේ ප්‍රකාශකයෙකු බවට පත්වීමේ දී කිසිවෙකු හසන් අල්-බන්නා අභිබවා නොගිය බව පැහැදිලි ය. හසන් අල්-බන්නාගේ මුස්ලිම් සහෝදරත්වය ගොඩනඟා ගැනීමට පසුබිම සකසමින් මුස්ලිම් සහෝදරයන්ගේ නිර්මාතෘ සහ එහි පියා ලෙස මෙන්ම වහාබ්වාදයේ" අත්තිවාරම ගොඩනඟා ඉස්ලාමීය චින්තකයින් වන අබුල් අලා මවුදීන් ඉන්දියාවේ, ඉරානයේ රුහෝල්ලා කොමේනි සහ විශේෂයෙන් සයීඩ් කුට්බ් වැනි අයට මඟ පෑදූ බව ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් නොවේ. හසන් අල්-බන්නාගේ මුස්ලිම් සහෝදරත්වය -අරාබි භාෂාවෙන් අල්-ඉක්වාන් අල්-මුස්ලිම් - දැනටමත් වසර කිහිපයක සිට පසුව දෘෂ්ටිවාදය කේන්ද්‍ර කර ගනිමින් ශක්තිමත් දේශපාලන - ආගමික මුහුණුවරක් අත්පත් කර ගෙන ඇත. අල්-බන්නාට, දේශපාලනය සහ ආගම ප්‍රායෝගිකව එකම දෙය වන අතර, "අපි බෙදීම් හඳුනා නොගන්නා" කාරණා දෙක පිළිබඳව ඔහු ප්‍රකාශ කළේය. පිටස්තර පුද්ගලයින්ට මුහුණ දෙන විට එකම දේ ප්‍රකාශ කිරීමට සහෝදරත්වයේ සාමාජිකයන් දිරිමත් කරන ලදි. මුස්ලිම් සහෝදරයින්ගේ අභිප්‍රාය කෙරෙහි ඔහු දැක්වූ දැවැන්ත කැපවීම නොතකා, අල්-බන්නා කිහිප වතාවක්ම සඳහන් කළ පරිදි, ඔහුගේ පරම්පරාවෙන් යුත් සයීඩ් කුතුබ් තරම් දක්ෂ ලේඛකයෙකු හෝ බුද්ධිමතෙකු නොවීය. සියල්ලටම වඩා ඔහු ක්‍රියාකාරිකයෙකි. ආරම්භකයාගේ දෘෂ්ටිවාදාත්මක මූලධර්මය බොහෝ දුරට සම්පාදනය කර ඇත්තේ ආලෝකය දෙසට වූ පත්‍රිකාවෙනි. මෙම රචනාවේදී අල්-බන්නා විසින් ඉස්ලාමීය මූලධර්මයන් ඉදිරිපත් කරන ලදි. ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ලියා වසර දෙකකට පසු වයස අවුරුදු 42 දී ඔහුව ඊජිප්තු රජුගේ අණ පරිදි විශේෂ පොලිසිය විසින් ඝාතනය කරනු ලැබීය.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් (SLJI) මුස්ලිම් සහෝදරත්වය (ඉඛ්වාන් මුස්ලිම්) හා සමාන මතවාදයක් මත කටයුතු කරන අතර ඊජිප්තුව, සෞදි අරාබිය, කුවේට්, කටාර්, ඉන්දියාව සහ පකිස්ථානය යන රටවල එකම මතවාදයක් ඇති පුද්ගලයින් හා සංවිධාන සමඟ සමීප

සම්බන්ධතා පවත්වයි. SLJI හි අවසාන ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තරව ඉස්ලාමීය රාජ්‍යයක් ඇති කිරීමයි. එය දිගුකාලීන අරමුණකි.

**1994** සිට හෙබ වූ **2018** දක්වා SLJI හි නායක ධුරය හොබවා ඇත්තේ හජ්ජුල් අක්බාර් ය.

එස්එල්ජේඅයි විසින් මාදම්පේ ඉස්ලාහියා අරාබි පාසල, මාවනැල්ලහි අයිෂා සයිඩිකා අරාබි පාසල සහ කල්කුඩාහි ෆාතිමා සහරා අරාබි විද්‍යාලය පිහිටුවන ලදි. **1992** අංක 7 දරණ පනත මඟින් පිහිටුවන ලද හිස්බුල් ඉස්ලාම් අරමුදල මෙම සංවිධානයේ කොටසකි.

නවුෆර් මාදම්පේ ඉස්ලාහියා අරාබි විද්‍යාලයේ වසර තුනක් ගත කළේය. සාදික් සහ ෂාහිඩ් ද එයට ඇතුලත් වී ඇත. ඉස්ලාහියා අරාබි විද්‍යාලයේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳව සිසුන්ට ඉගැන්වූ බවත් ආයුධ සමඟ සටන් කිරීමට ඉගෙනීම අනිවාර්ය බවත් සාක්ෂි තිබේ. ඇෆ්ගනිස්ථානය, බොස්නියාව සහ චෙච්නියාවේ මුස්ලිම්වරුන් මුහුණ දෙන දුෂ්කරතා නිරූපණය කරන වීඩියෝ දර්ශන ද ඔවුන්ට පෙන්වන ලදී. සෑම වසරකම සිසුන් වනාන්තරයට ගෙන ගොස් ඉදි කරන ලද කඳවුරු භාවිතා කරමින් ශාරීරික හා මානසික ව්‍යායාම පුහුණුව ලබා ඇත.

SLJI සිය ක්‍රියාකාරකම් සඳහා සෞදි අරාබියේ සහ ඉන්දියාවේ ප්‍රකාශයට පත් කරන ලද ශුද්ධ වූ අල් කුර්ආනය භාවිතා කරයි. සවුදි අරාබිය, මැලේසියාව, තුර්කිය, පකිස්ථානය සහ ඉන්දියාව වැනි රටවල ඉස්ලාම් දහම පිළිබඳ වැඩිදුර හැදෑරීමට SLJI හි සාමාජිකයින්ට අවස්ථාව ලැබේ.

SLJI විසින් ජමාඅත්-ඉ-ඉස්ලාම් පවුල් සෑදීම ආරම්භ කරන ලද අතර ඔවුන් උස්රා ක්‍රමය ලෙස හැඳින්වූ අතර එය පවුල් එකිනෙකා සමඟ සම්බන්ධ කර ජමාඅත් ඉස්ලාම් පවුලේ කොටසක් බවට පත් වූ අතර ඔවුන් එකම සමාජයක් බවට පත්විය. ඔවුන්ට ඔවුන්ගේම රැස්වීම් සහ උත්සව තිබේ. මෙය තවත් පවුල් එක්රැස් වීමට හේතු වේ.

2015 දී පමණ SLJI මහනුවර, පුත්තලම්, මාවනැල්ල සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල ක්‍රියාකාරී විය.

එස්.එල්.ජේ.අයි හි ප්‍රකාශන කාලයාගේ ඇවෑමෙන් අන්තවාදී අන්තර්ගතයන් පළ කොට ඇත. අල් හසනාත් යනු ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI හි නිල ප්‍රකාශනයයි. ජිහාඩ් ඍජුව හෝ වක්‍රව උත්කර්ෂයට නැංවූ අල් හසානාත්හි විවිධ කලාපවල පළ වූ ලිපි කිහිපයක සාක්ෂි ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. එක් ලිපියක ඇෆ්ගනිස්ථානයේ අබ්දුල්ලා හසාම්ගේ ජිහාඩ් ඉස්මතු කර දැක්වෙන්නේ ඔහුගේ පස් හැවිරිදි පුතා සමඟ සම්මුඛ සාකච්ඡාවක් ද ඇතුළුව ය. එහිදී ඔහු පවසන්නේ තම පියා මෙන් ජිහාඩ් කර ඔහු හා එක්වීමට තමාට අවශ්‍ය බවය. 2008 ජුනි මාසයේ තවත් ලිපියක් මගින් අල් හසානාත් ජිහාඩ් උත්කර්ෂයට නැංවීය.

1990 පෙබරවාරි මාසයේ අල් හසානාත් ප්‍රකාශනයේ ජිහාඩ් නොකර ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම කළ නොහැකි බව සඳහන් කර ඇත. 1994 දී අල් හසනාත්හි මුල් පිටුවේ ඇෆ්ගනිස්ථානයේ ජිහාඩ් සටන්කරුවෙකු වූ කුල්බුටීන් හික්මාතියාර්ගේ ඒකේ 47 රයිෆලයක් සහිත වර්ණ පින්තූරයක් පළ කළේ ය.

ප්‍රතිමා වන්දනා කිරීම විවේචනය කරමින් සහ ඒවා විනාශ කරන අයට ප්‍රශංසා කිරීම පිළිබඳව 1999 නොවැම්බර් අල් හසනාත් කතුවැකියක් පළ කළේය. හසන් අල්-බන්නා පැහැදිලි කළ පරිදි ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳවද එම සංස්කරණයේම සඳහන් වේ. 2001 පෙබරවාරියේ අල් හසනාත් සංස්කරණයේ ලිපියක් ඉස්ලාමය වෙනුවෙන් තම ජීවිතය පූජා කළ අය ගැන ප්‍රශංසා කරන අතර ස්වර්ගයේ සිටින කන්‍යාවන් 72 දෙනෙකු ඔවුන් වෙත ලබා දෙන බව ප්‍රකාශ කරයි.

2008 ජුනි මාසයේදී අල් හසනාත් සංස්කරණයේ යූසුෆ් අල් කර්දාවි සඳහන් කළේ මරාගෙන මැරෙන ප්‍රහාරයක් යනු ජිහාඩ්හි ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් බවයි.

අල් කුර්ආනය පිළිබඳ පාසල් ළමුන් සඳහා ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා (එස්එල්ජේඅයි) විසින් 1992 වසරේ දී බ්‍රහස්පතින්දා සහ සති අන්තවල වැල්ලවත්ත සහ මාවනැල්ලෙහි

පන්ති පවත්වන ලදි. ආගමික ප්‍රතිමා විනාශ කිරීම නිවැරදි දෙය බව එහිදී දරුවන්ට ඉගැන්වීය. පලස්තීන, බොස්නියානු සහ කාශ්මීර යුද්ධ පිළිබඳව ද පාඩම් උගන්වා තිබේ.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා (SLJI) විසින් දින පහක නේවාසික වැඩසටහන් ද පවත්වන ලදි. මේවායින් සමහරක් **1995** සහ **1996** දී මාදම්පේ ඉස්ලාහියා අරාබි පාසලේ හා මුස්ලිම් පල්ලියේදී පැවැත්විණි. මෙම වැඩසටහන් සඳහා සිසුන් **40** ත් **120** ත් අතර ප්‍රමාණයක් සහභාගී වූහ. ඔවුන්ගෙන් එක් අයෙක් පාස්කු බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙන් දැනට අත්අඩංගුවේ පසුවන රිස්වි ය. මෙම වැඩසටහන් අතරතුර සහභාගී වූවන්ට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් නීති සම්පාදනය කිරීම වැරදිය. නීති නිර්මාණය කිරීම දෙවියන්ගේ අයිතියක් බවත් වෙනත් කිසිවෙකුට නීති සම්පාදනය කිරීමට නොහැකි බවත් ඔවුන්ට පවසා තිබේ. මුස්ලිම්වරයෙකුට අල්ලාහ් හැර වෙනත් කිසිවෙකුගෙන් උපකාර ලබා ගත නොහැකි බවත්, ඔවුන් නීති සම්පාදනය කිරීමට අනුබල නොදිය යුතු බවත් ඉගැන්වීය. වඩාත් අර්බුදකාරී ලෙස ජාතික ධජයට හා ගීයට ගරු කිරීම වැරදි බව ද ඔවුන්ට උගන්වා තිබේ.

ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳව සාකච්ඡා කිරීමේ එවැනි එක් වැඩමුළුවකදී, මුස්ලිම්වරු සුළුතරයේ සිටියදී ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවන්නේ කෙසේද යන්න පිළිබඳව හජ්ජුවාල් අක්බාර් නම් සිසුවෙකු විසින් ප්‍රශ්නයක් මතු කරන ලදි. මුස්ලිම්වරුන් බහුතරයක් නොවුනත් ඉන්දියාවේ මෞගල් අධිරාජ්‍යය වසර **800** ක් රජකම් කළ බවත්, මුස්ලිම්වරුන් බහුතරය විය යුතු නැති බවත්, එය කළ හැකි බවත් සිසුන්ට එත්තු ගැන්වෙන පරිදි සම්පත් දායකයන්ගෙන් කෙනෙකු වූ හජ්ජුල් අක්බාර් පිළිතුරු දුන්නේය. බලය අල්ලා ගත හැකි නම් ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවන්න ලෙස ඔහු පවසා තිබේ. ඔහු ජිහාඩ් ඉටු කිරීම සඳහා ඇෆ්ගනිස්ථානයට ගොස් ඇති බව වාර්තා වේ. 2019-06-19 දින විකාශය වූ නෙත් එෆ් එම් ඔස්සේ විකාශය වූ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා ( SLJI) හිටපු ක්‍රියාකාරිකයෙකු වූ ඒ.ජී.එම්. නතීර් ගේ සම්මුඛ සාකච්ඡාවකදී ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා (SLJI) හි දිගුකාලීන ඉලක්කය බවට තවත් සාක්ෂි අඩංගු වේ.

හජ්ජුල් අක්බාර් කියා සිටියේ සහරාන් තමාට වරක් ද්‍රෝහී එකම ඇමතුමක් ලබා දී විවාදයකට ආරාධනා කළ බවත් තමන් එය ප්‍රතික්ෂේප කර බවයි. මෙම සංවාදයේදී එක් පාර්ශවයක් ලෙස සහභාගී වූයේ දැයි දැන ගැනීමට සහරාන්ගේ කටහඬ බව හඳුනා ගැනීමට රජයේ රස පරීක්ෂකවරයාට නොහැකි විය.

ඔහුගේ සහෝදර රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් අයිසිස්හි දෘෂ්ටිවාදය විවෘතව ඉදිරිපත් කිරීමට පටන් ගත් කාලය තුළ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI හි නායකත්වය හජ්ජුල් අක්බාර් විසින් අතහැර දමා ඇති බව පෙනේ.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI ට තුර්කි ප්‍රභවයන්ගෙන් අරමුදල් සහ අවස්ථාවන් ලැබුණි.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා එස්.එල්.ජේ.අයි සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ කුවේටයේ අර්ධ රාජ්‍ය සංවිධානයක් වන බයිතුස් සාකාත්, ඇමරිකා එක්සත් ජනපදයේ හෙල්ප් හැන්ඩ් සහ කැනඩාවේ අයි.සී.එන්.ඒ සංවිධානය විසින් බව හජ්ජුල් අක්බාර් සාක්ෂි ලබාදෙමින් කියා සිටියේ ය. කෙසේ වෙතත් එය 2015 සිට අවසන් කරන ලදී. එබැවින් තව දුරටත් විදේශ අරමුදල් නොලැබේ. එවැනි සුභසාධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී පක්ෂග්‍රාහීත්වය සම්බන්ධයෙන් විවිධ අංශවලින් ලැබී ඇති චෝදනා සේවය අවසන් කිරීමට හේතුව ලෙස පැහැදිලි කරන ලදී. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI හි සාමාජිකයින් සඳහා එකතු කරන ලද සාමාජික ගාස්තුවක් ලෙස (සාමාජිකයාගේ ආදායම අනුව රුපියල් 200 සිට 2000 දක්වා) සහ රාමසාන් සමයේ සුභ පතන්නන් ලැයිස්තුවක් මත පදනම්ව ආධාර ඉල්ලීම් ලිපි යොමු කිරීමෙන් ලැබෙන පරිත්‍යාග එකතු කරන බවට ඔහු සාක්ෂි දුන්නේය. තවද මැද පෙරදිග රටවල සිටින සුබ පතන්නන් ද ඊට දායක වන බව ප්‍රකාශ විය.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI තබ්ලිජමාඅත් සහ තවුහිද් ජමාඅත් සූෆි මුස්ලිම්වරුන් ඔවුන්ගේ අනුගාමිකයන් බවට පත් කිරීම ඔවුන්ගේ මූලධර්ම හා ඉගැන්වීම් ප්‍රචාරය කිරීම අරමුණු කර ගත් බවට හජ්ජුල් අක්බාර් වැඩි දුරටත් සාක්ෂි ලබා දුන්නේය.

ජමාතේ -ඉස්ලාමි ශිෂ්‍ය ව්‍යාපාරය **(SLJISM)**

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI හි ශිෂ්‍ය ශාඛාව මෙයයි. සාමාන්‍යපෙළ විභාගය සම්පූර්ණ කිරීමෙන් පසු එය මුස්ලිම්වරුන් සඳහා විවෘත වන අතර වයස අවුරුදු 26 දක්වා කෙනෙකුට සාමාජිකයෙකු ලෙස රැඳී සිටිය හැකිය. ඉන් අනතුරුව කෙනෙකුට ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා SLJI බැඳීමට අවස්ථාව තිබේ.

ඉහළම සාමාජිකත්වය "රුකූන්" ලෙස නම් කර ඇති අතර එය සාමාජිකයින් 60 - 70 කට සීමා වේ. මීළඟ මට්ටමේ සාමාජිකත්වය "සහකාර සාමාජිකත්වය" ලෙස නම් කර ඇති අතර එයට පුද්ගලයින් 250 - 300 ක් ඇතුළත් වේ. පහලම මට්ටම සේවකයින් ලෙස නම් කර ඇත. සාමාජික සංඛ්‍යාව නිශ්චිත වශයෙන් නොමැති නමුත් 1200 - 1300 පමණ මෙහි සාමාජිකත්වය දරයි. මැලේසියාව, සවුදි අරාබිය, ඉන්දියාව, පාකිස්තානය සහ තුර්කිය වැනි රටවලට නිතර විදේශ සංචාර සඳහා ඉහළ මණ්ඩලයේ සාමාජිකයින්ට අවස්ථාව ලැබේ.

ශිෂ්‍ය අංශය 1980 දී පිහිටුවන ලදි. අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ්, යූසුෆ් ඉසදීන් මොහොමඩ් හනීස්, එම්.එස්.එම්. ෆාරිස්, ජේ.එම්. අෂ්රොෆ්, Z.A.M. නවුසියා සහ ජේ. එම්. නිවාස් මෙය පිහිටුවීමෙහිලා කැපවී ක්‍රියා කල අයවලුන් ය.

අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ් සහ පවුලේ අය 1995 දී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූවත් ඔවුන් ශ්‍රී ලංකාව සමඟ සමීප සබඳතා පවත්වන බව පෙනේ. අහමඩ් තාලිබ් ලූක්මන් තාලිබ්ට පුතුන් දෙදෙනෙක් සිටී. ඔවුන් නම් ලූක්මන් තාලිබ් ඉස්මයිල් සහ ලූක්මන් තාලිබ් අහමඩ් නොහොත් අබු අබ්දුල්ලා ය.

ලූක්මන් තාලිබ් අහමඩ් නොහොත් අබු අබ්දුල්ලා ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු වන අතර 2014 සිට අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකාවට පැමිණ ඇත. අවසන් වරට ඔහු ශ්‍රී ලංකාවට

පැමිණියේ 2017 දෙසැම්බර් 20 වන දින වන අතර 2018 ජනවාරි 10 වන දින පිටත්ව ගියේය. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසුවන එක් සැකකරුවෙකු වන මාවනැල්ලේහි බුද්ධ ප්‍රතිමා කඩා බිඳ දැමීම සහ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ප්‍රධාන සැකකරුවෙකු වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදීක් අබ්දුල්ලා හෙවත් අබු උමාර් සමඟ 2014 සිට ඔහු සමීපව සම්බන්ධතා පවත්වා ඇත.

iv. සහකාර පොලිස් අධිකාරී කලවන්චුඩි (සහකාර පොලිස් අධිකාරී ෆාරුක්). වෙල්ලාවි, කොක්කඩිචෝලායි සහ කලවන්චිකුඩි යන පොලිස් ස්ථාන 3 ක් අධීක්ෂණය කරයි.

ක්‍රියාකාරී අංශය තුළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු හතරදෙනෙක් ඇත, එනම්:

- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලනය සහ මැතිවරණ යටතේ

නියෝජ්‍ය පොලිස්පතිවරු හතරක් ඇත:

- නියෝජ්‍ය නීතිපති පොලිස්පති මූලස්ථානය

- නියෝජ්‍ය නීතිපති, විනය හා හැසිරීම
- නියෝජ්‍ය පොලිස්පති, ඔම්බුඩ්ස්මන්,
- අධ්‍යක්ෂ, පර්යේෂණ හා සංවර්ධන

- ජෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ආධාරක සේවා :
  - නියෝජ්‍ය නීතිපති ප්‍රවර්ධන
  - නියෝජ්‍ය පොලිස්පති ප්‍රවාහන හා සන්නිවේදන
  - නියෝජ්‍ය නීතිපති තොරතුරු තාක්ෂණ
  - නියෝජ්‍ය පොලිස්පති සුභසාධන

- ජෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ, සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය සහ විශේෂ කාර්ය බලකාය :

මෙම ක්‍රියාකාරී අංශය යටතේ, නියෝජ්‍ය පොලිස්පතිවරු තිදෙනෙක් ඇත

- නියෝජ්‍ය පොලිස්පති අපරාධ
- නියෝජ්‍ය පොලිස්පති මත්ද්‍රව්‍ය
- නියෝජ්‍ය පොලිස්පති, විශේෂ කාර්ය බලකාය

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ කොට්ඨාසය:

මෙම ක්‍රියාකාරී අංශය යටතේ, නියෝජ්‍ය පොලිස්පතිවරු තුනක් ඇත

නියෝජ්‍ය පොලිස්පති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

නියෝජ්‍ය පොලිස්පති මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය

ඒ අනුව, පොලිසියේ ව්‍යුහය තුළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු 13 ක් ස්ථාපනය කර ඇති බව පෙනේ. කෙසේ වෙතත්, කාර්යයේ නිරතව සිටිනුයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති 12 ක් පමණි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දොළොස් දෙනාගෙන් එක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා විය. එබැවින්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු තිදෙනෙකුට පරිපාලන පළාත් 2 බැගින් අධීක්ෂණය කිරීමට සිදුවිය. 2011.04.21 දින වන විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු තිදෙනෙකු පරිපාලන පළාත් දෙකක් අධීක්ෂණයකර ඇති අතර එදිනට නිර්මාණය කරන ලද ව්‍යුහයට අනුව සේවක සංඛ්‍යාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ හිඟය හේතුවෙන්. එනම්, දකුණු සහ සබරගමුව පළාතභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති උතුරු මැද සහ වයඹ පළාතභාර සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මධ්‍යම සහ වයඹ පළාතභාර. පරාසය සහ දිස්ත්‍රික්කයේ ස්ථාවර ව්‍යුහයට අමතරව, ක්‍රියාකාරී පොලිස්පති අංශ කිහිපයක් සෘජුවම පොලිස්පතිවරයා යටතේ පැවතුනි.

නියෝජ්‍ය පොලිස්පති මානව සම්පත් කළමනාකරණය, බඳවා ගැනීම්, පුහුණුව සහ ජාත්‍යන්තර සබඳතා

නියෝජ්‍ය පොලිස්පති විශේෂ විමර්ශන ඒකකය

නියෝජ්‍ය පොලිස්පති ත්‍රස්තවාදී විමර්ශන ඒකකය

නියෝජ්‍ය පොලිස්පති විශේෂ ඒකකය

නියෝජ්‍ය පොලිස්පති ජනාධිපති ආරක්ෂක ඒකකය

නියෝජ්‍ය පොලිස්පති අග්‍රාමාත්‍ය ආරක්ෂක ඒකකය

විශේෂ ආරක්ෂණ ඒකකය

පොලිස්පතිගේ නියෝජ්‍ය පොලිස්පති කාර්යමණ්ඩලය

එපමණක් නොව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත භාර යටතේ තිබිය යුතු නියෝජ්‍ය පොලිස්පති ඒකක තුනක් ක්‍රියාකාරී නියෝජ්‍ය පොලිස්පති ඒකකයන් ලෙස සැළකිය යුතුය.

නියෝජ්‍ය පොලිස්පති රථවාහන පරාසය

නියෝජ්‍ය පොලිස්පති ක්ෂේත්‍ර, මූලස්ථාන ඒකකය

නියෝජ්‍ය පොලිස්පති පරිසර ආරක්ෂණ හා ආපදා කළමනාකරණ ඒකකය

2019 අප්‍රේල් 4 සහ 20 යන දිනවල ලැබුණු පූර්ව අනතුරු ඇඟවීමට ප්‍රතිචාර දැක්වීම මත පදනම්ව හඳුනාගත් නිලධාරීන්ගේ වගවීම පහත දැක්වේ.

1. පොලිස්පති පූජිත් ජයසුන්දර

රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධනගේ වාචික සාක්ෂි ලේඛනගත සාක්ෂි මගින් සනාථ කරනුයේ ඔහු සහරාන් පිළිබඳ වාර්තා ගණනාවක් පොලිස්පතිවරයා වෙත යවා ඇති අතර ඒවා ඇතැම් විට ආරක්ෂක ලේකම් සහ නීතිය හා සාමය අමාත්‍යවරයා වෙත යවා ඇති බවයි.

පරීක්ෂණ කොමිසම වෙත ඉදිරිපත් කර ඇති සාක්ෂි වලින් පෙනී යන්නේ සහරාන් 2017 මාර්තු 10 වන දින අලියාර් මං සන්දියේ සිද්ධියෙන් පසු පලා ගොස් ඇති බවයි.

කෙසේ වෙතත්, රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා වරින්වර පොලිස්පතිවරයාට සහ ආරක්ෂක ලේකම්වරයාට, සහරාන්, රිල්වාන් සහ ආමී මොහිදීන් සිටින ස්ථානය දැනුම් දී තිබේ. සහරාන්ගේ අන්තවාදී දේශනා පැවැත්වීම ගැන ඔහු සිය වාර්තාවල දිගින් දිගටම වාර්තා කළේය. මෙම ලියකියවිලි වලින් ලබාගත් වාර්තාවකින් පෙනී යන්නේ, පොලිස්පතිවරයා විසින් මෙම වාර්තා සියල්ලම පාහේ ත්‍රස්ත පරීක්ෂණ ඒකකය වෙත හෝ කලාතුරකින් පොලිස් විශේෂ ශාඛාවට යොමු කර ඇති බවයි. ඔහු සඳහන් කළ ස්ථානවල සහරාන් නොමැති බව ත්‍රස්ත පරීක්ෂණ කොට්ඨාශය පොලිස්පතිවරයා හට දැනුම්දී ඇත.

ඇත්ත වශයෙන්ම 2017 ජුනි 13 වන දින පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදී රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක විසින් ඉස්ලාමීය අන්තවාදය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කර ඇත. [ලකුණු කරන ලද ලේඛනය සී 369].

ත්‍රස්ත පරීක්ෂණ අංශය හි වැඩබලන අධ්‍යක්ෂ නාලක ද සිල්වා මහතා විසින් 2017.03.30 දිනැති ලිපියක් මගින් ජාතික තවුහිද් ජමාත් සංවිධානය හැසිරීම පිළිබඳව සොයා බැලීමට පොලිස්පතිවරයාගෙන් අවසර ඉල්ලා සිටි විට, පොලිස්පතිවරයා එයට ඉඩ ලබා දුන්නේය. 2017.05.24 දින වැඩබලන අධ්‍යක්ෂ නාලක ද සිල්වා මහතා පොලිස්පතිවරයාට දන්වා සිටියේ මේ සම්බන්ධයෙන් අදාළ ලිපිගොනුවක් නීතිපතිවරයා වෙත උපදෙස් සඳහා යවා ඇති බවයි [ලකුණු කරන ලද ලේඛනය X26].

සහරාන්ගේ ෆේස්බුක් ගිනුම පිළිබඳ තොරතුරු ෆේස්බුක් වෙත වාර්තා කිරීමට සහ රට තුළ සාමය හා සමගිය පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා ගිනුම අත්පත් කර ගැනීමට පියවර ගෙන ඇති බව නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා පොලිස්පතිවරයාට දැනුම් දුන්නේය [ලකුණු කරන ලද ලේඛනය X34].

2018 අප්‍රේල් 16 වන දින ත්‍රස්ත පරීක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂකවරයා පොලිස්පතිවරයා වෙත දන්වා ඇත්තේ සහරාන් අතුරුදහන් වී ඇති බවත්, කුරුණෑගල කැකුණුගොල්ල ප්‍රදේශයෙන් සොයා ගැනීමට නොහැකි වූබත්ය [ලකුණු කරන ලද ලේඛනය X34]

රාජ්‍ය බුද්ධි අංශය, යුද හමුදාව සහ පොලිස් විශේෂ ශාඛාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා කිහිපයක් ලැබීම සැලකිල්ලට ගෙන, පොලිස්පතිවරයා දැනුවත් වී සිටිය යුතුවූ කාරණාව වන්නේ ;

- සහරාන් යනු පලාගිය පුද්ගලයෙකි,
- ඔහු සිටින ස්ථානය රාජ්‍ය බුද්ධි අංශය සහ හමුදාව විසින් දැනගෙන වාර්තා කරන ලදී.
- ඔහු මුස්ලිම් ආගමේ අන්තවාදී දේශකයෙකි,
- ඔහු දිගින් දිගටම සිය දේශන සමාජ මාධ්‍යවල වීඩියෝ හරහා උඩුගත කළේය

- එවැනි සමහර දේශනාවන් මුස්ලිම් නොවන අය ඝාතනය කිරීම සඳහා අනුබල දුන්නේය.

ඉහත පෙන්වා දී ඇති පරිදි, ඔහුගේ අධීක්ෂණය හා නායකත්වය යටතේ ඇති ආයතන ඉස්ලාමීය අන්තවාදය මැඩපැවැත්වීම සඳහා යම් යම් පියවර ගෙන තිබේ. 'ඉස්ලාමීය අන්තවාදය' පිළිබඳ විස්තර කිරීම සඳහා ඔහු එවකට ජනාධිපතිවරයා වෙත නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා කැඳවාගෙන ගොස් තිබේ. හිටපු පොලිස්පතිවරයාගේ ක්‍රියාකලාපයට හිතකරවනසේ සක්‍රිය පියවරයන් කිහිපයක් තිබෙන අතර ඉන් එකක් ලෙස ඔහු විසින් අනෙකුත් ජාතික ආරක්ෂාව සම්බන්ධ ආයතන වෙත, බුද්ධි කොට්ඨාශ වාර්තා යොමු කිරීමේදී බොහෝ විට , මේ පිළිබඳ නැවත වාර්තා කරන්න යනුවෙන් සටහන් කොට යොමු කිරීමේ සිරිතක් පැවති බව පරීක්ෂණ කොමිසම විසින් නිරීක්ෂණය කරන ලදී.

මෙහිදී විමසිය යුතු වැදගත්ම කරුණක් වන්නේ නීතිපතිවරයාට ඉදිරිව සාමී සහ සෙසු අය [ (2007.2 ශ්‍රී. ල.රෙ 216) (බිදුණුවැව නඩුව) ] ප්‍රකාරව පොලිස්පතිවරයා විසින් යම් ආකාරයේ ක්‍රියාමාර්ග ගෙන ඇතත් එසේ ගෙන ඇති ක්‍රියාමාර්ග හෙතම එම ක්‍රියාමාර්ග ගැනීමේදී කටයුතු කල කාර්යක්ෂමතාවය සහ ඔහු විසින් අනුදත් පරිදි "ගැටළුවේ බැරෑරුම් බව " හා සලකාබලන කල්හි ත්‍රස්තපරීක්ෂණ ඒකකය හා පොලිස් විශේෂ අංශය ඇසුරෙහි සිදුවූ ක්‍රියාකාරකම් ප්‍රමාණවත්ද යන වගවේ.

පොලිස්පති ජයසුන්දරට ජාතික බුද්ධි අංශ ප්‍රධානී කාර්යාලයෙන් 2019.04.09 වන දින විදේශ බුද්ධි වාර්තාවක් ලැබුණි. [ලකුණු කරන ලද ලේඛනය C4A]. එදිනම ඔහුට විදේශීය බුද්ධි සභයකුගෙන් [ලකුණු කරන ලද ලේඛනය සී 4 සී] විසින් යොමුකරන කරන ලද සවිස්තරාත්මක වාර්තාවක් රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂවරයාගෙන් ලැබුණි.

පොලිස්පති ජයසුන්දර මහතා පහත සඳහන් නිලධාරීන් 4 දෙනාට C4 (A) සහ C4 (c) යවා ඇති අතර එය "කරු.අ.ක.ස" යනුවෙන් සටහනක් සහිතව 2016.04.09 දින යවා ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත - නන්දන මුණසිංහ

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ, සංවිධානාත්මක අපරාධ, පොලිස් මත්ද්‍රව්‍ය කොට්ඨාශසහ එස්.ටී.එෆ් - කමාන්ඩර් එම්. ලතීෆ්

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විශේෂ ආරක්ෂණ කොට්ඨාශ- ප්‍රියලාල් දසනායක

අධ්‍යක්ෂ - ත්‍රස්ත මර්දන කොට්ඨාශ- වරුණ ජයසුන්දර.

පොලිස්පති ජයසුන්දර මහතා සිය සාක්ෂියෙන් පැහැදිලි කළ පරිදි ඔහුට කරු.අ.කා.ස සටහනක් යෙදීමට හේතුව ජාතික බුද්ධි අංශ ප්‍රධානී සහ රාජ්‍ය බුද්ධි අංශය වෙතින් එකවර ලිපිය ලැබුණු නිසාත්, [ලකුණු කරන ලද ලේඛනය සී 4 (ඇ)] හි රාජ්‍ය බුද්ධි අංශය විසින් තහවුරු කර නොමැති තොරතුරු සඳහන් කර ඇති නිසාත් ය. එබැවින් ඔහු එය ඉහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීයා වෙත යැවීය.

පොලිස්පතිවරයාගේ කාර්ය මණ්ඩලයේ ප්‍රබල ස්ථානයක් හිමි කර ගත් බවට සැලකෙන ප්‍රියදර්ශන මහතා කොමිසම ඉදිරියේ තබා ඇති සාක්ෂිවලට අනුව බුද්ධි කොට්ඨාශ විසින් යවන ලද බුද්ධි වාර්තාවල බොහෝවිට සටහන් යොදා තිබේ. පොලිස්පතිවරයා විසින් ඔහුගේ අත්සන එහි යෙදීම පමණක් සිදු කර තිබුණි. පොලිස්පතිවරයාගේ කාර්යබහුල කාලසටහන සලකා බැලීමේදී තර්ක කළ හැකි කරුණක් නම්, මෙම එක් එක් බුද්ධි වාර්තාවල අන්තර්ගතය ඔහුට පෞද්ගලිකව කියවීමට හෝ දැනුවත් කිරීමට ඔහුට මනුෂ්‍ය වශයෙන් හැකි ද යන්න සලකා බැලිය යුතුය. කෙසේ වෙතත්, මේ සියලු සටහන් පොලිස්පතිවරයාගේ අත්සන යටතේ ඔහු යටතේ ඇති වෙනත් ආයතන වෙත යොමු වී තිබීම සැලකිය යුතු කරුණකි. ඉහත සඳහන් වාර්තාවල ඇති තොරතුරු වල අන්තර්ගතය හෝ බුද්ධි තොරතුර පිළිබඳ දැනුම ලබා ගැනීමේදී මෙය නිරන්තරයෙන් ඔහු මත පැටවෙන වගකීමක් බවට පත්වෙයි.

සී 4 (ඒ) සහ සී 4 (සී) පිළිබඳ හිටපු පොලිස්පතිවරයා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය සාමාන්‍ය ක්‍රියාදාමයෙන් බැහැර වී ඇති අතර, අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

4 දෙනෙකු වෙත "කරු.අ.ක.ස" යැවීමට ඔහු තීරණය කර ඇත. මෙයින් පෙනී යන්නේ ඔහු ඒ සම්බන්ධයෙන් වහාම ප්‍රතිචාර දක්වා ඇති බවයි. එම ලියකියවිලි ප්‍රශ්නය වන්නේ එය ප්‍රමාණවත්ද යන්නයි.

එස්.නියෝජ්‍ය පොලිස්පතිනන්දන මුණසිංහ මහතා ද සී 4 සමඟ බටහිර පළාතේ අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත බෙදා හැරීමට පියවර ගෙන තිබේ. එවැනි නිලධාරීන්ගෙන් බහුතරයක් ඔවුන්ගේ අධීක්ෂණය යටතේ පොලිස් ස්ථාන වෙත තොරතුරු බෙදා හැර ඇති නමුත් සමහර පොලිස් ස්ථාන ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී ඇත. මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු වන ජමීල්ගේ බෝම්බය ට්‍රොපිකල්ඉන් ලැගුම්හලේ පුපුරා ගියද, දෙහිවල භාර නියෝජ්‍ය පොලිස්පති වික්‍රමසිංහ විසින්  අදාළ ගල්කිස්ස ප්‍රදේශය මනාව කළමනාකරනය කොට ඇත. මෙයින් පෙනී යන්නේ පොලිස්පතිවරයා විසින් අවශ්‍ය පියවර ගැනීම සඳහා වූ යොමු කල සටහන් වලින් ඇතැම් අවස්ථාවල අපේක්ෂිත ප්‍රතිඵල ලැබී ඇති බවයි.

ඉහත පෙන්වා දී ඇති පරිදි පොලිස් මූලස්ථානයේ දී ලැබුණු බුද්ධි වාර්තාවල අන්තර්ගතය පොලිස්පතිවරයා දැන සිටියේය. එබැවින් ඉස්ලාමීය අන්තවාදීන්ගේ ගැටලුවේ තරම හා විශාලත්වය ඔහු දැන සිටියේය. සහරාන් විසින් මුස්ලිම් නොවන අය නසා දැමිය යුතු බවට සිය දේශනවලදී සඳහන් කොට ඇති බවද ඔහු දැන සිටියේය. මුස්ලිම් ප්‍රජාවේ ඇතැම් සාමාජිකයින් විසින් ආගමික ප්‍රතිමාවලට හානි කිරීම පිළිබඳව ඔහුගේ අධීක්ෂණය යටතේ කෙලින්ම පරීක්ෂණය කරන රහස් පොලිසිය විසින් විසින් පරීක්ෂණය කරන ලදී. ආගමික ප්‍රතිමා ප්‍රශ්නයෙන් මාසයකට අඩු කාලයකදී එම පරීක්ෂණ  කණ්ඩායමම වනාතවිල්ලුවේ පුපුරණ ද්‍රව්‍ය සොයාගෙන තිබේ. සහරාන්ගේ නම වනාතවිල්ලුව පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම හා සම්බන්ධ බව පොලිස්පති ජයසුන්දර දැන සිටියේය.

මුස්ලිම් ජාතිකයෙකු වුවද රහස් පොලිසියේ කණ්ඩායම වනාතාවිල්ලුව වෙත මෙහෙයවූ එක් සිවිල් වැසියෙකු ඝාතන තැතකට ද ලක්විය. අතීතයේදී සිංහලයන් සහ මුස්ලිම්වරුන් අතර වාර්ගික කැළඹීම් කිහිපයක් පැවතුනි. එල්.ටී.ටී.ඊය විසින් එවකට සිදු කර ඇති බවට සැක කළද, එය එසේ වූයේ නම්, එය තවත් ජනවාර්ගික ගැටුමක නැගීම පිළිබඳ ඇඟවීම

විය හැකිය. එවැනි පසුබිමක් දෙස බලන විට "කරු.අ.ක.ස" ට වඩා පියවර කිහිපයක් ඉදිරියට යාම රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නායකත්වය දරන තැනැත්තාගේ යුතුකම නොවන්නේද.

හිටපු පොලිස්පතිවරයා පහත දැක්වෙන පියවර නොගත්තා නම්;

- රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂකවරයා සිය කාර්යාලයට කැඳවා හෝ අවම වශයෙන් ඔහුට දූරකථන ඇමතුමක් ලබා දී වැඩිදුර විමසීම් කර තිබේද?
- සහරාන්අත්අඩංගුවට ගැනීමේ ප්‍රගතිය පිළිබඳව ත්‍රස්ත විමර්ශන ඒකකය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ කත්තන්කුඩි පොලිසියෙන් විමසා තිබේද?
- රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානි විසින් සපයන ලද තොරතුරු කිහිපයක් සලකා බැලීමේදී, සහරාන්, රිල්වාන් සහ ආමි මොහිදීන් සැඟවී සිටිය යුතු ස්ථානවලින් අත්අඩංගුවට ගැනීමට ත්‍රස්ත පරීක්ෂණ අංශය සහ රහස් පොලිසිය අපොහොසත් වූයේ මන්දැයි ඔහු විමසා බැලිය යුතු නොවේද?
- බස්නාහිර පළාතේ පිපිරීම් සිදුවනු ඇතැයි විදේශ මූලාශ්‍රය නිශ්චිතව නොකියන හෙයින් පළාත් 9 න් සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් කැඳවා ප්‍රවේශමෙන් හා සූදානමින් රැස්වීමක් පැවැත්විය යුතු නොවේද.
- ඔහු සී 4 (ඒ) පිටපත් කළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 4 දෙනා සමඟ පසු විපරම් කළේ කෙසේද?
- පළාත්වල අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් හෝ අවිනිශ්චිත සැලැස්මක් තිබීමේ හැකියාව පිළිබඳව ඔහු "කරු.අ.ක.ස" සකස් කළේ කාටද?
- ඔහුගේ වාර්තා කරණ ඉහල නිලධාරියා වන ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු අමතා තොරතුරු ගැන සාකච්ඡා කළාද?
- රාජ්‍ය බුද්ධි අංශ තොරතුරු සනාථ කර නොමැති නමුත් උත්සව සමයේදී පූර්වාරක්ෂාව ගැනීම වඩා හොඳ බැවින් එය සිදු නොවිය හැකි බව ඔහු අදාල තොරතුරු ඇමතිවරයාට දන්වා සිටියේයද.

ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී, හිටපු පොලිස්පතිවරයා ඉහත සඳහන් කළ පරිදි සි 4 (ඒ) සම්බන්ධයෙන් එක පියවරක් ගෙන තිබුණද, ප්‍රශ්නය වන්නේ එම ලේඛනය බෙදා හැරීම හුදෙක් ප්‍රමාණවත්ද යන්නයි. බින්දුනු වැව නඩුවේ හරයට අනුකූලව පෙන්වා දී ඇත.

සි 4 සි ලැබීමෙන් පසු පොලිස්පතිවරයාගේ පසුකාලීන හැසිරීම නිශ්චය කර ගැනීම සඳහා, 2019.04.09 දිනෙන් පසු පොලිස්පතිවරයාට ලැබුණු ලියකියවිලි සලකා බැලීම වැදගත්ය.

තැන

| අංකය | දිනය | සිද්ධිය | ලකුණු කිරීම |
|---|---|---|---|
| **01** | **2019.04.18** | රාජ්‍ය බුද්ධි අංශය විසින් බයිසිකල් බෝම්බ වාර්තාව | X 193 / X 450 |
| **02** | **2019.04.19** | රාජ්‍ය බුද්ධි අංශය විසින් බයිසිකල් බෝම්බය පිළිබඳ වැඩිදුර වාර්තාව | X 194 / X 457 |
| **03** | **2019.04.20** | රාජ්‍ය බුද්ධි අංශය විසින් සහරාන්ගේ | X 111 |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධතාවය පිළිබඳ ඉදිරිපත් කළ විස්තර | |

ඉහත සඳහන් සියලු වාර්තා ඔහු විසින් කියවා ඇති බව පොලිස්පති ජයසුන්දර මහතා සාක්ෂි දුන්නේය. ඔහුගේ පැහැදිලි කිරීම වූයේ මෙම වාර්තාවලට C4 (A) සහ C4 (C) සමඟ කිසිදු සම්බන්ධයක් නොමැති බවයි. පොලිස්පතිවරයාගේ සහ ආරක්ෂක ලේකම්වරයාගේ සාක්ෂියක් ලෙස එය නිරීක්ෂණය කරනු ලැබුවේ එවකට අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි අංශගේ වාර්තා 'බුද්ධි වාර්තාවක' අවශ්‍ය ව්‍යුහයට වැටී නැති බවය. නමුත් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනාම රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂවරයාට ඒ පිළිබඳව මඟ පෙන්වීම සඳහා කරදරයක් නොවැසුනෝය. රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයාට අනුව, පොලිස්පතිවරයාගෙන් සහ ආරක්ෂක ලේකම්වරයාගෙන් මෙම වාර්තාට ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමට ඔහු කැමති වුවද, අප්‍රේල් 21 වන දින පිපිරුම සිදුවන තෙක්ම කිසිවෙකු ප්‍රතිචාර දැක්වූයේ නැත.

මෙම නිලධාරීන් දෙදෙනා රාජ්‍ය බුද්ධි කොට්ඨාශ වාර්තා බුද්ධි තොරතුරු ලෙසට හඳුනා නොගනු ඇතත්, රාජ්‍ය බුද්ධි අංශය විසින් නිකුත් කරන ලද සෑම වාර්තාවකම ඉස්ලාමීය අන්තවාදය සම්බන්ධ වර්ධනයන් අවබෝධ කර ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ඔවුන් සතුව ඇති බව කිසිවෙකුට ප්‍රතික්ෂේප කළ නොහැකිය.

පොලිස්පතිවරයා සිය රාජකාරි ඉටුකිරීමට නිසි උත්සාහයක් දැරුවේ නම්, ඔහු සී 4 සී කියවූ මොහොතේම, එහි අන්තර්ගතය නිසැකවම රාජ්‍ය බුද්ධි අංශය විසින් එකම "තොරතුරු "සහ එකම කරුණු සහ ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි එකම පුද්ගලයෙක් පිළිබඳව විවිධ වාර්තා කිහිපයකින් ලබා දී ඇති 'තොරතුරු' කිහිපයක් ඔහුට මතක් කර දෙනු ඇත. ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන පුද්ගලයින්. හිටපු පොලිස්පතිවරයා C4A සහ C4C වෙත h ලෙස අඩු ආකල්පයක් ගෙවා තිබේද? බුද්ධි

කොට්ඨාශ වාර්තාවලට කිසිදු අවධානයක් යොමු නොකළේ ද නැතහොත් ජාතික ආරක්ෂාව ගැන ඔහුට කිසිදු තැකීමක් නොකළේ ද?

අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවයේ නිලන්ත ජයවර්ධන මහතා 19/4/20 දින සවස 5.00 ට පමණ ඇමතුමක් ලබා දී ප්‍රහාරයක් සිදුවන බව දන්වා සිටියේය. ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය බුද්ධි අංශය රැස්කරගෙන ඇති බුද්ධි තොරතුරු මොනවාදැයි පොලිස්පති ජයසුන්දර රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ වෙතින් විමසීය. ඔහුගේ ප්‍රතිචාරය වූයේ එය විදේශ ප්‍රභවයෙන් ලැබෙන තවත්තොරතුරකි යන්නයි..

අති උත්තම රදගුරුතුමන්ලා හට මෙම තොරතුරු දන්නවා නොසිටියේ මත්ද්‍රව්‍ය පරීක්ෂණ කොමිසම විසින් ප්‍රශ්නය කළ විට ඔහු ප්‍රතිචාර දැක්වූයේ එම තොරතුරු පිළිබඳව තමාට විශ්වාසයක් නැති බවය. මන්දයත් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ එය විදේශීය මූලාශ්‍රයකින් ලැබුණු බවත් රාජ්‍ය බුද්දි සේවය ඒ පිළිබඳව වෙනත් යමක් දැන නොසිටි බැවින් ඔහු ඒ ගැන සඳහන් කර නැත. පොලිස්පති ජයසුන්දර මහතා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වෙත පවසා ඇත්තේ ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරුන් සහ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත දැනුම් දෙන ලෙසයි. කෙසේ වෙතත්, පොලිස්පතිවරයා බුද්ධි කොට්ඨාශ බරපතල ලෙස නොසලකන බව සිතූ හෙයින්, ඔහු ආරක්ෂක ලේකම් සමඟ කතා කළ අතර, පසුව ඔහු පොලිස්පතිවරයා අමතා රාජ්‍ය බුද්දි අධ්‍යක්ෂ විසින් දැන්වූ තොරතුරු පවසා ඇත.

එවකට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කල නිලධාරියා හට පොලිස් පතිවරයා විසින් පවසා ඇත්තේ මෙම බුද්ධි තොරතුරු සියලු ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරුන් ලෙස දැනුම් දෙන ලෙසය.

පාලමුනෙයි පිපිරීම පිළිබඳ පොලිස්පතිවරයා දැනුවත් සිටි බැවින් එමඟින් ඔහුට හමෙන්ම රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයා හට පවා යම් ආකාරයකට මෙම තත්ත්වයේ බරපතලකම ගැන කරුණු අවබෝධ කර ගැනීමට ඉඩ තිබේ.

අප ඉදිරියේ ඇති සාක්ෂි පිළිබඳ සමස්ත තක්සේරුවක් මත පදනම්ව, සහරාන්ගේ පසුබිම, වර්ධනය සහ හැසිරීම සම්බන්දයෙන් ඔහුට ලබා දුන් අතිවිශාල බුද්ධි වාර්තා සැලකිල්ලට ගෙන අවශ්‍ය පරිදි කටයුතු කිරීමට පොලිස්පතිවරයා අපොහොසත් වූ බව අපගේ අදහසයි. රටේ පොලිස්පතිවරයා ලෙස ඵලදායී හා තීරණාත්මක පියවර ගැනීමට ඔහු අපොහොසත් වී තිබේ.

ඉදිරිපත්වී ඇති සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් ඇති බව පරීක්ෂණ කොමිසම හි අදහසයි. දණ්ඩ නීති සංග්‍රහයේ සුදුසු විධිවිධාන යටතේ පූජිත් ජයසුන්දර මහතාට එරෙහිව අපරාධ නඩු පැවරීම නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ, සංවිධානාත්මක අපරාධ, පොලිස් මත්ද්‍රව්‍ය කොට්ඨාශ සහ විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී එම්. ආර්. ලතීෆ්

ඔහු ආරම්භයේ සිටම විශේෂ කාර්‍ය බලකාය විසින් රාජකාරී ඉටු කරනලද ප්‍රදේශයක් වූ නැගෙනහිර පළාතේ අණදෙන නිලධාරියා විය. විශේෂ කාර්‍ය බලකාය ට 1980 දශකයේ මුල් භාගයේ සිට විදේශ පුහුණුව සමඟ ශක්තිමත් බුද්ධි කොට්ඨාශයක් තිබුණි.විශේෂ කාර්‍යබලකායේ ප්‍රධාන මෙහෙයුම් ප්‍රදේශය වූයේ නැගෙනහිර පළාතයි. කෙසේ වෙතත්, ඔහුගේ අණ යටතේ ප්‍රදේශයේ පවතින ඉස්ලාමීය අන්තවාදය පිළිබඳව කිසිදු බුද්ධි තොරතුරක් ලබා ගැනීමට විශේෂ කාර්‍ය බලකායේ බුද්ධි කොට්ඨාශවලට නොහැකි විය. වෙනත් කාරනාවන් පිලිබඳව බුද්ධි වාර්තා තිබුනද ඉස්ලාම් අන්තවාදය පිළිබඳව එසේ බුද්ධි තොරතුරු නොපැවිතිනි. ඒ සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රතිචාරය වූයේ එවැනි කිසිදු ක්‍රියාකාරකමක් පිළිබඳව ඔවුන්ට දැනගන්නට නොලැබුනු බවයි.

තමා වෙත C4C ලැබුනේ නැතැයි යන ස්ථාවරය ඔහු විසින් දැරුවද C4A සහ C4C ඔහු වෙත යොමු කොට තිබුණි. පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඔහු ඒ සම්බන්ධයෙන් ගත් පියවර විමසූ විට ඔහුගේ ප්‍රතිචාරය වූයේ ඉන්දීය තානාපති කාර්යාලය හා සම්බන්ධ වී

එයට ආරක්ෂාව සැපයූ බවයි. කෙසේ වෙතත්, ලැබී ඇති බුද්ධි තොරතුරු මත ක්‍රියා කිරීමට ඔහු සිය බුද්ධි කොට්ඨාශවලට උපදෙස් නොදුන්නේ මන්ද යන්න ප්‍රශ්නය සහගතය.

3. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බාර බස්නාහිර පලාත

ඔහුට 2019.04.09 දින පොලිස්පති කාර්යාලයෙන් සී 4 ඒ, සී 4 බී සහ සී 4 සී ලැබුණි. ඇත්ත වශයෙන්ම ඔහු එම තොරතුරු කියවා ඇත්තේ 2016.04.10 දින ය. එම ලේඛන නිල වශයෙන් ගොනු කිරීමට ඔහු පියවර ගෙන නොමැත.

එම කරුණු කෙසේ වුවද සී 4 ලේඛනය සකස් කොට ඇත්තේ ඔහුය. එහි දී ඔහු නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට ප්‍රධාන උපදෙස් හතරක් ලබා දී ඇත. උපදෙස් හතරෙන් දෙකක් බුද්ධිමය ක්‍රියාමාර්ගවලට සම්බන්ධ වන අතර දෙකක් ක්‍රියාකාරී ආරක්ෂක පියවරයන්ට අදාළ වේ.

බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ලබා ගත් පියවර දෙකෙහි පහත සඳහන් දෑ ඇතුළත් වේ:

සී 4 ඒ හි සඳහන් පුද්ගලයින්ගේ ඡායාරූප ලබා ගැනීම.

එම ඡායාරූප භූමියේ රාජකාරියේ නියුතු බුද්ධි කොට්ඨාශ නිලධාරීන් වෙත යොමු කිරීම.

ඉලක්ක ගත ස්ථාන අසල එම පුද්ගලයින් දැකීම පිළිබඳව සුපරීක්ෂාකාරී වීම

ඔවුන් තානායම හෝ කුලී ගෙවල්වල රැඳී සිටියි දැයි බැලීම.

තොරතුරු රැස් කිරීම රහසිගතව කළ යුතු බවද ඔහු අවධාරණය කරයි.

ප්‍රහාරයක් පිළිබඳ තොරතුරු කල්තියා ලබා ගන්නා ලෙසද ඔහු නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට උපදෙස් දී තිබේ.

කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් මෙවැනි සවිස්තරාත්මක උපදෙස් ලබා දීමේ පසුබිම තුළ, මෙම උපදෙස් බස්නාහිර පලාත් බුද්ධි

කොට්ඨාශයේ අධ්‍යක්ෂ වෙත යැවීම ඔහු විසින් දැඩි ලෙස නොසලකා හැර ඇති අතර එය ඔහුගේ අධීක්ෂණය යටතේ සෘජුවම ක්‍රියාත්මක වීම සඳහා පිහිටුවා ඇති එකම බුද්ධි කොට්ඨාශයද එය බව සඳහන් කල යුතු ය.

සී 4 හි සඳහන් තමාගේම උපදෙස් සාක්ෂාත් කර ගැනීම සඳහා සැලැස්මක් සකස් කිරීම සඳහා බස්නාහිර පලාත් බුද්ධි කොට්ඨාශය සමඟ රැස්වීමක් කැඳවීමට ඔහු අපොහොසත් වී ඇත.

එපමණක් නොව, සී 4 හි සඳහන් උපදේශන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී ආරක්ෂක පියවරයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා සී 4 ඒ, සී 4 බී සහ සී 4 සී පිළිබඳ සිය යටත් නිලධාරීන් සමඟ සම්මන්ත්‍රණයක් කැඳවීමට ඔහු අසමත් විය. ඉදිරියේදී එල්ල විය හැකි ප්‍රහාරයට එරෙහිව ක්‍රමවේදයක් සකස් කිරීම සහ එවැනි ප්‍රහාරයක් වැළැක්වීම සඳහා උපරිම පියවර ගැනීම සඳහා ඔහු රාජකාරිය ඉටු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් වන තොරතුරු සහිත උපදෙස් පත්‍රිකාවක් (සී 4) නිකුත් කිරීම ඔහුගේ එකම ඉහල නිලධාරියා වූ පොලිස්පතිවරයා සමඟ සංවාදයේ යෙදීමට ඔහු පියවර ගෙන නොතිබුණි. එහි නම් කර ඇති පුද්ගලයින්ගේ පසුබිම පිළිබඳ වැඩි දැනුමක් ලබා ගැනීම සහ එවැනි ප්‍රහාරයක් සිදුවීම වැළැක්වීම සඳහා ඵලදායී සැලැස්මක් සකස් කිරීමට ඔහු අපොහොසත් විය.

සී 4 හි සම්පාදකයා ලෙස, සාක්ෂිකරු එහි යටත් නිලධාරීන්ට ප්‍රමාණවත් උපදෙස් ලබා දී නොමැති අතර, ඉහත සඳහන් කළ පරිදි සම්මන්ත්‍රණයකදී හෝ රැස්වීමකදී තම යටත් නිලධාරීන් පුද්ගලිකව හමුවීමෙන් ඔහු එය පැහැදිලි කර නැත. පරීක්ෂණ කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු පෙන්වා දුන්නේ සී 4 හි ඉතා සීමිත නියෝග ඇති බැවින් එම තොරතුරු පූජ්‍ය පක්ෂයට සම්ප්‍රේෂණය කිරීමට නොහැකි වූ බවයි (උදා: ජ්‍යෙෂ්ඨ පොලිස් පරීක්ෂක සරත් කුමාරසිංහගේ සාක්ෂි).

සී 4 හි බුද්ධි කොට්ඨාශ නිලධාරීන් සහ සාමාන්‍යය පොලිස් නිලධාරීන් විසින් කළ යුතු උපදෙස් මාලාවක් අඩංගු විය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මූනසිංහට 2019 අප්‍රේල් 20 වන දින ලබා දුන් බුද්ධි තොරතුර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මුලින් සහ පසුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන වෙතින් එදිනම ලබා ගත්තේය. සක්‍රීය නිත්‍ය බලකායට නිශ්චිත උපදෙස් ලබා දීම සඳහා ඔහු නියෝජ්‍ය පොලිස්පතිවරයා සමඟ රැස්වීමක් කැඳවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. එල්ටීටීඊ යුද්ධයේ දී සහ යුද්ධයෙන් ඉක්බිතිව ත්‍රස්ත විමර්ශන අංශයේ සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ ද සේවය කළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස ඔහු ලබාගත් පෞද්ගලික අත්දැකීම් පසුබිම තුළ මෙය සලකා බැලිය යුතු විය. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සහ එවැනි බෝම්බකරුවන්ගේ මෙහෙයුම් වල ස්වභාවය ඔහු හොඳින් දැන සිටියේය.

එසේම, ඒ සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 20 වන දින බස්නාහිර පළාත් බුද්ධි කාර්යාංශයේ අධ්‍යක්ෂ ප්‍රසන්න බ්‍රාහ්මණගේ මහතාට දැනුම්දීමට ඔහු අපොහොසත් වී ඇත. ඔහුගේ අධීක්ෂණය යටතේ වූ කොට්ඨාශයක් වූ බුද්ධි කාර්යාංශයේ නිලධාරීන්ව 2019 අප්‍රේල් 20 වන දින රාත්‍රියේ විශේෂයෙන් බුද්ධි කොට්ඨාශ මෙහෙයුම් සඳහා යෙදවීමට අපොහොසත් විය. සී 4 ඒ හෝ වෙනත් පුද්ගලයෙකුගේ ලැයිස්තුගත කර ඇති විහව ප්‍රහාරකයන්ගේ චලනයන් දැන ගැනීම සඳහා මැද කොළඹ කොට්ඨාශය.

පල්ලිවලට පහරදීමක් පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවයේ නිලන්ත ජයවර්ධන විසින් සනාථ කරන විට සාක්ෂිකරු තම ප්‍රදේශයේ සිටින පූජ්‍ය පක්ෂයට 2019 අප්‍රේල් 20 හෝ 2019 අප්‍රේල් 21 දින දැනුම් දීමට අපොහොසත් විය. ඔහුගේ පැහැදිලි කිරීම වූයේ පිපිරීම සිදුවුවහොත් මිනිස් ජීවිතයට සිදුවිය හැකි හානියට වඩා පිපිරීමක් සිදු නොවන්නේ නම් එහි ප්‍රතිවිපාක ගැන ඔහු බිය වූ බවයි.

සාක්ෂිකරුගේ අතපසු වීම් සිදුවී ඇත්තේ දැනුවත් පසුබිමක් තුළය. ඔහු මඩකලපුව ප්‍රදේශයේ සේවය කර ඇති අතර ශ්‍රී ලංකාවේ අයිඑස් හිතවතුන්ට අදාළ තොරතුරු මීට පෙර අවස්ථාවකදී රාජ්‍ය බුද්ධි අංශය අධ්‍යක්ෂවරයාගෙන් සී 597 ලෙස ලියා ඇති ලිපියක ස්වරූපයෙන් ලැබී තිබේ. . තවුහිද් අනුගාමිකයන් සහ ප්‍රදේශයේ අනෙකුත් මුස්ලිම් නිකායන් අතර ඇති වූ ආරවුල් පිළිබඳව ද ඔහු දැන සිටි බව (2015.03.04 දිනැති සී 596

සලකුණු කරන ලද රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ විසින් යවන ලද තවත් ලිපියක සඳහන් වේ).

සී 4 ඒ, සී 4 බී සහ සී 4 සී හි තොරතුරු තමා බැරෑරුම් ලෙස නොසැලකූ බව සාක්ෂිකරු සාක්ෂි සහිතව පිළිගත් අතර, "එහි සඳහන් කර ඇති පරිදි 2019 අප්‍රේල් මාසයේ ප්‍රහාරය සිදුවනු ඇතැයි යන කාරණය ගැන ඔහු සිතුවේ නැත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මුණසිංහට ත්‍රස්ත ක්‍රියාකාරකම් සහ ඉස්ලාමීය ත්‍රස්තවාදය පිළිබඳ දැනුමක් තිබූ අතර, ඔහු එල්ලවීමට නියමිත ප්‍රහාරයක තොරතුරු පූර්ණ ලෙස තක්සේරු කිරීමට අපොහොසත් විය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස තම රාජකාරියේ යෙදී සිටියදී ඔහු සිය යටත් නිලධාරීන් එක්රැස් කිරීම සහ වැරදිකරුවන් තම පොලිස් ප්‍රදේශයට ඇතුළු වූ අවස්ථාවකදී ඔවුන් අල්ලා ගැනීමට හා අවදානයට ලක්විය හැකි කරුණු ලබා ගැනීමට පුළුල් සැලැස්මක් සකස් කිරීමට අසමත් විය.

2019.04.09 වන විට ප්‍රහාරකයන්ගේ නම් සාක්ෂිකරුට ලබා දුන් විට, ඔවුන්ගේ අනන්‍යතාව පිළිබඳ දැනුම ලබා ගැනීමට සහ තම ප්‍රදේශය තුළ අවදානමට ලක්විය හැකි ස්ථානවලට ඔවුන් ඇතුළු වීම වැළැක්වීමට ඔහු පියවර ගත්තේ නැත. කිංස්බරි සහ ෂැන්ග්‍රිලා අවන්හල්වල පිපිරීම් හමුවේ, මහ මොළකරු වන සහරාන් 2019 අප්‍රේල් 19 වන දින ෂැන්ග්‍රිලා හෝටලයට පැමිණ සිටියේය. පරීක්ෂණවලින් හෙළි වූ පරිදි ඔහු ආර්. ඒ. ද මෙල් මාවත සිට පැමිණ තිබේ. සහරාන්ගේ අනන්‍යතාවය නිත්‍ය බලකායේ පොලිස් නිලධාරීන්ට අවශ්‍ය පුද්ගලයකු ලෙස දැනුම් දීමට සාක්ෂිකරු පියවර ගෙන තිබේ නම් හෝ ඔහුගේ බුද්ධි කොට්ඨාශ නිලධාරීන් උපක්‍රමිකව අදාළ ඉලක්ක ගත ස්ථානවලට ස්ථාන ගත කොට තිබුනේ නම් මෙම ප්‍රහාරය වළකවා ගන්නට ඉඩ තිබුණි.

සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් ඇති බව පරීක්ෂණ කොමිසමහි අදහසයි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුනසිංහට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ හෝ

පොලිස් ආඥා පනතේ 82 වන වගන්තියේ සුදුසු විධිවිධාන යටතේ අපරාධ නඩු පැවරීම නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

[4. නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නියෝජ්‍ය පොලිස්පති (කොළඹ-උතුර)

පාස්කු ප්‍රහාරය සිදුවන විට ඔහු කොළඹ උතුරේ ස්ථිර නියෝජ්‍ය පොලිස්පතිවරයා විය. 2019.04.11 දින ඔහුට සී 4 (අ) (ආ) (ඇ) අතින් මෙන්ම වීපීඑන් හරහා ද ලැබී තිබේ. සී 4 ලෙස සලකුණු කරන ලද ලියවිල්ල ලැබීමෙන් පසු ඔහු සී -365 ලෙස සලකුණු කර ඇති ආවරණ ලිපියක් සාදා සී 4 සමඟ අමුණා ඇති අතර එය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන අතුකෝරාල සහ සහකාර පොලිස් අධිකාරී සිසිල කුමාර වෙත යවා ඇත්තේ 2016.04.12 දින ය.

කෙසේ වෙතත්, ඔහු එම සී 365 ,ලිපිය යැවීම හැර වෙනත් කිසිදු පියවරක් ගෙන නැත. ප්‍රහාරයට පෙර කනිෂ්ඨ නිලධාරීන්ගෙන් සී 4 සම්බන්ධ වාර්තා කැඳවීමට ඔහු අපොහොසත් විය. ඔහු හුදෙක් පණිවිඩකරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර ඔහුගේ රාජකාරි ඉටු කිරීමට අසමත් විය.

ඒ අනුව ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

5. පොලිස් අධිකාරී සංජීව බණ්ඩාර, (කොළඹ උතුර කොට්ඨාශය)

ඔහු කොළඹ උතුරු කොට්ඨාශයේ පොලිස් අධිකාරීවරයා විය. සී - 4 මඟින් ලැබුණු උපදෙස් සම්බන්ධයෙන් සාක්ෂිකරු කිසිදු අර්ථවත් පියවරක් ගෙන නොමැත.

මරාගෙන මැරෙන ප්‍රහාරයක් සිදුවිය හැකි බවට නියෝජ්‍ය පොලිස්පති ෂෙල්ටන් පතිනායක මහතා 2019-04-19 දින (සී -13 ඩී) සාක්ෂිකරුට දැනුම් දී ඇතත්, ප්‍රහාරය වළක්වා ගැනීමට සාක්ෂිකරු කිසිදු පියවරක් ගෙන නොමැත. යටත් නිලධාරීන්ගේ සාක්ෂි අනුව සාක්ෂිකරු ඔවුන් වෙත තොරතුරු ලබා දී නැත.

සී 4 සහ සී 13 ඩී මගින් ලැබුණු තොරතුරු සම්බන්ධයෙන් ඔහු කිසිදු පියවරක් ගෙන නොතිබුණද, 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ ප්‍රහාර වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂක පියවර ගෙන ඇති බව නිරූපණය කිරීම සඳහා සිදුවීමෙන් පසුව ඔහු සිය යටත් නිලධාරීන්ව ව්‍යාජ ඇතුළත් කිරීම් සඳහා පොළඹවා ඇති අතර නිල ලේඛන ව්‍යාජ ලෙස සකස් කර තිබේ.

සාක්ෂි වලින් හෙළි වූයේ ඔහු පහත සඳහන් ලියකියවිලි ව්‍යාජ ලෙස සකස් කිරීමට සහාය වූ බව ය.

සී -80

සී -81

සී -82

සී -94

සී -106 / සී -106 ඒ

සී -113 / සී -113 ඒ

සී -118 ඒ, 118 බී, 118 සී

සී -117

පොලිස් අධිකාරී සංජීව බණ්ඩාරට එරෙහිව අපරාධ චෝදනා එල්ල කිරීම සඳහා වැඩි නැඹුරුවක් පවතින සේ ප්‍රමාණවත් සාක්ෂි තිබේ.

ලැබී ඇති සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් ඇති බව පරීක්ෂණ කොමිසමහි අදහසයි. පොලිස් අධිකාරී සංජීව බණ්ඩාරට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ හෝ පොලිස්

ආඥා පනතේ 82 වන වගන්තියේ සුදුසු විධිවිධාන යටතේ අපරාධ නඩු පැවරීම නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

ඔහුට එරෙහිව කිසියම් චෝදනාවක් සනාථ කිරීම සඳහා පැමිණිල්ල විසින්

පොලිස් පරීක්ෂක රක්කින වසම් උපේන්ද්‍ර

නියෝජ්‍ය පොලිස්පති ෂෙල්ටන් පතිනායක

පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ලෙස කැඳවිය හැකි ය.

ව්‍යාජ ලිපි ලේඛන සැකසීමට කුමන්ත්‍රණය කළ බවට චෝදනා ඔප්පු කිරීමේදී, පැමිණිල්ල පහත සඳහන් සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි කැඳවිය හැකිය;

උඩගේ කංකානම්ගේ ගාමිනී

ප්‍රධාන පොලිස් පරීක්ෂක හෙන්රි මහේන්ද්‍ර කරුණාරත්න

පොලිස් පරීක්ෂක සිරිසේන අබේසිංහ

ප්‍රධාන පොලිස් පරීක්ෂක සුදත් ප්‍රියන්ත අබේරත්න.

6. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වන්දන අතුකෝරල

ඔහුට තොරතුරු ලැබුනේ 2016.04.12 දින සී 4 (අ), (ආ) (ඇ) සහ සී 365 මඟිනි .

ලිපි ලැබීමෙන් පසු වන්දන අතුකෝරල විසින් සී 375 සමග ඔහු විසින් සකස් කරන ලද ආවරණ ලිපිය ඔහුගේ අධීක්ෂණය යටතේ සිටි සහකාර පොලිස් අධිකාරීවරුන් 4 දෙනා වෙත යවා ඇත.

එසේම ඔහු තොරතුරු බුද්ධි කොට්ඨාශ ස්ථානාධිපති වෙත ලබා දී ඇත.

2018.04.18 දින බුද්ධි කොට්ඨාශ ස්ථානාධිපති විසින් සී 378 ලෙස සලකුණු කරන ලද ලිපියක් මඟින් කිසිදු තොරතුරක් සොයාගත නොහැකි බව දන්වා ඇත.

පසුව ඔහු සී 378 පිළිබඳ සටහනක් තබා වැඩි විස්තර සොයා ගැනීම සඳහා එය නැවත ස්ථානාධිපතිවරයා වෙත යවා ඇත.

සී 378 නිර්මාණය කර ඇත්තේ 2021.04.21 දිනට පසුව බව දියගම විදානගේ ආරච්චිලාගේ කසුන් සංජීව බණ්ඩාරට (ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාල බුද්ධි කොට්ඨාශයේ සේවය කළ නිලධාරියා) සාක්ෂි දී තිබේ.

පොලිස් අධිකාරී වන්දනා අතුකෝරාල මහතා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස සිය රාජකාරි ඉටු කිරීමට අපොහොසත් වී තිබේ.

ඉදිරිපත්වී ඇති සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු වීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් ඇති බව පරීක්ෂණ කොමිසමති අදහසයි. දණ්ඩ නීති සංග්‍රහයේ ඕනෑම සුදුසු විධිවිධානයක් යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වන වගන්තිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වන්දන අතුකෝරලට එරෙහිව අපරාධ නඩු පැවරීම නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

7. එස්පී බී. ඊ. අයි. ප්‍රසන්න, අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශය

සාක්ෂිකරු විසින් සපයන ලද සාක්ෂි සහ පරීක්ෂණ කොමිසම වෙත ඉදිරිපත් කර ඇති වෙනත් සාක්ෂි සලකා බැලීමේදී, පාස්කු ඉරිදා ප්‍රහාරයන් සිදුවීමට පෙර සාක්ෂිකරුගේ හැසිරීමෙහි පහත සඳහන් අතපසු වීම් නිරීක්ෂණය කරන ලදී.

2019 අප්‍රේල් 11 වන දින නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහන හරහා නියෝජ්‍ය පොලිස්පති පතිනායකගේ කාර්යාලයෙන් සී 9, සී 4, සී 4 ඒ, සී 4 බී සහ සී 4 සී ලබා ගත්තේය. ඒ අනුව, 2019 අප්‍රේල් 11 වන විට එම ලේඛනවල අන්තර්ගතය පිළිබඳව ඔහු දැන සිටියේය. පසුදින ඔහු උපදේශන පංතියක් පවත්වා ඇති අතර, තම යටත් නිලධාරීන්ට අවදියෙන් සිටින ලෙසත් ඔහුට වාර්තා කරන ලෙසත් උපදෙස් දී තිබේ. කෙසේ වෙතත්,

එම ගැටළුව විසඳීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීමට සාක්ෂිකරු අපොහොසත් වී ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි සමූහයෙන් පැහැදිලි වේ.

නිදසුනක් වශයෙන්, තොරතුරු පිළිබඳ ඵලදායි ලෙස තොරතුරු රැස් කිරීම සඳහා තම බුද්ධි කොට්ඨාශ නිලධාරීන්ට උපදෙස් දීමට හා ස්ථානගත කිරීමට ඔහු අසමත් විය. කොළඹ තුළ පල්ලි හෝ වෙනත් තීරණාත්මක ස්ථාන අසල කිසිදු බුද්ධි කොට්ඨාශ නිලධාරියෙකු ස්ථානගත කර නොතිබුණි.

සී 4 ප්‍රධාන වශයෙන් තොරතුරු රැස් කිරීම සමඟ කටයුතු කරන බව පෙනේ. එපමණක් නොව, තොරතුරු රැස්කිරීම සම්බන්ධයෙන් සී 9 ට වැඩි උපදෙස් ද තිබුණි. එමනිසා, සී 4 සහ සී 9 හි උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී මෙම සාක්ෂිකරුට විශාල කාර්යභාරයක් පැවරී ඇත.

තොරතුරු එක්රැස් කිරීම සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කිරීම සඳහා ඔහු සිය ආසන්නතම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුනසිංහ සමඟ සන්නිවේදනය / සම්බන්ධීකරණය කළ යුතුව තිබුණි. සී 4 ඒ හි සඳහන් පුද්ගලයින්ගේ ඡායාරූප ලබා ගැනීමට ගත් කිසිදු උත්සාහයක් ඔහුගේ සාක්ෂිවලින් හෙළි නොවේ.

2019 අප්‍රේල් 20 හෝ 21 යන දිනවල සිදුවීමට නියමිත ප්‍රහාරය පිළිබඳව තමාට පසුව කිසිදු තොරතුරක් නොලැබුණු බව සාක්ෂිකරු තරයේ කියා සිටියත්, පරීක්ෂණ කොමිසම ඉදිරියේ නියෝජ්‍ය පොලිස්පති ලලිත් පතිනායකගේ සාක්ෂි [කාශී සටහන් පිටු. 2013.11.02 දිනැති ගොනුවේ 132 සහ 133], ඔහු 2019.04.21 දින උදෑසන රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාගෙන් ලැබුණු තොරතුරු ගැන සාක්ෂිකරුට දැන සිටි බව (ඇමතුම් වාර්තාව සී 12 ඊ ලෙස සලකුණු කර ඇත) පැහැදිලි ය.

ඔහුගේ කොට්ඨාශය මැද කොළඹ කොට්ඨාශය තුළ ක්‍රියාත්මක වන එකම බුද්ධි කොට්ඨාශය වන බව සාක්ෂිකරු දැන සිටියේ ය. එම නිසා එම කොට්ඨාශ තුළ ඇති සියලුම පොලිස් ස්ථාන වළ බුද්ධි තොරතුරු එකතු කිරීම සඳහා බස්නාහිර පලාත් බුද්ධි කොට්ඨාශයේ නිලධාරීන් මත රඳා සිටියහ. මැද කොළඹ කොට්ඨාශයේ සංචාරක හෝටල්

ද ඇතුළුව කොළඹ තුළ තීරණාත්මක කරුණු ආවරණය කිරීම සඳහා එලදායී සැලැස්මක් සකස් කිරීමට අපොහොසත් වීමෙන් සාක්ෂිකරු සිය කොට්ඨාශයේ රාජකාරිය හා කාර්යය ඉටු කිරීමට අපොහොසත් විය.

සාක්ෂිකරු රාත්‍රියේදී තොරතුරු රැස්කිරීමේ කිසිදු සැලසුමක් සකස් කර නොතිබුණි. රාත්‍රී කාලයේදී කිසිදු බුද්ධි කොට්ඨාශ නිලධාරියෙකු නගරය තුළ ස්ථානගත කර නොතිබුණි. ප්‍රධාන වශයෙන් කොටුව පොලිස් ස්ථානය තුළ විශේෂ ආරක්ෂාවක් අවශ්‍ය වූ ස්ථාන 30 ක් තිබිනි.

ඉදිරිපත්වී ඇති සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් ඇති බව පරීක්ෂණ කොමිසමහි අදහසයි. දණ්ඩ නීති සංග්‍රහයේ හෝ පොලිස් ආඥා පනතේ **82** වන වගන්තිය යටතේ සුදුසු විධිවිධාන යටතේ බස්නාහිර පලාත් බුද්ධි කොට්ඨාශයේ අධ්‍යක්ෂ පොලිස් අධිකාරී ඩී. ඊ. අයි. ප්‍රසන්නට එරෙහිව අපරාධ නඩු පැවරීම නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

8. සහකාර පොලිස් අධිකාරී සිසිල කුමාර

ඔහු ආගමික අන්තවාදය හා අල්කයිඩා සම්බන්ධයෙන් තුර්කියේ පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගී වූ බැවින් පළපුරුදු නිලධාරියෙකි. සී 365 සහ සී 375 සමහ සී 4 (අ), (ආ), (ඇ), සී 365 සහ සී 375 යන තොරතුරු ඔහුට ලැබුණි. කෙසේ වෙතත්, ඔහු තොරතුරු ස්ථානාධිපතිවරුන්ට යවා නැත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් අනුව පියවර ගැනීම සඳහා සිසිල කුමාර මහතා කටාන පොලිසියේ තබා ඇති OVB පිළිබඳ සටහනක් (සී 379) තබා ඇති කටාන පොලිස් ස්ථානයට පැමිණ තිබේ.

ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ඔහුට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන අතුකෝරල ඇමතුමක් ලැබුණි. ඔහුට ලැබුණු තොරතුරුවලට අනුව ඔහු යටතේ පොලිස් ස්ථාන නිසි ලෙස පාලනය කර නොතිබුණි.

එබැවින් ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි

9. ප්‍රධාන පොලිස් පරික්ෂක ආර්. එම්. සරත් කුමාරසිංහ, වැඩබලන ස්ථානාධිපති කොට්ටව

සාක්ෂිකරු විසින් සපයන ලද සාක්ෂි සහ පරීක්ෂණ කොමිසම වෙත ඉදිරිපත් කර ඇති වෙනත් සාක්ෂි සලකා බැලීමේදී, පාස්කු ඉරිදා ප්‍රහාර සිදුවීමට පෙර සාක්ෂිකරුගේ හැසිරීමෙහි පහත සඳහන් අතපසු වීම් නිරීක්ෂණය කළ හැකිය.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජයසිංහ මහතා වෙනුවට 20 වන දින රාත්‍රියේ එස්.පී. වික්‍රමසිංහ මහතාගේ සාක්ෂි අනුව ඔහු වැඩබලන ස්ථානාධිපති කුමාරසිංහ මහතාට පහත සඳහන් කරුණු දැනුම් දී ඇත.

ආසන්න ප්‍රහාරයකට එරෙහිව පල්ලි වටා ආරක්ෂාව තර කිරීම සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් තොරතුරු ලැබුණි

මාර්ග බාධක වැඩි කිරීමට,

වැටලීම් කිරීමට

අවශ්‍ය කණ්ඩායම් දැනුවත් කිරීමට ඔහුට උපදෙස් ලැබිණි.

ප්‍රධාන පොලිස් පරික්ෂක කුමාරසිංහ මහතා ඉහත කිසිවක් කිරීමට අපොහොසත් වී ඇති අතර ඊට පටහැනිව ඔහු සාමාන්‍ය වේලාවට රැකියාවෙන් අවසන් කොට ගොස් බැරැක්කයේ සිට ඇත්තේ සිය රාජකාරි පොලිස් පරික්ෂක ලලන්තට යන නිලධාරියා භාරදීමෙනි.

2019-04-11 සිට 2019-04-21 දින දක්වා නිවාඩු ලබා සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක සාගර ලියනගේ මහතා වෙනුවට වැඩ බැලූ සාක්ෂිකරු 2019.04.19 දින, උදේ පැවති උපදෙස් පන්තියේදී තම නිලධාරීන්ට නිශ්චිත උපදෙස් ලබා දීමට අපොහොසත් වී ඇති අතර, ඔහු උපදේශන පන්තියේ සියලුම නිලධාරීන්ට SK 01 හි අන්තර්ගතය කියවා තිබුණේ ය..

තම ප්‍රදේශය තුළ ඇති පල්ලිවල ආරක්ෂාව පිළිබඳව පෞද්ගලිකව පරීක්ෂා කිරීමට ඔහු අපොහොසත් වී තිබුණි.

ඉදිරියේදී එල්ල විය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් පොලිස් අධිකාරි වික්‍රමසිංහගේ තහවුරු කරන ලද පණිවිඩයක් ලැබී තිබියදීත්, තම කොට්ඨාශය තුළ මාර්ග බාධක නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීමට ඔහු අපොහොසත් වී ඇත.

ඔහු තොරතුරු ලබාගෙන කඩිනම් පියවර ගැනීමත්, මාර්ග බාධකවල නිලධාරීන් යෙදවීමටත්, ලැබී ඇති තොරතුරු සම්බන්ධයෙන් එහි නිලධාරීන් දැනුවත් කිරීමත් සිදුකරනවා වෙනුවට පොලිස් ස්ථානයේ රාජකාරි ආවරණය කළ පොලිස් පරීක්ෂක ලලන්තට එම පණිවිඩ සම්ප්‍රේශනය කිරීම පමණක් සිදු කොට ඇත. තමාට ලැබුණු උපදෙස් අනුව තොරතුරු ලබා ගැනීම සඳහා කොටුවේ පොලිස් ස්ථානයේ අනුයුක්ත බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමට ඔහු අපොහොසත් විය.

සියළුම නිලධාරීන්ගේ සාක්ෂි වලට අනුව කොටුව පොලිස් ස්ථානය විශේෂ ආරක්ෂාවක් අවශ්‍ය ස්ථාන 30 ක් ආවරණය කරයි. එබැවින් ප්‍රධාන පොලිස් පරීක්ෂක කුමාරසිංහ මහතා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ.

ස්ථිර ස්ථානාධිපති සාගර ලියනගේ සමඟ සන්නිවේදනය / සම්බන්ධීකරණය කිරීමට ඔහු අසමත් විය.

සහකාර පොලිස් අධිකාරී ඩී. කේ. ප්‍රියන්ත සමඟ සන්නිවේදනය / සම්බන්ධීකරණය කිරීමට ඔහු අපොහොසත් වී ඇත.

පැය 1956 ට ෂැන්ග්‍රිලා හෝටලයේ බෝම්බකරුවන් හෝටලයට පැමිණ ඇති අතර, කිංග්ස්බරි හෝටලයේ බෝම්බකරු 2019-04-20 දින පැය 19.29 ට හෝටලයට පැමිණියේ ය. ෂැන්ග්‍රිලාහි මරාගෙන මැරෙන බෝම්බකරුසහ කිංග්ස්බරි හි මරාගෙන මැරෙන බෝම්බකරු පිළිවෙලින් පැය 20.21 සහ පැය 2106 ට අදාළ හෝටල්වලින් පිටත්ව ගොස් රාත්‍රී 0147 ට (2019.04.20 දින) රාත්‍රී කාලයේදී හෝටල් වෙත ආපසු යාමට පෙර පැය ඔහු තොරතුරු ලබාගෙන කඩිනම් පියවර ගැනීමත්, මාර්ග බාධකවල නිලධාරීන් යෙදවීමටත්, ලැබී ඇති තොරතුරු සම්බන්දයෙන් එහි නිලධාරීන් දැනුවත් කිරීමත් සිදුකරනවා වෙනුවට පොලිස් ස්ථානයේ රාජකාරි ආවරනය කළ පොලිස් පරික්ෂක ලලන්ත ට එම පණිවිඩ සම්ප්‍රේශනය කිරීම පමණක් සිදු කොට ඇත. ගාලු පාර ඔස්සේ ගමන් කර තිබේ. .

සියලු මාර්ග බාධක නිසි පරිදි ක්‍රියාත්මක වන බවට සහතික කරමින් සාක්ෂිකරු වඩාත් ක්‍රියාශීලි පියවර ගත්තේ නම්, මරාගෙන මැරෙන බෝම්බකරුවන් සොයා ගැනීමේ හැකියාවක් තිබුණි. සාක්ෂිකරුගේ විෂය රාජකාරිය පැහැර හැරීම පිළිබඳ පැහැදිලි නඩුවක් ඇති බව පෙනේ. 2016.04.20 දින කොටුවේ වැඩබලන ස්ථානාධිපතිවරයා වශයෙන්, තමා යටතේ සිටින සියලුම නිලධාරීන් ප්‍රහාර තර්ජනයකට එරෙහිව සටන් කිරීම සඳහා ඵලදායී ලෙස යොදා ගන්නා බවට සහතික වීමෙන් නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක වීම මඟින් ඔහු සිය රාජකාරි කඩිනමින් ඉටු කිරීමට අසමත් විය.

පොලිස් පරික්ෂක සාගර ලියනගේ (කොටුව පොලිසියේ ස්ථිර ස්ථානාධිපති) ඔහු උපදෙස් පන්තියක් පැවැත්වූ බව ප්‍රකාශ කළද, සීඅයි කුමාරසිංහගේ සාක්ෂිය වූයේ සීඅයි ලියනගේ විසින් පවත්වන ලද එවැනි විශේෂ පංතියක් ඔහුට මතක නැති බවය. සී. ඒ. එස්කේ 01 අලවා ඇත්තේ "උපදෙස් පන්ති පොතා" හි ය. එබැවින්, 2011.04.11 දින සිට

2016.04.20 වන දින දක්වා පැමිණි තොරතුරු පිළිබඳව ඔහුට පූර්ව දැනුමක් නොතිබූ බව පෙනේ.

ඉදිරිපත් වී සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් ඇති බව පරීක්ෂණ කොමිෂ ම අදහසයි.

සීඅයි ආර්. එම්. සරත් කුමාරසිංහට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ හෝ පොලිස් ආඥා පනතේ 82 වන වගන්තියේ සුදුසු විධිවිධාන යටතේ අපරාධ නඩු පැවරීම පිළිබඳව නීතිපතිවරයා සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

10. ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්. සාගර විලේගොඩ ලියනගේ, ස්ථානාධිපති කොටුව

සාක්ෂිකරු විසින් සපයන ලද සාක්ෂි සහ පරීක්ෂණ කොමිසම වෙත ඉදිරිපත් කර ඇති වෙනත් සාක්ෂි සලකා බැලීමේදී, පාස්කු ඉරිදා ප්‍රහාර සිදුවීමට පෙර සාක්ෂිකරුගේ හැසිරීමෙහි පහත සඳහන් අතපසු වීම් නිරීක්ෂණය කළ හැකිය.

2019 අප්‍රේල් 13 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උපාලි ජයසිංහ මහතා විසින් පවත්වන ලද රැස්වීමට සහභාගී වී එම රැස්වීමේදී සහරාන්ගේ ඡායාරූපයක් ලබා දී ඇති අතර, එම සමුළුවේදී ලැබුණු තොරතුරු පොලිස් ස්ථානයේ සිටින සිය නිලධාරීන්ට සම්ප්‍රේෂණය කිරීමට සාක්ෂිකරු අපොහොසත් වී තිබේ. දුම්රිය ස්ථානය තුළ සිටින සියලුම පරීක්ෂක නිලධරයන්ට ඔහු 2011.04.13 දින සවස උපදේශන පන්තියක් පැවැත්වූ බව ඔහු තරයේ කියා සිටියද, එය සනාථ කිරීම සඳහා කිසිදු සටහනක් නොතිබූ අතර, පරීක්ෂණ කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් නිලධාරීන්ට එවැනි උපදේශන පන්තියක් පිළිබඳ දැනුමක් නොතිබුණි (උදා. : අයි.පී. ලලන්ත ප්‍රියදර්ශන).

සහරාන්ගේ ඡායාරූපය ඔහු පොලිස් ස්ථානයේ දැන්වීම් පුවරුවේ පළ කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කළද, සාක්ෂි දෙන අවස්ථාවේ එම ඡායාරූපය අතුරුදහන් වී ඇති බව ප්‍රකාශයට පත් කළ බැවින් එය ඇත්ත වශයෙන්ම සිදු කළේද යන්න පිළිබඳව සැකයක් පවතී. තවද, සාක්ෂිකරුගේ ප්‍රකාශය වෙනත් කිසිදු නිලධාරියෙකු විසින් සනාථ කිරීමක් සිදු නොවිය.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව සාක්ෂිකරු එස්.කේ. 01 ට (සී 26 සහ අදාළ ඇමුණුම් වලින් සමන්විත ලේඛන සමූහයේ ලැබුණු පිටපත) සටහනක් එක් කර ඇති බව අත්අඩංගුවට ගත් සී.අයි. කෙසේ වෙතත්, ප්‍රදාන පොලිස් පරික්ෂක කුමාරසිංහ මහතාගේ සාක්ෂි වූයේ ඔහු සාමාන්‍ය උපදෙස් පන්තියට පෙර 2019.04.20 දින එම සටහන දුටු නමුත් එය අවිනිශ්චිත බවය. පොලිස් පරික්ෂක කුමාරසිංහ මහතා සාක්ෂි දෙන විට පවා ඔහු කොටුවේ පොලිස් ස්ථානය තුළ සේවය කරමින් සිටි අතර සාක්ෂිකරු එම ස්ථානයේ ස්ථානාධිපතිවරයා විය. එම නිසා, විහාරස්ථාන, පල්ලි සහ පොදු ස්ථාන අසල සෝදිසි කිරීම, මුර සංචාර කණ්ඩායම් යෙදවීම සඳහා උපදෙස් සහිතව සාක්ෂිකරු එස්.කේ. 01 ට සටහනක් එක් කළේද යන්න පිළිබඳව සැකයක් පවතී.

එපමණක් නොව, ඉදිරියේදී එල්ල වන ප්‍රහාරයක් පිළිබඳ පූර්ණ දැනුමක් ඇතිව සාක්ෂිකරු 2019 අප්‍රේල් 19 වන දින සිට නිවාඩු ලබාගෙන ඇත. තම පොලිස් ප්‍රදේශය තුළ ශ්‍රී ලංකාවේ තීරණාත්මක ස්ථාන බොහොමයක් අඩංගු බව සාක්ෂිකරු දැනුවත් බවයකින් සිටි කළ අතර, ඔහු එම තොරතුරු වලට ප්‍රමුඛත්වය නොදැක්වූ අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් විය.

ඔහු 2019 අප්‍රේල් 13 වන දින සමුළුවේදී එස්.කේ. 01 හි සඳහන් උපදෙස්වලට අනුව කටයුතු නොකළ අතර අවසන් මොහොතේ තොරතුරු ලැබුණු විට 2019 අප්‍රේල් 20 වන විට විශේෂ ආරක්ෂක සැලැස්මක් නොතිබූ බව පෙනේ.

කොටුවේ පොලිස් ස්ථානය තුළ ස්ථානගත කර ඇති බස්නාහිර පලාත් බුද්ධි කොට්ඨාශ නිලධාරීන් සමඟ සන්නිවේදනය / සම්බන්ධීකරණය කිරීමට ඔහු පියවර ගෙන නොමැත.

කොටුවේ පොලිස් ස්ථානයේ ස්ථානගත කර ඇති බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශ නිලධාරීන් සමඟ සන්නිවේදනය හා සම්බන්ධීකරණය මඟින් තොරතුරු ලබා ගැනීමේ කිසිදු සැලසුමක් ඔහු සකස් කර නොතිබුණි. එසේ කිරීමට අපොහොසත් වීමෙන් ඔවුන්ට පහත තොරතුරු ලැබී ට නොහැකි විය:

සහරාන් (ඔහුගේ නම සී 4 ඒ හි සඳහන් වේ) හෝටලයේ ඔත්තු බැලීමක් සිදු කිරීම සඳහා 2019 අප්‍රේල් 19 වන දින ෂැන්ග්‍රිලා හෝටලයට පැමිණ තිබේ.

සහරාන් ඉල්හාම් අහමඩ් සමඟ 2016.04.20 සවස ෂැන්ග්‍රිලා හෝටලයට පැමිණෙන විට ඔවුන් සමඟ ගියේය.

ඉහත කරුණු සලකා බැලීමේදී සහ සාක්ෂිකරුගේ වැදගත්කම කොටුව ස්ථානාධිපති ලෙස සලකන හෙයින්, පූර්ව අනතුරු ඇඟවීම් නොතකා කිසිදු වැළැක්වීමේ පියවරක් ගැනීමට ඔහු අපොහොසත් වූ බව පෙනේ. තම ප්‍රදේශය තුළ පිපිරීමක් සිදුවුවහොත් එය ජීවිතයට හානියක් වන බව දැන සිටි සාක්ෂිකරු එම තොරතුරු වලට ප්‍රමුඛතාවය දීමට සහ වැළැක්වීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමට අසමත් විය.

ඉදිරිපත් වී තිබෙන සාක්ෂි මත පදනම්ව, ඉහත විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් සාපරාධී වගකීමක් උපවය වී බවත් දණ්ඩ නීති සංග්‍රහයේ සුදුසු විධිවිධාන යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වන වගන්තිය යටතේ අපරාද නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිසමහි අදහසයි.

11. වමින්ද නවරත්න- පොලිස් ස්ථානාධිපති (කටාන)

ඔහුට 2019.04.13 දින ෆැක්ස් මඟින් සී 4 සහ සී 375 යන තොරතුරු ලැබුණි. කටාන පොලිසියට ෆැක්ස් හරහා සී 4 (අ), (ආ), (ඇ) ලැබී තිබේ.

තොරතුරු ලැබීමෙන් පසු ඔහු ඒ සම්බන්ධයෙන් පහත පියවර ගෙන තිබේ

උක්ත තොරතුරු නියෝග පොතේ ඇතුළත් කිරීමට පොලිස් කොස්තාපල් මද්දුරංග 67265 ට දැනුම්දීම. නියෝග පොත සී 385 ලෙස සලකුණු කර ඇත.

(2) තොරතුරු පරීක්ෂා කිරීම සඳහා බුද්ධි කොට්ඨාශ නිලධාරියෙකු වන පොලිස් සැරයන් නිශාන්ත 21705 ට දන්වා තිබීම.

(3) ඔහු 2016.04.20 දින රැස්වීමක් (උපදෙස් පන්ති ) පවත්වා ඇති අතර එහිදී මෙම තොරතුරු පිළිබඳව සාකච්ඡා කර ඇත.

4.පො.කො.76732 අසංග, පො.කො.73138 ලලිත්, පො.කො.49132 අශෝකට පල්ලි පරීක්ෂා කොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුනසිංහගේ උපදෙස් පිළිපදින්නැයි නියෝග පොතෙහි සටහනක් තබා ඇත. සී 390 ලෙස සලකුණු කර ඇත.

කෙසේ වෙතත්, කටාන පොලිස් ස්ථානයේ පවත්වාගෙන යනු ලබන OVB පිළිබඳ සහකාර පොලිස් අධිකාරී සිසිල කුමාර විසින් ඉදිරිපත් කරන ලද සටහනට ඔහු අනුකූල වී නොමැත. ඔහු සී 4 පිලිබඳව පොලිස් නිලධාරින් වෙත දන්වා සිට ඇත්තේ පහර දීමට දිනකට පෙර එනම් 2016.04.20 දින පමණි.

සී 4 (අ) (ආ) (ඇ) ලැබීමෙන් පසු ඔහු සිය රාජකාරි ඉටු කිරීමට අපොහොසත් වී ඇත.

ඉහත තත්වයන් මත ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

එබැවින් ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි.

## 21 වන පරිච්ඡේදය

# නීතිපති දෙපාර්තමේන්තුව

මෙම පරිච්ඡේදයේදී පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලිපිගොනු අංක EER/08/2017 හැසිරවීමේදී නීතිපති දෙපාර්තමේන්තුව දැක්වූ ප්‍රමාදය පිළිබඳව සලකා බලයි.

නීතිපතිවරයා රජයේ ප්‍රධාන නීති උපදේශකවරයා වේ. ඔහු විසින් සියලුම නීතිමය කටයුතු සම්බන්ධයෙන් රජය, රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථාවලට උපදෙස් දෙයි. ඔහු අපරාධ නඩුවලදී නඩු පවරන අතර රජය, රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා වෙනුවෙන් ඕනෑම අධිකරණයක හෝ විනිශ්චය සභාවක පෙනී සිටියි.

අපරාධමය කාරණා සම්බන්ධයෙන් නීතිපතිවරයා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. වැදගත්කමකින් හෙබි හෝ අසීරු තත්ත්වයක් උද්ගතවන ඕනෑම අපරාධ කාරණයක් සම්බන්ධයෙන් ඔහු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන් මෙන්ම වෙනත් ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ රාජ්‍ය සංස්ථාවල නිලධාරීන් ඔහුගෙන් උපදෙස් ලබා ගැනීම හෝ ඔහුගේම මූලිකත්වය මත උපදෙස් ලබා දීම සිදු කරයි. මේ සම්බන්ධයෙන් වන නිශ්චිත විධිවිධාන ප්‍රධාන වශයෙන් (වරින් වර සංශෝධනය කර ඇති පරිදි) 1979 අංක 75 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ මෙන්ම (වරින් වර සංශෝධනය කර ඇති පරිදි) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ ඇතුළත් කර ඇත. බරපතල සාපරාධී වැරදි සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පුද්ගලයින්ට එරෙහි සියලු අධිචෝදනා නීතිපතිවරයාගේ නමින් මහාධිකරණය වෙත ගොනු කරනු ලබන අතර 1979 අංක 75 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 193 වන වගන්තිය මඟින් නඩු පැවරීම නීතිපති හෝ සොලිසිටර් ජනරාල් හෝ රජයේ නීතිඥවරයෙකු හෝ ඒ වෙනුවෙන් නීතිපති විසින් පොදුවේ හෝ විශේෂයෙන් බලයලත් යම් අභිචෝදකයෙකු විසින් සිදු කරනු ලබයි.

භූස්ත විමර්ශන අංශය විසින් no. EER/08/2017

දරණ ගොනුව 2017 ජූනි 07 දිනැති ලිපිය මඟින් නීතිපතිවරයා වෙත යොමු කළේ ය. මෙහිදී නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටි උපදේශය වූයේ ඉදිරිපත් කරන ලද කරුණු මත පදනම්ව, ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ගිණුම් තහනම් කළ හැකිද යන්න සහ මෙම නීති විරෝධී කටයුතුවල යෙදී සිටින පුද්ගලයින් අත්අඩංගුවට ගෙන විමර්ශනය කළ හැකිද යන්න පිළිබඳවයි. 2017 ජූනි 07 වන දින මෙම ගොනුව නීතිපති දෙපාර්තමේන්තුවට ලැබිණි. එවකට එම විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ නිලධාරියා වූයේ එවකට රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයෙකු (SSC) වූ අසාර්ඩ් නාවි ය. පසුව ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ දප්පුල ද ලිවෙරා අපරාධ අංශයේ ප්‍රධානියා ලෙස 2017 ජූනි 12 වන දින සිට වැඩ භාර ගත්තේ ය. අපරාධ අංශය 2017 ජූනි 12 වන දින අදාළ ලිපි ගොනුව රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ අසාද් නවාවි වෙත යොමු කරන ලද්දේ මේ ලිපි ගොනුව හැසිරවීම සඳහා නීතිඥවරයෙකු නම් කරන ලෙස සඳහන් කරමිනි. 2017 ජූනි 16 වන දින එම ලිපි ගොනුව තමාට ලැබුණු බවට රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ මලික් අසිස් සටහනක් යොදා තිබේ. 2017 ජූනි 15 වන දින රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ නාවි විසින් රජයේ නීතිඥ (SC) මලික් අසීස්ට මෙම ලිපි ගොනුව ලබා දෙන අතර එහි "මේ පිළිබඳව ඔබ සමඟ කතා කළා. කරුණාකර මේ පිළිබඳව ක්‍රියාත්මක වන්න යනුවෙන් සටහනක් යොදා ඇත." ජ්‍යෙෂ්ඨ නීතිඥ නාවි සාක්ෂි දෙමින් කියා සිටියේ ගොනුව වෙන් කිරීමට පෙර රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ අසීස් සමඟ කතා කිරීම තමාට මතක ඇති නමුත් සංවාදයේ අන්තර්ගතය සිහිපත් කිරීමට නොහැකි බවයි.

මෙහිදී අවධානය යොමු කළ යුතු කාරණය නම් මෙම ලිපිගොනුව හැසිරවීමේදී නිලධාරීන් දෙදෙනාගේ පාර්ශවයෙන් කිසියම් අතපසු වීමක් සිදුවී ඇත්ද යන්නයි.

රජයේ නීතිඥ මලික් අසීස් වෙත, ලිපි ගොනුව ලැබුණු අවස්ථාව වන විට ගොනුවේ පිටු විසිපහක් අඩංගු වූ අතර එහි අඩංගු කරුණු පහත පරිදි විය :

(i) 01 සිට 16 දක්වා තොරතුරු ඇතුළත් පිටු සහ ත්‍රස්ත විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයාගේ සහතිකයක් අඩංගු 17 වන පිටුව,

(ii) පිටු 18 සිට 22 දක්වා ඉස්ලාමීය මූලධර්මවාදය සහ අන්තවාදය විමර්ශනය කරන ඒකකයේ ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා වෙත යොමු කරන ලද වාර්තාවක් සහ

(iii) ත්‍රස්ත විමර්ශන අංශයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් 2017 ජුනි 07 දිනැති අංක O / TID / OUT / 5/3600/17 දරණ වාර්තාවක් 23 සිට 25 දක්වා පිටුවල අන්තර්ගත කරමින් ඉහත නීතිපති වෙත යොමු කරන ලදි.

2018 ජුනි 14 දිනැති සංයුක්ත තැටියක් සමඟ තවත් ලියකියවිලි කට්ටලයක් ලැබෙන තෙක් මෙම ලිපි ගොනුව පිළිබඳව කිසිදු අවධානයක් යොමු කර ඇති බවට ලිපි ගොනුවේ කිසිදු සටහනක් නොමැත. පසුව ලැබුණු කට්ටලය පිටු හැට හයක් අඩංගු විය. ත්‍රස්ත විමර්ශන අංශය විසින් කරන ලද ඉල්ලීම මත ගනු ලැබූ පියවර පිළිබඳව තව දුරටත් අදාළ ගොනුවේ සටහනක් නොතිබුණි. දෙවන ලිපි ලේඛන කට්ටලය ත්‍රස්ත විමර්ශන අංශය වෙතින් ලැබීමට හේතුව ලෙස ප්‍රවාදයන් දෙකක් තිබේ.

ත්‍රස්ත විමර්ශන අංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක පතිරණ විසින් ලබා දුන් සාක්ෂිවලට අනුව සහරාන් සමාජ මාධ්‍ය ජාලාවල දිගින් දිගටම අපහාසාත්මක ප්‍රකාශන ඉදිරිපත් කරමින් සිටි නිසා දෙවන ලියකියවිලි කට්ටලය නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ විය. රජයේ නීතිඥ මලික් අසීස් විසින් කරන ලද පැහැදිලි කිරීම නම්, ලිපිගොනුව සමඟ ලැබුණු පළමු ලිපි ලේඛන මාලාවේ අන්තර්ගතය විමසා බැලීමෙන් පසුව, ඔහු එම තොරතුරු ප්‍රමාණවත් නොවන බව සොයා ගත් බැවින් අදාළ තොරතුරු ඉල්ලා සිටීමට පියවර ගත් බවත් එම නිසාවෙන් 2018 ජුනි 14 දිනැති ඉහත කී සංයුක්ත තැටියද සමඟ දෙවන ලිපි ලේඛන කට්ටලය ලැබීමට හේතුව වූයේ ඔහු විසින් සිදු කරන ලද ඉල්ලීම වන බවයි. සංයුක්ත තැටියක් සමඟ දෙවන ලිපි ලේඛන ලැබීමට හේතුව මෙය බව ඔහු පැහැදිලි කළේය.

මෙම ස්ථාවරය තව දුරටත් තහවුරු කරනු පිණිස රජයේ නීතිඥ අසීස් විසින් ත්‍රස්ත විමර්ශන අංශය විසින් ඔහු වෙත එවන ලද 2018 මැයි 31 දින ඉහත කී ලිපි ලේඛන සමඟ

ඔහු වෙත ආමන්ත්‍රණය කරමින් එවන ලද ලිපියක් පිළිබඳව සඳහන් කලේ ය. උක්ත ලිපි ගොනුව හසුරුවන නිලධාරියා ලෙස ඔහු විසින් දැනුම් දී ඇත්නම් මිස ඔහුව හඳුනා ගත නොහැකි බවත් එසේ ඔහු විසින් ඉල්ලීමක් නොකරන තත්ත්වයකදී නිලධාරින්ට එසේ කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බව ද ඔහු සඳහන් කලේ ය.

පරීක්ෂණ කොමිෂන් සභාව මෙම ස්ථාවරය ප්‍රතික්ෂේප කරන්නේ එය ඉදිරියේ ඇති සාක්ෂි පදනම් කරගෙන ය. තමන් විසින් වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස තමා ත්‍රස්ත විමර්ශන අංශය වෙත උපදෙස් දී ඇති බවට අසිස් පවසා සිටියද 2018 ජුනි 07 දින පොලිස්පතිවරයා වෙත ලිපියක් යවමින් එවකට ත්‍රස්ත විමර්ශන අංශයේ නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා සඳහන් කළේ අසිස් මහතා EER / 08/2017 ගොනුව අධ්‍යයනය කරමින් සිටින බවත් ඒ පිළිබඳව තවම කිසිදු උපදෙසක් ලැබී නොමැති බවත්ය.

මෙයින් ඇඟවෙන්නේ රජයේ නීතිඥ අසිස් විසින් ඉදිරිපත් කරන ලද එවැනි දැනුම්දීමක් නොකළ බවයි. මෙය තවදුරටත් සනාථ කරනුයේ 2018 මැයි මස 03 වන දින ත්‍රස්ත විමර්ශන අංශයේ 02 ඒකකය භාර නිලධාරියා විසින් එවකට ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂ වෙත කරන ලද සටහනකිනි.

ඔහු නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගත් විට හර්ෂනී නම් මහත්මියක් විසින් er/ 08/2017 ගොනුව රජයේ නීතිඥ අසිස් විසින් අධ්‍යයනය කරමින් සිටින බව දැනුම් දී ඇත. ත්‍රස්ත විමර්ශන අංශය විසින් තවත් ලිපි ලේඛන සමඟ යවන ලද 2018 මැයි 31 දිනැති ලිපිය රජයේ නීතිඥ අසිස්ගේ අවධානයට යොමු වූයේ එලෙස ය.

ලිපිගොනුවෙහි පළමු සටහන 2019 මාර්තු 12 දිනයේ ඇතුලත් කර ඇති අතර ඒ වන විට ලිපි ගොනුව නීතිපති දෙපාර්තමේන්තුවට ලැබී වසර එකහමාරකට වැඩි කාලයක් ගත වී ඇත. එම සටහන පහත පරිදි ය.

"මගේ උපදෙස් පරිදි උප පොලිස් පරීක්ෂක රත්නායක, පොලිස් කොස්තාපල් නයනප්‍රිය 8356 සහ පොලිස් කොස්තාපල් රුමේෂ් 77703 පැමිණ සිටී. ඔවුන් මේ වන විට විමර්ශනය මෙහෙයවමින් සිටී.

ඊට අදාළ මූල් උපදෙස් ලබා ගත හැකි විය. ඒ අනුව පළමු විධිමත් ලිඛිත පැමිණිල්ල ඇතුළු ලේඛන කිහිපයක් අප වෙත එවා නොමැති බව පෙනී ගියේය.

මේ දක්වා සැකකරුගේ අපරාධ සහායකත්වය සහ සැකකරු සම්බන්ධ චෝදනා කිහිපයක් පිළිබඳව අපි සාකච්ඡා කළෙමු.

මා විසින් හඳුනාගත් කරුණු කිහිපයක් සති 03 ක් තුළ ඉදිරිපත් කරන ලෙස ස්වයං උපදෙස්. ලබා දුන්නෙමි."

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ඊළඟ සටහන 2019 මැයි මස 02 වන දින යොදා ඇත.

මෙම ලිපිගොනුව හැසිරවීමේදී රජයේ නීතිඥ අසීස්ගේ පැත්තෙන් අධික ප්‍රමාදයක් සිදුවී ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි වලින් පෙනී යයි.

රජයේ නීතිඥ අසීස්ගේ සාක්ෂි සහ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි සලකා බැලීමෙන් පසු රජයේ නීතිඥ අසීස්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නිර්දේශ කරනු ලැබේ.

තමන් විසින් EER/08/2017 දරන ගොනුව රජයේ නීතිඥ අසීස් වෙත පැවරූ පසු එම ලිපි ගොනුව තමන්ට නොලැබුණු බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් අසාද් නවාවි ප්‍රකාශ කර සිටියි. ඔහු එම ගොනුව ලබාගෙන ඇත්තේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් සති කිහිපයකට පසු ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමකදී නීතිපති දෙපාර්තමේන්තුවට ත්‍රස්ත විමර්ශන අංශය විසින් ලිපිගොනුවක් යොමු කරන ලද බව දැන ගැනීමට ලැබීමෙන් පසුවය. නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් අසාද් නවාවි විසින් එම ලිපි ගොනුව අධීක්ෂණය නොකලද අධීක්ෂණ නිලධාරියා වශයෙන් එම ලිපි ගොනුව අධීක්ෂණය කළ යුතුව තිබූ බව පරීක්ෂණ කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් නවාවි සාක්ෂි සහ පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි සලකා බැලීමෙන් පසු, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් නවාවිට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව සලකා බැලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිර්දේශ කරනු ලැබේ.

ඇත්ත වශයෙන්ම, EER / 08/2017 ලිපිගොනුව සඳහා උපදෙස් ලබාදීම ප්‍රමාද කිරීම පිළිබඳ කරුණු සෙවීම සඳහා මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා නීතිපති විසින් නිලධාරීන්ගේ කමිටුවක් පත් කළ බවට සාක්ෂි ඉදිරිපත් විය. මෙම පත්වීම 2020 ජූනි මස 02 වන දින සිදු කරන ලදි. කමිටුව විසින් 2020 ජූලි 17 දිනැති වාර්තාව මඟින් ආයතන සංග්‍රහය යටතේ සපයා ඇති පරිදි නියෝජ්‍ය අතිරේක සොලිසිටර් ජනරාල් අසාද් නාවි සහ රජයේ නීතිඥ අසිස්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන ලෙස නිර්දේශ කර ඇත. මෙම කාරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත දන්වන ලදි.

මේ සම්බන්ධයෙන්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විකුම් ද අබ්රූ විසින් මූලික විමර්ශන සොයාගැනීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රතිචාරය පිළිබඳව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත දැනුම් දීමට උත්සාහ කළ බව සඳහන් කළ යුතුය. කෙසේ වෙතත්, ඒ වන විට ඔහු පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවෙකු වූ රජයේ නීතිඥවරයකු වෙනුවෙන් නීතිඥවරයෙකු ලෙස පෙනී සිටියේය. තමාට පුද්ගලිකව සාක්ෂිකරුවෙකු ලෙස සහ නීතිඥවරයෙකු වශයෙන් ඇති පුද්ගලික භාවය සුරක්ෂා කල යුතුය යන වෘත්තීය බැඳීම් සම්බන්ධයෙන් සිතා බලා, පරීක්ෂණ කොමිෂන් සභාව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විකුම් ද අබ්රූට උපදෙස් දුන්නේ එකවර නීතිඥයෙකු හා සාක්ෂිකරුවෙකු වීමට උත්සාහ නොකර නිසි ක්‍රියා පටිපාටිය හරහා අදාළ කාරණ සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව වෙත විධිමත් ලෙස දැනුම් දෙන ලෙසයි. තවදුරටත් උක්ත කාරණාවන් සම්බන්ධයෙන් නිවේදනයන් පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ලැබී නොමැත.

අතිරේක සොලිසිටර් ජනරාල් සුමති ධර්මවර්ධනගේ සාක්ෂි වූයේ අදාළ කාල සීමාව තුළ ඊඊආර් (EER) ලිපිගොනු සම්බන්ධයෙන් ලිපිගොනු සමාලෝචන රැස්වීම් පවත්වා නොමැති බවයි. මෙය සමස්ත අධීක්ෂණ ක්‍රියාවලියේ බරපතල පසුබෑමකි.

ඒ අනුව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

1. ත්‍රස්තවාදීන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සහ ඊට අදාළ පැමිණිලි විභාග කිරීමට වෙන් වූ නඩු පැවරීමේ ඒකකයක් පිහිටුවීම. ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබා දිය යුතු වන අතර එම කණ්ඩායමට ත්‍රස්තවාදී නඩු විභාග කිරීම සහ සහාය දීම හැර වෙනත් කාර්යයන් පැවරිය යුතු නොවේ.
2. දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල කාර්තුමය ගොනු සමාලෝචන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
3. ත්‍රස්ත විමර්ශන අංශය සහ අනෙකුත් අදාළ ආයතනවල ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන කණ්ඩායම් වල නිලධාරීන් අතර මාසික සමාලෝචන රැස්වීමක් පැවැත්වීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

## 22 වන පරිච්ඡේදය

## සහදායක සාදක

වාර්ගික හා ආගමික කැළඹීම් ඇති කළ හෝ රට තුළ මෙවැනි ක්‍රියාවන්ට සහාය දෙන සහ මහජනතාවගේ නොසන්සුන්තාව සහ සමාජ ක්‍රමයට බාධා පමුණුවන සහ සමාජ අඛණ්ඩතාව කඩාකප්පල් කර වාර්ගික කැළඹීම් ඇති කළ පුද්ගලයින්, සංවිධාන හඳුනා ගැනීමට පරීක්ෂණ කොමිෂන් සභාවට බලය පවරා ඇත.

මෙම කාර්ය භාර්යේ කොටසක් ලෙස සංවිධාන පිළිබඳව 18 සහ 25 පරිච්ඡේදවල සාකච්ඡා කර ඇත. මෙම පරිච්ඡේදය පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරයි.

### 1. පූජ්‍ය ගලගොඩ අත්තේ ඥානසාර හිමි

මෙම හිමියන් බොදුබල සේනා සංවිධානයේ ලේකම් ය. එම සංවිධානය 2012 දී පිහිටුවන ලදී. වහාබ්වාදයෙන් රටට ඇති තර්ජනය හඳුනා ගැනීමේ ව්‍යාපාරයේ පෙරමුණ ගෙන සිටියේ මෙම හිමියන් ය. වාර්තාවේ කලින් විස්තර කර ඇති පරිදි මෙම කාරණය සම්බන්ධයෙන් එහිමියන් නිවැරදි බව ඔප්පු වී ඇත. එහෙත් මෙම තෙරුණ්වහන්සේ ගේ කතා වහාබ් මතවාදය ඉලක්ක කර ගැනීමෙන් පමණක් නතර නොවූ අතර පොදුවේ මුස්ලිම් ප්‍රජාව ද ඉලක්ක කර ඇත.

කෙසේ වෙතත්, තෙරුණ්වහන්සේගේ සමහර ක්‍රියා සහ ප්‍රකාශ මුස්ලිම් තරුණයින් අන්තවාදයට තල්ලුවීමට සහ සහරාන් සමහ එක්වීමට හේතු වී තිබේ. සහරාන් තම අභිප්‍රාය වෙනුවෙන් සහයෝගය ලබා ගැනීම සඳහා උන්වහන්සේගේ කථා සහ ක්‍රියාවන් යොදා ගත් බවට සාක්ෂි ඉදිරිපත් වී තිබේ. සහරාන් විසින් කරන ලද අවසාන වීඩියෝ පටයේ දී ප්‍රහාරයන් එල්ල කිරීමට හේතු දක්වමින් පූජ්‍ය ගලගොඩ අත්තේ ඥානසාර හිමියන්ගේ ක්‍රියාවන් දක්වා ඇත.

අන්‍යෝන්‍ය රැඩිකලීකරණය යනු එකිනෙකාගේ රැඩිකලීකරණ මතවාදයන් ප්‍රවර්ධනය කරන රැඩිකලීකරණ චක්‍රයයි. පූජ්‍ය ගලගොඩ අත්තේ ඥානසාර හිමියන්ගේ ක්‍රියාවන්ගේ ප්‍රතිඵලය වූයේ මුස්ලිම් තරුණයින්ගේ අන්‍යෝන්‍ය රැඩිකලීකරණයයි.

2014 පෙබරවාරි 17 වන දින පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් විසින් මහරගම සහ 2014 ජුනි මාසයේ පෝය දිනයට පසු දින අළුත්ගමදී කරන ලද අපහාසාත්මක ප්‍රකාශයන් පරීක්ෂණ කොමිෂන් සභාවට අසන්නට ලැබිණ.

2013 පෙබරවාරි 17 වන දින මහරගමදී සහ 2014 ජුනි මාසයේ පෝය දිනට පසු දින අලුත්ගමදී කරන ලද කතාවලට එරෙහිව 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත(ICCPR act) ප්‍රකාරව ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමේ හැකියාව සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි. මුස්ලිම් තරුණයින්ගේ රැඩිකලීකරණයට අර්ධ වශයෙන් පූජ්‍ය ගලගොඩ අත්තේ ඥානසාර හිමියන් ද දායක වී ඇත්තෝ ය.

බොදුබල සේනා සංවිධානයේ ක්‍රියාකාරකම් ආගමික සමඟියට තර්ජනයක් බවත් එය තහනම් කළ යුතු බවත් පරීක්ෂණ කොමිෂන් සභාවෙහි අදහසයි.

2. රිෂාඩ් බතියුදීන් මහතා

පාස්කු ප්‍රහාරය සිදුවන අවස්ථාව වන විට සාක්ෂිකරු රජයේ ඇමතිවරයෙකු විය. ප්‍රහාරය සම්බන්ධයෙන් ඉන්සාන් මයිනුදීන් නම් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිබේ. එම සැකකරුවාව අත්අඩංගුවට ගෙන ඇත්තේ ශ්‍රී ලංකා හමුදාව විසිනි. ඉන් ටික කලකට පසු බතියුදීන් මහතා යුද හමුදාපති ජනරාල් මහේෂ් සේනානායක මහතා සිය ජංගම දුරකථනයෙන් තුන් වරක් ඇමතුවේය.

බතියුදීන් මහතා පවසන පරිදි සැකකරුගේ පියා අමාත්‍යාංශයේ ලේකම්වරයෙකි. තම පුතා නාඳුනන පුද්ගලයින් පිරිසක් විසින් පැහැරගෙන ගොස් ඇති බවත් ඔහු සොයා ගැනීමට ඔහුට සහාය විය හැකි දැයි ඔහු බතියුදීන් මහතා අමතා ඉල්ලා සිටි බවයි.

මේ පිළිබඳව බතියුදීන් මහතාගේ ප්‍රකාශය වූයේ අදාල පුද්ගලයා ගේ පුත්‍රයා අත්අඩංගුවේ සිටිනවාද යන්න සොයා බැලීමට පමණක් ඔහු හමුදාපතිට කතා කරන ලද බවයි.

ජනරාල් සේනානායක මහතා මෙසේ සාක්ෂි දුන්නේය.

ප්‍ර : දැන් බදුර්දීන් අමාත්‍යවරයා ඔබට කතා කරලා අහමඩ් කියන පුද්ගලයෙක් අත්අඩංගුවට ගත්ත කිව්වනේ. ඉතිං මොකද්ද ඔබෙන් බලාපොරොත්තු වුණේ. ලංකාවේ හමුදාපතිවරයා වන ඔබට මේ ඇමතිවරයා කතා කරලා මොකද්ද බලාපොරොත්තු වුණේ ඔහු කියා සිටියද ඔහුට මොකද්ද අවශ්‍ය වන්නේ කියලා?

පි : මට කිව්වේ මං ඉස්සෙල්ලා පෙරදි කිව්වා වගේ එයාගේ සාමාන්‍ය අධිකාරිවරයෙක් හෝ ලේකම්වරයෙක් පුතෙක් එයා ගැන පොඩ්ඩක් බලන්න මොකද්ද කරන්න පුළුවන් කියලා බලන්න කියන එක තමයි කිව්වේ.

[2016.11.16 දින කාර්ය සටහන් , 8 වන පිටුව]

ඒ අනුව මෙහිදී භාවිතා කරන ලද වචන සැකකරු ඉහ්සාන් මයිනුදීන් වෙනුවෙන් වාසියක් ලබා ගැනීමේ උත්සාහයක් ලෙස පෙනී යයි.

රිෂාඩ් බතියුදීන් මහතාට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ සුදුසු විධිවිධාන ප්‍රකාරව අපරාධ චෝදනා ගොනු කිරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

පරීක්ෂණ කොමිෂන් සභාවේ අවධානයට ලක් වූ තවත් කාරණයක් තිබේ. එය බතියුදීන් මහතාගේ අමාත්‍යාංශයට අයත් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට (IDB) අදාළ වේ. රජයේ ආයතනවලින් අපද්‍රව්‍ය ලෙස බැහැර කෙරෙන සුන්බුන් ලෝහ එකතු කිරීම හා කුඩා, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්තකරුවන් අතර ඒවා බෙදා හැරීම සඳහා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සම්බන්ධ වේ.

එවැනි අවස්ථාවකදී අනුගමනය කළ යුතු නිර්ණායකයන් මාර්ගෝපදේශවල දක්වා ඇත. කාර්මිකයින්ට සුන්බුන් ලෝහ නිකුත් කිරීමට බලයලත් නිලධාරියා වූයේ විකුණුම්

අධ්‍යක්ෂවරයා ය. කෙසේ වෙතත්, එක් පුද්ගලයෙකුට බෙදා හැරිය යුතු සුන්බුන් ලෝහවල ප්‍රමාණය පිළිබඳ නිශ්චිත නීති රීති නොතිබුණි.

එබැවින්, මිල කැඳවීමක් (quotation) ඉදිරිපත් කරන විට කාර්මිකයෙකුට ඕනෑම සුන්බුන් ලෝහ ප්‍රමාණයක් නිකුත් කිරීමට කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට බලය හිමිවේ. ඒ අනුව සභාපති (ගාමිණී ජිනසේන මහතා) විසින් ප්‍රශ්න ගත කාල සීමාව තුළ අත්තනෝමතික ලෙස විශාල ප්‍රමාණයේ සුන්බුන් ලෝහ (විශේෂයෙන් තඹ) ඉන්ෂාෆ්ට අයත් කොලොසස් (පුද්ගලික) සමාගමට නිකුත් කර ඇත.

සමහර අවස්ථාවලදී, කොලොසස් (පුද්ගලික) සමාගමේ ඉල්ලීම සභාපතිවරයා විසින් සෘජුවම අනුමත කරනු ලැබුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ විකුණුම් අධ්‍යක්ෂකගේ එකඟතාවය ලබා නොගෙනය. කාර්මිකයින්ට සුන්බුන් ලෝහ නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශවල කිසිදු ටෙන්ඩර් ක්‍රමවේදයක් සකස් කර නොමැත.

සුන්බුන් ලෝහ නිකුත් කිරීමේදී අක්‍රමිකතා සිදුවී ඇති බව තහවුරු කිරීමට පරීක්ෂණ කොමිෂන් සභාව වෙත සාක්ෂි ඉදිරිපත් වී තිබේ. කොලොසස් (පුද්) සමාගම වෙත අනෙකුත් කාර්මික ආයතන හා සසඳන විට අසාමාන්‍ය ලෙස ඉහළ සුන්බුන් ලෝහ ප්‍රමාණයක් නිකුත් කර ඇත. ඉන්ෂාෆ් බතියුදින් මහතාගේ ඥාතියෙකි. කෙසේ වෙතත්, බතියුදීන් මහතා සාක්ෂි දෙමින් කියා සිටියේ කොලොසස් (පුද්ගලික) සමාගමට සුන්බුන් ලෝහ නිකුත් කිරීමට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොවූ බවයි.

මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තයක් වූ කොලොසස් (පුද්) සමාගමට සැලකිය යුතු ලෙස වැඩි ප්‍රමාණයක් සුන්බුන් ලෝහ නිකුත් කර ඇති බව ලේඛන සාක්ෂිවලින් පෙනී ගියේය. එයින් සමහරක් සභාපතිවරයා විසින් අනුමත කර ඇත. කෙසේ වෙතදු, සුන්බුන් ලෝහ මිලදී ගැනීමේදී එම ආයතනයට වෙනත් ආයතනවලට වඩා වැඩි වට්ටමක් ලබා දී ඇත. එමඟින් රජයට සිදුවී ඇති පාඩුව රුපියල් මිලියන 4.6ක් රජයට පාඩු සිදුවී තිබේ.

ඉන්ෂාෆ් සහ ඉල්හාම් සහරාන්ට විශාල මූල්‍ය පහසුකම් සැපයූහ. එබැවින් මෙම ගනුදෙනු පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය භාර්ය අයත් වේ. පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය

භාර්ය අනුව, මෙම කරුණු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි. C752 සිට 765 දක්වාත්, C770 සිට C799 දක්වාත් ඩීපීපී ලෙස සලකුණු කර ඇති සියලුම ලියකියවිලි ප්‍රියංකා ලක්ෂ්මන් රත්නමාලා, දික්වැල්ල පටබැඳිගේ පාලිත පුෂ්පශාන්ත සහ කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ විකුණුම් අධ්‍යක්ෂවරයා වූ පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි හා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන යන අයවලුන්ගේ සාක්ෂි සටහන්වල පිටපත් ද මේ සමඟ එකී කොමිසම වෙත යැවිය යුතු ය.

### 3. රියාජ් බතියුදීන්

ඔහු ඇමති බතියුදීන්ගේ සහෝදරයාය. ඔහු අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකි. ඉන්ෂාෆ් සහ රියාජ් බතියුදීන් අතර දුරකතන ඇමතුම් කිහිපයක් සිදුවී ඇති බව රහස් පොලිසිය විසින් සොයාගෙන තිබේ. කොලොසස් (පුද්) සමාගම විසින් අපද්‍රව්‍ය අපනයන රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ආරවුලක් සම්බන්ධයෙන් ඉන්ෂාෆ් ඇමතිවරයා සමඟ සම්බන්ධ වීමට උත්සාහ කළ අවස්ථාවේදී මෙම ඇමතුම් ලබා ගත් බව රියාජ් බතියුදින් කියා සිටි. 2017 දී ඉන්ෂාෆ් තමා අමතා ඇති බව අමාත්‍ය බතියුදීන් සාක්ෂි දුන් අතර එයින් අදහස් කරන්නේ ඉන්ෂාෆ් සතුව ඇමතිවරයාගේ අංකය තිබූ බවයි.

සුන්බුන් ලෝහ විකිණීම හා එහි අක්‍රමිකතා අතර ඇති සම්බන්ධය සහ සහරාන්ගේ විශාලතම අරමුදල් සම්පාදකයෙකු වූ ඉන්ෂාෆ් මීට සම්බන්ධව ඇති නිසා මෙම කරුණු පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය භාර්ය තුළට ඇතුලත් වේ.

ඉහත කරුණු අල්ලස් කොමිසම වෙත යොමු කිරීමට නිර්දේශ කර ඇති අතර, කලින් සඳහන් කළ කාරණයට අමතරව අවශ්‍ය කරුණු හා විමර්ශන පැවැත්වීම සඳහා මෙම කරුණු දෙකම පොලිසියට යොමු කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

### 3 රාසික් රෆයිඩීන් නොහොත් අබ්දුල් රාසික් මහතා

1983 ජූලි 7 වන දින උපත ලද ඔහු පළමු වසරේ සිට සාමාන්‍ය පෙළ විභාගය දක්වා මරදාන සහිරා විද්‍යාලයෙන්ද පසුව රාජකීය විද්‍යාලයෙන්ද අධ්‍යාපනය ලැබීය. පසුව ඔහු කැළණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් සහ AAT පාඨමාලාවක් හැදෑරීය.

ඔහු 2010 මාර්තු 24 වන දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයේ ලේකම්වරයා ලෙස කටයුතු කළේය. 2005 දී ශ්‍රී ලංකා තවුහිද් ජමාත් හා සම්බන්ධ වන තෙක් 2001 සිට 2005 දක්වා ඔහු සමස්ත ලංකා ජමියතුල් උලමා සභාවෙහි සාමාජිකයෙක් ලෙස කටයුතු කළේ ය.

2009 දී පමණ හෙතෙම අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බව හා වෙනත් ආකාරයකින් සිතන ඕනෑම පුද්ගලයෙකුට ප්‍රසිද්ධ විවාදයක් සඳහා අභියෝග කරන බව පවසමින් සිංහල භාෂාවෙන් අත් පත්‍රිකා බෙදා හැරියේ ය.

2014 මැයි 6 වන දින ඔහු බෞද්ධයන්ගේ ත්‍රිවිධරත්නය මැණික් ගල් තුනකට සමාන කළ අතර එවැනි මැණික් ගල්වලට වන්දනාමාන කිරීමෙන් කිසිවෙකුට සහනයක් ලබා ගත හැකි දැයි ප්‍රශ්න කළේය. බුදුරජාණන් වහන්සේ මිනිස් මාංශ අනුභව කළ බව ඔහු තවදුරටත් කියා සිටියේය. මෙම ප්‍රකාශයට පදනම් කර ගනිමින් ඔහුට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 7467/1/14 දරන අපරාධ නඩුව පවරා ඇත. නමුත් තවමත් ඊට අදාලව කිසිදු චෝදනාවක් ගොනු කර නොමැත. මෙම ගොනුව කලකට පෙර නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

2017 නොවැම්බර් 12 වන දින කාත්තන්කුඩියේ හිස්බුල්ලා ශාලාවේදී ශ්‍රී ලංකා තවුහිද් ජමාත් නායක මොහොමඩ් ජාසීන්ගේ අනුග්‍රහයෙන් රැස්වීමක් පැවැත්වූ අතර එහිදී අබ්දුල් රාසික් දේශනයක් පැවැත්වීය. පූනානිහි ඉදිවන මඩකලපු විශ්වවිද්‍යාලයට පක්ෂපාතීව ඔහු අදහස් පල කලේ ය. රවුෆ් හකීම් මහතා විසින් තමන් මුස්ලිම් ජාතිකයෙකු වන බව අමතක කර ඉංග්‍රීසියෙන් කතා කිරීම ඔහුගේ විවේචනයට ලක්විය. පළාත් පාලන හා පළාත් සභා මැතිවරණවලදී 20%ක කාන්තා නියෝජනයක් ලබා දීමේ යෝජනා ඔහු විවේචනය කළ අතර එය ඔහුට අනුව මුස්ලිම් පක්ෂ හා මුස්ලිම් ප්‍රජාවට අහිතකර ය. ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව මඟින් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දීම නවතා දමා මේ රට බහු ආගමික රටක් බවට පිළිගත යුතු බව ඔහු තවදුරටත් පැවසීය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සිංහලයාට පළමු ස්ථානය ද දෙවන ස්ථානය දෙමළාට ද ලබා දී ඇති බව ඔහු තවදුරටත් කියා සිටියේය.

2017 දී දෙහිවල ජයසිංහ ශාලාවේ පැවති දේශනයකදී අබ්දුල් රාසික් ප්‍රකාශ කළේ අයිඑස් යනු ඉස්ලාමය බවයි.

සාරා ඉස්ලාම් ආගමට බඳවා ගැනීමට හේතු වූයේ ඔහු ය. මන්දයත් ඔහුගේ සංවිධානය ඉස්ලාම් ආගමට බැඳීමට කැමති ඕනෑම පුද්ගලයෙකුට ඒ සඳහා සහාය වන බවට ප්‍රසිද්ධියක් ලබා දී ඇත. සාරා මෙම සංවිධානයේ සබැඳිය අන්තර්ජාලය හරහා සොයාගෙන ඔහු සමඟ සම්බන්ධ වී ඇත. ඔහු ඇයට මඩකලපුව වෙත පැමිණෙන ලෙස උපදෙස් දුන් අතර ඇයව එතැන් සිට ශ්‍රී ලංකා තව්හීද් ජමාත් සාමාජිකයින් දෙදෙනෙකු විසින් ඇයව පුත්තලම හරහා කොළඹට රැගෙන එන ලදි.

රාසික් සාරා සමඟ විවාහ වීමට හස්තුන්ව තෝරාගෙන ඇති බව පෙනේ. එම විවාහයට මහර් සපයන ලද්දේ රාසික් විසින් බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත සාක්ෂි ඉදිරිපත් වී ඇත.

ෂරියා නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා අබ්දුල් රාසික්ගේ නායකත්වයෙන් කොළඹ පැවති උද්ඝෝෂණයක සාක්ෂි පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ලැබී ඇත.

ඔහු මවුලවිවරයෙකු නොවන බව පිළිගෙන ඇතත්, ඔහු විසින් ශුද්ධ වූ අල් කුර්ආනයේ පරිවර්තනයක් ප්‍රකාශයට පත් කර තිබේ.

**4.** මොහොමඩ් ෆාරුක් මොහොමඩ් ෂිබ්ලි මහතා

ඔහු කාත්තන්කුඩිහිදී උපත ලැබූ අතර එහි සාමාන්‍ය පෙළ විභාග දක්වා අධ්‍යාපනය ලැබීය. ඉන්පසු ඔහු මාතලේ සහිරා විද්‍යාලයට ගොස් උසස් පෙළ විභාගයට පෙනී සිටියේ ය.ඔහු වෘත්තියෙන් ඉංජිනේරුවෙකි.

2012 දී ඔහු දේශපාලනයට අවතීර්ණ වී මඩකලපුව දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පළාත් සභාවට තේරී පත්වී 2017 වන තෙක් එහි කටයුතු කලේ ය. ඔහුට අනුව ඔහුට සහරාන් සහ රිල්වාන් ගැන හඳුනා ගැනීමට ලැබෙන්නේ ඔහු 2012 දී දේශපාලනයට පිවිසීමෙන් පසුව සහ බොහෝ විට 2015 දී පමණ ය.

එම වශයෙන් 2017 මාර්තු දක්වා ඔහු සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සමඟ සමීප ඇසුරක් පැවැත්වූ බවට සාක්ෂි ඇත.

2016 මාර්තු 4 වන දින සහරාන් විසින් ෂියා නිකායෙන් මුස්ලිම්වරුන්ට සිදුවී ඇති හානිය පිළිබඳව වාලච්චේනෙයි ප්‍රදේශයේ මීරාඩ් හන්දියේදී වැඩසටහනක් පැවැත්වූ බව පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි වලින් පෙනී යයි. ඔහු ෂියා නිකායේ ක්‍රියාකාරකම් කිහිපයක් විවේචනය කළේය. මුලදී වාලච්චේන පොලිසිය ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලබා දුන්නේ නැත. නමුත් ෂිබ්ලි ෆාරුක් මහතාගේ මැදිහත් වීමෙන් පසුව එම අවසරය ලබා දෙන ලදී.

තවද මීට පෙර 2014 හෝ 2015 දී පමණ ඔහු රැස්වීම් පැවැත්වීම සඳහා පොලිසියේ අවසරය ලබා දීමට කටයුතු කරමින් සහරාන්ට උදව් කළේය. 2016 දී සහරාන්ගේ දුරකථන අංකයෙන් ලැබුණු ඇමතුම් සම්බන්ධයෙන් රහස් පොලිසිය ඔහුගෙන් ප්‍රශ්න කළ අතර ඒ බව ඔහුගේ ඇමතුම් වාර්තාවලින් ද තහවුරු වේ.

2017 මාර්තු 10 වන දින අලියාර් මං සන්ධියේදී සිදුවූ සිද්ධියට සම්බන්ධ ජාතික තවුහිද් ජමාත්හි සාමාජිකයෙකු වන ආමි මොහිදීන් සමඟ ෆාරුක් මහතා පෙනී සිටි ඡායාරූප පිළිබඳ සාක්ෂි පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ලැබුණි. ඔවුන් දෙදෙනා අතර ආරවුලක් විසඳීම සඳහා හිස්බුල්ලා මහතා සහ ෂිබ්ලි ෆාරුක් මහතා කළ ඉල්ලීමට සහරාන් මැදිහත් වූ බවට සාක්ෂි පවතී. එය ජාතික තවුහිද් ජමාත් දේවස්ථානයේදී සිදු කරන ලදී. දෙපාර්ශවයේ නියෝජිතයින් පස් දෙනෙකු මෙම ක්‍රියාවලියට සහභාගී වූහ.

2015 මහ මැතිවරණයෙන් පසුව ෆාරුක් මහතා හිස්බුල්ලා මහතාගේ ආධාරකරුවන් විසින් රිල්වාන්ට පහරදීමෙන් පසු ඔහුගේ සැප දුක් සොයා බැලීමට රෝහලට ගිය බවට සාක්ෂි

පවතියි. ඔහු තමා රිල්වාන් බැලීමට විශේෂයෙන්ම රෝහලට පැමිණීම සිදු නොවූ බවටද ගර්භනී කාන්තාවක් බැලීම සඳහා රෝහලට පැමිණි අවස්ථාවේදී රිල්වාන්වද හමුවූ බවද සාක්ෂි දීමට උත්සාහ කළේය. එහෙත්, රවුෆ් හකීම් මහතා සමඟ ඔහු කෙලින්ම රිල්වාන් බැලීමට ගිය බව පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි මඟින් පැහැදිලි වේ.

සහරාන් සහ ජාතික තවුහිද් ජමාත් සංවිධානය අවම වශයෙන් 2017 මාර්තු දක්වා ෆාරුක් මහතාගේ දේශපාලන අනුග්‍රහය ලබා ගත් බව සාක්ෂි වලින් හෙළි වේ.

5. වෛද්‍ය මුහම්මද් සුෆියන් මුහමාඩ් සාෆ්රාස්

වෛද්‍ය සාෆ්රාස් කල්මුනේහි උපත ලැබූ අතර මරුතමුනෙයි අල්මනාර් මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා යාපනය විශ්ව විද්‍යාලයට ඇතුළත් වී **2012** මාර්තු මාසයේදී වෛද්‍ය (MBBS) උපාධිය ලබා ගත්තේය. ඉන්පසු ඔහු රාජ්‍ය සේවයට බැඳී රටේ විවිධ ප්‍රදේශවල සේවය කළේය.

**2015** දී එම්.ඩී. සර්ජරි පළමුවන කොටස සමත් වූ ඔහු පසුව ශල්‍යකර්ම පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළත් විය. විකලාංග ශල්‍යකර්ම පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු වීමට තීරණය කළ ඔහු **2019** පෙබරවාරි මාසයේදී විකලාංග වෛද්‍ය විද්‍යාව පිළිබඳ එම්.ඩී උපාධිය ලබාගෙන ස්වකීය කණ්ඩායමේ ප්‍රථමයා ලෙස රන් පදක්කම දිනා ගත්තේ ය.

වෛද්‍ය සාෆ්රාස් **2017** අප්‍රේල් **1** වන දින කොළඹ ජාතික රෝහලේ ප්ලාස්ටික් සැත්කම් ඒකකයට අනුයුක්තව සේවය කිරීමට පටන් ගත්තේ ය. **2018** අගෝස්තු **27** වන දින අළුයම **1.30** ට පමණ ඔහුට මොහොමඩ් අලිමාර් මාර්සූක් රිලාගෙන් ඇමතුමක් ලැබුණි. ඔවුන් දෙදෙනා මරුතමුනෙයි අල්මනාර් මධ්‍ය මහාවිද්‍යාලයේ එකට ඉගෙනුම ලබමින් සිටි කිට්ටු මිතුරන් යැයි කියනු ලැබේ. ඔහු වෛද්‍යවරයාගෙන් විමසා සිට ඇත්තේ තමා හඳුනන පුද්ගලයෙකු ගෑස් සිලින්ඩරයක් පිපිරීමෙන් තුවාල සිදුවී ඇති බවත් මේ ආකාරයේ තුවාල සඳහා ලබා දිය හැකි ප්‍රථමාධාර කවරක්ද වන බවයි. රිලා ඒ වන විට සෞදි අරාබියේ සිටි අතර තුවාල ලැබූ පුද්ගලයා ශ්‍රී ලංකාවේ සිටින බව වෛද්‍ය සාෆ්රාස්ට දන්වා

දුටුවේය. මෙම රෝගියා මොහොමඩ් සහරාන්ගේ සහෝදරයා වන මොහොමඩ් රිල්වාන් වන අතර ඔහු පුපුරණ ද්‍රව්‍ය කිහිපයක් පරීක්ෂා කිරීමේදී තුවාල ලබා ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ සාක්ෂි අනුව පැහැදිලි වේ.

වෛද්‍ය සල්රාස් රෝගියාගේ ඡායාරූප කිහිපයක් ඉල්ලා සිටි විට , ඔහුට එම ඡායාරූප වට්ස්ඇප් හරහා හිමිවූ අතර එම අංකය කඩුරුවෙල, මක්කිකම්පිටියේ 4/4 හි පදිංචි අයි.එම්. ජෙෆ්රි නමැත්තෙකුගේ නමින් ලියාපදිංචි කර තිබුණි. රෝගියාට පිළිස්සුම් තුවාල සිදුවී ඇති බවත් රෝගියා දැඩි අසනීපයෙන් සිටින බවත් මුහුණ සහ අත් කළු වී ඇති බවත් වෛද්‍යවරයා නිරීක්ෂණය කළේය. රෝගියාගේ ජීවිතය අනතුරේ පවතින බව වටහා ගත් ඔහු රෝගියා රෝහලකට ගෙන යන ලෙස උපදෙස් දුන් අතර, මේ ආකාරයේ තුවාල ලැබූවන්ට නවීන ප්‍රතිකාර ලබා දීම සඳහා මඩකලපුව, මහනුවර හෝ කොළඹ ජාතික රෝහල් වැනි රෝහල් පිළිබඳව තොරතුරු  ලබා දුන්නේය. මෙම කාල පරිච්ඡේදය තුළදී වෛද්‍ය සාෆ්රාස්ට මෙම දේශිය අංකයෙන් අවම වශයෙන් ඇමතුම් තුනක් සහ රිලාගෙන් තවත් ඇමතුමක් ලැබුණි. අදාල ඇමතුමේ ඇමතුම් කාලය මිනිත්තු අටක් පමණ වූ අතර කෙතරම් සංවාදවල යෙදුණද රෝගියාට තුවාල සිදුවූ ස්ථානය තමාට පැවසූ බව වෛද්‍යවරයා ප්‍රතික්ෂේප කළේය.

2018 අගෝස්තු මස 27 වන දින කොළඹ ජාතික රෝහලේ සේවය කරමින් සිටියදී වෛද්‍ය සාෆ්රාස්ට දේශීය අංකයකින්  ඇමතුමක් ලැබුනු අතර එය උදේ 4.55ට ඔහුව ඇමතීමට සහ උදෑසන 4.55 ට ඔහු වෙත පණිවිඩයක් යවන ලද පළමු දේශීය අංකයෙන්ම ය. මෙම ඇමතුම එදිනම උදේ 9.31 ට ලබා ගන්නා ලදී. එදිනම 13.42 ට පමණ එම්.අයි. ෂාහිඩ් යන නාමයෙන් රිල්වාන් හදිසි ප්‍රතිකාර සඳහා ජාතික රෝහලට ඇතුළත් කළ නමුත් ප්‍රතිකාර අතරතුර වෛද්‍ය සාෆ්රාස් අවස්ථා දෙකකදී ඔහුව දුටුවේය. වරක්,79 වන වාට්ටුවේ ස්නායු කම්පන ඒටීයූහිදි වන අතර තවත් වරක් 79 වන වාට්ටුවේදීමය.  ඔහු එකල මෙම අංශවල වැඩ නොකළන ලද බව ද සැලකිය යුතු ය. වෛද්‍ය සාෆ්රාස් ජාතික රෝහලට ඇතුළත් කරන අවස්ථාවේ රිල්වාන් සමඟ පැමිණි පුද්ගලයෙකු හෝ පුද්ගලයන්

කිහිප දෙනෙකු සමඟ සම්බන්ධතා පැවැත්වූ බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති සාක්ෂිවලින් පෙනී යයි.

2018 දෙසැම්බරයේ දී රීලා සහරාන් සහ රිල්වාන් ඇතුළු තවත් සිව් දෙනෙකු සමඟ කොළඹ පිහිටි වෛද්‍ය සෆ්රාස්ගේ නිවසට පැමිණ ඔහුව හමුවිය. ඔහු සහරාන් මවුලවි ලෙසත් රිල්වාන් ඔහුගේ සහෝදරයා ලෙසත් හඳුන්වා දී තිබේ. මෙම ගමන ප්‍රතිකාර සඳහා එම වෛද්‍යවරයා ලබා දුන් සහයෝගයට ස්තුතිවන්ත වීමට පැමිණි බව පැවසූ අතර වෛද්‍ය සාෆ්රාස් සහරාන් සහ රිල්වාන් හමු වූ පළමු හා අවසාන අවස්ථාව මෙය බව පැවසේ. කෙසේ වෙතත් රීලා නොහොත් අබු ලිබාන්ඩ් සහරාන් ප්‍රතිකාර සඳහා කටයුතු සම්පාදනය කරන ලද වෛද්‍යවරයාට රුපියල් ලක්ෂ 2 1/2 ක් ගෙවීමට සිදුවන බව පැවසූ බවට සාක්ෂි හමු වී තිබේ. ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව සහරාන් එම මුදල් ලබා දී ඇති බව ප්‍රකාශ කර තිබේ.

වෛද්‍ය සාෆ්රාස්ට අනුව 2019 අප්‍රේල් 21 වන දින ප්‍රහාරයෙන් සතියකට පමණ පසු ඔහු විසින් උපකාර කරන ලද පුද්ගලයින්ගේ අනන්‍යතාවය දැන ගන්නා ලදී. ඉන්පසු ඔහු මොහොමඩ් රිලාගේ මිතුරා ලෙස දුරකථනයේ සටහන් කොටගත් (save) දේශීය අංකය මකා දැමූ නමුත් නීති උපදෙස් ලබා නොගැනීමට හෝ තමා සතුව පවතින පුද්ගලික තොරතුරු පොලීසියට ඉදිරිපත් නොකිරීමට අවසානයේදි තීරණය කළේය.

වෛද්‍ය සාෆ්රාස්ගේ සාක්ෂිවල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් අවධානය යොමු කළ අංශ කිහිපයක් තිබේ. රෝගියාගේ ඇඳ ඉහපත් වාර්තාවට රෝගියා විසින් ලබා දී ඇති පරිදි රෝග ඉතිහාසය ඇතුළත් කිරීමට ඉඩකඩ තිබේ. උක්ත සිද්ධියේදී ගෑස් සිලින්ඩර පිපිරීමක් හේතුවෙන් තුවාල සිදුවී ඇති බව සඳහන් වන නමුත් හදිසි ප්‍රතිකාර ඒකකයේ රෝගියා පරීක්ෂා කළ වෛද්‍ය වන්දන විසින් රෝග ඉතිහාසය පිළිබඳව ප්‍රශ්නාර්ථ ලකුණක් තබා ඇත්තේ තුවාල සිදුවී ඇති බව මුළුමනින්ම ඒත්තු නොයන බව නිසාවෙන් මෙන්ම ලබා දී ඇති රෝග ඉතිහාසය සිදුවූ තුවාල හා සමපාත නොවන හෙයින් මෙම සිදුවීම පිළිබඳව පොලීසියට දැනුම් දිය යුතු බවට ද පිටසන් කිරීමක් ලබා දෙන ලදී.

ඇද ඉහපත් වාර්තාව පරීක්ෂා කිරීමෙන් මෙම ප්‍රකාශ පහසුවෙන් නොසලකා හැරිය නොහැකි බව වෛද්‍ය සාෆ්රාස් පිළිගත්තේය. විශේෂඥ සාක්ෂි ලබා දෙමින් කොළඹ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි වෛද්‍ය අජිත් තෙන්නකෝන් සාක්ෂි දෙමින් කියා සිටියේ රෝගියාගේ තුවාල ගෑස් සිලින්ඩර් පිපිරුමකට අනුකූල නොවන බවත් පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීමේදී සිදු වූ පිපිරීමක් හේතුවෙන් ඇති වූ තුවාල වලට වඩාත් සමානවන බවත් ය. වෛද්‍ය සෆ්රාස්ගේ දුරකථනයට වට්ස්ඇප් හරහා එවන ලද තුවාල ලැබූ පුද්ගලයාගේ පින්තූර ඔහුගේ දුරකථනයේ තිබී හමු නොවීය. 2019 මාර්තු 6 සිට 16 දක්වා ඔහු සෞදි අරාබියේ සිටියදී වට්ස්ඇප් අස්ථාපනය කර ඇති බව වෛද්‍ය සාෆ්රාස් සාක්ෂි දුන්නේය. කෙසේ වෙතත්, ඔහුගේ දුරකථනයේ අයි ක්ලවුඩ්, ඩ්‍රොප් බොක්ස් වැනි උපස්ථ පැවති බවත් මාර්තු 16 වෙනිදා ඔහු වට්ස්ඇප් යෙදවුම අස්ථාපනය කළද ඉතා ඉක්මනින්ම එය නැවත ස්ථාපනය (reinstall) කර ඇති බව රහස් පොලිසිය විසින් සකස් කරන ලද දුරකථන විශ්ලේෂණ වාර්තාවෙන් පැහැදිලි වේ.

මෙම සිදුවීමට සම්බන්ධ පසු කලෙක සෞදි අරාබියේදී අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට ගෙන එන ලද මොහොමඩ් අලියර් මාසුක් රිලා පිළිබඳව බලධාරීන් දැනුවත් කිරීමට ඔහු අපොහොසත් වූයේ මන්ද යන ප්‍රශ්නය ද මෙහිදී උද්ගත වේ. වෛද්‍ය සාෆ්රාස් සිය පාසල් කාලයේ දී ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමිහි සාමාජිකයෙකු වූ බවට සාක්ෂි ද ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 5 වන වගන්තියට ප්‍රකාරව තොරතුරු ලබා දීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් මොහුට විරුද්ධව අපරාධ නඩු පැවරීමේ හැකියාව නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

6. එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා

ඔහු වරෙක රජයේ ඇමතිවරයෙකු මෙන්ම නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයෙක් ද විය.

ඔහු කාත්තන්කුඩිය අරාබිකරණයෙහි ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. මෙම තත්වය කාත්තන්කුඩි වෙත සුවිශේෂීත්වයක් කාවැද්දීමට දායක වූ එක් සාධකයකි. වහාබි ආකාරය ඉස්ලාම් දහම පිළිපැදීමේ නිසි ක්‍රමය බව ඔහුගේ සාක්ෂිය විය.

2015 මහ මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයින් සඳහා සහරාන් සහ ජාතික තවුහිද් ජමාත් විසින් යෝජනා කරන ලද කොන්දේසිවලට ඔහු එකඟ විය. පසුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජාතික ලැයිස්තුවට ඔහු පත් කිරීම ගැන සහරාන් විරුද්ධ විය.

හිරා පදනම පිහිටුවීමට සම්බන්ධ වූ ඇඩම් ලෙබ්බෙ මොහම්මදු මුම්තාස් හිස්බුල්ලා මහතාගේ සමීපතමයෙකි. මුම්තාස් මහතා තවුහිද් අනුගාමිකයෙකු වූ අතර අයිඑස් දෘෂ්ටිවාදයේ ආධාරකරුවෙකු ලෙස ද ප්‍රකටව සිටි අයෙකි. 2019 අප්‍රේල් 21 වන දින පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ඉක්බිතිව 2019 අප්‍රේල් 21 රාත්‍රියේ පාසිකුඩාහි හෝටලයක සිට හිස්බුල්ලා මහතා සමඟ පිටතට යන අය අතර ඔහුද සිටින අයුරු දක්නට ලැබේ.

ඉන්දියාවේ සහ බංගලාදේශයේ තහනම් කර ඇති අන්තවාදී දේශකයෙකු සහ peace රූපවාහිනියේ හිමිකරු වන ආචාර්ය සකීර්නායික් සමඟ හිස්බුල්ලා මහතා එකම වේදිකාවේ සිටි අයුරු පිළිබඳව ද සාක්ෂි තිබේ.

කාත්තන්කුඩියේ හරුන් මවුලවී හිස්බුල්ලා මහතාගේ සමීපතම හිතවතෙකු බවට[1] ද සාක්ෂි ඇත. හරුන් මවුලවී යනු කාත්තන්කුඩියේ අයිඑස් ධජ රැගෙන යමින් විරෝධතාවක් සංවිධානය කළ අයෙකි .[2]

හිස්බුල්ලා මහතා ඇතැම් විට ප්‍රචණ්ඩ අන්තවාදී ක්‍රියා ගැන කතා කර ඇත. 2016 දී ඔහු පාර්ලිමේන්තුවේදී කතාවක් සිදු කළ අතර එම අන්තවාදය ඔහු විසින් පිළිගනිමින් ඔහු ප්‍රකාශ කරන්නේ ඉස්ලාම් දහම පිළිපැදීමට ඔවුන්ට ඉඩක් නොමැති අවස්ථාවක ඔවුන් යුද්ධ කරන බවත් මෙය ඔවුන්ගේ ආගම[3] බවත්ය.

[1] Exhibit C-943
[2] Exhibit C-944
[3] Exhibit C-1353

2017 නොවැම්බර් 08 වන දින ඔහු පාර්ලිමේන්තුවේදී තවත් කතාවක් පැවැත්වූයේ රටේ උතුරු හා නැගෙනහිර එක් පළාතක් බවට පත් කරන්නේ නම් මුස්ලිම් තරුණයින් අවි අතට ගන්නා බවත් රට පුරා රුධිර ගංගා ගලා යනු ඇති බවත්ය.

ඔහු කාත්තන්කුඩියේ ජුම්මා මුස්ලිම් දේවස්ථානයේදී දේශනයක් පවත්වමින් අවධාරණය කර සිටියේ මුස්ලිම්වරු මේ රටේ සුළුතරයක් පමණක් වන නමුත් ගෝලීය වශයෙන් බහුතරයක් වන අතර ඔවුන්ව යටත් කර ගත හැකි යැයි කිසිවෙකු නොසිතිය යුතු බවත් ය.

හිස්බුල්ලා මහතාගේ ක්‍රියා කලාපය කාත්තන්කුඩි තුළ අන්තවාදය ව්‍යාප්ත කිරීමට පහසුකම් සපයන බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

23 වන පරිච්ඡේදය

## ප්‍රතිත්‍රස්ත නීතිය

සෑම පුරවැසියෙකුගේම ආරක්ෂාව සහතික කිරීම සෑම රාජ්‍යයකම මූලික යුතුකමකි. Salu Salus populi suprema est lex ජනතාවගේ ආරක්ෂාව උත්තරීතර නීතියයි යන නෛතික ආප්තය තුලින් ද උක්ත කරුණ අවධාරණය කරයි. ගෝලීය ත්‍රස්තවාදය වර්ධනය වීම හේතුවෙන් නූතනයේ මෙම වගකීමට වැඩි වැදගත්කමක් හිමිව තිබේ. නූතන ත්‍රස්තවාදයට ආගම, ජනවාර්ගිකත්වය, වර්ණය ඇතුලු වෙනත් ආකාරයේ මුහුණුවරවල් තිබේ. එය සයිබර් අවකාශය ඇතුළු බොහෝ අවකාශයන් භාවිතා කරයි. ත්‍රස්තවාදයේ තර්ජනය මැඩපැවැත්වීමේදී රාජ්‍යයන් මුහුණ දෙන අභියෝග මේ අනුව ඉහළ ගොස් තිබේ.

ත්‍රස්තවාදය කොටස් තුනකට බෙදිය හැකිය:

1. ජාත්‍යන්තර ත්‍රස්තවාදය

2. දේශීය ත්‍රස්තවාදය

3. අන්තර්ජාතික ත්‍රස්තවාදය

2019 අප්‍රේල් 21 දින පාස්කු ප්‍රහාරයේ අරමුණ වූයේ අයිඑස්හි දෘෂ්ටිවාදය හා ක්‍රියාවන් මත පදනම් වූ ත්‍රස්ත ක්‍රියාවක් සිදු කිරීමයි. මෙම ප්‍රහාරයට සම්බන්ධ සමහර පුද්ගලයින්ට විදේශ පුහුණුව ලබා දී තිබුණි. මෙම ප්‍රහාරයන්ට හේතු වූ සහරාන්ගේ වාර්තා ගත ප්‍රකාශයට අනුව ත්‍රස්ත ක්‍රියාව සඳහා මූලික හේතුවක් වූයේ ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීමයි. එබැවින් සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විසින් සිදු කරන ලද පාස්කු ඉරිදා ප්‍රහාරය ජාත්‍යන්තර හා දේශීය ත්‍රස්තවාදය යන දෙකෙහි එකතුවක් ලෙස සැලකිය හැකිය.

ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ සියලු ක්‍රියාවන්ට එරෙහිව ඵලදායී ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකාව විදේශ රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය. මෙවැනි ත්‍රස්ත ක්‍රියා වැළැක්වීම සඳහා විදේශ රටවල් ගෙන ඇති පියවර සලකා බැලීමෙන් පසු

ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කිරීම සඳහා නීතිමය ක්‍රියා පටිපාටින් අනුගමනය කළ යුතු වේ. 2001 සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් පසුව ලෝකය ත්‍රස්තවාදය දෙස බැලූ ආකාරය විශාල ලෙස වෙනස් විය. 2000 අප්‍රේල් 17 දින එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මැඩලීන් ඇල්බ්‍රයිට් මෙසේ පැවසීය.

මත්ද්‍රව්‍ය සමඟ සටන් කිරීමේ නාමයෙන් ගනු ලබන කිසිදු ක්‍රියාමාර්ගයකට සහ මත්ද්‍රව්‍ය හා ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම හෝ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම යන තවර හෝ ක්‍රියාමාර්ගයන්ට එක්සත් ජනපදය සහාය නොදක්වයි. ප්‍රචණ්ඩකාරී තර්ජනයන්ට මුහුණ දෙන රජයකට ඇති භයානක පෙළඹවීම්වලින් එකක් වන්නේ අහිංසක පුරවැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන දැඩි ලෙස ප්‍රතිචාර දැක්වීමයි. ත්‍රස්තවාදය සාපරාධී ක්‍රියාවක් වන අතර එය ඊට අනුව කටයුතු කළ යුතු ය. එයින් අදහස් කරන්නේ නීතිය සාධාරණව හා ස්ථාවරව ක්‍රියාත්මක කිරීමයි. ත්‍රස්තවාදී තර්ජන පරාජය කිරීමට ඇති හොඳම ක්‍රමය නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වැඩි දියුණු කරන අතරම ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම බව ලොව පුරා අත්දැකීම් තුළින් අපි සොයාගෙන ඇත්තෙමු.

9/11 ප්‍රහාරයෙන් ඉක්බිතිව, එක්සත් ජනපද කොංග්‍රසය විසින් 2001 සැප්තැම්බර් 18 දින "2001 සැප්තැම්බර් 11 වන දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයන්ට සැලසුම් කිරීම, බලය පැවරීම, හෝ ආධාර කිරීම සිදු කරන ලද සංවිධාන හෝ පුද්ගලයින්ට රැකවරණය සැපයීම වැළැක්වීම සඳහා එම ජාතීන්ට, සංවිධානවලට හෝ පුද්ගලයන්ට එරෙහිව අවශ්‍ය සහ සුදුසු සියලු බලවේග භාවිතා කිරීමටත් එවැනි ජාතීන්, සංවිධාන හෝ පුද්ගලයින් විසින් එක්සත් ජනපදය විෂයහි සිදු කල හැකි අනාගත ජාත්‍යන්තර ත්‍රස්ත ක්‍රියාවන් වැළැක්වීම සඳහා ඔහු (එක්සත් ජනපද ජනාධිපති) විසින් සුදුසු හා අවශ්‍ය යැයි කල්පනා කරන ඕනෑම පියවරක් ගැනීමේ බලය පවරමින් යෝජනාවක් සම්මත කරන ලදී.

බ්‍රිතාන්‍යයේ හිටපු අග්‍රාමාත්‍ය ටෝනි බ්ලෙයාර් කියා සිටියේ සිවිල් නිදහසට මූල් තැන දීම භයානක වැරදි විනිශ්චයක් බවයි.[1]

ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම විසින් 2004 දී ජර්මනියේ බර්ලින් හිදී "මානව හිමිකම් තහවුරු කිරීම සහ නීතියේ ආදිපත්‍ය තහවුරු කිරීම මඟින් ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම පිළිබඳ ප්‍රකාශයක්" නිකුත් කළේය. මෙහිදී වැඩි දුරටත් ප්‍රකාශ වූයේ ත්‍රස්තවාදය මැඩලීම සඳහා සෑම රාජ්‍යයක් විසින්ම මූලධර්ම 11ක් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළ යුතු බවයි. පළමු මූලධර්මය මඟින් ප්‍රකාශ කරන ලද්දේ සියලු රාජ්‍යයන්ට තම බල සීමාව තුළ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස ගරු කිරීමට හා සහතික කිරීමට බැඳීමක් ඇති බවත් එවැනි පුද්ගලයින් ත්‍රස්තවාදී ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතු බවත්ය. ත්‍රස්තවාදයට එරෙහි පියවරයන් ගැනීමේදී, නීත්‍යානුකූලභාවය, අවශ්‍යතාවය, සමානුපාතිකත්වය සහ වෙනස් කොට නොසැලකීම යන මූලධර්ම සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලක් දැක්විය යුතු බව එහි සඳහන් විය.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ත්‍රස්ත මර්දන නීතිය 1979 තරම් ඈත අතීතයේ සිට බලාත්මක වූ අතර එය ද තාවකාලික පදනමක් මත ක්‍රියාත්මක කිරීමට අදහස් කරන ලද්දකි. ත්‍රස්තවාදය ඵලදායී ලෙස මර්දනය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් බල ගැන්වීම සඳහා නව ත්‍රස්ත මර්දන නීතියක් පැනවීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී.

ත්‍රස්තවාදයට එරෙහි වීමට නීති සම්පාදනය කිරීමට පෙර ත්‍රස්තවාදය ඇතිවීමට හේතු සාධක පිළිබඳව අප විසින් දැනුවත්වී සිටීම වැදගත් ය. ලොව පුරා ත්‍රස්තවාදය ව්‍යාප්ත වීමට ප්‍රධාන හේතුව වන්නේ ජාතිකත්වයන් සහ ආගම් සම්බන්ධයෙන් සමාජයේ ජනතාව අතර ඇති නොගැලපීමයි. තවත් හේතුවක් වන්නේ එකිනෙකාට ගරු නොකරමින් වුවද පොදු මහජන ක්‍රියාකාරිත්වයේ කොටසක් ලෙස ඇතැම් පිරිස් කටයුතු කිරීමට උත්සාහ දැරීමයි.

[1] 27 May 2007, Sunday Times

ත්‍රස්ත මර්දන නීති ඵලදායී විය යුතුය. එමෙන්ම දැඩි නීති හඳුන්වා දිය යුතුය. මූලික අවධානය යොමු කළ යුත්තේ ත්‍රස්තවාදීන්ගේ පීඩාවන්ගෙන් අහිංසක සිවිල් වැසියන් ආරක්ෂා කිරීම පිළිබඳව ය. ත්‍රස්තවාදීන්ගේ මානව හිමිකම් සඳහා වැඩි වැදගත්කමක් ලබා දීම ත්‍රස්තවාදයට එරෙහි වැයමට බාධාවක් විය හැකිය.

2018 වසරේ කෙටුම්පත් කරන ලද ත්‍රස්ත මර්දන පනත (CTA) (උපගන්ත්‍ර VII) නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් බල ගැන්වීම සහ සැකකාර ත්‍රස්තවාදියාගේ මානව හිමිකම් අතර නිසි සමතුලිතතාවයක් නොමැති බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි අදහසයි. ත්‍රස්තවාදී සැකකරුවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරමින් ත්‍රස්ත මර්දන නීති කෙටුම්පත් කරනු ලැබුවහොත් නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්හට ඔවුන්ගේ පරීක්ෂණ ඵලදායී ලෙස කරගෙන යාමට ඉඩනොලෙබෙනු ඇත. එබැවින් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් සුදුසු හා ඵලදායී ලෙස විමර්ශනය කිරීම වළක්වන ප්‍රතිත්‍රස්ත පනතේ විධිවිධාන ඉවත් කළ යුතුය.

මනුෂ්‍ය ඝාතන වැරදි සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයට අනුව මරණ දඬුවම නියම කළ හැකිය. නමුත් ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම් පතේ මනුෂ්‍යඝාතනයකට දිය හැකි උපරිම දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවම් පැමිණවීමයි. ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත විසින් මරණීය දණ්ඩනය ලබා දී නොමැති බැවින් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වැළැක්වීමට අනුබලයක් නොසපයයි.

රැඳවුම් නියෝගයක් නිකුත් කිරීමට ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත මඟින් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට බලය ලබා දී ඇත. කෙසේ වෙතත්, පොලිස් දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත අනාවරණය වී ඇති හෙයින් එවැනි බලය ආරක්ෂක ලේකම් වෙත ලබා දීම සුදුසුය.

ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පතෙහි ත්‍රස්ත සැකකරුවෙකු රඳවා තබා ගැනීමේ කාලය අඩු කර ඇත. කෙසේ වෙතත් ඵලදායී හා සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා නිර්දේශිත කාල සීමාව ප්‍රමාණවත් නොවේ. ඒ අනුව ත්‍රස්තවාදී සැකකරුවෙකු මාස 6 ක් රඳවා තබා ගැනීමට ඕනෑම අවස්ථාවක රැඳවුම් නියෝග නිකුත් කළ යුතු අතර ඉන් පසුව සෑම මාස

6කට වරක් දීර්ඝ කිරීම සහිතව වසර 2 ක් දක්වා දීර්ඝ කිරීමට නිර්දේශ කෙරේ. එසේ කිරීමේ බලය ආරක්ෂක ලේකම්වරයා වෙත පැවතිය යුතුය. මෙය පුනරුත්ථාපන ක්‍රියාවලියක් සමඟ ඒකාබද්ධ කළ යුතු අතර ත්‍රස්ත සැකකරුට මෙම කාලය තුළ පුනරුත්ථාපන වැඩ පිළිවෙලකට ද සහභාගීවීමට සිදුවනු ඇත. ත්‍රස්ත සැකකරුවෙකු දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීමේ බලය ත්‍රස්ත සැකකරු පුනරුත්ථාපනය කිරීමට උපකාරී වන අතර එය ඕනෑම ත්‍රස්ත ක්‍රියාවක් සඳහා ඔහුගේ සහභාගීත්වය යම් ප්‍රමාණයකට සීමා කරනු ඇත.

රැඳවුම් භාරයේ සිටින ත්‍රස්තවාදී සැකකරුවන් සෑම මසකම අධිකරණ වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ සම්බන්ධ වාර්තාවක් ලබා ගත යුතුය. එම වාර්තාව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

යෝජිත ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත (උපගන්ථ VII) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි නිර්දේශයන් පහත පරිදි වේ.

**1. 4** (අ) වගන්තිය - ජනාධිපති සමාවක් හෝ දඬුවම ලිහිල් කිරීමට හැකියාවක් නොමැතිව මරණ දඬුවම නියම කර ක්‍රියාත්මක කළ යුතුය. දණ්ඩ නීති සංග්‍රහය යටතේ මිනීමැරීම සඳහා මරණීය දණ්ඩනය නියම කළ හැකිය. එබැවින් ත්‍රස්තවාදී ක්‍රියාවලින් සිදුවන ඝාතන සඳහා මරණීය දණ්ඩනය මෙම නීතියෙන් ද නියම කළ යුතුය.

**2. 13** වන වගන්තිය - බලධාරීන්ට තොරතුරු ලබා දීමට අපොහොසත් වීමේ දඬුවම වසර 10 නොඉක්මවිය යුතු අතර දඩ මුදල රු. මිලියනයක් නොඉක්මවිය යුතු ය. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ආරක්ෂක හමුදාවන්ට කඩිනමින් ලබා දීමෙන් එවැනි ක්‍රියාකාරකම් මැඩලීමට පහසුකම් සැලසෙනු ඇත. එබැවින් මෙම තොරතුරු පිළිබඳ දනිමින්ම ආරක්ෂක අංශ වෙත දැනුම් නොදෙන අයටද දඬුවම් පැමිණ වීම ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට උපකාරී වේ. පාස්කු ප්‍රහාරයට පෙර ත්‍රස්ත ක්‍රියාකාරකම් පිළිබඳව ආරක්ෂක අංශ නිසි ලෙස දැනුවත් නොකිරීම හේතුවෙන් ආරක්ෂක හමුදාවන්ට ප්‍රහාරය

වැළැක්වීමට නොහැකි විය. එබැවින් දැනුවත්ව තොරතුරු සඟවා තබන අයට දැඩි දඬුවම් දිය යුතුය.

3. 14 වන වගන්තිය - නීත්‍යානුකූල නියෝගවලට අකීකරු වීමේ දඬුවම වසර 5 දක්වා වැඩි කළ යුතු අතර දඩ මුදල රු. 500,000 / =ක් විය යුතු ය. මෙම පනත යටතේ නියම කර ඇති නීතිමය විධිවිධාන උල්ලංඝනය කිරීම සඳහා නියම කර ඇති වසර 2ක සිර දඬුවම ප්‍රමාණවත් නොවන බැවින් එය වසර 5 දක්වා වැඩි කළ යුතුය.

4. 17 වන වගන්තිය - එම වගන්තිය පොලිස් නිලධාරියෙකු මෙන්ම රේගු හෝ ආගමන විගමන නිලධාරියෙකුටද අත්අඩංගුවට ගැනීම සඳහා බලය පැවරිය යුතුය. මෙම පනත යටතේ වැරදි සිදු කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරනු ලබන්නේ ගුවන්තොටුපලවල සහ වරායවලදී මෙම වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට බලය රේගු සහ ආගමන විගමන නිලධාරීන්ට ලබා දීමෙනි.

5. 19 (2) වගන්තිය - රේගු හෝ ආගමන විගමන නිලධාරියෙකුගේ සහාය ඇතිව සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම සඳහා එය අවකාශ සැලසිය යුතුය. වරාය හා ආගමන හා විගමන නිලධාරීන්ගේ සහාය ඇතිව අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කළ හැකි ය.

6. 20 වන වගන්තිය - එය රේගු හෝ ආගමන විගමන නිලධාරී සඳහා විය යුතුය. රේගු හා ආගමන විගමන නිලධාරීන්ට 20 වන වගන්තිය යටතේ බලතල ලබා දීමෙන් වාහන හා දේපළ පරීක්ෂා කිරීම සහ ලේඛන පරීක්ෂා කිරීම වඩාත් කාර්යක්ෂම වනු ඇත.

7. 25 (ii) (ඈ) උප වගන්තිය - සැකකරුවන්ව අත්අඩංගුවට ගත් නිලධාරියාගේ නාම සහ නිලය ඉවත් කළ යුතුය. පනතේ 1 වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති ලේඛනයක සැකකරුවෙකු අත්අඩංගුවට ගන්නා නිලධාරියෙකුගේ නාම සහ

නිල නාම ඇතුළත් කිරීම එම නිලධාරියාගේ ආරක්ෂාවට තර්ජනයක් වනු ඇත.

**8. 25 (v) (ඇ)** වගන්තිය - සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු කොටසකි.

**9. 27 (v)** වගන්තිය - පහත පරිදි වෙනස් කලයුතුය - පුද්ගලික අතුරු කොටසෙහි අර්ථය වන්නේ කිසිදු පොලිස් නිලධාරියෙකු නොමැති අවස්ථාවක මහේස්ත්‍රාත් නිල කාමරයේ විවෘත අධිකරණයේ මෙන් කටයුතු සිදු කිරීමයි.

**10. 30 (1)** වගන්තිය - උපරිම මාස 12 ක කාල සීමාව සහ තවත් මාස 6 ක් සඳහා මහාධිකරණ විනිසුරුවරයාගෙන් නීතිපති වෙත කරන ලද අයදුම්පතක් සමඟ තවදුරටත් දීර්ඝ කිරීම.

**11. 53** වන වගන්තිය ඉවත් කළ යුතු ය.

**12. 55 (3)** වගන්තිය ඉවත් කළ යුතු ය.

**13. 68 (2) (ආ)** වගන්තිය ඉවත් කළ යුතු ය.

**14. 54 (3) (අ)** වගන්තිය ඉවත් කළ යුතු ය.

**15. 88 (උ)** වගන්තිය - මෙම උප වගන්තිය ඉවත් කළ යුතුය. මෙම විධිවිධානය ත්‍රස්ත සැකකරුවකුට සමාව දීමට අගතියට පත් පාර්ශවයක කැමැත්ත ඇතිව අවසර දෙයි. මෙමගින් අගතියට පත් පාර්ශවයට සැකකරුගේ අනවශ්‍ය බලපෑම් ඇතිවිය හැකි අතර ත්‍රස්ත මර්ධනයට ද බාධා පැමිණිය හැකි ය.

## 24 පරිච්ඡේදය

# අකර්මන්‍ය වූ රජය

ඉස්ලාම් අන්තවාදය මඟින් එල්ල වන තර්ජනය කෙරෙහි රජයේ ප්‍රතිචාරය අකර්මන්‍ය එකක් විය. එහි ක්‍රියාකාරකම් මඟින් පිළිඹිබු වූයේ ජාතික අරාක්ෂාව සම්බන්ධ ගැටළු පිළිබඳ ප්‍රබත්වයක් ලබා දී නොමැති බවයි.

එහි අවධානය වැඩි වශයෙන් යොමු වී ඇත්තේ ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසංධානය ලෙසටයි.

මුස්ලිම් දේශපාලන පක්ෂ විසින් මෙම රජය පිහිටුවීමේ හා පවත්වාගෙන යාමේ දී නිරූපනය කරන කරන ලද වැදගත් භූමිකාව රජය මඟින් IS සංවිධානයෙන් එල්ල වන තර්ජන කෙරෙහි දක්වන ප්‍රතිචාරය හැඩ ගැස්වීමට ඉවහල් වී ඇති බව පෙනී යයි. විමර්ශන කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවන් කිහිපදෙනෙකුගේම සාක්ෂි තුළින් මේ බව මොනට පැහැදිලි වේ.

පසුගිය සියවස් ගණනාව තුළම අභ්‍යන්තර හා බාහිර ප්‍රභවයන්ගෙන් ජාතික ආරක්ෂාවට එල්ල වූ අභියෝග රැසකටම ශ්‍රී ලංකාව මුහුණ දී තිබේ. මේ සඳහා වන හේතු අතර අභ්‍යන්තර මෙන්ම බාහිර කාරණා ද පවතී.

සියවස් කිහිපයක් පුරාම විදෙස් රටවල ආක්‍රමණිකයන් විසින් මෙරට පවතින සම්පත් නිසා මෙන්ම මෙරටේ භූගෝලීය පිහිටීම නිසා ද අප රට ආක්‍රමණය කරන ලදි. වර්ෂ 1971 සහ වර්ෂ 2010 අතර කාලය තුළ රටේ ජාතික ආරක්ෂාව අභ්‍යන්තර කාරණා හේතුවෙන් තර්ජනයන්ට ලක් විය. ඕනෑම රජයකට ජාතික ආරක්ෂාව සෑම විටම අතිශය ප්‍රමුඛත්වයෙහිලා සැලකිය යුතුය යන පාඩම ඉතිහාසය විසින් කියා දෙයි.

වර්ෂ 2015 හා වර්ෂ 2019 කාලවකවානුව තුළ මෙම තත්ත්වය ඒ අයුරින් නොපැවති බව කණගාටුවෙන් වුවද පැවසිය යුතුය. වර්ෂ 2016 වන විට එවකට ජනාධිපති ලෙස කටයුතු කළ සිරිසේන මහතා සහ අගමැති ලෙස කටයුතු කළ වික්‍රමසිංහ මහතා ඇතුළු රජය 2014 වසරේ ජූනි මස 29 වන දින IS සංවිධානය නමින් ප්‍රකාශයට පත් කරන ලද කැලිෆේටයේ

කොටසක් ලෙස ශ්‍රී ලංකාව ද සඳහන්ව තිබූ බව දැන සිටියෝ ය. කැලිෆේට් යන වචනය ( අරාබි භාෂාවෙන් කැලීෆා ලෙස හඳුන්වයි) මගින් හඳුන්වන්නේ කලීෆ්වරයෙකුගේ නායකත්වය සහිතව බිහිවන ඉස්ලාම් රාජ්‍යයක් ලෙසයි. මෙම කලීෆ්වරයා යනු මොහොමඩ් නබි නායකතුමාගෙන් පසු බිහිවන දේශපාලනික හා ආගමික නායක ප්‍රතිරූපය ලෙස ද සමස්ත මුස්ලිම් ලෝකයේ නායකයා ලෙස ද ( උම්මාහ්) හඳුන්වයි. එමෙන්ම වර්ෂ **2014** සහ **2015** අතර කාලය තුළ IS සංවිධානය සමඟ සම්බන්ධ වීම සඳහා ශ්‍රී ලාංකිකයින් තිස් දෙදෙනෙකු පමණ සිරියාව කරා ගොස් ඇති බව ඔවුන් දනිති.

නමුත් මෙම තර්ජනය මැඩපැවැත්වීම සඳහා මනා සම්බන්ධීකරණයකින් යුත් සංවිධිත ප්‍රයත්නයක් සඳහා එතරම් උනන්දුවක් නොවීය. සැබැවින්ම හිටපු හමුදාපති ක්‍රිෂාන්ත ද සිල්වා මහතා සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීම්වලදී ඉදිරිපත් කරන ලද රට තුළ විශේෂයෙන් නැගෙනහිර පළාතේ හිස ඔසවමින් පවතින ඉස්ලාම් අන්තවාදය පිළිබඳ බුද්ධි තොරතුරු ඇතුළත් ඉදිරිපත් කිරීම් වික්‍රමසිංහ මහතා පිළිනොගත් බවයි. අගමැති වික්‍රමසිංහ මහතා “ නෑ නෑ එහෙම වෙන්න බැහැ” යනුවෙන් පවා ප්‍රකාශ කරන තත්ත්වයකට පත් වී ඇත.

නීතිය හා සාමය, දක්ෂිණ සංවර්ධන පිළිබඳ අමාත්‍ය සාගල රත්නායක මහතාගේ අවධානයට ශ්‍රී ලාංකික ජාතිය ඇසුරෙහි හිස ඔසවමින් පැවති IS සංවිධානයේ කටයුතු පිළිබඳව එකල අභියාචනාධිකරණයේ සේවය කළ විනිශ්කාරවරයෙකු වන එම්.එම්.ඒ ගෆූර් විසින් අවධානයට ලක් කළ අවස්ථාවේදීම වඩා හොඳින් අවබෝධ කරගෙන නිසි පියවර ගැනීමට හැකියාව පැවතිණි. ඔහු සාක්ෂි දෙමින් පවසා සිටියේ වර්ෂ **2016** දී පමණ මවක් විසින් තම පුත්‍රයා IS සංවිධානයේ දෘෂ්ඨිවාදයට සහාය දක්වන බව ඔහු වෙත දන්වා සිටි බවයි. ඇය ඒ පිළිබඳ ඔහුගේ සහාය පැතුවාය. ඔහු මිතුරන් කිහිප දෙනෙකුගේ මාර්ගයෙන් අමාත්‍ය සාගල රත්නායක මහතාව සම්බන්ධ කොටගෙන ඔහුව අරලිය ගහ මන්දිරයේ දී හමු වී මේ පිළිබඳ ඔහුගේ අවධානය යොමු කළේ ය. එහි දී විනිශ්චකාර ගෆූර් වෙත අමාත්‍යවරයා විසින් පවසා ඇත්තේ මේ වන විට පැතිර යාම ඉස්ලාම් අන්තවාදය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ ඔවුන් දැනුවත්ව සිටින බවත් අගමැතිවරයාගේ අවධානය ද ඒ

පිළිබඳ යොමු වී ඇති බවත් ය. පාස්කු ප්‍රහාරයෙන් පසුව විනිසුරු ගනූර්හට දැනගන්නට ලැබී ඇත්තේ ඔහුට ඒ පිළිබඳ සඳහන් කළ මවගේ පුත්‍රයා ද අදාළ ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති බවයි. විමර්ශන කොමිසම වෙත ඉදිරිපත් වූ සාක්ෂි වලින් අනාවරණය වූයේ ජනාධිපති සිරිසේන මහතා විසින් ද ඊට සමාන ප්‍රවේශයක් ඉස්ලාම් අන්තවාදය කෙරෙහි ලබාගෙන ඇති බවයි. ජාතික ආරක්ෂක විද්‍යාතනයේ හිටපු අධ්‍යක්ෂ අසංග අබේගුණසේකර මහතා සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ වර්ෂ 2017 මාර්තු හෝ ඊට ආසන්න වකවානුවක දී ඉස්ලාම් අන්තවාදය පිළිබඳව මාතෘකාව රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡා කරන්නට යෙදුණේ, හෙතම රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂකවරයා ද සමඟ ආරක්ෂක අමාත්‍යාංශයේ විශේෂ අමුත්තන් සඳහා වන මැදිරියේ ආරක්ෂක ලේකම්වරයා හමුවීම සඳහා රැඳී සිටින අතරතුර බවයි. එහි දී එවකට ජනාධිපති සිරිසේන මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් පිළිබඳව රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා ඔහු සමඟ පවසා තිබුණි. ඔහු තව දුරටත් සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ එතැන් සිට ඔවුන් අන්තවාදය පිළිබඳ වැඩිදුර කටයුතු සිදු නොකළ බවයි. {රූපය} (2020.09.30 දින විභාග කළ සාක්ෂි පිටු අංක **25, 26** )

සාක්ෂි ලබාදීමට අදාළ මෙම අදියරේ දී රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් එවකට ජනාධිපති ලෙස කටයුතු කළ සිරිසේන මහතා වෙනුවෙන් හෝ පෙනී සිටි නීති උපදේශකවරුන් විසින් අබේගුණසේකර මහතාව ඔවුන්ගේ හරස් ප්‍රශ්න ඇසීමේ වාරයේ දී ප්‍රශ්න කිරීමට ලක් නොකරන ලදි.

සාක්ෂිකරුවන් කිහිපදෙනෙක් සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ මුස්ලිම් දේශපාලන පක්ෂ බොහෝමයක් රජයේ කොටස්කරුවන්ව වී සිටි බැවින් ඉස්ලාම් අන්තවාදය පිළිබඳ කිසිදු ඉදිරිගාමී පියවර ගැනීමට රජය පැකිලීමක් දැක් වූ බවයි. සැබැවින්ම මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 17 දෙනෙකු පමණ පිරිසකගෙන් රජය සමන්විත විය. විදේශීය ආගමික දේශකයින් නාත්‍යාමනයට උත්සහා කිරීම සහ ත්‍රස්ත විමර්ශන අංශය තුළ ඉස්ලාම් අන්තවාදය පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා වෙනමම ඒකකයක් පිහිටුවීම වැනි පියවරයන්

කිහිපයක් ගෙන තිබුණ ද සිදු වූ සිදුවීම් මගින් තහවුරු වූයේ ඒවා ප්‍රමාණවත් නොවන ඒවා බවයි.

සැබැවින්ම රජයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක් ලෙස කටයුතු කළ විජයදාස රාජපක්ෂ මහතා අධිකරණ අමාත්‍යවරයා වශයෙන් වර්ෂ 2016 නොවැම්බර් මස 18 වන දින IS සංවිධානයට සම්බන්ධ ශ්‍රී ලාංකිකයන් පිළිබඳ කරුණු ඉස්මතු කරමින් සිදු කළ කතාව සම්බන්ධයෙන් රජයේ මුස්ලිම් අමාත්‍යවරුන් සහ තවත් සාමාජිකයින් කිහිපදෙනෙකු විසින් සෑම අතකින්ම විවේචනයට ලක් කරන ලදි. වනාතවිල්ලුවෙන් හමු වූ විශාල අවි ආයුධ තොගය බවා රජයට පැහැදිලි අනතුරු ඇඟවීමක් වන්නට තිබිණි. මේ සම්බන්ධයෙන් අත්අඩංගුට ගත් සහ පලා ගිය සැකකරුවන් සහරාන් සහ සම්බන්ධතා පැවැත්වූ බව ද මෙහි දී දැනුවත් කෙරුණි. මෙහි දී පොටෑසියම් නයිට්‍රේට් නයිට්‍රික් අම්ල වැනි බෝම්බ නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය රැසක් හමුවිය.

ජිහාදයට මඟ පෙන්වන පොත් කිහිපයක් සහ ලොව ප්‍රසිද්ධ යේමන් ඇමරිකානු රැඩිකල්වාදී දේශකයෙකු වන අන්වර් අල් අව්ලකී විසින් පවසන ලද සිත් ඇදගන්නා සුළු වචන කිහිපයක් ද මෙහි දී හමුවිය. මෙහි දී අත්අඩංගුවට ගත් සැකකරුවෙකුගේ පසුබිම්බියේ තිබී විදුලි පරිපථ සටහනක් බෝම්බ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු හමුවිය. වර්ෂ 2019 පෙබරවාරි 19 වැනි දින පැවති ජාතික ආරක්ෂක කවුන්සලය ද මෙම අනාවරණයන් පිළිබඳ දැනුවත් කොට තිබුණි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ෂානි අබේසේකර සාක්ෂිදෙමින් පවසා සිටියේ ඔහු සහ ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති ( අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ) රවී සෙනවිරත්න වර්ෂ 2019 මාර්තු මාසයේ දී ජනාධිපති සිරිසේන මහතා හමු වී ජාතික ආරක්ෂාවට ඇති බරපතල තර්ජනයක් පිළිබඳ දැනුම්දුන් බවයි. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම සහ සහරාන්ව අත්අඩංගුවට ගැනීම සහ ඔවුන් සතු 700 දෙනෙකුට අධික මානව සම්පත් අතරින් යොදා තිබුණේ විමර්ශකයන් සත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකි. එහි දී ජනාධිපති සිරිසේන මහතා විසින් කිසිදු විශේෂිත මාර්ගෝපදේශයක් ලබා දී නොමැති අතර වර්ෂ 2019 පෙබරවාරි

මස 19 පසු ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීමත් පාස්කු ප්‍රහාරය සිදුවෙන තෙක්ම කැඳවා තිබුණේ නැත. සන්ධාන රජය ඒ වන විට පැවතියේ ජනාධිපති සිරිසේන මහතා සහ අගමැති වික්‍රමසිංහ මහතා අතර සබඳතා තීරණාත්මක ලෙස බිඳවැටීම හේතුවෙන් ඇති වූ ප්‍රධානයට ලක්වෙමිනි. ජනාධිපති සිරිසේන මහතා සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ මහ බැංකු බැඳුම් කර සිදුවීමෙන් පසුව සන්ධානය පිළිබඳ ඔහුගේ විශ්වාසය බිඳී ඇති බවයි. කෙසේ වුවත් වික්‍රමසිංහ මහතා සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ පරස්පරතා තිබුණ ද ඔහු සහ ජනාධිපති සිරිසේන මහතා අතර රාජකාරි වශයෙන් පැවති සම්බන්ධතා එතරම් බරපතල ලෙස පළුදු වී නොමැති වූ බවයි.

තවදුරටත් සාක්ෂිලබාදෙමින් ජනාධිපති සිරිසේන මහතා පවසා සිටියේ වර්ෂ 2018 ඔක්තෝම්බර් මාසයේ වික්‍රමසිංහ මහතාව අගමැති ධූරයෙන් පහ කිරීමට ද එක් හේතුවක් වන්නේ විශ්වාසය පළුදුවීම බවයි. වර්ෂ 2018 ඔක්තෝම්බර් මාසයේ සිදු වූ සිද්ධීන් ජාතික ආරක්ෂාව මත ඇති කළ බලපෑම ඉතා බරපතල බවට පත් වූයේ 2018 වසරේ දෙසැම්බර් මාසයේ දී වික්‍රමසිංහ මහතා අගැමති ලෙස බලයට පත්වීමෙන් අනතුරුව ජනාධිපති සිරිසේන මහතා ඒ පිළිබඳ දැරූ ආකල්පය හේතුවෙනි. ඉන් අනතුරුව ජනාධිපති සිරිසේන මහතා අගමැති වික්‍රමසිංහ මහතාට ඉන්පසු පැවතුණු කිසිදු ආරක්ෂක මණ්ඩල රැස්වීමකට ඇරයුම් කළේ නැත. එය කොතරම් බරපතල වී ද යත් පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව අග්‍රාමාත්‍යය වික්‍රමසිංහ මහතාට ජනාධිපතිවරයා රටින් බැහැරව සිංගප්පූරුව වෙත ගොස් සිටිය ද, ජාතික ආරක්ෂක කමිටුවේ රැස්වීමක් කැඳවීමට අවශ්‍ය වූ නමුත් ජනාධිපති ලේකම්වරයා සහ ආරක්ෂක ලේකම්වරයා ඇමතූ ජනාදිපතිවරයා විසින් එම රැස්වීමට සමභාගී නොවන ලෙස දන්වා තිබේ.

රජය ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසංවිධානය පිළිබඳ වැඩි අවධානයක් යොමු කොට තිබුණු. මෙම ප්‍රයත්නය කෙරෙහි වැඩි සම්පත් ප්‍රමාණයක් යොමු කොට තිබුණි. සැබවින්ම වසර 30 ක් මුළුල්ලෙහි ජාතිය මුහුණ දුන් LTTE තර්ජනය සලකා බලන විට ජාතික ඒකබද්ධතාවය සහ ප්‍රතිසංවිධානය අනිවාර්යයෙන් පැවතිය යුතුය. නමුත් සාක්ෂිකරුවන් කිහිපදෙනෙක් සාක්ෂිදෙමින් පවසා සිටයේ රජය තුළ ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වයක්

හිමි නොවූයේ රජයේ අවධානය ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසංධානය වෙත යොමු වී තිබූ බැවින් යනුවෙනි. මෙම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පිළිබඳ සැක පහල කිරීමට විමර්ශන කොමිසමට කිසිදු හේතුවක් නොමැත.

සාක්ෂි ඉදිරිපත් කරමින් පොලිස්පති පූජිත් ජයසුන්දර පවසා සිටියේ ඔහු සහ ජනාධිපතිවරයා අතර විශ්වාසය පළුදුවීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බුද්ධි අංශයේ මෙහෙයුම් ක්‍රියාකාරීන් නිරතුරුවම ඔහුගේ යාමර්ම් පිළිබඳ පරීක්ෂාවෙන් සිටි බවයි. නමුත් රාජ්‍ය බුද්ධි අංශය සහරාන් සහ ඔහුගේ කණ්ඩායම් පිළිබඳ විමර්ශනය කරන විට බොහෝ තොරතුරු සහ බුද්ධි තොරතුරු ලැබුණේ විවෘත මූලාශ්‍රවලිනි.

බුද්ධි අංශවල ක්‍රියාකාරීත්වය විමසා බලන විට රජයේ පාර්ශවයෙන් IS සංවිධානයෙන් එල්ල වූ තර්ජන සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රවේශයක් නොමැති වීම මනාව ඉස්මතු විය. බුද්ධි තොරතුරු ලබාදීම පිළිබඳ කීර්තිය හිමි කර ගැනීමට බුද්ධි අංශ අතර පැවති තරඟය හේතුවෙන් මේ තත්ත්වය තව දුරටත් බරපතල බවට පත්විය.

මේ පිළිබඳ මනාව හෙළිදරව් වන කාරණයක් වන්නේ හමුදා බුද්ධි අංශ සතුව ජමීල් හා ජමෙතුල් ඉස්ලාම් සංවිධානයේ සෙසු සමාජිකයන් පිළිබඳ වැදගත් තොරතුරු වර්ෂ 2015 වකවානුවේ සිටම තිබීමත් මෙහි දී පිළිගත් ආකාරයට මේ සියළු බුද්ධි තොරතුරු සෙසු බුද්ධි අංශ සමඟ හුවමාරු කරගෙන නොතිබීමත් හේතුවෙනි. රාජ්‍ය බුද්ධි අංශය ද මීට නොදෙවෙනි තත්ත්වයක පැවතුණි. හමුදාපති මහේෂ් සේනානායක මහතා විසින් ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතාට පැමිණිලි කොට තිබුණේ රාජ්‍ය බුද්ධි අංශය විසින් හමුදා බුද්ධි අංශ සමඟ තොරතුරු සහ බුද්ධි තොරතුරු හුවමාරු කර නොගන්නා බව පවසමිනි.

ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පුද්ගලික වෙනස්කම් පසෙකලා කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට අපොහොසත් වූහ. සාක්ෂි ලබාදෙමින් රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන පවසා සිටියේ උප පොලිස්පති නාලක ද සිල්වා විසින් තමන්ට එරෙහිව සමාජ මාධ්‍ය සහ වෙනත් රැස්වීම්වල කටයුතු කිරීමට නාමල් කුමාර නැමැත්තා පොළඹවා ගනිමින් සිටි

බවයි. මින් ඔහු බලාපොරොත්තු වී ඇත්තේ රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ ධූරය ලබාගැනීම බව ද ඔහු තව දුරටත් පැවසීය. විමර්ශන කොමිසම විසින් මෙම සාක්ෂිය තහවුරු කිරීමට සමත් ශ්‍රව්‍ය පටිගත කිරීම් කිහිපයකට සවන් දී තිබේ. උප පොලිස්පති නාලක සිල්වාගේ පැහැදිලි කිරීම වූයේ ඔහු නාමල් කුමාරව තොරතුරු සැපයුම්කරුවෙකු ලෙස පරීක්ෂා කරමින් සිටි බවයි. විමර්ශන කොමිෂමේ වැටහීම වන්නේ එය එසේ සිදු නොවූ බවයි.

අකර්මන්‍ය වූ රජය වනාහි සහරාන් ඇතුළු කණ්ඩායමට ප්‍රහාර එල්ල කිරීම සඳහා හිමි වූ අනගිතම අවස්ථාවක් ලෙස සැලකිය හැක.

## 25 වන පරිච්ඡේදය

### අන්තවාදී ආගමික කණ්ඩායම්:

රට තුළ ජනවාර්ගික හා ආගමික ගැටලු ඇති කිරීමට හේතු පාදක වන සහ එවන් ක්‍රියාකාරකම්වලට සහාය ලබාදෙන සහ ඒ මගින් මහජන කැළඹීම් ඇති කිරීමට හේතු වන, නීතිය හා සාමයට බාධා පැමිණවීමට සමත්, සමාජ සුපිළිපන්න භාවයට අවහිරතා පමුණුවන පුද්ගලයින්, සංවිධාන, අනුබල දෙන කණ්ඩායම් ආදිය පිළිබඳව හඳුනා ගැනීම සඳහා විමර්ශන කොමිසම සතුව ඇති බලතල භාවිත කෙරේ.

ඒ අනුව ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාමික් සහ (SLJISM) නැමැති සංවිධාන විමර්ශන කොමිසම විසින් තහනම් කළ යුතු අන්තවාදී මුස්ලිම් සංවිධාන ලෙස පෙරදී හඳුනාගෙන තිබේ. ඊට අමතරව වහබිවාදයද තහනම් කළ යුතු දෘෂ්ටි වාදයක් ලෙස විමර්ශන කොමිසම විසින් හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකාවේ වහබිවාදී සංවිධාන ක්‍රියාත්මක වන්නේ තවුහිද් සංවිධාන ලෙසය. 5 වන පරිච්ඡේදයේදී මේ පිළිබඳව වඩාත් විස්තරාත්මකව ඉදිරිපත් කොට තිබේ. මෙම පරිච්ඡේදයේදී විමර්ශන කොමිසම අපේක්ෂා කරන්නේ රට තුළ ජනවාර්ගික හා ආගමික ගැටලු ඇති කිරීමට හේතු පාදක වන සහ එවන් ක්‍රියාකාරකම්වලට සහාය ලබාදෙන සහ ඒ මගින් මහජන කැළඹීම් ඇති කිරීමට හේතු වන, නීතිය හා සාමයට බාධා පැමිණවීමට සමත්, සමාජ සුපිළිපන්න භාවයට අවහිරතා පමුණුවන පුද්ගලයින්, සංවිධාන හා අනුබල දෙන කණ්ඩායම් හඳුනා ගැනීමටයි.

පාස්කු ප්‍රහාරය එල්ල වූයේ, වර්ෂ 2009 යුද්ධය අවසන් වීමෙන් පසු කාලය තුළ මෙරට ආගමික හා ජනවාර්ගික අසමගිතාවයන් පවතින පසුබිමකයි. එතැන් සිට හඳුන්වා දෙන ලද ප්‍රතිසන්ධානය උදෙසා වන පියවරයන් හීදී මූලික වශයෙන් දමිළ ප්‍රජාව තුළ විශ්වාසය සහ ආත්ම ශක්තිය නැවත ගොඩනැගීම පිළිබඳ වැඩි අවධානයක් යොමුව පැවතිනි.

බලයට පැමිණි සියලු රජයන් තිරසාර සාමයක් උදෙසා ප්‍රගතිශීලී පියවරයන්ට එළඹුණ අතර ඒ සඳහා පරිපාලන ක්‍රමවේද හඳුන්වාදීම, ආයතනික යාන්ත්‍රණයන්

ස්ථාපනය කිරීම සහ අවශ්‍ය වන ව්‍යවස්ථාපිත සහ නෛතික තත්ත්වයන් සම්පාදනය කිරීම යන කටයුතු සිදුකරන ලදී.

කෙසේ වුවත් රට තුළ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ ආරක්ෂක අධිකාරිය විසින් රට තුළ මෑතක සිට හිස ඔසවන ඉස්ලාම් අන්තවාදය සිරියානු හා ඉරාක දේශ සීමාවලින් ලෝකය නැමැති විශ්ව ගම්මානය පුරාම පතුරුවා හැරීමේදී එම විශ්ව ගම්මානයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් වෙත ද සමීපවන ආකාරය ප්‍රමාණවත් පරිදි හඳුනාගෙන නොමැත.

ශ්‍රී ලංකාවේ ජන ප්‍රජාවන් අතුරින් ආගමික අන්තවාදය ඉස්මතුවීම වළක්වාලීම, දුර්වල කිරීම සහ මුලිනුපුටා දැමීම සඳහා අවශ්‍ය ප්‍රගතිගාමී පියවරයන් පැවතියේ අසංවිධිත සහ අකර්මන්‍ය තත්ත්වයකය. රට තුළ දේශපාලනික හා ආගමික නායකත්වය විසින් සිදුකරන කැපවීම, වර්ෂ **2014** ජුනි **24** වෙනි දින අබු බකර් අල් බග්ඩාඩි විසින් කැලිෆේට් නැමැති ඉස්ලාමීය රාජ්‍ය ප්‍රකාශයට පත් කොට ඔහුව එහි උත්තරීතර නායකයා (කලීෆා) ලෙස හඳුන්වාගත් මොහොතේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රම ක්‍රමයෙන් සක්‍රියවීමට පටන් ගත් ඉස්ලාම් රාජ්‍යයට පක්ෂපාතී මූලධර්මවාදී, අන්තවාදී සුළු පිරිසකගේ අධිෂ්ඨානය හා කැපවීම අභිබවා යෑමට අසමත් විය.

මෙවන් සන්ධර්භයක් තුළ මෙම වාර්තාවේ මෙම කොටසින් සාකච්ඡා කෙරෙනු ඇත්තේ 3 වන පරිච්ඡේදයේදී විස්තර කොට ඇති පරිදි වසර දහසකට අධික කාලයක් සාමය සපිරි සහජීවනයකින් යුතුව මෙරට ජීවත් වූ සිංහල බෞද්ධ සහ මුස්ලිම් ඉස්ලාම් ජන කොටස් අතරින් ඉතා සුළු පිරිසක් අතර හදිසියේම පැන නැඟුණු ආගමික අසමඟිතාවය පිළිබඳවයි. මෙම ජන කොටස් **2** සඳහාම තම ජන කොටස වෙනුවෙන් නැඟී සිටීමට, එකිනෙකාව සැක කිරීමට, විවේචනය කිරීමට මෙන්ම ඇතැම් අවස්ථාවලදී ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීමටද තුඩු දෙන හේතු කාරණා සහ නොක්කාඩු ස්වරූපයේ කාරණා පවතී. මෙම ජන කොටස් දෙක අතර භේද හට ගැනීමට ඓතිහාසික කාරණා මත පදනම් වූ දැක්මක් මෙන්ම තත්කාලීන තත්ත්වයන් යටතේ ද හේතු පාදක වූ කරුණු සම්බන්ධයෙන් සාධාරණීකරණයන් ඉදිරිපත් කෙරෙන සාක්ෂි විමර්ශන කොමිසම හමුවේ අනාවරණය වී

ඇත. එමෙන්ම 80 දශකයේ මුල් භාගයේදී පැන නැඟුණු ආගමික විවිධත්වයන් දේශපාලණීකරණය වීම සහ ආගම මත පදනම්ව දේශපාලන පක්ෂ බිහිවීම (නිදසුන් ලෙස ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය) යන කාරණා දෙකෙහි සම් මිශ්‍රණයක් නිසා මෙම අසමඟිය උද්ගතව තිබෙන බව මනාව පැහැදිලි වේ.

කෙසේ වුවත් මේ පිළිබඳව විස්තරාත්මකව ගවේශනය කිරීමට පෙර සඳහන් කළ යුතු කරුණක් වන්නේ මුස්ලිම් ප්‍රජාව තුළ අන්තවාදය මුලින්ම මතු වූයේ 90 දශකයේ මුල් භාගයේදී ප්‍රසිද්ධියට පත් වහාබි වාදය සමඟ බවයි. මෙහි ප්‍රතිඵලය වූයේ මුස්ලිම් කණ්ඩායම් අතර වාර්ගික වෙනස්කම් පිළිබඳව ගැටුම් ඇතිවීම ඔස්සේ ශ්‍රී ලංකාවේ සූෆි මුස්ලිම් ප්‍රජාව එම ගැටුම්වල ඉලක්කය බවට පත්වීමයි. මේ පිළිබඳව විස්තරාත්මකව 4 වන හා 6 වන පරිච්ඡේදවල දක්වා ඇති අතර, සූෆි මුස්ලිම්වරුන් සහ සහරාන්ගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වූ ජාතික තවුහිද් ජමාත් සංවිධානය අතර හට ගත් අන්තර් ආගමික අසමඟිය ද මෙහිදී සැළකිල්ලට ගන්නා කාරණයකි. ඒ අයුරින් අන්තවාදී ප්‍රවණ්ඩත්වය මුලින්ම ඉස්මතු වූයේ මුස්ලිම් ප්‍රජාව තුළම වන අතර එසේ සිදුවූයේ අන්තවාදී බෞද්ධ ආගමික කණ්ඩායම් විසින් මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කොට ගෙන අන්තවාදී ප්‍රවණ්ඩත්වය මුදා හැරීමට පෙරාතුවයි.

ඉන් පෙර මෙරට මුස්ලිම් ප්‍රජාව සිය ඡන්දය ප්‍රකාශ කළේ බහුතරයක් නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයට හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, ඔවුන්ගේ වර්ණයන්ට සහ සංකේතවලටය. ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය තුළ මුස්ලිම් දේශපාලනඥයින් බහුතර සිංහල ඡන්ද හිමියන් වෙසෙන ප්‍රදේශවල පවා බලයට පත් වූ අවස්ථා පිළිබඳ නිදසුන් තිබේ.

1978 ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමය සඳහා සිදුකළ වෙනස්කම් හේතුකොටගෙන, ආගම මත පදනම්ව වර්ෂ 1981 දී නිර්මාණය වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, වර්ෂ 2000 දී නිර්මාණය වූ සිහළ උරුමය සහ වර්ෂ 2005 දී නිර්මාණය වූ ජාතික හෙළ උරුමය යන පක්ෂවල බිහිවීම තුළ මැතිවරණ පසුබිමෙහි ද යම් වෙනසක් ඇති විය.

ඡන්දය ප්‍රකාශ කිරීමේදී ආගමික පදනමින් සිතා කටයුතු කිරීමට මේ නිසා ඡන්ද හිමියන් හට පෙළඹවීම ඇති කොට තිබේ. විමර්ශන කොමිසම විසින් සිදු කරන ලද එක්තරා සාක්ෂි විමසීමකදී දැන ගැනීමට ලැබුණු පරිදි වර්ෂ 1983 ජුනි මස 24 වෙනි දින කල්මුණේ ප්‍රදේශයේ පවත්වන ලද රැස්වීමකදී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායකයා මුස්ලිම් ජාතික පිරිසක් අමතමින් අවධාරණය කොට ඇත්තේ ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂවලට සහයෝගය දැක්වීමෙන් මුස්ලිම් ජනතාවට කිසිවක් ලැබී නැති බවත්, එම නිසා ඔවුන් ජන කොටසක් ලෙස මැතිරණය සඳහා තරඟ කළ යුතු අතර, යම්කිසි තීරක බලයක් ලබා ගැනීම සඳහා ආසනවලින් යම් කොටසක් ඔවුන් වෙත නතුකොට ගත යුතු බවයි.

සමානුපාතික නියෝජිත ඡන්ද ක්‍රමය ශ්‍රී ලාංකික සමාජ සන්ධර්භයට බලපෑම් සිදු කර ඇති ආකාරය පිළිබඳ පහත දැක්වෙන අයුරින් යෙහියා සහ වර්ණපාල විසින් විස්තර කොට දක්වා තිබේ.

" ජනවාර්ගික හා ආගමික සුළුතර පක්ෂ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් සුළුතර ජනතාව වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ 2 විසින් සුළුතර අපේක්ෂකයින් වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරනු ලැබේ. වර්ෂ 1989 දී හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය මුල් යුගයේදී සලකනු ලැබුවේ සුළුතරයන් හට අවාසිදායක ක්‍රමවේදයක් ලෙසිනි. කෙසේ වුවද මෙම සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය සුළුතර ජනකොටස් සඳහා වාසිදායක වී ඇති අතර ප්‍රධාන පක්ෂවලට අපේක්ෂිත වාසි සලසා නොමැත. සුළුතර අපේක්ෂකයින් බොහෝ දෙනෙක් තේරී පත්වන නමුත් සුළුතර ජන කොටස්වල ඡන්ද බෙදී යාමක් සිදු වේ. එබැවින් ප්‍රධාන දේශපාලන පක්ෂ 2 සඳහා එයින් කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවේ. සැබවින්ම වඩා ජාතිවාදී ප්‍රවේශයක් සඳහා එළඹෙන පක්ෂ වඩාත් අන්තර්කරණයෙන් යුත් ප්‍රතිරූපයක් නිරූපනය කරන පක්ෂවලට වඩා යහපත් තත්ත්වයක පවතින බව පිළිගැනීමට ප්‍රමාණවත් සාක්ෂි තිබේ. සුළුතර ජන කොටස් සඳහා සුදුසු වටපිටාවක් නිර්මාණය කිරීම තුළ සිංහල බහුතරය මංමුලා ස්වභාවයකට පත්ව ඇති අතර, එබැවින් වඩාත් විප්ලවීය, අන්තවාදී, ජාතිවාදී ප්‍රවේශයන් වෙත ප්‍රධාන පක්ෂ යොමු වෙමින් පවතී. "

මෙම නව ප්‍රවණතාවය ජන කොටස් 2 අතර සමගිය කෙරෙහි ඉතා අහිතකර ලෙස බලපෑ අතර, එයට හේතු වූයේ දේශපාලන වශයෙන් එකතු වූ මුස්ලිම් ජනතාව ප්‍රධාන සමාජ ප්‍රවාහයෙන් බෙදී වෙන්වී යාමයි. එසේ බෙදී යාමේදී පැහැදිලිවම අදාළ ප්‍රජාවන් 2 සඳහාම සමාජ, සංස්කෘතික, ආගමික සහ ආර්ථික අංශයන්හි ඇති වන වෙනස්කම් ගැටලු සහගත තත්ත්වයන් බවට පත් වේ. මෙම නව දේශපාලන සංස්කෘතියේ ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාම් ආගම අදහන්නන් කෙරෙහි ඇති භීතිකාව (ඉස්ලාම් ෆෝර්බියා) ශ්‍රී ලාංකීය සමාජයට අවතීරණ විය.

මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කරමින්, 80 දශකයේ මුල් භාගයේ සිට හිස එසවීමට පටන් ගත් වහාබි වාදය සහ මෑතකදී ඉස්මතු වූ හලාල් සහතිකය, ෂරියා නීතිය, තවුහිද් දේවස්ථාන, මද්‍රාසා පාසැල් සහ අරාබි පාසැල් පැතිරයාම, මෙම තත්ත්වය වඩාත් උත්සන්න කිරීමට සහ මුස්ලිම් විරෝධීන්ගේ චිත්ත සන්තානය තුළ වඩාත් භයානක ඉස්ලාම් භීතිකාවක් ජනනය කිරීමට සමත් විය.

විමර්ශන කොමිසම ඉදිරිපිට සාක්ෂි ඉදිරිපත් කළ සාක්ෂිකරුවන් බොහෝ දෙනෙකු විසින් කොමිසම වෙත මෙම තත්ත්වය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලදී.

එල්.ටී.ටී.ඊ යුද්ධය ආරම්භවීමට පෙර දීර්ඝ කාලයක් කාත්තන්කුඩිහි විසූ එක් සාක්ෂිකරුවකු සාක්ෂි ලබාදෙමින්, ඔලුවිල් ප්‍රකාශය සහ එහි අන්තර්ගතව තිබූ "මුස්ලිම් නිජබිම" නැගෙනහිර පළාතේ ඇති කිරීම පිළිබඳ පවසා සිටියේය. ඔහු තවදුරටත් දැඩි සිත් වේදනාවෙන් පවසා සිටියේ මෙම නව දේශපාලන සංස්කෘතිය ඈත ඉතිහාසයේ පටන්ම එකමුතුකමින් ජීවත් වූ මුස්ලිම් ජනතාව සහ විශේෂයෙන්ම සිංහල වැනි සෙසු ප්‍රජාව අතර බෙදීම් ඇති කිරීමට බෙහෙවින් ඉවහල් වූ බවයි.

පාස්කු ඉරිදා දින ප්‍රහාරයේ මහමොළකරු ලෙස කටයුතු කළ වහබිවාදියා වන සහරාන් වර්ෂ 2009 සිට නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ආගමික දේශන පවත්වමින් ඔහු විසින් අනුදක්නා ලද ඉස්ලාම් අන්තවාදය පතුරවමින් සිටියේය. පසුකාලීනව රට තුළ බොහෝ ප්‍රදේශවල සිය ආගමික අන්තවාදය පිළිබඳ දේශන

ප්‍රවත්වමින් ඔහු සැරි සැරුවේය. ඔහු වෛරය ඇති කළේ සිංහල බෞද්ධ ජනතාව අතර පමණක් නොව ඔහු අයත් වූ මුස්ලිම් ප්‍රජාව තුළද සූෆි ජන කොටස ඉලක්ක කරගනිමින් එහෙම වෛරය පැතිරවීය. සහරාන් විසින්ම නිර්මාණය කොට ගත් විරුද්ධවාදීන් හට ඔහුගේ න්‍යාය පත්‍රය සහ මෙහෙයුම පිළිබඳ වඩා හොඳින් වැටහීමට පටන් ගත් අවස්ථාවේදී ඉස්ලාම් ආගමික අන්තවාදය හිස ඔසවන බව කළින්ම වටහා ගත් මෙම පිරිස් නිසි බලධාරීන් දැනුවත් කළ බව විමර්ශන කොමසම ඉදිරියේ සාක්ෂි දෙමින් පෙනී සිටි එම ජන ප්‍රජාවේ සාමාජිකයන් විසින් අනාවරණය කරන ලදී. එනමුත් අදාළ දැනුවත් කිරීම් පිළිබඳ කිසිදු ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

අනික් පසින් බොදුබල සේනාව වැනි බෞද්ධාගමික අන්තවාදී සංවිධාන වහාබි වාදය සහ ඉස්ලාම් අන්තවාදය විවේචනය කරමින් හඩනගන්නට විය. කෙසේ වුවත් මොවුන් එතනින් නොනැවතුන අතර, පොදුවේ මුස්ලිම් ජනතාව ඉලක්ක කොටගෙන වෛරී ප්‍රකාශ නිකුත් කළෝය. පූජ්‍ය ගලගොඩ අත්තේ ඥාණසාර හිමියන්ගේ දේශනවල පොදුවේ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කොට ගත් අදහස් අඩංගු වූ අතර, මුස්ලිම් විරෝධයට එමඟින් පණ පෙවීම සිදුවිය. කිසිදු සැකයකින් තොරව එම අදහස් අතර වෛරී ප්‍රකාශ තිබූ බව පැවසිය හැක. වර්ෂ 2003 පෙබරවාරි 17 දින මහරගමදී පූජ්‍ය ගලගොඩ අත්තේ ඥාණසාර හිමියන් විසින් පවත්වන ලද දේශනය සහ 2014 වසරේ ජුනි මාසයට යෙදුනු පොහොය දිනයෙන් පසුදා අළුත්ගමදී සිදුකළ දේශනය කොමිසම විසින් විශේෂයෙන් අධ්‍යයනය කොට තිබේ. කොමිසමේ මතය වන්නේ එම දේශනවල අඩංගු ඇතැම් කරුණු පිළිබඳ වර්ෂ 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ බලාත්මක කරන පනත යටතේ චෝදනා පවා ගොනු කළ හැකි බවයි. එබැවින් කොමිසම විසින් නිර්දේශ කරන්නේ ඉහත කරුණු ප්‍රකාරව නීතිපතිවරයා විසින් පූජ්‍ය ගලගොඩ අත්තේ ඥාණසාර හිමියන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම සුදුසු බවයි.

නිසැකවම එවැනි වෛරී ප්‍රකාශ විසින් බෞද්ධාගමික ජන කොටස් අතර ජීවත් වන අන්තවාදී කණ්ඩායම් සක්‍රිය කිරීමට සමත් වූ අතර, එමඟින් මුස්ලිම් ජනතාව සහ ඔවුන්ගේ ව්‍යාපාර ආයතනවලට එරෙහිව කටයුතු කිරීමට එවැනි පිරිස් යොමු කරන ලදී.

සහරාන් වැන්නන් හට සිය ආධිපත්‍ය තහවුරු කර ගැනීමට වඩාත් උචිත පසුබිමක් මෙමඟින් නිර්මාණය විය. ඔහු තම පිරිසට නවකයින් බඳවා ගැනීම සඳහා මෙම තත්ත්වය උපයෝගී කරගත් අතර, එහිදී ඔහු සාර්ථකත්වයක්ද අත්කර ගත්තේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාජයේ පවතින අන්තවාදී බලවේග බොහොමයකට ආගමෙන් හා ජාතියේ නාමයෙන් සංවිධාන ගතවෙමින් තම අන්තවාදී දෘෂ්ටිවාද සමඟ පෙරට ඒමට යම් පිටුබලයක් ලැබිණි.

අනික් පසින් සිලෝන් තවුහිද් ජමාත් සංවිධානයේ (CTJ) රාසික් රෆයිදීන් නොහොත් අබ්දුල් රාසික් විසින් ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ සහ මුස්ලිම් ඉස්ලාම් ජන කොටස් අතර අසමඟිය වර්ධනය කිරීම සඳහා මහා පරිමාණයෙන් දායක විය. " බුදුන් වහන්සේ" නැමැති ශ්‍රී ලංකාවේ බෞද්ධාගමිකයින්ගේ ශාස්තෘවරයාව විවේචනය කරමින් ඔහු වෛරී ප්‍රකාශ නිකුත් කළේය.

ෂරියා නීතිය බලාත්මක කරන ලෙස බලකරමින් ඔහු පැවැත් වූ මහජන උද්ඝෝෂණ සහ අන්තවාදී ප්‍රකාශ සමාජ මාධ්‍ය ඔස්සේ වේගයෙන් ප්‍රචාරය විය. මෙම තත්ත්වයෙන් වාසි ලබාගත් සිංහල බෞද්ධ අන්තවාදීන්ද ඒ සඳහා ප්‍රති ප්‍රහාර එල්ල කිරීමට කටයුතු කොට ඇත.

ශ්‍රී ලංකාවේ ජන ප්‍රජාවන් අතර ජන වාර්ගික හා ආගමික සමඟියට, සහජීවනයට සහ එකමුතු බවට බාධා පැමිණවිය හැකි ආගම් පදනම් කොට ගත් අන්තවාදී සංවිධාන පිළිබඳ විමර්ශන කොමිසම විසින් අධ්‍යයනය කොට තිබේ. 2009 වසරේ යුද්ධය නිමා වීමෙන් පසු මෙවැනි සංවිධානවල බිහිවීමේ වර්ධනයක් නිරීක්ෂණය වී තිබේ. මෙම සංවිධානවල නිර්මාතෘවරුන් හුවා දක්වන්නට උත්සාහ කරන්නේ ඔවුන් ජාතිවාදී මානව වාදී හා දේශ හිතෛෂී පුද්ගලයින් ලෙස වුවත් ඔවුන් කථා කරන, ක්‍රියා කරන හා සමාජ මාධ්‍යවල ප්‍රචාරය කරන දෑ පිළිබඳ යථාර්තවාදී දෘෂ්ටි කෝණයකින් විමසා බැලූ විට අවබෝධ වන කරුණක් නම් ඔවුන් සැබවින්ම ඒ ආකාරයේ පුද්ගලයින් නොවන බවයි. ඔවුන්ගේ අභිමතාර්ථයන්, චර්යා රටාවන් හා ක්‍රියාකාරිත්වය තුළින් ජන කොටස් අතර එදිරිවාදීකම් නිර්මාණය වේ.

මෙම සංවිධාන බොහොමයක් ලියාපදිංචි සංවිධාන නොවන අතර, නිලධාරි මණ්ඩලයකින්ද සමන්විත නොවේ. නමුත් පුද්ගලයින් කිහිප දෙනෙක් පමණක් සමාජ මාධ්‍ය තුළ ක්‍රියාකාරී වන අතර, භූමිය තුළ කිසිම ආකාරයකින් ක්‍රියාත්මක නොවේ. කෙසේ වුවත් අවශ්‍ය හැම විටකම කැරළි ගැසීම, මහජන රැස්වීම් පැවැත්වීම විරෝධතාවල නිරතවීම සහ ජනතාව අතර එකමුතු බව නැසෙන සේ කටයුතු කිරීම සඳහා කණ්ඩායම් යෙදවීමට ඔවුන් සූදානම්ය. අරමුදල් සපයා ගැනීම සහ සාමාජිකත්වය අතින් ඔවුන් එතරම් සවිමත් නොවූවද සැළකිය යුතු කාලයක් බුද්ධි නිලධාරීන්ගේ හෝ පොලිසියේ අධීක්ෂණය හා පාලනයෙන් තොරව ක්‍රියා කිරීමට ඔවුන්ට අවකාශ ලබා දුනහොත් එවැනි ශ්‍රිස් ජාතික ආරක්ෂාවටද තර්ජනයක් විය හැක. මක්නිසාදයත් ඕනෑම ආකාරයකින් ඕනෑම ප්‍රජාවක් තුළ ක්‍රියාත්මක වන අන්තවාදය දීර්ඝ කාලීනව ත්‍රස්තවාදය දක්වා වර්ධනය විය හැකි බැවිනි.

යුද්ධය අවසන් වීමෙන් පසුව බෞද්ධ හිමිවරුන් කිහිප දෙනෙක් ගිහි දැඩි මතධාරීන් සහ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයින් විසින් රට තුළ මුස්ලිම් විරෝධී හැඟීම් ඉස්මතු කිරීමේ ක්‍රියාදාමයක් හිස ඔසවමින් පැවති අතර, මුස්ලිම් විරෝධී හැඟීම් ප්‍රකට කරන ප්‍රචණ්ඩකාරී සිදුවීම් කිහිපයක්ද සිදු වී තිබිණි.

වර්ෂ **2014** ජුනි මාසයේදී කළුතර දිස්ත්‍රික්කයේ, අළුත්ගම දර්ගා නගරය, වැලිපැන්න සහ බේරුවල යන ප්‍රදේශවල සංවිධානගතව ප්‍රචණ්ඩ ක්‍රියා මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. වර්ෂ **2017** දී ගාල්ල දිස්ත්‍රික්කයේ ගිංතොට ප්‍රදේශයේදී මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වූ අතර, වර්ෂ **2018** දී ප්‍රධාන සිදුවීම් **2** ක් - පෙබරවාරි මස **27** වන දින අම්පාරේදී ද, මාර්තු මාසයේදී දිගන සහ තෙල්දෙනිය ප්‍රදේශවල මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රහාර මාලාවක් ද ක්‍රියාත්මක විය.

මෙරට සිංහල බස කතා කරන ප්‍රදේශවල බෞද්ධාගමික භික්ෂූන් කිහිප දෙනෙකු සහ ගිහි පුද්ගලයින් සුළු පිරිසක් විසින් සිදු කරන ලද විවිධ ද්වේශ සහගත ක්‍රියාවන්ට අමතරව උතුරු හා නැගෙනහිර දෙමළ බස කතා කරන ප්‍රදේශවල ද මුස්ලිම් විරෝධී ක්‍රියාකාරකම්වල වර්ධනයක් පිළිබඳවද විවිධ මත පළ විය. **1990** වසරේ යුධ කාලය තුළ

නැගෙනහිර පළාතේ සිදු වූ මුස්ලිම්වරුන්ගේ සමූල ඝාතනය හේතුවෙන් මුස්ලිම් තරුණයින් කිහිප දෙනෙක් තෝරාගෙන හමුදාව සඳහා සහාය දක්වන සටන්කාමී කණ්ඩායම ලෙස අවි පුහුණුව ලබාදුන් අතර, මුස්ලිම් ප්‍රජාව එල්.ටී.ටී.ඊ ප්‍රහාරවලින් ආරක්ෂා කිරීම සඳහා ඔවුනට ආයුධ ද ලබා දී තිබුණි. උතුරු නැගෙනහිර පළාත් තුළ ක්‍රියාත්මක වූ සිවසේනා ව්‍යාපාරය එසේත් නැතිනම් ඊලාම් සිවසේනා නමින්ද හඳුන්වන සමාජ විරෝධී ගිහි සංවිධාන කිහිපයක් විසින් මුස්ලිම් විරෝධී අදහස් පතුරුවාලීමට මෙය හේතු විය.

කෙසේ වෙතත් විමර්ශන කොමිසම වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව වර්ෂ 2009 යුද්ධය නිමාවීමෙන් පසු අදාළ මුස්ලිම් සටන්කාමී කණ්ඩායම් විසුරුවා හැර ඔවුන් හට ලබාදුන් ආයුධ ද යළි නීතිය ක්‍රියාත්මක කරන අංශ වෙත ලබා ගැනීමට කටයුතු කොට ඇති බව අනාවරණය විය. මෙය බොහෝදුරට සාර්ථකව සිදු කෙරුණද ඇතැම් පිරිස් සතුව තවමත් අවි ආයුධ පවතින බවට යම් සැකයක්ද මතුව පැවතිනි. මෙය සිංහල බෞද්ධ සමාජ විරෝධී කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ ප්‍රධානතම ගැටලුවක් බවටද පත් විය. ඇත්ත වශයෙන්ම නැගෙනහිර පළාතේ හිටපු නියෝජ්‍ය පොලිස්පති එඩිසන් ගුණතිලක මහතා සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ හිස්බුල්ලා සන්නද්ධ කණ්ඩායම සිය අවි ආයුධ නැවත භාරදීම ප්‍රතික්ෂේප කළ බවයි.

එසේ වුවද මඩකලපුව දිස්ත්‍රික්කයේ වව්නතිව් ප්‍රදේශයේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ආයුධ ලබා ගැනීම සඳහා ඝාතනය කිරීමට සහරාන් විසින් නියෝග ලබාදීම තුළින් පැහැදිලි වන්නේ අදාළ ජිහාඩ් අන්තවාදී කණ්ඩායම සතුව ආයුධ නොතිබූ බවයි. කෙසේ වුවත් එම ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් දේවස්ථාන ඇතුලු මුස්ලිම් ජන කොටස් වෙසෙන ස්ථානවල සිදු කළ සෝදිසි කිරීම්වලදි කඩු බොහොමයක් සොයා ගැනීමට හැකි විය. මේ නිසා මුස්ලිම්වරුන්ට එරෙහි ක්‍රියාකාරකම් රට පුරා දියත්වීම සිදුවේ. එසේ සිදු වූයේ මක්නිසාදයත් " අසිපතෙන් යුධ වදින ජිහාඩය" යනු ඉස්ලාම් අන්තවාදීන් විසින් පිළිගැනෙන ප්‍රමුඛ ආගමික ඇදහිලි අතුරින් එකක් වනවා සේම සිංහල බෞද්ධ ආගමික සමාජ විරෝධී කණ්ඩායම් අතරද මේ පිළිබඳව බහුලව කතා බහ ඇති වෙන බැවිනි. ඒ

අසුරින් හිස ඔසවන සන්නද්ධ මුස්ලිම් සටන්කාමීන් සහ ඉදිරියේ ඇති වීමට නියමිත භයානක තත්ත්වය පිළිබඳ කතා විස්තර රට තුළ වෙසෙන සියලු මුස්ලිම් නොවන ජන ප්‍රජාවන්ගේ මනස තුළට කා වැද්දී තිබුණි. සාක්ෂිවලින් දැක්වෙන පරිදි මිල්හාන් සහ රිල්වාන් විසින් මොහොමඩ් ෂිෆාත් සත්තා නැමැත්තාගෙන් තමන් හට කඩු කිහිපයක් සොයා දෙන ලෙස ඉල්ලීමක් කොට ඇති බවත්, එසේ සපයා ගත් කඩු බේරුවල සහ කුරුණෑගල ප්‍රදේශවලට යොමු කොට ඇති බවද සඳහන් වේ. මස්ජිත් දූල් කාදල් ජුම්මා මුස්ලිම් දේවස්ථානය වෙත මවුලවි මොහොමඩ් ගවුස් මොහොමඩ් ෆහීම් සහ කොළඹ නගර සභාවේ සභික මොහොමඩ් අර්ෂාඩ්ගේ සහභාගිත්වයෙන් කඩු 50 ක් ලබා දී ඇත.

පළමුවරට මුස්ලිම් සිංහල කෝලාහල ශ්‍රී ලංකාව තුළ සිදු වී ඇත්තේ 1915 වසර තරම් ඈත යුගයක වන අතර, එවකට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවතිනි. " සිලෝන් දිවයිනේ යුධ නීතිය යටතේ ගත කළ දින සියයක් (Hundred Days In Ceylon Under Martial Law) " නැමැති ආමන්ඩ් ද සූසා විසින් ලියන ලද ග්‍රන්ථයේ ශ්‍රී ලංකාව තුළ වර්ෂ 1915 ජුනි මස ආරම්භ වී මාස ගණනක් පුරා ක්‍රියාත්මක වූ මුස්ලිම් සිංහල කෝලාහල පිළිබඳ ඓතිහාසික කරුණු සටහන් වේ.

එකට විසූ මුස්ලිම්වරු අරාබි රටවලින් පැමිණ පදිංචි වූ සිලෝන් මුවර්වරු සහ වෙරළබඩ මළබාර් ඉන්දියානුවන්ගෙන් පැවත ආ වෙරළබඩ මුවර්වරුන් හඳුනාගෙන තිබේ. වසර 800 ක් පැරණි බෞද්ධ විහාරයක් සහ වසර 30 ක් පැරණි වෙරළබඩ මුස්ලිම් දේවස්ථානයක් අරභයා ආගමික වතාවත් කිරීම පිළිබඳව වෙරළබඩ මුවර්වරුන් සහ සිංහල බෞද්ධ ප්‍රජාව අතර ගැටුම්කාරී තත්ත්වයක් හට ගෙන තිබුණි. මෙම ඉස්ලාම් දේවස්ථානය "හම්බයන්" ලෙස ද හඳුන්වා ඇති අතර, බෞද්ධ විහාරයේ වතාවත් කිරීම සඳහා හේවිසි පූජා පැවැත්වීමට එරෙහිව විරෝධතා පැවැත් වූ මුස්ලිම්වරුන් අවධාරනය කොට ඇත්තේ අදාළ හේවිසි තේවා මුරය දේවස්ථානයට මීටර් 100 ක් එපිටින් පවත්වන ලෙස බල කරමිනි.

එම ලේඛකයාට අනුව සිලෝන් මුවර්වරු සිංහල බෞද්ධ ජනතාව සමඟ සාමයෙන් හා සමාදානයෙන් ජීවත් වූ අතර, එකිනෙකා අතර ගැටුම් හට ගන්නා ආකාරයේ ඉල්ලීම

හෝ අවශ්‍යතා කිසිවක් ඔවුන් අතර නොපැවැතිනි. මෙසේ සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් ශ්‍රී ලංකාව තුළ සාමයෙන් හා සංහිඳියාවෙන් යුක්තව ජීවත්වීමට හේතු සාධක ලෙස සාම්ප්‍රදායික මුස්ලිම් ප්‍රජාව විසින් පිළිගන්නා ලද සංස්කෘතිය, ඇදහිලි සහ විශ්වාසයන් ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාවයත් සමඟ මනාව පෑහීම නිසා සිදු වූවාක් බව සැලකිය හැක.

අවාසනාවන්ත ලෙස මෙම මධ්‍යස්ථ මුස්ලිම් ප්‍රජාව දැඩි සේ තර්ජනයට ලක් වී ඇති අතර, ඊළඟ පරපුරේ දේශපාලන බලය හා ආර්ථික සවිය මෙන්ම ජාත්‍යන්තර සම්බන්ධතා සහිත අරාබි රටවල සහ දකුණු ආසියාවේ සෙසු ඉස්ලාමීය රටවල ආභාෂයෙන් යුත් අධ්‍යාපනික පසුබිමක් සහිතවීම මීට හේතුවේ.

මෙම කණ්ඩායම විශ්වාස කරන්නේ වහබි වාදයට අනුව ඉස්ලාම් දහම අනුගමනය කළ යුතු බවයි. විමර්ශන කොමිසම විසින් නිරීක්ෂණය කළ පරිදි සහරාන්ගේ ආගමික අන්තවාදයට එරෙහි පැමිණිලි නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ අවධානයට ලක් නොවීමට සෑම රජයකම ඉහළ නිලතල දැරූ ප්‍රභූ මුස්ලිම් දේශපාලනඥයින් ඇතුළු පිරිසගේ බලපෑම් හේතු වූයේ මෙවන් පසුබිමකය.

හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂි සඳහා විමර්ශන කොමිසම ඉදිරියට කැඳවන ලදුව සන්ධාන රජයේ මුස්ලිම් දේශපාලනඥයින් වහාබි වාදය පැතිරීම සහ ඒ හා සම්බන්ධ ආගමික අන්තවාදයේ භයානක භාවය නිසා ජාතික ආරක්ෂාවට එල්ලවන තර්ජන පිළිබඳව සාකච්ඡා කොට ඇත්දැයි ඔවුන්ගෙන් ප්‍රශ්න කෙරිනි. මෙහිදී නායකයින් දෙදෙනා විසින්ම ලබා දුන්නේ නැත යන පිළිතුරයි. විමර්ශන කොමිසම විසින් ඔවුන්ගෙන් තවදුරටත් විමසා සිටියේ එවකට අධිකරණ හා බුද්ධ සාසන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ විජේදාස රාජපක්ෂ මහතා වර්ෂ **2016** නොවැම්බර් මස **16** වෙනි දින ඉදිරිපත් කළ කතාවේදී අයි.එස්. සංවිධානය ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය වීම සහ ශ්‍රී ලාංකික මුස්ලිම් තරුණ ප්‍රජාව එම සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සිරියාව වෙත ගොස් තිබෙන බව අනාවරණය කිරීමෙන් පසුව හෝ ඒ පිළිබඳව මුස්ලිම් දේශපාලකයින් ඔවුන් සමඟ

සාකච්ඡා සිදු කළේද යන්නයි. නැවතත් ඔවුන්ගෙන් ලද පිළිතුර නැත යන්නයි. වෙනත් සාක්ෂිවලින් විමර්ශන කොමිසමට අනාවරණය වූයේ සමස්ථ ලංකා ජමෙයතුල් උලමා සංවිධානය සහ ඇතැම් මුස්ලිම් දේශපාලකයින් ඔවුන්ගේ අවධානය වෙනතකට යොමු කිරීම සඳහා අමාත්‍ය විජේදාස රාජපක්ෂ මුස්ලිම්වරුන්ට එරෙහි අසත්‍ය පතුරවන බවට විවේචනය කළ බවයි. ඔවුන් තවදුරටත් පවසා සිටියේ ඉස්ලාමීය රාජ්‍ය යනු ඇමෙරිකාව විසින් බිහිකල අදහසක් වන අතර, ශ්‍රී ලංකාවේ එම සංවිධානයට සම්බන්ධ කිසිවෙකු නොමැති බවයි.

අප්‍රේල් මස 21 වන දින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් තහවුරු වූ ආකාරයේ සැකයක් හා අවිශ්වාසයක් මුස්ලිම් ආගමික අන්තවාදය පිළිබඳ බහුතර සමාජ තුළ රෝපණය කිරීමට මෙම මුස්ලිම්වරු කණ්ඩායමද යම් තරමකට වගකිව යුතුය.

එමෙන්ම බොදුබල සේනාව වැනි අන්තවාදී බෞද්ධාගමික කණ්ඩායම් වලට එරෙහි විය යුතුව තිබූ අතර, පූජ්‍ය ගලගොඩ අත්තේ ඥාණසාර හිමියන් විසින් සිදු කරන ලද වෛරී ප්‍රකාශවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමටද අවස්ථාව තිබූ නමුත් එසේ සිදුකොට නොමැත.

තම ප්‍රචාරන ව්‍යාපාර පිහිටුවීමේදී, සිංහල බෞද්ධ සමාජ විරෝධී ආගමික සහ ගිහි කණ්ඩායම් දේශපාලන න්‍යාය පත්‍ර පිළිබඳ නිරීක්ෂණය කොට තිබේ. රට තුළ ජීවත් වන සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර එකමුතු බව විශ්වාසය සහ ආත්ම ශක්තිය දුර්වල කිරීමට, දේශපාලන නායකයින්ගේ අනුවන බව, අකර්මන්‍ය බව හිස ඔසවන ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳ යථාර්තය සම්බන්ධයෙන් පැවති දුරාවබෝධය මෙන්ම ඇතැම් දේශපාලනඥයින් ඇතුලු මුස්ලිම් ප්‍රභූ කණ්ඩායම් විසින් සත්‍ය කරුණු ප්‍රතික්ෂේප කිරීමද වක්‍රාකාරයෙන් දායක විය.

ඉතාම කණගාටුදායක කරුණ වන්නේ එවකට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු විෂය භාර අමාත්‍යවරයා ලෙස කටයුතු කළ එම්.එච්.එම්.හලීම් සාක්ෂි ලබාදෙමින් කියා සිටියේ අන්තර් ආගමික අසමඟියක් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව තුළ

පැවැති බව ඔහු නොදත් බව සහ සෙසු ආගමික ජන කොටස්වලට එරෙහිව සහරාන් විසින් ක්‍රියාත්මක කරන ලද ආගමික අන්තවාදය පිළිබඳවද ඔහු දැනුවත්ව නොසිටි බවත් පැවසීමයි. අහිංසක මුස්ලිම්වරුන්ව ඉස්ලාම් ආගමික අන්තවාදීන්ගේ සියලු ආකාරයේ හිංසනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සහ එවන් අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳ අවදානයෙන් සිටීම තුළ එම ගැටලුව නොදුටු සේ නොසිත ඒ පිළිබඳ නිසි පියවර ගැනීමට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු ඇමතිවරයා හට මෙන්ම එම අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් හට වගකීමක් පැවරී තිබුණි.

යම් බෞද්ධ සහ වෙනත් ආගමික සංවිධාන පිළිබඳ තොරතුරු විමර්ශන කොමිසම විසින් අධ්‍යනය කළ අතර, බොදුබල සේනා සංවිධානය තහනම් කළ යුතු බවට විමර්ශන කොමිසම විසින් නිර්දේශ කරන අතර, සෙසු ආගමික සංවිධානවල ක්‍රියාකාරකම් සමීපව අධීක්ෂණය කරමින් යම් ආකාරයක අන්තවාදී ක්‍රියා සිදු වන්නේ නම් ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ගද ගත යුතු බව නිර්දේශ කොට ඇත.

1. සිංහල රාවය: සමාජ විරෝධී සිංහල බෞද්ධ ව්‍යාපාරයකි. කැඳවුම්කරු වන මඟුල් කන්දේ සුදත්ත හිමියන් සහ එම සංවිධානය බොදුබල සේනා සංවිධානය හා සහයෝගයෙන් කටයුතු කරයි.
2. මහසෝන් බලකාය: අමිත් වීරසිංහ සහ අම්පිටියේ සුමනරතන හිමියන් විසින් මෙහෙයවනු ලබන සිංහල බෞද්ධ ප්‍රචාරන ව්‍යාපාරයකි. මෙය වර්ෂ **2018** මහනුවර දිස්ත්‍රික්කයේ දිගන සහ තෙල්දෙනිය ප්‍රදේශවල ඇති වූ කෝලාහල මොවුන් විසින් සිදු කළ බව වාර්තා වේ. බොදු දහම රැක ගැනීමේ අරමුණෙන් සමාජ මාධ්‍ය ඔස්සේ ඉතා සක්‍රිය ලෙස නවකයන් බඳවා ගැනීම සිදු කෙරෙයි. සමාජ මාධ්‍ය වෙත යොමු කොට ඇති ප්‍රචාරන පෝස්ටර් ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් ගන්නා අතර ආගමේ නාමයෙන් මිනිසුන්ගේ හැඟීම් උද්දීපනය කිරීමට සමත් වන බැවින් අන්තවාදී ස්වරූපයක් ගනී. සිංහල බෞද්ධයන්ගේ "විශාලතම හමුදාව"සමඟ සම්බන්ධ වන සියලු දෙනා අනිවාර්යයෙන්ම සටන්

පුහුණුව ලැබිය යුතුය යන්න මෙම ප්‍රචාරන ව්‍යාපාරයේ සටන් පාඨයකි. වර්ෂ 2018 මහනුවර දිස්ත්‍රික්කයේ දිගන හා තෙල්දෙනිය ප්‍රදේශවල ඇති වූ කළබලකාරී සිද්ධිය සම්බන්ධයෙන් මෙම සංවිධාන නිරූපනය කරන ලද භූමිකාව සම්පූර්ණයෙන් විමර්ශනය කොට යම් වැරදි සහගත දෙයක් සිදු වී ඇත්නම්, හැකි ඉක්මණින් අපරාධ චෝදනා ගොනු කළ යුතුය.

3. සිංහලේ ජාතික බලමුළුව: එය සමාජ විරෝධී සිංහල බෞද්ධ ප්‍රචාරන ව්‍යාපාරයකි. අරඹේපොල රතනසාර හිමියන් විසින් මෙහෙයවන මෙම සංවිධානය ස්ථාපිත කොට ඇත්තේ බෞද්ධ හිමිවරුන් කිහිප දෙනෙක් හා රට පුරා විසිරී සිටින ගිහි සාමාජිකයන් පිරිසක් විසිනි.

විමර්ශන කොමිසමට ලැබී ඇති සාක්ෂිවලට අනුව මෙම කණ්ඩායම විසින් මුස්ලිම් ප්‍රජාවට එරෙහිව වෛරිය පතුරවන අතර, එය සිදු කරන්නේ සිංහල බෞද්ධ ප්‍රජාව, මුස්ලිම් වෙළඳ ආයතන හා ආපනශාලා වර්ජනය සඳහා පෙළඹවීමෙන් හා මුස්ලිම් ගැණුම්කරුවන් හට ඉඩම් ආදිය අලෙවි නොකරන ලෙස පැවසීමෙනි. වර්ෂ 2015 දී " සිංහ ලේ" නැමැති ප්‍රචාරක ව්‍යාපාරයක් මෙම සංවිධානය විසින් ආරම්භ කළ අතර, එහි අඩංගු වූයේ ජාතික ධජයෙන් උපුටාගත් සිංහයාගේ රුව සමඟ කහ වර්ණයෙන් සිංහ යන වචනයද, රතු වර්ණයෙන් ලේ යන වචනයද සටහන් කළ ප්‍රචාරන ද්‍රව්‍ය වේ. මෙය ජාතික ධජය යළි අරුත් ගැන්වීමේ උත්සාහයක් වන අතර, ද්‍රවිඩ සහ මුස්ලිම් ප්‍රජාවන් නියෝජනය කරමින් තැඹිලි සහ කොළ පැහැති තුරු ඉන් ඉවත් කොට තිබුණි. මෙම කණ්ඩායම විසින් එහි සලකුණ රැගත් ටීෂර්ට්, කැප් තොප්පි සහ ස්ටිකර් එහි සාමාජිකයන්ට හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන අයට අලෙවි කළ අතර, එමඟින් සෙසු ප්‍රජාවන් අතර ද්වේශය ඇති වන ආකාරයේ අන්තවාදී අදහස් ප්‍රචාරය කරන ලදී.

4. සිංහලේ ජාතික සංවිධානය: විශ්‍රාමික හමුදා නිලධාරියෙකු වන ඩෑන් ප්‍රියසාද් සහ අමිත් වීරසිංහගේ බිරිඳ (මහසෝන් බලකායේ නායකත්වය) විසින් මෙහෙයවන සිංහල බෞද්ධ ප්‍රචාරන ව්‍යාපාරයකි.

5. සිවසේනා ව්‍යාපාරය: රටේ උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන ද්‍රවිඩ හින්දු සංවිධානයකි. එහි ආදර්ශ පාඨය වන්නේ ජනවාර්ගික ගැටලුවට තිරසාර දේශපාලන විසඳුමක් සෙවීම සහ ද්‍රවිඩ ජනතාව හා ඔවුන්ගේ ඉඩම් රැක ගැනීමයි. මඩකලපුව දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ, ඉන් පෙර එල්.ටී.ටී.ඊ සංවිධානය සමඟ යුධ බිමේ සටන් කළ මන්ත්‍රීවරයා මීට නායකත්වය ලබාදෙයි. විවිධ ප්‍රදේශ හා ක්‍රියාකාරකම් පිළිබඳ කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය නායකයින්ද පත්කොට තිබේ. ආගමික නායකයින්, දේශපාලනඥයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් මෙම සංවිධානයේ සක්‍රීය සාමාජිකයන් වන අතර, මෙම සංවිධානය ඉන්දියාවේ සිවසේනා ව්‍යාපාරය සමඟ ද සම්බන්ධතා පවත්වයි. වර්ෂ 2017 දී එහි සාමාජිකයන් විශාල ප්‍රමාණයක් ඉන්දියාවේ මහාරාෂ්ත්‍ර ප්‍රදේශයේ සිට උතුරු පළාතට පැමිණ ඇති අතර, යුධ සමයේ විනාශ වූ හින්දු සිද්ධස්ථාන යළි නිර්මාණය කිරීම හා ඒ ආශ්‍රිතව ආගමික අධ්‍යාපන ආයතන ස්ථාපනය කිරීම පිළිබඳ සාකච්ඡා කොට ඇත.

ශ්‍රී ලංකාවේ සමස්ථ මුස්ලිම් ප්‍රජාව ඉස්ලාම් අන්තවාදීන් හෝ ත්‍රස්තවාදීන් සමඟ සම්බන්ධතා පවත්වන බවට කිසිදු සාක්ෂියක් මඟින් අනාවරණය නොවන බව අවධාරනය කළයුතු අතර, සමාජය තුළ එවැනි මත පළ කිරීමට අනුබල දෙන සමාජ විරෝධී ප්‍රචාරන ව්‍යාපාර මුස්ලිම්වරුන්ට එරෙහිව ක්‍රියාත්මක වෙමින් වගකීම් විරහිත සමාජ මාධ්‍ය ප්‍රචාරවල නිරත වෙති. මේ සම්බන්ධයෙන් යළි යළිත් අවධාරනය කළ යුතු කරුණක් වන්නේ සහින්දමර්දු ප්‍රදේශයේ පවත්වාගෙන ගිය ආරක්ෂක නිවස්නය මුල් අවස්ථාවේදීම පොලීසිය විසින් සොයා ගනු ලැබුවේ එම ගම්

ප්‍රදේශයේ වෙසෙන මුස්ලිම්වරුන් විසින් අදාළ අන්තවාදීන්ට එරෙහිව පොලීසිය වෙත සපයන ලද තොරතුරු නිසා බවයි.

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධාන ක්‍රියාකාරකම් ඇරඹීමට කාලය එළඹ ඇති බව මෙනයින් සනාථ වන අතර, එසේ සිදු කළ යුත්තේ වර්ෂ 2019 අප්‍රේල් මස එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් ප්‍රජාවන් අතර ඇති වූ උණුසුම් තත්ත්වය මෙන්ම 2019 වසරේ මැයි මස කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්ක තුළ මුස්ලිම් ජනතාවට එරෙහිව වෙන් වෙන්ව එල්ල කරන ලද ප්‍රහාර පිළිබඳ මතකයන් තවමත් ඇතැම් අයගේ සිත් තුළ තවමත් ජීවමානව පැවැතිය හැකි බැවිනි.

අභ්‍යන්තර අරගල තත්ත්වයක් තුළ දිගු කාලයක් ගෙවූ රටක් වශයෙන් ජනවාර්ගික හා ආගමික අසමගියේ ප්‍රතිඵල අප අමතක නොකළ යුතු අතර, එවැනි සිදුවීම් තුළින් සියලු දෙනාටම ශෝකාකුල ජීවිත උරුම කරන ආකාරයේ දීර්ඝ කාලීන අර්බුද නිර්මාණය වීමට ඉඩ ඇත. ප්‍රජාවන් තුළ අන්තවාදී ප්‍රචණ්ඩත්වයට හා වෛරී ක්‍රියාවන් වෙත සිදු කෙරෙන පෙළඹවීම් මැඩපැවැත්වීම සඳහා පැවතිය යුතු ප්‍රතිවාර්ජිතතාව ගොඩ නැගීමේදී ඉහළම දේශපාලන කැපවීම සහිත පුළුල් ව්‍යුහයකින් යුතු ප්‍රවේශයක් මෙන්ම ආගමික මැදිහත්වීම් සහ හවුල්කාරිත්වයන් (සිවිල් සමාජය සහ සංවර්ධන හවුල්කරුවන්) සමඟම යහපාලනය නීතියේ ආධිපත්‍ය සහ මානව ගරුත්වය ඇතුලත් පද්ධති රාමුවක්ද අවශ්‍ය වේ. මේ සඳහා සවිමත් දේශපාලනික අභිමතයක් සහ මනා සවි බලයකින් යුත් ආයතනික යාන්ත්‍රණයක් මෙහි මූල හේතු හඳුනා ගැනීමේදී බෙහෙවින් ඉවහල් වේ. ඒ අයුරින් තිරසාර සාමයක් උදෙසා ආගමික ගැටුම් සහ අනන්‍යෝන්‍ය ස්ථාවරතාව කඩිනමින් විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ.

එහිදී නිරීක්ෂණය වී ඇති තවත් කරුණක් නම් සමස්ථ ලංකා ජමෙයතුල් උලමා සංවිධානය විසින්ද, සිංහල බෞද්ධ හා මුස්ලිම් ප්‍රජාවන්

අතර සමඟිය වර්ධනය කිරීම සඳහා යම් ප්‍රගතිශීලී පියවරයන් කිහිපයක් ගෙන ඇති බවයි. ඒ සඳහා ඔවුන් සමාජ සංවාද හා ඉස්ලාම් භීතිකාව පිළිබඳ ග්‍රන්ථ මාලාවක් ප්‍රකාශයට පත් කර ඇති අතර, විමර්ශන කොමිසම විසින් සඳහන් කළ කරුණක් වන්නේ මෙම පොත් සියල්ල නැවතත් විමසා බැලිය යුතු බවයි. උදාහරණයක් ලෙස සමාජ සංවාද පිළිබඳ පළමු පොතෙහි සඳහන් වන කරුණක් නම් බෞද්ධ වෙහෙර විහාරවල වාදනය කරන බෙර සාදා ඇත්තේ ගවයින්ගේ සම්වලින් බවයි. මෙවැනි ග්‍රන්ථ සංහිඳියාවේ නාමයෙන් ප්‍රකාශයට පත් කිරීමෙන් සැබවින්ම සිදු වන්නේ ප්‍රජාවන් එකිනෙකාගෙන් දුරස්වීමයි. මෙම ග්‍රන්ථ කියවන අය තර්කානුකූලව සිතන පාඨකයින් වෙතත් නොවෙතත් ඔවුන්ට ඒ පිළිබඳ ආවේගයක් ඇති අතර, ඊට හේතුව එමඟින් පාඨකයාගේ හැඟීම් ප්‍රකම්පනය කරන බැවිනි.

විමර්ශන කොමිසම විසින් මිස්කත් පර්යේෂණ ආයතනයේ උස්තාද් එම්.ජේ.එම්.මන්සූර් (නලිනි) විසින් සම්පාදනය කරන ලද " අල්කුර්ආනය ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන්නේද?" යන හිසින් යුතු ග්‍රන්ථය පිළිබඳ විශේෂ සටහනක් දක්වන අතර, එය ඉතාමත් තනි පුද්ගලයෙක් විසින් ඉස්ලාම් ආගමික අන්තවාදය අහිංසක මුස්ලිම් දරුවන්ගේ මනස් තුළින් ඉවත් කිරීමට ඉවහල් වන ඉතාමත් ප්‍රගතිශීලී ක්‍රියාවක් ලෙස හඳුන්වා තිබේ. මෙම ග්‍රන්ථය තුළින් ශුද්ධ වූ කුර්ආනයේ සමහර පාඨ, දීර්ඝ කාලයක් තිස්සේ යුධ වැදී සිටි මොහොමඩ් නබිතුමා විසින් එම යුද්ධ කාලයට පමණක් අදාළ වන සේ සකස් කළ ඒවා ලෙස අර්ථ දක්වා ඇත. (උදාරහණ ශුද්ධ වූ යුද්ධය හෙවත් ජිහාඩ්) සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සංවිධානය විසින් මෙම ග්‍රන්ථය සඳහා වලංගුතාවයක් ලබා දෙමින් පවසා සිටියේ ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම් ජනතාවට කිසිදු ප්‍රජාවකට එරෙහිව යුද වැදිය නොහැකි බව හා ඉස්ලාමයේ නාමයෙන් අහිංසක මිනිස්සුන් මරා දැමිය නොහැකි බවයි. සැබැවින්ම සිය දිවි නසා ගැනීම ශුද්ධ වූ කුර්ආනයට අනුව හරාම් එහෙත්

නොකළ යුත්තක් වේ. බොහෝ මුස්ලිම් දේශපාලනඥයන්ද මෙම ස්ථාවරය පිළිගෙන තිබේ.

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ අනුපමේය ප්‍රතිසන්ධාන ප්‍රයත්නය ශ්‍රී ලංකා ඉතිහාසයේ අමතක නොවන සන්දිස්ථානයක් ලෙස සටහන් වේ. උන්වහන්සේ විසින් අවිහිංසාව, දයානුකම්පාව සහ සමාව සතුරන් වෙත ප්‍රධානය කරන ලෙස සියලු ශ්‍රී ලාංකිකයන් වෙතින් සිදු කළ ආයාචනය හේතුවෙන් පැතිරීමට නියමිතව තිබූ ජනවාර්ගික හා ආගමික අසමගිතාවය තවදුරටත් උත්සන්න වීමට පැවැති අවස්ථාව ඇහිරීම තුළින් රටට සිදු වීමට ගිය මහත් විනාශයක් වළක්වා ගැනීමට හැකි විය.

මෙරට සියලු ආගමික නායකයන් විසින් උකහා ගත යුතු පාඩමක් වන්නේ මානව වර්ගයා කෙරෙහි වන අපරිමත දායව මිස අන් කිසිවක් නොවේ. ඔවුන් දුප්පත් ද පොහොසත්ද යන වග, සමේ පැහැය සුදු හෝ කළු ද යන වග කුමන ආගමකට අයත් වන්නේද යන වග සංනිවේදනය සඳහා යොදා ගන්නා භාෂාව කවරක්ද යන වග වැනි දේ මත පදනම්ව කිසිදු ආකාරයකින් වෙනස් කොට සැලකීමක් සිදු කළ යුතු නැත.

ඔවුනට ස්වකීය ප්‍රජාවන්ගේ හැඟීම් සහ බුද්ධියට ආමන්ත්‍රණය කිරීමේ හැකියාව තිබිය යුතුය. ඒ අයුරින් තම අනුගාමිකයින් ප්‍රති සන්ධානය උදෙසා වන එකමුතු බව, සාමය හා සමගිය කරා යන ගමන වෙත මෙන්ම එකම ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් වෙත යොමු කළ හැකි විය යුතුය.

වර්ෂ 2019 දෙසැම්බර් මස විමර්ශන කොමිසම ඉදිරියේ දින දෙකක් පුරා සාක්ෂි ඉදිරිපත් කළ උන්වහන්සේ එහිදී පවසා සිටියේ ආගම් පවතින්නේ සාමය උදෙසා වුවත් අවාසනාවන්ත ලෙස මෙම පාරිභෝජනවාදී ලෞකිකත්වය තුළ මිනිසුන් බෙදන කාරණයක් බවට ආගම පත් වී ඇති

අතර, එයින් ඉටු වියයුතු කාර්යය වන මිනිසා රැකබලා ගැනීම, පෝෂණය කිරීම සහ එකමුතු බවට පත් කිරීම ඉන් සිදු නොවන බවයි. සියලුම ආගම්වල දේශනා කොට ඇත්තේ අන්‍ය අය අදහන ආගම් වෙත අන්‍යෝන්‍ය ගරුත්වය දැක්විය යුතු බවයි. මෙලොව උපන් කිසිදු ආගමික නායකයෙක් මිනිස් වර්ගයා තුළ බෙදීම් ඇති විය යුතුය, දෙවියන්ගේ නාමයෙන් මිනිසුන් මරා දැමිය යුතුය යනාදි වශයෙන් පවසා නැත. උන්වහන්සේ පැවසූ පරිදි මේ රට තුළ පවතින ආගමික විවිධත්වය ආශිර්වාදයකි. එතුමා තවදුරටත් ප්‍රකාශ කර සිටියේ ආගම් නිවැරදි ආකාරයෙන් අනුගමනය කළහොත් වඩා යහපත් ජීවිතයක් උදෙසා වන සමාජීය වෙනසකට එමඟින් මඟ පෑදෙනු ඇති බවයි. උන්වහන්සේ පවසා සිටි තවත් කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ අලංකාරය රැඳා පවතින්නේ එහි විවිධත්වය මත බවයි. එය සමාන කළ හැක්කේ අප අවට පවතින ස්වභාවික පරිසරය තුළ ඇති තුරුලතා වෙතින් ගම්‍ය වන විවිධත්වය සමඟ ඇති සුන්දරත්වයටයි.

ආගම් අතර පවතින අන් මත නොවිමසීමේ ලක්ෂණය හා සැබෑ මූල හේතු හඳුනා ගැනීමට රජය විසින් තිරසාර පියවරක් ගත යුතු අතර, රට තුළ ජීවත් වන විවිධ ජනවාර්ගික ප්‍රජාවන් අතර විශ්වාසය ප්‍රවර්ධනය කිරීමටද කටයුතු කළ යුතුය. එමෙන්ම මනාව නිර්මාණය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් මත පදනම්ව (ශ්‍රී ලංකාවේ ආගමික සමඟිය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම) යුහුසුළුව ක්‍රියාත්මක විය යුතු වනවා මෙන්ම එය සිදු කළ යුත්තේ පාර්ලිමේන්තුව මඟින් අනුමත කරවන ලද ද්වීපාර්ශවිකත්වයක් අන්තර්ගත කළ හැකි සවිමත් ප්‍රතිපත්ති රාමුවක් මතය.

ඉහත දක්වා ඇති කරුණු කාරණා, වාචික හා ලේඛනමය සාක්ෂි මඟින් සහ විමර්ශකයන්ගෙන් හා බුද්ධි අංශවල ප්‍රකාශ ඇතුළුව විමර්ශන කොමිසම ඉදිරියේදී ඉදිරිපත් කරන ලද සාක්ෂි වල කොටසකි.

## 26 වන පරිච්ඡේදය

### වින්දිතයින් සඳහා වන්දි, සුභසාධන පියවර සහ සහන වැඩසටහන්

පරීක්ෂණ කොමිෂමේ කාර්ය භාර්යේ එක් කොටසක් වූවේ අවශ්‍ය පරිදි වර්ෂ 2019 අප්‍රේල් මස 21 වෙනි දින සිදුවූ සිදුවීමෙන් විපතට පත් වූ පුද්ගලයන් හට සහය ලබා දීමට සහ පුනරුත්ථාපනය කිරීමට නිසි පියවරයන් නිර්දේශ කිරීමයි.

වින්දියන් හට සහය ලබා දීමේ ක්‍රමවේදය තුළ රාජ්‍ය හා පුද්ගලික අංශවල කාර්ය භාර්ය විමර්ශන කොමිෂම විසින් විමසීමට ලක් කරනු ලදී. ඒ අනුව පහත දැක්වෙන ආයතන හා පුද්ගලයන්ව විමර්ශන කොමිෂමක් හමුවට කැඳවන ලද්දේ වින්දිතයන් හට ලබා දී ඇති සහන හා වන්දි පිළිබඳ විමසා දැන ගැනීමටයි.

හානිපූර්නය සඳහා ස්ථාපිත කරන ලද කාර්යාලය ක්‍රියාත්මක වන්නේ අධිකරණ හා බන්ධණාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ වන අතර වර්ෂ 2018 අංක 34 දරණ පනත මහින් වර්ෂ 1988 අංක 29 දරණ පුද්ගලයින් දේපල සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරි පනත අවලංගු කිරමින් එය ස්ථාපනය කරන ලදී.

එම පනතේ අරමුණුවලට අනුව එහි කාර්ය භාර්ය වන්නේ හානිපූර්ණ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකාරකත්වය සැපයීම මෙන්ම අගතියට පත් පුද්ගලයින් හට කේවල සහ සමුච්ත හානි පූර්ණයන් ලබා දීම හා සුදුසුකම් සපුරන ලද අගතියට පත් පාර්ශව සඳහා හානි පූර්ණය සැපයීමේ ක්‍රියාවලිය අධීක්ෂණය සහ ඇගයීමට ලක් කිරීමයි. එහි වැඩබලන අධ්‍යක්ෂක සිනී මොහොමඩ් බදූර්දීන් විමර්ශන කොමිෂම ඉදිරියේ සාක්ෂි ලබා දීම සඳහා පෙනී සිටියේය. මෙම කාර්යාලය සඳහා වින්දිතයන් පදිංචිව සිටි ප්‍රදේශවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සහය ලැබුණි.

වින්දිතයන් වෙත ගෙවීම සිදු කිරීමේදී හානිපූර්ණ කාර්යාලය සඳහා අවශ්‍ය සියලු ලිපි ලේඛන ප්‍රාදේශිය ලේකම්වරයා විසින් සකසන ලද අතර නිර්දේශද සමඟ ගෙවීම් සඳහා ඒවා යොමු කරන ලදී.

රාජ්‍ය සේවා පලාත් සභා පලාත් පාලන අමාත්‍යාංශය වනාහි රජයේ රාජ්‍ය සේවය හා රාජ්‍ය පරිපාලන කළමණාකරනය පිළිබඳ කටයුතු කරන ලද ප්‍රධානතම අමාත්‍යාංශයයි . පොදුවේ කාර්යක්ෂමතා හා ඵලදායි සේවාවක් පුරවැසියන් හට හා [illegible] බාහිර මෙන්ම අභ්‍යන්තර සේවාලාභින් හට සැලසීම එහි වගකීමයි.

රාජ්‍යසේවා ක්ෂේත්‍රයේ මානව සම්පත් කළමණාකරනය කරන ප්‍රධානතම ආයතනය වශයෙන් ශ්‍රම බලකායේ යහපැවැත්ම හා සුභසාධනය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම මෙම අමාත්‍යාංශයේ කාර්ය භාර්යයි.

රාජ්‍ය සේවා පලාත් සභා පලාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරින් කීප දෙනෙකු විමර්ශන කොමිෂම වෙත කැඳවන ලද්දේ පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දිතයන් හට ගෙවන ලද වන්දි මුදල් සහ ඔවුන්ගේ සුභසාධනය වෙනුවෙන් ගෙන ඇති පියවර පිළිබඳව විමසීම සඳහාය ඔවුන් නමින් ආර්.එම්.එස් රත්නායක මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආයතනය. කේ.ජී හිරන හෙළරුවන් කිරිඇල්ලෙ මහතා කඨාන ප්‍රාදේශීය ලේකම් කටුවාපිටිය ශාන්ත සෙබස්තිය දේවස්ථානයට එල්ල වූ ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා වන්දි ලබා දීම සිදු කෙරුණේ ඔහුගේ පරිපාලන හා අධික්ෂණය යටතේය.

සුරංගි කාන්චනා ගුණවර්ධන මහත්මිය කොළඹ ප්‍රාදේශිය ලේකම් කොච්චිකඩේ ශාන්ති අන්තෝනී දේවස්ථානයට සහ කොළඹ ප්‍රදේශයේ හෝටල් 04 කට හා ලැහම්හලකට මෙන්ම දෙමටගොඩ මහවිල උයනේදී සිදුවූ අලාභ හානී සඳහා වන්දි ප්‍රධානය කරනු ලද්දේ ඇයගේ පරිපාලනය හා අධික්ෂණය යටතේය.

විමර්ශන කොමිෂම ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කළ රජයේ නිලධාරින් විසින් පාස්කු ප්‍රහාරයට හේතුවෙන් විපතට පත්වූවන් සඳහා ප්‍රධාන කල වන්දි සහ ලබා දුන් විවිධ සුභ සාධන මෙන් සහන පිළිබඳව දිර්ඝ වශයෙන් විස්තර කළහ. මෙහිදි සඳහන් වූ කරුණක් නම් අමාත්‍ය මණ්ඩල අනුමැතියද සහිතව මහාභාණ්ඩාගාරය මඟින් වින්දිතයන් හට ( මියගිය පුද්ගලයන්ගෙන් යැපෙන්නන් තුවාල ලැබූවන් සහ දේපල හානී වලින් පීඩාව ලැබූ පුද්ගලයන්) මූල්‍යාධාර ලබා දීම සඳහා අරමුදල් සම්පාදනය කොට ඇති බවයි. මහ

භාණ්ඩාගාර හරහා රජය විසින් රුපියල් 301,062,500 /= ක මුදලක් මෙම කර්තවය සඳහා වෙන්කොට තිබේ.

## 2019.04.21 වෙනි දින සිදුවූ ත්‍රස්ථ ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා ගෙවන ලද වන්දි

### (2020.12.06 දින දක්වා වන ප්‍රගති වර්තාව )

| අනු අංකය | සිද්ධිය | අලාභහානි ප්‍රමාණය සහ ගෙවන ලද මුදල් | | | |
|---|---|---|---|---|---|
| | | මරණ සඳහා | | තුවාල සඳහා | |
| | | අලභා හනි ප්‍රමාණය | ගෙවන ලද මුදල රු. | අලභා හනි ප්‍රමාණය | ගෙවන ලද මුදල රු. |
| 1. | කටුවා පිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය | 108 | 108,000,000 | 280 | 45,087,500 |
| 2. | මඩකලපුව සියෝ දේවස්ථානය | 30 | 30,000,000 | 79 | 13,325,000 |
| 3. | කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය | 50 | 50,000,000 | 102 | 16,575,000 |
| 4. | ෂැංග්‍රිලා හෝටලය | 10 | 10,000,000 | 11 | 2,275,000 |
| 5. | සිනමන් ග්‍රෑන් හෝටලය | 7 | 7,000,000 | 13 | 1,900,000 |
| 6. | කින්ස්බරි හෝටලය | 1 | 1,000,000 | 9 | 1,225,000 |
| 7. | දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම්හල | 2 | 2,000,000 | - | - |
| 8. | මහවිල් උද්‍යානය , දෙමටගොඩ | 3 | 3,000,000 | - | - |
| 9. | විදේශියන් | 9 | 9,000,000 | 12 | 675,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුළු අගය | 220 | 220,000,000 | 506 | 81,062,500 |
| | සමස්ථ මරණ සංඛ්‍යාව | 220 | | | |
| | මරණ සඳහා ගෙවන ලද මුදල | 220,000,000 | | | |
| | තුවාල ලැබූ මුලු ගණන | 506 | | | |
| | තුවාල ලැබුවන් සඳහා ගෙවන ලද මුදල | 81,062,500 | | | |
| | මරණ හා තුවාල සමස්ථ සංඛ්‍යාව | 726 | | | |
| | මුල් එකතුව රු. | 301,062,500.00 | | | |

මූලාශය: හානී පූර්ණ කාර්යාලය

කැබිනට් තීරණයක් මත මෙම ගෙවීම් සිදු කර ඇති අතර ඒ සඳහා ත්‍රස්තවාදී ප්‍රහාරවලට වන්දි ගෙවීමේ කාර්ය පවරා ඇති හානී පූර්ණ කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මෙම ගෙවීම් සඳහා අදාල කොට ගෙන ඇත. හානීපූර්ණ කාර්යාලයේ වැඩබලන අධ්‍යක්ෂකවරයා විසින් 2016.04.22 දිනැති කැබිනට් සන්දේශය සහ 2016.04.25 දිනැති තීන්දුව විමර්ශන කොමිෂම වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව හානී පූර්ණ කාර්යාලය විසින් මියගිය එක් අයකුවෙනුවෙන් රුපියල් මිලියනයක් බැවින් ගෙවීම් සිදු කොට තිබේ. රුපියල් පන්ලක්ෂයක උපරිමයකට හා රුපියල් පනස්දහසකට අවමයකට යටත්ව තුවාල ලැබුවන් සඳහා අදාල තුවාලවල බරපතල තත්ත්වය ස්භාවය අනුව එම වන්දි මුදල් ගෙවා තිබේ. අභාවයට පත් පුද්ගලයන් සඳහා ගෙවීමට නියමිතව තිබූ රුපියල් මිලියන මුදල් වටිනාකමින් රුපිලයල් ලක්ෂයක මුදලක් අවම මුදල් කටයුතු සඳහා ඉක්මනින් ගෙවීමට කටයුතු කර තිබේ. ඉහත සඳහන් උප ලේඛනයේ සඳහන් වන පරිදි උපරිම ගෙවීම වන රුපියල් පන් ලක්ෂයක මුදල ගෙවනු ලැබ ඇත්තේ ද තුවාල ලැබූ අයගෙන් ඉතා සුළු ප්‍රතිශතයකට පමණි. ඒ පිළිබඳව තව

දුරටත් විමසීමේ දී විමර්ශන කොමිෂමට දැනගන්නට ලැබුණේ අදාළ මුලද ගෙනවූ ලැබ ඇතේත් තුවාල ලැබූ පුද්ගලයාගේ ඉපයීමේ එහැකියාවන් මත පදනම්ව මිස තුවාල වල ස්වභාවය අනුව බවයි. එවැනි ගණනය කිරීම් වලට හේතු පාදක වූ කාරණා කිසිදු අයුරකින් විස්තර කළ නොහැකි වනු අතර ඕනෑම සාධාරණ සිතන පුද්ගලයෙකුගේ හදවත කම්පා කරවීමට ඒවා සමත් වනු ඇත. පැහිදිලිව ඉහත දක්වා ඇති පරිදි මෙහිදී සලකා බලන්නේ මිනිසුන් පිළිබඳව බැවින් පූජ්‍ය ලොරන්ස් රාමනායක ඉතා බරපතල තුවාල ලැබූ අතර සෙසු බොහෝ දෙනා තම ඉතිරි ජීවිත කාලය පුරාවටම අංගවිකල තැනැත්තන් බවට පත්විය. මේ පිළිබඳ උත්ප්‍රසාත්මක කාරණය වන්නේ මේ සඳහා වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව වැඩබලන අධ්‍යක්ෂකවරයා විසින් ම පිළිගන්නා ලැබීමයි.

කෙසේ වුවද සාක්ෂි ප්‍රකාරව **2019** අප්‍රේල් මස **21** වන දින සිදු වූ සිදුවීම් ආශ්‍රිතව ජීවිත **271** ක් අහිමි වී ඇති අතර ඒ අතුරින් වන්දී ගෙවීම් සිදු කොට ඇත්තේ අභාවප්‍රාප්ත අයගෙන් **220** දෙනෙකුට පමණක් බව විමර්ශන කොමිසම විසින් නිරීක්ෂණය කොට තිබේ.මේ සම්බන්ධ කොමිසමේ නිර්දේශය වන්නේ රජය විසින් අහිමි වූ ඉතිරි ජීවිත **51** වෙනුවෙන් ද වන්දි ගෙවිය යුතුය යන්නයි.

මේ සම්බන්ධව ඉස්මතු විය යුතු තවත් කාරණයක් ද තිබේ. එනම් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාරව කැබිනට් අනුමැතිය ද සහිතව විදේශිකයන් ද ඇතුළුව සියළු අභාවයන්ට සහ ආබාධිත තත්ත්වයන්ට රජව නිසින් වන්දි ප්‍රදානය කළ අතර, විමර්ශන කොමිසම මඟින් විමර්ශනය කරන ලද්දේ දිගන සහ බේරුවල සිදුවීම් වලදී පාස්කු ප්‍රහාරය හා සන්සන්දනය කරන කල්හි වන්දි ගෙවීම්වල පරස්පරතා දක්නට ලැබෙන බවයි.

වර්ෂ **2018** දී යථෝක්ත සිදුවීම් හට ගන්නා ලද්දේ බෞද්ධ සහ මුස්ලිම් ජන කොටස් අතර පැන නැඟුනු ගැටුම් හේතුවෙනි. මෙහිදී අහිමි වූ මිනිස් ජීවිත සඳහා ගෙවන ලද වන්දි මුදල පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේදී ජීවිත අහිමිවීම් සඳහා ගෙවන ලද වන්දි මුදල මෙන් දෙගුණයකි. එමෙන්ම බේරුවල හා දිගන ප්‍රදේශවලදී විපතට පත්වූවන්ගේ

දේපළ හානි සඳහා ඒවායේ සැබෑ වටිනාකම වන්දි මඟින් පියවා ඇති අතර, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා ඒ ආකාරයෙන් සම්පූර්ණ වන්දි මුදල ගෙවා නොමැත.

එවැනි වෙනස් ගෙවීම් පටිපාටියක් අනුගමනය කිරීමට කිසිදු ආකාරයක මිනුම් දණ්ඩක් භාවිත කළ හැකි බව විමර්ශන කොමිසමට නිරීක්ෂණය නොවේ. අවම වශයෙන් සැලකුවහොත් මෙම අවස්ථා දෙකේදීම පුරවැසියන් හට අවශ්‍ය ආරක්ෂාව සැපයීමට රජය අපොහොසත් වී තිබේ.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා කතෝලික සභාව විසින් ගෙන ඇති සුභ සාධන පියවරයන් පිළිබඳවද විමර්ශන කොමිසම අවධානය යොමු කර තිබේ.

සෙත්සරණ නමින් හඳුන්වන කැරිටාස් කලම්බු අනුබද්ධිත වන්නේ කැරිටාස් ශ්‍රී ලංකා ආයතනයට වන අතර, (SEDEC) ශ්‍රී ලංකා කතෝලික සභාවේ සාමය හා මානව සංවර්ධනය උදෙසා වූ කොමිසමේ යුක්තිය උදෙසා වූ ජාතික ලේකම් කාර්යාලය යටතේ වර්ෂ 1983 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ලියාපදිංචි කොට ඇත. සෙත්සරණ යනු කොළඹ අගරදගුරු පදවියේ සමාජ සේවා අංශයයි. මෙම පුණ්‍යායතනය ස්ථාපිත කොට ඇත්තේ වර්තමාන අගරදගුරු අතිඋත්තම මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වර්ෂ 1986 දී මානව සංවර්ධන කොමිසමේ පදිවි අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන කාලයේදී ය.

මෙහිදී සිදු වී ඇති හානියේ බරපතලකම වටහා ගත් සෙත්සරණ ආයතනය විසින් ඵලදායි ලෙස සහාය, ආධාර හා සහන සැලසීම සඳහා හානියට පත් පවුල් පහත සඳහන් මූලික වර්ගීකරණය යටතේ දෙවර්ගයකට බෙදා වෙන්කොට තිබේ. මෙහිදී එම පවුල් අයත් වූයේ කුමන ප්‍රජාවකටද, කවර කුළයකටද, ගෝත්‍රයකටද, ආගමකටද යන්න කිසිසේත් සලකා බලා නොමැත.

1. මෙම ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස තම පවුලේ සාමාජිකයන් එක් අයෙකු හෝ කිහිප දෙනෙක් අහිමි වූ පවුල් සහ

2. මෙම ප්‍රහාරයෙන් සිය පවුලේ එක් සාමාජිකයෙක් හෝ සාමාජිකයන් කිහිප දෙනෙක් තුවාල ලැබූ පවුල්.

මෙම ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස තම පවුලේ සාමාජිකයන් එක් අයෙකු හෝ කිහිප දෙනෙක් අහිමි වූ පවුල්.

- මෙම පවුල් ද තවදුරටත් උප වර්ගීකරණයන්ට ලක් කොට ඇති අතර,

  ඍජු සහ වක්‍ර

- ඍජු ගණයට ඇතුලත් වන පවුල් වන්නේ තමාගේම පවුලේ සාමාජිකයෙකු මෙම ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස ජීවිතක්ෂයට පත් වූ විට.(පියෙකු, මවක, දියණියක හෝ පුතෙකු යනාදි වශයෙන්)
- මියගිය පුද්ගලයා තමාගේම පවුලේ සාමාජිකයෙක් නොවූවද ඥාති පවුලක සාමාජිකයෙක් වූ විට.(උදාහරණ ලෙස මාමණ්ඩිය, නැන්දම්මා හෝ නීත්‍යානුකූල ඥාතිත්වයක් පවතින පවුලේ සාමාජිකයෙක් මියගිය විට)

මේ අයුරින් තමාගේම පවුලේ සාමාජිකයෙකු හෝ ඥාති පවුලක සාමාජිකයෙකු ප්‍රහාරය හේතුවෙන් මියගිය පවුල් සඳහා අවමංගල්‍ය කටයුතු සිදු කිරීමට අවශ්‍ය වියදම් ලෙස සෙත්සරණ විසින් එක් සාමාජිකයෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂයක් බැගින් ගෙවීමක් සිදු කොට ඇත. (උදාහරණ ලෙස පවුලේ සාමාජිකයින් දෙදෙනෙක් මියගිය අවස්ථාවේදී එම පවුලට රුපියල් ලක්ෂ 2 ක මුදල් ගෙවා තිබේ)

2. මෙම ප්‍රහාරයෙන් සිය පවුලේ එක් සාමාජිකයෙක් හෝ සාමාජිකයන් කිහිප දෙනෙක් තුවාල ලැබූ පවුල්.

- මෙම පවුල් උප වර්ගීකරණයන් තුනක් යටතේ වර්ග කර තිබේ.

  තීරණාත්මක, බරපතල සහ සුළු තුවාල.

- පළමු සතිය තුළදීම වෛද්‍ය ප්‍රතිකාර වියදම් දරා ගැනීම සඳහා තුවාල ලැබූ එක් පුද්ගලයෙකු සඳහා සහනාධාර ලෙස රුපියල් 50,000 ක මුදල් ගෙවන ලදී.

- ඉන් අනතුරුව සිදුකරන ලද සමීක්ෂණයක් සහ අගතියට පත් පවුල් වෙත ගොස් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ලබා ඇති තුවාලවල බරපතල බව සැළකිල්ලට ගෙන යළිත් ආධාර මුදලක් ප්‍රධානය කොට තිබේ.
- මෙම සහන සැලසීමේ මූලික අරමුණ වන්නේ මෙම පවුල් සඳහා වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් වැය වන වියදම් සහ සෙසු දෛනික වියදම් සඳහා ප්‍රමාණවත් මුදලකින් ආධාර කිරීමයි.

  - ප්‍රතිලාභීන් තෝරා ගැනීමට යොදා ගත් මිණුම් දඬු.

  පහත දැක්වෙන වර්ගීකරණයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. අගතියට පත් පවුල්වල පවුල් පසුබිම අධීක්ෂණයට ලක් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව පහත දැක්වෙන ප්‍රතිලාභීන් තෝරා ගැනීම් මිණුම් දඬු හඳුන්වා තිබේ.

  1. දෙමාපියන් දෙදෙනාම අහිමි වයස 18 ට අඩු දරුවන්.
  2. වසර 18 ට වැඩි දෙමව්පියන් දෙදෙනාම අහිමි වූ දරුවන්. මේ යටතේ ආදායම් අහිමි අවිවාහක දරුවන් තෝරා ගන්නා ලදී.
  3. පවුලේ එක් සාමාජිකයෙකු හැර සෙසු සියලු සාමාජිකයන් මරණයට පත්ව ඇති විට.
  4. පවුලේ මියගිය සාමාජිකයා පහත දැක්වෙන භූමිකාවලින් එකක් නිරූපණය කොට ඇත්නම්.
     - I. පවුලේ මුදල් උපයන පුද්ගලයා.
     - II. ගර්භණී බිරිඳක් සිටින අය.
     - III. වයස 18 අඩු දරුවන් සිටින අය.
     - IV. වයස අවුරුදු 18 වැඩි අවිවාහක දරුවන් සිටින අය.
     - V. පවුලේ එක් සාමාජිකයෙක් සදාකාලික ආබාධිත තත්ත්වයට පත්ව ඇති විට.

VI. පවුලේ සාමාජිකයින් බරපතල තුවාල ලබා ඇති විට.

ඉහත සඳහන් සියලුම වර්ගීකරණයන්ට අදාළ පවුල්වල සියලු වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් දරණ ලද්දේ සෙත්සරණ විසිනි.

අගතියට පත් වූ පවුල් සඳහා සෙත්සරණ විසින් පහත දැක්වෙන කුටුම්බ මූලික ආධාර වැඩ සටහන් ක්‍රියාත්මක කළ අතර, එමඟින් නව ව්‍යාපාර ආරම්භ කිරීම සහ දැනට ලබාගෙන ඇති ණය පියවීම මඟින් ඔවුන්ගේ මූල්‍යමය තත්ත්වය උසස් කර ගැනීම අරමුණු කොට ගෙන තිබිණි.

1. සියලු අගතියට පත් පවුල් සඳහා ගෘහස්ත සුළු පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය මඟින් ඔවුන්ගේ ගෘහස්ථ ආදායම වැඩි කරගැනීම සඳහා ආදායම් ජනන වැඩ සටහන්.
2. සෘජුව අගතියට පත්ව ඇති දරුවන් සඳහා ශිෂ්‍යත්ව.
3. ණය පියවීම.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත්වූවන්ගේ එදිනෙදා ජීවිතය පහසුවෙන් ගතවන බවට තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් ලෙස සෙත්සරණ විසින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් යෝජනා කොට තිබේ.

- අගතියට පත් දරුවන් සඳහා අධ්‍යාපන ආධාර.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත් වූ සහ අගතියට පත් දරුවන් උදෙසා වෘත්තීය පුහුණු, උසස් අධ්‍යාපන ආධාර සහ ක්‍රීඩා ආධාර යන අංශයන් යටතේ විශේෂ ශිෂ්‍යත්ව වැඩ සටහනක් රජය විසින් ක්‍රියාත්මක කිරීම මැනවි.

- ශක්‍යතා මත පදනම් වූ ජීවනාධාර.

අගතියට පත් පවුල් සඳහා නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා හෝ ඔවුන් දැනට සිදු කරන ව්‍යාපාර දියුණු කර ගැනීම සඳහා විශේෂ මුදල් ආධාර ලබාදීම උදෙසා විශේෂ ජීවනාධාර වැඩ සටහනක් රජය විසින් ක්‍රියාත්මක කිරීම මැනවි.

- වෛද්‍යාධාර.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් බරපතල තුවාල ලැබූ සියලු දෙනා සඳහා රජය විසින් විශේෂ වෛද්‍ය ප්‍රතිකාර රක්ෂණාවරණයක් ලබාදීම මැනවි.

➢ නිවාස අවශ්‍යතා.

අගතියට පත් පවුල්වල ගෘහ මූලිකයා අභාවයට පත් වී ඇත්නම් හෝ බරපතල තුවාල ලැබූ සාමාජිකයින් සිටී නම් හෝ කුළී නිවාසවල ජීවත් වන්නේ නම් එවන් පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාදීම සඳහා රජය විසින් ප්‍රමුඛත්වය ගැනීම මැනවි.

➢ රජයේ රැකියා සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අගතියට පත් දරුවන් සඳහා රජයේ රැකියා ලබාදීමේ ක්‍රමවේදයක් රජය මඟින් සකස් කිරීම මැනවි.

➢ කැපකරු මාපිය වැඩ සටහන.

සිය දෙමාපියන් දෙදෙනාම අහිමි වයස **18** ට අඩු දරුවන්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා රජය විසින් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම මැනවි.

➢ කල් බදුද ඇතුලුව ණය පියවීමේ ක්‍රමවේද.

කොළඹ අභරදගුරුතුමා විසින් මිලියන **42.9** ක මුදලක් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට එල්ල වූ ප්‍රහාරයෙන් විපතට පත් වූ පවුල් **114** ක් අතර බෙදා දෙන ලදී. කොළඹ අභරදගුරුතුමා විසින් මිලියන **95.579** ක මුදලක් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට එල්ල වූ ප්‍රහාරයෙන් විපතට පත් වූ පවුල් **281** ක් අතර බෙදා දෙන ලදී. කොළඹ අභරදගුරුතුමා විසින් සියෝන් දේවස්ථානය සඳහා රුපියල් මිලියන **10** ක මුදල් ප්‍රදානය කරන ලදී.

මේ වන විට කොළඹ අභරදගරුතුමා විසින් පුද්ගලයින් **37** දෙනෙකු සඳහා දැනට සිදු කෙරෙන වෛද්‍ය ප්‍රතිකාර හා සැත්කම්වලට අවශ්‍ය මුදල් සපයා ගැනීම සඳහා සහාය දක්වයි. එමෙන්ම පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් බරපතල ලෙස අගතියට පත්වීම නිසා එම තත්ත්වයන්ට මුහුණදීමට අසීරු තත්ත්වයේ පසුවන වින්දිතයන් සඳහා දිනපතා සිදුවෙන වියදම් මෙන්ම ආදායම් ඉපයීම සඳහා ද එතුමා විසින් අරමුදල් සපයනු ලැබේ.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා වන්දි ලබාදීම සහ සුභ සාධනයට අවශ්‍ය පියවර ගැනීම පිළිබඳ සලකා බැලීමේදී සිතෙහි තබාගත යුතු කරුණක් වන්නේ ඇතැම් වින්දිතයන් සඳහා දීර්ඝකාලීන සත්කාර අවශ්‍ය වන බවයි. දීර්ඝ කාලයක් සඳහා රෝහල් ගත කොට ඇති වින්දිතයන්ද මේ අතර වේ.

ඔවුන් අතරින් ඇතමෙක් දිගු කාලයක් තුළ ආබාධිත ලෙස ජීවත් වන අතර, සාමාන්‍ය තත්ත්වයට පැමිණෙන තෙක් දීර්ඝ කාලීනව ඔවුනට සහාය හා සත්කාර අවශ්‍ය වනු ඇත.

විමර්ශන කොමිසම මඟින් පහත නිර්දේශ ඉදිරිපත් කෙරේ.

1. රජය විසින් මියගිය එක් අයෙකු සඳහා රුපියල් මිලියන 2 ක වන්දි මුදලක් ගෙවිය යුතු අතර, තුවාල ලැබූ පුද්ගලයන් සඳහා ඔවුන්ට දැරීමට සිදුවන සමස්ථ වියදම රුපියල් ලක්ෂ 5 ක උපරිමයකට යටත්ව ගෙවිය යුතුය.

ඉතා සංවේගයෙන් යුතුව පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා ගෙවන ලද වන්දි මුදල් වෙත විමර්ශන කොමිසමේ අවධානය යොමු කරන අතර, රජයේ නොසැළකිමත් බව නිසා සිදුවූ අතපසුවීමක් හේතුවෙන් එය සිදු වූ බැවින් එම ගෙවීම් කිසිදු අයුරකින් ප්‍රමාණවත් නොවේ. එය ප්‍රමාණවත් නොවන්නේ ප්‍රහාරය දියත් කිරීමට දින 17 ට පෙර අදාළ තොරතුරු රජය වෙත ලැබී තිබියදී ද එම ප්‍රහාරය වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට රජය අපොහොසත් වූ බැවිනි.

දිගන හා බේරුවල සිද්ධීන්වලින් විපතට පත්වූවන් පිළිබඳ කාරණයේදී අහිමි වූ ජීවිත, ලැබූ තුවාල හා සිදු වූ දේපළ හානි සඳහා ගෙවන ලද වන්දි මුදල් පිළිබඳ රජය ප්‍රතිපත්තිමය තීරණ අසාධාරණ හා පක්ෂපාතී ලෙස ක්‍රියාත්මක කොට ඇත. පාස්කු ඉරිදා ප්‍රහාරයේදී විපතට පත් වින්දිතයින් සම්බන්ධයෙන් එවැනි වෙනසක් සිදු කරන ලද්දේ කවර හේතු මතදැයි යුක්ති යුක්ත වේ.

රජයේ නොසැළකිල්ල හේතුවෙන් පුරවැසියන් සඳහා සැපයිය යුතු ආරක්ෂාව ලබාදීමට රජය අපොහොසත් වන අවස්ථාවලදී සිදුවූ ජීවිත හා දේපළ හානිවලට

අනුකූලව වන්දි ගෙවීමේ පරම යුතුකමක් රජය සතුය. එබැවින් ප්‍රමාණවත් හා සාධාරණ වන්දි මුදල් ප්‍රදානයන් මෙම ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහාද, දිගන හා බේරුවල සිද්ධීන්වලදී විපතට පත් පුද්ගලයින් හට වන්දි ගෙවන ලද ආකාරයට සමානව ගෙවීම සිදුකළ යුතුය.

ඉහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කිරීම උදෙසා විමර්ශන කොමිෂම විසින් නිර්දේශ කරනුයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් හට අයත්ව තිබූ පුද්ගලික දේපළ හා ව්‍යාපාර ආශ්‍රිත දේපල රාජ්‍ය සන්තක කිරීම සඳහා ව්‍යවස්ථාපිත නීති සම්ප්‍රාදනය කළ යුතු බවයි. එවැනි ව්‍යවස්ථාපිත නීති සම්ප්‍රාදනය කිරීමේ දී ඒවා අතීතයට බලපාන පරිදි සම්ප්‍රදානය කිරීමට සිදු වනු ඇත. මක්නිසාදයත් විමර්ශන කොමිෂමට දැනගැනීමට ලැබුණු පරිදි සමහර මරාගෙන මැරෙන බෝම්බකරුවන් මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීමට තීරණය කිරීමෙන් පසු ඔවුන් සතුව තිබූ දේපළ වල අයිතිය වෙනත් අයට පවරා ඇති බැවිනි .

2. වර්ෂ 2018 අංක 37 දරණ හානිපූරණ කාර්යාල පනතෙහි විපතට පත් වූ අය අතර අත්‍යඅවශය සහායක් ලබාදිය යුතු පුද්ගලයින්ගේ ජීවිතාන්තය දක්වා සුභසාධන කටයුතු සඳහා අරමුදල් අයදුම් කිරීමට, කැබිනට් අනුමැතියක් පතා ව්‍යාපෘති යෝජනාවක් යොමු කිරීමේ හැකියාවක් පවතී. එබැවින් විමර්ශන කොමිෂමේ නිර්දේශය වන්නේ තවදුරටත් අරමුදල් සපයා ගැනීම සඳහා හානී පූර්ණ කාර්යාලය මඟින් රේඛිය අමාත්‍යාංශය වෙත පරිපූර්ණ විස්තර සහිත ව්‍යාපෘති යෝජනාවක් කැබිනට් අනුමැතිය පතා යොමු කිරීම සුදුසු බවයි. අදාල කැබිනට් පත්‍රිකාව, ඉහත සඳහන් පරිදි සෙත්සරණ සංවිධානය විසින් ඉදිරිපත් කොට ඇති යෝජනාවලියද විමර්ශන කොමිෂම විසින් ඉදිරිපත් කොට ඇති යෝජනාද ආවරණය වනසේ සකස් කළ යුතු බව යෝජනා කරේ. වසර පහක් තුළ අඛන්ඩව ක්‍රියාත්මක වන ආකාරයට පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත් පුද්ගලයින්ගේ සුභසාධනය

වෙනුවෙන් වාර්ෂිකව ඒකීය අගයක් සහිත වැය ශිර්ෂයක් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත හැකි ආකාරයට සැලසුම් කිරීම වැදගත් වේ.

3. ලෝක මුස්ලිම් ලීගය විසින් ප්‍රධාන කරන බවට පොරොන්දු වී ඇති රුපියල් බිලියනයනක් වටිනා මූල්‍යමය ප්‍රධානය පසුපස ඇති සත්‍ය කරුණු රජය විසින් අනාවරණය කර ගතයුතු අතර එය මේ දක්වා ලැබී නොමැති බැවින් එය ලබා ගැනීම සඳහා ගත හැකි සියලු පියවර ගතයුතුය.
4. වනාතවිල්ලු පුහුණු කඳවුර පිළිබඳව අනාවරණ කර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනගි සහයක් ලබා දුන් තස්ලිම් නමැති හිටපු අමාත්‍ය කබීර් හසීම්ගේ සම්බන්ධිකරණ ලේකම්වරයා හට වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැය වූ සැබෑ වියදම රජය විසින් ගෙවීම හෝ ප්‍රතිපූර්ණය සිදුකළ යුතුය.
5. මඩකලපුව සියම් දේවස්ථානයේ සිදුවීමට තිබූ ජීවිත හානි රැසක් වලක්වා ගැනීමට මහෝපකාරි වූ රමේෂ් රාජු මහතාගේ නිර්භීත විරක්‍රියාවට උපහාර පිණිස ඔහුගේ ජීවත්ව සිටින ළඟම ඥාතියා හට රජය විසින් මුදල් ත්‍යාගයක් ලබාදීම සුදුසුය.
6. රාජ්‍ය සේවා, පළාත් සභා පලාත් පාලන අමාත්‍යාංශය විසින් මුල්‍යමය හෝ ද්‍රව්‍යයම නොවන සුභසාධන සහන හා ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරන අතර විශේෂ වරප්‍රසාද ලබා දීම එවැන්නකි. එවැනි වරප්‍රසාදයකට නිදසුනක් වන්නේ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් විපතට පත්වූවන්ට රජයේ රැකියා සඳහා තෝරා ගැනිමේ තරග විභාගවලට පෙනී සිටිමේදී යම් අතිරේක ලකුණු ප්‍රතිශතකයක් වෙන් කිරීමේ ක්‍රියාවලියයි. **1992** මාර්තු **24** වන දිනැති අංක **17/92** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය බලාත්මක කොට තිබුණේ එසේ LTTE ගැටුම් පැවති කාලයේදී ඊට ගොදුරුවූ වින්දිතයන් වෙනුවෙනි. දැන් එය තවදුරටත් වලංගු නොවේ.

විමර්ශන කොමිෂම මගින් නිර්දේශ කරනුයේ ඒ හා සමාන චක්‍රලේඛයක් පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත්වූ පිරිස වෙනුවෙන්ද නිකුත් කිරීම සුදුසු බවයි.

ඉහත දක්වා ඇති කරුණු කාරණා, වාචික හා ලේඛනමය සාක්ෂි මෙන්ම විශේෂඥයින්ගෙන් ලබාගත් ප්‍රකාශ ඇතුළුව විමර්ශන කොමිෂම ඉදිරියේදී ඉදිරිපත් කරන ලද සාක්ෂිවල කොටසකි.

27 පරිච්ඡේදය

## පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම

වර්ෂ 2019 අප්‍රේල් මස 21වෙනිදින පාස්කු ප්‍රහාරය සිදුවූ පසු මහජන උද්ඝෝෂණ, කඩාකප්පල්කාරී ක්‍රියා, දේපල හානි සිදුකිරීම්, පුද්ගල හානි සිදුකිරීම් සහ එමඟින් මහජන සාමය කඩවන ආකාරයේ කටයුතු සිදුකිරීමට සම්බන්ධ පුද්ගලයන් හා සංවිධාන හඳුනාගැනීම විමර්ශන කොමිසමෙහි කාර්යභාරයෙහි අවශ්‍යම අංගයක් විය.

පාස්කු ඉරිදා ප්‍රහාරය සිදුවී සති තුනක් ගතවූ පසු වෙනස්ම අභියෝගයකට මුහුණදීමට රටවැසියන්ට සිදුවිය. එනම් මුස්ලිම් ප්‍රජාවට එරෙහි ප්‍රතිප්‍රහාරයක් එල්ලවීමට තිබූ හැකියාව නිසා උද්ගතවීමට තිබූ බරපතල තත්ත්වයි. බොහෝවිට එවැනි ගැටුම් වාර්තා වූවේ වයඹ පළාතේ ඇතැම් ප්‍රදේශවලින් මෙන්ම මීගමුව හා මිනුවන්ගොඩ ප්‍රදේශවලිනි. විවිධ පුද්ගල කණ්ඩායම් විසින් සිදුකළ පහරදීම් සහ ගිණිබත් කිරීම් හේතුවෙන් කඩ සාප්පු කීපයකටද, නිවාස කීපයකටද, ආගමික ස්ථාන කීපයකටද හානි සිදුවිය.

මීගමුව ප්‍රදේශයේ කතෝලික හා මුස්ලිම් ජන කොටස් වසර ගණනාවක් තිස්සේ සාමකාමීව ජීවත්වූ අතර ජනවාර්ගික අරගල කිසිවක් වාර්තාවී තිබුණේ නැත. කෙසේවුවද කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය වෙත එල්ලවූ ප්‍රහාරයෙන් පසු නගර සීමාවේ ජීවත්වූ කතෝලික හා මුස්ලිම් ජන කොටස් අතර උණුසුම් තත්ත්වයක් වර්ධනය විය.

මීගමුව ප්‍රධාන මුස්ලිම් දේවස්ථානයේ ප්‍රධාන පූජක තැන පවසා සිටියේ එම ප්‍රහාරය එල්ල කරන ලද්දේ අන්තවාදී රැඩිකල් කරණයට ලක්වූ ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් පිරිසක්

සහ ඔහුන් සමඟ එක්ව සිටි අගනුවර සහ තදාසන්න ප්‍රදේශවල පදිංචි මුස්ලිම්වරුන් පිරිස් විසින් බව දැනගන්නට ලැබීමෙන් ඔහු මහත් විමතියට පත්වූ බවයි. මගේ දරුවන් තිදෙනාම දැන් ඉගෙන ගන්නේ කතෝලික පාසලකයි. ඒ අයුරින් අපි මේ සමාජයේම කොටසක් බවට පත්වී සිටියද එක්වරම අප හුදකලාවී ඇති බවත් අපට දැනුණා යැයි සාක්ෂිකරු පැවසීය. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සිදුවී දින 14 ට පසු, වර්ෂ 2019 මැයි මස 05 වනදා පමණ මීගමුවේ විසූ ක්‍රිස්තියානුවන් සහ මුස්ලිම්වරුන් අතර ගැටුම් ඇතිවිය. ඒ වනවිට ඇඳිරි නීතිය පනවා තිබුණද විවිධ පුද්ගල කණ්ඩායම් විසින් මුස්ලිම්වරුන්ට අයත් කඩසාප්පු සහ නිවැස්වලට අලාභහානි සිදුකළහ. නිවෙස් 70 ක් පමණ සහ ත්‍රීරෝද රථ 12 ක් පමණ එසේ අලාභ හානියට පත්විය. මෙහිදී යුද හමුදාවද යොදවනු ලැබුවද විපතට පත්වූවන් පවසා සිටියේ යුද හමුදාව එහි පැමිණෙනවිට ප්‍රමාද වැඩි බවයි.

ඉන් සුළු කාලකට පසු සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාවේ පූජකවරුන් පිරිසක් කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කාදිනල් රංජිත් හිමිපාණන් සමඟ මීගමුව මුස්ලිම් දේවස්ථානය වෙත පැමිණියෝය. ඔවුන් එහි පැමිණියේ ප්‍රජාව අතර සමගිය පිළිබඳව කථා කිරීමටයි. එහිදි අගරදගුරුතුමා ප්‍රහාර එල්ල කිරීමෙන් වළකින ලෙසට ක්‍රිස්ත්‍රියානුවන් අමතා පවසා සිටි අතර සිය අගතියට පත්වූ ජනතාව සනහාලීමට ඔහුට වැඩියමක් සිදුකළ නොහැකි බවද හෙතම පිළිගන්නා ලදි.

මුල් ප්‍රහාරය හලාවතින් වාර්තාවූ අතර සාමය කඩවීමේ සිදුවීම් වයඹ පළාතේ සෙසු ප්‍රදේශ වෙතද සැනකින් පැතිර ගියේය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉස්ලාම් දේවස්ථාන කීපයකටම විවිධ පුද්ගල කණ්ඩායම් විසින් අලාභහානි සිදුකළ අතර මුස්ලිම්වරුන්ගේ කඩ සාප්පු සහ නිවෙස් කිපයක්ම ගිනිබත් කළෝය. අප්‍රේල් 21 වන දින එල්ලවූ පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව සිදුවූ විශාල පරිමාණයේ එකම ප්‍රහාරය එයයි. දිස්ත්‍රික්කයේ ගම්මාන 06 ට මුලින් පොලිස් ඇඳිරි නීතිය පනවා තිබුණද පසුව එය දීපව්‍යාප්ත මට්ටමින් පසු දින උදෑසන දක්වා පනවන ලදී. එසේ සිදුකරන ලද්දේ උද්ගතවූ උණුසුම් තත්ත්වය හා ප්‍රහාරයන් තවදුරටත් උත්සන්න වෙමින් පැතිරෙතැයි ඇතිවූ බිය හේතුවෙන්.

2019 මැයි 12 වෙනිදින හලාවත නගරයේදී ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම ආරම්භ විය. ඊට හේතුවූයේ සිංහල ජාතිකයෙකු විසින් ෆෙස්බුක් වෙබ් අඩවියට එක් කරන ලද අදහසක් මගින් පැවසුනු පරිදි නෝලිමිට් ආයතනයෙන් කිසිවක් මිලදී නොගන්නා ලෙසටවූ පණිවිඩයයි. හලාවත නගරයේ ඇති නෝලිමිට් වෙළඳ සැලේ සේවය කරන තරුණයකු විසින් එම අදහස පිළිබඳ ප්‍රතිචාර දැක්වීමත් සමඟ හලාවත නගරයේ සිංහල ජන... අදාළ නෝලිමිට් ආයතනයේ සේවකයාට එරෙහිව ක්‍රියා කිරීමට පටන් ගත්හ. විමර්ශන කොමිසම මගින් නිරික්ෂණය කල පරිදි ඉස්ලාම් දේවස්ථාන වෙත සහ මුස්ලිම්වරුන්ට අයත් කඩ සාප්පු වෙත ගල් ගැසිමේ සිදුවීම් කීපයක් සහ එම ප්‍රදේශයේ වැසියෙකුට පුද්ගල කණ්ඩායමක් විසින් පහරදීමේ සිද්ධියක් වාර්තාවූ අතර ඒ හේතුවෙන් පොලිස් ඇඳිරි නීතිය පැනවීම සිදුවේ. අදාළ ෆේස් බුක් අදහස ප්‍රකාශයට පත්කළ 38 හැවිරිදි අබ්දුල් හමීඩ් මොහොමඩ් හශ්මා නැමැත්තාව පොලිසිය විසින් අත්අඩංගුවට ගත් අතර ඔහු අන්තර්ජාලයට එක් කොට තිබුණේ " කවදා හෝ ඔබ හඬනු ඇත " යන අදහසයි එය

තර්ජනාත්මක ප්‍රචණ්ඩත්වය ලෙස අරුත් ගන්නා තිබූ බව පැවසිනි. හලාවත නගරයේ තවත් පිරිසක් රැස්වූ අතර ඊට හේතුවූවේ නගර ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කරන බව දැක්වෙන ෆෙස්බුක් ප්‍රකාශයකි.

එසැනින් පොලිස් ඇඳිරි නීතිය පනවනු ලැබූ අතර ඉන් ඉදිරියට සිදුවූ හානිය දුරදිග නොගොස් පාලනය කරගැනීමට එමගින් හැකිවිය. පසුව එම සිද්ධියට සම්බන්ධ පුද්ගලයින් දෙදෙනෙක් අත්අඩංගුවට ගන්නා ලදි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන වලින් සැදී පොකුරු කීපයක් ප්‍රධාන වශයෙන් බලපෑමට ලක්විය. කුලියපිටිය, කොබෙයිගනේ, රස්නායකපුර, හෙට්ටිපොල, බිංගිරිය සහ දුම්මලසූරිය යන ප්‍රදේශවලට වැඩි හානී සිදුවිය. සාක්ෂිකරුවන් අනාවරණය කළේ මෙම විනාශ ක්‍රියා ආරම්භ වූවේ **2019** මැයි **13** වෙනිදා දහවල් කාලයේ බවයි. එහිදී පෙනීගියේ එම හානී සිදුකල පුද්ගල කණ්ඩායම් පිළිබඳ සැලැස්ම වූවේ ගමින් ගමට යමින් මුස්ලිම්වරුන්ගේ නිවෙස්වලට හා දේපලවලට හානී සිදුකිරීම බවයි. ඇතැමුන් යතුරු පැදිවලින් පැමිණ මුස්ලිම් දේවස්ථාන සහ මුස්ලිම්වරන්ගේ කඩ සාප්පුවලට පහරදීමට පටන් ගත්හ.

ගැමියන් නිවෙස් තුළ ඇතිවූ බිය ජනක තත්ත්වය හේතුවෙන් නිවෙස් තුළ හෝ අසළවූ කැලෑ බදවල්වල සැඟවී සිටිහ. කිණියමට යාබදව පිහිටි මුස්ලිම් දේවස්ථාන අවම වශයෙන් තුනක් හෝ ප්‍රහාරයට ලක්විය. එක් සාක්ෂිකරුවෙකු පැවසූ පරිදි එක් මුස්ලිම් දේවස්ථානයක් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වී ඇති අතර ප්‍රහාරයට ලක්වූ කිණියම අබ්‍රා මුස්ලිම් දේවස්ථානයේ සෑම තැනකම කැඩී බිඳීගිය විදුරු කැබලි විසිරි තිබෙනු

දක්නට ලැබිණි. සාක්ෂි ලබාදීමෙන් එක්තරා සාක්ෂිකරුවෙක් පවසා සිටියේ ලා රෝසපැහැති එම ගොඩනැගිල්ලේ සියලුම දොරවල් සහ ජනෙල් කැබලි වනසේ ප්‍රහාරයට ලක්වූ අතර කුර්ආනයේ පිටපත් බිමදමා තිබුණු බවයි. මෙම දේවස්ථානයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක් පවසා සිටියේ එසේ ප්‍රහාර එල්ලවීම ආරම්භ වූවේ බෞද්ධ භික්ෂූන් පිරිසක් ඇතුලු කිපදෙනෙකු විසින් දේවස්ථානයේ ප්‍රධාන බිල්ඩිම පරීක්ෂා කිරීමට අවශ්‍ය බව අවධාරණය කිරීමත් සමඟයි. වැය කිරීමත් සමඟයි. ඔවුන් එසේ ඉල්ලීම් කොට ඇත්තේ අසළ තිබූ වැවවක් සෙබලුන් විසින් පරීක්ෂා කිරීමෙන් පසුවයි. දේවස්ථානයේ රැඳිසිටි සාක්ෂිකරුවෙකු පවසා සිටියේ වර්ෂ 2019 මැයි මස 13 වෙනි දින පුද්ගලයින් 150 ක් හෝ 200 ට ආසන්න පිරිසක් කඩු හා පොලු මුගුරු රැගෙන පැමිණි බවත් දේවස්ථානය තුළ සිටින මුස්ලිම්වරුන් පොලිසියද සහය ඇතිව ඔවුන්ව එතැනින් පිටත්කර හැරි බවත්ය. ඉන් සුළු මොහොතකට පසු ඔවුන් නැවත පැමිණි අතර මෙවර එහි පිරිස 1300 ක් පමණවූ බවත් ඔහු තවදුරටත් පැවසීය.

දේවස්ථානය තුළ කොටුවී සිටි මුස්ලිම්වරුන් පිරිස විසුරුවා හැරීම සඳහා අහසට වෙඩි තබන ලෙස පොලිස් නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියද පොලිසිය පැවසුවේ දේවස්ථානය තුළ ආයුධ ඇද්දැයි බැලීමට මේ පිරිසට අවශ්‍යවූ බවයි. ඉන් අනතුරුව එම පිරිස මුස්ලිම් දේවස්ථානය තුළට කඩාවැදී එහි තිබූ දෑ ඒ මේ අත විසි කරන්නට විය. සාක්ෂිකරුවා පවසා සිටියේ එම පිරිස කුර්ආන ග්‍රන්ථ පුළුස්සා විනාශ කර අතර එහි තිබූ සියළු වීදුරු ජනෙල් හා දොරවල් කඩා බිඳ දැමූ බවත් මුස්ලිම්වරුන් පව් සමාකිරීම සඳහා යොදා

ගන්නා ජලය රැස්කර තිබූ ස්ථානයට ඔවුන් මූත්‍රා කරන බවත් සාක්ෂි ලබා දෙමින් ඔවුහු තවදුරටත් පැවසීය.

හෙට්ටිපොළ ප්‍රදේශයේ යම් ආකාරයක දේපළ හානි සිදුවී තිබූ නමුත් කිසිවෙකු තුවාල ලබා නොතිබුණි. හෙට්ටිපොළදී පිරිස පාලනය කර ගැනීම සඳහා පොලීසිය විසින් අහසට වෙඩි තබා තිබේ.

2019 මැයි 13 වන දින කොස්වත්ත මාරවිලදී එක් මුස්ලිම්වරයෙක් ඝාතනය කෙරුණි. ඉස්ලාමීය සටන්කරුවන් ලෙසින් සිදුකළ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව සිදුවූ වඩාත් ප්‍රචණ්ඩතම වාර්ගික හිංසන සිද්ධිය වන මුස්ලිම් දේවස්ථානවලට සහ මුස්ලිම්වරුන්ට හිමි කඩ සාප්පුවලට ප්‍රහාර එල්ල කර පුද්ගල කණ්ඩායම් වෙත පොලීසිය විසින් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීමෙන් අනතුරුව පොලිස් ඇඳිරි නීතිය පනවන ලදී. මාරවිල රෝහලට කැපුම් තුවාල හේතුවෙන් ඇතුළත් කළ හතළිස් දෙහැවිරි පිරිමි පුද්ගයෙක් එසේ ඇතුළත් කළ මොහොතේම මරුමුවට පත් විය. සාක්ෂිකරුවෙකු සිය සාක්ෂි ඉදිරිපත් කරමින් පවසා සිටියේ ප්‍රහාර සඳහා මිනිසුන් සිය ගණනක් පැමිණ තිබූ අතර පොලීසිය සහ හමුදාව කිසිවක් නොකොට බලා සිටි බවයි. දේවස්ථාන කිහිපයක් පුද්ගල කණ්ඩායම් විසින් ගිණිබත් කරන ලද අතර මුස්ලිම්වරුන්ට අයත් කඩසාප්පු බොහෝමයක් කඩා බිඳ දමන ලදි.

<u>මිනුවන්ගොඩ ( C 1416)</u>

2019 මැයි මස 13 වැනි දින 1500 ක පමණ පිරිසක් සවස 05.30 ට පමණ මිනුවන්ගොඩ නගරයට රැස්වූ බව අනාවරණය විය. ඔවුන් විසින් මුස්ලිම්වරුන්ට අයත් කඩ සාප්පුවලට හා හෝටල්වලට පහරදීම ආරම්භකර ඇත. එවකට ගම්පහ දිසාව භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොෂාන් විජයවර්ධන මහතා (වර්තමානයේ බදුල්ල නියෝජ්‍ය පොලිස්පති) අවට පොලිස්ථානය වෙත මේ බව දැනුම් දුන්නේය. ඔහු කටුනායක මිනුවන්ගොඩ පාරේ පිහිටි ෆවුස් හෝටලය වෙත පැමිණෙන විට මිනිසුන් එම හෝටලයට ප්‍රහාර එල්ල කරමින් අලාභ හානි සිදුකරමින් සිටියෝය. තත්ත්වය පාලනය කිරීම සඳහා බට පිරිසක් යොමු කරන ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා යුධ හමුදාවට දන්වා ඇත. ප්‍රහාරකයින් විශාල ප්‍රමාණයක් එහි පැමිණි අවස්ථාවේදී එම ස්ථානයට විශේෂ කාර්ය බලකාය කැඳවන ලදි. මෙම ප්‍රහාරය සඳහා මැර කණ්ඩායම් 2000 ක් පමණ සම්බන්ධව සිටියෝය. රැස්ව සිටි පිරිස ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙමින් සිටි බැවින් ඔවුන්ව පාලනය කිරීමට පොලීසියට නොහැකි විය. හානියට ලක් වූ සමහර කඩ සාප්පු අයත් වූයේ මිනුවන්ගොඩ නගර සභාවටය. එහිදී තවදුරටත් අනාවරණය වූයේ එම සාප්පු බදු කුලී පදනම මත ලබාගත් වෙළඳුන් ඔවුන්ගේ බදු කාලය ඉකුත්වී පසුව ද එම කඩ සාප්පුවල රැඳීසිටි බවයි. එම කඩ සාප්පු වලින් බහුතරයට පූර්ණ වශයෙන් හානි සිදුවී තිබුණි. ඇතැම් සාක්ෂිකරුවන් පවසා සිටියේ අදාළ නගර සභාව විසින් එම සාප්පු විනාශ කිරීමට මැර කණ්ඩායමට ඉඩ ලබාදුන්නේ චේතනාන්විතව බවයි. මක්නිසාදයත් එම ස්ථානයම සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් ගොඩනැගීමට ඔවුන්ට අවශ්‍යව තිබූ බැවින් එම සාප්පු නැවත පවරා ගැනීමට ඔවුනට අවශ්‍යව තිබූ බැවිනි. මැයි 13 වන දින පොල්වත්ත ප්‍රදේශයේ ජීවත් වන මුස්ලිම් තරුණයකු ගමේ පන්සල වෙත ගොස් බෞද්ධ භිමි නමකට තියුණු අවියකින් පහරදුන්

බවට ආරංචි පැතිර ගියේය. මෙම පුවත සමස්ථ මිනුවන්ගොඩ පුරාම සුළු මොහොතකින් පැතිරී ගියේය. මෙම කතාව ඇසීමෙන් කලබලයට පත්වූ පිරිස් පොල්වත්ත පන්සල වෙත ඇදී ආවෝය. එම ප්‍රදේශයේ අනවශ්‍ය කලබල ඇති කිරීම අටියෙන් ඇතැම් පිරිස් මෙම පුවත තවදුරටත් තීව්‍ර කරමින් තව දුරටත් ප්‍රචාරය කළෝය. සාක්ෂි ලබාදීමට පැමිණි බෞද්ධ හිමිවරුන් දෙදෙනෙකු පවසා සිටියේ තියුණු ආයුධයකින් පහරදීමේ පුවත සම්පූර්ණ අසත්‍යයක් බවයි.

ආණමඩුවේ සිරි සුමන හිමි (පොඩි හාමුදුරුවෝ) මුස්ලිම් ප්‍රජාවට එරෙහිව අසත්‍ය ප්‍රකාශයක් ඉදිරිපත් කළේය. එමෙන්ම පොල්වත්ත ප්‍රදේශයේ ජගත් නැමති පුද්ගලයා මෙම මුස්ලිම් විරෝධී ප්‍රචාරණ ව්‍යාපාරය සංවිධානය කොට ඇති බව කොමිසම ඉදිරියේ විභාගවූ සාක්ෂි මඟින් අනාවරණය විය. එබැවින් ජගත් සහ ඔහුගේ මිතුරන්ගේ මෙන්ම ආණමඩුවේ සිරිසුමන හිමි ඇතුළු මෙම මුස්ලිම් විරෝධී ප්‍රචාරණ ව්‍යාපාරයට හා සම්බන්ධවූ පිරිස් පිළිබඳව තවදුරටත් විමර්ශනය කොට අදාළ චෝදනා ඒ අනුව ගොනු කළ යුතුය.

මිනුවන්ගොඩ නගරයේ ගැටුම් ආරම්භවූයේ එහි වෙසෙන තරුණයන් පිරිසක් විසින් තම මිතුරන් අමතා මිනුවන්ගොඩ නගරය ප්‍රහාරයට ලක්වන බැවින් වහාම එහි පැමිණෙන ලෙස පැවසීමත් සමඟයි. මිනුන්ගොඩ ප්‍රදේශයේ මුස්ලිම් කෝලාහල සංවිධානය කිරීම පසුපස ගල්ඔළුව ප්‍රදේශයේ වෙසෙන අතුල දයාරත්න (ජගත් නමින් මොහුව හඳුන්වයි) සහ රහල් අල්විස් නැමැත්තෙක් සංවිධාන කටයුතු සිදුකොට ඇති බව සඳහන් වේ. ජනප්‍රිය ගායකයෙකු වන මදුමාදව අරන්වින්ද 2019 මැයි 13 වන දින කෝලාහල ආරම්භ වන විට

මිනුවන්ගොඩ ප්‍රදේශයේ සිට ඇත. ඒ පිළිබඳව ඔහුගේ පැහැදිලි කිරීම පිළිගත හැකි එකක් වන අතර, මැයි මස 13 වන දින රාත්‍රී 7.30 ට පමණ මිනුවන්ගොඩ නගරය පසුකර යාමට ඔහුට කවර කරුණක් හේතුවී ඇත්දැයි යන්න පිළිබඳ පැහැදිලි නැත.

දෙනිපිටියේ සුදම්ම හිමි සහ ආනමඩුවේ සිරිසුමන හිමි විසින් සාක්ෂි ලබාදෙමින් ජගත් සහ ඔහුගේ මිතුරන් විසින් ගොතන ලද කථාව තහවුරු කොට තිබුණි. එම සිදුවීම නිසා ගමේ සෙසු අයද කළබලයට පත්වී ඒ අසළ පිහිටි මුස්ලිම් ගමක් ඉලක්කකොට ගෙන මැර ප්‍රහාර දියත් වී ඇත.

මිනුවන්ගොඩ නගරයේ පොලිස් නිලධාරීන් 50 ක් පමණ පිරිසක් මැයි මස 30 වන දින රාජකාරියේ නිරතව සිටි බව පැහැදිලිය. ඔවුනට සහාය සඳහා තවත් පොලිස් කණ්ඩායම් එම ප්‍රදේශයට ගෙන්වීමට කටයුතු යෙදුණේ ප්‍රචණ්ඩත්වය තවදුරටත් උත්සන්න වීමෙනි. එවැනි තත්ත්වයකට මුහුණදීමට නිසි සූදානමක් පොලිස් නිලධාරීන් සතු නොවූ බව පෙනී යයි. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, කැළණිය දිස්ත්‍රික් 1 ප්‍රකාශ කළ පරිදි සිංහල තරුණයින් තිදෙනෙක් තුවාල ලබා රෝහල්ගත කරන ලදි. මිනුවන්ගොඩ නගරයට ප්‍රහාර එල්ල කිරීමට පැමිණි අය එහි පැමිණ ඇත්තේ වැගව්ව සහ හල්ලොලුව ප්‍රදේශවල සිටයි.

මිනුවන්ගොඩ නගරය කඩ සාප්පු සහ ව්‍යාපාරික ස්ථාන 300 ක් පමණ විය. ඒ අතුරින් කඩ සාප්පු 60 ට ආසන්න ප්‍රමාණයක් හිමිව තිබුණේ මුස්ලිම්වරුනටය.

" ර්කෝ" නැමැති මිනුවන්ගොඩ මීගමුව පාරේ පිහිටි ඇඟලුම් ව්‍යාපාරික ස්ථානයක් සම්පූර්ණයෙන් හානියට පත්විය. මෙම ගැටුම් තත්ත්වයට මාස කිහිපයකට පෙර එම සිව්

මහල් ගොඩනැගිල්ල තනා ඇත්තේ එම ව්‍යාපාරික ස්ථානය හිමි සිංහල කාන්තාවක් විසිනි. ඇය සාක්ෂි ඉදිරිපත් කරමින් පවසා සිටියේ ඇයට සිදුවූ හානියේ වටිනාකම රුපියල් මිලියන 55 ක් බවයි. ඇය ඉදිරිපත් කළ දුක්ගැනවිල්ලක් වූයේ මිනුවන්ගොඩ ප්‍රදේශයේ සාප්පු හිමි මුස්ලිම්වරුන් සියලු දෙනා හටම ඔවුන්ගේ ව්‍යාපාරික ආයතනවලට සිදුවූ හානි සලකා බලා වන්දි ගෙවීම සිදුකළද ඇයට එවැනි කිසිදු වන්දි මුදලක් නොලැබුණු බවයි. ඇයට එසේ වන්දි මුදලක් නොගෙවන ලද්දේ මක්නිසාද යන්න පැහැදිලි නැත. මිනුවන්ගොඩ නගර සභාවේ සභාපතිවරයාව සාක්ෂි ලබාදීම සඳහා කැඳවන ලද අතර, ඔහු පවසා සිටියේ නගර සභාවට අයත් කඩ සාප්පු 150 ක් පමණ තිබූ අතර, ඒ සියල්ල මුස්ලිම්වරුන් විසින් වෙළඳ ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතා කළ බවයි. කඩ සාප්පු 29 ක් සම්පූර්ණයෙන් විනාශයට පත්වූ අතර, ඒ අතරින් කඩ සාප්පු 10 ක් මුස්ලිම් වෙළඳුන්ට අයත්ව තිබුණි.

එහිදී තවදුරටත් අනාවරණය වූයේ මිනුවන්ගොඩ නගර සභාවට අයත් ජල බවුසරය ඇතිවූ ගින්න මැඩ පැවැත්වීම සඳහා නොපමාව නොයවනු ලැබ ඇත්තේ චේතනාන්විතව බවයි. නගර සභාවේ සභාපතිවරයා එසේ ප්‍රමාදයක් සිදුවූ බව පිළිගෙන ඇති අතර, සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ එසේ සිදුවූයේ කාර්මික දෝශයක් හේතුවෙන් බවයි. අදාළ බවුසරයේ නඩත්තු පිළිබඳ ලේඛනය (පොත) සාක්ෂියක් වශයෙන් විමර්ශන කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර, එහි සඳහන්ව තිබුණේ අදාළ බවුසරය ධාවනයට සුදුසු තත්ත්වයේ නොතිබුණු බවයි. නමුත් අපගේ වැටහීම වූයේ අදාළ නඩත්තු පිළිබඳ

ලේඛනයේ පිටු අංක 3 සහ 4 පසුව වෙනස්කර තිබූ බවයි. එහි සටහන් කොට තිබුණේ C 1419 A සහ C 1419 B.

| | |
|---|---|
| මිනුවන්ගොඩ ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 78 |
| ප්‍රහාරවලින් හානියට පත් ව්‍යාපාරික ස්ථාන ගණන | 40 |
| ගින්නෙන් හානියට පත්වූ ව්‍යාපාරික ස්ථාන ගණන | 27 |
| ගල් ගැසීමේ ප්‍රහාර හේතුවෙන් හානියට පත් වූ මුස්ලිම් දේවස්ථාන ගණන | 01 |
| හානියට පත්වූ මුස්ලිම් නිවෙස් ගණන | 09 |
| හානියට පත්වූ කර්මාන්ත ශාලා ගණන | 01 |
| අත්අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කළ සැකකරුවන ගණන | 47 |

මිනුවන්ගොඩ සිද්ධිය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ වී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ජගත් නැමැත්තාගේ සහ ඔහුගේ සහචරයන්ගේ ක්‍රියාකාරකම් තවදුරටත් විමර්ශනයට ලක්විය යුතුය.

<u>කුළියාපිටිය පොලීසිය **(C 1427 සහ C 1428)**</u>

| | |
|---|---|
| කුළියාපිටිය පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 37 |
| කුළියාපිටිය පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගත් පුද්ගලයන් ගණන | 20 |

2019 මැයි මස 12 වෙනි දින කුළියාපිටිය පොලිස් බල ප්‍රදේශය තුළ සිදුවීම් 37 ක් වාර්තා විය. ඒ සම්බන්ධයෙන් පුද්ගලයින් 17 දෙනෙක් අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කළ අතර, කඩ සාප්පු කිහිපයක් සහ ගොඩනැගිලි කිහිපයක් අලාභහානියට පත්විය. පැය 3 ක් 4 ක් පමණ කාලය ඇතුළත කුළියාපිටිය පොලිසිය විසින් ගැටුම්කාරී තත්ත්වය සමනය කිරීමට සමත් විය.

| | |
|---|---|
| කුළියාපිට ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 37 |
| අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 14 |
| ගල් ගැසීමේ ප්‍රහාර නිසා අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන | 02 |
| අලාභ හානි සිදු මුස්ලිම් නිවෙස් ගණන | 21 |
| අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කළ සැකකරුවන් ගණන | 20 |

**දුම්මලසූරිය (C1426)**

| | |
|---|---|
| දුම්මලසූරිය පොලිස් බල ප්‍රදේශය තුල සිදුවූ සිදුවීම් ගණන | 02 |

දුම්මලසූරිය පොලිස් බල ප්‍රදේශය තුල කිසිවකු අත්අඩංගුවට ගෙන නැත.

| | |
|---|---|
| මිනුවන්ගොඩ ප්‍රදේශයේ සිදුවූ සිදුවීම ගණන | 02 |
| ප්‍රහාරවලින් හානියට පත්වූ ව්‍යාපාරික ස්ථාන ගණන | 01 |
| ගිනිතැබීම නිසා අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 01 |

## <u>බිංගිරිය (1422)</u>

බිංගිරියේ කිණියම වැව අසල තිබී ආයුධ පුරවන ලද ගමන් මල්ලක් පොලීසියට හමුවිය. මෙය වැව අසළට ගෙනවිත් තිබුණේ නාඳුනන පුද්ගලයෙකි. අදාළ ආයුධ දැකීමෙන් පසු ගම්වාසීන් කළබලයට පත් විය. ඔවුන් විසින් එය කඩිනමින් පොලිසිය වෙත වාර්තා කරන ලදි. ඉන් දිනකට පෙර මුස්ලිම් අය විසින් ආයුධ පූරවන ලද මලු කිහිපයක් වැව වෙත ගෙනැවිත් දමා ඇති බවට පොලීසියට තොරතුරු ලැබී තිබිණි. නාවික හමුදාව කැඳවා වැවතුළ පරීක්ෂා කළද කිසිවක් හමුවී නැත. ඉන් පසුදින වැවට එන අයෙකුට දකින්නට ලැබෙන අයුරින් වැවේ නාන තොටුපලේ පියගැටපෙළ මත ආයුධ පිරවූ මල්ලක් තබා තිබිණි. එය ජලයට දමා නොතිබූ නිසා වැටහී යන්නේ යම්කිසි කළබලකාරී තත්ත්වයක් නිර්මාණය කිරීමට අවශ්‍යතාවයක් තිබූ පුද්ගලයෙකු විසින් එම අවි ආයුධ සහිත මල්ල කිණියම වැව වෙත රැගෙන ගොස් දමන්නට ඇත. මේ සඳහා සැකපිට 2 ක් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලදි.

| | |
|---|---|
| බිංගිරිය පොලිස් බල ප්‍රදේශයේ සිදුවීම් ගණන | 08 |
| බිංගිරිය පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන | 09 |
| ප්‍රහාර නිසා අලාභ හානියට ලක් වූ ව්‍යාපාරික ස්ථාන ගණන | 04 |
| ගිණි තැබීම නිසා අලාභ හානියට පත්වූ ව්‍යාපාරික ස්ථාන ගණන | 01 |
| ගල් ගැසීමේ ප්‍රහාර නිසා අලාභ හානියට පත් වූ මුස්ලිම් දේවස්ථාන ගණන | 03 |

අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ සැකකරුවන් ගණන 09


This mosque in Kiniyama was one of the places attacked

හෙට්ටිපොළ (**C1431**)

හෙට්ටිපොළ පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 200

හෙට්ටිපොළ පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන 12

මුස්ලිම් කඩ සාප්පුවලට හානි සිදුකිරීම සම්බන්ධයෙන් බිංගිරිය පොලිසිය විසින් අත්අඩංගුවට ගත් පුද්ගලයින් 06 දෙනෙක් හෙට්ටිපොළ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිම සඳහා හෙට්ටිපොළ පොලිස් ස්ථානයට රැගෙන එන ලදි. හෙට්ටිපොළ පොලීසිය අසළට රැස් වූ 500 කට ආසන්න පිරිසක් ඔවුන්ව මුදා හරින ලෙස ඉල්ලා සිටියෝය. ඔවුන් හෙට්ටිපොළ පොලිස් ස්ථානයටද පහර දීමට සූදානම් වූහ. ඒ

මොහොතේ අමාත්‍ය දයාසිරි ජයසේකර ජනතාවගේ ඉල්ලීම පිළිබඳව විමසා බැලීමට හෙට්ටිපොළ පොලිසිය වෙත පැමිණියේය.

ඔහු විසින් ලබාදුන් සාක්ෂිවලට අනුව එම පිරිස ඉල්ලා සිට ඇත්තේ බිංගිරිය පොලිසිය විසින් අත්අංගුවට ගත් පුද්ගලයින් හයදෙනා නිදහස් කරන ලෙසයි. කුරුණෑගල නියෝජ්‍ය පොලිස්පතිවරයා ඇමතූ අමාත්‍යවරයා විසින් ඔවුන්ව පොලිස් ඇප මත මුදා හැරීම සඳහා අවසර ලබාගෙන ඇත. එම අත්අඩංගුවට ගත් සැකකරුවන්ව ප්‍රවාහනය සඳහා වාහනයක් නොතිබුණු බැවින් දයාසිරි ජයසේකර අමාත්‍යවරයා ස්වේඡාවෙන් ඉදිරිපත් වී එම පුද්ගලයින් හයදෙනා සිය ජීප් රථයේ නංවාගෙන බිංගිරිය පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් තිබේ. මේ පිළිබඳ ඔහුගේ පැහැදිලි කිරීම වී ඇත්තේ ඔහු එසේ කරන ලද්දේ හෙට්ටිපොළ පොලිස් ස්ථානය අසළ රැස්ව සිටි පිරිස ඉතා ප්‍රචණ්ඩකාරී ලෙස හැසුරුණු නිසා බවය. හෙට්ටිපොළ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා එහි රැස්ව සිටි සෙනඟට ඒත්තුගන්වන ලද්දේ අදාළ පුද්ගලයින් හයදෙනා නැවත බිංගිරිය පොලිස් ස්ථානයට රැගෙන යාමෙන් පසු ඔවුන්ව පොලිස් ඇප මත මුදා හරිනු ඇති බවයි.

ඒ අතරම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඝාතනය කිරීමේ උත්සාහයකට සැකකරුවෙකු වූ නාමල් කුමාර ද එසේ හෙට්ටිපොළ පොලිස් ස්ථානය අසළ රැස්ව සිටි පිරිස අසළට පැමිණියේය. අමාත්‍ය දයාසිරි ජයසේකර සැකකළේ හෙට්ටිපොළ ප්‍රදේශයේ කළබලකාරී තත්ත්වයක් නිර්මාණය කිරීම සිදුකිරීම පිටුපස සංවිධාන කටයුතු නාමල් කුමාර විසින් සිදු කරන්නට ඇති බවයි. නමුත් එම චෝදනාව ඔප්පු කිරීම සඳහා සාක්ෂි

නොතිබුණි. සුළු මොහොතක් තුළ නාමල් කුමාර සහ අමාත්‍ය දයාසිරි ජයසේකර අතර හෙට්ටිපොළ පොලීසිය ඉදිරිපිටදී බහින් බස්වීමක් සිදුවී ඇත.

මඳ වේලාවකින් පසු සැකකරුවන් හයදෙනාද සමඟ දයාසිරි ජයසේකර මහතා තම ජීප් රථයෙන් එතනින් නික්මුණු අතර නාමල් කුමාර ඔහු ගමන් කරමින් සිටි ස්ථානය වෙත නික්ම ගියේය. ඉන්පසු හෙට්ටිපොළ පොලිස් ස්ථානය අසල රැස්ව සිටි පිරිස එතනින් ඉවත්ව හෙට්ටිපොළ නගර මධ්‍ය දෙසට ගමන් කළහ. ඒ අතර මඟදී මෙම 500 ක් පමණ පිරිස මුස්ලිම්වරුන්ට අයත් කඩ සාප්පු සහ නිවාසවලට පහර දුන්හ.

එහිදී අනාවරණයවූයේ එම පිරිස පාලනය කර ගැනීමට පොලීසිය අපොහොසත්වූ බවයි. එසේ ඇති වූ උණුසුම් තත්ත්වය සමනය කිරීම සඳහා ප්‍රමාණවත් පොලිස් බලඇණියක් එම පොලිස් ස්ථානය සතු නොවීය.

හෙට්ටිපොළ ප්‍රදේශයේ සිදුවීම් කිහිපයක් සිදුවූ අතර, මුස්ලිම් කඩ සාප්පු කිහිපයකටම ප්‍රහාර එල්ල විය. විවිධ ප්‍රදේශවලින් පැමිණි පුද්ගලයින් විසින් එහි මුස්ලිම් කඩ සාප්පුවලට පහර දී කෙටි කලකින් එම ස්ථානයෙන් ඉවත්ව ගොස් ඇත.

| | |
|---|---|
| හෙට්ටිපොළ ප්‍රදේශයේ සිදු වූ සිදුවීම් ගණන | 200 |
| පහරදීම් හේතුවෙන් (රුපියල් 25,000/- ට අධික) අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 114 |
| පහරදීමට හා කොල්ලකෑමට ලක්වූ (රුපියල් 25,000/- අඩු) | |

| | |
|---|---|
| අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 08 |
| කොල්ල කෑමට ලක්වූ ව්‍යාපාරික ස්ථාන ගණන | 01 |
| සුළු සිද්ධීන් | 39 |
| ගල්මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදු වූ මුස්ලිම් දේවස්ථාන ගණන | 01 |
| අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ සැකකරුවන් ගණන | 11 |

කටුපොත (C1423)

| | |
|---|---|
| කටුපොත පොලිස් බල ප්‍රදේශයේ සිදුවීම් ගණන | 05 |
| කටුපොත පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන | 07 |
| කටුපොත ප්‍රදේශයේ සිදුවීම් ගණන | 05 |
| ප්‍රහාරවලින් හානියට පත් ව්‍යාපාරික ස්ථාන ගණන | 04 |
| ගල් මුල් ප්‍රහාර නිසා අලාභ හානිවූ මුස්ලිම් දේවස්ථාන ගණන | 01 |
| අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන | 07 |

නාරම්මල (C1424)

| | |
|---|---|
| නාරම්මල පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 03 |
| නාරම්මල පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන | 02 |

නාරම්මල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 03

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 01

ගිණිබත් කිරීමෙන් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 01

ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන 01

අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ සැකකරුවන් ගණන 02

**පන්නල (C1425)**

පන්නල පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 01

නාරම්මල පොලිස් බල ප්‍රදේශයේ කිසිවකු අත්අඩංගුවට ගෙන නැත.

පන්නල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 01

ප්‍රහාරවලින් අලාභහානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 01

**<u>හලාවත (C1436)</u>**

හලාවත පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 09

හලාවත පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. 06

හලාවත ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 09

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 08

ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන 01

පොලිසිය මඟින් අත්අඩංගුවට අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන 06

දංකොටුව **(C1437)**

දංකොටුව පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 13

දංකොටුව පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. 07

දංකොටුව ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 13

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 01

ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන 01

අලාභ හානි සිදුවූ මුස්ලිම් නිවෙස් ගණන 11

පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත්

කළ පුද්ගලයින් ගණන. 07

මාරවිල **(C1438, C1439)**

මාරවිල පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 42

මාරවිල පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන අධිකරණයට

ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන 20

මාරවිල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 42

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 26

ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභහානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන 04

අලාභ හානි සිදුවූ මුස්ලිම් නිවෙස් ගණන 12

පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත්

කළ පුද්ගලයින් ගණන. 20

කොස්වත්ත (C )

කොස්වත්ත පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 45

කොස්වත්ත පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. 15

කොස්වත්ත ප්‍රදේශයේ සිදු වූ සිදුවීම් ගණන | 45

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 06

ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන | 02

අලාභ හානි සිදුවූ මුස්ලිම් නිවෙස් ගණන | 36

මිය ගිය පුද්ගලයින් ගණන | 01

පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත්

කළ පුද්ගලයින් ගණන. | 15

නිකවැරටිය **(1471)**

නිකවැරටිය පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 67

නිකවැරටිය පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. | 46

නිකවැරටිය ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 67

ප්‍රහාරවලින් අලාභහානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 37

ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන | 02

අලාභ හානි සිදු වූ මුස්ලිම් නිවෙස් ගණන | 28

පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. 46

කොබොයිගනේ (C1471)

කොබෙයිගනේ පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 02

කොබෙයිගනේ පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. 03

කොබෙයිගනේ ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 02

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 02

පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන. 03

මීගමුව (1452)

මීගමුව පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 55

මීගමුව පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් නැත

සියලු පැමිණිලි පැමිණිලිකරුවන් විසින්ම ඉල්ලා අස්කර ගත් අතර ඒ පිළිබඳ ඉන්පසු කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනිණි.

| | |
|---|---|
| මීගමුව ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 55 |
| ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 21 |
| ගල් මුල් ප්‍රහාර හේතුවෙන් අලාභ හානි සිදුවූ මුස්ලිම් දේවස්ථාන ගණන | 01 |
| අලාභ හානි සිදුවූ මුස්ලිම් නිවෙස් ගණන | 28 |
| අලාභ හානි සිදුවූ වාහන ගණන | 05 |

කොච්චිකඩේ

| | |
|---|---|
| කොච්චිකඩේ පොලිස් බල ප්‍රදේශයේ සිදු වූ සිදුවීම් ගණන | 13 |
| කොච්චිකඩේ පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන | |
| අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන | 17 |
| කොච්චිකඩේ ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 13 |
| ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 08 |
| අලාභ හානි සිදුවූ මුස්ලිම් නිවෙස් ගණන | 05 |
| අලාභ හානි සිදුවූ වාහන ගණන | 17 |

කටාන

| | |
|---|---|
| කටානපොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 30 |

කටාන පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන 34

කටාන ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 30

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 08

අලාභ හානි සිදුවූ මුස්ලිම් නිවෙස් ගණන 22

කටාන පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන 34

දුංගල්පිටිය

දුංගල්පිටිය පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 01

දුංගල්පිටිය පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන -

දුංගල්පිටිය ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන 01

ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන 01

දුංගල්පිටිය පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන

අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන 02

කටුනායක

| | |
|---|---|
| කටුනායක පොලිස් බල ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 02 |
| කටුනායක පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන | |
| අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන | 04 |
| කටුනායක ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් ගණන | 02 |
| ප්‍රහාරවලින් අලාභ හානි සිදුවූ ව්‍යාපාරික ස්ථාන ගණන | 02 |
| කටුනායක පොලිස් බල ප්‍රදේශයේ අත්අඩංගුවට ගෙන | |
| අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයින් ගණන | 04 |

තවදුරටත් අනාවරණය වූ කරුණක් නම් ප්‍රාදේශීය සභා දේශපාලනඥයින්ද ඇතැම් ප්‍රදේශවල මැර ප්‍රහාරවලට සම්බන්ධව සිටින ආකාරය නිරීක්ෂණයවූ බවයි. එවැනි දුෂ්චරිතවත් පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. ඔවුන්ගේ මෙම චරියා රටාව තුළින් ඉතාමත් අසුභ පෙර නිමිති පෙන්නුම් කරන අතර, එහිදී දැකිය හැකි වන්නේ මෙම ප්‍රාදේශීය සභා සහ පළාත් සභා වනාහි උත්තරීතර පාර්ලිමේන්තුවට පරිබාහිරින් පවතින අංකුර පාලක ස්ථාන බැවින්, පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර සඳහා සභිකයන් නිර්මාණය වන මෙම ස්ථාන තුළින් අනාගතයේ බිහිවනු ඇත්තේ වර්තමානයේ මැති සභය හොඹවන සුළු පිරිසටත් වඩා චරිතයෙන් අශිෂ්ඨ වූ ප්‍රචණ්ඩකාරීවූ පිරිසක් විය හැකි බවයි.

වයඹ පළාතේ නිකවැරටිය ප්‍රදේශයේ මැර ප්‍රහාර හේතුවෙන් සිය ව්‍යාපාරික ස්ථානයට අර්ධ වශයෙන් අලාභ හානි සිදු වූ මුස්ලිම් කඩ සාප්පු හිමියෙක් සඳහන් කළේ මෙම ප්‍රහාරය ඔවුන් අපේක්ෂා කළ නමුත් එය වැළැක්වීම සඳහා ආරක්ෂක අංශ විසින් කිසිදු පියවර නොගත් බවයි. ඉන් පැහැදිලිව පෙනී යන්නේ ප්‍රචණ්ඩත්වය මැඩ පැවැත්වීම සඳහා පොලීසිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවයි. එම ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථානය ආසන්නයේ කඩ සාප්පු 2 කට හෝ 3 කට එපිටින් දේවස්ථානයේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 2 ක් රඳවා තිබුණද ඡායාරූප හා සී.සී.ටී.වී. දර්ශනවල දැක්වෙන පරිදි කඩ සාප්පුවකට මැර ප්‍රහාර එල්ලවන විට අදාළ පොලිස් නිලධාරීන්ද එම ස්ථානවල සිට ඇත. සාක්ෂිකරුවන් විසින් ඇතැම් ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයින් ඇතුළත් සී.සී.ටී.වී දර්ශන ලබාදීම තුළින් එම ප්‍රහාරවලට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට හැකි වුවද ඔවුන්ව දින 14 ක් ඇවෑමෙන් ඇප මත මුදාහරින ලදි.

මුස්ලිම්වරුන්ට හිමි ව්‍යාපාර සහ මුස්ලිම්වරුන් වෙසෙන ස්ථාන ඉලක්ක කොට ගෙන ප්‍රහාර මාලාවක් දියත්වනවිට ඇතැමුන් ඒ සම්බන්ධයෙන් කොස්වත්ත පොලිසියේ සහාය පැතූහ. එහිදී පොලිස් නිලධාරීන් පවසා සිටියේ කිසිවක් සිදු නොවනු ඇති බවයි. එමෙන්ම අදාළ නිලධාරීන් විසින් ආරක්ෂාව සපයන බවටද පොරොන්දුවී ඇත. නමුත් පොලීසිය මෙම ස්ථානයට පැමිණියේ අදාළ ස්ථාන ගිණිබත් කිරීමෙන්ද පසුව රාත්‍රී 70 පමණ වන අතර, ඒ වන විට ඔවුන් එහි පැමිණීමෙන් කිසිදු ඵලක් නොමැත.

ඉහත දක්වා ඇති කරුණු කාරණා, වාචික හා ලේඛනමය සාක්ෂි මඟින් සහ විමර්ශකයින්ගෙන් ලබාගත් ප්‍රකාශ ඇතුළුව විමර්ශන කොමිසම ඉදිරියේදී ඉදිරිපත් කරන ලද සාක්ෂිවල කොටසකි.

## 28 වන පරිච්ඡේදය

## ආගමික සිද්ධස්ථාන ස්ථාපිත කිරීම

2015 සිට 2020 දක්වා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව 2015 දී 348 ක්, 2016 දී 473 ක්, 2017 දී 420 ක්, 2018 දී 303 ක්, 2019 දී 370 ක් සහ 2020 දී 120 ක් වේ.

2014 සිට 2018 දක්වා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ක්‍රිස්තියානි දේවස්ථාන සංඛ්‍යාව 1952 කි. දීර්ඝ කාලයක් තිස්සේ පැවති දේවස්ථාන ද මෙයට ඇතුළත් ය. 2019 දී දේවස්ථාන 82 ක් සහ 2020 දී දේවස්ථාන 32 ක් ලියාපදිංචි කරන ලදී. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලැබුණු සාක්ෂි වලට අනුව 2015 න් පසු නව දේවස්ථාන ආරම්භ කිරීමට කිසිදු අවසරයක් ලබා දී නොමැත.

2015 සිට 2020 දක්වා කාලය තුළ හින්දු කෝවිල් 1168 ක් හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත.

2020 අගෝස්තු 21 වන විට මුස්ලිම් මස්ජිද සහ සිද්ධස්ථාන 2534 ක් රට තුළ ඉදි වී තිබේ. මීට අමතරව දැනට ලියාපදිංචි නොකළ මුස්ලිම් දේවස්ථාන 951 ක් රට තුළ තිබේ.

මෙම සන්දර්භය තුළ පරීක්ෂන කොමිෂන් සභාවේ අවධානය 1982 අංක 33 දරණ මුස්ලිම් දේවස්ථාන සහ පුණ්‍යාධාර පනත නොහොත් වකුෆ් පනත වෙත යොමු වේ. දේවස්ථානය මහජන වන්දනාව විවෘත කර මාස හයක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට 10 වන වගන්තියෙන් අවසර දී ඇත.

වකුෆ් පනතේ 13 බී වගන්තිය මඟින් ලියාපදිංචි කළ යුතු යැයි වකුෆ් මණ්ඩලය සලකන නමුත් ලියාපදිංචි නොකළ මුස්ලිම් දේවස්ථාන සම්බන්ධයෙන් යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට වකුෆ් මණ්ඩලයට නියම කළ හැකි ය. කෙසේ වෙතත් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ සාක්ෂිය වූයේ ඉතිහාසයේ

මෙතෙක් එවැනි කිසිදු ක්‍රියාමාර්ගයක් වකුෆ් මණ්ඩලය විසින් ගෙන නොමැති බවයි. මෙය සම්පව විමසා බැලිය යුතු කරුණක් වන අතර වහාම පරිපාලනමය ක්‍රියාමාර්ග ගත යුතුය.

පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි වලට අනුව ආගමික වන්දනා සිද්ධස්ථානයක් ඉදිකිරීමට පෙර නිශ්චිත අනුමැතියක් ලබා ගැනීමට නීතිමය අවශ්‍යතාවයක් නොමැත.

ප්‍රතිමා ඇතුළු ආගමික වන්දනා සිද්ධස්ථාන නිසි සොයා බැලීමකින් තොරව ඉදිකිරීම දක්නට ලැබෙන අතර පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති මෙවැනි ක්‍රියාකාරකම් නිසා විවිධ ආගම්වල අනුගාමිකයන් අතර මෙන්ම එකම ආගම අදහන අය අතර ද ගැටලු ඇතිවන අවස්ථාවන් දක්නට ලැබේ. එවැනි සිදුවීම් සමහරක් පහත පරිදි දැක්විය හැකි ය.

(අ) තෙල්දෙනිය පොලිස් කොට්ඨාශය තුළ අංක **102/1**, හිජ්රාපුර, රජවෙල්ල හි මුස්ලිම් කාන්තාවන්ට ආගමික කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

(ආ) නවාලපිටිය පොලිස් කොට්ඨාශය තුළ නාවලපිටිය ඕවිටහි අංක **6 /** එෆ් ජයසුන්දරේ මාවතෙ දරන ස්ථානයේදි ශ්‍රී ලංකා තවුහද් ජමාත් විසින් නව කාර්යාලයක් ඉදිකිරීම.

(ඇ) දොලගල පොලිස් කොට්ඨාශය තුළ අංක **31/1**, එලමාල්ඩෙනිය, මුරුතගහමුල යන ස්ථානයේ කාන්තාවන් සඳහා නව මුස්ලිම් අරාබි විද්‍යාලයක් ඉදිකිරීම.

(ඈ) මධුරගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුළ හිරගල්කොටුවා අංක **391 /** සී හි ශ්‍රී ලංකා තවුහිද් ජමාත් විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

(ඉ) වාලච්චේනෙයි පොලිස් කොට්ඨාශය තුළ අක්බාර් දේවස්ථානය හරස් වීදියේ JSM සංවිධානය විසින් දේවස්ථානයක් ඉදිකිරීම. ආරවුල තබ්ලික් ජමාත් සාමාජිකයන් සමඟ විය.

(ඪ) ශ්‍රී ලංකා තවුහිද් ජමාත් ආයතනය විසින් කුච්චාවෙලි, ජයනගර් හි මුස්ලිම් දේවස්ථානයක් ඉදිකිරීම.

(ඩ) 2017 දී පොලිස් කොට්ඨාශය තුළ හදිරවලන, උදයර් මාවත, ඉහලගම, හදිරවලානේ තවුහිද් දේවස්ථානයක් ඉදිකිරීම.

මේ සම්බන්ධයෙන් එවකට මුස්ලිම් ආගමික තැපැල් හා සංස්කෘතික කටයුතු පිලිබඳ අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එච්. අබ්දුල් හලීම් මහතා කොමිෂන් සභාව ඉදිරියේ මේ පිළිබඳව සාක්ෂි ලබා දුන් අතර රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකු විසින් යොමු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු සපයමින් මෙසේ ප්‍රකාශ කලේ ය.

ප්‍ර: මෙම කොමිසමට කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමා මේ මුස්ලිම් පල්ලි ඔය කාත්තන්කුඩිය ප්‍රදේශය ගැන තමයි වාර්තා වුණේ. නමුත් තවත් බුද්ධි තොරතුරුත් තියෙනවා මෙම කොමිසම හමුවේ. මුස්ලිම් පල්ලි ඉතාමත්ම වේගයෙන් හතු පිපෙන්නා වගේ සමහර ප්‍රදේශවල එකපාරටම මතු වෙනවා. එම මතුවීම තුළ විදේශ රටවල්වලින් විශේෂයෙන්ම ඔය සෞදි අරාබිය, කුවේට්, කටාර් රාජ්‍ය එම රටවල්වලින් ආධාර ලැබීම නිසා තමයි මෙම ඉස්ලාම් ආගමික මුස්ලිම් පල්ලි හතු පිපෙන්නා වගේ රට තුළ බිහි වෙන්නේ. ඒක ඔය ඔබතුමා සඳහන් කළ ආකාරයටම අනිත් නිකායන් අතරත් ගැටුම් ඇතිවීමට හේතුවක් වෙලා තියෙනවා කියලා. ඒ කියන්නේ මුස්ලිම් ආගමේම නිකායන් එකිනෙකා රණ්ඩු කර ගන්නවා මේ පල්ලි ඇතිවීම නිසා. දැන් ඔබතුමාට අමාත්‍යතුමා හැටියට වැඩ කරනකොට මෙම තොරතුරු වාර්තා වුණේ නැද්ද මේ හතු පිපෙන්නා වගේ එක එක විදේශ රටවල්වලින් මූල්‍යාධාර ලැබෙමින් දේවස්ථාන ඉදිකිරීම පිළිබඳව.

පි: ඒ නිසා තමයි මම නිතරම කියා සිටියේ මේ පල්ලි ඉදිකිරීම් නැවැත්විය යුතුයි. ඔය ඇති පල්ලි තියෙන ප්‍රමාණ. ඒ වගේම තියෙන පල්ලි ඔක්කොම අනිවාර්යයෙන්ම ලියාපදිංචි කළ යුතුයි කියන එක. එතකොට තමයි ඒ පල්ලිය පාලනය කර ගන්න පුළුවන් වෙන්නේ. දැන් ඇත්තටම දැන් එහෙම පාලනයක් නැත්නම් ඒ පල්ලිවලට

එන මුදල් ආධාර ගැන කිසිම සොයා බැලීමක් කවුරුත් කරන්න බැහැ, කරන්නේ නැහැ. ඉතිං ඇත්තටම දැන් තියෙන පල්ලි සංඛ්‍යාව අධිකයි. අනවශ්‍යයි එච්චර පල්ලි.

ශ්‍රී ලංකාව වැනි බහුවාර්ගික හා බහුආගමික රටක, ජන කොටස් අතර සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය විශ්වාසය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතික සමගිය ශක්තිමත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට, ජනාධිපතිවරයාට සහ අමාත්‍ය මණ්ඩලයට මඟ පෙන්වනු ලැබේ.

විවිධ ආගම්වල අනුගාමිකයන් අතර අසමගිය හා අතෘප්තිය ප්‍රවර්ධනය නොවන අයුරින් ආගමික වන්දනා සිද්ධස්ථාන අත්තනෝමතික ලෙස ඉදිකිරීම සීමා කිරීම සියලු ආගම්වල අයිතිවාසිකම් සහ නිදහස ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන අතර එමඟින් රාජ්‍ය ප්‍රතිපත්තියේ මෙම නියම මූලධර්මය තහවරු වනු ඇත.

ආගමික වන්දනා ස්ථාන ඉදිකිරීමේ එවැනි නියාමනය බොහෝ රටවල බලාත්මක වේ. ඉන්දුනීසියාව ප්‍රථම වරට 1969 දී 1/1969 ඒකාබද්ධ නියෝගය මඟින් ආගමික කටයුතු පාලනය කිරීම සහ සියලු ආගමික ප්‍රජාවන් සඳහා පූජනීය ස්ථාන ඉදිකිරීමට පහසුකම් සැලසීම අරමුණු කර ගනිමින් එය පරිපාලනය කිරීමට ආගමික දෙපාර්තමේන්තුව බලය පවරන ලදි. ඒ අනුව ආගමික කණ්ඩායමකට පූජනීය ස්ථානයක් ඉදිකිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අදාළ ප්‍රදේශයේ නගරාධිපතිවරයාගෙන් හෝ ප්‍රදේශයේ පාලකයාගෙන් අවසර ලබා ගත යුතුව තිබුණි. අදාළ නගරාධිපතිවරයා හෝ ප්‍රාදේශීය පාලකයා ස්වකීය තීරණය ගැනීමේදී නගරාධිපති / ප්‍රාදේශීය පාලකයා විසින් ආගමික දෙපාර්තමේන්තුවේ නිර්දේශය, යෝජනාව සඳහා වන සැලසුම් සහ ප්‍රාදේශීය ආගමික නායකයින්ගේ මතය ඇතුළුව ප්‍රාදේශීය තත්වයන්" සලකා බලනු ඇත.

ආගමික කටයුතු රෙගුලාසි 2017 මගින් චීනය ආගමික ප්‍රතිමා ඉදිකිරීම නියාමනය කරයි. රාජ්‍ය සභාව සිදුකරන ලද නියෝගය ප්‍රකාරව ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා ගත යුතුය. බහරේනයේ පූජනීය සිද්ධස්ථාන ඉදිකිරීම සඳහා ජාතික හා නාගරික ආයතනවල අනුමැතිය අවශ්‍ය වේ. ඊජිප්තුවේ දේවස්ථාන ඉදිකිරීමේ නීතිය (2016 අංක 80 දරන නීතිය) දේවස්ථානයක් ඉදිකිරීම අනුමත කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් නිර්මාණය කරයි.

ඇත්ත වශයෙන්ම, 1973 දී ශ්‍රී ලංකාවේ ඕනෑම ගොඩනැගිල්ලක්, පිළිමයක් හෝ වෙනත් වස්තුවක් ඉදිකිරීම හා ස්ථාපිත කිරීම හෝ ඕනෑම ගොඩනැගිල්ලක් පොදු ආගමික වන්දනා සිද්ධස්ථාන ලෙස භාවිතා කිරීම සඳහා නියාමනය කිරීමට උත්සාහ දරා ඇත. 1973 මැයි 2 වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ න්‍යාය පත්‍රයට "සිද්ධස්ථාන" සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ හැර පොදු ආගමික වන්දනා ස්ථානයක් ලෙස භාවිතා කිරීමේ අරමුණ සහ එවැනි බලපත්‍ර සඳහා අයදුම්පත් ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ කරුණු සැපයීම යන දිර්ඝ නාමයෙන් යුතු පනත් කෙටුම්පතක් ඉදිරිපත් විය. මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය හමුවේ අභියෝගයට ලක් විය. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය කියා සිටියේ පනතේ කිසිදු විධිවිධානයක් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනි නොවන බවයි. පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ මතය උපග්‍රන්ථයේ දැක්වේ. කෙසේ වෙතත් පනත් කෙටුම්පත සුළුතර විපක්ෂය විසින් අදාළ දිනයේ රජය පෙර සූදානමකින් නොසිටි අවස්ථාවක උපක්‍රමික ක්‍රමවේදයක් මගින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඡන්ද 14 ට 3ක් ලෙස පරාජයට පත් කරන ලදී.

කිසියම් ස්ථානයක් මහජන ආගමික වන්දනා සිද්ධස්ථාන ලෙස භාවිතා කිරීම සඳහා ඕනෑම ගොඩනැගිල්ලක් ප්‍රතිමාවක් හෝ වෙනත් වස්තුවක්

ඉදිකිරීම හෝ ස්ථාපිත කිරීම හෝ ඕනෑම ගොඩනැගිල්ලක් පරිවර්තනය කිරීම නියාමනය කිරීම වැදගත් බව පරික්ෂණ කොමිෂන් සභාවේ අදහසයි. 1973 මැයි 2 වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලද "සිද්ධස්ථාන" යන පනත් කෙටුම්පතට සමාන නීතියක් කොමිෂන් සභාව විසින් යෝජිතය. උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවලට හෝ පළාත් සභාවලට කාර්යභාරයක් ලබා නොදෙමින් එම සම්පූර්ණ නියාමනය මධ්‍යම රජයට පවරා දෙමින් ආගමික සිද්ධස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා කිසියම් ගොඩනැගිල්ලක්, ප්‍රතිමාවක් හෝ වෙනත් වස්තුවක් ඉදිකිරීම හෝ ස්ථාපිත කිරීම හෝ ඕනෑම ගොඩනැගිල්ලක් පරිවර්තනය කිරීම නියාමනය කිරීම සඳහා වන නියාමන ආයතනය මධ්‍යම රජයේ ආයතනයක් බවට පත් විය යුතු බව සම්මත කල යුතු බවත් එවැනි නීතියක් සම්මත කළ යුතු වන බවත් පරික්ෂණ කොමිෂන් සභාවේ අදහසයි.

## 29 වන පරිච්ඡේදය

## ෆෙටෝ ව්‍යාපාරය

සහරාන් සහ ඔහුගේ කණ්ඩායම කිසියම් විදේශීය පිරිසක්, ආයතනයක්, සංවිධානයක් හෝ රටක් සමඟ සම්බන්ධවී ඇත්ද යන්න සොයා බැලීම සඳහා ශ්‍රී ලංකාවේ ෆෙටෝ ව්‍යාපාරය පිළිබඳව විමර්ශනයක් පරීක්ෂණයක් කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

කොළඹ තුර්කි තානාපති කාර්යාලයට[1] අනුව ගුලෙන්මොව්මන්ට් ලෙසද හැඳින්වෙන ෆෙටෝ ත්‍රස්තවාදී සංවිධානයකි. එහි නායකයා වන්නේ ඉස්ලාමීය උගතෙකු ලෙස සභාය දක්වමින් සිට, ෆෙටෝ ව්‍යාපාරයෙන් ඉවත් වූ  සයිඩ් නර්සිගේ ඉගැන්වීම් මත තම ව්‍යාපාරයේ දෘෂ්ටිවාදී පදනම මුලින් ගොඩනහා ගත් ෆෙටුල්ලා ගුලන්ය. 1999 දී නිරාගමික රාජ්‍යය පෙරළා දැමීමට තැත් කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනාකර නඩු විභාගයකින් පසුව ඔහු තුර්කිය  අතහැර ඇමරිකාවට සංක්‍රමණය විය. ඉස්ලාමීය සහයෝගීතා සංවිධානය සහ ගල්ෆ් අරාබි රාජ්‍යයන් සඳහා වන සහයෝගිතා කවුන්සිලය ෆෙටෝ ව්‍යාපරයට එරෙහිව යෝජනා සම්මත කර තිබුණි. ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත්වූ රජය, ජනාධිපතිවරයා සහ තුර්කියේ ව්‍යවස්ථානුකූල පාලනය පෙරලා දැමීම සඳහා 2016 ජූලි 15 වන දින තුර්කියේ කුමන්ත්‍රණයක් දියත් කිරීමට[2] ෆෙටෝ සංවිධානයේ නායකත්වයෙන් යුත් රහසිගත කණ්ඩායමක් ක්‍රියා කරන ලද බව තුර්කි රජය චෝදනා කරයි.

කෙසේ වෙතත් ෆෙටෝ ත්‍රස්තවාදි සංවිධානයක් නොවන බව පවසන වෙනත් විචාරකයින් සහ විශේෂඥයින් සිටිති. තුර්කි ජනරජයේ නිර්මාතෘ මුස්තාපා කෙමාල් අටතුර්ක්ගේ ලෞකික නවීකරණ දැක්ම සමඟ තමන් එකඟවන බව මෙන්ම ඔහුගේ ව්‍යාපාරය තුර්කියේ වඩාත් රැඩිකල් වෙනත් මුස්ලිම් කණ්ඩායම්වලින් වෙන්කර ගැනීම සඳහා ගුලන් විසින්ම ඇතිකරගත් සම්මුතියක් පෙන්වාදිය හැකිය. ෆෙටෝ පිළිබඳ ශ්‍රී ලාංකික විශේෂඥයකු වන මහාචාර්ය එස්.කේ. හෙට්ටිආරච්චි මහතා පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි

---

[1] Exhibit C-273(B) Note 1
[2] Exhibit C-273(B) Note 2

දෙමින් පවසා සිටියේ ෆෙටෝ යනු ත්‍රස්තවාදී සංවිධානයක් නොවන බවයි. ඇත්ත වශයෙන්ම ෆෙටෝ යනු ත්‍රස්තවාදී සංවිධානයක් ද යන්න පිළිබඳව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් කිසිදු සොයාගැනීමක් සිදුකර නැත . කෙසේ වෙතත්, විදේශීය රාජ්‍යයක් විසින් ත්‍රස්තවාදී සංවිධානයක් යැයි ප්‍රකාශ කරන සංවිධානයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් එවකට පැවති රජයේ ආකල්පය පිළිබඳව පරීක්ෂණ කොමිෂන් සභාව සැළකිලිමත් වේ. මන්දයත් එම ආකල්පය තුළින් ජාතික ආරක්ෂාව පිළිබඳ සමස්ත රජයේ සංවේදිතාවය පිළිබිඹු වන බව පරීක්ෂණ කොමිෂන් සභාවේ අදහස වන හෙයිනි.

FETO පිළිබඳ ගැටළු සහ එය ශ්‍රී ලංකාව තුළ පැවතීම සම්බන්ධයෙන් තුර්කි විදේශ ඇමති මෙව්ලූට් කැවුසොග්ලු විසින් අතිගරු ජනාධිපතිවරයා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා වෙත 2016 ජුනි මාසයේදී කොළඹදී දැනුම්දී ඇත. තුර්කිය නුදුරේදීම රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඔස්සේ විදේශ  කටයුතු අමාත්‍යංශය හරහා ලිපි ලේඛන ඉදිරිපත් කරන බව ශ්‍රී ලංකා දූත පිරිසට දන්වා සිටියේය.

2016 අගෝස්තු 4 වන දින ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී මෙම ප්‍රශ්නය මතු කළ හැකිවන පරිදි විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත[3] දන්වා ඇති බව පෙනේ. මෙම රැස්වීමේදී මෙම ගැටළුව ඇත්ත වශයෙන්ම සාකච්ඡා කළබව පෙනේ. එහෙත් ඒ සම්බන්ධයෙන් සිදුවූ සාකච්ඡාවන් හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ඉදිරි ක්‍රියාමාර්ග අපැහැදිලිය.

අති ගරු කොළඹ තුර්කි තානාපතිවරයා  විසින් අසාර්ථක කුමන්ත්‍රණ ප්‍රයත්නය සහ ෆෙටෝ සම්බන්ධ බවට චෝදනා සහ ෆෙටෝ සමඟ සම්බන්ධ වී සිටින පුද්ගලයින් කිහිප දෙනෙකු පිළිබඳව සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් ෆෙටෝ පිළිබඳ සවිස්තර වාර්තාවක්, 2016 අගෝස්තු  දිනැති නෝට් වර්බේල් ( ප්‍රකාශයක් උපුටාගත් සටහනක්) පණිවිඩයක් මඟින් නිල වශයෙන් විදේශ කටයුතු අමාත්‍යංශය වෙත ඉදිරිපත්

[3] Muslim Networks and Movements in Western Europe, September 2010, p. 18, Pew Forum on Religion & Public Life

කරන ලදි. ශ්‍රී ලංකාවේ ෆෙටෝ ආශ්‍රිත සංවිධානවල ක්‍රියාකාරකම් කැටිකිරීම සහ එම සංවිධානවල සාමාජිකයින් ශ්‍රී ලංකාවෙන් පිටුවහල් කිරීම සඳහා තුර්කි රජයේ ඉල්ලීම අදාළ ශ්‍රී ලංකා බලධාරීන් වෙත යොමු කරන ලෙස විදේශ අමාත්‍යංශයෙන් ඉල්ලීමක් කරන ලදි.

තුර්කි තානාපති කාර්යාලය විසින් හඳුනාගෙන ඇති සංවිධාන සහ පුද්ගලයින් අතර ඇති සම්බන්ධතා පිළිබඳව නිරීක්ෂණය කරන ලෙස විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් විසින් 2016 අගෝස්තු 24 දිනැති ලිපියක් මඟින් නීතිය,සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලා සිටින ලදි .නීතිය,සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පොලිස්පතිවරයාහට 2016 අගෝස්තු 30 දිනැති ලිපියක් මඟින් තුර්කි තානාපති කාර්යාලය විසින් හඳුනාගෙන ඇති සංවිධාන සහ පුද්ගලයින් අතර ඇති සම්බන්ධතා පිළිබඳව නිරීක්ෂණය කිරීම තුළින් ශ්‍රී ලංකා රජයට තුර්කි රජය මඟින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට කටයුතු කරන ලදී.

පොලිස්පතිවරයා විසින් 2016 සැප්තැම්බර් 06 දිනැති ලිපියක් මඟින් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ වෙත මෙ කරුණු යොමුකර ඇත. කෙසේ වෙතත් මේ පිළිබඳ කිසිදු පිළිතුරක් ලැබී ඇති බවට පොලිස්පති කාර්යාලයේ කිසිදු වාර්තාවක සඳහන් නොවේ.

කෙසේ වෙතත්, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ විසින් 2016 දෙසැම්බර් 06 දිනැති ලිපියක් මඟින් ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයාට දන්වා සිටියේ රාජ්‍ය බුද්ධි සේවය විසින් දේශීයව සිදුකරන ලද පරීක්ෂණවලින් හෙළිවී ඇත්තේ ෆෙටෝ විසින් අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ සංවිධාන පවතින බවත් තුර්කි නිලධාරීන්ගේ අදහස වන්නේ උපයන ලද ආදායම එම සංවිධාන ත්‍රස්තවාදය සඳහා යොදාගන්නා බවයි. ෆෙටෝහි ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා ආධාර ඉල්ලා තුර්කිය සිදුකරන ලද ඉල්ලීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා විදේශ කටයුතු අමාත්‍යාශයේ ලේකම්වරයාගේ අදහස් විමසීය. ආරක්ෂක අමාත්‍යංශය විසින් මෙම ඉල්ලීම 2016

දෙසැම්බර් 09 වන දින විදේශ කටයුතු අමාත්‍යංශය වෙත යොමු කරන ලදී. මෙම කරුණ මතුවූ විට විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් විසින් 2016 අගෝස්තු 4 වන දින ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී මෙම ප්‍රශ්නය සාකච්ඡා කර ඇති බවත් මෙම කරුණට අදාළ සහයෝගය ශ්‍රී ලංකාව විසින් ලබාදීම ඉතා වැදගත් බවත් පෙන්වාදී ඇත. ශ්‍රී ලංකාවේ ෆෙටෝ අනුබද්ධ ව්‍යාපාරවලින් උපයන ආදායමෙන් ත්‍රස්තවාදී සංවිධානවලට අරමුදල් සපයන්නේ කුමක් සඳහාද යන්න පිළිබඳව දෘඪ සාක්ෂි ඉදිරිපත් කරන තෙක් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අත්හිටවන බව දන්වන ලදි .

2017ජනවාරි 19 වන දින තුර්කියේ ශ්‍රී ලංකා තානාපතිවරයා සමඟ පැවති සාකච්ඡාවකදී ද්විපාර්ශ්වික දේශපාලන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් (දකුණු ආසියාව) තානාපති ෆාසිල් කාර්මන් විසින්[4] ශ්‍රී ලංකාව තුළ ෆෙටෝ සම්බන්ධිත පුද්ගලයින් සහ සංවිධාන සිටීම පිළිබඳව තුර්කි රජයේ කනස්සල්ල යළිත් වරක් මතුවිය. ෆෙටෝ සමඟ සම්බන්ධතා ඇති බවට චෝදනා කරන ආයතනවලට එරෙහිව මිත්‍ර රටවල් පියවර ගනු ඇතැයි තුර්කි රජය අපේක්ෂා කරන බව දැනුම් දෙන ලදී.

2017 ජුනි 22 වන දින කොළඹදී ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ තුර්කියේ තානාපතිවරයා අතර ද්විපාර්ශ්වික සාකච්ඡාවකදී සහ පිලිපීනයේ මැනිලා නුවර 24 වන ආසියාන් කලාපීය සංසදයට සමගාමීව 2017 අගෝස්තු 4 වන දින විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා වූ වසන්ත සේනානායක මහතා හා තුර්කි විදේශ අමාත්‍ය මෙව්ලුට් කැවුසොග්ලු මහතා විසින් ෆෙටෝ පිළිබඳ ප්‍රශ්නය යළිත්වරක් මතු කරන ලදී.

FETO ආශ්‍රිත ව්‍යාපාර සම්බන්ධයෙන් තුර්කි රජය විසින් විධිමත් ලෙස මතුකර ඇති ගැටළු විසඳීම සඳහා ඉදිරි පියවර සාකච්ඡා කිරීම සඳහා 2017 ඔක්තෝම්බර් 09 වන දින විදේශ කටයුතු අමාත්‍ය තිලක් මාරපන මහතා, ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් කපිල වෛද්‍යරත්න සහ රාජ්‍ය බුද්ධි සේවයේහි අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වුණි. විදේශ කටයුතු ලේකම් ප්‍රසාද් කාරියාවසම් සහ විදේශ කටයුතු අමාත්‍යංශයේහි බටහිර අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් යන

44

මහත්වරු ද සහභාගිවූහ. මෙහිදී සාකච්ඡාවට බඳුන්වූයේ ෆෙටෝ අනුබද්ධිතව මෙරට ක්‍රියාත්මක වනවා යැයි සැලකෙන ශ්‍රී ලංකාවේ පුණ්‍ය කටයුතු සහ අධ්‍යයන කටයුතු පිළිබඳය.

ශ්‍රී ලංකාවේ තුර්කි දූත මණ්ඩලය හරහා තුර්කි රජය විසින් විධිමත් ලෙස මතුකරන ලද කරුණු සාකච්ඡා කෙරුණි. වීසා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් තුර්කි තානාපති කාර්යාලය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරන බව විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා දැනුම් දුන්නේය. ඒ අනුව කල් ඉකුත්වූ වීසා බලපත්‍ර දීර්ඝ කිරීම හෝ නැවත නිකුත් කිරීම සිදුනොකෙරුණි. තුර්කියේ ත්‍රස්ත ප්‍රහාර එල්ල කර ඇති බවට දැඩි සාක්ෂි නොමැති හෙයින් තුර්කි අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා වීසා බලපත්‍ර ප්‍රතික්ෂේප කළ නොහැකි බව ඔහු තවදුරටත් පැහැදිලි කළේය. තුර්කි රජය විසින් ශ්‍රී ලංකා බලධාරීන්ට ෆෙටෝ විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සමඟ ව්‍යාපාරික සම්බන්ධතා ඇති ජ්‍යෙෂ්ඨ කැබිනට් අමාත්‍යවරුන් දෙදෙනෙකු පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වෙත දැනුම් දුන්නේය. ඔවුන් අතර ගරු රිෂාඩ් බතියුදීන් සහ ගරු කබීර් හෂීම් යන මහත්වරුන්ද සිටින බව විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා දැනුම් දුන්නේය. කෙසේ වෙතත් ගැටලුවේ සංවේදී දේශපාලන ස්වභාවය සැලකිල්ලට ගෙන එය අවධානයට ලක්නොකර සිටීම යෙහෙකැයි මෙහිදී තීරණය කෙරුණි. රැස්වීමේ වර්තා සටහන් කිහිපය තුළ පමණක් ඔවුන්ගේ නම් ප්‍රකාශ වී ඇති අතර එම තොරතුරු පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විසින් ලබාගෙන ඇත්තේ රැස්වීමට සහභාගි වූ එක් අයෙකු හරහා පමණි. මෙය 2019 අප්‍රේල් 21 වන දින පාස්කු ප්‍රහාරයට පෙර ෆෙටෝ ප්‍රශ්නය සම්බන්ධයෙන් පවත්වන ලද අවසාන රැස්වීම බව පෙනේ. කබීර් හෂීම් සිය සාක්ෂි විමසීමේදී ශ්‍රී ලංකාවේ ෆෙටෝහි ව්‍යාපාරික ආයතන සමඟ කිසිදු සම්බන්ධයක් ඇති බව ප්‍රතික්ෂේප කළේය.

ශ්‍රී ලංකාවට පැමිණෙන තුර්කි ජාතිකයින්ගේ වීසා බලපත්‍ර අයදුම්පත් පරීක්ෂා කිරීම සඳහා තුර්කි තානාපති කාර්යාලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය බුද්ධි සේවය

සමඟ එක්ව නිලනොවන පරිපාලන වැඩ පිළිවෙලක් පවත්වාගෙන ගොස් ඇති බව පෙනේ.

2019 පෙබරවාරි මාසයේදී තුර්කි රජය විසින් තුර්කියේ ශ්‍රී ලංකාවේ තානාපතිවරයා සමඟ ශ්‍රී ලංකාවේ ෆෙටෝ පිළිබඳ ප්‍රශ්නය යළිත් වරක් මතු කරන ලදී.[5] කොළඹ තුර්කි තානාපති කාර්යාලය විසින් පුද්ගලයන්ගේ ලැයිස්තුවක් සහ අවලංගු කරන ලද විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ විස්තර ශ්‍රී ලංකා බලධාරීන්ට ලබාදී ඇති බව දන්වා ඇත. (2018 මාර්තු 15 වන දින රාජ්‍ය බුද්ධි සේවයේ සහ 2019 ජනවාරි 7 වන දින ආරක්ෂක අමාත්‍යංශයේහි ලේකම්) කෙසේ වුවද විදේශ ගමන් බලපත්‍ර තුර්කිය විසින් අවලංගු කරනලද පුද්ගලයන්ගෙ වීසා ෆෙටෝ සමඟ සම්බන්ධවී සිටින තුර්කි ජාතිකයින්ට තුර්කිය විසින් ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර අවලංගු කිරීමෙන් පසුව පවා ශ්‍රී ලංකා බලධාරීන් විසින් දිගින් දිගටම වීසා බලපත්‍ර නිකුත් කරමින් සිටීම පිළිබඳව තුර්කි බලධාරීන් කලකිරීමට පත්ව ඇති බව ද සඳහන් වී ඇත.

ෆෙටෝ ප්‍රශ්නය සම්බන්ධයෙන් රජය විසින් පාස්කු ප්‍රහාරය මාධ්‍යය තුළ ඉස්මතු වන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් 2019 ජුලි 22 දිනැති ලිපියක් මඟින් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත තුර්කි තානාපති කාර්යාලයෙන් ලැබුණු නම් සහ තුර්කි විදේශ ගමන් බලපත්‍ර අංක ලැයිස්තුවක් ලියා එම පුද්ගලයින් රට හැර ගොස් ඇත්දැයි විමසීය. පාලක ජනරාල් විසින් 2019 අගෝස්තු 2 දිනැති ලිපියක් මඟින් විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයාට තොරතුරු ලබාදී ඇති අතර, පුද්ගලයින් 50 දෙනාගෙන් පුද්ගලයින් 05 දෙනෙකුගේ පිළිබඳව වාර්තා නොමැති අතර එක් අයෙකු විදේශ ගමන් බලපත්‍ර අංකයක් සඳහා රටින් බැහැරව සිටින බව පෙන්නුම් කර ඇත. අනෙක් විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහා කිසිදු වාර්තාවක් නොතිබුණි. රට තුළ සිටින්නේ එක් අයෙකු පමණි.

මෙම කාරණය සම්බන්ධයෙන් කිර්ති ඇලපාත විජේරත්නගේ සාක්ෂිය විමසීමේ වාසිය පරීක්ෂණ කොමිෂන් සභාව සතුවිය. ඔහු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලක (වීසා) වන අතර වීසා බලපත්‍ර ක්‍රියා පටිපාටිය පිළිබඳව වඩාත් සාක්ෂි ලබාදී ඇත. විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් සංචාරක අවසරය (මෙතැන් සිට ETA ලෙස හඳුන්වනු ලැබේ) ස්ථාපිත කර ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය. එම දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් සංචාරක අවසරය ලබාගැනීම සඳහා ක්‍රම තුනක් හඳුන්වාදී ඇත.

පළමු ක්‍රමය යටතේ විදේශිකයෙකුට www.eta.gov.lk වෙත පිවිස අන්තර්ජාලය හරහා වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කළ හැකිය. දෙවනුව, විදේශිකයාට තම රටේ ශ්‍රී ලාංකික තානාපති කාර්යාලය හරහා වීසා බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ හැකිය. තෙවනුව, එවැනි විදේශිකයෙකුගේ නියෝජිතයෙකුට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් වීසා බලපත්‍රයක් අයදුම් කළ හැකිය. ETA සියළුම රටවල් සඳහා විවෘතව පවතින බවත් මාලදිවයින, සීෂෙල්ස් සහ සිංගප්පූරුව යන රටවලින් පැමිණෙන අ[illegible]A වෙත දත්ත ඇතුළත් නොකර වීසා ලබාගත හැකි බවත් සාක්ෂිකරු තවදුරට[illegible] දුන්නේය. කෙසේ වෙතත් සාක්ෂිකරු ප්‍රකාශ කළේ 'වීසා මත පැමිණීමේ' යටතේ පැමිණෙන අමුත්තන්ගේ දත්ත දේශසීමා පාලන පද්ධතියට ඇතුළත් කර ඇති බවයි. එම ETA සහ දේශසීමා පාලන පද්ධතිය එකිනෙකට සම්බන්ධ වූ වෙනම පද්ධති දෙකක් බව සාක්ෂිකරු තව දුරටත් සාක්ෂි දුන්නේය. අමුත්තන්ගේ ආගමන හා විගමන දත්ත සනාථ කිරීම සඳහා වීසා සහ දේශසීමා පාලන පද්ධතිය නිකුත් කිරීමට ETA භාවිතා කරයි.

පුද්ගලයෙකු ශ්‍රී ලංකාවට පැමිණිවිට ඔහුගේ විදේශ ගමන් බලපත්‍රය ආගමන හා විගමන කවුළුවට ඉදිරිපත් කළයුතු බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය. එවැනි විදේශ ගමන් බලපත්‍රය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තරව නඩත්තු කෙරෙන 'සෝදිසි මඟින් ලැයිස්තුවක්' මඟින් පරීක්ෂා කරනු ලැබේ. එවැනි සෝදිසි ලැයිස්තුව රජයේ ආයතන සහ සාමාන්‍ය ජනතාව විසින් සපයනු ලබන තොරතුරුවලින් සමන්විත වේ. ඉහත සෝදිසි ලැයිස්තුවට අමතරව අපලේඛනයක් ද ඇත. SIS, CID, TID, SIU වැනි නීති

බලාත්මක කිරීමේ බලධාරීන් විසින් සපයනු ලබන තොරතුරු භාවිතා කරමින් මෙම ලැයිස්තුව සකස් කරනු ලැබේ. සංක්‍රමණ පිළිබඳ සහ අධිකරණ නියෝගවලින් සමන්විත නඩු පැවරීමේ ලැයිස්තුවක්ද ඇත. එම ලැයිස්තුවලට අමතරව ජාත්‍යන්තර පොලිස් ලැයිස්තුවක් සහ එක්සත් ජාතීන්ගේ සම්බාධක ලැයිස්තුවක්ද ඇත.

ETA හරහා අමුත්තන්ට වීසා ඉල්ලුම් කළ නොහැකි රටවල් දහයක් ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය. ඒවා නම් ඊජිප්තුව, සිරියාව, නයිජීරියාව, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය, අයිවරි කෝස්ට්, ගනා, කැමරූන්, උතුරු කොරියාව සහ මියන්මාරය. සිරියාවේ පුද්ගලයෙකුට ETA හරහා හෝ තානාපති කාර්යාලයට පැමිණ වීසා ලබාගත නොහැකි බව සාක්ෂිකරු වැඩිදුරටත් පැවසීය. වීසා ලබාගැනීම සඳහා එවැනි පුද්ගලයෙකුගේ නියෝජිතයෙකුට I සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ගොස් අයදුම්පත ඉදිරිපත් කළයුතුය. කෙසේ වෙතත්, සාක්ෂිකරු කියා සිටියේ වලංගු වීසා බලපත්‍රයක් ලබාගත් ශ්‍රී ලාංකිකයෙකු සිරියාවට පිටත්ව යන විට, එවැනි සංචාරයක අරමුණ කුමක් දැයි විමසීමට දැනට කිසිදු ක්‍රියා පටිපාටියක් නොමැති බවයි.

සංචාරක වීසා සහ ව්‍යාපාරික වීසා බලපත්‍ර ලබාගත හැකි වීසා වර්ග දෙකක් ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය. ආගමික උත්සවවලට සහභාගිවීමට අදහස් කරන අමුත්තන්ට ව්‍යාපාරික කාණ්ඩය යටතේ වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කළ හැකිය. කෙසේ වෙතත්, වීසා බලපත්‍ර අයදුම්පත්‍රයේ, ශ්‍රී ලංකාවේ සංචාරයේදී එවැනි අමුත්තන්ට අනුග්‍රහය දක්වන හෝ පහසුකම් සපයන්නේ කවර පාර්ශ්වයක්ද යන්න පිළිබඳ තොරතුරු අඩංගු නොවේ.

සාක්ෂිකරුට සී 335 ලෙස සලකුණු කර ඇති, තුර්කි පුද්ගලයින් 158 දෙනෙකුගේ නම් 158 ක් අඩංගු ලේඛනය පෙන් වූ විට ඔහු කියා සිටියේ පුද්ගලයින් 13 දෙනෙකු හැර සෙසු තුර්කි පුද්ගලයින් (145 ක්) වලංගු වීසා බලපත්‍රයක් යටතේ ශ්‍රී ලංකාවේ නැවතී සිටින බවයි. දේශසීමා පාලන පද්ධතියේ පුද්ගලයන් 13 දෙනෙකු සඳහා කිසිදු වාර්තාවක් නොවීය. පුද්ගලයින් 145 දෙනෙකු සංචාරක වීසා බලපත්‍රය යටතේ පැමිණ ඇති අතර සෙසු අය නේවාසික වීසා බලපත්‍ර යටතේ සිටින අය වෙති.

සී 335 ලෙස සලකුණු කර ඇති එම ලැයිස්තුවේ නම් කිහිපයකට සාක්ෂිකරුගේ අවධානය යොමුවූ අතර, ඔහු තවමත් ශ්‍රී ලංකාවේ සිටීද නැතහොත් රට හැරගොස් තිබේද යන්න පිළිබඳව අදහස් දැක්වීමට ඔහුට ආරාධනා කළේය. සාක්ෂිකරු දුන් පිළිතුරු සාරාංශ කොට පහත වගුවේ ඇතුළත් කර ඇත.

| බාණ්ඩ අංකය | ප්‍රකාශ |
|---|---|
| 14 | රට තුළ සිටී. |
| 29 | සිටී |
| 44 | සිටී |
| 53 | සිටී |
| 63 | සිටී |
| 73 | රටින් පිට වී තිබේ. |
| 81 | රට තුළ සිටී. |
| 88 | සිටී |
| 95 | සිටී |
| 98 | සිටී |
| 103 | සිටී |
| 106 | සිටී |
| 118 | සිටී |
| 128 | සිටී |
| 138 | සිටී |

ආගමන විගමන පාලක ජනරාල්වරයාගේ 2019 අගෝස්තු 02 දිනැති ලිපියේ අන්තර්ගතය සමඟ මෙම සාක්ෂි සංසන්දනය කරන විට, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දත්ත පදනමේ නිරවද්‍යතාවය පිළිබඳව බරපතල ප්‍රශ්නයක් පැන නගී. මෙම කාරණය කඩිනමින් විමසා බැලිය යුතුය.

ඉහත දක්වා ඇති සිද්ධිමය කාරණාවන්ට අදාළ පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ වාචික හා ලේඛනමය සාක්ෂි මඟින් සම්පින්ඩනය කරන ලදී.

## 30 වන පරිච්ඡේදය

## නිගමන

පරීක්ෂණ කොමිෂන් සභාව සිය අධිකාරී ක්ෂේත්‍රයේ විවිධ කොටස් සම්බන්ධයෙන් සිය නිගමන පහත පරිදි සම්පිණ්ඩනය කර තිබේ.

1. සහරාන්, රිල්වාන්, ෂයිනි, ඉල්හාම්, ඉන්ෂාෆ්, ජමීල්, හස්තුන්, මුවාත්, අසාද්, මුබාරක්, නවුෆර්, මිල්හාන්, සාදික් සහ තවත් අය ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සෘජුවම සම්බන්ධ පුද්ගලයින් බවට ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යභාරය යටතේ හඳුනාගෙන තිබේ. ඔවුන්ගෙන් සමහරෙකු පිළිබඳ විස්තර 16 වන පරිච්ඡේදයේ සඳහන් ය. ඉස්ලාම් අන්තවාදය ක්‍රියාත්මක වන පදනම වන්නේ තවුහිද් (වහබ්) දෘෂ්ටිවාදය වන අතර ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම්(SLJI), ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් ශිෂ්‍ය ව්‍යාපාරය (SLJISM) සහ තවුහිද් (Thowheed) කණ්ඩායම් වැනි සංවිධාන වක්‍රව ඊට සම්බන්ධ වේ.
2. 19 වන පරිච්ඡේදයේ හඳුනාගෙන ඇති නිලධාරීන් සහ බලධාරීන් මෙවැනි ත්‍රස්තවාදී හා අන්තවාදී ක්‍රියාකාරකම් රට තුළ සිදුවනු ඇති බවට පූර්ව නිශ්චය කිරීමට අපොහොසත් වීම සහ ඊට අදාළ කරුණු සොයා බැලීම හෝ ඊට සම්බන්ධ කවුරුන්ද යන්න පිළිබඳව සොයා බලා නීතියට අනුව ක්‍රියා කිරීම නොසලකා හැරීම සහ මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගෙන ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව නිගමනය කරයි.
3. 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාර වැළැක්වීමට අපොහොසත් වීම සහ ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමට අපොහොසත් වීම සහ නිසි පියවර නොගැනීම සම්බන්ධයෙන් 19 සහ 20 වන පරිච්ඡේදවල හඳුනාගෙන ඇති නිලධාරීන් සහ බලධාරීන් වගකිව යුතු බවට පවතින සාක්ෂි මත පරීක්ෂණ කොමිෂන් සභාව නිගමනය කරයි.
4. 2019 අප්‍රේල් 21 වන දින ප්‍රහාරය සිදුවීමෙන් පසු මහජන විරෝධතා, කඩාකප්පල්කාරී ක්‍රියාවන් දේපල හා පුද්ගලයන්ට හානි සිදු කිරීම සහ මහජන

නොසන්සුන්තාවයට 27 වන පරිච්ඡේදයේ හඳුනාගෙන ඇති පුද්ගලයින් සම්බන්ධ බවට ලැබී ඇති සාක්ෂි මත පරීක්ෂණ කොමිෂන් සභාව නිගමනය කරයි.

5. 18, 22 සහ 25 පරිච්ඡේදවල හඳුනාගෙන ඇති පුද්ගලයින් සහ සංවිධාන වාර්ගික හා ආගමික ක්‍රියාවන්ට හේතු වූ වාර්ගික හා ආගමික කැළඹීම් ඇති කිරීමට තුඩු දුන් මහජන නොසන්සුන්තාවයක් ඇති කොට රට තුළ මෙවැනි ක්‍රියාවන්ට ආධාර හෝ අනුබල ලබා දුන් බවට සහ එම ක්‍රියාවන් මගින් සමාජය තුල සාමය ස්ථාපිත කිරීමට බාධා කළ අතර සමාජ අඛණ්ඩතාව කඩාකප්පල් කරමින් වාර්ගික කැළඹීම්ද ඇති කළ බව ඒ සම්බන්ධයෙන් පවතින සාක්ෂි මත පරීක්ෂණ කොමිෂන් සභාව නිගමනය කරයි

6. 2019 අප්‍රේල් 21 වන දින සිදුවීම් සඳහා මූලිකව හේතු වන්නේ වහබ් දෘෂ්ටිවාදය සහ තවුහිද් කණ්ඩායම්, ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් (SLJI) සහ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි ශිෂ්‍ය ව්‍යාපාරය (SLJISM) වැනි කණ්ඩායම්ද, ජාත්‍යන්තරව අයිඑස් සංවිධානයේ ක්‍රියාකාරකම් සහ දේශීය වශයෙන් බොදුබල සේනා සංවිධානය වැනි අන්තවාදී කණ්ඩායම්වල ක්‍රියාකාරකම් මෙම සිදුවීම් සඳහා දායක වූ බව පරීක්ෂණ කොමිෂන් සභාව නිගමනය කරයි.

7. අප්‍රේල් 21 සිදුවීම් සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ ඊබ්‍රාහිම් සොහොයුරන් වන ඉන්ෂාෆ් සහ ඉල්හාම් විසිනි. 26 සහ 31 පරිච්ඡේදවල දක්වා ඇති පරිදි අගතියට පත් පාර්ශවයන් සඳහා වන්දි ගෙවීම සහ සුහසාධන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සිදුකළ යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි. මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සහ මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ 23 සහ 31 වන පරිච්ඡේදවල අඩංගු වේ.

8. රිෂාඩ් බතියුදීන් මහතා සම්බන්ධයෙන් 22 වන පරිච්ඡේදයේ දක්වා ඇති තඹ කර්මාන්ත ශාලාවට අදාළ කරුණු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු කාරණයක් ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව හඳුනා ගනී.

9. එම වැරදි සිදු කළ බවට චෝදනා ලැබ සිටින පුද්ගලයින්ට එරෙහිව අපරාධ නඩු පැවරීම පිළිබඳව සලකා බැලීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් වාර්තාවේ සම්පූර්ණ වාර්තාව නීතිපති වෙත භාර දීම මැනවැයි පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

10. පරීක්ෂණ කොමිෂන් සභාවේහි නිර්දේශ 31 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

## 31 වන පරිච්ඡේදය

## නිර්දේශ

පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය භාර්ය ප්‍රකාරව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවට අවශ්‍ය වේ.

(i) පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම හෝ වෙනත් ආකාරයකින් සහාය වීම. මේ පිළිබඳව පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ 26 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

(ii) මහජනයාගේ ආරක්ෂාව සහතික කිරීම.

(iii) මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම.

(iv) අනාගතයේ දී එවැනි අතපසුවීම් හා වැරදි සහගත සිදු වීම වැළැක්වීම.

(v) එවැනි ත්‍රස්තවාදී ක්‍රියා සහ අන්තවාදයන් මඟින් ජාතික ආරක්ෂාවට හා ජාතික සමඟියට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම. පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඉහත කරුණු සම්බන්ධයෙන් සිය නිර්දේශ ඉදිරිපත් කරයි. නිර්දේශයන් අදාළ වන උප අංශ කිහිපයක් යටතේ හඳුනාගෙන පසුව ඒවා අකාරාදී පිළිවෙලට සකස් කර තිබේ.

රාජ්‍ය පරිපාලනය

1. රජයේ පරිපාලනයේ වැදගත් අංග තුනක් නොමැති වීම රැඩිකලීකරණ ක්‍රියාවලියේදී වැදගත් භූමිකාවක් ඉටු කරයි. එනම් යහපාලනය නොමැතිකම, ඵලදායී අධිකරණ පද්ධතියක් නොමැති වීම සහ ජනතා ප්‍රශ්න නැගීමට වේදිකා නොමැති වීම. මෙම අංශ තුනේ ඇති සියලුම අඩුපාඩුකම් සපුරාලීම සඳහා ඵලදායී හා ප්‍රායෝගික පියවර ගැනීම වැදගත්ය. අන්තර්ජාතික ත්‍රස්තවාදය පිළිබඳ විශේෂඥයෙකු වන මහාචාර්ය රොහාන් ගුණරත්න මහතා සාක්ෂි දෙමින් කියා සිටියේ යහපාලනය නොමැතිකම, ආයතනික අසාර්ථකත්වය සහ දේශපාලන අස්ථාවරත්වය ත්‍රස්තවාදීන්ට

ක්‍රියාත්මක වීමට සාරවත් පදනමක් සපයන බවයි. 2016 සිට සහරාන් යහපාලනයේ අඥතාවය සහ අධිකරණ පද්ධතිය පිළිබඳව කතා කළේය.

ගුවන් අවකාශය

1. ඩ්‍රෝන කැමරා භාවිතය ඇතුළු ගුවන් අවකාශය රජය විසින් සම්පූර්ණයෙන්ම නියාමනය කළ යුතුය. සහරාන්ගේ කණ්ඩායම 2018 දී පමණ ඩ්‍රෝන කැමරාවක් මිලදී ගෙන ඇත.

සමස්ත ලංකා ජමියතුල් උලමා

1. සමස්ත ලංකා ජමියාතුල් උලමා ව්‍යුහය තුළ සූෆි මුස්ලිම් ප්‍රජාව ප්‍රමාණවත් ලෙස නියෝජනය වන බව සහතික කිරීම සඳහා 2000 අංක 51 දරණ පනත සංශෝධනය කිරීම. මෙම සූෆි මුස්ලිම් කණ්ඩායම ජමියතුල් උලමා සංවිධාන ව්‍යුහය තුළ ප්‍රමාණවත් පරිදි නියෝජනය නොවන බවට පරීක්ෂණ කොමිෂන් සභාව වෙත සාක්ෂි ඉදිරිපත් වී ඇත.

පුරාණ ආගමික ස්මාරක

1. සියළුම නිකායන්හි සියලුම පුරාණ ආගමික ස්මාරක ආරක්ෂා කළ යුතුය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා පොලිසියේ විශේෂ අංශයක් ජාතික හා පළාත් මට්ටමින් නිර්මාණය කළ යුතුය.

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට

1. ශ්‍රී ලංකා දූත මෙහෙවරකට හෝ ආයතනයකට නොපැමිණ සාක්ෂිකරුවෙකු විදෙස් රටවලින් සාක්ෂි ලබා ගැනීමට හැකි වන පරිදි පනත සංශෝධනය කළ යුතුය. මෙයට හේතුව ශ්‍රී ලංකා දූත මෙහෙවරක් හෝ ආයතනයක් නොමැති රටවල් මෙන්ම එම පුද්ගලයා විදේශ රටක අත්අඩංගුවේ තබා ගැනීමේ හැකියාව ද ඔහු රඳවා තබා ගැනීමෙන් ඉවත් කිරීමට නීතියෙන් ඉඩ නොදෙන බැවිනි. උදාහරණයක්

ලෙස ශ්‍රී ලංකා ත්‍රස්ත සැකකරුවෙකු පුහුණු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි දීමට හැකි ත්‍රස්ත සැකකරුවෙකු හෝ විදේශගතව සිටින වැරදිකරුවෙකු විය හැකිය.

නීතිපති දෙපාර්තමේන්තුව

1. ත්‍රස්තවාදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඒ වෙනුවෙන් පමණක් ක්‍රියාත්මක වන අභිචෝදකයන්ගේ ඒකකයක් පිහිටුවීම. ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබා දිය යුතුය. ත්‍රස්තවාදී නඩු විභාග කිරීම සහ සහාය දීම හැර වෙනත් කාර්යයන් කණ්ඩායමට පැවරිය යුතු නොවේ.

2. දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල කාර්තුමය ගොනු සමාලෝචන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. පාස්කු ඉරිදා ප්‍රහාරය තෙක් 2017 දී ත්‍රස්ත විමර්ශන අංශය විසින් භාර දුන් ගොනුව කිසිදු ආකාරයක ගොනු සමාලෝචනයට යටත් නොවන බව පරීක්ෂණ කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය.

3. ත්‍රස්ත විමර්ශන අංශය සහ අනෙකුත් අදාළ ආයතනවල ඒ වෙනුවෙන් ක්‍රියා කරන කණ්ඩායම සහ නිලධාරීන් විසින් කරුණු සමාලෝචනයේ යෙදෙන රැස්වීමක් මාසිකව ක්‍රියාත්මක කිරීම.

ප්‍රශංසා

1. පොලිස් සැරයන් 83225, 2019 සුමින්ද නිහාල් වීරසිංහ අප්‍රේල් 26 වන දින සයින්දමර්දූහි සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් දැක්වූ නිර්භීතකම වෙනුවෙන් ප්‍රශංසාවට ලක්විය යුතු ය. නොදන්නා කණ්ඩායමක් ගමේ ගැවසෙන බවට ගම් වැසියන්ගෙන් දැනගත් වහාම සිය ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ අවධානය ද ඊට යොමු කරමින් තමාට වෙඩි තබන විටත් අදාළ නිවස දෙසට ගමන් කිරිම ප්‍රශංසනී ය.

සමාගම්

1. සමාගම් පනතේ සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නැවත සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කළ යුතුය. ව්‍යාපාර කිරීමේ පහසුව සහ ජාතික ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා අතර සමබරතාවයක් ඇති කළ යුතුය.

2. සමාගම්වල වාර්ෂික වාර්තා සම්බන්ධ දැනුම්දීම් නිසි ලෙස අධීක්ෂණය කළ යුතුය.

3. සමාගම් පනත යටතේ ආගමික පාසල් ලියාපදිංචි නොකළ යුතුය. ඔවුන් සියලු වර්ගවල ආගමික පාසල් නියාමනය කරන පාලන තන්ත්‍රයක් තුළට ගෙන ආ යුතුය.

වන්දි

1. රජය විසින් රු. මියගිය එක් අයෙකු සඳහා රුපියල් මිලියන 2 ක් සහ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් තුවාල ලැබූ සියලු දෙනාගේ සැබෑ වියදම් සලකා රු. 5,00,000 /= වන්දි ප්‍රදානය කල යුතු බවට නිර්දේශ කරන අතර මෙම සූත්‍රය සඳහා දැනටමත් ගෙවා ඇති ඕනෑම වන්දියක් සැලකිල්ලට ගත යුතුය.

2. පුද්ගලයන්, දේපල හා කර්මාන්ත පුනුරුත්තාපනය කිරීමේ අධිකාරියේ වාර්තාවලට අනුව පුද්ගලයින් 220 දෙනෙකුගේ මරණ සඳහා වන්දි ගෙවා ඇත. කෙසේ වෙතත් සාක්ෂිවලට අනුව 2019 අප්‍රේල් 21 වන දින සිදුවීම් කිහිපයක් හේතුවෙන් මරණ 271 ක් සිදුවිය. ඉතිරි මරණ 51 සඳහා ද රජය වන්දි ගෙවිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

3. 2018 අංක 34 දරණ පනත මඟින් සංස්ථාපනය කර ඇති හානි පූරණ කාර්යාලය අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවක් යටතේ වින්දිතයින් අතර වඩාත් අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ ජීවිත කාලය පුරාම සුභසාධනය සඳහා අරමුදල් ඉල්ලා සිටීමට විධිවිධාන ඇත. එබැවින් වැඩිදුර අරමුදල් සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා හානි පූරණ කාර්යාලය විසින් රේඛීය අමාත්‍යාංශයට පුළුල් යෝජනාවක් ඉදිරිපත් කිරීම නිර්දේශ කරනු ලැබේ. 26 වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි සෙත් සරණ විසින් යෝජනා කරන ලද මෙම කැබිනට් පත්‍රිකා ආවරණ අවශ්‍යතා යෝජනා කෙරේ.

4. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා සුභසාධන ව්‍යාපෘතියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර භාණ්ඩාගාරයෙන් කඩින් කඩ වාර්ෂික පදනමක් මත අරමුදල් වෙන් කිරීමෙන් වසර 5 ක කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. වන්දි ගෙවීම සහ සුභසාධන ක්‍රියාමාර්ග පිළිබඳ වැඩිදුර තොරතුරු 26 වන පරිච්ඡේදයේ ඇත.

5. 2019 අප්‍රේල් 26 න් පසු සිදු වූ සිදුවීම් සඳහා වන්දි ගෙවිය යුතු පුද්ගලයින්ට මුදල් ගෙවන බවට සහතික විය යුතු ය. කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මොහොමඩ් නාහීම් මොහොමඩ් මුසාෆර්ට මුදල් ගෙවා නොමැති බවට සාක්ෂි ඉදිරිපත් කර ඇත.

6. 2019 මැයි 9 වන දින මොහොමඩ් රාසික් මොහමඩ් තස්ලින් තම බිරිඳ සමඟ නිදා සිටියදී මාවනැල්ලේ දනගමහි පිහිටි ඔහුගේ නිවස අසලදී වෙඩි තබා ඇත. 2019 ජනවාරි 16 වන දින වනාතවිල්ලුවේ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සහ බුද්ධ ප්‍රතිමා කැඩීම හා සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඔහු වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ඔහු දැනට ප්‍රතිකාර ලබමින් සිටින නමුත් එක්සත් රාජධානියේ වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය වේ. මෙම ප්‍රතිකාරය සඳහා රජය මූල්‍ය ආධාර සැපයීම මෙන්ම ඔහුට ආරක්ෂාව සැපයීම කරන මෙන් රජයට නිර්දේශ කරනු ලැබේ.

7. මඩකලපුවේ සියොන් දේවස්ථානයේ අභාවප්‍රාප්ත රමේෂ් රාජු මහතාගේ සමීපතම ඥාතියාට (next of kin) මරණ සංඛ්‍යාව අවම කිරීමට හේතු වූ නිර්භීතකම වෙනුවෙන් ත්‍යාග ගෙවීමක් සිදු කිරීමට රජය විසින් කටයුතු කල යුතු බව නිර්දේශ කරයි.

රාජසන්තක කිරීම

1. 26 වන පරිච්ඡේදයේ සඳහන් යෝජනා සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීම සඳහා මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ව්‍යාපාර දේපළ ඇතුළු සියලු දේපළ

රාජසන්තක කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතුය. මරාගෙන මැරෙන බෝම්බකරුවන් සියදිවි නසා ගැනීම පිළිබඳ තීරණය කිරීමෙන් පසු ඔවුන්ගේ දේපළ මාරු කර ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාවට දැනගන්නට ලැබී ඇති හෙයින් එවැනි නීති යම් දුරකට ක්‍රියාත්මක විය යුතුය.

ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම

1. ආගමික වන්දනා ද්ධස්ථාන ලෙස භාවිතා කිරීම සඳහා කිසියම් ගොඩනැඟිල්ලක්, පිළිමයක් හෝ වෙනත් වස්තුවක් ඉදිකිරීම හෝ ස්ථාපිත කිරීම හෝ ඕනෑම ගොඩනැඟිල්ලක් පරිවර්තනය කිරීම නියාමනය කළ යුතුය. **1973** මැයි **2** වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලද "සිද්ධස්ථාන" යන පනත් කෙටුම්පතට සමාන නීතියක් ක්‍රියාත්මක කළ යුතුය (උපග්‍රන්ථය VIII). මහජන ආගමික වන්දනා සිද්ධස්ථාන ලෙස භාවිතා කිරීම සඳහා කිසියම් ගොඩනැඟිල්ලක්, පිළිමයක් හෝ වෙනත් වස්තුවක් ඉදිකිරීම හෝ ස්ථාපිත කිරීම හෝ කිසියම් ගොඩනැගිල්ලක් පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවලට හෝ පළාත් සභාවලට කාර්යභාරයක් තිබිය යුතු නොවේ. නියාමන ආයතනය මධ්‍යම රජයේ ආයතනයක් විය යුතුය. මෙම අංගය **28** වන පරිච්ඡේදයේ විස්තරාත්මකව දක්වා ඇත.

ත්‍රස්ත මර්දන පනත

1. ත්‍රස්තවාදයට එරෙහිව නව නීතියක් පැනවිය යුතුය. පරීක්ෂණ කොමිෂන් සභාව විසින් මේ සඳහා ඉදිරිපත් කල ඇති යෝජනා **23** වන පරිච්ඡේදයෙන් සොයාගත හැකිය.

ත්‍රස්තවාදී මූල්‍යකරණ මර්දනය පිළිබඳ සම්මුතිය

1. ජාත්‍යන්තර නිර්දේශයන්ට අනුකූලව ත්‍රස්තවාදයට මුදල් යෙදවීම සම්බන්ධ වරද ශක්තිමත් කිරීම. වරක් ශක්තිමත් කරන ලද වරද ත්‍රස්තවාදී ක්‍රියාවන් සඳහා සූදානම් වීම, සැලසුම් කිරීම හෝ සකස් කිරීම හෝ සහභාගී වීම හෝ ත්‍රස්තවාදී පුහුණුව

ලබා දීම හෝ ලැබීම සඳහා විදේශ රාජ්‍යයකට යන පුද්ගලයින්ගේ ගමන් සඳහා මුදල් යෙදවීම සලකා බලනු ඇත.

2. මානව හා වෙනත් සම්පත් ලබා දීමෙන් ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සම්බන්ධව විභාග වෙමින් පවතින පරීක්ෂණ කඩිනම් කිරීමට ගත යුතු පියවර. 2005 දී බලාත්මක වූ දා සිට පනත යටතේ කිසිදු වරදකරුවෙකු කර නොමැත. දෙමළ පුනරුත්ථාපන සංවිධානයට එරෙහිව ගොනු කර ඇති ත්‍රස්තවාදී මූල්‍ය නඩුව තවමත් 2009 සිට උසාවියේ විභාග වෙමින් පවතී.

අපරාධ පරීක්ෂණ

1. සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සමඟ මොහොමඩ් නෆීස් මොහමඩ් නෆ්රිත් සහ මොහමඩ් නෆීස් මොහමඩ් නවිත් සම්බන්ධ කර ගැනීම පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතුය. එහි කොටසක් ලෙස, එස්.එල්.ජේ.එස්.එම්. ඇතුළු අනෙකුත් තවුහිද් කණ්ඩායම් සමඟ ඔවුන් සම්බන්ධ වී ඇතිද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්විය යුතුය. ඔවුන්ව කොන්දේසි සහිත මුදා හැරීමක් සිදුකළ අවස්ථා පිළිබඳව ද විමර්ශනය කළ යුතුය.

2. නිශ්චිත අවසරයකින් තොරව විමර්ශන ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එකම කාරණය විමර්ශනය නොකරන බවට සහතික විය යුතු ය. එක් අවස්ථාවක දී රහස් පොලිසිය සහ ත්‍රස්ත විමර්ශන අංශය යන ආයතන ද්විත්වයම සහරාන් පිළිබඳව විමර්ශනය කරමින් සිටින බව පරීක්ෂණ කොමිෂන් සභාව නිරීක්ෂණය කළ අතර එමඟින් විමර්ශනවලින් ඉවත් වන ලෙස රහස් පොලිසිය ඉල්ලා සිටියේය. විමර්ශන ආයතන අතර සම්බන්ධීකරණයක් තිබිය යුතුය.

3. දැනට පවත්නා අපරාධ පරීක්ෂණවලට අදාළව පාර්ලිමේන්තු මන්ත්‍රී, පළාත් සභාව හෝ පළාත් පාලන ආයතනය ඇතුළු ඕනෑම දේශපාලනයෙකු කිසිදු පොලිස් නිලධාරියෙකු සම්බන්ධ කර ගැනීම වැළැක්වීම සඳහා නීතිමය විධිවිධාන විශේෂයෙන් ක්‍රියාත්මක කළ යුතුය. සැකකරු ඉන්සාන් මයිනුදීන් සහ මාවනැල්ල

සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයන් රිෂාඩ් බදුදීන් සහ අසාඩ් සාලි මහතා විසින් සිදු කරන ලද මැදිහත්වීම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරිපත් ඇති සාක්ෂි සැලකිල්ලට ගනිමින් මෙම නිර්දේශය ඉදිරිපත් කර ඇත.

4. ආගමික හෝ ජනවාර්ගික අසමගිය ඇති කිරීමට සම්බන්ධ බවට සැක කෙරෙන කිසිදු පුද්ගලයෙකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම සඳහා විධිවිධාන සැලසීම.

5. මහේස්ත්‍රාත්වරයකු විසින් අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කරන විට ත්‍රස්ත සැකකරුවෙකු සැඟවී සිටින ඕනෑම ගොඩනැගිල්ලක් හෝ නිවසක් සෙවීම සඳහා සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා නීතිය සංශෝධනය කිරීම. එක්සත් රාජධානියේ 2019 ත්‍රස්තවාදයට එරෙහි ආරක්ෂක පනතේ 56 ඒ වගන්තිය උපදේශාත්මක ය.

අපරාධ නඩු විභාගය

1. පාස්කු ඉරිදා ප්‍රහාර මෙන්ම ත්‍රස්තවාදී නඩු සම්බන්ධ සියලු අපරාධ නඩු විභාග කිරීමට හා අවසන් කිරීමට කැප වූ මහාධිකරණ පිහිටුවීම. මේ සම්බන්ධයෙන් විනිසුරුවන්ට විශේෂ රැකවරණයක් මෙන්ම පුහුණුවක් ද ලබා දිය යුතුය.

2. දිනපතා නඩු විභාග කල යුතු ය.

3. ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් රෂීඩ් හජ්ජුල් අක්බාර්ට එරෙහිව අපරාධ නඩු පැවරීම පිළිබඳව සලකා බැලීමට නීතිපති.

4. රාසික් රෆිදීන් නොහොත් අබ්දුල් රාසික්ට එරෙහිව අපරාධ චෝදනා ගොනු කළ හැකිද යන්න කඩිනමින් සලකා බැලීමට නීතිපති. 2014 මැයි 6 වන දින උතුම් ත්‍රිවිධරත්නය මැණික් ගල් තුනකට සමාන කළ ඔහු එවැනි මැණික් ගල්වලට ගරු කිරීමෙන් කිසිවෙකුට සහනයක් ලබා ගත හැකිදැයි ප්‍රශ්න කළේය. බුදුරජාණන්

වහන්සේ මිනිස් මාංශ අනුභව කළ බව ඔහු තවදුරටත් කියා සිටියේය. මේ ප්‍රකාශය සම්බන්ධයෙන් ඔහුට එරහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ බී 7467/1/14 හි උක්ත ප්‍රකාශයට අදාළව ඔහුට එරෙහිව අපරාධ නඩු පවරා ඇත. නමුත් තවමත් කිසිදු චෝදනාවක් ගොනු කර නොමැත. මීට වසර තුනකට පෙර මෙම ලිපිගොනුව නීතිපති වෙත යවා ඇති නමුත් කිසිදු උපදෙස් ලබා දී නොමැති බව පරීක්ෂණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

5. 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයිසීසීපීආර්) පනත ප්‍රකාරව ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ට අපරාධ නඩු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා නීතිපතිවරයා 2013 පෙබරවාරි 17 වන දින මහරගම සහ 2014 ජූනි මාසයේ පෝයා දිනයට පසු දින.

අළුත්ගම යන නගරවල කළ කථාවන් සලකා බලන මෙන් පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

සයිබර් අවකාශය

1. නූතන ත්‍රස්තවාදී හා අන්තවාදී තර්ජනය සයිබර් අවකාශයේ ප්‍රබල ලෙස පවතී. අයිඑස්, වහාබ්වාදය සහ තවුහිද් වැනි අන්තවාදී ආගමික මතවාද ශ්‍රී ලංකාවට ප්‍රවේශ විය නොහැකි බව සහතික කිරීම සඳහා සමාජ මාධ්‍ය ඇතුළු සයිබර් අවකාශය නියාමනය කල යුතු ය

2. සයිබර් අවකාශයේ අන්තවාදී ආගමික වෙබ් අඩවි සහ බ්ලොග් අඩවි ක්‍රියාත්මක කරන අය වහාම විමර්ශනය කිරීම, චෝදනා කිරීම, නඩු පැවරීම, නඩු විභාග කිරීම සහ දඬුවම් ලබා දිය යුතුය.

3. සයිබර් ත්‍රස්තවාදයට එරෙහිව ඵලදායි ප්‍රති ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

දහම්පාසල් / ඉරිදා පාසල / අහඩියා සහ තක්කියා පාසල්

1. සියලුම දම්පාසල්, ඉරිදා පාසල සහ අහඩියා සහ තක්කියා පාසල් රජය විසින් ඒකම ආයතනයක් යටතේ නියාමනය කළ යුතුය.

ආරක්ෂක

1. ආරක්ෂක අමාත්‍යාංශය සෑම විටම ජනාධිපතිවරයා යටතේ විය යුතුය.

2. ඔහු හෝ ඇය විදෙස් ගත වන්නේ නම් වැඩබලන ආරක්ෂක අමාත්‍යවරයකු පත් කිරීම ජනාධිපතිවරයාට අනිවාර්ය කිරීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධාන පැනවිය යුතුය. ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයා සතු සියලු බලය වැඩබලන අමාත්‍යවරයාට තිබිය යුතුය. ජාතික ආරක්ෂක මණ්ඩලය කැඳවා උපදෙස් දීමට වැඩබලන අමාත්‍යවරයාට බලය තිබිය යුතුය.

නිර්රැඩිකලීකරණය වැඩසටහන

1. ඉස්ලාමය සහ අනෙකුත් ආගමික රැඩිකල්වාදීන් විසින් එල්ල කරනු ලබන තර්ජනයට එරෙහිව සටන් කිරීම සඳහා රැඩිකලීකරණය වැළැක්වීම සඳහා ආරක්ෂාව සහ වෙනත් ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බැවින් ආගමික අන්තවාදීන් රැඩිකල් කිරීම සඳහා කාර්යක්ෂම පුනරුත්ථාපන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

2. එසේ කිරීමේදී පුනරුත්ථාපන හා සේවයෙන් පහකිරීමේ ක්‍රියාවලින් හා සංකල්පවල වෙනස්කම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත යුතුය. වැඩසටහන මඟින් රැඩිකල්කරණය අක්‍රිය කිරීම පමණක් නොව අක්‍රිය වීමෙන් ඔබ්බට ගොස් නිර්රැඩිකලීකරණය ළඟා කර ගැනීමට උත්සාහ කිරීම වැදගත් ය.

3. ආගමික විශ්වාසයන් සම්බන්ධව රැඩිකලීකරණය කළ නොහැකි බවට යම් යම් විශ්ලේෂිකරණයන් කර තිබේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සියලු ආකාරයේ ආගමික අන්තවාදය රැඩිකලීකරණය කිරීමේ අරමුණින් පුනරුත්ථාපන වැඩසටහනක් වහාම ක්‍රියාත්මක කිරීම වැදගත් ය.

4. දේශීය තත්ත්වයන්ට සරිලන පරිදි යම් යම් වෙනස් කිරීම් සහිතව සිංගප්පූරුවේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ශ්‍රී ලංකාවේ ආගමික අන්තවාදයට විසඳුම් සෙවීම සඳහා වඩාත් සුදුසුය.

5. සිංගප්පූරුවේ වැඩසටහනට මනෝවිද්‍යාත්මක පුනරුත්ථාපන, ආගමික පුනරුත්ථාපන, සමාජ පුනරුත්ථාපන සහ ප්‍රජා සහභාගීත්වය සහ පවුල් සහයෝගය යන අංගයන්ගෙන් සමන්විත වූ සම්බන්ධිත සංරචක කිහිපයක් තිබී ඇති අතර එය අපගේ දැක්ම අනුව වැදගත් අංගයක් වන අතර එය දිගු කල් පවතින හා තිරසාර වේ. අධ්‍යාපන පුනරුත්ථාපනය, වෘත්තීය පුනරුත්ථාපනය සහ විනෝදාත්මක පුනරුත්ථාපනය ද සංරචක ලෙස එකතු කිරීම නිර්දේශ කරනු ලැබේ.

6. පුනරුත්ථාපන ක්‍රියාවලියකට සමගාමීව, ආගමික අන්තවාදය සහ ත්‍රස්තවාදය බරපතල වැරදි සහ නීතියෙන් දඬුවම් ලැබිය හැකි බවට සමාජයට පැහැදිලි පණිවිඩයක් තිබිය යුතුය. එබැවින් වඩාත් සාපරාධී වැරදිකරුවන් වූ පුද්ගලයින් උසාවියට ගෙනැවිත් නඩු පැවරිය යුතුය. මෙම වැරදිකරුවන් පුනරුත්ථාපන වැඩසටහනේ කොටසක් විය යුතුය.

7. ආගමික අන්තවාදීන් පුනරුත්ථාපනය කිරීමට රජය අපේක්ෂා කරන බව ප්‍රජාව සැබැවින්ම විශ්වාස කරන්නේ නම් මිස පුනරුත්ථාපන ක්‍රියාවලියට පූර්ණ කැපවීමක් ඇති බව රජය පෙන්විය යුතුය.

8. ඉස්ලාමීය අන්තවාදයට එරෙහිව සටන් කිරීමේදී, ආගමික නායකයින් සහ සිවිල් සමාජය ඇතුළු ඉස්ලාමීය ප්‍රජාව සමඟ සම්බන්ධ වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුත්තේ ආගමික සමගිය ගොඩනැගීමට නායකත්වය ගැනීම සහ රැඩිකලීකරණය වූ තරුණ තරුණියන් හඳුනා ගැනීම සඳහා ය.

9. නිර්නාමික පදනමක් මත ඥතියෙකු රැඩිකලීකරණය කළ හැකි බවට බලධාරීන්ට දැනුම් දිය හැකි ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහ සම්බන්ධතාවය පවත්වා ගෙන යන අතරතුර පුද්ගලයා රැඩිකලීකරණයට යටත් කිරීමටද ප්‍රතිපාදන අන්තර්ගත විය යුතු

ය. මීට සාක්ෂි සපයන සිදුවීමක් ලෙස 2017 දී මවක් මෙය කිරීමට උත්සාහ කළ අතර එය නීතිය හා සාමය අමාත්‍යවරයාට පවා දැනුම් දීමෙන් කිසිදු පලක් නොවීය. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු පුතා අත්අඩංගුවට ගනු ලැබීය.

10. ත්‍රස්තවාදයට වරදකරුවන් වූ අයට දඬුවම් තුළ පුනරුත්ථාපන වැඩසටහනකට භාජනය කිරීම අනිවාර්ය කිරීම සඳහා නෛතික විධිවිධාන පැනවීම.

අධ්‍යාපනය

1. බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හෝ ඉස්ලාම් ආගමික බෙදීම් වර්ගීකරණය කිරීම වෙනුවට ජාතික හා පළාත් පාසල් මෙන්ම ජාත්‍යන්තර පාසල්ද අනාගතයේදී සැකසීම. සෑම පාසලකම රටේ ආගමික සංයුතිය නියෝජනය කරන ශිෂ්‍ය ජනගහනයක් සිටිය යුතුය.

2. පවත්නා සියලුම පාසල් බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හෝ ඉස්ලාම් ආගමික බෙදීම්වලින් නිදහස් කළ යුතු අතර, එවකට හා පළාත් මට්ටමේ මෙන්ම සියලු ආගම්වල සිසුන් අන්තර්ක්‍රියා කරන ජාත්‍යන්තර පාසල්වලද මිශ්‍ර පාසල් පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. මෙය යම් කාල පරිච්ඡේදයක් තුළ සිදු කළ යුතු අතර එමඟින් පාසල්වලට වෙනසකට හැඩ ගැසීමට ඉඩ ලබා දේ.

3. සෑම පාසලකම සිසුන්ට, ඔවුන්ගේ ආගම නොසලකා, "ආගමික අධ්‍යාපනය" යන නව විෂයයක් ඉගැන්විය යුතුය. එහිදී බුද්ධාගම, ක්‍රිස්තියානි ධර්මය, හින්දු සහ ඉස්ලාම් යන මූලික කරුණු 1 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අනිවාර්ය පදනමක් මත ඉගැන්විය යුතුය. ආදර්ශ ආගමික ගම්මාන පිහිටුවීම මඟින් රජයට මීට අතිරේක ක්‍රියාමාර්ගයන් ද ලබා ගත හැකිය.

4. ජාතික හා පළාත් පාසල්වල මෙන්ම ජාත්‍යන්තර පාසල්වල සිසුන්ගේ භාවිතය සඳහා ප්‍රකාශයට පත් කරන ලද සියලුම ආගමික අධ්‍යාපන පොත් කිසියම් අන්තවාදී හෝ ත්‍රස්තවාදී සාහිත්‍යයක් ඍජුව හෝ වක්‍රව ඇතුළත් කර ඇත්දැයි සොයා බැලීම සඳහා පරීක්ෂා කළ යුතුය. 4 වන පරිච්ඡේදයේ වඩාත් හොඳින් පැහැදිලි කර ඇති

හේතුන් මත, සූෆි පූජකවරු ඉස්ලාමීය ආගමික අධ්‍යාපන පොත් සුරක්ෂිත කරන කණ්ඩායමේ කොටසක් විය යුතුය.

5. ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය අධ්‍යාපන ග්‍රන්ථවල අන්තර්ගතය ක්ෂණිකව නැවත තක්සේරු කිරීමක් කළ යුත්තේ අන්තවාදී ඉගැන්වීම් හඳුනා ගැනීම සහ ඉවත් කිරීම සහ අන්තවාදී ලේඛකයින් වෙත යොමු කිරීම ය. අන්තවාදී අන්තර්ගතයන් හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විකුණන ඉස්ලාම් දහම පිළිබඳ විදේශීය ග්‍රන්ථවල අන්තර්ගතය පිළිබඳව වහාම ඇගයීමක් කිරීම ද නිර්දේශ කෙරේ. සූෆි පූජක අනුපිළිවෙලෙහි සාමාජිකයන් මෙම ක්‍රියාවලීන් දෙකෙහිම කොටසක් විය යුතුය.

6. ආගමික ප්‍රතිසන්ධානය පාසල් විෂය මාලාවට ඇතුළත් කළ යුතුය.

7. රටේ වයස අවුරුදු 5 සිට 18 දක්වා සියලුම දරුවන් "පිළිගත් රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනවල" අධ්‍යාපනය ලැබීම අනිවාර්ය විය යුතුය. ළමයින්ට නිවෙස් වල පමණක් ඉගැන්විය යුතු නැත. මෙය හුදෙකලා වීමට හේතු වේ. සමහර මරාගෙන මැරෙන බෝම්බකරුවන් තම දරුවන් පාසලට නොයවා නිවසේදී අධ්‍යාපනය ලබා දුන් බවට සාක්ෂි පරීක්ෂණ කොමිෂන් සභාව වෙත හිමි වී ඇත.

8. සියලුම ළමයින්ට 13 වන ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය නොතකා අධ්‍යාපනය අනිවාර්ය කරමින් අතුරු ව්‍යවස්ථාවක් පැනවිය යුතුය.

9. බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු සහ ඉස්ලාම් සංස්කෘතිය, සාහිත්‍යය, ජනකතා, සංගීතය, නාට්‍යය සියලු දරුවන් සඳහා නව විෂයයක් ලෙස හඳුන්වා දිය යුතුය.

10. කිසියම් අන්තවාදී හෝ ත්‍රස්තවාදී අන්තර්ගතයක් හඳුනා ගැනීම සහ ඉවත් කිරීම සඳහා සියලුම අධ්‍යාපන ප්‍රකාශන නියාමන මණ්ඩලයක් විසින් සමාලෝචනය කළ යුතුය.

11. අධ්‍යාපන අරමුණු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන සියලුම විදේශිකයින්ගේ මෙන්ම අධ්‍යාපන අරමුණු සඳහා විදේශ ගත වන සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ දත්ත

පද්ධතියක් නිර්මාණය කිරීම. මෙම නිර්දේශය ලබා දී ඇත්තේ විදේශිකයන් කිහිප දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණ අන්තවාදී ලෙස හඳුනාගෙන ඇති ආයතනවල කටයුතුවලට සහභාගී වූ බවටත්, අන්තවාදය ව්‍යාප්ත කිරීමට දායක වූ බවටත් සාක්ෂි හමුවී ඇති හෙයින් මෙන්ම විදේශ ගත වූ සමහර ශ්‍රී ලාංකිකයන් ද එසේ කර සිදු කර ඇති බැවිනි.

12. අන්තවාදී හා ත්‍රස්තවාදී අන්තර්ගතයන් ඉගැන්වීම තුරන් කිරීම සඳහා පෞද්ගලික පාසල්වල සියලුම ආගම්වල ඉගැන්වීම් සමීපව නිරීක්ෂණය කිරීම.

මැතිවරණ ක්‍රමය

1. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා ස්ථාවර රජයක් අත්‍යවශ්‍ය වේ. දුර්වල රජයක් පැවතිම හේතුවෙන් ශ්‍රී ලංකාවට ප්‍රහාරයක් එල්ල විය හැකි බව සහරාන්ගේ කණ්ඩායම සිතූ බවට පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි ඉදිරිපත් විය. ඕනෑම මහ මැතිවරණයකදී 50% කට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නා පක්ෂයකට වැඩ කරන බහුතරයක් ලබා දෙන මැතිවරණ ක්‍රමයක් කල්තියාම නිර්මාණය කළ යුතු අතර සුළුතර කණ්ඩායම්වලට නිසි නියෝජනයක් ලැබෙන බවට සහතික විය යුතුය. නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කරන ප්‍රදේශයෙන් සුළුතර කණ්ඩායම්වල අපේක්ෂකයින් සංඛ්‍යාවක් දේශපාලන පක්ෂවලට තිබිය යුතු බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙනත් පක්ෂයකට බැඳීම තහනම් කිරීමත් සමඟ එවැනි විධිවිධාන ඒකාබද්ධ කළ හැකිය.

2. සෑම ඡන්ද දායකයෙකුටම තම ඡන්දය ප්‍රකාශ කිරීම අනිවාර්ය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සැකයිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම දඩයකට යටත් විය යුතුය. ඡන්ද දායකයෙකුට ඔහුගේ හෝ ඇයගේ ඡන්දය අවලංගු කිරීමට ඇති අයිතිය ඇතුළත් කිරීම සඳහා ඡන්ද බලය භාවිතා කළ යුතුය. සහරාන් කණ්ඩායමේ සාමාජිකයින් මැතිවරණ ක්‍රියාවලියට සහභාගී නොවූ බවටත් පවුලේ සාමාජිකයින්ට එසේ කිරීම වළක්වා ඇති බවටත් සාක්ෂි ඉදිරිපත් වූ බැවින් මෙම නිර්දේශය ඉදිරිපත්

කෙරේ. එවැනි විධිවිධාන අනුගමනය කිරීම ඉස්ලාමීය අන්තවාදීන් හඳුනා ගැනීමට උපකාරී වේ.

පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ

1. ජෙලිග්නයිට්, ඩෙටනේටර් සහ නයිට්‍රික් අම්ලය වැනි පුපුරණ ද්‍රව්‍ය සඳහා භාවිතා කළ හැකි ද්‍රව්‍ය විකිණීම දැඩි ලෙස නියාමනය කළ යුතුය. එය මිලදී ගත් අරමුණු සඳහා ඒවා භාවිතා කර ඇති බව සහතික කිරීම සඳහා එය අලෙවියෙන් පසු අධීක්ෂණය දක්වා විහිදිය යුතුය. පුපුරණ ද්‍රව්‍ය නිසි ලෙස භාවිතා කර නොමැති බවට යම් සැකයක් ඇත්නම්, විගණකවරුන් විසින් ජීඅයිඑස් විගණනය සඳහා නීතිමය විධිවිධාන සැලසිය යුතු අතර එය නිකුත් කිරීමට විගණකාධිපතිවරයාට බලය තිබිය යුතුය.

2. පුපුරණ ද්‍රව්‍ය හා ආයුධ ජාවාරම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ සාගර සහ ගුවන්තොටුපල සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කළ යුතුය. අයිඑස් සතුව ඇති විශාල අරමුදල් හේතුවෙන් සියලු ගුවන්තොටුපලවල ප්‍රභූ පිවිසුම ද පරීක්ෂාවට ලක් කළ යුතු අතර පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පැහැදිලි වන පරිදි සමාජයේ ඉහළ හා ඉහළ මධ්‍යම පංතියේ කොටස් බඳවා ගැනීම සඳහා අවදානමට ලක්ව ඇත.

විනිමය පාලන පනත

1. 2017 දී පනතට ගෙන එන ලද සමහර සංශෝධන පෙර කළ හැකි සමහර පරීක්ෂණ සඳහා ලබා දී නොමැති බවට සාක්ෂි ඇත. පනතට සුදුසු සංශෝධන යෝජනා කිරීම සඳහා කමිටුවක් පත් කළ යුතුය.

පිටුවහල් කිරීමේ නීතිය

1. විදේශ රටවල ත්‍රස්ත සැකකරුවන් පිටුවහල් කිරීම සඳහා පියවර ගැනීම සඳහා පිටුවහල් කිරීමේ නීති ශක්තිමත් කිරීම.

මූල්‍ය පද්ධතිය

1. අවිධිමත් මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන් (හවාලා, හුන්ඩියල්) සඳහා බලපත්‍ර / ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් හඳුනාගෙන ගනුදෙනුවලට අදාළ වාර්තා තබා ගැනීම අවශ්‍ය වේ. සහරාන්ගේ කණ්ඩායමට සමහර අරමුදල් හවාලා ක්‍රමය හරහා ලබා දී ඇති බව පරීක්ෂණවලින් හෙළි වී තිබේ.

2. අතාර්තික වත්කම් සේවා සපයන්නන් සඳහා (ක්‍රිප්ටෝ මුදල්) බලපත්‍ර / ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් හඳුනාගෙන ගනුදෙනුවලට අදාළ වාර්තා තබා ගැනීම අවශ්‍ය වේ. මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු සමඟ සම්බන්ධයක් ඇති පුද්ගලයෙකු පිළිබඳ පරීක්ෂණවලින් හෙළිදරවු වූ අතර ඇය බිට් කොයින් සමඟ ගනුදෙනු කර ඇත.

3. ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුට, ආයතනයකට හෝ සංවිධානයකට විදේශයන්ගෙන් සම්ප්‍රේෂණය වන මුදල් ඇත්ත වශයෙන්ම ප්‍රකාශිත අරමුණු සඳහා භාවිතා කරන්නේද යන්න නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් දැනට නොමැත. මෙය ත්‍රස්තවාදී අරමුදල් කෙරෙහි බරපතල අනුමිතියක් ලෙස දැක්විය හැකිය. මෙම ගැටළුව විසඳීම සඳහා ගත යුතු ක්ෂණික පියවර ගත යුතුව තිබේ .

මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මෝටර් වාහන රෙජිස්ට්‍රාර්, ආගමන හා සංක්‍රමණ දෙපාර්තමේන්තුව, ඉඩම් රෙජිස්ටාර්, අපරාධ වාර්තා අංශය, ජාත්‍යන්තර පොලිසිය වැනි දත්ත පදනම් වෙත ප්‍රවේශ වීමට මූල්‍ය බුද්ධි අංශයට හැකියාව ලබා දීම.

2. පූර්ව පාර්ශවීය පදනමක් මත පිහිටිමින් අත්හිටුවීමට තෝරාගත් ගනුදෙනු පිළිබිඹු කිරීම සඳහා 15 (2) සහ 15 (3) වගන්තිය ශක්තිමත් කිරීම.

3. මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවීම සහ එහි අධ්‍යක්ෂවරයාගේ කාර්යයන්, කාර්යභාරය සහ බලතල පිළිබඳව වැඩි පැහැදිලි කිරීමක් ගෙන ඒම.

4. මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් ගනුදෙනු වාර්තාව / ඉලෙක්ට්‍රෝනික අරමුදල් හුවමාරු විශ්ලේෂණය ශක්තිමත් කිරීම, ඒකකය විසින් සැක සහිත ගනුදෙනු වාර්තා ආරම්භ කිරීම සඳහා සැපයීම.

5. සියලුම වාණිජ බැංකු ශාඛාවන්ට මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සම්බන්ධ වීමට නම් කරන ලද නිලධාරියෙකු සිටිය යුතුය.

විදේශිකයන්

1. වීසා ක්‍රියාවලියේ කොටසක් ලෙස නිශ්චිතවම අවසර දී ඇත්නම් මිස කිසිදු ආගමික දේශනයක්, සාකච්ඡා හෝ සම්මන්ත්‍රණ ඔවුන් විසින් සිදු කළ නොහැකි බව සියලු විදේශිකයින්ගේ අවධානයට ලක්විය යුතුය. මේ සඳහා ආගමික දේශනා, සාකච්ඡා හෝ සම්මන්ත්‍රණ පැවැත්වීමට කැමති විදේශිකයින්ට වෙනම වර්ගයේ වීසා බලපත්‍රයක් නිකුත් කළ යුතුය.

විදේශ අරමුදල්

1. සියලුම ආගමික සංවිධානවලට විදේශ අරමුදල් ගලා ඒම නියාමනය කිරීම.

විදේශීය ආගමික දේශකයෝ

1. බුද්ධි අංශ විසින් දැඩි පරීක්ෂණයකින් පසුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ඇතිව විදේශීය ආගමික දේශනාකරුවන්ට ශ්‍රී ලංකාවට ඇතුළුවීමට අවසර දිය යුතුය. ගෙන එන ආගමික පොත් සහ වීඩියෝ සෝදිසි කිරීම සඳහා බලධාරීන්ට කල්තියා ලබා දිය යුතුය.

2. වෙනත් රටක කිසියම් විදේශීය ආගමික දේශකයෙකු තහනම් කර ඇත්නම්, ඔහුට රට තුළට ඇතුළුවීමට අවසර දිය යුතුද යන්න තීරණය කිරීමේදී මෙම කරුණ සැලකිල්ලට ගත යුතුය.

3. දේශනයේ අන්තර්ගතය සඳහා පූර්ව අවසරය ලබා ගත යුතුය. විදේශීය ආගමික දේශකයන්ගේ මෙහෙවර හා න්‍යාය පත්‍රය අධීක්ෂණය කළ යුතු අතර ආගමික

සහජීවනය උල්ලංඝනය කරන්නේ නම් ඔහුට එරෙහිව පියවර ගැනීමට බලධාරීන්ට හැකි වන පරිදි දේශකයාගේ කථාව හෝ දේශනය සටහන් කළ යුතුය.

4. වෙනත් රටවල තහනම් කර ඇති අන්තවාදී ආගමික දේශකයන්ගේ සහ ආගමික දේශකයන්ගේ ජීවිත කථා සහ කථා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කිසිදු ආයතනයක් විසින් පාසල් පෙළ පොත්, වෙනත් සඟරා හෝ පින්තූරවල පළ නොකළ යුතුය.

විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන්

1. සිරියාවෙන් සහ වෙනත් ස්ථානවලින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණි නිශ්චිත විදේශීය සටන්කරුවන් සංඛ්‍යාව ගණනය කිරීම වැදගත්ය. අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා ආගමන විගමන අංශය අදාළ බලධාරීන් සමඟ සමීපව කටයුතු කළ යුතුය.

විදේශීය සේවකයින්

1. ආරක්ෂක අවසරයකින් තොරව කිසිදු විදේශිකයෙකුට ශ්‍රී ලංකාවේ සේවය කිරීමට ඉඩ නොදිය යුතුය.

රෝහල් ගත කිරීම

1. රජයේ සහ පෞද්ගලික රෝහල්වලට ඇතුළත් කර ඇති රෝගියාගේ අනන්‍යතාවය හැකි ඉක්මනින් ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය මඟින් තහවුරු කර ගත යුතුය. පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂා කරමින් සිටියදී සිදුවූ පිපිරීමක් හේතුවෙන් රිල්වාන් 2018 අගෝස්තු මස අගභාගයේදී කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර තිබේ. ඔහු ව්‍යාජ නමක් යටතේ ඇතුළත් කර ඇති අතර අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කිරීමෙන් වැළකී සිටියේය.

2. සියලුම රජයේ රෝහල්වල ඇති රෝහල් පොලිසි සඳහා වන ක්‍රියා පටිපාටිය සමාලෝචනය කළ යුතුය. වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශය පරිදි සියලුම රෝගීන්ට වෛද්‍ය නෛතික පරීක්ෂණ පෝරමයක් නිකුත් කිරීම සහතික කිරීම සඳහා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කළ යුතු අතර රෝගියා අධිකරණ වෛද්‍ය

නිලධාරියෙකු වෙත විභාග සඳහා ඉදිරිපත් කළ යුතුය. අධිකරණ වෛද්‍ය නිලධාරියා පරීක්ෂණයෙන් පසු වෛද්‍ය නෛතික වාර්තාවක් නිකුත් කළ යුතු අතර අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ සොයා ගැනීම් මත පදනම්ව වැඩිදුර පරීක්ෂණ පවත්වන ලෙස පොලිසියට උපදෙස් දිය යුතුය.

හෝටල්, ලැඟුමහල්, තානායම් නිවාස සහ වෙනත් නවාතැන්

1. අමුත්තන්ගේ සම්පූර්ණ හා සත්‍ය තොරතුරු ලබා ගැනීමේ අදහසින් හෝටල් ,ලැඟුමහල්, තානායම් නිවාස සහ වෙනත් නවාතැන්පලවල ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටි මත දැඩි පාලනයන් තැබිය යුතුය. ඇතැම් , මරාගෙන මැරෙන බෝම්බකරුවන් හෝටල්වලට අසත්‍ය තොරතුරු ලබා දුන් බවට සාක්ෂි ඇත.

2. හෝටල්, ලැඟුමහල්, තානායම් නිවාස සහ වෙනත් නවාතැන්පලවල අමුත්තන්ගේ වාර්තා වසර තුනක කාලයක් සඳහා සංරක්ෂණය කළ යුතු අතර එමඟින් අනාගත අපරාධ පරීක්ෂණයක් සඳහා එය ලබා ගත හැකිය.

3. සාක්ෂිවලින් පෙනී යන්නේ බොහෝ හෝටල් කාර්ය මණ්ඩල, තම පරිශ්‍රය තුළට පොලිසිය පැමිණීමට අකමැති බවයි. විදේශිකයන් ඉලක්ක කර ගැනීමේ අයිඑස්හි දෘෂ්ටිවාදය සැලකිල්ලට ගනිමින්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සහ හෝටල් ආරක්ෂකයින් අතර සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීම සඳහා ආරක්ෂක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

1. මෙම ආයතනය වෙනත් බුද්ධි මණ්ල (think tanks) මඟින් ආරක්ෂක පර්යේෂණ වාර්තා විශ්ලේෂණය කිරීම හා එකතු කිරීම සහ බුද්ධි අංශ වෙත ලබාදීම සඳහා කාර්යභාරයක් ඉටු කළ යුතුය.

2. ආයතනයේ ප්‍රධානියා ලෙස ත්‍රස්තවාදය සහ අන්තවාදය පිළිබඳ විශේෂඥයෙකු පත් කළ යුතු අතර විශ්ලේෂණ හැකියාවන් වැඩි කළ යුතුය.

අන්තර්ජාල

1. අන්තවාදී සහ ත්‍රස්තවාදීන් විසින් අන්තර්ජාලය හරහා ප්‍රචාරය කිරීම වැළැක්වීම සඳහා අන්තර්ජාල සැපයුම්කරුවන් සමඟ එක්ව ක්‍රියා කිරීම නියාමනය කිරීම. එවැනි අන්තවාදී සහ ත්‍රස්තවාදී මතවාද පතුරවන වෙබ්අඩවිවල ක්‍රියාකාරිත්වය අත්හිටුවීම. එවැනි වැළැක්වීමේ ක්‍රියාමාර්ග වලංගු කිරීම සඳහා අවශ්‍ය නීති පැනවිය යුතුය.

ඉස්ලාමීය ආගමික පෙළ

1. ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පරිවර්තනය කරන ලද ශුද්ධ වූ අල් කුර්ආනයක් තිබිය යුතුය. වැරදි අර්ථ නිරූපණයන් වළක්වා ගැනීම සියලු මුස්ලිම්වරුන්ට පිළිගත හැකි විය යුතුය. මෙම පොදු සංස්කරණය සම්පාදනය කිරීමෙන් පසුව, ශුද්ධ වූ අල් කුර්ආනයේ අනෙකුත් සියලුම පෞද්ගලිකව පරිවර්තනය කරන ලද අනුවාදයන් සාමාන්‍ය ජනතාවට භාවිතා කිරීමට ඉඩ නොදිය යුතුය. සහරාන් ශුද්ධ වූ අල් කුර්ආනය විවිධ වැරදි අර්ථ භාවිතා කරමින් වැරදි ලෙස අර්ථකථනය කරමින් සිටින බව මුස්ලිම් ආගමික විද්වතුන් කිහිප දෙනෙක් සාක්ෂි දුන්හ.
2. වහබිවාදය ව්‍යාප්ත කිරීම සඳහා භාවිතා කරන බැවින් තවුහිද් කණ්ඩායම් විසින් භාවිත කරන මුහම්මද් බින් අබ්දුල් වහබ් විසින් රචිත කිටාබ් අට්-තාහිඩ් ග්‍රන්ථය තහනම් කිරීම
3. උස්තාද් එම්.ඒ.එම් විසින් රචිත "අල් කුර්ආනය ප්‍රචණ්ඩත්වය දිරිගන්වයිද?" මිෂ්කාත් පර්යේෂණ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද මන්සූර් (නල්ලෙම්) (පළමු ප්‍රකාශනය, 2019 සැප්තැම්බර්) රටේ මුස්ලිම් දරුවන්ට ශුද්ධ කුර්ආනය ඉගැන්වීම සඳහා භාවිතා කිරීම අනිවාර්ය කළ යුතුය.

මද්‍රසා අධ්‍යාපනය

1. සියලුම මද්‍රසා (කුරානය, හිෆ්ල් කුර්ආන් සහ අරාබි විද්‍යාල) සුදුසු නෛතික රාමුවක් මඟින් පාලනය කළ යුතු අතර ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් සම්පව නියාමනය කළ යුතුය. උපග්‍රන්ථයේ VII හි සඳහන් බංගලාදේශයේ 1978 අංක 9 දරණ මද්‍රසා අධ්‍යාපන සටහන පනත සුදුසු රාමුවක් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කළ හැකිය. මෙම නියාමන ව්‍යුහයේ කොටසක් නොවී කිසිදු මද්‍රසා රටක් තුළ ක්‍රියාත්මක නොවිය යුතුය.

2. සියලුම ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ මද්‍රසා නියාමන ව්‍යුහය යටතට ගෙන ආ යුතුය. සෑම දිස්ත්‍රික්කයකම මුස්ලිම් ජනගහනය සැලකිල්ලට ගනිමින් තාර්කිකකරණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කළ යුතු අතර ජනගහනය සැලකිල්ලට ගනිමින් අනුපාතයක් ගණනය කළ යුතුය.

3. සිංහල භාෂාවට මෙන්ම දෙමළ භාෂාවට ද ප්‍රමුඛත්වය ලබා දෙමින් රට පුරා මද්‍රසාවල ඉගැන්වීමේ මාධ්‍යයේ නිශ්චිත / හැකි අනුපාතය පවත්වා ගැනීම.

4. සම්මත ශිෂ්‍ය ඇතුළත් වීමේ නිර්ණායකයක් තිබිය යුතු අතර අපොස සාමාන්‍යය පෙළ ඇතුළත් වීමේ නිර්ණායක ලෙස නිර්දේශ කෙරේ.

5. ඉංග්‍රීසි සමඟ ජාතික භාෂා දෙකම මද්‍රසාහි ඉගැන්විය යුතුය.

6. මුස්ලිම් සිසුන්ට අපොස සාමාන්‍යය පෙළ සහ අපොස උසස් පෙළ සඳහා ඉගෙන ගැනීමට ඉඩ සලසන අරාබි විද්‍යාලයක් ඇතුළු ඕනෑම මද්‍රසාවක් දැඩි රජයේ නියාමන ක්‍රමයක් යටතට ගෙන ආ යුතුය. ඒවා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කළ යුතුය. එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති රජයේ විෂය නිර්දේශය අනුගමනය කළ යුතු අතර රජයේ යාන්ත්‍රණයක් මඟින් ගුරුවරුන් පත් කළ යුතුය.

7. මද්‍රසාහි සියලුම මවුලාවිවරු සහ ගුරුවරුන් නියාමන අධිකාරියේ ලියාපදිංචි කළ යුතුය.

8. මදුසා වෙත දේශීය හා විදේශීය අරමුදල් ගලායාම නියාමනය කිරීම සඳහා නීති ප්‍රතිපාදන සැකසීම. මෙය සිදු කළ යුත්තේ මදුසා හා සැසඳිය හැකි වෙනත් ආගම්වල ආයතනවලට සමාන අරමුදල් නියාමනය කිරීම සඳහා එකම නෛතික තන්ත්‍රයක් බලාත්මක කිරීමෙනි. අසාමාන්‍ය ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා නීතියෙන් ප්‍රතිපාදන සැකසිය යුතුය.

සංක්‍රමණය

1. ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන විදේශීය ඉස්ලාමීය රටවල සරණාගතයින් සැලකිය යුතු සාධකයක් වී තිබේ. සංක්‍රමණික දත්ත එක්රැස් කිරීම ඉක්මවා ගොස් නවීන දත්ත විශ්ලේෂණ ක්‍රම ගෙන ඒම සඳහා සම්පත් වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.

2. රට තුළට හා රටින් පිටතට සිදු වන සංක්‍රමණ සහ ප්‍රේෂණ නියාමනය කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යුහයන්, ක්‍රම සහ හැකියාවන් අනුගමනය කළ යුතුය.

3. ජාතික සංක්‍රමණ සහ ආගමන විගමන ප්‍රතිපත්ති ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කිරීම සැලකිල්ලට ගත යුතුය.

4. අන්තර්ජාතික තර්ජනවලින් ජාතික දේශසීමා ආරක්ෂා කිරීම සඳහා සංක්‍රමණ සහ ප්‍රේෂණ දත්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

ආගමික කටයුතු අමාත්‍යාංශය

1. සියලුම ආගමික කටයුතු සඳහා පැවතිය යුත්තේ එක් අමාත්‍යාංශයක් පමණි. එක් එක් ආගම සඳහා විවිධ දෙපාර්තමේන්තු තිබිය හැකි නමුත් ඒවා එක් අමාත්‍යාංශයක් යටතේ තිබිය යුතුය. මෙම අමාත්‍යාංශය ජනාධිපතිවරයාගේ යටතේ පැවතිය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නීති සම්ප්‍රාදනය විය යුතුය.

ජංගම දුරකථන

1. එම් (EMI) අංකය සැඟවීමෙන් රට තුළ සාමාන්‍ය ඇමතුම් ලබා ගැනීමේ හැකියාවක් ඇති බවත්, ඇමතුම් අනාවරණය කිරීමේ ලියාපදිංචියේ ලියාපදිංචි නොවීම මෙන්ම

දුරකථන සංඥා කුළුනු අනුව පිහිටීම- cell location ( පිහිටීම අනාවරණය කර නොමැති බවත් පෙනේ නම් ). ක්ෂණික අපරාධ පරීක්ෂණයක් සඳහා අවශ්‍ය නම් ශ්‍රී ලංකාව තුළ ගනු ලබන සියලුම ඇමතුම් පසුව හඳුනාගත හැකි බව සහතික කිරීම සඳහාක්‍රියාමාර්ග ගත යුතුය.

2. ජංගම දුරකථන සම්බන්ධතා නිකුත් කිරීම දැඩි ලෙස නියාමනය කළ යුතුය. පුද්ගලයෙකු සඳහා සම්බන්ධතා ගණන සීමිත විය යුතුය. ලියාපදිංචි වන අවස්ථාවේ දී පරිශීලකයාගේ සම්පූර්ණ තොරතුරු ලබා ගත යුතුය. අනන්‍යතා තොරතුරු ලබා නොදී නැගෙනහිර පළාතේ සම්බන්ධතා සපයන ආයතන මඟින් සම්බන්ධතා (සිම්) විශාල ප්‍රමාණයක් මිලදී ගැනීමට සහරාන් සහ ඔහුගේ කණ්ඩායමට හැකි වූ බවට සාක්ෂි ඇත.

මුදල් විශුද්ධිකරණය

1. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සංශෝධන ගෙන ඒම

අ. විමර්ශන අතරතුරදී අත්අඩංගුවට ගත් සාපරාධී වත්කම් අත්හිටුවීම සහ රාජසන්තක කිරීමේ පියවර ශක්තිමත් කිරීම සහ අපරාධ වත්කම්, අරමුදල්, දේපල කැටි කිරීම, අත්පත් කර ගැනීම සහ රාජසන්තක කිරීම කළමනාකරණය කිරීම සහ / හෝ බැහැර කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.

ආ. අපරාධ අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රෙගුලාසි නිකුත් කිරීම සහ අවශ්‍ය පියවර ගැනීමට පොලිසියට යොමු කිරීම වැනි විධිවිධාන ශක්තිමත් කිරීම.

ඇ. අපරාධයක් සඳහා සැකකරුවන් නොවන පාර්ශවයන්වල පවා දේපළ රාජසන්තක කිරීම සඳහා විධිවිධාන සකස් කරීම.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධව පාර්ශවකරුවන්ට පුහුණුව ලබා දීම.

ජාතික හැඳුනුම්පත

1. වයස අවුරුදු 15 ට වැඩි සියලුම පුරවැසියන්ට සියලු දත්ත සහිත විද්‍යුත් චිපයක් සහිත හැඳුනුම්පතක් නිකුත් කළ යුතුය. මෙම විද්‍යුත් හැඳුනුම්පත සෑම වසරකම යාවත්කාලීන කළ යුතුය. මෑත වසරවලදී ලොව පුරා රටවල් ගණනාවක ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් (ඊඅයිඩී කාඩ්) හඳුන්වා දී ඇත.

ජාතික බුද්ධි අංශ

1. ජාතික බුද්ධි ඒජන්සියක් පිහිටුවීම සඳහා නීති සම්පාදනය කිරීම උත්තරීතර ආයතනය විය යුත්තේ ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ජාතික ආරක්ෂක මණ්ඩලයයි. එහි සාමාජිකයින් විය යුත්තේ අගමැති, ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශ ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීන්, ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානීන්, ජතික බුද්ධි ප්‍රධානී, පොලිස්පති, රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ, හමුදාවේ බුද්ධි අංශයේ අධ්‍යක්ෂක, ත්‍රිවිධ හමුදාවේ බුද්ධි අංශ ප්‍රධානීන්, ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂ., අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යන පාර්ශව වේ.

2. ඊළඟ මට්ටමේ දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජතික බුද්ධි ප්‍රධානී ප්‍රධානත්වයෙන් යුත් ජාතික බුද්ධි අධ්‍යක්ෂ කාර්යාලයක් තිබිය යුතුය. සියළුම බුද්ධි අංශවලට ප්‍රවේශය තිබිය යුතු අධ්‍යක්ෂක මණ්ඩලයට තමන්ගේම දත්ත පදනමක් තිබිය යුතු අතරම ඒ සමඟම ජාතික බුද්ධි අධ්‍යක්ෂ කාර්යාලයට අනෙකුත් සියලුම බුද්ධි දත්ත පදනම් වෙත ප්‍රවේශය තිබිය යුතුය. ජාතික බුද්ධි ප්‍රධානයති කාර්යභාරය විය යුත්තේ විවිධ බුද්ධි අංශවලින් බුද්ධි හා තොරතුරු එක්රැස් කර ජාතික ආරක්ෂක කවුන්සිලයට ඉදිරිපත් කිරීමයි. ජාතික බුද්ධි ප්‍රධානයති රාජකාරි හා කාර්යයන් නීතියෙන් නියම කළ යුතුය. බුද්ධි අංශ විසින් සපයන බුද්ධි හා තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ජාතික බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට තමන්ගේම කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. ඔවුන් බහු විධ ක්ෂේත්‍ර

නියෝජනය කරන කණ්ඩායමකින් සමන්විත විය යුතු අතර මනෝ විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින් සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ විශේෂඥයින් ඇතුළත් විය යුතුය.

3. ජාතික බුද්ධි අධ්‍යක්ෂ කාර්යාලය තුළ විදේශ කටයුතු අමාත්‍යාංශය, මූල්‍ය බුද්ධි අංශය, රේගු, දේශීය ආදායම් දෙපාර්තමේන්තු, ආගමන හා විගමන, පුද්ගලයින් ලියාපදිංචි කිරීම, ලේඛන ලියාපදිංචි කිරීම, ඉඩම් ලියාපදිංචි කිරීමේ සහ රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ නියෝජිතයින්ගෙන් සමන්විත උප කණ්ඩායමක් සිටිය යුතුය. මෙම කණ්ඩායම තොරතුරු සැපයීමට පහසුකම් සපයනු ඇත.

4. ජාතික බුද්ධි අධ්‍යක්ෂ කාර්යාලය ඇතුළු සියලුම බුද්ධි අංශ නිලධාරීන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව මෙන්ම ප්‍රධාන ආගම් පිළිබඳව විධිමත් දැනුමක් ලබා ගත යුතුය. ඊට අමතරව ඔවුන්ට අරාබි භාෂාව පිළිබඳ විධිමත් දැනුමක් ලබා දිය යුතුය.

5. වහාම ක්‍රියාත්මක විය යුතු බුද්ධිය මත ක්‍රියා කිරීම සඳහා ජතික බුද්ධි ප්‍රධානී තුළ ඉක්මන් ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායමක් ගොඩනැගීම. අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට අවශ්‍ය නීතිමය බලය නීතියෙන් ලබා දිය යුතුය.

6. සියළුම බුද්ධි අංශ අතර වෙනම හා ආරක්ෂිත සන්නිවේදන මාර්ගයක් ස්ථාපිත කළ යුතුය.

7. තොරතුරු සපයන්නන් නඩත්තු කිරීමේදී බුද්ධි අංශ සහ විමර්ශන ආයතන විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සකස් කිරීම. රහස් පොලිසියේ නිලධාරීන් විසින් සහරාන්ගේ මස්සිනා වන අන්සාර්ව තොරතුරු සපයන්නෙකු ලෙස යොදා ගෙන ඇති බවයි. වනතාවිල්ලුව වෙත පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ චෝදනාව මත ඔහු පසුව අත්අඩංගුවට ගනු ලැබීය. එමෙන්ම රහස් පොලිසියේ නිලධාරීන්

විසින් ආමී මොහිදීන්, තොරතුරු දැනුම් දෙන්නෙක් ලෙස තබා ගෙන ඇත්තේ ඔහුට එරෙහිව වරෙන්තුවක් නිකුත් කර ඇති බව දැන සිටියදීය.

8. නව ආකාරයේ ත්‍රස්ත කණ්ඩායම්වලට එරෙහිව සටන් කිරීම සඳහා අඩුපාඩු හා සීමාවන් හඳුනාගෙන අභ්‍යන්තර ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර ආරක්ෂාව සහ බුද්ධි කාර්ය සාධන විගණනය සිදු කළ යුතුය.

9. ත්‍රස්තවාදයේ නව මුහුණුවර හමුවේ බුද්ධි හුවමාරුව සඳහා වෙනත් ජාතීන් අතර අන්තර්ජාතික සහයෝගීතාවයක් ද අවශ්‍ය වේ. එයට බහු අධිකරණ හා බහු පාර්ශවීය ප්‍රවේශයක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ජාතික ආරක්ෂාවට හා ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ආරක්ෂක ගිවිසුම් අත්සන් නොකිරීමට ශ්‍රී ලංකාව ප්‍රවේසම් විය යුතුය.

10. බුද්ධි අංශ අතර වැඩි සම්බන්ධීකරණයක් සහතික කිරීම.

11. බුද්ධි අංශ නිලධාරින් හා විමර්ශකයන් අතර රාජකාරි මට්ටමේ තොරතුරු හුවමාරු නොවීම සහරාන්ගේ කණ්ඩායමට සිය ත්‍රස්ත ක්‍රියා සිදු කිරීමට පිටු බලයක් විය බුද්ධි නිලධාරීන් සහ විමර්ශන නිලධාරීන් මෙහිදි පොදු අරමුණක් අනුව කටයුතු කොට නොමැත විමර්ශණ නිලධරීන් කටයුතු කර ඇත්තේ සැකකරුවන් නීතිය හමුවට පැමිණීමේ අරමුණින් අතර බුද්ධි නිලධාරීන් ක්‍රියාත්මක වී ඇත්තේ සමස්ථ ත්‍රස්ථවාදී ජාලය බිඳහෙළිමේ අරමුණින් ඉදිරියේ මෙවැනි සිදුවීම් සිදු නොවීම සඳහා නිසි පියවර ගත යුතුය.

12. ත්‍ර ස්තවාදී අපරාධ සම්බන්ධයෙන් දඩුවම් නියම කිරීමෙන් පසු නිදහස් වන සියලුම පුද්ගලයින් පිළිබඳව අවම වශයෙන් අවුරුදු පහක්වත් සෝදිසියෙන් සිටිය යුතුය.

13. කිසියම් පුද්ගලයෙකු දෙපාර්ශවයටම තොරතුරු සපයන නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රියා පටිපාටියක් පැවති යුතුය.

ජාතික ප්‍රතිපත්ති

1. පාස්කු ඉරිදා ප්‍රහාර සඳහා මූලික හේතුවක් වන්නේ ජාතික ආරක්ෂාව සහ ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් හා ප්‍රමුඛතාවයක් නොමැතිකමයි. ජාතික ආරක්ෂාව සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර සම්මත කර ගැනීමට යෝජනා කරනු ලැබේ. එවැනි ප්‍රතිපත්තියක් පිළිගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සැපයිය යුතුය. ජාතික ආරක්ෂාව සහ ජාතික ආරක්ෂාව සඳහා ලබා දී ඇති ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් බලයේ සිටින පක්ෂයට පාලනයක් නොතිබිය යුතුය. ඒවා සැම විටම ඕනෑම රජයක පළමු ප්‍රමුඛතාවය විය යුතුය.

2. ජාතික ප්‍රතිපත්තිවලින් ලබාගත් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

ජාතික මට්ටමේ පිළිගැනීමක් ලබාදිය යුතු පාර්ශව.

1. මාවනැල්ලේ බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීමේ ක්‍රියාවලියේදී පහර දුන් එක් අයෙකු නීතිය ඉදිරිටයට පැමිණවීමට සෙනරත් බණ්ඩාර සහ ශානක ජයරත්න යන අය ඉමහත් සහයෝගයක් දැක්වූහ. මෙම මහජනයාගේ උද්යෝගිමත් සහායෙන් සිදු වූ අත්අඩංගුවට ගැනීම පුපුරණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අඩංගු වනාතාවිල්ලුව පුහුණු කඳවුර සොයා ගැනීමට හේතු විය. මෙම සොයා ගැනීම නොවන්නට, සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විසින් සිදු කරන ලද හානිය මීට වඩා වැඩි වීමට ඉඩ තිබේ. සෙනරත් බණ්ඩාර සහ ශානක ජයරත්න යන දෙදෙනාට මුදල් ත්‍යාග ඇතුළු නිසි ජාතික පිළිගැනීමක් ලබා දිය යුතුය.

ජාතික ආරක්ෂාව

1. “එක් රටක් එක් නීතියක්” යන සංකල්පය පිළිගෙන ක්‍රියාත්මක කළ යුතුය. මෙය විවිධ ප්‍රජාවන් අතර සුවිශේෂීත්වයක් ඇතිවීම වළක්වනු ඇත.

2. අදාළ පාර්ශවකරුවන් සමඟ තොරතුරු හුවමාරු කරගත හැකි ආකාරයේ මාර්ගගත දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන පියවර ගත යුතුය.

3. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහ බුද්ධි අංශවලට වැදගත් තොරතුරු ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට හැකිවන පරිදි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වැනි ආයතනවල දත්ත පද්ධති ජාල ගත කිරීමට පියවර ගත යුතුය.

4. UNSCR **1373** ට අනුකූලව **2012** අංක **1** දරණ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ දේශීයව හඳුනාගත් ත්‍රස්ත සංවිධාන / ත්‍රස්තවාදීන් වහාම නම් කළ යුතුය.

5 විදේශ ත්‍රස්තවාදී සටන්කරුවන් සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි වීම සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා **2178** හි ඉතිරි කොටස ක්‍රියාත්මක කිරීම.

6. මහජන ආරක්ෂක පනත යටතේ හදිසි නීතිය පැනවීමකින් තොරව ශ්‍රී ලංකා හමුදාවේ සහාය ලබා ගැනීමට පොලිසියට හැකි වන පරිදි නීතිමය තන්ත්‍රයක් ඇති කිරීම. ත්‍රස්තවාදී හෝ අන්තවාදී ක්‍රියාකාරකම් වලදී පමණක් එවැනි ආධාර ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා මෙය සීමා දක්වන භාෂා විලාසයකින් සටහන් කළ යුතුය.

7. ඕනෑම පොදු ස්ථානයකදී, මුහුණ ආවරණය වන සේ නිර්මාණය කර ඇති ඇඳුම් ඇඳීම තහනම් කළ යුතුය. වෙනත් රටවල ද එවැනිම තහනම් පනවා ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රංශයේ දී අංක **2010/1192** දරණ නීතිය මඟින් වර්ෂ 2010 ඔක්තෝම්බර් **11** වැනි දින බලාත්මක කරන ලද නීතිය ප්‍රංශයට එදිරිව පුරවැසියකු විසින් යුරෝපා සංගමයේ අධිකරණයේ පවරන ලද නඩුවක් මඟින් අභියෝගයට ලක් කෙරුණු අතර ( **2014** III Eur Ct. Hr. **341** ) යුරෝපා අධිකරණය මඟින්

තහනම අනුමත කොට සඳහන් කර සිටියේ ස්වේච්ඡාවෙන් නිරතුරුවම මුහුණ ආවාරණය කිරීම ගැටළු සහගත බවයි. මන්දයත් ප්‍රංශ සමාජයේ " එක්ව විසීම" සංකල්පයට එය මූලික වශයෙන් පටහැනි බැවිනි. නාගරික අතුරු ව්‍යවස්ථා මඟින් බෙල්ජියමේ ද එවැනිම තහනමක් පැනවූ විට, එය ඩකීර් එදිරිව බෙල්ජියම, නඩු අයදුම්පත් අංක **4619/12** (EUR1 CT.H.R. JULLY 11.2017) අභියෝගයට ලක් විය. කෙසේ වෙතත්, යුරෝපීය මානව හිමිකම් අධිකරණය මෙම තහනම පිළිගත් අතර, වෙස්ඩ්‍රේ පොලිස් දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ අතුරු ව්‍යවස්ථා මඟින් පනවා ඇති තහනම, එහි අරමුණ හා සමපාත වෙන බවත් එම අරමුණින් දැක්වෙන්නේ "අන්‍යයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම", 'එකට විසීම' සඳහා පැවතිවිය යුතු තත්ත්වයන් ආරක්ෂා කිරීමක් වශයෙන් සැලකීම බවත් එම අධිකරණය ප්‍රකාශ කර සිටින ලදී.

8. ආගමික / ජනවාර්ගික අන්තවාදයට අදාළ ප්‍රචාරයන් මැඩපැවැත්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සමාජ මාධ්‍ය වේදිකාවක් නිර්මාණය කිරීම.

9. ප්‍රති-අන්තවාදී ප්‍රතිපත්ති පිළිබඳ පුරවැසියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

10. ත්‍රස්තවාදී සහ සංවිධානාත්මක අපරාධකරුවන් සහ ඔවුන් එකිනෙකා සමඟ ඇති සම්බන්ධතාවය හඳුනාගෙන එවැනි ක්‍රියා වැළැක්වීමට පියවර ගැනීම.

11. සංවිධානාත්මක අපරාධකරුවන් වන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, අවි වෙළෙඳුන් නීතිවිරෝධී ලෙස රටින් පිටවීම වැළැක්වීමට පියවර ගත යුතුය.

12. ත්‍රස්තවාදයට සම්බන්ධ ඕනෑම මූල්‍ය හෝ දේපළ ගනුදෙනුවක් හෝ ත්‍රස්තවාදයට සම්බන්ධ ඕනෑම ක්‍රියාවක් පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් දැනුවත් කිරීම සියලු වෘත්තිකයන් සඳහා අනිවාර්ය කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් වසර **10** ක් දක්වා සිර දඬුවමක් හා රු. මිලියනයක් දක්වා වන දඩමුදලක් සඳහා අදාල පාර්ශව යටත් කළ යුතුය. මෙම නිර්දේශය කරනු ලබන්නේ පිපිරුම්

තුවාල ලැබීමෙන් පසු රිල්වාන්ට ලබා දුන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා රජයේ වෛද්‍යවරයකු රහසිගතව සම්බන්ධ වී සිටි බවට ඉදිරිපත් සාක්ෂි සැලකිල්ලට ගනිමිනි. රිල්වාන්ගේ මරණයෙන් පසුවත් පාස්කු ඉරිදා ප්‍රහාරයට ඔහු සම්බන්ධ බවටත් වෛද්‍යවරයා කිසිදු තොරතුරක් හෙළි නොකළේය.

13. සැක සහිත තැපැල් හුවමාරු සම්බන්ධයෙන් හා ජල පරිවහන මාර්ග සඳහා ලබා දෙන ආරක්ෂාව පිළිබඳව සුපරීක්ෂාකාරී විය යුතුය.

14. ත්‍රස්තවාදි ප්‍රහාර සඳහා භාවිතා කරන ද්‍රව්‍ය දැඩි පාලනයකට නතු කිරීමේ ක්‍රියාවලිය සවිමත් කිරීම.

15. ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීමට කාන්තාවන් දිරිමත් කිරීම.

වෙනත් ආගමික විද්‍යස්ථාන

1. අනෙකුත් සියලුම ආගමික විද්‍යාල (බෞද්ධ, ක්‍රිස්තියානි සහ හින්දු) ද මද්‍රසා මෙන් නියාමනය කළ යුතුය.

2. මෙම ආගමික පාසල්වල විෂයමාලාව මද්‍රසා සඳහා යෝජනා කර ඇති ආකාරයටම රජය විසින් නියාමනය කළ යුතුය.

විදේශ ගමන් බලපත්‍ර

1. කිසියම් අපරාධ ක්‍රියාවක් තුරන් කිරීම සඳහා නැතිවූ සෑම විදේශ ගමන් බලපත්‍රයක් පිළිබඳවම පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

පොලිස් දෙපාර්තමේන්තුව

1. හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා ධුරයේ කටයුතු කළ ආකාරය පිළිබඳව බරපතල ගැටළු ඇති විය. ජනාධිපතිවරයාට ඔහුව ඉවත් කිරීමට අවශ්‍ය වූ නමුත් එය ඉවත් කිරීමට පාලනය වන නෛතික තන්ත්‍රය සහ අගමැතිවරයා සහ ඔහුගේ පක්ෂය විසින් එම ඉවත් කිරීම සඳහා සහයෝගය නොලැබීම හේතුවෙන් එය කළ

නොහැකි බවට එය සාක්ෂි ඉදිරිපත් වී තිබුණි. එම ක්‍රියාපටිපාටිය ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා දේශපාලන පක්ෂ දෙකක සාමාජිකයන් වීමේ හැකියාව මනසේ තබා ගනිමින් නැවත තක්සේරු කළ යුතු ය.

2. ආගමික විරෝධී පැමිණිලි පිළිබඳ පැමිණිලි අධීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යටතේ ජාතික මට්ටමින් වෙනම අංශයක් ස්ථාපිත කළ යුතුය. රටේ සෑම පොලිස් ස්ථානයකටම මෙම කොට්ඨාශ නියෝජිතයින් සිටිය යුතු අතර ඔවුන් එවැනි පැමිණිලි විභාග කරනු ඇත. ඔවුන් අදාළ ස්ථානාධිපති හා මෙම අංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත වාර්තා කරනු ඇත.

3. රහස් පොලිසිය සහ ත්‍රස්ත විමර්ශන අංශය එක් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු යටතට පැවරිය යුතුය.

4. එක් එක් පළාත තුළ සිය මෙහෙයුම් පුළුල් කිරීම සඳහා උප කාර්යාල පිහිටුවීමෙන් ත්‍රස්ත විමර්ශන් අංශයේ කාර්යයන් පුළුල් කළ යුතුය.

5. පොලිස් පරීක්ෂකයින්ට මනෝ විද්‍යාත්මක කරුණු සහ විශේෂයෙන් මනෝවිද්‍යාත්මක ප්‍රශ්න කිරීම් ක්‍රමවේද පිළිබඳ පුහුණුව ලබා දිය යුතුය.

6. රහස් පොලිසිය සහ ත්‍රස්ත විමර්ශන අංශයේ රැඳවුම් පහසුකම් පුළුල් කර නවීකරණය කළ යුතුය.

7. සියළුම නවීන පහසුකම්, යටිතල පහසුකම්, සමාජ තාක්ෂණික පද්ධති (මානව හා යාන්ත්‍රික) සහ ප්‍රමාණවත් අරමුදල් සහිත විශේෂ ශාඛාවේ කොටසක් ලෙස නව පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කළ යුතුය. දැනුම හා තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය අත්‍යවශ්‍ය වේ. ප්‍රවේශ පාලනයක් සහිත මාර්ග ගත සංකේතාත්මක දත්ත හුවමාරු පද්ධතියක් හරහා ක්‍රියාශීලීව ක්‍රියා කිරීම සඳහා අන්තර් හා අන්තර් ආයතන හුවමාරු / තොරතුරු හා බුද්ධිය හුවමාරු කර ගැනීම ස්ථාපිත කළ යුතුය. විශේෂ ශාඛාව පොලිස්පතිවරයාගේ පාලනය හා අධීක්ෂණය යටතේ පැවතිය යුතු අතර යෝජිත

ව්‍යුහයේ කොටසක් ලෙස එහි ක්‍රියාකාරකම් ජාතික බුද්ධි ප්‍රධානි විසින් නිරීක්ෂණය කළ හැකි විය යුතුය. විශේෂ ශාඛාව දීපව්‍යාප්තව ක්‍රියාත්මක විය යුතු ය.

8. සංවිධානය, සංස්කෘතිය, වටිනාකම් සහ අචාර ධර්ම විශේෂයෙන්ම සන්නිවේදන ක්ෂේත්‍රයට අදාළව උසස් නිලධාරීන්, පහත් නිලධාරීන් සහ සම නිලයන් අතර සිදුවන ආකාරය වෙනසකට ලක් විය යුතුය. සාක්ෂිවලින් හෙළිවූ පරිදි ජ්‍යෙෂ්ඨයන් විසින් කනිෂ්ඨ නිලධාරීන් අමතා භාවිතා කළ වචන නිසා එම කනිෂ්ඨ නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලදී ක්‍රියාකාරිත්වයට අහිතකර බලපෑමක් එල්ල වී තිබේ.

9. පොලිස්පති පූජිත් ජයසුන්දර "අ.ක.ස" ලෙස සටහනක් යොදා තමාට ජාතික බුද්ධි අංශ ප්‍රධානි සිසිර මෙන්ඩිස් වෙතින් ලැබුණු තොරතුරු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු හතරදෙනෙකු වෙත යොමු කිරීම වැනි ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකුගේ විසින් සිදු කර ඇති ක්‍රියාවන් නොතකා හැරිය නොහැක. රාජ්‍ය පරිපාලනය තුළ මෙම යෙදුම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව රජය බරපතල ලෙස අවධානය යොමු කළ යුතුය.

10. පොලිස් දෙපාර්තමේන්තුවේ සංස්කෘතිය වෙනස් කළ යුතුය. එකම ගොඩනැගිල්ලේ ස්ථානගත කර ඇති ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු අදහස් හුවමාරු කර ගැනීම හෝ එකිනෙකා සමඟ කතා කිරීම නොකරන බව පරීක්ෂණ කොමිෂන් සභාවෙහි අවධානයට යොමු වී තිබේ. උසස්වීම් සඳහා නිලධාරීන් අතර ඇති තරඟය අවම කිරීමට පියවර ගත යුතුය. පුද්ගලික කාරණාවලට වඩා දෙපාර්තමේන්තුවක් ලෙස එකමුතුව කටයුතු කිරීම ප්‍රමුඛතා ගත කිරීමේ අවශ්‍යතාව පෙන්වා දිය යුතුය.

11. නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සඳහා පොලිස් නිලධාරීන් හට දැඩි වගකීමක් පැවරීම.

12. පොලීසිය පිළිබඳ මහජන මතය සහ පොලිසිය සමඟ ජනතාවගේ අන්තර් සම්බන්ධතා ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම.

13. ත්‍රස්තවාදයට එරෙහි මහජනතාව සමඟ සන්නිවේදනය වැඩි දියුණු කිරීම.

14. ප්‍රජාවන් සමඟ වඩා හොඳින් සම්බන්ධ වීමට හා ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට පදනමක් ලෙස පොලිස් නිලධාරින්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම.

15. ප්‍රජා ආරක්ෂන ගැටළු සහ දුක්ගැනවිලි හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම.

16. ත්‍රස්තවාදයට තවමත් සම්බන්ධ වී නැති හෝ පහසුවෙන් සමීප විය නොහැකි පුද්ගලයින් සහ කණ්ඩායම් සමඟ පොලිසියේ ඇති සබඳතා වැඩි දියුණු කිරීම.

17. ඔවුන්ගේ කැපවීම් ප්‍රදර්ශනය කිරීම සඳහා පොලීසිය හැකි තරම් තොරතුරු ප්‍රජාවන් සමඟ බෙදා ගත යුතුය.

18. සිය කැපවීම් ප්‍රදර්ශනය කිරීම සඳහා පොලීසිය හැකි තරම් තොරතුරු ප්‍රජාවන් සමඟ බෙදා ගත යුතුය.

19. විශේෂිත ප්‍රජාවන්ට (සිංහල-දෙමළ-මුස්ලිම්) නිතිපතා සංචාරය කරන, ඒ සඳහාම අනුයුක්ත පොලිස් නිලධාරීන් සමඟ විශේෂිත ප්‍රදේශවලට සේවය කිරීම සඳහා ප්‍රජා පොලිස් කණ්ඩායම අනුයුක්ත කිරීම.

20. අතථ්‍ය ප්‍රජා ප්‍රතිපත්තියක් (virtual community poly) හඳුන්වා දීම.

21. ආරක්ෂක පරීක්ෂාවන් සහ ශරීර සෝදිසි සිදු කරන සියලුම අධීක්ෂකවරුන් සහ පොලිස් නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ පුහුණුවක් අනිවාර්යය කිරීම.

22. පොලිසිය විසින් සුළු ජාතීන්ට හැකිතාක් දුරට ඔවුන්ගේම භාෂාවෙන් තොරතුරු ලබා දිය යුතුය.

වැළැක්වීමේ අරමුණින් සිදු කරන රඳවා ගැනීම

1. ප්‍රතිරැඩිකලීකරණය අරමුණු කරගත් පුනරුත්ථාපන වැඩසටහනකට ආගමික අන්තවාදීන් හෝ ත්‍රස්තවාදීන් ඇතුළත් කර ගැනීමේ අදහසින්, වැළැක්වීමේ අරමුණින් සිදු කෙරෙන රඳවා තබා ගැනීම් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක විධිවිධාන අනුගමනය කළ යුතුය. එවැනි ක්‍රියාමාර්ග ගැනීමේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහ පෙර මුහුණ දුන් අභියෝග පිළිබඳව හදිසි රෙගුලාසි යටතේ නිකුත් කරන ලෙ මාර්ගෝපදේශ සැලකිල්ලට ගත යුතුය.

අගමැති

1. ජනාධිපතිවරයා විදේශගතව සිටින විට සහ අග්‍රාමාත්‍යවරයා වැඩ බලන ආරක්ෂක අමාත්‍යවරයා නොවන අවස්ථාවක දී, සියලු ජාතික ආරක්ෂක තොරතුරු අග්‍රාමාත්‍යවරයාට දැනුම් දීම අනිවාර්ය කළ යුතු ය.

සභිකයින්ගේ පුද්ගලික පනත්

1. ආයතන සහ සංවිධාන පිහිටුවීමට අපේක්ෂා කරන සභිකයන්ගේ පෞද්ගලික පනත්, කෙටුම්පත් ආරක්ෂක නිෂ්කාශනය සඳහා යොමු කරන ක්‍රියාවලියක් සැකසීම. මෙයට හේතුව, පාර්ලිමේන්තු පනතක් මඟින් අන්තවාදී සම්බන්ධතා ඇති සංවිධාන සංස්ථාගත කර ඇති අවස්ථා කිහිපයක් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කිරීමයි.

තහනම් පැනවීම

1. අයිඑස් ඇතුළු අන්තවාදී ආගමික කණ්ඩායම් තහනම් කිරීම සඳහා නීති හෝ රෙගුලාසි නිර්මාණය කළ යුතු ය.

2. ශ්‍රී ලංකා ජමාතේ-ඊ-ඉස්ලාමි සංවිධානය (එස්එල්ජේඅයි) සහ ජමාඅත්-ඊ-ඉස්ලාමි ශිෂ්‍ය ව්‍යාපාරය (එස්එල්ජේඑස්එම්) තහනම් කළ යුතුය. සුදුසු නීතිය යටතේ අපරාධ චෝදනා ගොනු කිරීම සඳහා එහි ක්‍රියාකාරකම් සහ සාමාජිකයන් පිළිබඳව ගැඹුරු පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

3. බොදුබල සේන (BBS) තහනම් කළ යුතුය.

පුද්ගලයින් ලියාපදිංචි කිරීම

1. සියළුම පුද්ගලයින් හට, තමන් වාසය කරන ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ලියාපදිංචි වීම අනිවාර්ය කළ යුතුය.

දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම

1. ආගමික හේතු සහ විශ්වාසයන් මත පදනම්ව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම තහනම් කළ යුතුය. කිසිම ආගමක නමක් කිසිදු දේශපාලන පක්ෂයක නමේ කොටසක් නොවිය යුතුය.

2. එම අයුරින් දැනටමත් ලියාපදිංචි කර ඇති දේශපාලන පක්ෂවලට පක්ෂය සම්බන්ධ නියමිත වෙනස්කම් සිදු කිරීම සඳහා සහන කාලයක් ලබා දිය යුතුය.

ආගමික සමඟිය

1. ආගමික අවකාශය නියාමනය කිරීම සඳහා ඵලදායී නීති රාමුවක් සකස් කිරීම. මෙයට ඇතුළත් විය යුත්තේ,

අ. සිංගප්පූරුවේ ආගමික සමඟිය පවත්වාගෙන යාමේ පනතට සමාන නීතියක් පැනවීම (උපග්‍රන්ථය X) ඕනෑම ආගමික කණ්ඩායමක හෝ ආයතනයක අධිකාරී තනතුරක සිටින පුද්ගලයෙකුට එරෙහිව වාරණ නියෝග පැනවීමට ජනාධිපතිවරයාට / අගමැතිවරයාට හෝ නම් කරන ලද අමාත්‍යවරයාට බලය ලබා දීම. මෙහිදී අදාළ පුද්ගලයා පහත සඳහන් ක්‍රියාවන්ගෙන් එකක් හෝ කිරීමට උත්සාහ කිරීම පිළිබඳව ජනාධිපති / අගමැති හෝ නම් කරන ලද අමාත්‍යවරයා සෑහීමකට පත්විය යුතු ය. විවිධ ආගමික කණ්ඩායම් අතර සතුරුකම, වෛරය, අයහපත් බව හෝ සතුරුකම ඇති කිරීම හෝ දේශපාලන හේතුවක් ප්‍රවර්ධනය කිරීම, කඩාකප්පල්කාරී ක්‍රියාකාරකම් සිදු කිරීම හෝ ආගමික විශ්වාසයක් ප්‍රචාරය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම යන මුවාවෙන් රාජ්‍ය විරෝධී කටයුතුවල යෙදීම.

ආ. විවිධ ආගම්වල සමතුලිත නියෝජනයක් සහිත සියලුම ආගමික නායකයින්ගෙන් සමන්විත ජනාධිපති උපදේශක කමිටුවක් පත් කිරීම, එවැනි වාරණ නියෝගයක් දීමට පෙර ජනාධිපති / අගමැති හෝ නම් කරන ලද අමාත්‍යවරයා, මෙම උපදේශක කමිටුවේ උපදෙස් ලබා ගත යුතුය. එම කමිටුවේ සාමාජිකයෙකු ලෙස කිසිදු දේශපාලනඥයෙකු පත් නොකළ යුතුය.

ඇ. 1970 අංක 13 දරණ ආගම් සම්මේලන පනත ද මෙහිදී සලකා බැලිය යුතු ය.

2. ජනවාර්ගික හා ආගමික වෛරය අවුලුවාලීම වැළැක්වීම සඳහා පුළුල් නීතිමය රාමුවක් නිර්මාණය කිරීම. එවැනි වෛරයක් ඇති කරන ඕනෑම පුද්ගලයෙකුට හෝ කණ්ඩායමක් දඬයකට යටත්ව තහනම් කළ යුතුය.

ආගමික ප්‍රකාශන

1. අන්තවාදී හෝ ත්‍රස්තවාදී අන්තර්ගතයන් ප්‍රකාශයට පත් කිරීම වැළැක්වීම සඳහා සියලුම ආගමික ප්‍රකාශන නියාමනය කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්

1. ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් එක් තනතුරකට වඩා නොහෙබ විය යුතුය. හේමසිරි ප්‍රනාන්දු මහතා සමගාමීව තනතුරු කිහිපයක් දැරූ බැවින් ආරක්ෂක අමාත්‍යාංශයේ සිය රාජකාරි සඳහා ගත කළ කාලය අඩු වූ බවට සාක්ෂි ලැබී ඇත.

සමාජ මාධ්‍ය

1. සමාජ මාධ්‍යයෙහි පළවන විවිධ ප්‍රකාශන අධීක්ෂණය, කළමනාකරණය සහ ඉවත් කිරීම සඳහා ධාරිතාව වැඩි දියුණු කළ යුතුය. ආගමික වෛරය පැතිරවීම සඳහා සමාජ මාධ්‍ය භාවිතා කරනු ලැබේ. අවශ්‍ය නීතිමය විධිවිධාන පැනවීමෙන් අන්තවාදී සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා සමාජ මාධ්‍ය අවහිර කිරීමේ වලංගුභාවය ලබා දිය යුතුය.

ශ්‍රී ලාංකික අනන්‍යතාවය

1. ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ඇති කිරීම අරමුණු කරගත් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් රජය විසින් ක්‍රියාත්මක කළ යුතුය. සියළුම ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් ඔවුන්ගේ අනන්‍යතාවන් ආරක්ෂා කර ගැනීමට රිසිය. මෙය එම සැලැස්ම සඳහා අදාළ කර ගත යුතුය. එහෙත් මෙය වෙනත් රටවල දක්නට ලැබෙන පරිදි පුළුල් ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් තුළ පවතින සේ සිදු කළ හැක.

2. බෞද්ධයන්, කිතුනුවන්, හින්දු සහ මුස්ලිම්වරුන්ගේ මනස තුළ ශ්‍රී ලාංකික හැඟීමක් හා ප්‍රතිරූපයක් වර්ධනය කිරීමට පියවර ගැනීම. මෙය පාසල්වල ඉතා කුඩා අවධියේ සිට ආරම්භ විය යුතුය.

3. සුළුතරය තමන් ශ්‍රී ලංකාවේ කොටසක් නොවන බවට හැඟීම ඇති නොකළ යුතුය.

රජයේ ඉඩම්

1. රටේ සියලුම රජයේ ඉඩම් පිළිබඳ විගණනයක් සිදු කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කිරීම සහ සියලු අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට වහාම පියවර ගැනීම.

2. රජයේ ඉඩම් සඳහා අනාගත සියලු බලපත්‍ර නිකුත කිරීම සහ පිරිනැමීම් ජාතික ජනවාර්ගික හා ආගමික සංයුතියට සමානුපාතික පදනමක් මත සිදු කළ යුතුය. කිසිම ප්‍රදේශයක විශේෂිත ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමක පුද්ගලයන් පමණක් සිටිය යුතු නොවේ. ජාතික ආගමික අනුපාතය මත පදනම්ව රජයේ ඉඩම් ලබා දිය යුතු අතර, එම අනුපාතය උල්ලංඝනය කරමින් එවැනි රජයේ ඉඩම් පැවරීමක් සිදු නොකිරීමට සුදුසු ප්‍රතිපාදන සකස් කළ යුතුය. මෙම නිර්දේශය ඉදිරිපත් කරනු ලබන්නේ ජනවාර්ගික හෝ ආගමික පදනමක් මත ඇතැම් කණ්ඩායම් විසින් රාජ්‍ය ඉඩම් සංවිධානාත්මකව අනවසරයෙන් අල්ලා ගත් බවට සාක්ෂි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විමසා ඇති හෙයිනි.

3. සහරාන්ගේ උපදෙස් අනුව 2018 ඔක්තෝම්බර් 4 වන දින සාරිබු ආදාම් ලෙබ්බේ නොහොත් ගෆූර් මාමා විසින් අක්කර 25 ක් මිලදී ගන්නා ලදී. එගොඩපත්තුව,

පිදිතැන්න, වැලිකන්ද යන ප්‍රදේශවලින්, මොහොමඩ් සෆී මොහදීන් අබ්දුල් [illegible] නැමැත්තෙකුගේ නමින් මෙම ඉඩම් මොහොමඩ් කාසීම් කාල්ඩීන් වෙතින් රු. ලක්ෂ 20 ක මුදලකට මිලදී ගන්නා ලදී. මෙය මහවැලි අධිකාරියට අයත් ඉඩමක් බවද කාල්ඩීන් විසින් එය බදු පදනම මත ලබා ගෙන තිබූ බවද කියනු ලැබේ. නීතියට අනුකූලව මෙම ඉඩම වහාම අත්පත් කර ගැනීමට පියවර ගත යුතුය.

රාජ්‍ය බුද්ධි සේවය

1. 2019 අප්‍රේල් 21 න් පසු නැගෙනහිර පළාතේ ආරක්ෂිත නිවාස සොයා ගැනීම, සමහම කණ්ඩායමේ ඉතිරි සාමාජිකයින් හට සයින්දමරුදූහි සියදිවි නසා ගැනීමට සිදුවන තත්ත්වයට පත්වන සේ කරුණු කාරණා සාම්පාදනය කරමින් පරීක්ෂණ කටයුතු සිදු කළ සියලුම රාජ්‍ය බුද්ධි අංශ නිලධාරීන්ට ත්‍යාග ලබා දිය යුතුය. පරීක්ෂණ කොමිෂන් සභාව ඔවුන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා තම සඳහන් කිරීමෙන් වැළැකී සිටී. ඔවුන් පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉදිරියේ සාක්ෂි ලබා දුන්හ.

2. රාජ්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා හමුදාවේ හෝ පොලිසියේ යම් ක්ෂේත්‍ර පළපුරුද්දක් ඇති අයෙකු විය යුතුය.

3. මනෝ විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින්, තොරතුරු තාක්ෂණ විශේෂඥයින්, පරිගණක විද්‍යාඥයින් සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ විශේෂඥයින් රාජ්‍ය බුද්ධි අංශය වෙත බඳවා ගත යුතු ය.

4. රාජ්‍ය බුද්ධි අංශයෙහි ජාත්‍යන්තර විශ්ලේෂණ මධ්‍යස්ථානය නැවත ප්‍රතිස්ථාපනය කළ යුතු ය.

5. රාජ්‍ය බුද්ධි අංශය සඳහා බඳවා ගැනීම ස්වාධීන ආයතනයක් විසින් පරීක්ෂා කළ යුතුය.

6. රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සියළුම ඉදිරිපත් කිරීම් රාජ්‍ය බුද්ධි අංශයේ දත්ත පද්ධතියේ ගබඩා කළ යුතුය.

7. දේශපාලන මැදිහත්වීම්වලට බියෙන් තොරව රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරීන්ට සිය රාජකාරි ඉටු කිරීමට හැකිවන පරිදි නීති රාමුව ශක්තිමත් කළ යුතුය.

රූපවාහිනී,ගුවන්විදුලි සහ මාධ්‍ය

1. ශ්‍රී ලංකාවේ පීස් (PEACE TV) රූපවාහිනී නාලිකාව තහනම් කළ යුතුය. සිංගප්පූරුව, මැලේසියාව සහ බංග්ලාදේශය තුළ එය තහනම් කර ඇත.

2. අන්තවාදී ආගමික වැඩසටහන් විකාශය නොවන බවට තහවුරු කර ගැනීම සඳහා, රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකාවල විකාශනය වන සියලුම ආගමික වැඩසටහන්වල අන්තර්ගතයන් නිරීක්ෂණය කළ යුතුය.

ත්‍රස්තවාදී විමර්ශන දෙපාර්තමේන්තුව

1. යම්කිසි සුවිශේෂී තත්ත්වයන් නොමැති අවස්ථාවලදී ත්‍රස්තවාදය පිළිබඳ සියලු විමර්ශන ත්‍රස්ත විමර්ශන අංශය විසින් මෙහෙය විය යුතුය.

2. පළපුරුදු විමර්ශකයෙකු ත්‍රස්ත විමර්ශන අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ යුතු ය.

ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත 1980 අංක 31

1. ලාභ නොලබන, රාජ්‍ය නොවන සංවිධාන සහ පුණ්‍යායතන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සහ රාජ්‍ය නොවන සංවිධාන මහලේකම් කාර්යාලයේ අධීක්ෂණ හා අධීක්ෂණ බලතල වැඩි කිරීම මඟින් පනත සංශෝධනය කළ යුතුය. එවැනි සියලුම සංවිධාන රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය සමඟ අනිවාර්ය ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටියකට යටත් විය යුතු අතර එම නියාමන බලය ලේකම් කාර්යාලයේ බලතල අතරට ඇතුළත් කළ යුතු ය.

2. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ නව අංශ තුනක් ඇති කළ යුතු ය. එනම් නීති, මූල්‍ය හා විගණන සහ තොරතුරු තාක්ෂණ අංශ වේ.

3. පළපුරුදු විමර්ශකයින් රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට අදාළව පදනම මත යොමු කිරීම.

4. ඉල්ලීම් සපුරාලීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය වැඩි කිරීම.

5. රාජ්‍ය නොවන සංවිධාන මහලේකම් කාර්යාලයට නියාමකයෙකු ලෙස සමාජ සේවා සංවිධානවල ගිණුම්වලට ප්‍රවේශ හා පනත යටතේ ලියාපදිංචි වීමට අපොහොසත් වීමේ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් කටයුතු කිරිම සඳහා ප්‍රවේශය සැකසෙන පරිද්දෙන් අදාල පනත සංශෝධනය කිරීම.

6. ලාභ නොලබන, රාජ්‍ය නොවන සංවිධාන සහ පුණ්‍යායතන, ලියාපදිංචි කිරීමට පෙර ආරක්ෂක නිෂ්කාශන සිදු කළ යුතු ය.

වහබ්වාදය

1. ශ්‍රී ලංකාවේ වහබ්වාදය තහනම් කළ යුතුය. එක්සත් ජනපදයට එරෙහි ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ අවසාන වාර්තාවේ සඳහන් වන ආකාරයට "ඉස්ලාමීය ත්‍රස්තවාදය" "වහාබ් වාදයේ ආරම්භකයින්, මුස්ලිම් සහෝදරත්වය සහ ප්‍රමුඛ සලාෆි චින්තකයන් හරහා ගලා එන" අන්මත නොඉවසන අන්තවාදීත්වය පිළිබඳ දීර්ඝ සම්ප්‍රදායක් "තුළින් ආහාෂය ලබා ඇති බවයි. "වහාබ් ව්‍යාපාරයේ හදවත ලෙස හඳුන්වන, සෞදි අරාබියේ අල් කාසිම් පළාතේ හැදී වැඩෙමින්, ඇමරිකා එක්සත් ජනපදය වෙත එල්ල වූ සැප්තැම්බර් 11 ප්‍රහාරයට සම්බන්ධ ගුවන් යානා කොල්ලකරුවන් සිදු කළ ක්‍රියාකාරකම් සහ ඔවුන් ලැබූ අධ්‍යාපනය පිළිබඳව මෙම වාර්තාවේ විස්තර සඳහන් වේ. කොමිසමට අනුව, දැනට අක්‍රියව ඇති අල් හරාමෙන් ඉස්ලාමීය පදනම වැනි සෞදි "වහාබ් අරමුදල් සහිත සංවිධාන" "මුස්ලිම් නොවන අයට එරෙහිව ප්‍රචණ්ඩ ජිහාඩ් කිරීමේ ඉලක්කය ඉදිරියට ගෙන යාම සඳහා අන්තවාදීන් විසින් සූරාකනු ලැබ ඇත."

2. ඉබ්නු තයිමියා, ඉබ්නු අබ්දුල් වහබ්, අබ්දුල් අල මෞදූදි සහ හසන් අල් බන්නා යන අය වහාබ් වාදය පිළිබඳ විද්වතුන් වන නිසා ඔවුන්ගේ ඉගැන්වීම් සහ ප්‍රකාශන තහනම් කළ යුතු ය.

මැලේසියාව, රුසියාව සහ ටජිකිස්තානය යන රටවල වහබ්වාදය දේශනා කිරීම තහනම්ය. වහබ්වාදය තහනම් කරන ඊජිප්තුව වහබ් සහ සලාෆි විශාරදයින් වන අබ්දුල් වහබ්, ඉබ්නු තයිමියා, ඉබ්න් බාස්, ඃතයිම්, ඉබ්න් උතාමීන් සහ වෙනත් අය විසින් ලියන ලද සියලුම පොත් ඉවත් කිරීමට නියෝග කර තිබේ. ජෝර්දාන් රජය වහබ් දෘෂ්ටිවාදයේ විද්වතුන්ගේ පොත් තහනම් කර තිබේ.

3. වහබ්වාදී සංවිධාන වන බැවින් සියළුම තවුහිද් සංවිධාන තහනම් කළ යුතුය.

තරුණ සහභාගීත්වය

1. මුස්ලිම් තරුණ තරුණියන් ක්‍රීඩා හා වෙනත් විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩසටහන් ආරම්භ කරන්න. මෙය කළ යුත්තේ මුස්ලිම් දේශපාලනඥයින්, ආගමික නායකයින් සහ සිවිල් සංවිධානවල ක්‍රියාකාරී සහභාගීත්වයෙනි.

2. විවිධ ආගමික නිකායන්ට අයත් තරුණ තරුණියන් අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම අරමුණු කර ගත් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා ජාතික තරුණ සේවා සභාව කටයුතු කළ යුතු ය.

## 32 වන පරිච්ඡේදය

### විධායක සාරාංශය

2019 අප්‍රේල් 21 වන දින සිදුවූ ඛේදනීය සිදුවීම එල්ටීටීඊ භීෂණයේ අඳුරු දිනයන් පිළිබඳ මතකයන් නැවත අවදි කරයි. තිස් වසරක් පැරණි සිවිල් යුද්ධයක ප්‍රතිඵලයක් ලෙස එල්ටීටීඊයේ ක්‍රියාකාරකම් මුල සිටම අඩාල කිරීමට රජය අපොහොසත් වූවා සේම 1980 දශකයේ මුල් භාගයේදී රට තුළ රෝපණය කරන ලද ඉස්ලාමීය අන්තවාදයේ බීජ පිළිබඳ මුල් අවධියේදීම පියවර ගැනීමට අසමත් විය.

සිංහල රාජවලිය පැවති යුගවල සිටම එනම් අනාදිමත් කාලයක සිට උඩරට රාජධානිය දක්වාම සිංහලයන් සහ මුස්ලිම්වරුන් අතර වාර්ගික මිත්‍රත්වයක් පැවතුණි. කෙසේ වෙතත් බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමඟ ඔවුන් විසින් දියත් කරන ලද "බෙදා පාලනය කිරීමේ ප්‍රතිපත්තිය" නිසාවෙන් මුස්ලිම්වරු ඔවුන්ගේ අත වූ බලවත් ආයුධයක් බවට පත්වූ අතර එමඟින් උඩරට රාජධානියේ බලය හා බලපෑම අඩපණ කිරීමට භාවිතා කරන ලද බැවින් සිංහල මුස්ලිම් ප්‍රජාවන් අතර පැවති සුහද සම්බන්ධතාවයටද එමඟින් හානි සිදුවිය.

කෙසේ වෙතත් 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය හැරුණු විට මෙම දෙපිරිස අතර සම්බන්ධතාවය සාමකාමී විය. මුස්ලිම් ප්‍රජාව ශ්‍රී ලාංකික සමාජයට අන්තර්ග්‍රහනය වී ශ්‍රී ලාංකීය ජාතියට අගනා දායකත්වයක් ලබා දුන්හ.

හත්වන සියවසේ මුහම්මද් නබිතුමාගේ සහ ඔහුගේ සගයන්ගේ ඉගැන්වීම්වලින් බැහැර වන ඕනෑම නව්‍යතාවයන් හෝ භාවිතයන් බැහැර කරමින් ඉස්ලාමය පවිත්‍ර කිරීමට උත්සාහ කරන සුන්නි ඉස්ලාමීය ව්‍යාපාරයක් හැඳින්වීමට "වහබිවාදය" යන යෙදුම අරාබි ලෝකයෙන් පිටත පුළුල් ලෙස යොදා ගැනේ. තවුහිද් (ඇතැම් තැන්හි තවුහිද්, ටහීඩ්, තවුහිද් හෝ ටෙව්ඩිස් යනු ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ වහාබ්වාදය සඳහා භාවිතා කරන යෙදුමකි).

වහාබ්වාදයේ දක්නට ලැබෙන ගැටළුව වනුයේ ඉස්ලාමීය ඒක දේවවාදය (තවුහිද්) පිළිබඳ සුවිශේෂී අවබෝධයකින් ඇති වූ එහි තක්ෆිරි දෘෂ්ටිවාදයයි. එය ඉස්ලාමීය ඇදහිල්ලේ විෂය පථයෙන් පරිබාහිර යැයි සැලකෙන අයට එරෙහිව පුළුල් ලේ වැගිරීම්වලට තුඩු දී තිබේ.

එක්සත් ජනපදයට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ අවසාන වාර්තාව තවදුරටත් කියා සිටින්නේ "ඉස්ලාමීය ත්‍රස්තවාදය" වහබ්වාදයේ ආරම්භකයින්, මුස්ලිම් සහෝදරත්වය සහ සලාෆි චින්තකයෝ හරහා ගලා එන " අන්ත නොඉවසීම පිළිබඳ අඛණ්ඩ සම්ප්‍රදායක් "තුළ ආභාෂයක් ලබා ගන්නා බවයි.

ශ්‍රී ලංකාවේ වහබ්වාදය ව්‍යාප්ත කිරීමේ මුල් උත්සාහයක් ලෙස 1947 දී කුරුණෑගල පරගහදේනියාවේ ජාමියා ඉස්ලාමියා මිලියා පිහිටුවන ලද අතර ඩර්වේෂ් අබ්දුල් හමීඩ් බක්රි විසින් එය සිදු කරන ලදි. එම ප්‍රයත්නය සූෆිවරුන්ගේ දැඩි විරෝධය හේතුවෙන් ඵලදායී නොවීය.

1954 දී ශ්‍රී ලංකාවේ SLJI පිහිටුවන ලදි. එස්.එල්.ජේ.අයි මුස්ලිම් සහෝදරත්වය (ඉඛ්වාන් මුස්ලිම්) හා සමාන මතවාදයක් මත කටයුතු කරන අතර ඊජිප්තුව, සෞදි අරාබිය, කුවේට්, කටාර්, ඉන්දියාව සහ පකිස්ථානය යන රටවල සමාන මතවාදයක් ඇති පුද්ගලයින් හා සංවිධාන සමඟ සමීප සම්බන්ධතා පවත්වයි. ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම සහ ජාත්‍යන්තරව ඉස්ලාමීය රාජ්‍යයක් ඇති කිරීම ශ්‍රී ලංකා සංවිධානයේ අවසාන ඉලක්කයයි. එය දිගුකාලීන අරමුණකි.

එහි ශිෂ්‍ය ශාඛාවක් වන එස්.එල්.ජේ.එස්.එම්. සහ එහි සාමාජිකයන් කිහිප දෙනෙකු ආයුධ පුහුණුව සඳහා 2013-2014 පමණ තුර්කිය හරහා සිරියාවට ගොස් ඇත. පාස්කු ඉරිදා ප්‍රහාර සම්බන්ධයෙන් එහි සමහර සාමාජිකයින් අත්අඩංගුවේ පසුවෙති.

වහබ්වාදයේ වඩාත් ක්‍රියාශීලී හා සාර්ථක ව්‍යාප්තිය 1980 දශකයේ දී ශ්‍රී ලංකාවේ ආරම්භ වූයේ ප්‍රධාන වශයෙන් නැගෙනහිර පළාතේය. ශ්‍රී ලංකාවේ වහබ්වාදයේ ප්‍රචණ්ඩ අන්තවාදය මුලින්ම යොමු වූයේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් වන කාත්තන්කුඩියේ සූෆිවරුන් වෙතය. 1990 සිට 2010 දක්වා කාලය තුළ සූෆි බැතිමතුන් හා පූජකවරුන් වෙත

එල්ල වූ ශාරීරික හිංසනයට අමතරව ඔවුන්ගේ ආගමික වන්දනා ස්ථාන කිහිපයකට පහර දෙන ලදි. සූෆිවරුන්ට එරෙහිව වහබිවරුන්ගේ ප්‍රචණ්ඩකාරී ක්‍රියාකාරකම් නොකඩවා පවත්වා ගෙන යනු ලැබුණි.

වහාබ්වාදයේ ව්‍යාප්තිය ඉස්ලාමීය බුද්ධිමතුන්ගේ අග්‍රගන්‍යම සංවිධානය ලෙස සැලකෙන සමස්ථ ලංකා ජමියතුල් උලමා සභාව වෙත ද ව්‍යාප්ත වී ඇති බව පෙනී යයි. 1991 දී සමස්ත ලංකා තවුහිද් ජමාත් සංවිධානයේ සභාපති මවුලානා මවුලවි අබ්දුල් සමත් අලිත් විසින් ලිපියක් යවමින් සිය තනතුරෙන් ඉල්ලා අස්වුනේ ය. එහිදී ඔහු සඳහන් කළේ වහාබ් විශාරදයින් විසින් සමස්ත ලංකා ජමියතුල් උලමා සභාව අත්පත් කර ගනිමින් සිටින බවත් මහලු වියේ සිටින තමන් හට ඔවුන් සමග සටන් කළ නොහැකි නිසා තමන් ස්වකීය තනතුරෙන් ඉල්ලා අස්වන බවත්ය.

ඉතා කෙටි කාලයක් තුල දී කාත්තන්කුඩි ප්‍රදේශය ඉස්ලාමීය අන්තවාදයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. එහි වූ සුවිශේෂී බයිෂ්කාරී පරිසරය එහි ව්‍යාප්තියට තව දුරටත් වේගවත් කළේය.

සහරාන් ඉපදී හැදී වැඩුණේ මේ අවටය. 2005 වන විට ඔහු තම මතය අනුව අන්තවාදියෙකු බවට පත් වූ අතර කාත්තන්කුඩිහිදී දාරුල් ආදර් අද් දයියා නමින් ඔහුගේම වහාබ්වාදී සංවිධානයක් පිහිටුවා ගත්තේය. 2009 වන විට ඔහු තවුහිද් මතවාදයයේ විවෘත ආධාරකරුවෙකු ලෙස ප්‍රසිද්ධියේ හඳුන්වා ගන්නා ලදි.

2009 වන විට සහරාන් සහ ඔහුගේ අනුගාමිකයින් සතුව ටී -56 ආයුධ කිහිපයක් තිබී ඇති බව පෙනේ. 2009 දී ආයුධ භාරදීමට ලබා දුන් පොදු සමාව අවසානයේ ආරක්ෂක අංශ විසින් ආයුධ පරීක්ෂා කිරීමට පටන් ගත් විට ඒවා වළ දමන ලදි. පසුව ඒවා විකුණා ඇති අතර එම වකවානුවේදී ඒවා ක්‍රියාත්මක තත්ත්වක නොසිටි බව පෙනේ.

සහරාන් 2009 දී පමණ දරුල් ආදර් අද් දයියා හැර ගිය අතර ඔහු අනතුරුව ජාතික තවුහිද් ජමාත් නම් සංවිධානය පිහිටුවීය. 2013 ඔක්තෝබර් වන විට සහරාන් බෞද්ධ අන්තවාදය සහ බොදුබල සේනා සංවිධානය වැනි කණ්ඩායම් ගැන දේශන සිදු කරමින් සිටියේය.

2012 සිට 2015 දක්වා කාලය තුළ බොදුබල සේනා සංවිධානයේ ක්‍රියාකාරකම් හේතුවෙන් බෞද්ධ අන්තවාදයේ උත්සන්න වීමක් සිදුවිය. වහබ්වාදය, හලාල් සහතික නිකුත් කිරීම, මදුසා සහ විදේශීය ආගමික දේශකයන්ගේ පැමිණීම වැනි ගැටළු කිහිපයක් ඔවුන් විසින් ඉස්මතු කරන ලදි. කෙසේ වෙතත්, බොදුබල සේනා සංවිධානයේ සමහර ක්‍රියා එම ගැටළුවලින් ඔබ්බට ගොස් පොදුවේ සමස්ත මුස්ලිම් ප්‍රජාවම ඉලක්ක කර ගත්හ. මෙය අන්‍යෝන්‍ය රැඩිකලීකරණයට හේතු විය.

2013 පෙබරවාරි 26 සිට 2014 ඔක්තෝබර් 22 දක්වා කාලය තුළ සූෆි කණ්ඩායමක් වන අල්හාජ් අබ්දුල් ජවාන් අලිම් වලියුල්ලා හාරයේ සාමාජිකයින් සහරාන් සහ ඔහුගේ කණ්ඩායමට එරෙහිව කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ පැමිණිලි එකොළහක් ගොනු කළහ. මෙම පැමිණිලි ජාතික තවුහිද් ජමාත් විසින් ඔවුන්ගේ කණ්ඩායමට සහ අධ්‍යාත්මික නායක මවුලවි අල්හාජ් ඒ. අබ්දුල් රාහුමන් මිස්පාහි පාස්ජිට එරෙහිව කරන ලද ප්‍රකාශයන්ට එරෙහිවය.

සහරාන් සහ ජාතික තවුහිද් ජමාත් සංවිධානය 2015 ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයා වූ ජනාධිපති සිරිසේනගේ අපේක්ෂකත්වයට සහාය දැක්වූහ. 2015 අගෝස්තු මහ මැතිවරණයේදී ඔවුන් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ අපේක්ෂකයින්ට සහාය දැක්වීය.

2014 ජුනි 29 වන දින අයි එස් අයි එස් නායක අබු බකර් අල් බක්දාදි විසින් කැලිෆේටයක් ප්‍රකාශයට පත් කරන ලදි. 2020 වන විට අයිඑස් සිය පාලනය යටතට ගැනීමට සැලසුම් කර ඇති ප්‍රදේශ පෙන්වමින් 2014 දී මාර්ගගතව (online) සිතියමක් නිකුත් කරන ලදි. වෙසෙසින්ම ශ්‍රී ලංකාව ඉන්දියාව, පකිස්ථානය සහ ඉරානය අයත්වන කුරසාන් පළාතේ කොටසක් ලෙස හඳුනාගෙන තිබේ.

2013 සිට 2016 දක්වා කාලය තුළ ශ්‍රී ලාංකික මුස්ලිම්වරු කිහිප දෙනෙක් අයිඑස් සංවිධානයට බැඳීම සඳහා සිරියාවට ගියහ. මෙය 2014-2015 පමණ වන විට බුද්ධි අංශවල අවධානයට ලක් විය.

සාමාන්‍යයෙන් ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම් සෑම සතියකම නිශ්චිත දිනයක පවත්වන ලදි. ජනාධිපති සිරිසේන එහි රැස්වීම් කඩින් කඩ පැවැත්වීය. ජාතික ආරක්ෂාවට ලබා දී ඇති ප්‍රමුඛතාවය හීන වූ අතර ජනවාර්ගික සමඟිය හා සංහිඳියාව වෙත ප්‍රමුඛතාවය හිමි විය.

මුස්ලිම් නොවන අය ඝාතනය කිරීම වැනි අයිඑස්හි කුරිරු ක්‍රියාවන් සාධාරණීකරණය කරමින් සහරාන් 2016 දී පමණ සිය ෆේස්බුක් පිටුවේ අයිඑස් දෘෂ්ටිවාදයට අනුකූල වන පරිදි ලිපි පළ කිරීම ආරම්භ කළේය. සහරාන් අයිඑස් නායක අබු බකර් අල්-බක්දාදි මුහම්මද් නබිතුමාගෙන් පැවත එන්නෙකු ලෙස හැඳින්වීය. එතැන් සිට ඔහු සමාජ මාධ්‍යවල අයිඑස් සංවිධානයට පක්ෂව අදහස් දැක්වීමට පටන් ගත්තේය.

2016 දෙසැම්බර් 09 වන දින සහරාන් විසින් ඉස්ලාමය සහ කැලිෆේටය පිළිබඳ කාත්තන්කුඩියේ පිහිටි ජාතික තව්හිද් ජමාත් පල්ලියේදී දේශනයක් පැවැත්වූයේ ය. මුහම්මද් නබිතුමා ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටවූයේ අසිපත් ගෙන යුධ වැදී සතුරන් මරා දමා බව ඔහු පැහැදිලි කළේය. ඔහු එහිදී වැඩි දුරටත් ප්‍රකාශ කලේ මුස්ලිම්වරුන් යුද්ධ කළ යුතු බවත්, තමා (සහරාන්) මිය යාමට බිය නොවන බවත්, යුද්ධ කිරීමෙන් පසු ඔහුත් මිය යා යුතු බවත් ය. මෙම කතාවේ වීඩියෝව යූටියුබ්හි සංසරණය වී ඇත.

මෙම ප්‍රසිද්ධ ප්‍රකාශවලින් පෙනී යන්නේ 2016 වර්ෂය අවසානය වන විට සහරාන් ප්‍රචණ්ඩ අන්තවාදයට දැඩි නැඹුරුවක් ලබා ඇති බවයි. සහරාන් ප්‍රචණ්ඩ අන්තවාදයට ඉදිරියට යාමේ දී නවුෆර් වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

2017 මාර්තු මාසයේදී සහරාන් සහ ජාතික තව්හිද් ජමාත් සාමාජිකයින් සූෆිවරුන්ට පහර දුන්හ. ඉන්පසුව පාස්කු ඉරිදා ප්‍රහාරය එල්ල වන තෙක් සහරාන් කට්ටි පනිමින් සිට ඇත.

2017 නොවැම්බර් මාසයේදී සහරාන් සිය ආධාරකරුවන් සඳහා පුහුණු කඳවුරු පැවැත්වීම ආරම්භ කළේය. මෙම පුහුණුවට අයිඑස් පිළිබඳ දේශන, බොදුබල සේනා සංවිධානය වැනි බෞද්ධ අන්තවාදී සංවිධානවල ක්‍රියාකාරකම්, ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පුහුණුව ඇතුළත් විය. ඔහු රටේ විවිධ ප්‍රදේශවල කඳවුරු එකොළහක් පමණ පවත්වා

තිබේ. සහරාන් විසින් භාවිතා කරන ලද රැඩිකලීකරණ ක්‍රියාවලියේ ප්‍රධාන ග්‍රාමක බලවේගය මනාව ගොඩනඟන ලද ආඛ්‍යාන කිහිපයකින් සමන්විත විය.

පළමුවෙන්ම ඔහු කැලිෆේටය පිළිබඳව කතා කළේය. කැලිෆේටය (අරාබි බසින් කිලාෆා) යනු ඉස්ලාමීය රාජ්‍යයක් වන අතර එය කාලිෆ් (අරාබි බසින් කලීෆා) විසින් මෙහෙයවනු ලබන අතර ඔහු මුහම්මද් නබිතුමාගේ දේශපාලන -ආධ්‍යාත්මික අනුප්‍රාප්තිකයෙකු ලෙස සලකනු ලබයි. එසේම කලීෆාවරයා යනු සමස්ත මුස්ලිම් ලෝකයේ (උම්මා) නායකයෙකි.

දෙවනුව, සහරාන් ඉස්ලාමීය ආගමික ග්‍රන්ථවල ජිහාඩ් සහ ඒ ගැන සඳහන් කර ඇති විවිධ ලේඛනයන්හි ඒ ගැන සඳහන්ව ඇති කරුණු පිළිබඳව ප්‍රකාශ කළේ ය. එසේම එය ප්‍රචණ්ඩ ජිහාඩ් යන්නෙන් අර්ථ ගැන්විය යුතු බව ද ඔහු අවධාරණය කළේය.

තෙවනුව, ලොව පුරා මුස්ලිම්වරුන්ට සිදු කරන ලද හිංසාවන් ගැන සඳහන් කළ සහරාන් ඒ සියල්ලටම පළිගත යුතු බව ප්‍රකාශ කළේය. විශේෂයෙන් ඔහු බුරුමයේ සිදුවීම් සහ සිරියාවේ සහ ඉරාකයේ අයිඑස් හමුදාවන්ට එල්ල වූ පහරදීම් ගැන සඳහන් කළේය. සිව්වනුව, සහරාන් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ඉලක්ක කරගත් සිදුවීම් සහ විශේෂයෙන්ම පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ගේ ක්‍රියාකාරකම් ගැන සඳහන් කළේය.

පස්වනුව, සහරාන් උත්සාහ කළේ මුස්ලිම් ප්‍රජාවට රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යූහය කෙරෙහි ඇති විශ්වාසය බිඳ හෙළීමට ය.

සහරාන් සහ ඔහුගේ කණ්ඩායම **2018** අගෝස්තු වන විට පුපුරණ ද්‍රව්‍ය අත්හදා බලමින් සිටියහ. මෙම කාර්යෙහි නිරතවූ රිල්වාන්ට **2017** අගෝස්තු **27** වන දින බරපතල තුවාල සිදුවිය.

සහරාන් විසින් සැලසුම් කරන ලද මුල් සැලැස්ම වූයේ මහනුවර පෙරහැරට පහර දීමයි. එහෙත් වනාතවිල්លුවේ ආයුධ ගබඩාවක් සොයා ගැනීම, සිරියාවේ සහ ඉරාකයේ අයි එස් බලය පිරිහෙමින් පැවතිම නිසාවෙන් එම සංවිධානය ලොව පුරා විසිරි සිටි සිය විශ්වාසවන්ත අනුගාමිකයන්ගෙන් ප්‍රහාර දියත් කරන මෙන් ඉල්ලා සිටීම වැනි

ජාත්‍යන්තර සාධක හේතුවෙන් එම ප්‍රහාරය ඉක්මන් විය. එසේම නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් ඉතා ඉක්මනින් තමාව අත්අඩංගුවට ගනු ඇතැයි සහරාන් අපේක්ෂා කළේ ය.

මාස හයකට ආසන්න කාලයක නිහැඬියාවකින් අනතුරුව 2019 මාර්තු 16 වන දින නවසීලන්තයේ මුස්ලිම් පල්ලි ප්‍රහාරයන්ට එරෙහිව පළිගැනීමේ ප්‍රහාර අයැද සිටින අයිඑස්හි ප්‍රකාශක අබු හසන් අල්-මුහජිර් හඬපටයක් නිකුත් කළේ ය. 2019 මාර්තු 15 වන දින සුදු ජාතිකවාදී අන්තවාදියෙකු විසින් වෙඩි තැබීමෙන් නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච්හි මුස්ලිම් දේවස්ථාන දෙකක දේව මෙහෙයන්ට සහභාගී වූ මුස්ලිම් වන්දනාකරුවන් 49 දෙනෙකු ඝාතනය විය. “මුස්ලිම් දේවස්ථාන දෙකේ සමූල ඝාතන දර්ශන ඔස්සේ, රැවටී සිටින මුග්දයින්ව අවදි කළ යුතු බවත් ඔවුන්ගේ ආගමේ නාමයෙන් පළිගැනීමට කැලිෆේට්යේ ආධාරකරුවන් කටයුතු කළ යුතු ය” යනුවෙන් එම හඬ පටයේ සඳහන් විය.

2019 මාර්තු මස අවසානය වන විට සහරාන්ගේ කණ්ඩායම විසින් බෝම්බ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගෙන තිබුණි. සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විසින් ප්‍රහාර සඳහා සූදානම් වීම ඉතා හොඳින් සැලසුම් කරන ලදි.

සහරාන් සහ තවත් මරාගෙන මැරෙන බෝම්බකරුවන් හත්දෙනෙක් 2019 අප්‍රේල් 20 වන දින ස්පාන් ටවර් සේෆ් නිවසේදී ප්‍රහාරයන් සාධාරණීකරණය කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර හේතු දක්වමින් බයියාට් දිවුරුම ලබා දුන්හ.

2015-2019 කාලය තුළ රට තුළ වර්ධනය වෙමින් පැවති අයිඑස් ආධාරකරුවන් මැඩ පැවැත්වීමට සහ සහරාන් අත්අඩංගුවට ගැනීමට අවස්ථා කිහිපයක්ම මඟ හැරුණි.

ශ්‍රී ලංකාව අයිඑස් කැලිෆේට්යේහි කොටසක් ලෙස හඳුනාගෙන ඇති බව ජනාධිපති සිරිසේන සහ අගමැති වික්‍රමසිංහ ඇතුළු රජය දැන සිටියේය. අයිඑස් සංවිධානයට බැඳීම සඳහා ශ්‍රී ලාංකිකයන් 32 ක් පමණ සිරියාවට ගොස් ඇති අතර ඒ බව රජය වෙත දැනුම් දෙන ලදි. අධිකරණ අමාත්‍යවරයා මෙම කාරණය පාර්ලිමේන්තුවේදී මතු කළේ වී නමුත්

ඉන් සිදුවූයේ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අමාත්‍යවරයා කියා සිටින කාරණය "පරණ ප්‍රශ්නයක්" මතු කිරීමක් ලෙස හුවා දක්වමින් දැඩි විවේචනයට ලක්වීම පමණි.

2017 නොවැම්බර් 27 වන දින මහාචාර්ය රොහාන් ගුණරත්න ප්‍රධාන ධාරාවේ මාධ්‍යයක් සමඟ සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් කියා සිටියේ අයිඑස් දකුණු ආසියාවේ සහ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී වෙමින් පවතින මුල් කාලය මෙය බවත් තර්ජනයට ප්‍රතිචාර දැක්වීමට රාජ්‍යයන් ප්‍රමාද වන බවත්ය. මෙම තර්ජනය මැඩපැවැත්වීම සඳහා රාජ්‍ය යාන්ත්‍රනයේ ප්‍රවේශය තුළ කිසිවක් වෙනස් නොවීය.

සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු හමුවූ විශාලතම පුපුරණ ද්‍රව්‍ය තොගය වන 2019 ජනවාරි 16 වන දින වනාතවිල්ලුවේදී සොයාගත් විශාල පුපුරණ ද්‍රව්‍ය තොගයක් සොයා ගන්නා ලදි. සහරාන් ඊට සම්බන්ධ බව පරීක්ෂණවලින් හෙළි විය. අවම වශයෙන් 2019 පෙබරවාරි 19 වන විට ජනාධිපති සිරිසේනට මේ පිළිබඳව දැනුම් දී ඇත. කෙසේ වෙතත් ඉන් අනතුරුව 2019 අප්‍රේල් 21 වන දින දක්වා කිසිදු ආරක්ෂක මණ්ඩල රැස්වීමක් පවත්වා නොමැත. තවද ඔහු ආරක්ෂක අමාත්‍යවරයා ධූරයේ වැඩ බලන පත්වීමක් ලබා නොදී 2019 අප්‍රේල් 16 වන දින ඉන්දියාව සහ සිංගප්පූරුව බලා පිටත්ව ගියේය.

2019 අප්‍රේල් 04 වන දින රාජ්‍ය බුද්ධි සේවය වෙත සහරාන් සෙසු සාමාජිකයින්ගේ නම් ඇතුළත්ව සහ සිදුවිය හැකි ප්‍රහාරයක තොරතුරු ඉන්දියාවෙන් නිවැරදි හා ක්‍රියාත්මක විය හැකි මට්ටමේ බුද්ධිමය තොරතුරක් ලැබුණි. කෙසේ වෙතත් ආරක්ෂක ලේකම්, ජාතික බුද්ධි ප්‍රධානි, පොලිස්පති සහ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට අපොහොසත් විය.

ඔවුන් තිදෙනාම මෙම බුද්ධි තොරතුර රජයේ වෙනත් බුද්ධි අංශ සමඟ බෙදා ගැනීමට අසමත් වූහ.

බුද්ධි තොරතුරුවල විශ්වසනීයත්වය සහ සිදුවීම් වල සම්භාවිතාව තහවුරු කිරීම සඳහා රාජ්‍ය බුද්ධි සේවය සමඟ ඇති දත්ත අතිශයින් ප්‍රමාණවත් හා විශ්වසනීය විය. කෙසේ වෙතත්, බුද්ධි තොරතුරු නිසි ලෙස විශ්ලේෂණය කිරීම සඳහා රාජ්‍ය බුද්ධි සේවය තුළ

අවශ්‍ය පියවර ගෙන නොමැත. එය කෙතරම්ද යත් ජනාධිපති සිරිසේන නිල කටයුත්තක් සඳහා මඩකලපුව වෙත යාමට සූදානම් වන විට, සහරාන් සහ ඔහුගේ ක්‍රියාකාරකම් ගැන සඳහන් කරමින් රාජ්‍ය බුද්ධි සේවය විසින් තර්ජන තක්සේරු වාර්තාවක් සඳහන් කළද, ලැබුණු බුද්ධි තොරතුර පිළිබඳව කිසිවක් සඳහන් කොට නොතිබිණි.

රාජ්‍ය බුද්ධි සේවයේ  අධ්‍යක්ෂවරයා ජාතික බුද්ධි ප්‍රදානී සමඟ බුද්ධි තොරතුරු හුවමාරු කර ගත් අතර ඒ පිළිබඳව ආරක්ෂක ලේකම් වෙත සඳහන් කර පොලිස්පතිවරයා වෙත ලිපියක් යවා තිබේ. කෙසේ වෙතත්, බුද්ධි තොරතුරු විශ්ලේෂණය මගින් පොලිස්පතිවරයාට සහ අනෙකුත් ග්‍රාහකයන්ට බුද්ධි තොරතුර තනුක කර ඇති බවට වන තර්කය විවෘත එකකි.

පොලිස්පතිවරයා විසින් මෙම පණිවිඩය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හතර දෙනෙකු වෙත "කරු.අ.ක.ස" සටහනක් සමඟ යොමු කරන ලදි. මෙය ලැබූ නිලධාරීන් එය ඔවුන්ගේ යටත් නිලධාරීන් වෙත සම්ප්‍රේෂණය කළහ.

නැගෙනහිර පළාතේ තාලන්කුඩාහි යතුරුපැදියක් පිපිරීමේ සිදුවීමක් වූ බවට 2019 අප්‍රේල් 17 වන දින රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ වෙත තොරතුරු ලැබුණි. වැඩිදුර විමර්ශනවලදී එම සිද්ධිය සහරාන් සමඟ සම්බන්ධකම් ඇති බව සොයා ගන්නා ලදි. මේ අතර ආරක්ෂක ලේකම් හා පොලිස්පතිවරයා වෙත රාජ්‍ය බුද්ධි  සේවයේ අධ්‍යක්ෂක විසින් 2019 අප්‍රේල් 04 වන දින ලබා දුන් බුද්ධි තොරතුරුවලට වඩා නිවැරදි බුද්ධි තොරතුරු 2019 අප්‍රේල් 20 වන දින සවස රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ වෙත ලබා දී ඇත. එහෙත් ඛේදවාචකය වළක්වා ගැනීමට නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් අපොහොසත් විය.

මරාගෙන මැරෙන බෝම්බකරුවන් අට දෙනාටම තම මෙහෙයුම 2019 අප්‍රේල් 21 වන දින පෙ.ව 08. 45ට ටාජ් සමුද්‍රා හෝටලයේ පිපිරීම සිදුකිරීමට නියමිතව සිටි ජමීල් හැර සෙසු අය විසින් සිදු කරන ලද අතර බෝම්බ පිපිරීම් ඉතා කුඩා කාල ප්‍රාන්තර ඇතුළත සිදුවී තිබුණි.

පුපිරීමෙන් මියගිය සංඛ්‍යාව 271 ක් (මරාගෙන මැරෙන බෝම්බකරුවන් සහ ඔවුන්ගේ දරුවන් හැර) වූ අතර තවත් සිය ගණනක් තුවාල ලැබූහ. රජය විසින් වන්දි මුදල් ගෙවා ඇත්තේ මරණ 220 ක් සඳහා පමණි.

2015 සිට රජය ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා නොදෙන ලදි. ඒ වෙනුවට ජාතික සමඟිය හා සංහිඳියාවට ප්‍රමුඛත්වය දෙන ලදි. ආගමික අන්තවාදයට එරෙහිව සටන් කිරීමට රජය ක්‍රියාශීලී පියවර නොගත් බවට බොහෝ සාක්ෂිකරුවන් සාක්ෂිදුන්හ.

අයිඑස් සහ ඉස්ලාමීය අන්තවාදය සහ වෙනත් ආකාරයේ අන්තවාදය හේතුවෙන් රට මුහුණ දී ඇති තර්ජනයේ විශාලත්වය නිසි ලෙස වටහා ගැනීමට රජය අපොහොසත් විය. ජනාධිපති සිරිසේන සහ අගමැති වික්‍රමසිංහ අතර විශ්වාසය බිඳ වැටීම නිසා මෙය තවත් උග්‍ර විය.

බුද්ධි අංශ අතර ඇති වූ තරඟකාරිත්වයේ ප්‍රතිඵලය වූයේ වැදගත් බුද්ධි තොරතුරු බෙදා ගැනීමට අපොහොසත් වීමයි.

අකාර්යක්ෂම රජය 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ සිදුවීම් සඳහා ප්‍රධාන දායක සාධකයක් විය.

මෙම ඛේදවාචකයට ජනාධිපති සිරිසේන සහ අග්‍රාමාත්‍යවරයා ඇතුළු රජය වගකිව යුතුය.

පාස්කු ඉරිදා ප්‍රහාර වැළැක්වීමට රජය සහ එහි නිලධාරීන් අපොහොසත් වීම රටේ රාජ්‍ය පරිපාලනය සහ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආයතනයන් විසින් එතෙක් මෙතෙක් වාර්තා කරන ලද විශාලතම අත්වැරදීම සනිටුහන් කරන්නක් විය.

රට තුළ පවතින ඉස්ලාමීය අන්තවාදයේ හරය තවුහිද් (වහබි) මතවාදයයි. මුල් අවධියේදී කළමනාකරණය කිරීම නොකරන ලද බෞද්ධ අන්තවාදය විසින් මෙය තවදුරටත් පැසවීමකට ලක් කරන ලදි.

නවුෆර් කණ්ඩායමෙ න්‍යායාචාර්යවරයා වූ අතර ඉල්හාම්, ඉන්ෂාෆ්, රිල්වාන්, මිල්හාන්, ෂයිනි, සාදික්, හස්තූන් වැදගත් චරිත නිරූපණය කළහ. ඉන්ෂාෆ් සහ ඉල්හාම් මෙම කණ්ඩායමට මූල්‍ය පහසුකම් සැපයූහ.

ප්‍රහාරයෙන් ඉක්බිතිව ත්‍රස්තවාදී කණ්ඩායමක නායකයා ආරම්භයේදීම සියදිවි නසා ගැනීම අසා නොතිබූ හෙයින් සහරාන් කණ්ඩායමේ සැබෑ නායකයා දැයි ප්‍රශ්න ගතවී තිබේ.

2019 මාර්තු 27 වන දින පානදුරේ ආරක්ෂිත නිවස්නයක පැවති රැස්වීමකදී සහරාන් සාමාජිකයින් පිරිසකට දන්වා සිටියේ බංගලාදේශයේ අයිඑස් කණ්ඩායමේ නායකයා විසින් සිදු කරන ලද මරාගෙන මැරෙන ප්‍රහාරයට සමාන මරාගෙන මැරෙන ප්‍රහාරයකට තමන් සහභාගී වන බවයි. සහරාන් මෙහිදී බංගලාදේශයේ ඉස්ලාමීය රාජ්‍යයේ එමීර්වරයා ලෙස සැලකූ කුන්යා අබු ඊබ්‍රාහිම් අල්-හනීෆ් නොහොත් අහමඩ් චෞද්‍රි ගැන සඳහන් කර ඇති බව පෙනේ. ඔහු 2016 ජූලි මාසයේදී ඩකාහි ගුල්ශාන් ආපන ශාලාවට ප්‍රහාරය එල්ල කිරීමේ මහ මොළකරු වූ අර අතර එහි ප්‍රතිඵලයක් ලෙස මරණ 29 ක් සිදුවිය. මෙම ප්‍රහාරයෙන් තමීම් මියගොස් ඇති බව සහරාන් වැරදි ලෙස විශ්වාස කළේය. එහෙත් ඇත්ත වශයෙන්ම එම ප්‍රහාරයෙන් ඔහු මිය ගියේ නැත.

තවත් එක් සම්ප්‍රේෂණයක් වනුයේ ප්‍රහාරයට විදේශීය මැදිහත් වීමක් තිබේද යන සැකයයි. සමහර දේශපාලනඥයන් ඇතුළු සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් ඒ සඳහා සාක්ෂි දුන්හ. කෙසේ වෙතදු හුදු සනාථ නොකරන ලද අනුමානයක් (අයි.පී.එස්. ඩික්සිත්) හැර වෙනත් කිසිදු සාක්ෂියක් ඉහත ස්ථාවරය සම්බන්ධයෙන් ඉදිරිපත් වී නොමැත. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව එවැනි විදේශීය සම්බන්ධතාවයක් සොයා නොගත් නමුත් හඳුනාගත් ඇතැම් පාර්ශවයන් වැඩිදුර විමර්ශනය කළ යුතු යැයි නිර්දේශ කර ඇත.

වර්ධනය වෙමින් පවතින අයිඑස් සහ ඉස්ලාමීය අන්තවාදයේ තර්ජනයට එරෙහිව වහාම ගත යුතු පියවර බොහොමයක් පවතී. එකී පියවරයන් ගැනිමේදී බෞද්ධ අන්තවාදය ඇතුළු අනෙකුත් සියලුම අන්තවාදයන් කෙරෙහි අවධානය යොමු කර යුතු ව ඇත. ඵලදායී ත්‍රස්ත මර්දන නීතියක් කඩිනමින් බලාත්මක කළ යුතුය. ශ්‍රී ලංකාවේ වහාබ්වාදය තහනම් කළ යුතුය. ආගමික අධ්‍යාපනය සහ ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම නියාමනය කළ යුතුය.

මද්‍රසා පද්ධතිය නැවත සකස් කර සමීපව නිරීක්ෂණය කළ යුතුය. විදේශීය ආගමික දේශකයන් අධීක්ෂණය කළ යුතුය.

ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රතිපත්තියක් සහ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු අතර එයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීමක් ලබා දිය යුතුය.

නෛතික රාමුවක සහාය ඇතිව නව ජාතික බුද්ධි යාන්ත්‍රනයක් අනුගමනය කළ යුතුය.

හුදෙකලා වීම තුරන් කළ යුතු අතර ජාතික ප්‍රමුඛතාවයක් ලෙස ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ස්ථාපිත කළ යුතුය.

මියගිය හා තුවාල ලැබූවන්ට ගෙවන වන්දි මුදල වැඩි කළ යුතු ය. මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ දේපළ හා මුදල් රාජසන්තක කළ යුතුය.

ආගමික සහජීවනය සඳහා පනතක් සම්මත කර ගත යුතුය.

# 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

වේලාව :- ප.ව. 12.30

දිනය :- 2020. 10.22

(සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි)

**ගරු විනිසුරු මඬුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරි මහත්මිය - සාමාජික

**පෙනී සිටීම:-**

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, රජයේ අධි නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් කෞෂි සෙල්වනාගම් මෙනවිය ,සමඟ ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් නීතිඥ මධු ජයතිලක මහත්මිය

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**

මේ අවස්ථාවේදී කොමිෂන් සභා පනතේ 2008 අංක 16 දරණ සංශෝධන පනතේ 26 වගන්තිය ප්‍රකාරව නීතිපතිතුමා වෙනුවෙන් උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල් සරත් ජයමාන්න මහතා කොමිෂන් සභාව ඇමතීමට අවසර ඉල්ලයි. අවසර ලබා දෙමි.

**************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

ගරු සභාපතිතුමනි, ගරු කොමසාරිතුමනි, කොමසාරිස්තුමියනි, බොහෝම ස්තුතියි මට නීතිපතිතුමා වෙනුවෙන් එතුමා වෙනුවෙන් මෙම පනතේ 26 වන වගන්තිය ප්‍රකාරව සැලකිරිමක් කිරීමට අද අවස්ථාව ලබා දීම ගැන. මම මේ අවස්ථාව නීතිපතුමාගේ උපදෙස් පිට යෙදා ගනු ලබන්නේ වැදගත් නීතිමය සහ සිද්ධිමය කාරණයක් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අද දිනයේ සහ මින් ඉදිරියට මට දැන ගන්න ලැබෙනවා මේ වනතෙක් සැකකරුවන් ලෙස හෝ සැකකාරියන් ලෙස විමර්ශකයන් විසින් අත්අඩංගුවේ තබා ගෙන සිටි යම් සැකකරුවන් ඔබ ගරුතුමන්ලාගේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන් ලෙස කැඳවිමට යම් සුදානමක් තිබෙන විත්තිය ගරු නීතිපතිතුමාට දැන ගන්නට ලැබී තිබෙනවා. ඉතින් ගරු නීතිපතිතුමා වෙනුවෙන් ඔබතුමාලා ඉදිරියේ මා කරන දේශනයේ මුඛ්‍ය පරමාර්ථය මුලින්ම කෙටියෙන් සඳහන් කරනවා නම් සියලුම නීතිමය සහ අනෙකුත් කාරණා සලකා බලන විට සාක්ෂිකරුවන් ලෙස හෝ වෙනත් ආකාරයකින් මෙම සැකකරුවන් කැඳවීම අනාගතයේ දවසක නීතිපතිතුමා වෙතට විතරක්ම පැවරෙන නඩු පැවරීමේ බලයත් පැමිණිල්ල මෙහෙයවීමේ බලයටත් ප්‍රබල අගතියක් සිද්ධ වෙනවා. ඒ නිසා මගේ අවසාන ඉල්ලීම වන්නේ ඒ ඉල්ලීම ප්‍රකාරව මේ ආකාරයෙන් විමර්ශකයන් භාරයේ පොලීසිය භාරයේ රඳවා නියෝග ගැනීම මත රඳවා සිටින යම් යම් සැකකරුවන් මේ කොමිෂන් සභාව ඉදිරියේ දී සාක්ෂිය සඳහා කවර ආකාරයෙන් හෝ කැඳ නොවන ලෙස. ගරු සභාපතිතුමනි ඔබතුමන්ලාගේ කොමිෂමට ජීවය දෙන්න ලැබෙන්නේ කොමිෂන් සභාව පනත යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරන ලද අධිකාරි බලපත්‍රය මත. ඒ අධිකාරි බලපත්‍රයේ පැහැදිලිව සඳහන් වෙනවා May I read that particular portion in English, to be my Commissioners to Investigate and Inquire in to take necessary action, to enable future legal action. ඔබතුමන්ලා මොන කර්තව්‍යය ගෞරවාන්විත කර්තව්‍යය මේ කොමිෂන් සභාවේ පියස යට සිද්ධ කලත් අවසාන පරමාර්ථය සිද්ධවෙන්නේ නඩු කටයුතු අනාගතයේදී පැවරීම. ඒ වගේම එම අධිකාරි පත්‍රයේ 11 වන ඡේදයේ තවදුරටත් සඳහන් වෙනවා ඔබතුමන්ලා විසින් එකතු

කරනු ලබන සාක්ෂි.May I read that "To transmit the Attorney General such material on Investigation and Inquiry enabling the Attorney General to consider the Institution of Criminal Proceedings against persons alleged to have committed such offences."

ඒ මේ ඔක්කෝම මුඛ්‍ය පරමාර්ථය අවසානයේදී ඔබතුමන්ලා බොහෝම අමාරුවෙන් එකතු කර ගන්නා සාක්ෂි හරියට එක පක්ෂියෙක් බොහෝම අමාරුවෙන් රත්‍රන් බිත්තර එකතු කර ගන්නා වගේ සියුම් ලෙස එකතුකරගන්නා මෙම සාක්ෂිය නීතිපතිතුමා තමන්ගේ දක්ෂතාවය සහ තමන්ගේ වෘත්තිමයභාවය සලකලා අධිකරණයක් ඉදිරියේ නඩු මෙහෙයවන්න කරන තීරණයක්. ඊට අමතරව අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රකාර නිතිපතිතුමාට විතරයි මේ ලංකාවේ අධිකරණයක් ඉදිරියේ විශේෂයෙන් මහාධිකරණයක් ඉදිරියේ නඩු පැවරීමේ බලය තිබෙන්නේ අපරාධ නඩු විධාන සංග්‍රයේ 393 (7) වන වගන්තිය ප්‍රකාර. ඒ වගේම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 12 වන වගන්තිය ප්‍රකාර නිතිපතිතුමාගේ අවසරය නැතිව මහාධිකරණයේ කිසිම නඩු පැවරීමක් කරන්න බැහැ. ඒ නිසා මේ සිද්ධිය කොච්චර බරපතළ වුණත් ඔබතුමන්ලා කෙතරම් දිවා රෑ මහන්සි වෙලා ඔබතුමන්ලා මේ ගෞරවනීය සේවය කලත් අවසාන පරමාර්ථය මොකක්ද නීතිපතිතුමා නඩු පවරන එක. ඒ නිසා නීතිපතිතුමා නඩු පවරන්නේ කවුරු කාරණා මතද මේ වන විටත් ගරු සභාපතිතුමනි අපාරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් යම් යම් විමර්ශන කරලා තියෙනවා. ඒ විමර්ශන කරන අතරතුරවාරයේදී ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 7 වන වගන්තිය යටතේ යම් යම් පුද්ගලයන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන තියෙනවා. ඒ පුද්ගලයෝ කවදා හරි දවසක සැකකාරයෝ වෙලා මහාධිකරණයක් ඉදිරියේ නඩු පැවරුවහොත් අනිවාර්යය වශයෙන් පැමිණිල්ලට තියෙන අභියෝගය තමයි මෙන්න මේ ප්‍රකාශ ස්වේච්ඡාවෙන් ලබා ගත්ත බවට ඔප්පු කිරීමේ වගකීම. ඒක එක. ඒ වගේම යම් යම් අවස්ථාවලදි මොවුන් විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ රැඳවීම් නියෝග යටතේ සිටින කාලය අතරතුරේදී ගරු මහේස්ත්‍රාත්තුමා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ පුද්ගලයන්ගෙන් ප්‍රකාශ ලියලා තියෙනවා. එතකොට මේ වන විට මේ රටේ අධිකරණ ක්‍රියාදාමය මේකට සම්බන්ධ වෙලා තියෙනවා. ඒ වගේම මේ අධිකරණ ක්‍රියාදාමය සම්බන්ධ වෙලා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය යටතේ යම් යම් ආකාරයකින් විමර්ශනවලට සහාය දැක්වීමකුත් කරනවා. ඒ වගේම අද දිනයේ සිට යම් යම් සැකකරුවන් රක්ෂිත බන්ධනාගාරගත වෙනවා. ඒ අවස්ථාවේදී අනිවාර්යය වශයෙන්ම බලය ලැබෙනවා මහේස්ත්‍රාත් අධිකරණයට මේ අධිකරණ කටයුතුවලට සහයෝගය දක්වන්න. ඒ නිසා දැනටමත් විර්ශන කටයුතු සිද්ධ වෙලා අධිකරණය මේ සම්බන්ධයෙන් සම්බන්ධ වෙලා අවසානයේදී සිද්ධ වෙනවා මොවුන්ට විරුද්ධව නීතිපතිතුමා විතරයි සැල කර බලන්නේ. ඉතාමත්ම ගෞරවයෙන් කියන්නේ ඔබතුමන්ලා කවර නිර්දේශය කරත් ඉතාමත්

ගෞරවයෙන් කියන්නේ ඔබතුමන්ලා කවර නිර්දේශය කරත් ඒ නයින්ම ස්වායක්තව නඩු පැවරෙන්නේ නැහැ. ඒ නඩු පැවරීමේ තනි සහ අනන්‍ය බලය නීතිපතිතුමා සතු විතරක් තියෙනවා. මේක නීතිපතිතුමාගේ බලයවත් ඔබතුමන්ලාගේ බලය පිළිබඳ ප්‍රශ්නයක් නෙමේ. මට කිසිම බලය පිළිබඳ ප්‍රශ්නයක් නෑ. අපි මේ ආයතන දෙකම ඉතාමත්ම සුහද ව හා සමාන්තරව අපේ අවසාන ඉලක්කය මොකක්ද අපේ අවසාන ඉලක්කය විශේෂයෙන් එදා අප්‍රේල් මාසේ 21 වෙනිදා වෙච්ච ඒ ප්‍රහාරය ඇතුලු ඊට සම්බන්ධ අනෙකුත් සිද්ධීන් සමුදායක් තියෙනවා නම් ඒ කුමන්ත්‍රණයේ සුල මුල හොයගෙන නඩු පවරන එක. ඒ නඩු පවරන්න වෙන්නේ සාක්ෂි ආඥා පනතට අනුව. ඒ විතරක් නෙමේ ඒ නඩු පවරද්දි නීතිපතිතුමාට සිද්ධ වෙන්නේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරන්න. ඔබතුමන්ලාට කිසිසේත්ම භාරයක් නැහැ සාධාරණ සැකයෙන් ඔබ්බට තමන් ඔබතුමන්ලාගේ ගෞරවණීය නිර්දේශ කරන්න. ඔබතුමන්ලාට තිබෙන්නේ කවුරුහරි හඳුනා ගන්නවානම් මේ අපරාධයට සම්බන්ධයි කියලා ඒ සම්බන්ධව නිර්දේශයක් කරන එක පමණයි. ඒ නිසා නිතිපතිතුමාට තියෙන්නේ එතුමාගේ දෙව්ර මත තියෙන්නේ මහා වගකීමක්. හරියට ස්නායු ශෛල්‍ය වෛද්‍යවරයෙක් මොකක් හරි සැත්කමක් කරන කොට වැරදිලාවත් එක ස්නායුවක් බේරන්න ගිහිල්ලා තව ස්නායුවක් කැපුනොත් එහෙම ඒ ලේඩාගෙන් වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා කන්දක් විදදරා මොනවාහරි කරලා යම් අත් වැරැද්දක් මේ ක්‍රියාමාර්ගය තුළ සිද්ධ වුණොත් අවාසන හානිය වෙන්නේ මේ රටේ යුක්තිය සාධාරණත්වය අපේක්ෂාවෙන් සිටින සමස්ථ සමාජයට. සමස්ථ සමාජයේ කැඩපත තමයි නීතිපතිතුමා කියන්නේ. ඒක නිසා මේක කිසිසේත් ම නීතිපතිතුමාගේ බලය පෙන්වන අවස්ථාවක් නෙමේ. මා ගෞරවයෙන් කියන්නේ ඔබතුමන්ලා ඉතාමත්ම ගෞරවනිය රාජකාරියක් මේ අවස්ථාව වන විටත් කරලා තියෙනවා ඒවා ගැන අපි කිසිම බාධාවක් නැහැ. ඒ නිසා තමයි නිතිපතිතුමා වෙනුවෙන් ඔබතුමන්ලාගේ කොමිෂන් සභාවට සහය දෙන්න නිලධාරීන් කණ්ඩායමකුත් පත්කරලා තියෙන්නේ. මගේ ඉල්ලීම දැනටමත් සැකකරුවන් ලෙස හඳුනාගෙන තිබෙන අය සාක්ෂිකරුවන් ලෙසට කැඳවීම මූලික වශයෙන්ම මූලික සිද්ධාන්තය බිඳ දැම්මක්. කවර ආකාරයකින් ද ඔබතුමන්ලා තීරණය ගත්තේ මොවුන් සාක්ෂිකරුවන් හැටියට කැඳවන්න. මොවුන්ට විරුද්ධව ඔබතුමන්ලා ඉදිරියේ අමුද්‍රව්‍ය තිබුණා මදීද ඔවුන්ට විරුද්ධව 16 වන වගන්තිය යටතේ සැකකරුවන් ලෙස සලකන්න. ඔවුන්ට සාක්ෂිකරුවන් ලෙස මෙතෙන්ට කැඳෙව්වාට පස්සේ ඔවුන්ට හම්බෙනවා හොඳ වේදිකාවක්. මොකක්ද හම්බෙන වේදිකාව හොඳ තෝතැන්න මොකක්ද අනාගතයේ දවසක මේ නඩු විභාගයක් ගියොත් එහෙම ඒ නඩු විභාගයේදී ඒ පැමිණිල්ලේ නඩුව කෙරෙහි සාධාරණ සැකයක් ඇති කරන්න පුළුවන් ඒ සාක්ෂි සලිත කරන්න පුළුවන් වේදිකාවක් ඔබතුමන්ලා නොදැනුවත්වම සමහර විටක සලස්වා දෙනවා වෙන්න පුළුවන්. මම අපරාධ නඩු ගැන මේ රටේ ගොඩාක් නඩු කරලා තියෙන එක්කෙනෙක්. නීතිපතිතුමාගේ මතය මොකක් වුණත් නැතත්

මම දන්නවා පැමිණිල්ලක් මෙහෙය වන්න යද්දි මගේ ඔලුවේ කැකෑරෙන ප්‍රශ්න ගණනාවක්. මොකද එකම සාක්ෂිකාරයා විවිධ අවස්ථාවලදී විවිධ තැන්වලදී දාහක් දේවල් කියලා තිබුණා සාක්ෂිකරුවෙක් හැටියට ප්‍රශ්න ගණනාවක් මතුවෙනවා පැමිණිල්ලට. ඒ වගේම උසාවියේ මහාධිකරණයේ ඉන්න සැකකරු ඔහු විසින් මහේස්ත්‍රාත්තුමාට හරි වෙනත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක්ට පාපොච්චාරණයක් කරලා තියෙනවානම් ඒකේ ස්වේච්ඡා භාවය පිළිබඳව අධිකරණයේ පරීක්ෂණයක් කරද්දි Vior dire inquiry එකක් කරද්දි ඒකට අවශ්‍ය අමුද්‍රව්‍ය මේ කොමිෂන් සභාවට ඇවිල්ලා ප්‍රසිද්ධ වේදිකාවක් හදලා හදා ගන්න පුළුවන්. එතකොට ඔවුන්ට කියන්න පුළුවන් මහාධිකරණය ඉදිරියේදී අප්‍රමාදිත්‍ය පරීක්ෂණය දාද්දි මම මෙහේ විතරක් නෙමේ කොමිෂන් සභාව ඉදිරියේදීත් කිව්වා මගෙන් ස්වේච්ඡාවෙන් නෙමේ අදාල නිලධාරීන් මගේ ප්‍රකාශ සටහන් කරේ. මේවා ගැන මම කියන්නේ අපි ඉතාමත්ම සංවේදී වෙන්න ඕනේ. ඔබතුමන්ලාට බලය ගැන ප්‍රශ්නයක් නෙමේ කිසිසේත්ම ඔබතුමන්ලාගේ අඩුපාඩුවක් කවුරුත් දකින්නේ නැහැ. මෙන්න මේ මං කිව්ව නීතිමය කාරණා ඔබතුමන්ලා සඳහන් කරලා ඒක සාධාරණීකරණය කරනවානම් නීතිය පිළිබඳ අල්ප මාත්‍රයක්වත් දන්නේ නැති බාහිර අය කිසිසේත්ම ඔබතුමන්ලාට දෝෂාරෝපණයක් එල්ල කරන එකක් නෑ මේ සාක්ෂිකරුවන් මේ සැකරුවන් කැදෙව්වේ නැහැයි කියලා මොකද මේක නීතිමය කර්තව්‍යයක්. ඇත්ත මේ රටේ ජනතාවට දැන ගන්න අයිතියක් තියෙනවා ඇත්ත මේ රටේ මාධ්‍යයට දැන ගන්න අයිතියක් තියෙනවා ඒ මොන කොහොම අයිතියක් තිබුණත් අවසානයේදී අපිට මහාධිකරණයේ සාර්ථක ලෙස නඩුවක් මෙහෙයවන්න පුළුවන්නම් මේ ඔක්කෝම සුන්නත් දූවිලි වෙලා යන අපරාධ යුක්ති ක්‍රමයේ වැඩක් නැති බවට වැඩක් බවට පත්වෙලා යනවා. ඒ නිසා ගෞරවයෙන් සඳහන් කරන්නේ මෙන්න මේ පුද්ගලයෝ මේ අවස්ථාවේදී කැඳවන්න එපා. අනෙක් කාරණය ගරු ස්වාමිනි මේ සමහර පුද්ගලයන්ට විරුද්ධව දැනටමත් මහාධිකරණවල නඩු පවරලා තියෙනවා. ඒ නඩු පවරලා තියෙන්නේත් විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ සඳහන් කරන ලද යම් පාපොච්චාරණ මත රැදී එතකොට යම් යම් පුද්ගලයෝ ඒ මහාධිකරණය ඉදිරියේ විත්තිවාචකය ගන්න බලාපොරොත්තු වෙනවා නම් ස්වේච්ඡාභාවය පිළිබඳව ඔවුන්ට මෙතනදී හොඳ තෝතැන්නක් හම්බෙනවා සැකකරුවන් හැටියට වෙන නඩුවල නැති සැකකරුවන්ට නැති ඉතාමත්ම අසාධාරණ අවස්ථාවක් ඔවුන්ට ලැබෙනවා මේ වේදිකාවක් හැදුවොත් එහෙම ඔවුන්ගේ නඩු විභාගය සුනුවිසුනු කරන්න. අනිත් එක මේ නඩුව ගරු ස්වාමිනි නිකම්ම හුදකලා සිද්ධියක් නෙමේ. මේ නඩුව වටා තියෙනවා තවත් සිද්ධි ගණනාවක්, වනාතවිල්ලුව වෙන්න පුළුවන්, එහෙම නැත්නම් මාවනැල්ල වෙන්න පුළුවන් ඒ වගේම තවත් සිද්ධි ගණනාවක් තියෙනවා. මේ තුළ මහ කුමන්ත්‍රණය තුළ තවත් කුමන්ත්‍රණ ගණනාවක් තියෙනවා. ඒ නිසා මේක අපිට ආවාට ගියාට මේ වැඩේ කරන්න බැහැ අවසානයේදී නිතිපතිතුමා තමයි තීරණය කරන්නේ කවුද මගේ සාක්ෂිකරුවෝ

වෙන්නේ කවුද මගේ සැකකරුවෝ වෙන්නේ. සමහර විට ඉන්න සැකකාරයෙක් නීතිපතිතුමා හිතන්න පුළුවන් මේ රටේ පවතින යුක්තිය පසිඳලීමේ සිද්ධාන්ත සහ දර්ශනය දිහා කල්පනා කරලා මට වෙන සාක්ෂි නැහැ මට හොඳම දේ තමයි මේ පුද්ගලයා හෝ මේ තැනැත්තියට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 256 වන වගන්තිය යටතේ සමාවක් දීලා පැමිණිල්ලේ සාක්ෂිකාරයෙක් කරනවා කියලා. එහෙම කරනවා නම් අපිට ලොකු පීඩනයක් අපිට තෙරපුමක් ඇයි ඒ සාක්ෂිකාරයාගේ සාක්ෂිය ස්වාධීන සාක්ෂිවලින් තහවුරු කරන්න ඕන. ඊට අමතරව ඒ සාක්ෂිකාරයා අපි අධිකරණය වෙත දාන්නේ හරි ප්‍රවේශමෙන්. හැබැයි අධිකරණයට දාන්න කලින් ඒ සාක්ෂිකාරයා මෙම කොමිෂන් සභාව ඉදිරිපියේ හරි ඇවිල්ලා ඒ සැකකාරයා අපාරධයට සම්බන්ධ එක්කෙනෙක් මේ කොමිෂන් සභාව ඉදිරියට හරි ඇවිල්ලා නානාප්‍රකාරයේ හරස් ප්‍රශ්නවලට ලක් කරොත් එහෙම මොකද වෙන්නේ ඒ සාක්ෂිකාරයා අපිට දාන්න බැරි වෙනවා. ඒ නිසා ඇත්ත සත්‍ය හොයන්න ඕන බව ඇත්ත. නමුත් සත්‍ය හොයන්න ගිහිල්ලා මේ සාක්ෂියේ වියවුලක් බවට පත්වුණොත් එහෙම වියවුල් සහගත සාක්ෂි තුලින් නීතිපතිතුමා තමයි අමාරුවේ වැටෙන්නේ. නීතිපතිතුමා කියන්නේ මේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රමය. ඒ නිසා මං ගෞරවයෙන් සඳහන් කරන්නේ මෙන්න මේ වැදගත් විශේෂයෙන්ම තීරණාත්මක සාක්ෂිකරුවන් දැනටමත් ප්‍රකාශ දීලා තියෙනවා. ඒ ප්‍රකාශ දුන්න සාක්ෂිකරුවන් හෝ සැකකරුවන් ඔවුන්ට රඳවා ගැනීමේ නියෝග මත දීලා තියෙන්නේ. ඔවුන් අද දිනයේ සිට රක්ෂිත බන්ධනාගාරයට පත්වෙනවා. ඒ නිසා ලොකු අවදානමක් තිබෙනවා ඔවුන් අනාගතයේ ඔවුන් ගන්න යන චිත්තවාචික සම්බන්ධයෙන් යම් යම් ස්ථාවර මේ අධිකරණය ඉදිරියේ ගන්න. ඒක නිසා මං නීතිපතිතුමා වෙනුවෙන් ගෞරවයෙන් සැලකර සිටින්නේ මේ පුද්ගලයන් මේ අවස්ථාවේදී කිසිසේත්ම සාක්ෂිකරුවන් හෝ එහෙම නැත්නම් 16 වන වගන්තියේ සැකකරුවන් හැටියට නොකැඳවන ලෙසට. එහෙම කළොත් සිද්ධ වෙන්නේ කවදා හරි දවසක අපිට අතීතයට හැරීලා බලලා කියන්න සිද්ධ වෙයි මට නඩු පවරන්න තිබුණු හොඳම අවස්ථාවන් ටික මගෙන් ගිලිහී ගියා කියලා. ඒ නිසා මා ගෞරවයෙන් කියන්නේ විශේෂයෙන්ම මේ පනතේ 23 වන 24 වන වගන්තියේ කියනවා නීතිපතිතුමාට 2008 ගෙනාව සංශෝධනය නිසා බලය ලැබෙනවා ඔබතුමන්ලා ඉදිරියේ මෙහෙයවපු සාක්ෂි දිහා බලලත් නඩු දාන්න. හැබැයි ඒ සාක්ෂි දිහා විතරක් බලලා නඩු දාන්න කලින් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ නීතිපතිතුමාට ආයේ සැරයක් කියන්න වෙනවා යම් යම් සැකකරුවන්ට දෝෂාරෝපණය කියලා දීලා ඒ සැකකරුවන්ගේ දෝෂාරෝපණය කියලා දීලා ඔවුන්ගෙන් නැවතත් ප්‍රකාශයක් සටහන් කරන්න කියලා. ඒනිසා ඒ වැඩ පිළිවෙල ඉදිරියට යා යුතු වෙනවා. ඒක නිසා මා ගෞරවයෙන් සඳහන් කරන්නේ විශේෂයෙන්ම රක්ෂිත බන්ධනාගාරය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ යම් සැකකරුවන් හිටියා නම් ඔවුන් මේ අධිකරණය

ඉදිරියේදී සාක්ෂිකරුවන් හෝ එහෙම නැත්නම් සැකකරුවන් ලෙස සාක්ෂියට නොකැඳවන ලෙස. බොහෝම ස්තූතියි.

**************

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

**මේ අවස්ථාවේදී උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ලබා දුන් කරුණු දැක්වීමෙන් පැන නගින කාරණාවක් කොමිෂන් සභාව ඔහුගෙන් විමසයි. එනම් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා සම්බන්ධයෙන් මෙම ස්ථාවරය නීතිපතිවරයා නොගත්තේ කුමන හේතුන් මත ද යන්න පැහැදිලි කරන ලෙසට ඉල්ලන්නේ ?**

**************

<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

ගරු සභාපතිතුමනි මං මේ සඳහන් කරේ විශේෂයෙන්ම අපරාධයක සෘජුවම එක එල්ලේම සම්බන්ධ බවට ඒ කියන්නේ සිද්ධියට සම්බන්ධ බවට රක්ෂිත බන්ධනාගාරය හරි එහෙම නැත්නම් රැඳවුම් නියෝග මත තිබෙන පුද්ගලයන් ගැන මම මේ සඳහන් කරේ. ඒ ඇරෙන්න ඔබතුමන්ලා කර කරුණු සවේශනය කරලා හොයාගන්න කරුණුත් මේ කොමිෂන් සභාවෙත් තිබුණා. ඒකට බාධා කරන්න අපිට කිසිම අරමුණක් තිබ්බෙ නැහැ. හිටපු පොලිස්පතිතුමා හරි ඔවුන් හරි සැකකරුවෝ ලෙස රඳවා ගැනීමේ නියෝග මත අපරාධයට සෘජුවම සම්බන්ධ පුද්ගලයන් හැටියට නම් වෙලා තිබුණ් නැහැ. මං මේ කථා කරේ ඒ පුද්ගලයන් නෙමේ අපරාධයට වෙන ආකාරයකින් අන්‍යාකාරයකින් සහයෝගය දුන්න ඒ පුද්ගලයෝ ගැන නෙමේ මං සඳහන් කරේ. කෙලින්ම අපේ අනාගත නඩුවට එක එල්ලේ බලපෑමක් වෙනවා මෙන්න මේ රඳවා ගැනීමේ නියෝග මත ඒ ඇතුලත චක්‍රය මත ඇතුලත චක්‍රය මත හිටි පුද්ගලයන්. මොකද හැම පුද්ගලයන් සම්බන්ධයෙන්ම මම එහෙම දේශනයක් කරන එක සාධාරණ නෑ. අපිට බලන්න ඕනේ ඒකේ ප්‍රමාණය සහ ඒකේ තියෙන ගතික ස්වභාවය සහ ගුණාත්මක භාවය. එහෙම බලලා තමයි මේ ඉල්ලීම කරේ. එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ කොමිෂන් සභාව අකර්මන්‍ය කිරීමේ බලාපොරොත්තුවක් අපේ නීතිපතිතුමාට කිසිසේත්ම තිබුණ් නැහැ. ඒ නිසා ගෞරවයෙන් සඳහන් කරන්නේ මගේ ඉල්ලීම සීමා වෙන්නේ මෙ අපරාධයට සැලසුම් කරලා කාලයක් තිස්සේ එකට ඉඳලා ඔවුන් මාස ගණනාවක් තිස්සේ සැලසුම් කරලා ඒ සම්බන්ධයෙන් ඒ සැලසුම් කිරීම පිටිපස්සේ හිටපු පුද්ගලයන් ගැන මෙතන සඳහන් කරලා තියෙන්නේ. අනෙක් පුද්ගලයෝ ස්වාමිනි ඔබතුමන්ලාගේ කොමිෂමේ දක්ෂතාවය නිසා තමයි මා පිළිගන්නවා ඒ සාක්ෂි හෙළිදරව් වුණේ. ඒ ගැන මගේ කිසිම විවාදයක් නැහැ ස්වාමිනි.

**************

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**

උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල් තුමනි හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා මෙම කොමිෂම ඉදිරියේ සාක්ෂිකරුවන් වශයෙන් කැඳවන විට ඔවුන් සැකරුවන් වශයෙන් අධිකරණයක් ඉදිරියේ නම් කරලාද තිබ්බෙ ?

*************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

ගරු සභාපතිතුමනි මා ගෞරවයෙන් සඳහන් කරන්නේ ඔවුන් අපරාධයට විවිධාකාරයෙන් සම්බන්ධ බවට මේ කොමිෂන් සභාව ඉදිරියේ හෙළිදරව් වෙලා ඇති. නමුත් මේ ඉල්ලීම මෙම අපරාධයට ගැඹුරින්ම සම්බන්ධ අභ්‍යන්තරයේ සිටි ඒ පුද්ගලයන් අති විශේෂයි මේ නඩුවේ කවදා හරි නඩුවක පැමිණිල්ල මෙහෙයවන දවසට

*************

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**

ඒක අපි අවබෝධ කෙරුවා. ඔබ කරපු මේ කරුණු දැක්වීම සලකා බැලීම සඳහා තමයි මේ ප්‍රශ්නය අහන්නේ. හේමසිරි ප්‍රනාන්දු මහතා සහ පූජිත් ජයසුන්දර මහතා කොමිෂම ඉදිරියේ 16 වන වගන්තිය යටතේ නොතීසි ලත් තැනැත්තන් වශයෙන් සාක්ෂියට කැඳවන විට අධිකරණමය කටයුත්තක ඔවුන් සැකකරුවන් වශයෙන් නම් කරලාද තිබ්බේ ?

පි: එසේය.

ප්‍ර: දැනට අත්අඩංගුවේ සිටින තැනැත්තන් ඔබතුමා ඔබගේ කරුණු දැක්වීමේ දී සඳහන් කරපු තැනැත්තන් අධිකරණයක් ඉදිරියේ තිබෙන කටයුත්තක සැකකරුවන් වශයෙන් නම් කරලා තියෙනවද ?

පි: මගේ මතකය නිවැරදිනම් මම හිතන්නේ දැනටමත් සමහර සැකකරුවෝ මීට කලින් අධිකරණයට ඉදිරිපත් කරලා රක්ෂිත බන්ධනාගාර කරලා තියෙනවා. එය ස්ථිර කර ගතයුතුයි විමර්ශකයන්ගෙන් විමසලා. ගරු සභාපතිතුමනි අද දිනට යෝජිත හාදියා නැමැති සැකකාරිය අද දිනයේ සැකකාරියක් හැටියට නම් කිරීමට අධිකරණය ඉදිරියේදී යෝජිතයි. ලැබෙන උපදෙස් පරිදි අනෙක් සැකකරුවන් සම්බන්ධයෙන් අද දින පැමිණ සිටින විමර්ශන නිලධාරියාට අවබෝධයක් නැහැ මොකද ඔහුගේ අවධානය යොමු වෙලා තිබෙන්නේ හාදියා නමැති සැකකාරිය සම්බන්ධයෙන් පමණයි ස්වාමිනි. ඒ හාදියා අද දිනයේ අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී නිල වශයෙන් සැකකාරියක් විදියට නම් වෙනවා.

*************

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

එම සැකකාරිය අද දිනයේ අධිකරණයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවද?

*************

**<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>**

එසේය ගරු සභාපතිතුමනි. අද දිනය වෙනකොට එම සැකකාරිය සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ විටින් විට නිකුත් කරන ලද රඳවා ගැනීමේ නියෝගවල අවසන් දිනය. ඒ නිසා අද දිනය අනිවාර්යය වශයෙන්ම එම සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කළ යුතු වෙනවා. අද දිනයෙන් පසුව ඇයව රක්ෂිත බන්ධනාගාරගත වෙනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ සඳහන් වෙන්නේ 7 වගන්තියේ ගරු සභාපතිතුමනි මේ ආකාරයට. Any person arrested under sub section 1 of section 6 may be kept in custody for a period not exceeding 72 hours and shall unless the detention order under section 9 has been made in respect of such person be produced before a Magistrate before the expiry of such period and then the Magistrate shall on an application made in writing in that behalf by the police officer not below the rank of Superintendent of Police make order that such person be remanded until the conclusion of the trial. Provided that where the Attorney General consents to release of such person from custody before the conclusion of trial the Magistrate shall release such person from custody. ඒ නිසා ඔබතුමාට පෙනී යනවා ඇති ඒ තීන්දුව ගන්නේ මුදවා හරිනවද කියන තීන්දුව ගන්නත් නීතිපතිතුමාගේ අනුමැතිය අවශ්‍ය වෙනවා. ඒ නිසා ඔබතුමාලා කරන අති ගෞරවනීය කාර්යය අගය කරන ගමන්ම නීතිපතිතුමාට ඉන්පසුව මේ යෂ්ටිය ඔබතුමන්ලා දෙනවා. ඒ යෂ්ටිය දෙද්දී බොහොම සවිමත් යෂ්ටියක් අපිට අවශ්‍යයි. කැඩුණු බිඳුණු යෂ්ටියක් නෙවෙයි. ඒ නිසා මම ගෞරවයෙන් කියන්නේ අපිට ඉදිරියේ සමස්ථ සමාජයම බලාගෙන ඉන්නවා. හැම කවුරුහරි වරදක් කරපු එක්කෙනෙක් ඉන්නවානම් ඔහුට විරුද්ධව නඩු පවරන්න. ඒ නිසයි මම මේ ඉල්ලීම කරේ ස්වාමිනි.

*************

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමනි ඔබතුමන් කොමිෂන් සභාවේ ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර එනම්, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා සහ ඔබ විසින් සඳහන් කරන්නට යෙදුණු අනිත් පුද්ගලයින්ගේ අවස්ථානුකූලභාවය ඇති

වෙනස ඔබතුමා කොමිෂන් සභාවට විස්තර කෙරුවා. එය පැහැදිලි කර ගැනීමක් වශයෙන් ඔබතුමා කිව්වා කොමිෂන් සභාවට දැන් ඉදිරියට ගේන්න තියෙන සාක්ෂිකරුවන් ප්‍රධාන කාරණාව හා සම්බන්ධයි. හිටපු පොලිස්පති සහ හිටපු ආරක්ෂක ලේකම් ඒකට සම්බන්ධ නොවන වෙනත් වරදක් සම්බන්ධයෙන් කියලා. එම සිද්ධිමය කරුණුවලට හැරෙන්නට එම සිද්ධිමය කරුණුවලට හැරෙන්නට නීතිමය තත්ත්වය යටතේ එම සියලු පුද්ගලයෝ සමානද නැද්ද?

*************

**<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>**

ස්වාමිනි ගරු සභාපතිතුමනි තවමත් විමර්ශනය පවතින්නේ කළල අවදියේ. මේ ඔක්කෝම ගත්තාට පස්සේ තමයි අපරාධ නඩු විධාන සංග්‍රහයේ 173, 174, 175, 176 වගන්ති අනුව නීතිපතිතුමාට තීරණය කළ යුතු වන්නේ මේ ඔක්කෝම එකම නඩුවක් යටතේ දානවද, නඩු 2ක් දානවද, නඩු 3ක්. ඉතින් මම මේ මේ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී ගෞරවාන්විතව සඳහන් කරන්නේ මේ අවස්ථාවේදී නිගමනයක් නීතිපතිතුමා අනාගතයේ මොකක් කරයිද කියලා ඇත්තට මම පොහොසත් නැහැ ඒක කරන්න. ඒ සාක්ෂි දිහා බලලා සමහර විට එකට වෙන්නත් පුළුවන්. වෙනම යන්නත් පුළුවන්.

*************

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා මම ඇහුවේ ඒ එකම නඩුවකද වෙනත් නඩුවකද මේ නඩු ගොනු කරන එක ගැන නෙවෙයි මම ඇහුවේ. ඔබතුමා කොමිසමේ අවධානයට යොමු කරපු ඒ නීතිමය සිද්ධාන්තය එනම් යම් අවස්ථාවකදී එකම තැනැත්තෙකු විවිධ ස්ථානවලදී කරන ප්‍රකාශවලින් පැණ නඟින තත්ත්වය. එම තත්ත්වය සිද්ධිමය කරුණු නෙවෙයි. එම තත්ත්වය හිටපු ආරක්ෂක ලේකම් සහ හිටපු පොලිස්පතිවරයා සමඟ සංසන්දනය කරන විට ඔබතුමා කොමිෂන් සභාවේ අවධානයට යොමු කරපු අනිත් තැනැත්තන් සම්බන්ධයෙන් ද සමාන වෙනවද නැද්ද කියන එකයි?

*************

**<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>**

ස්වාමිනි අනිත් තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂයෙන්ම රඳවා ගැනීමේ නියෝග යටතේ ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කරලා තියෙනවා. මහේස්ත්‍රාත්තුමාගේ අපරාධ නඩු විධාන සංග්‍රයේ 127 වගන්තිය යටතේ. ඒක සම්පූර්ණයෙන්ම සුවිශේෂී තත්ත්වයක්. මොකද එතකොට ස්වෙච්ඡාභාවය පිළිබඳ තත්ත්වයක් ප්‍රශ්නයක් මතුවෙන නිසා.

*************

**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**

මෙම ඉස්සර හේමසිරි ප්‍රනාන්දු සහ පූජිත් ජයසුන්දර යන පුද්ගලයින් ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත යටතේ ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කරලා තියෙනවද?

**************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

ස්වාමිනි මට උපදෙස් ලැබෙන පරිද්දට ඔවුන්ට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කටයුතු කරලා නැහැ.

**************

**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**

එතකොට මේ සැකකරුවන් සහ ඒ සැකකරුවන් අතර වෙනසක් තිබෙනවද?

**************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

බැලූ බැල්මට වෙනසක් තිබෙනවා. ඔවුන්ට අපරාධ නඩු විධාන සංග්‍රහයේ යටතේ පමණයි මේ වනතෙක් කටයුතු කරලා තියෙන්නේ.

**************

**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**

අනික් එක ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත?

**************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

මේක විශේෂ පනතක් ස්වාමිනි.

**************

**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**

එතකොට පාපොච්චාරණය කරලා තිබෙනවා සමහර සැකකරුවන් දැනට රිමාන්ඩ්..?

**************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔවුන් පාපොච්චාරණය කරලා තියෙනවා. ඒ වගේම වරද පිළිගැනීම වෙන ආකාරයේ දේවල් කරලා තියෙනවා.

**************

**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**

දැන් පූජිත් ජයසුන්දර, හේමසිරි ප්‍රනාන්දු වැනි පුද්ගලයින්ගෙන් එහෙම පාපොච්චාරණ ගැනීමක් සිදු කරලා තිබෙනවද?

*************

**උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා**

අපි දන්න තරමින් නැහැ ස්වාමිනි. අපි දන්න තරමට නැහැ ස්වාමිනි.

*************

**නියෝගය**

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**

උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් මෙම කොමිෂන් සභාවට දැක්වූ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමෙන් පසුව නියෝගය හෙට දින පෙරවරු 10.00ට සිදු කරන බව සටහන් කරමි. අද දින කොමිෂන් සභාවේ නියෝග මත කොමිෂන් සභාවට ගෙන ආ පුද්ගලයින් දෙදෙනා නැවත හෙට උදෑසන කොමිෂන් සභාවට පෙරවරු 10ට ඉදිරිපත් කළ යුතු බවට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තු නිලධාරියා හට දන්වමි. එය අදාල තැනැත්තිය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී උගත් මහේස්ත්‍රාත්වරියට දැනුම් දිය යුතු බවට ඔහුට නියෝග කරමි. ඒ අනුව උගත් මහේස්ත්‍රාත්වරියගෙන් ඒ අදාල නියෝගයක් ලබා ගන්නා ලෙසටද ඔහුට නියෝග කරමි.

ඉන් පසුව අද දින සාක්ෂියට කැඳවා ඇති අනිත් තැනැත්තා රිමාන්ඩ් භාරයෙන් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති බව කියා සිටි හෙයින් අදාල බන්ධනාගාර අධිකාරීවරයාට හෙට පෙරවරු 10 ට කොමිෂන් සභාවට එම පුද්ගලයාද ඉදිරිපත් කරන ලෙසට නියෝග කරමි.

## 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020. 10.23 වේලාව :- පෙ.ව. 10.40

(සටහන් කළේ :- නිල්මිණි කුමාරි)

**ගරු විනිසුරු මඩුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම:-**

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, රජයේ අධි නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් කෞෂි සෙල්වනාගම මෙනවිය ,සමඟ ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටිමට අවසර

වේලාව: පෙ.ව. 10.40

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අද දින ප්‍රථමයෙන් සිදු කිරීමට තිබෙන්නේ ඊයේ දිනයේදී කොමිෂන් සභාව ඉදිරියේ ගරු නීතිපතිතුමා වෙනුවෙන් පෙනී සිටි උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් කොමිෂන් සභාවට කරන ලද කරුණු දැක්වීම සම්බන්ධයෙන් නියෝගය ප්‍රකාශයට පත් කිරීමයි. එම කරුණු දැක්වීම් මාධ්‍යය නොමැතිව ඊයේ දිනයේදී ලබා ගත් හෙයින් නියෝගය ප්‍රකාශ කිරීමද ඒ අනුව මාධ්‍යය නොමැතිව කරන බව සටහන් කරමි. මාධ්‍යය මේ අවස්ථාවේදී කොමිෂන් සභාවෙන් පිටත් කරමි. එසේම නීතිඥවරුන් හැර අනිත් සියලු තැනැත්තන් කොමිෂන් සභාවෙන් පිටත් කරන්න.

අදාල නියෝගය කොමිෂන් සභාවේ බහුතරයකින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරන අතර පළමුව සුළුතරයේ තීන්දුව හිටපු අභියාචනාධිකරණ විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා විසින් කරනු ඇත.

**************

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

මෙම කොමිෂන් සභාවේ, ගරු සභාපති කොමසාරිස්වරයා සහ අනිකුත් විනිසුරුතුමන්ලා විසින් දීමට බලපොරොත්තු වන නියෝගයට මා එකඟ නොවන බැවින් ඒ සම්බන්ධව මාගේ නියෝගය වෙන්ව ප්‍රකාශයට පත් කරමි. නීතිපතිවරයා වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා මෙම කොමිෂන් සභාව ඉදිරියේදී ප්‍රකාශ කර සිටිනු ලැබුවේ මෙම කැඳවීමට නියමිත සැකකරුවන් මෙම කොමිෂන් සභාවේ සාක්ෂිය සඳහා කැඳවීමෙන් ඉදිරියේදී අධිකරණයක් ඉදිරියේ පවත්වනු ලබන නඩු කටයුත්තකදී එම ක්‍රියාවලියට යම් අගතියක් සිදුවිය හැකි බවයි. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් නීතිපතිතුමා වෙනුවෙන් සැල කර ඇත්තේ මෙම දැනට අද දින කැඳවීමට නියමිත සහරාන් නැමැති පුද්ගලයාගේ බිරිඳ දැනට මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේද පාපොච්චාරණයක් කර ඇති බවයි. මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරියේ ද ඇය ප්‍රකාශයක් කර ඇති බව මා දැනුවත් වී ඇත . මෙබැවින් මෙම ප්‍රකාශ මෙම කොමිෂන් සභාවට දෙන ලද ප්‍රකාශවල ඇතුලත් වන කරුණුද ඇතුලත් වී ඇති බව මා දැනුවත් වී ඇත. කෙසේ වුවද මෙම කොමිෂන් සභාවේදී ඇය සාක්ෂියට කැඳෙව්වොත් එම ප්‍රකාශවල සඳහන් වන කරුණුවලට අමතරව යම් කරුණු ඉදිරිපත් කළ හැකි බව මා හටද පෙනී යයි. කෙසේ වුවද මෙවැනි අවස්ථාවකදී අප සලකා බැලිය යුත්තේ රටේ පවතින නීතිමය පසුබිම තුළ මෙම සාක්ෂිකරුවන් කැඳවිය යුතුද යන්නයි. මෙවැනි අවස්ථාවක විනිසුරුතුමෙකු වශයෙන් මාගේ හැඟීම්වලට වහල් වෙලා කටයුතු කළ නොහැක. විනිශ්චයකාරතුමෙක් වශයෙන් මාගේ ප්‍රධානම කාර්යය වනුයේ නීතිමය තත්ත්වය පරීක්ෂා කර බැලීමයි. අපරාධ නඩු විධාන

සංග්‍රහය අනුව නීතිපතිවරයාට අපරාධ නඩුවක් පැවරීමේ පූර්ණ බලතල ඇත. නීතිපතිතුමා විසින් යම් අතිචෝදනාවක් ඉදිරිපත් කිරීමේදී යම් සැකකරුවෙකුට එරෙහිව ඉදිරිපත් කළ යුතු චෝදනා කුමක්ද, සාක්ෂිකරුවන් කවුරුද ,ලේඛන කුමක්ද, සාක්ෂි මෙහෙය වන්නේ කුමන ආකාරයෙන්ද යන්න සම්බන්ධයෙන් තමාට තීරණයක් ගැනීමේ නීතිපතිවරයාට බලයක් ඇත. නීතිපතිවරයා එය තම අනිකුත් නිලධාරීන් මඟින් මහාධිකරණයේදී එම කටයුතු සිදු කරනු ලබයි. එයට අමතරව ඕනෑම අවස්ථාවක යම් සාක්ෂිකරුවෙකු අපරාධ නඩුවක රජයේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කිරීමේ බලයද නීතිපතිතුමාට ඇත. එම බලය ඇත්තේ නීතිපතිතුමාට පමණි වෙනත් කෙනෙකුට නොවේ. ඒ අනුව අසීමිත බලයක් නඩු පැවරීමේදී නීතිපතිතුමාට ඇත. නීතිපතිතුමා වෙනුවෙන් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත්තේ මෙම සැකකරුවන් සාක්ෂිකරුවන් වශයෙන් කැඳවීමෙන් තම නීතිමය කටයුතු ඉදිරියේදී ගෙන යෑමේදී යම් අවහිරතාවයක් ඇතිවිය හැකි බවයි. අප රටේ නීතිපතුමා අපරාධ නඩු මෙහෙයවීමේදී පූර්ණ බලධාරියා වේ. ඒ අනුව නීතිපතිතුමා සද්භාවයෙන් යම් කරුණක් සම්බන්ධව තමාට මෙම සාක්ෂි මෙහෙයවීම හේතු කොටගෙන මහාධිකරණ නඩුවලදී චෝදනා ඉදිරිපත් කිරීමටත් අනෙක් සැකකරුවන් සම්බන්ධව අපරාධ නඩු කටයුත්තකට යෑමටත් යම් අවහිරතාවයක් සිදුවන බව ප්‍රකාශ කළ විට ඒ සම්බන්ධයෙන් අප දැඩිව අවධානය යොමු කළ යුතුය. මා විසින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සලකා බැලීමේදී සඳහන් කරනුයේ මෙම සැකකරුවන්ගෙන් සමහරක් පාපොච්චාරණ ද ලබා දී ඇති බැවින් එම පාපෝච්ඡාරණ සම්බන්ධයෙන් මහාධිකරණයේ Voir dire පරීක්ෂණද පැවැත්විය යුතු බවයි. Voir dire පරීක්ෂණ පැවැත්වීමේ දී එම සාක්ෂි මෙහෙයවීම ඉතා සුපරීක්ෂාව කළ යුතුය. යම් සැකකරුවෙකු මෙම කොමිෂන් සභාවේදී සාක්ෂි දෙමින් එම තමන්ගේ නිර්දෝෂිභාවය සඳහා සහ පාපෝච්ඡාරණය ස්වේච්ඡාවෙන් නොකල බවට ඒත්තු ගැන්වීම සඳහා කරුණු ඉදිරිපත් කරනු ලබුවොත් එයින් එම Voir dire පරීක්ෂණයේ කටයුතුවලට බාධා සිදුවෙනවා ඇත. එයින් නීතිපතිවරයාට Voir dire පරීක්ෂණය නිසි ආකාරව පවත්වාගෙන යාමට නොහැකි වන අතර බොහෝ අවස්ථාවල සැකකරුවෙකු සාක්ෂි වශයෙන් මෙම කොමිෂන් සභාවේ එයට විරුද්ධව Voir dire පරීක්ෂණයට අදාලව යම් ප්‍රකාශයක් කරනු ලැබුවොත් එම සැකකරුට සමහරවිට යම් අගතියක් සිදුවිය හැකියි. මේ සම්බන්ධයෙන් ද කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් මා සලකා බලන ලදි. මේ හැරුණු විට මෙම යම් සැකකරුවෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් සාක්ෂි දෙන අවස්ථාවේදී වෙනත් සැකකරුවෙකු සම්බන්ධව කරුණු ඉදිරිපත් කළහොත් එයින් ද එම සැකකරුවන් සම්බන්ධව චෝදනා ඉදිරිපත් කිරීමේදී කුමන ආකාරයකින් චෝදනා ඉදිරිපත් කිරීම ද යන්න සම්බන්ධයෙන් නීතිපතිතුමාට ගැටලුවක් ඇතිවෙනු ඇත. එසේම යම් සැකකාර සාක්ෂිකරුවෙක් මෙම සාක්ෂි විමසීමේදී යම් වෙනත් සැකකරුවෙකු සම්බන්ධව

ප්‍රකාශයක් කළහොත් එම සැකකරුට ජනාධිපති කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ නීතිඥවරයෙකු මාර්ගයෙන් ඔහුගෙන් ඇයගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දියු යුතුය. එසේ නීතිඥවරයකු මාර්ගයෙන් ඇයගේ නීතිමය අයිතීන් අනුව ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දුනනහොත් එයින් මතු වන කරුණු මත නීතිපතිතුමාට මහාධිකරණයේදී නඩු පැවරීමේදී යම් ගැටලුසහගත අවස්ථාවන් උදාවිය හැකිය. එවැනි ආකාරයෙන් කටයුතු කිරීම මත අපරාධ නඩුවක් පැවරීමේ යම් ගැටලුසහගත තත්ත්වයක් උද්ගත වුවහොත් එයින් ඇතිවන අවදානම් තත්ත්වය ගැන නීතිපතිතුමා මෙම අවස්ථාවේදීම දැනුවත් වී ඒ ගැන කොමිෂන් සභාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් මා ස්තූතිවන්ත වෙමි. තවද විශේෂයෙන් මා මෙහිදි අවධානය යොමු කරනු ලැබුවේ ජනාධිපති කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ දියයුතු යම් චෝදනාවට ඇය ලක්වීමට හෝ හැකියාවක් ඇත්නම් ඇයට එම සැකකාරියට හෝ සැකකරුට නීතිඥවරයකු මගින් පෙනී සිටීමට ඇති අයිතියයි. නීතිමය මූලධර්ම අනුව එම නීතිඥයකු මාර්ගයෙන් සාක්ෂි ලබා දීමට හෝ එම සාක්ෂිකරුවකුගේ සාක්ෂි නිසා අගතියට පත් පාර්ශවයට නීතිඥ මාර්ගයෙන් ප්‍රශ්න ඇසීමට ලබා දීම මගින් මෙම සැකකරුවන් දෙන සාක්ෂිවල යම් ගැටලුසහගත තත්ත්වයන් ඇති විය හැකි බව මාගේ නිගමනයයි. එවැනි පරස්පර ගැටලුසහගත තත්ත්වයන් ඇතිවීම මත ක්‍රමාණුකූලව අපරාධ නඩුවක් පැවරීමේ හැකියාව නීතිපතිතුමාට නැතිවිය හැකි බවද මාගේ මතයයි. මෙම සැකකරුවන් සාක්ෂිකරුවන් ලෙස කොමිෂන් සභාවට නොකැඳවීමෙන් විශාල අගතියක් සිදු නොවන බව මාගේ හැඟිමයි. ජනාධිපති කොමිෂන් සභා පනත අනුව සත්‍ය තොරතුරු හැකිතාක් දුරට උපරිම මට්ටමෙන් ලබා ගත යුතු වුවද එම උපරිම මට්ටමින් ලබා ගැනීමට කටයුතු කිරීම මත ඉදිරියේදී සැකකරුවන්ට නඩු පැවරීමේදී යම් ගැටලුසහගත තත්ත්වයන් උදාවිය හැකිනම් ඒ පිළිබඳව සලකා බලා එම සැකකරුවන් සාක්ෂියට නොකැඳවීම කොමිෂන් සභාව විසින් කල යුතු බව මාගේ පෞද්ගලික මතයයි. මෙම කොමිෂන් සභාව විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමා ප්‍රකාශ කරනු ලැබුවේ දැනට නඩු පවරනු ලැබූ හේමසිරි ප්‍රනාන්දු සහ පූජිත් ජයසුන්දර යන අය සම්බන්ධයෙන් මෙවැනි නියෝගයක් බලාපොරොත්තු නොවුන බවත් නමුත් ඔවුන්ට එරෙහිව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නඩු පැවරීම සඳහා වාර්තා ඉදිරිපත් කර නැති බවත්, ඔවුන් රඳවා තබා ගැනිමෙ නියෝග මත තබා නොසිටින බවත්ය. මේ සම්බන්ධයෙන්ද මා අවධානය යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ මෙම කොමිෂන් සභාවට කැඳවීමට කටයුතු කරන ලද සැකකරුවන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා තබාගන්නා ලද සැකකරුවන් බවයි. මෙබැවින් එවැනි සැකකරුවන් එබැවින් අනිකුත් චෝදනාවන් ඉදිරිපත් කරන සැකකරුවන්ට වඩා වෙනස් ආකාරයෙන් මෙම සැකරුවන් පිළිබඳ මෙම ඉල්ලීම කිරීමෙන් නීතිපතිතුමා වරදක් කර ඇති බවක් මා හට පෙනී නොයයි. විශේෂයෙන් කොමිෂන් සභාවේ කටයුතු කිරීමේදී

කොමිෂන් සභාවේ වගකීම වනුයේ ඉදිරි නීති කටයුතුවලට බාධා නොවන අයුරින් පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු හා සාක්ෂි මෙහෙය වීමයි. විශේෂයෙන් මා මෙහිදි වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලබනුයේ මෙම කොමිෂන් සභාවේ සියලුම බලතල සහ කාර්ය භාරයන් 2020 දෙසැම්බර් මස 20 වෙනිදායින් අවසන් වන බවයි. 2020 දෙසැම්බර් 20 වෙනිදායින් පසුව මෙම කොමිෂන් සභාවේ තිබෙන බලතල අහිමි වනු ඇත. එයට පසු කොමිෂන් සභාව වෙනුවෙනුත් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙනුත් අධිකරණයකදී කරුණු කියාපෑමට සිදුවන්නේ නීතිපතිතුමාටයි. එසේ කරුණු කියාපෑමට නීතිපතිතුමාට සුදුසු වාතාවරණයක් අප විසින් සකස් කළ යුතුය. නීතිපතිතුමාට සුදුසු වාතාවරණයක් ඉදිරි අධිකරණ කටයුතු කරගෙන යෑමට සකස් නොකර යම් අවහිරතා ඇතිවුණොත් ඉදිරියේදී මෙම සැකකරුවන්ට එරෙහිව නීතිමය කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට හැකිවේද යන්න පිළිබඳව මා මාගේ අවධානය යොමු කරන ලදී. මෙබැවින් මම අනිකුත් කොමසාරිස්තුමාලාගේ තවද මා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ මෙම සැකකරුවන්ගෙන් සාක්ෂි ලබා ගැනීමෙන් යම් වැඩිදුර කරුණු හෙළිදරව් වීමට හැකි වුවත් ඉදිරියේදී මෙම ප්‍රහාරය සම්බන්ධව සැකකරුවන්ට එරෙහිව සාර්ථකව නීතිමය කටයුතු කරගෙන යෑම සම්බන්ධයෙන් එයට වඩා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු බවයි. සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුවන්ගෙන් නව කරුණු හෙළි වී ඇත්නම් ඒවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශවලද පාපොච්චාරණවලද සටහන්ව ඇත. එසේනම් ඒ අනුවද තවදුරටත් පරීක්ෂණ කිරීමට නීතිමය අංශවලට හැකියාවක් ඇත. මෙම ජනාධිපති කොමිෂන් සභාවටද යම් යම් කරුණු සම්බන්ධව ඇයගේ ප්‍රකාශ පිළිබඳව දැනුවත් වී ඇති බැවින් තවදුරටත් ඒ පිළිබඳ පරීක්ෂණ කරමින් ඉදිරි කටයුතු කර ගෙන යාමට හැකියාවක් ඇත. එබැවින් මා අවසාන වශයෙන් තීරණය කරනුයේ මෙම සැකකරුවන් හා සැකකාරියන් සාක්ෂියට කැඳවීමෙන් ඉදිරි අධිකරණ කටයුතුවලදී යම් බාධාවක් ඇතිවීමට අවස්ථාවක් ඇති බවයි. අධිකරණයේ නඩු පවරනු ලබන නීතිපතිතුමා විසින්ම මෙය කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇති බැවින් අප ඒ ගැන වඩාත් සැලකිලිමත් විය යුතුය. එබැවින් නීතිපතිතුමාගේ ඉදිරි කටයුතු මෙම සැක කටයුතු පුද්ගලයින් වෙනුවෙන් කරගෙන යාමට අවස්ථාවක් ලබාදීම සඳහා ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා විසින් කරන ලද ඉල්ලීමට අවසර දීම සුදුසු බව මා තීරණය කරමි. ඒ අනුව අනෙකුත් උගත් කොමසාරිස්වරයන්ගේ තීරණයට වෙනස්ව මාගේ තීරණය ප්‍රකාශ කරමි.

**********

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
ස්තූතියි රාජපක්ෂ මැතිතුමා
බහුතරයේ තීන්දු ව එනම් අභියාච ානාධිකරණ විනිශ්චයක ාර ගරු බ දූල කරුණාරත්න මැතිතුමා, හිටපු මහාධිකරණ විනිශ්චයකාර ගරු බ දූල අතපත්තු මැතිතුමා සහ හිටපු අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ගරු මංගලිකා අදිකාරි මහත්මිය මා සමඟ එකඟ වන නියෝගය මේ අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරමි.

*************

## බහුතර නියෝගය

2020.10.22 වෙනි දින වරින් වර සංශෝධිත කොමිෂන් සභා පනතේ 26 වැනි වගන්තිය යටතේ ගරු නීතිපතිතුමාගේ උපදෙස් අනුව කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා කරුණු සැළ කිරීමේ දන්වා සිටියේ සැකකරුවන් ලෙස හෝ සැකකාරි යක් ලෙස විමර්ශකයන් විසින් අත්අඩංගුවේ තබාගෙන සිටින යම් සැකකරුවන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ දී සාක්ෂිය සඳහා කවර ආකාරයකින් හෝ නො කැඳවන ලෙසයි. ඔහු විසින් වැඩිදුර වත් දන්වා සිටි යේ එලෙස කැඳවීම අනාගතයේ දවසක ගරු නීතිපතිතුමා වෙතට විතරක්ම පැවරෙන නඩු පැවරීමේ බලයත්, පැමිණිල්ල මෙහෙයවීමේ බලයටත් ප්‍රබල අගතියක් සිදු වෙන නිසා බවයි.

එසේම ගරු නීතිපතුමා වෙනුවෙන් සැළ කරන ලද්දේ මෙම කොමිසම කවර නිර්දේශය කරත් එනයින්ම, ස්වායක්තව නඩු පැවරෙන්නේ නැති බවත්, ඒ නඩු පැවරීමේ තනි සහ අනන්‍ය බලය ගරු නීතිපතිතුමා සතුව විතරක් පවතින බවයි. එනමුත් වික් ටර් අයිවන් එරෙහිව සරත් එන් සිල්වා නීතිප ති සහ තවත් පුද්ගලයෙකු 1998 (1) ශ්‍රී ලංකා නීති වාර්තා 340 පිටුවේ සටහන්ව ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා ප්‍රකාශ කරන ලද්දේ "... The Attorney General's power, to file or not to file an indictment... is a discretionary power which is neither absolute nor unfettered. It is similar to other powers vested by law in public functionaries. They are held in trust for the public to be exercised for the purpose for which they have been conferred and not otherwise."

ඒ නිසා නඩු පැවරීමට හෝ නොපැවරීමට ගරු නීතිපතිවරයාට ඇති අභිමතය යම් යම් සීමාවන්ට යටත් අතර එම තීරණය නිවැරදිව ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද මෙවන් කොමිෂන් සභාවක්, සිය සම්පූර්ණ බලය තුල ක්‍රියාකරමින් ගරු ජනාධිපතිවරයා විසින් මෙම කොමිෂන් සභාවට නියම කර ඇති සියලුම කරුණු පිළිබඳව විමර්ශනය කොට, පරීක්ෂා කොට ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනු පිණිස වාර්තා කිරීම සිදු කළ යුතුයි.

මෙහිදී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 7 (1) (ඇ) වගන්තිය කෙරෙහි අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ මෙම කොමිසමට ශ්‍රී ලංකාව තුල පදිංචි ඕනෑම පුද්ගලයෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් කැඳවිය හැකි බවයි. එම බලයට සීමා පැනවීමට ගරු නීතිපතිතුමාට නෛතික බලයක් නැත.

මෙම කොමිෂන් සභාවට බලය පැවරෙන අධිකාරි බලපත්‍රයේ 3 වෙනි කරුණ යටතේ පැවරී ඇති ප්‍රධාන කාර්යයක් වන්නේ 2019 අප්‍රේල් මස 21 වෙනි දින සිදුවූ ත්‍රස්තවාදී ක්‍රියාවට සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් ඇති පුද්ගලයින් හා සංවිධාන හා ඒවායේ ක්‍රියා කලාපයන් හඳුනා ගැනීමයි. ඒ සඳහා එම ත්‍රස්තවාදී ක්‍රියාවට සම්බන්ධ වූ පුද්ගලයින් සමඟ සමීප ඇසුරක් පවත්වාගෙන ගිය තැනැත්තන්ගෙන් සාක්ෂි ලබා ගැනීමට හැකියාවක් ඇති විට එම අවස්ථාව හිතාමතාම මඟ හැරියහොත් එය මෙම කොමිසම විසින් කරනු ලබන බලවත් අතපසු කිරීමක් වියහැකි බව අපගේ මතයයි.

දැනට මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව එම ත්‍රස්ත ප්‍රහාර එල්ල කළ එක් පුද්ගලයෙකු වන මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් යන අයගේ බිරිඳ වන අබ්දුල් කාදර් ෆාතිමා හාදියා පමණයි ස්වයං ඝාතකයන් සමඟ සිටි පුද්ගලයන් අතරින් දැනට ජීවතුන් අතර සිටින සහ සොයා ගත හැකි එකම තැනැත්තිය වන්නේ එම තැනැත්තිය විසින් මෙම කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට කර ඇති ප්‍රකාශය පරිශීලනය කිරීමේදී ඉහත කී ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් මෙම කොමිසම ඉදිරියේ දැනට නොමැති වැදගත් කරුණු බොහොමයක් ප්‍රකාශ කර ඇති බව පෙනී යන අතර එම කරුණු පිළිබඳව දැනුවත්ව සිටින මෙම කොමිසම ඇයගේ සාක්ෂිය ලබා නොගතහොත් එය අප වෙත පවරා ඇති අධිකාරි බලපත්‍රය නොසලකා හැරීමක් සිදු වන බව අපගේ මතයයි.

නීතියට අනුව අධිචෝදනා ගොනු කිරීමේදී ගරු නීතිපතිතුමාට යම් බලයක් පැවරී ඇත්තා සේම නීතියට අනුව මෙම කොමිසමට ද යම් බලතල ලබා දී ඇත. එකී බලතල යටතේ පැවරී ඇති වැදගත් කර්තව්‍යයක් වනුයේ පාස්කු ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධව සියලු කරුණු අනාවරණය කර ගැනීමයි. ඉහත කී ගරු නීතිපතිවරයාගේ බලතලත් මේ කොමිසමේ බලතලත් තුලනාත්මකව සංසන්දනය කර බැලුවද ඉහත කී අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තිය මෙම කොමිසම ඉදිරියේ සාක්ෂිකාරියක් වශයෙන් කැඳවීම සාධාරණ සහ යුක්ති සහගත බව අපගේ මතයයි. අවසානයේ මෙම කොමිසමේ ප්‍රධාන කාර්යයක් වන්නේ මෙම ත්‍රස්ත ප්‍රහාරයෙන් මිය ගිය සහ තුවාල ලැබූ තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල්වල අයට යුක්තිය සහ සාධාරණය ඉටු කිරීමයි. එකී අරමුණ මුදුන්පත් කර ගැනීම උදෙසා මෙම කොමිසම සම්පූර්ණ විමර්ශනයක් හා පරීක්ෂණයක් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

ඉහත කී කරුණු හේතුවෙන් අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තිය සාක්ෂිකාරියක් වශයෙන් මෙම කොමිසම ඉදිරියේ කැඳවීමට අප තීරණය කරමු.

මෙම නියෝගය මඟින් දැනට අත්අඩංගුවේ හෝ රක්ෂිත බන්ධනාගාරය භාරයේ සිටින සියලුම තැනැත්තන් මෙම කොමිසම ඉදිරියේ සාක්ෂිකරුවන් වශයෙන් කැඳවන බව ගම්‍ය නොවේ. කැඳවනු ලැබිය යුත්තේ කවුරුන්ද යන්න සියලු අදාළ කරුණු සළකා බලා අවස්ථානුකූලව මෙම කොමිසම විසින් තීරණය කරනු ලබන බව සටහන් කර තබමි.

මේ අවස්ථාවේදී අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තියගේ සාක්ෂිය නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය ඉදිරියේ ලබා ගන්නා බව පමණක් සටහන් කරමි.

**************

<u>**අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය**</u>

ස්වාමිනි ඔබතුමන්ලා විසින් අද දින උදෑසන කරන ලද නියෝගය ප්‍රකාරව ඇයගේ සාක්ෂිය ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවට සහාය වෙමින් මෙහෙයවන්නට මේ අවස්ථාවේදී අපේක්ෂා කරනවා ස්වාමිනි.